# ඉස්ලාම්

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## 13 ශ්‍රේණිය



ආගම් දෙපාර්තමේන්තුව
භාෂා, ආගම්, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# ඉස්ලාම්

13 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

(2010 සිට 13 ශ්‍රේණිය සඳහා)

ආගම් දෙපාර්තමේන්තුව,
විෂයමාලා සංවර්ධන පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

© ජාතික අධ්‍යාපන ආයතනය

පළමුවන මුද්‍රණය 2010

**ඉස්ලාම්**
13 ශ්‍රේණිය

ආගම් දෙපාර්තමේන්තුව,
භාෂා, ආගම්, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

*මුද්‍රණය*

# පෙරවදන

නිපුණතා පාදක විෂයමාලාව පාසල් පද්ධතියට හඳුන්වාදීමේ කාර්යය 13 වන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ හඳුන්වා දීමත් සමඟ සම්පූර්ණ වේ. 12 වන හා 13 වන ශ්‍රේණිවල සිසු සිසුවියන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා පවතින දැඩි තරගයට ගොදුරුවීම නිසා නිරන්තරව ම යම් තරමක පීඩනයකට යටත් වේ. නව විෂයමාලාව ප්‍රථම වතාවට අ.පො.ස. (උ.පෙ.) සඳහා යොදා ගැනෙන විට මෙම පීඩනය තවත් දැඩි වේ. එවැනි අවස්ථාවක ඔබ අතට පත්වන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, විෂය නිර්දේශ තරමට ම ගුරුවරුනට වැදගත් වන්නේ ය. මෙහි මූලිකව ම ගුරුවරයා සැලකිල්ලට ගත යුතු පැති තුනක් ඇත. එනම් ගුරු මාර්ගෝපදේශ, විෂය නිර්දේශය හා පූර්ණව ගැළපී තිබීම, විෂයමාලාවේ අනපේක්ෂිත නිපුණතා පාදකව විෂයමාලාවේ දර්ශනය හා දැක්ම මුල්කොට ගෙන සකසා තිබීම හා 12 - 13 ශ්‍රේණිවල දරුවාගෙන් අපේක්ෂිත සාධන මට්ටම මෙනෙහි කොට සකසා තිබීම. එහෙයින් මෙය හොඳින් පරිශීලනය කිරීම ගුරුවරයාට අත්‍යවශ්‍ය කාර්යයක් හා වගකීමක් වන්නේ ය.

ජාතික අධ්‍යාපන ආයතනය ඉහත කී කරුණු තුන ම ඔබගේ අවධානයට ගෙන ඒම සඳහා 13 වන ශ්‍රේණිවල ඉගැන්වීම් කරන සියලුම ගුරුවරුනට ඒ සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීම සඳහා ද ක්‍රියාත්මක වී සිටී. නිරන්තරව පැවැත්වෙන මෙම පුහුණු සැසිවලට අදාළ ගුරුවරුන් සහභාගී වීම අතිශයින් ම අවශ්‍ය කරුනක් වන්නේ මෙහි දැක්වෙන ඉගෙනුම් - ඉගැන්වීම් මූලධර්ම හා ක්‍රියාදාම වටහා ගැනීමට පුහුණුව බෙහෙවින් ඉවහල් වන නිසා ය. විශේෂයෙන් ම පාසල් පාදක ඇගයීම් ක්‍රියා, නිපුණතා වර්ධනය සඳහා ඉවහල් කර ගැනීම අපේක්ෂා කෙරේ. විෂය කරුණුවලට පමණක් ඉගැන්වීම යටත්වීමට නොදී සිසුනගේ කුසලතා ඔප ගැන්වීමේ අභිලාෂය ඉටුකරදීමට මේ සියලු මැදිහත්වීම් අවශ්‍ය බව අධ්‍යාපන හා ඇගයීම් කාර්යයේ නියැලෙන අප සියලු ම දෙනා වටහා ගත යුතු වේ.

ගුරු මාර්ගෝපදේශ පිළියෙල කිරීමේ අතිශය වෙහෙසකාරී කාර්යය ඉටුකරලීමට මැදිහත් වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලුම ශාස්ත්‍රීය අංශවල නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩල හා බාහිරව ඒ සඳහා දායක වූ විද්වත් හැම දෙනාට ම ද මාගේ විශේෂ ස්තුතිය හිමි වේ.

**මහාචාර්ය උපාලි එම්. සේදර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# සංදේශපනය

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2010 වර්ෂයේ සිට 13 වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු භවතුන් හට ප්‍රයෝජනවත් වේ.

මෙම පොත සම්පාදනය කිරීමට පාදක කරගත් විෂය නිර්දේශය මෙතෙක් පැවති විෂය නිර්දේශවලට වඩා වෙනස් වූවකි. එම වෙනස හඳුනා ගැනීමට යොමුවන ඔබට එය නිපුණතා පාදක විෂය නිර්දේශයක් බව දැකිය හැකි ය. මෙහි දැක්වෙන නිපුණතාවක් එම ශ්‍රේණිය තුළදී ම සාක්ෂාත් කර ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. ඇතැම්විට ඒ සඳහා බොහෝ කලක් ගතවිය හැකි ය. එහෙත් නිපුණතා මට්ටම් හා එක් එක් නිපුණතා මට්ටම් යටතේ දැක්වෙන ඉගෙනුම් ඵල එම ශ්‍රේණිය තුළදී ම අත්පත් කර ගත යුතු වේ. එබැවින් ඔබට ශ්‍රේණියට අදාළ පාඩම් සැළසුම් කර ගැනීමේ දී එම නිපුණතා මට්ටම් හා ඉගෙනුම්ඵල බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම ඉගෙනුම් ඵල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් අරමුණු සකසා ගැනීමට මෙන් ම පන්ති කාමරයේ දී සිදු කෙරෙන ඇගයීම් උපකරණ සකස් කර ගැනීමේ දී නිර්ණායක ලෙස යොදා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම විෂය හැදෑරීමේ දී පරිශීලනය කළ යුතු අතිරේක පොත්පත් මෙන් ම වෙබ් අඩවි පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට ප්‍රයෝජනවත් වේ.

මෙහි යෝජිත ක්‍රියාකාරකම් ඔබ නිර්මාණශීලී ගුරුවරයකු වශයෙන් ක්‍රියා කිරීමේ අපේක්ෂා සහිත ව ආදර්ශවත් ලෙස ඉදිරිපත් කළ ඒවා වශයෙන් සලකන්න. ගුරු කේන්ද්‍රීය පන්ති කාමර ක්‍රියාවලිය වෙනස් කර ශිෂ්‍ය කේන්ද්‍රීය බවක් ඇති කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් සිසුන් විවිධ පොත්පත් පරිශීලනයට අන්තර්ජාල භාවිතය වැනි ගවේෂණයට යොමු කෙරෙන ඉගෙනුම් අවස්ථා හැකි හැමවිට ම උදා කළ යුතු වේ. ඉගැන්වීමේ දී සාම්ප්‍රදායික ලෙස සටහන් ඉදිරිපත් කිරීම වෙනුවට ආකර්ෂණීය ලෙස නව දැනුම මූලධර්ම ආදිය ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා තාක්ෂණය හැකිතාක් දුරට යොදාගත් සන්නිවේදන උපක්‍රම භාවිත කිරීම නව පන්තිකාමරය තුළ දී උනන්දු විය යුතු වේ. ඒ සඳහා නව තාක්ෂණික උපකරණ හැකිතාක් දුරට භාවිත කිරීමට නිර්මාණශීලී වීම අවශ්‍ය වේ.

13 වන ශ්‍රේණියේ දී මෙම විෂය ඉගෙනීම අරඹන ඔබගේ සිසුන්ට විෂය නිර්දේශ මනාව පැහැදිළි කර දෙන්න. වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ඔබගේ ඉගැන්වීමේ සැලැස්ම හඳුන්වා දෙන්නේනම් එය සිසුන් තුළ පෙළඹවීමක් වනු ඇත. මුළු විෂය නිර්දෙශය ආවරණය කර ගැනීමට පාසල වෙත සිසුන් ආකර්ශණය වේ. මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණ රටට දැනෙන පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු සඳහා අදාළ විෂය නිර්දේශය මෙන් ම මෙහි යෝජිත ක්‍රියාවලි ඇසුරෙන් ඔබගේ නිර්මාණශීලී හැකියා පුබුදුවා ගන්නා මෙන් ඉල්ලමි.

මෙම මාර්ගෝපදේශ සැකසීමේ දී දායක වූ විද්වත් සැමට, ගුරුභවතුන්ට සහ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන්ට මගේ ස්තුතිය හිමි වේ. මේ කාර්යය සඳහා මඟපෙන්වූ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ලාල් පෙරේරා මැතිඳුන් මෙන් ම මුද්‍රණ කටයුතු සිදුකර පාසල්වලට ලබාදීමේ වගකීම භාරගෙන කටයුතු කළ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්යය මණ්ඩලයට මගේ විශේෂ ස්තුතිය පුද කරමි. මෙහි ඇතුළත් කරුණු පිළිබඳව සංවර්ධනාත්මක යෝජනා ඇතොත් මා වෙත ලබා දෙන්නේ නම් කෘතඥ වෙමි.

**විමල් සියඹලාගොඩ**
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, ආගම්, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

# අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

# ලේඛක මණ්ඩලය

| | | |
|---|---|---|
| **උපදේශනය** | : | ආචාර්ය උපාලි එම්. සේදර<br>අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය<br><br>විමල් සියඹලාගොඩ මයා<br>සහකාර අධ්‍යක්ෂ ජනරාල්<br>ආගම්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **අධ්‍යක්ෂණය** | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>අධ්‍යක්ෂ (ආගම්) ජාතික අධ්‍යාපන ආයතනය. |
| **විෂය උපදේශකත්වය** | : | ආචාර්ය එම්. ඒ.එම්. ෂුක්රි,<br>අධ්‍යක්ෂ, නලීමියා ඉස්ලාමීය ආයතනය, බේරුවල.<br>අෂ්ෂේක්, ඒ. සී. අගාර් මුහම්මද්,<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ, නලීමියා ඉස්ලාමීය ආයතනය,බේරුවල.<br>අෂ්ෂේක්, එම්. එස්. එම්. අබ්දුල් බාරි<br>ඉස්ලාමීය ශිෂ්ටාචාර දෙපාර්තමේන්තුව,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය.<br>මව්ලවි එම්. එච්. එම්. ලාෆිර්,<br>නියෝජිත, ජම්ඉය්යතුල් උලමා සභාව |
| **සම්බන්ධීකරණය** | : | එස්. එම්. ආර්. සුදීන්<br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **ලේඛක මණ්ඩලය** | : | එම්. එච්. එම්. නාලිර්<br>අෂ්ෂේක් එම්. එච්. එම්. බුහාරි<br>අෂ්ෂේක්, ඒ. පී. එම්. අබ්බාස්<br>අෂ්ෂේක්, ඒ. සී. සාජහාන්<br>අෂ්ෂේක් එම්.එම්. ෆස්ලූර් රහ්මාන්<br>අෂ්ෂේක් එස්. එම්. එම්. මසාහිර්<br>එම්. එස්. එම්. අනස්<br>එම්. එස්. එම්. බූසරි<br>එන්. ගපුර්දීන්<br>එස්. එම්. ආර්. සුදීන් |
| **සංස්කරණය** | : | එස්. එම්. ආර්. සුදීන්<br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>අෂ්ෂේක් එම්. එච්. එම්. බුහාරි |
| **පරිවර්තනය** | : | එස්. ඒ. සී. එම්. කරාමත්<br>ආචාර්ය එම්. එච්. එම්. නාජිම්<br>එස්. එම්. නෞෆර්<br>එම්. එච්. එම්. යාකූත්<br>එම්.එෆ්.එම්. ෆාහිම් |
| **භාෂා සංස්කරණය** | : | එම්. එච්. එම්. යාකූත් |
| **පරිගණක සැකසුම** | : | නිල්මිණි බටවල |
| **පිටකවරය** | : | එම්. ඩබ්ලිව්. ඒ. අසාර් |

## 1.0 හැඳින්වීම

මිනිසා සමාජානුයෝජනය කරන සාධක අතරෙන් අධ්‍යාපනයට ප්‍රධාන තැනක් හිමි වේ. සමාජානුයෝජන ක්‍රියාවලියේ දී ආගමට වැදගත් තැනක් ලැබේ. එහෙයින් ආගම හා අධ්‍යාපනය අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධවී ක්‍රියා කරයි.

ඉස්ලාම් ජීවන ක්‍රමයක් ලෙස, මුස්ලිම්වරුන්ගේ ජීවිතය ගොඩනැගීම කෙරෙහි ද, ක්‍රියාත්මක කිරීම කෙරෙහි ද, සංවිධානය කිරීම කෙරෙහි ද පූර්ණ බලපෑමක් ඇති කරයි. එය විෂයයක් ලෙස සැලකුව ද, ජීවිතය සඳහා වූ මඟ පෙන්වීමක් ලෙස ඉගැන්විය යුතු ය. පොදුවේ මිනිස් සමාජය ද විශේෂයෙන් තරුණ පරම්පරාව ද ආගම බැහැර කරමින් ජීවත් වන අද වැනි යුගයක ආගමේ අවශ්‍යතාව ද, වැදගත්කම ද, සිසුන්ගේ සිත් තුළ ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ සඳහා සකස් කර ඇති මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගුරුවරුන්ගේ දායකත්වය කාර්යක්ෂම වීම අවශ්‍ය ය. මෙය සිද්ධාන්තමය වශයෙන් පමණක් නොව ක්‍රමවේද, ආදර්ශ වැනි ක්‍රම මගින් ද ඉදිරිපත් විය යුතු ය.

බහු වාර්ගික සමාජයක සුළුතර සමාජයක් ලෙස ජීවත්වන අපට ඉස්ලාම් විෂය උපදේශනය ඉස්ලාමයේ අනන්‍යතාව රකින අතර අන් ආගම් සමඟ අන්‍යෝන්‍ය අවබෝධයෙන් ජීවත් වීමට මඟපාදන එකක් ද විය යුතු ය. ඒ නිසා බහුවාර්ගික සමාජ පිළිබඳ ව දැනගැනීමට අවස්ථාවක් මෙම විෂය නිර්දේශය තුළින් ලබා දී ඇත.

ආගම, කලා විෂය ධාරාවට අයත් විෂයයක් ලෙස සලකනු ලැබුව ද ජීවිතයට සෘජුව සම්බන්ධ වන කරුණු එහි ඇතුළත් හෙයින් සියළු අංශවල සිසුන් ආගම විෂයය කෙරෙහි, විශේෂයෙන් ඉස්ලාම් විෂය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය. ඉස්ලාම් උගන්වන ගුරුවරුන්ගේ කැපවීමත් නොමසුරු වෑයමත් මේ සඳහා අවශ්‍ය වන්නේ ය. ඒ අනුව විෂයය උගන්වන ගුරුවරුන්ගේ පූර්ණ කැපවීමත් දායකත්වයත් අපේක්ෂා කෙරේ.

මෙම විෂයය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුළුල් ලෙස ගවේෂණ කාර්යයේ යෙදිය යුතු අතර සිසුන්ගේ දැනුම කුසලතා ආකල්ප සහ ක්‍රියා කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරන ක්‍රියා මාර්ග භාවිතා කළ යුතු වේ. මෙමඟින් ඉස්ලාමීය දැනුම, පුහුණුවෙන් හෙබි සිසු පරපුරක් ඇති කිරීමට හැකි වන අතර රටට වැඩදායී පුරවැසියන් ලෙස ඔවුන් බිහි කර ගැනීමටත් හැකි වේ යැයි අප තරයේ විශ්වාස කරමු.

**ලේඛක මණ්ඩලය**

# පටුන

පිටුව


- පෙරවදන
- සංඥාපනය
- ග්‍රන්ථ ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය
- හැඳින්වීම
- ලේඛක මණ්ඩලය
- විෂය කරුණු අවබෝධ කර ගැනීමට අත්වැලක්
- පාසල් පාදක ඇගයීම - හැඳින්වීම
- පාසල් පාදක ඇගයීම් උපකරණ

**නිපුණතාව 7.0 : ඉස්ලාමයේ සම්භවය හා වර්ධනය පිළිබඳව ද ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දීම පිළිබඳව ද වටහාගෙන ප්‍රකාශ කරයි.**

**නිපුණතා මට්ටම 7.1** : ඉස්ලාමයේ බිහිවීම හා වර්ධනය පිළිබඳ ව වටහාගෙන එහි පූර්වාදර්ශ ගෙන හැර දක්වයි.

**කාලය** : කාල පරිච්ඡේද 25

**ඉගෙනුම් ඵල** :

- ඉස්ලාම් බිහිවී වර්ධනය වූ පසුබිම වටහාගෙන ඉස්ලාමයේ අවශ්‍යතාව සවිස්තරව දක්වයි.
- ඉස්ලාම් හි ආගමික, සමාජ, දේශපාලන වර්ධනයෙහි මට්ටම් ඓතිහාසිකව විස්තර කර රචනා ලියයි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

### නබි (සල්) තුමාණන්ගේ කාලයේ ඉස්ලාමයේ සම්භවය හා වර්ධනය

- ඉස්ලාම් යනු මිනිසාගේ සම්භවය සමඟ ආරම්භ වුණු එක් ජීවන ක්‍රමයකි. සෑම නබිවරයෙකුම දේශනා කළේ ඉස්ලාමයයි. සෑම නබිවරුන්ගේ දීනය ඉස්ලාමය වන්නේ ය. එහෙත් කාලයට හා සමාජ පරිසරයට අනුව එම දීනයන්හි ෂරිආ වෙනස් වූයේය. ඉස්ලාමයේ දීන් ස්ථාවර වූ ද, ෂරිආව කාලයට හා පරිසරයට නම්‍ය වූ ද විය. නබි (සල්) තුමාගේ කාලය සමඟ ෂරිආව ස්ථාවර විය. එම නිසා අල්ලාහ් වෙත අනුමත ආගම් ඉස්ලාම් (3:19) යැයි ද, පෙර නබිවරුන් මෙන් ම නබි (සල්) තුමාට ද ෂරිආව ලබා දුන් බව ද (5:48) අල්කුර්ආන් පවසයි.

- මෙහිදී අප සැලකිල්ලට ගනුයේ නබි (සල්) තුමාගේ කාලයේ හඳුන්වා දෙන ලද ෂරිඅතයට අනුව ඉස්ලාම් ගැනය.

- නබි මුහම්මද් (සල්) තුමා ක්‍රි.ව. 6 වන ශතවර්ෂයේ , 7 වන දශකයේ දී ඉපැදුණහ. එතුමාගේ රිසාලතය 7 වන ශතවර්ෂයේ ප්‍රථම දශකයේ දී බිහි විය.

- නබි (සල්) තුමාට පෙර ලෝකයේ ආගම් බොහොමයක් විය. එයින් සමහරක් වහී මගින් අල්ලාහ් විසින් පහළ කරනු ලැබූ ඒවා ය. ඒවායින් තව්රාත්, සබූර්, ඉන්ජීල්, යන ඒවා අප දන්නා ඒවා ය. තවත් සමහරක් අල්ලාහ් විසින් පහළ කරනු නොලැබූ ඒවා ය. උදාහරණ ලෙස මිනිස් චින්තනවලින් බිහි වූ සමන, සොරස්ට්‍රියම, කොන්ෆියුසියම වැනි ආගම් සඳහන් කළ හැකිය. එහෙත් ඒවා මිනිසා නිර්මාණය කළ ආගම් නිසා අඩුපාඩුකම් සහිත විය. අල්ලාහ් විසින් පහළ කරනු ලැබූ ආගම් පවා රසූල්වරුන්ගේ අභාවයෙන් පසුව මිනිස් බලපෑම නිසා වෙනස්කම්වලට භාජනය විය. නැගෙනහිර හෝ බටහිර වහී මගින් පහළ කරනු ලැබූ ආගම් විනාශයට භාජනය වූ ස්වභාවයත්, අදහස් කිහිපයක් සමඟ සහ සම්ප්‍රදායයන් සමඟ පිළිවෙත් ලෙසින් පමණක් පවතින්නේ ය.

- ඒ අතර අල්ලාහ් විසින් පහළ කරනු ලැබූ ආගම් සම්බන්ධයෙන් ඒවා ජාතික ආගම් විය. රෝම අධිරාජ්‍යය බිහිවී වර්ධනය වීමට කලින් රටවල් සියල්ලම වෙන් ව පැවතිනි. මුහුදු, කඳු, කැලෑ, කාන්තාර, යනාදිය පසුකර යා හැකි උපකරණ දක්නට නොතිබූ නිසා නැතහොත් ඒ සඳහා වන දැනුම නොලැබීම නිසා රටවල් වෙන් වෙන් ව පැවතිනි. එසේ වෙන් ව පැවති රටවලට වෙන් වෙන් ආකාරයේ ආගම් පහළ කෙරුණි. මේ නිසා සමකාලීනව නබිවරු සේවය කළ බව දකින්නෙමු.

ඉබ්රාහිම් (අලෛ) ලූත් (අලෛ) එකම කාලයේ වෙන් වෙන් ප්‍රදේශවල සේවය කළහ. ඊසා (අලෛ) තුමා හා යහ්යා (අලෛ) තුමා ෂම්ඌත් (අලෛ) (34:14) අය ද එකම කාල වකවානුවේ ජීවත් වූහ. (34:14)

- රෝම අධිරාජ්‍යය ව්‍යාප්ත ව පැවති අවධියේ දී දේශපාලන හමුදාමය හා වෙළෙඳ අරමුණු සඳහා පාරවල් තනන ලදී. පාලම් තනන ලදී. මේ නිසා සීමා සහිත පෙදෙසක හිරවී සිටි සමාජ එකිනෙකට සම්බන්ධ විය. එක් භාෂාවක් අන් අය දැන ගැනීමටත්, එක් පිරිසකගේ ජීවන ක්‍රමය වෙනත් අය දැන ගැනීමේ අවස්ථාවත් උදාවිය. මෙවැනි රටවල් අතර සම්බන්ධය අන්තර් ජාතික නබිවරයෙකු බිහිවීම පුරෝකථනය කළේය. මේ නිසා නබි (සල්) තුමා මුළු මනුෂ්‍ය සංහතියටම අයත් නබිවරයා ලෙස ද (7:158) අවසන් නබිවරයා ලෙස ද (33:40) ලෙස පහළ කරනු ලැබූහ. එතුමාට ෆුර්කාන් යන නමින් වූ ආගමක් පහළ කරන ලදී. එහි දීනය කලින් පැවති ආගම් අනුකරණයට කලාවූත්, ෂරීආව කාලයට අදාළව ද පහළ විය.

- සම්පූර්ණ වූ දීනය ලබාදීමට සුදුසු ස්ථානය ලෙස අරාබි රට පැවතීම එදා පැවති ලෝකයේ මධ්‍ය ස්ථානයේ පිහිටා තිබීම, රෝම, පර්සියානු අධිරාජ්‍යයන්ගේ බලපෑමට යටත් නොවී විදේශීය සංස්කෘතීන් නිසා කෙලෙසීමට භාජනය නොවූ සංස්කෘතියක් අරාබිය සතුවීම, අරාබිවරුන් සතු වූ නිදහස් හැඟීම, චාම් බව, වීරත්වය, පොරොන්දු කඩනොකිරීම, අමුත්තන්ට සැලකීම, භාෂා ලැදියාව වැනි ලක්ෂණ ඉස්ලාම් බිහිවීමට සුදුසු පරිසරයක් ඇති කළේය.

- ජනයාට දීර්ඝ කාලයක් තිස්සේ හුරු පුරුදු කඃබාව යන දීර්ඝ කාලයක් පැවැති දේවස්ථානය පිහිටා තිබීම, ඉස්ලාම් ප්‍රකාශ කිරීමට අදහස් කරන අදහස ඉදිරිපත් කිරීමට තරම් දියුණු බසක් ව අරාබි බස තිබීම, එම භාෂාව කෙරේ ඔවුන්ගේ ලැදියාව නිසා එය සංවර්ධනය කිරීමට උවමනාවක්, අරාබීන් සතුව තිබීම, ආදිය මෙසේ ඉස්ලාම් අරාබියේ බිහිවීමට මුල් වූ සාධක වන්නේ ය.

- ඉස්ලාමයේ ආගමික, සමාජ හා දේශපාලන සංවර්ධන පියවර තුනකට බෙදා සැලකිය හැකිය.
  1. නබි (සල්) තුමාගේ මක්කා ජීවිත කාලය (වසර 13 ක්)
  2. නබි (සල්) තුමාගේ මදීනා ජීවිත කාලය (වසර 10 ක්)
  3. කුලෆා උර් රාෂිදින්වරුන්ගේ කාලය (වසර 30)

- නබි (සල්) තුමාගේ මක්කා ජීවිත කාලය (වසර 13) ආගමික දියුණුව, මෙයට ඉස්ලාමයේ දේශනයට අදාළ කරුණු ඉදිරිපත් කෙරිණි. නබි (සල්) තුමා නබි ලෙස පත් කරනු ලැබූ විට, අල්ලාහ්ගේ දූත මෙහෙය ජනතාවට ළඟා කිරීමේ වගකීම ඔවුන් සතු විය. එය නබි (සල්) තුමා ආකාර තුනකින් ඉදිරිපත් කළහ.
  i. නෑයන් සංග්‍රහවලට ආරාධනා කර ඉස්ලාමය හඳුන්වා දීම.
  ii. සෆා කඳුගැටය මත නැඟ මහජනතාව එහි පාමුල එක්රැස් කර ඉස්ලාමය හඳුන්වා දීම.
  iii. තනි පුද්ගලයන් හමුවී ඉස්ලාමය හඳුන්වා දීම.

  මෙහිදී ඉස්ලාමයේ පදනම් තුනකට වැදගත්කමක් දෙන ලදී.

  1. තව්හීද් - අල්ලාහ් හැර වෙනත් නැමදීමට සුදුස්සෙක් නැත. ෂිර්ක් මුළුමනින්ම අනිවාර්යෙන් ම නැති කිරීම.

  2. රිසාලත් - නබි (සල්) තුමා අල්ලාහ්ගේ දූතයා ලෙස ගෙන හැර දැක්වීම. එතුමාට වහී මගින් දැනුවත් කරන බව ගෙන හැර දැක්වීම. එතුමා අනුගමනය කරන ලෙස ඉල්ලීම.

3. මආද් - කියාමාව ඇත. එහි දී මෙලොව ක්‍රියාවන්ට තෑගි හා දඬුවම් හිමිවේ. දඬුවම නිරයේදී ද, තෑගි ස්වර්ගයේදී ද හිමි වේ.

මෙම මූලික සිද්ධාන්ත තුන පිළිගත් පුද්ගලයින් රැස්කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළහ. එතුමා අනුගමනය කළ ප්‍රථම ක්‍රම දෙක අතහැර තුන්වන ක්‍රමය වූ තනි පුද්ගලයින් හමු වී දෑවා කිරීම කෙරෙහි වැඩි කාලයක් ගත කළහ. නිදහස් පුරුෂයින් හා වහලුන් බොහෝ දෙනෙකු එතුමා සමඟ එක්වූහ. ඉස්ලාම් බිහිවීමට පෙර හවනබිය චින්තනය කෙරෙහි විශ්වාස තැබූ අය ද නබි (සල්) තුමාගේ දෙසුම් ආකර්ශණය කළේය. සමාජයේ සැදැහතුන් ලෙස සලකනු ලැබූවන් උසස් පවුල්වලට අයත් අය, ඉස්ලාමයට සම්බන්ධ වීම එය බලවත් දෙයක් විය. බොහෝ දෙනා කලින් ආගම්වල දැන්වූ පුරෝකථනයන්, සිහින, අභූත හඬ, මගින් දැනුවත් කිරීම, අල්කුර්ආනයේ භාෂාමය ආශ්චර්යයන්, නබි (සල්) තුමාගේ උත්තම ගුණාංග, කුරෙෂිවරුන්ගේ විරුද්ධ ප්‍රචාරයන් ආදී කරුණු නිසා ද ඉස්ලාමය වැළඳ ගත්හ.

- මෙතුමා සෆා කඳු ගැටයේ පාමුල පසෙක වූ දාරුල් අර්කම් යන නිවසෙහි අධ්‍යාත්මික පුහුණුව ලදහ. එතුමා දීර්ඝ රාත්‍රී කාලීන නැමදුම්වල යෙදුනහ. (සූරා මුසම්මිල්) පාරිසරික බලපෑම් නිසා එතුමා ළඟ ජාහිලිය්‍යා කාලීන දුර්ගුණ නොමැති විය. සත් ගුණයන්වලින් ඔප් නැඟුණාහ. ඉස්ලාමය වෙනුවෙන් කැප කිරීමේ පුරුද්ද වැඩි විය. වසර තුනක් රහසිගත ප්‍රචාරයෙන් පසුව ප්‍රසිද්ධ ප්‍රචාරයන්ගෙන් යෙදුනහ. මේ නිසා නබිතුමාද, නබි (සල්) තුමා අනුගමනය කළ අයද කුරෙෂිවරුන් ගේ දැඩි විරෝධතාවලට ලක් වූහ. ප්‍රථමයෙන් වහලුන් දැඩි තාඩන පීඩනවලට ලක් කරනු ලැබූහ. පසුව නිදහස් පුරුෂයින් ද හුබයිබ් (රළි) කබ්බාබ් (රළි) වැනි අය ද දැඩි ලෙස පහර දෙනු ලැබූහ. සමහරු ඝාතනය කරනු ලැබූහ. මේ නිසා නබිතුමාගේ අණ පරිදි සමහරු හබෂාවලට හිජ්රත් කළහ.

- අනෙක් අතට නබි (සල්) තුමාගේ ප්‍රචාරයන් වැළැක්වීම සඳහා කවියා, ජේන කියන්නා, මානසික රෝගියා යැයි ප්‍රචාරය කළහ. එතුමන්ට ගල් ගැසූහ. එතුමා යන එන මාර්ගවල ගල්මුල් පැතිරවූහ. රෙදිවලින් ගෙළ ගැටගැසූහ. සුජූද් කරන විට දී නරක් වූ බඩවැල් ගෙලෙහි බැන්දහ. කුණු කසල ඇඟ මත හෙලූහ. සමහරවිට පහර දුන්හ. ඝාතනය කිරීමටත් පෙළඹුනහ. මේ එක් වෑයමක්වත් සාර්ථක නොවූ විට අබූතාලිබ් වෙත ගොස් පැමිණිලි කළහ. ප්‍රචාරක කටයුතු නවත්වන ලෙස ඉල්ලා සිටියහ. නොහැකි නම් නබි (සල්) තුමා තමාට බාර දෙන ලෙස ඉල්ලූහ. නබිතුමා සමඟ ඇති සම්බන්ධය නතර කර දමන ලෙස අවවාද කළහ. මේ සියල්ල අසාර්ථක වූ පසු නබි (සල්) තුමා පෞද්ගලිකව හමු වූහ. ඔහුට අවශ්‍ය ඕනෑම දෙයක් දෙන බවත්, ප්‍රචාරය නවත්වන ලෙසත් ඉල්ලූහ. රත්රන්, දේපළ, කාන්තාවන් යන ඉල්ලන දෙයක් දීමට සූදානම් වූහ. තම වියදමින් වෙදකම් කරන බවත් පැවසූහ. නබි (සල්) තුමා මේ කිසිවකට එකඟ වූයේ නැත. එහෙයින් නබිතුමා සමඟ ඇති සම්බන්ධතාවය නැති කිරීම සඳහා සම්බාධක පැනවීය.

- නබි (සල්) තුමා සමඟ ද බනූ හාසිම්, බනූ මුත්තලිෆ් යන ගෝත්‍ර නාමය කිසිවෙක් සම්බන්ධතා පැවැත්විය යුතු නැතැයි ප්‍රසිද්ධ කොට එය කෑබාවේ ලියා එල්ලූහ. වසර තුනක කාලයක් මුළුල්ලේ අවශ්‍ය තරම් ආහාර පානාදිය හා ජලය නොමැතිව නබිතුමා සහ පිරිස දුක් වින්දහ. මෙය ඉවසාගත නොහැකි තරුණයින් පිරිසක් එම ප්‍රකාශනය ඉරා දැමූහ. නබි (සල්) තුමා සහ පිරිස තමා කොටු වී උන් ෂිහ්ගු අබූ තාලිබ් යන මිටියාවතෙන් පිටවූයේ ඉන්පසුව ය. මෙම සිද්ධියෙන් සති කිහිපයකින් පසුව අබූ තාලිබ් වෆාත් වූහ. තව මාස කිහිපයකින් කදීජා (රළි) තුමිය ද වෆාත් වූහ.

- මේ සමඟ සතුරු උවදුරු වැඩිවන්නට විය. එහෙයින් තවත් ප්‍රදේශයක් (තායිෆ්) වෙතට නබි තුමා හිජ්රත් කළහ. එහෙත් එහි පිළිගැනීමක් නොවීය. ඇනුම් බැනුම් සහ ගල්මුල් පහරවල් ලැබුණි. එනිසා නබි (සල්) තුමා නැවත මක්කාවට හැරී ආහ. මුත්ඉම් බින් අතී යන අයගේ ආරක්ෂාව යටතේ පසු වූහ.

- මේ වකවානුවේ දී ඉස්ලාමීය වර්ධනයට හේතු වූ සිද්ධීන් දෙකක් සිදුවිය. මුහම්මද් නබි (සල්) තුමා සහ පිරිස මදීනාවේ පදිංචි වීමට අවස්ථාවක් උදාවිය. අනෙක් සිද්ධිය, කණගාටුවෙන් පසු නබි (සල්) තුමාට සැනසීමක් ගෙන දෙන අයුරින් ඉස්ලාමය ඊළඟ වර්ධන පියවරෙහි, දැනුම ලබන මාර්ගයක් වූ අල්ඉස්රා වල් මිහ්රාජ් යන සිද්ධියයි.

  එහෙත් මෙම කාල පරිච්ඡේදයේ දී හොඳ පෞරුෂය ඇති පුද්ගලයින් නබි (සල්) තුමා වහි කළහ. ඉස්ලාම් යන ගොඩනැගිල්ලේ අත්තිවාරම දැමිය හැකි දියමන්ති ලෙස ඔවුන් පුහුණු කරනු ලැබූහ. කිසිදු පැකිලීමකින් තොරව අවසානය තෙක් ඉස්ලාමය වෙනුවෙන් කැපවීමට හැකි මිනිසුන් ලෙස එම සහාබාවරු හැඩ ගැස්සුනාහ.

- පුආස් යුද්ධයේ දී පරාජයට පත් වූ කස්රජ්වරු යුද පරාජය පැවති කාලය තුළ ශුද්ධ වූ මාසයේ දී කුරෙෂිවරුන්ගේ සහාය ලබාගැනීම සඳහා මක්කාවට පැමිණියහ. ඒ අවස්ථාවේ දී බලාපොරොත්තු නොවූ අයුරින් නබි (සල්) තුමා හමුවූහ. නබි (සල්) තුමා එම ජනතාවට ඉස්ලාමය ගැන පහදා දුන් විට, ඔවුන් ඉස්ලාමය පිළිගත්හ. කලදි අවසාන දූතයා ගැන යුදෙව්වන් මගින් දැන සිටි ඔවුන්, යුදෙව්වන්ට ප්‍රථම තමන් ඉස්ලාමය පිළිගැනීම වාසිදායක බව වටහා ගත්හ. මෙය ආරංචි වූ තවත් 12 දෙනෙක් ඊළඟ වන්දනා කාලයේ දී මක්කාවට පැමිණියහ. අකබා යන ස්ථානයේ නබි (සල්) තුමා හමුවී, ඉස්ලාමය පිළිගත්හ. නබි (සල්) තුමාට පොරොන්දුවක් ද දුන්හ. මෙය ප්‍රථම අකබා පොරොන්දුව නම්.

- මොවුන් මදීනාවට ආපසු ගියවිට, ඉස්ලාමීය දඃවා ඉටු කිරීම සඳහා මුස්අබ් ඉබ්නු උමෙර් (රළි) තුමා යවා තබනු ලැබූහ. මෙය අලුත් දඃවා ක්‍රමවේදයක් විය. එතුමා මදීනාවට පැමිණ එහි ප්‍රභූවරු හමුවූහ. ඉස්ලාමය දේශනා කළහ. සමහරු එය පිළිගත් අතර, තවත් සමහරු එයට විරුද්ධ වූහ. එතුමාගේ නොමඳ වෑයම නිසා මදීනාවේ ඉස්ලාම් සාර්ථක ව හඳුන්වා දෙනු ලැබුණි. ඊළඟ වන්දනා සමයේ 73 දෙනෙක් මක්කාවට පැමිණියහ. නබි (සල්) තුමා මදීනාවට කැඳවාගෙන යෑම මදීනා වාසීන්ගේ අරමුණ විය. ඔවුන් අකබාවේ නබි (සල්) තුමා රාත්‍රී කාලයේ හමු වූහ. දෙවන අකබා පොරොන්දුව දුන්හ.

- නබි (සල්) තුමා තම දිවිහිමියෙන් රකින බව ඔවුන් පොරොන්දු වූහ. අල්ලාහ්ගේ අවසරය ලැබෙන තෙක් ඉවසන ලෙස නබි (සල්) තුමා පැවසූහ. ඔවුන්ගෙන් 12 දෙනෙක් නකීබ්වරු තෝරා ගනු ලැබූහ. මෙයින් පසු කුරෙෂිවරුන්ට නොදැනෙන සේ කුඩා කණ්ඩායම් ලෙස මුස්ලිම්වරු මදීනාවට ගියහ.

- අබුබක්කර් (රළි) තුමාව පමණක් නබි (සල්) තුමා නවතා ගත්හ. මෙය දැනගත් කුරෙෂිවරු එතුමා ද මදීනාවට යෑම වැළැක්වීම සඳහා නබි (සල්) තුමා මරා දැමීමට තීරණය කළහ.

- රාත්‍රී කාලයේ නබි (සල්) තුමාගේ නිවස වට කළහ. අල්ලාහ් නබි (සල්) තුමාට ගෙයින් පිටවන ලෙසට දැන්වූයේ ය. සතුරන්ට නොදැනෙන සේ තම නිවසින් පිටත් ව අබුබක්කර් (රළි) තුමාගේ නිවසට ගියහ. එහි සිට රාත්‍රියේම පිටත් වී දකුණු දිශාවට ගමන්කොට හිරු උදාවීමට පෙර තව්ර් ගුහාවේ නැවතුණහ. දින තුනක් එහි රැඳී සිටි කාලයේ දී අබුබක්කර් (රළි) තුමාගේ පවුලේ අය විවිධ අයුරින් උදව් කළහ.

අනෙක් අතට කුරෙෂිවරු පාරවල් දිගේ සොයා ඇවිද්දාහ. තෞර් ආසන්නයට පැමිණි විට, අප දෙදෙනා පමණයි සිටින්නේ යැයි බිය වූහ. නැත, අල්ලාහ් ද අප සමඟ සිටී යැයි නබි (සල්) තුමා ධෛර්යමත් කළහ. අල්ලාහ් මකුළුවෙකුගේ මාර්ගයෙන් හා පරෙවියන් දෙදෙනෙකුගේ මාර්ගයෙන් ඔවුන් බේරා ගත්හ. පසුව විකල්ප මාර්ගයක් ඔස්සේ මදීනාවට ගියහ. මදීනාවට ආ නබි තුමාවද අබූබක්කර් (රළි) තුමාවද ජනතාව ඉතා සතුටින් පිළිගත්හ. මෙම ගමන හිජ්රත් නම් වේ. මෙය හදිසියේ සිදුවූ සිද්ධියක් නොව නබි (සල්) තුමා සැළසුම් කර ගිය ගමනකි.

**සමාජ සංවර්ධනය**

- ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ අවස්ථාවේ දී නබි (සල්) තුමා සමඟ කදීජා (රළි) තුමිය ද, අබූබක්කර් (රළි) තුමා ද, අලි (රළි), සෙයිද් (රළි) තුමා ද යන සතරදෙනාම ඉස්ලාමය පිළිගත්හ. ඉන්පසු අබූබක්කර් (රළි) තුමාගේ වෑයම නිසා එතුමාගේ මිතුරන් බොහෝ දෙනෙක් ඉස්ලාමය වැළඳ ගත්හ.

  මෙසේ ඉස්ලාමය පිළිගත් පුද්ගලයින් 40 දෙනෙක් වීමට අවුරුදු 5 ක් ගතවිය. හම්සා (රළි) තුමා ද, උමර් (රළි) තුමා ද ඉස්ලාමය පිළිගත්තේ මේ කාලයේදී ය. එතෙක් රහසින් කඃබාවට ගිය මුස්ලිම්වරු ප්‍රසිද්ධියේ යෑමේ අවස්ථාව උදාවිය. ක්‍රම ක්‍රමයෙන් ඉස්ලාමය පිළිගන්නා අයගේ සංඛ්‍යාව වැඩි වුව ද, සමාජයක් වශයෙන් සඳහන් කළ හැකි ආකාරයෙන් ජනතාවගේ සංඛ්‍යාව වැඩි වූයේ නැත.

- පොදුවේ සමාජය යනුවෙන් පවසන විට ජනතාවගේ සංඛ්‍යාව පමණක් සැලකුව ද, සමාජයක් බිහිවීමට කරුණු 4 ක් අවශ්‍ය ය.

  1. ජනතාව
  2. ජනතාව ඒකරාශී කළ හැකි පොදු අංගය. එය භාෂාව හෝ ජාතිය හෝ ආගම හෝ ප්‍රතිපත්තිය හෝ විය හැක.
  3. එම ජනතාව මෙහෙයවන නායකත්වය.
  4. එම ජනතාව නිදහසේ ජීවත් විය හැකි ප්‍රදේශයක් හෝ භූමියක්

  මෙහි පළමු අවශ්‍යතා තුන තරමට හෝ තිබුණ ද, හතරවන අංගය නොතිබුණි. එහෙයින් මක්කාවේ ඉස්ලාමීය සමාජයක් පැවති බව අපට කිව නොහැක. නබි (සල්) තුමා වැඩි අවධානයක් යොමු කළා විය හැකිය.

- එය ඉස්ලාමයේ මුල් කාලය වූ නිසා ඉස්ලාමීය දෙසුම් හා අල්කුර්ආනයේ වචන මිනිසුනි යැයි කතා කරන ස්වභාවය සහිත විය. ඊමානය පිළිබඳ කරුණු ඉතිහාසය තුළින් ඉදිරිපත් කරන ලදී. කුරෙෂිවරුන්ගේ තාඩන පීඩනවලට භාජනය වූවන් ලෙස ජීවත් වූහ. නබි (සල්) තුමා ලබාදුන් ආධ්‍යාත්මික පුහුණුව තස්කියතුන් නෆ්ස් මගින් ඔවුන්ගේ සිත් සකස් කරනු ලැබ තිබූ නිසා සුළු ජන කොටසක් යැයි ඔවුන් බිය වූයේ නැත.

- මෙයට තවත් හේතුවක් ලෙස මුස්ලිම්වරු හා කාෆිර්වරු අරාබීන් යන එකම ජාතිකයන් වීමත්, ආසන්න හා දුර නෑයන් වීමත්, එකම ගෝත්‍රයට අයත් පිරිසක් වීමත් බව පැවසිය හැකිය. සමූහ වශයෙන් ක්‍රියා කිරීමට තරම් ජනගහණයක්, ආරක්ෂාව, බලය නොමැති නිසා සමූහ යාච්ඤා අනිවාර්ය කරනු නොලැබූ බව සිතිය හැකිය. මෙම කාලයේ දී සුන්නත් ලෙස ද ෆර්ල් ලෙස ද මුස්ලිම්වරු නැමදුමේ යෙදුණාහ. සදකා දුන්හ. සුන්නත් වූ සව්ම් ඉටු කළහ. අල්කුර්ආන් වාක්‍ය වනපොත් කළහ. උසුරුෑහ. සුන්නාව අනුගමනය කළහ. එහෙත් මදීනාවට යන තෙක් මේවා ෆර්ල් නොවීය. සමූහ වශයෙන් ඉටු කිරීම අණ කරනු ලැබූයේ ද නැත.

## නබි (සල්) තුමාගේ මදීනා ජීවිතය

### ආගමික වර්ධනය

මක්කා යුගයේ දී නබි (සල්) තුමා තනිව ඉදිමින් ඉස්ලාමය ප්‍රචාරය කළහ. එහෙත් මදීනා කාල වකවානුව ආරම්භයේ දී මදීනාවේ ජනතාවට ඉස්ලාමය පිළිබඳ ව හඳුන්වා දීමක් ලැබුණි.

- මදීනාවේ ජීවත් වූ යුදෙව්වන් මගින් මදීනා ජනතාව අවසාන දූතයාණන් පිළිබඳ තොරතුරු ලබාගෙන සිටියහ. නිබුව්වත් 10 දී නබි (සල්) තුමාට හමු වූ හයදෙනෙකු මගින් ද, නුබුව්වත් 11 දී නබි (සල්) තුමා හමු වූ 12 දෙනෙක් මගින් ද විශේෂයෙන් නුබුව්වත් 11 දී මදීනාවට පැමිණි මුස්අබ් ඉබ්නු උමෙයිර් මගින් ද, ඉස්ලාම් පිළිබඳ දැනුම මදීනාවේ ජනතාවට ලැබී තිබුණි. එහෙත් මක්කාවේ ඉස්ලාමය ප්‍රචාරය කිරීම සඳහා පිරිසක් තුන් වසරක රහස්‍ය ප්‍රචාරය මගින් එක්රැස් කිරීම වැන්නක් මදීනාවේ අවශ්‍ය නොවීය. එහෙයින් මදීනාවට පැමිණි නබි (සල්) තුමා ඉතා ආදර ගෞරවයෙන් පිළිගනු ලැබූහ. සෑම මදීනාවාසියෙකුම නබි (සල්) තුමා තම නිවසේ රැඳී සිටිය යුතු යැයි බලාපොරොත්තු වූහ.

- මක්කාවේ දාරුල් අර්කම් තිබුණාක් මෙන් මදීනාවේ නිවසක් තිබීම අවශ්‍ය නොවීය. මදීනාවට පැමිණීමට පෙරම කුබාහි නබි (සල්) තුමා විසින් මස්ජිදයක් ගොඩනගන ලදී. ජමාඅත් සලාතය අනිවාර්ය කරනු ලැබීම මෙයට හේතු වූවා විය හැකිය. කුබාහි හා මදීනාව අතර ගමන් කළ අවස්ථාවේ දී, ජුම්ආ සලාතය ඉටු කෙරුණි.

  මදීනාවට ඇතුළු වූ විට, ඉදිකළ මස්ජිදය මස්ජිදුන් නබවි යැයි හඳුන්වන ලදී. නබි (සල්) තුමා මදීනාවට පැමිණීමට පෙර එම නගරය යත්රිබ් නම් විය. නබි (සල්) තුමා එහි වාසයට පැමිණි පසු මදීනතුන් නබි යැයි නම් කෙරුණි. මෙය පසුව මදීනා යැයි කෙටි වුණි.

- මක්කාවේ මස්ජිදයක් ඉදිනොකළ නබි (සල්) තුමා මදීනාවේ මස්ජිදය ඉදිකළේ ඇයි? මෙයට පිළිතුරු දෙකක් දිය හැකිය. මක්කාවේ කෑබතුල්ලාහ් පිහිටා තිබූ නිසා එහි තවත් මස්ජිදයක අවශ්‍යතාවයක් ඇති නොවීය. එහෙත් මදීනාවේදී ජමාඅත් ලෙස සලාතය ඉටු කිරීමට පොදු ස්ථානයක් අවශ්‍ය වීමයි.

- නබි (සල්) තුමා සමු සලාත ඉටු කිරීම සඳහා වන ස්ථානයක් පමණක් නොව, එය එක් සමාජ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක කළහ. මක්කාවේ දී ඉස්ලාම් ඒක පුද්ගලික ආගමක් විය. මදීනාවේ එය සමාජයේ මාර්ගයක් වූයේය, යන අදහස මෙයින් ඇති වන්නේ ය.

  මස්ජිදුන් නබවිය මගින් සමාජයේ විවිධ අවශ්‍යතා ඉටු කෙරුණි. ජනතාව ඒකරාශී කිරීම, ජනතාවගේ අවශ්‍යතා ගැන සොයා බලා ඉටු කළේය. අධ්‍යාපනය ලබා දුන්නේ ය. සාකච්ඡා පවත්වන ලදී. මුදල්මය හා නීතිමය අවශ්‍යතා ඉටු කෙරුණි. සමාජයේ ආරක්ෂක අවශ්‍යතාවය ඉටු කළේය. මෙසේ බලන විට ඉස්ලාම් ආධ්‍යාත්මික ආගමක් පමණක් නොව ලෞකික ආගමක් යන්න ද පැහැදිළි වන්නේ ය.

  නබි (සල්) තුමාගේ කාලයත් සමඟ ඉස්ලාම් අවසන් වන්නක් නොවේ. එය කියාමාව දක්වා පැවතිය යුතුය. එසේ පැවැතීමට නම්, එය තනි පුද්ගල ආගමක් ලෙස නොව සමාජ ආගමක් ව ක්‍රියාත්මක විය යුතු ය. එහි පදනම ලෙස, ජමා අත් හා ජුම්ආ සලාත, මාසයක දී මුස්ලිම්වරු සියල්ලන්ම සවිමය ඉටු කිරීම එක් ව සකාත් දීම වැනි ඒවා ෆර්ල්වූ ද, අන්තිමට ෆර්ල් වූහජ් ද මෙයට එක් කළ හැකිය.

මක්කා ජීවිත කාලයේ සඳහන් කළාට වඩා පුළුල් වූ ව්‍යුහයකින් විනය පිළිබඳ දේශනා මදීනා ජීවිත කාලයේ දී පැවැත්විණි. සුරතුන් හුපුරාත් හි මෙය හඳුනාගත හැකිය. ඉස්ලාම් තනි පුද්ගල ආගමක් ව පැවති අවධියේ දී විනය නීති පමණක් සෑහෙන්නක් විය. එහෙත් එය සමාජමය ආගමක් වූ පසු නීති රීති අවශ්‍ය විය. එහෙයින් අල්කුර්ආනයේ මදනී ආයත මගින් නීති රීති පිළිබඳ පහදා දීම් ලබා දෙන ලදී. හලාල් හරාම් පිළිබඳ පහදා දීම් ලබා දුනි.

- කලින් ඉස්ලාම් අන්තර් ජාතික ආගමක් යැයි පැවසුවෙමු. එම අන්තර්ජාතික ස්වභාවය තහවුරු කිරීමක් ලෙස, මදීනා ජීවිත කාලයේ දී, විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. පළමුව බයිතුල් මක්දසය දෙසට බලා සලාතය ඉටු කරන ලදී. පසුව කෑබාව දෙසට හැරී සලාතය ඉටු කරන ලදී. මක්කාවේ හෝ වේවා ලොව අන් ඕනෑම තැනක හෝ වේවා සිටින පුද්ගලයින් මක්කාවේ පිහිටි කෑබාව දෙසට හැරී සලාතය ඉටු කළ යුතුය.

- සලාතය සඳහා කැඳවුම අරාබි බසින් විය යුතුය. සලාතයේ භාෂාව අරාබි භාෂාව විය යුතුය. සලාතය ඉටු කරන ආකාරය ද, කුමන ස්ථානයක හෝ කුමන කාලයක හෝ ජීවත් වන්නන් වුව ද එකම ආකාරයෙන් විය යුතුය. සලාතය සඳහා ඉදිකරන මස්ජිදවල මූලික හැඩය ද සමාන විය යුතුය. මෙවැනි අන්තර්ජාතික තත්ත්වයක් මදීනා කාලවකවානුවේදී ම හඳුන්වා දෙන ලදී. එහෙයින් හජ් වගකීම ද එකම ස්ථානයේ එකම දිනවල එකම ව්‍යුහය අනුව ඉටුවීම සඳහා ක්‍රම හජ්ජතුල් විදා මගින් සහතික කෙරුණි.

- මෙවැනි ක්‍රියාමාර්ග අල්කුර්ආනය මගින් අවස්ථානුකූල ව ගෙන හැර දක්වන ලදී. අල්කුර්ආනය කෙටියෙන්, නැතහොත් ප්‍රතිපත්තියක් ලෙස හෝ සංකේතාත්මක ව ඉදිරිපත් කළ ඒවා නබි (සල්) තුමා විස්තරාත්මක ව විවෘත ව ක්‍රියාකාරකම් මගින් සුන්නා මගින් පහදා දුන්හ. නව ගැටලු ඇතිවන විට හා පැරණි සම්ප්‍රදායයන් ඉවත් කරන විට අවශ්‍ය පහදාදීම් අල්කුර්ආනය සහ සුන්නාහ් මගින් මෙම කාල වකවානුවේ දී වැඩි වශයෙන් ලබා දුන්නේ ය.

ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ මුල් කාලයේ දී නබි (සල්) තුමා සෘජුව දෑවා කාර්යයෙහි යෙදුනහ. සමහර අවස්ථාවල සහබාවරු ද එම කාර්යයේ යෙදුනහ. මේවා බොහෝවිට වාචික ව සිදුවිය. කනින් අසන ලදී. එහෙත් මදීනා කාල වකවානුවේ දී නබි (සල්) තුමා ප්‍රචාරක කටයුතුවල යෙදුණේ, සංදේශ මගිනි. තනි පුද්ගලයින් ගෝත්‍රික නායකයන් හමුවීම අඩු විය. යුවරාජවරු හා අධිරාජ්‍යවරු ඉස්ලාමය වෙතට ආරාධනා කිරීම මදීනා යුගයේ දී ආරම්භ විය. රෝම හා පර්සියානු අධිරාජයාණන් වරුන්ට ද, නජ්ජාසි මුලෙකස් වැනි රජවරුන්ට ද ආරාධනා කෙරුණි. ඒ සඳහා සංදේශ හෝ දූතවරු යොදා ගන්නා ලදී.

**සමාජ වර්ධනය**

- ඉහතින් සඳහන් කළාක් මෙන් සමාජය ගොඩනැගීම සඳහා අවශ්‍ය බිමක් නබි (සල්) තුමාට ලැබුණේ හිජ්රතයෙන් පසුවය. එහෙයින් හිජ්රතයෙන් පසුව මදීනාවේ මුස්ලිම්වරු පිළිබඳ සංගණනයක් පැවැත්වූහ. මක්කාවේ සුළු ජනකොටසක් ව ජීවත් වූ ජනයා මදීනාවේ දී ප්‍රධාන ජන කොටස බවට පත් වූහ. මක්කාවේ සිටියේ අරාබි මුස්ලිම්වරු පමණි. අරාබි නොවන අය සිටියේ ඉතා සුළු සංඛ්‍යාවක් පමණි. මදීනාවේ යුදෙව්වන් සිටියහ. මොවුන් ජාතියෙන් පමණක් නොව ආගමින්ද වෙනස් වූ පිරිසක් වූහ. මක්කාවේ මුස්ලිම්වරුන්ගේ සතුරන් වූයේ කුරෙෂිවරු පමණි. මදීනාවේ යුගයේ දී කුරෙෂිවරුන්ගේ විරෝධතාවලට අමතරව, යුදෙව්වන්ගේ විරෝධතා ද ඇතිවිය. අලුතින් බිහිවූ මුනාෆික්වරුන්ගේ රහසිගත විරෝධතා ද විය. මක්කාවේ මෙන් මදීනාවේ වූයේ ද ගෝත්‍රික සමාජ ක්‍රමයකි. එය අරාබිවරුන් අතර පමණක් නොව යුදෙව්වන් අතර ද විය.

- එහෙත් මදීනාවේ ඉස්ලාම් බිහි කළ සමාජය ගෝත්‍රික සමාජයක් නොව, ප්‍රතිපත්තිය පදනම් වූ සමාජයක් විය. මෙය අල්කුර්ආනය ගෙනහැර දක්වයි. (49:13) එහෙයින් සෑම මුස්ලිම්වරු සහෝදරයින් බව අල්කුර්ආනය ද සුන්නාහ්ව ද පෙන්වා දෙයි. නබි (සල්) තුමා මුස්ලිම් සමාජය සිරුරේ අවයවවලට හා ගොඩනැගිල්ලක ගඩොල්වලට සමාන කර දැක්වූහ. මෙමගින් සමාජයේ සාමාජිකයන්ගේ එක්සත්කම, ඒකීයත්වය, අන්‍යෝන්‍ය සහයෝගය, උපකාරය, ආරක්ෂාව වැනි ඒවා අවධාරණය කෙරේ.

- මේවා නිර්මාණය කරන නැතහොත් සංවර්ධනය කරන කාර්යයන් මස්ජිදුන් නබවි මගින් සිදු කෙරුණි. අදාන් හඬ අසා මස්ජිදයට රැස්වීම මගින් මුස්ලිම්වරු සියල්ලන් ම එක හඬට අවනත වීමේ පුරුද්ද ඇති කරයි. ජමාඅත් සලාතය ජනයා අතර දක්නට ලැබෙන උස් පහත්කම් ඉවත් කරන්නේ ය. ජමාඅතය සඳහා ඉමාම්වරයෙකු තෝරා ගැනීම,සමාජයට නායකයකු තෝරා ගැනීමේ ක්‍රමය පෙන්වා දෙයි. ඉමාම්වරයාට අවනතව සලාතයේ දී ක්‍රියා කිරීම නායකත්වයට අවනත ව සමාජය ක්‍රියාකිරීමේ පුරුද්ද ලබාදෙන්නේ ය.

- මස්ජිදය ආධ්‍යාත්මික ක්‍රියාකාරකම් වන සලාතය, තිලාවතුල් කුර්ආන්, (ඉඃතිකාෆ්) ආදිය සඳහා වූ ස්ථානයක් පමණක් නොව, ලෞකික ක්‍රියාකාරකම් සඳහා වූ ස්ථානයක් ලෙස ද, ක්‍රියාත්මක විය යුතු බව මස්ජිදුන් නබවියේ ක්‍රියාකාරකම් ගෙනහැර දක්වයි. එය අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස සාකච්ඡා මණ්ඩපයක් ලෙස, මූල්‍ය ආයතනයක් ලෙස, අධිකරණයක් ලෙස, රෝහලක් ලෙස, හමුදා මූලස්ථානයක් ලෙස, අමුත්තන් පිළිගන්නා ස්ථානයක් ලෙස, පොදු උත්සව ශාලාවක් ලෙස, ක්‍රියාත්මක වූ ආකාරයෙන් මෙය පැහැදිළි වන්නේ ය. මෙමගින් ඉස්ලාම් යනු අධ්‍යාත්මය පමණක් උගන්වන ආගමක් නොව ජීවිතයේ සෑම අංගයක් ම පෙන්වා දෙන ජීවන මාර්ගයක් ලෙස තහවුරු වන්නේ ය.

- නබි (සල්) තුමා විසින් බිහි කළ එම සහාබා සමාජය අරාබි සමාජය ලෙස ජාතියක් පදනම් වූ සමාජයක් නොවීය. එය අන්තර්ජාතික සමාජයක් ලෙස බැබලුණි. එහි ජඃෆර් යන අරාබිවරයෙක් ද සලමාන් යන පර්සිවරයෙක් ද, අබුදර් යන කිෆාරි ද, බිලාල් යන හබසි ද, තුෆයිල් යන යෙමන් ජාතිකයා ද, විය. මේ සියල්ලන් ම උපතින් වෙනස් වුව ද ප්‍රතිපත්තිමය වශයෙන් සමාන අය වෙති. එහෙයින් එම සමාජයේ ජාතිය, භාෂාව, ස්ථානය, පාට වෙනස්කම් සැලකිල්ලට නොගන්නා ලදී.

- ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ වකවානුවේ, මක්කාවේ පුද්ගලයින් 17 දෙනෙකුත් මදීනාවේ පුද්ගලයින් 9 දෙනෙකුත් පමණ ලිවීමට කියවීමට හැකි අය වූහ. මක්කා යුගයේ කුත්තාබුල් වහි ලෙස සිටියේ ඉතා සුළු සංඛ්‍යාවක් පමණි. එහෙත් මදීනා යුගයේ දී සාක්ෂරතාව වැඩිවිය. බද්ර් යුද හිරකරුවන් විසින් මදීනාවේ දරුදැරියනට ලිවීමට, කියවීමට පුරුදු කිරීමේ ආදර්ශය, මෙයට මුල් විය. බද්ර් යුද්ධයට සූදානම් ව පැමිණ සයිද් ඉබ්නු සාබිත් (රළි) බාල වයසේ කෙනෙකු වූ නිසා හමුදාවට බඳවා නොගෙන ආපසු යැවූහ. මෙම සෙද් (රළි) තුමා බද්ර් යුධ සිරකරුවෙකුගෙන් ලිවීමට, කියවීමට ඉගෙන ගත්තේය. පසුව කාතිබුල් වහි ලෙස උසස් වූ එතුමා නබි (සල්) තුමාගේ ඉල්ලීම පරිදි ඉතා කෙටි කලකින් සුර්යානි අරබානි භාෂාවන් ඉගෙන විදේශවලින් පැමිණෙන ලිපි නබිතුමාට කියවා පෙන්වන්නෙකු ලෙස හැරුණහ. මෙසේ ලිවීමට කියවීමට හැකි අය සහිබා යන අත් පිටපත් ඉතිරි කර ගියහ. මේවා හදීස් හා ඉතිහාසය යන ක්ෂේත්‍රවලට පූර්වාදර්ශ වූහ.

**දේශපාලන වර්ධනය**

- නබි (සල්) තුමාගේ හිජ්රතයෙන් පසුව ඉස්ලාමයේ දේශපාලනය බිහි විය. මීට කලින් සමාජයක් බිහිවී ක්‍රියාත්මක වීමට අංග හතරක් අවශ්‍ය බව පැවසුවෙමු. මේවාට අමතරව සමාජයක් තමාව ආරක්ෂා කර ගැනීමට රජයක් ද අවශ්‍ය බව නබි (සල්) තුමාගේ සීරාව මගින් පෙන්නුම් කරයි. අල්කුර්ආනය මගින් ඉටු කළ නොහැකි ඒවා රජයක් මගින් පිහිටුවිය හැකිය යැයි උස්මාන් (රලි) තුමා සඳහන් කරයි. එනිසා අල්කුර්ආන් සඳහන් කරන නීති ක්‍රියාත්මක කිරීමට හා අධීක්ෂණය කිරීමට රජයක් අවශ්‍ය ය.

- මදීනාවට හිජ්රත් ගිය නබි (සල්) තුමා සමාජයක් ගොඩනැගූ ඒ අවස්ථාවේ දී රජයක් ද ඇති කළහ. මදීනාවට නබි (සල්) තුමා පැමිණි විට, මක්කාවේ සිට හිජ්රත් පැමිණි මුහාජිරීන්වරු වූහ. මදීනාවේ ස්වදේශීන් වූ ඖස්වරු ද කස්රජ්වරු ද මුස්ලිම්වරු ද මුස්ලිම් නොවන අය ද වූහ.

- මෙයින් පිරිසක් නබි (සල්) තුමා ආදරයෙන් පිළිගත්හ. තවත් පිරිසක් පිළිකුළෙන් පසුවූහ. අනෙක් අතින් නබි (සල්) තුමා ද මුහාජිරීන්වරු පිළිගත් ජනයා විවිධ අරමුණු ඇති ව ඔවුන් පිළිගත්හ.

- තම මාර්ගෝපදේශකයා වශයෙන් සලකා අන්සාරිවරු නබි(සල්) තුමා පිළිගත්හ. යුදෙව්වන් තමන් පලස්තීනයෙන් එළවා දැමූ ක්‍රිස්තියානිවරු පලි ගැනීම සඳහා නබි (සල්) තුමාගේ සහාය ලබාගැනීම සඳහා එතුමා පිළිගත්හ. ජුආස් යුද්ධය අවසන් වූ පසු මදීනාවේ නායකත්වය අබ්දුල්ලාහ් ඉබ්නු උබයි යන පුද්ගලයා බලාපොරොත්තුවෙන් සිටියේය. නබි (සල්) තුමා මදීනාවට පැමිණි නිසා තම තනතුර නැති වුණි යන කණගාටුවෙන් ඔහු පසුවිය. (මේ නිසා මුනාෆික් ලෙස හැසිරුණු බව පැවසේ) මේ පරිසරය යටතේ මදීනාවට පැමිණි නබිතුමාට ශාන්ත පරිසරයක් අවශ්‍ය විය. මේ නිසා වෙන්ව සිටි ඖස්වරු හා කස්රජ්වරු සමාදාන කළහ. මක්කාවේ සිට පැමිණි මුහාජිරීන්වරු හා මදීනාවේ ජීවත් වූ අන්සාරිවරු සහෝදර බන්ධනයෙන් බැඳ තැබූහ. මදීනාවේ ජීවත් වූ යුදෙව්වන් මුස්ලිම්වරු හා සම්බන්ධ කර එකම ජාතියක් ලෙස පත් කළහ. මෙහි යුදෙව්වන් සමඟ ඇති කරගත් ගිවිසුම දේශපාලනමය වැදගත්කමක් ඇති එකකි. එයට මදීනාවේ ප්‍රඥප්තිය ලෙස හඳුන්වන්නේ මේ නිසා ය. ආචාර්ය හමීදුල්ලාහ් මෙය ලොව ඇති වූ ප්‍රථම ලිඛිත ව්‍යවස්ථාවක් ලෙස සඳහන් කරයි.

- අරිස්ටෝටල්ගේ කාලයේ පටන් ව්‍යවස්ථාවක් ගැන සාකච්ඡා කළ ද, ප්‍රථම ලිඛිත, පාලක සහ පාලනය කරනු ලබන්නා පිළිගත්, දෙපාර්ශවයේම වගකීම් හා අයිතිවාසිකම් ගැන පෙන්වා දෙන ගිවිසුමක් මෙය විය. මෙම ගිවිසුම පිළිබඳ ගැටලු ඇති විය. එයට අවසන් තීන්දුව ලබාදෙන බලය නබි (සල්) තුමාට දෙන ලදී, මෙය යුදෙව් සමාජය මුස්ලිම් අනුමත කළ අවස්ථාව වන්නේ ය.

- මෙම ගිවිසුම කේන්ද්‍රගත කළ නබි (සල්) තුමාගේ දේශපාලන ක්‍රියා ආරම්භවිය. මේ අනුව මදීනාව ශුද්ධ නගරයක් ලෙස ප්‍රකාශ කෙරුණි. එහි ලේ හැලීම තහනම් කෙරුණි. එය මුස්ලිම් රජයේ අගනුවර විය. එයට පහරදීමකට කවරෙකු හෝ පැමිණියේ නම්, මුස්ලිම්වරු හා යුදෙව්වන් යන සියල්ලන්ම එක් ව ප්‍රතිප්‍රහාර දී එය ආරක්ෂා කළ යුතු බව පිළිගැණුනි.

- දීර්ඝ කාලයක් මුලුල්ලේ ශුද්ධ නගරයක් වුව ද එහි රජයක් නොවීය. නබි (සල්) තුමාගේ හයවන පරම්පරාවේ අයෙකු වූ කුසයි ඉබ්නු කිලාබ්, මක්කාවේ නාගරික පාලන ක්‍රමයක් ස්ථාපිත කළේය. එය බෙහෙවින් ම වන්දනා කාලයේ දී වන්දනාකරුවන්ගේ සුබසාධනය සැලසීම, කුරයිෂ්වරුන්ගේ

නායකත්වය රැකීම වැනි දේ සඳහා වුනි. එතුමා විසින් ස්ථාපිත දාරුන් නද්වා, නබි (සල්) තුමාගේ කාලයේ දී උපදෙස් ලබා දෙන මණ්ඩපයක් වූයේය. එහෙත් කුසයි විසින් ඇති කළ ප්‍රතිසංවිධාන පාලන ක්‍රමයක් සඳහා වන සම්පූර්ණයෙන් පිළිගත නොහැකි ය. එනිසා අරාබි රටේ ගෞරවය නබි (සල්) තුමාට හිමි ය.

- එතුමා ප්‍රථමයෙන් මදීනාවේ නාගරික රජයක් බිහි කළහ. මස්ජිදුන් නබවි රාජ්‍ය කාර්යාලයක් විය. ලෞකික කටයුතු සියල්ල සහබාවරුන්ගේ යෝජනා සමඟ නිර්මාණය විය. සාකච්ඡා කර තීරණවලට එළැඹෙන ලෙස අල්ලාහ් ද අණ කළේය. (3:159), (42:38). ඉස්ලාම් ව්‍යාප්ත වූ විට නැතහොත් මදීනාවේ සීමාවන් විස්තීරණ වූ විට, ප්‍රාදේශීය පරිපාලනයට නාකිබ්වරු පත්කළහ. ලිපි හා ගිවිසුම් ලිවීමට කාතිබ්වරු පත් කළහ. ඔවුන්ගෙන් සමහරු ස්ථිර සේවකයන් ද, තවත් සමහරු අනියම් සේවකයන් ද වූහ. සාමාන්‍යයෙන් කාතිබ්වරු 46 දෙනෙක් ලේඛන 246 ලියා ඇති බව තක්සේරු මගින් පැවසේ.

- නබි (සල්) තුමාගේ පෞද්ගලික ලේකම් ලෙස බිලාල් (රළි) තුමා ක්‍රියාත්මක කළහ. රුසූල් යන අය පිටරටට දූත මෙහෙවරෙහි යෙදුනහ. උදාහරණ ලෙස හුදයිබියා ගිවිසුමට පෙර තමා පැමිණියේ යුද්ධ කිරීමට නොව උම්රාවට පැමිණි බව කුරෙෂිවරුන්ට දැන්වීම සඳහා රුසුල්වරු තිදෙනෙක් ගියහ. රජවරුන්ට හා අධිරාජ්‍යවරුන්ට දූතමෙහෙවර කළේත් ලිපි ගෙන ගියේත් රුසුල්වරුන්ය.

- හිජ්රි 6 වන වසරට පසු වාලි යන අය ප්‍රාදේශීය පාලනය සිදු කළහ. මුදල්, අධිකරණය හා පරිපාලන ක්‍රියා භාරවූයේ මොවුන්ට ය. මක්කාවේ අදා බින් ආජිබ් (රළි) ද තායිෆ්හි උස්මාන් බින් අබුල් ආස් (රළි) ද වාලි වූහ. මෙසේ වාලිවරු 32 දෙනෙක් වූ බව සඳහන් වේ. ගෝත්‍රික අරාබි සමාජ පාලනය කිරීමට ගෝත්‍රික නායකයන් වන නකීබ්, රුආසා, යන අය පත් කරනු ලැබූහ. ගෝත්‍ර මධ්‍යම රජය හා සම්බන්ධ කරන නියෝජිතයන් ලෙස ක්‍රියා කළේ මොවුන් ය. මධ්‍යම රජයේ බදු අය කරන්නන් නොපැමිණෙන අවස්ථාවල බදු අය කළේ මොවුන් ය. ඒවා මදීනාවට යවා තැබූහ. අධිකරණ ක්ෂේත්‍රය පවරා තිබුණේ කාදිවරුන්ට ය. උමර් (රළි), අලි (රළි), අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළි), අබූ මූසා අල් අෂ්අරි (රළි) , සයිද් ඉබ්නු, සාබිත් (රලි) වැනි අය ද කාදිවරු ලෙස ක්‍රියා කළහ.

- වෙළෙඳ පොළ තත්ත්වයන් පාලනය කිරීම සඳහා සාහිබුල් සූක් යන අය පත් කරනු ලැබූහ. මක්කාවේ සුද් ඉබ්නු සයීද් අල් ආස් (රළි) තුමා ද මදීනාවේ උමර් (රළි) තුමා ද මෙම සේවයේ යෙදුණාහ. මුස්තයිබ් යන අය ද මෙම කාර්යයට සහාය වූහ. රාජ්‍ය පාලනය සඳහා වෙනම රාජ්‍ය සේවක බලඇණියක් අවශ්‍ය බවද, ඒ සඳහා සුදුසුකම් ඇති අයගෙන් ඔවුන් තෝරාගත යුතු බවත් පැහැදිළි ය.

- නබි (සල්) තුමා ප්‍රථමයෙන් මදීනාව සහ එහි වටපිටාව ඇතුළත් ප්‍රදේශයේ ම තම නාගරික රජය බිහි කළහ. පසුව හටගත් බද්රු, උහද්, අගල් සටන්වල ප්‍රතිඵල හුදයිබියා ගිවිසුම බිඳී යාම ආදී සිද්ධීන් නිසා මදීනාවට දකුණින් තිබූ ප්‍රදේශ මුස්ලිම්වරුන්ගේ පාලනය යටතට ගෙනාවේය. අගල් යුද්ධයේ දී යුදෙව්වන් සමඟ ඇති කරගත් ගිවිසුම බිඳ දැමූ නිසා මදීනාවේ ජීවත් වූ බනු නලීර් බනු කයිනුකා යන ගෝත්‍රිකයන් මෙන් බනු කුරයිලාවරු ද කයිබර් ප්‍රදේශයට පිටිවහල් කරනු ලැබූහ. මේ නිසා කයිබර් මිටියාවතේ මදීනා රජයට විරුද්ධ පෙරමුණක් බිහිවිය. ඔවුන් මදීනාවට පහරදීමට සූදානම් වන බව දැනගත් නබි (සල්) තුමා, ඔවුන් පැමිණීමට පෙර කයිබරය ආක්‍රමණය කළහ. කයිබරය ජයගන්නා අතර අවට සිටි බාර අය මුස්ලිම් රජයට විශ්වාසිකව විසීමට කැමැත්ත පළ කළහ. ඒ නිසා මුස්ලිම් රජය මදීනා රජය උතුරු දෙසින් ව්‍යාප්ත විය.

- හිජ්රී 7 වන වසරේ දී අන් රාජ්‍යයන්ට යැවූ ලිපි මදීනා රජයේ ව්‍යාප්තියට මඟ පෑදුණි. එහි ප්‍රථම පියවර හිජ්රී 8 හි පැවැති මූතාහ් සටන ආරම්භ විය. රෝම රජතුමාට පණිවිඩ රැගෙන ගිය දූතයා මරා දැමීමට විරුද්ධව පළිගැනීමේ අරමුණින්, මූතාහ් සටන ආරම්භ විය. මෙය කුලෆාඋර් රාෂිදූන්ගේ කාලය තෙක් පැවැතිණි. මේ නිසා වයඹ දෙසින් මදීනා රජය ව්‍යාප්ත විය.

- නබි (සල්) තුමා මදීනාවේ රජයක් පිහිටුවා රාජ්‍ය මට්ටමින් දෑවා කටයුතු සිදු නොකළා නම්, එතුමන්ගේ දෑවා කටයුතු තේරුමක් රහිත වනු ඇත. උදාහරණ ලෙස, යුදෙව්වන් නබි (සල්) තුමා සමඟ ඇතිකර ගත් ගිවිසුම බිඳ දැමූ අවස්ථාවේ දී මදීනාවෙන් ඔවුන් පිටමං කිරීමට බලය නබි (සල්) තුමාට නොලැබෙන්න ඉඩ තිබුණි. තම දූතයා මරා දැමීමට විරුද්ධව හමුදා මෙහෙයවීමට බලය නොලැබෙන්න ඉඩ තිබුණි. පර්සියානු රජු නබි (සල්) තුමාගේ ලිපිය ලැබුණු විට, ඔහු මගේ වහළා මට මෙහෙම ලිපි එවනවා ද කියා කෝපයෙන් නබි (සල්) තුමා අත්අඩංගුවට ගන්නා ලෙස අණ කරනු ලැබීමත්, මෙය ඔහුගේ ආධිපත්‍ය බලය පෙන්නුම් කෙරේ. තම රජය පිහිටුවීම තුළින් එම ආධිපත්‍ය බලයට සමාන බලයක් නබි (සල්) තුමා අත්පත් කර ගත්හ. තවත් අන්දමකින් පවසන්නේ නම්, නබි (සල්) තුමා තම රාජ්‍ය පාලනය දෑවා සඳහා මාධ්‍යයක් කරගන්නා තම උම්මතයට පූර්වාදර්ශය සැපයූ බව පැවසිය හැකිය.

## කුලෆාඋර් රාෂිදූන්වරුන්ගේ කාල වකවානුව

- නබි (සල්) තුමාගේ වෆාතයෙන් පසුව ඉස්ලාම් සහාබා සමාජය වෙත යොමු කෙරිණි. ආගමික සමාජයීය හා දේශපාලන වර්ධනය තීරණය කළේ ඔවුන් ය. එනිසා නබි (සල්) තුමාගේ කාලය ඉස්ලාමය හඳුන්වා දෙනු ලැබූ මුල් කාලය බවත්, කුලෆාඋර් රාෂිදූන්වරුන්ගේ කාලවකවානුව සංවර්ධන අවධිය ලෙසත් සමහරු දක්වති.

- නබි (සල්) තුමාගේ කාලයේ ඉස්ලාමයේ ආගමික, සමාජ හා දේශපාලන සිද්ධීන් නබි (සල්) තුමාගේ සෘජු අධීක්ෂණය යටතේ සිදුවිය. එහෙත් එතුමන්ගේ වෆාතයෙන් පසුව නබි (සල්) තුමා පූර්වාදර්ශයට ගෙන ක්‍රියා කිරීමට සහාබාවරු පත් වූහ. නැතහොත් වගකීම බාර ගත්හ. ඔවුන් කිසිවිටෙකත් තම හිතුමතයට ක්‍රියා කළේ නැත. අල්කුර්ආනයේ හා සුන්නාවේ සාධක අනුව ද සුදුස්සන් සමඟ සාකච්ඡා කිරීමෙන් ද ඒවා ඉටු කළහ.

- නබි (සල්) තුමාගේ වෆාතය සමඟ මුස්ලිම්වරුනට නායකත්වයක් නැති තත්ත්වයක් ඇති විය. නායකත්වයක් නොමැතිව නබි (සල්) තුමා භූමිදානය කිරීමට පවා ඔවුන් ඉඩ දීමට කැමැති වූයේ නැත. ෂකීෆා බනී ෂාඉදාහි සාකච්ඡා පවත්වන ලදී. තර්ක විතර්ක රැසක් ඇති විය.

  කලීෆා තේරෙන්නේ කුරෙෂිවරුන් අතුරෙන් බවය යන හදීසය මත අබූබක්කර් (රළි) තුමා නායකත්වය සඳහා පත් කරන ලදී, එතුමා එය මහත් බරක් ලෙසත්, වගකීමක් ලෙසත් සලකා ක්‍රියා කළහ. තමා අල්ලාහ්ගේ දූතයාණන්ගේ නියෝජිතයා ලෙස ඉතා විනීතව හඳුන්වා ගත්හ. කලීෆාතුර් රසූලුල්ලාහ් යන වචනය පසුව කලීෆා යැයි විකාශනය විය. එතැන් පටන් පාලනය කිලාෆත් යැයි නම් විය.

- නබි (සල්) තුමා තම අවසාන කාලයේ දී උසාමා (රළි) තුමාගේ නායකත්වයෙන් යුතු හමුදාවක් සකස් කළහ. එය ෂාම් දේශයට යැවීම සඳහා සූදානම් වූහ. එහෙත් නබි (සල්) තුමා රෝගී වූ නිසා හමුදාව යැවීමේ කාර්යය පමාවිය. එතුමාගේ අභාවය නිසා හමුදාව යැවීම නොකළ යුතු බවත්, එසේ යවන්නේ නම් උසාමා (රළි) තුමාගේ නායකත්වය යටතේ හමුදාව නොයැවිය යුතු බවත්, මත පැතුරුණි. නබි (සල්) තුමා පත්කළ සෙන්පති ඉවත් කිරීම හෝ හමුදාව නොයවා සිටීම කළ නොහැකි බව කලීෆා තුමා තරයේම කියා සිටියහ.

- යමාමා යුද්ධයෙන් හාෆිල්වරු බොහෝ දෙනෙක් ෂහීද් වූ නිසා අල්කුර්ආනය නැති වී යන්නේ ය යන බියක් පැතුරුණි. එහෙයින් එය ලියා ගොනුකර ආරක්ෂා කළ යුතුයැයි උමර් (රළි) තුමා අදහසක් ඉදිරිපත් කළහ. නබි (සල්) තුමා නොකළ දෙයක් මා කරන්නේ කෙසේ දැයි කලීෆාවරයා ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ. කරුණු පැහැදිලි කළ පසු කලීෆාවරයා එයට එකඟ විය. මෙය අල්ලාහ්ගේ දූතයා ලෙස එතුමා ක්‍රියාකිරීම දක්වන උදාහරණ දෙකක් වේ.

- කලීෆාවරයා රාජ්‍ය පාලකයා මෙන් ම අධ්‍යාත්මික නායකයා ද වූයේ ය. එනිසා ඉස්ලාමීය ජීවන ක්‍රමයේ ඇතිවන ගැටලු ඉවත් කිරීමේ වගකීම ද එතුමාට විය. එවැනි අවස්ථාවල එතුමා අල්කුර්ආනයෙන් සාධක සෙවූහ. සුන්නාහ්වේ පිළිතුරු තිබේ දැයි සහාබාවරු යවා සාධක සෙවූහ.

  ඔවුන් සාධක ඉදිරිපත් කළා නම් එය පදනම් කරගෙන තීන්දුව ලබා දුන්හ. එසේ නොමැති අවස්ථාවල විෂයට අදාළ විශේෂඥවරුන්ගේ අදහස් ලබාගෙන ඉජ්තිහාද් මගින් පිළිතුරු සැපයූහ.

- මෙයට සුසුස්සන් ලෙස නබි (සල්) තුමා සහාබාවරු පුහුණු කළහ. ඉබ්නු අබ්බාස් (රළි) වැනි සමහරු තෆ්සීර්හි නිපුණයෝ වූහ. ඉබ්නු උමර් (රළි) වැනි සමහරුන් හදීස් කලාවේ නිපුණයෝ වූහ. ඉබ්නු මස්ඌද් (රළි) වැනි සමහරුන් ෆික්හ් හි නිපුණයෝ වූහ. සඅද් ඉබ්නු අබී වක්කාස් (රළි) වැනි අය යුධ කටයුතුවල නිපුණයෝ වූහ. උමර් (රළි) වැනි සමහරුන් දේශපාලන ක්ෂේත්‍රයේ නිපුණතාවය ලැබ සිටියහ. එහෙයින් මෙවැනි අයගේ සහාය ඇති ව, පවතින ගැටලු ඉජ්තිහාද් මගින් විසඳන ලදී.

- කුලෆාඋර් රාෂිදුන්වරුන්ගේ කාලයේ දී, ඉස්ලාම් සීග්‍රයෙන් පැතිරුණු අතර, කිලාෆතයේ සීමා පුළුල් විය. අරාබීන් නොවන මුස්ලිම්වරුන්ගේ සංඛ්‍යාව වැඩි විය. වෙනත් සංස්කෘතීන් නිසා බලපෑමට ලක් වූ විශාල ජනතාවක් සිටියහ. අරාබි බසින් වූ අල්කුර්ආනය හෝ සුන්නාහ්ව සෘජුව වටහා ගැනීමට ඔවුන්ට නොහැකි විය. එහෙයින් ඉස්ලාමීය පිළිවෙත් සහාබාවරු අනුගමනය කිරීමෙන් ඉගෙන ගත්හ. එම අවස්ථාව නොලද අයට ඉස්ලාමීය විධි ක්‍රම ගැන වටහා දීමේ වගකීම කලීෆාවරුන්ට පැවරුණි. කලීෆා උමර් (රළි) තුමා විවිධ ප්‍රදේශවලට විවිධ සහාබාවරු යවා මවාලිවරුන්ගේ එදිනෙදා ජීවිත කටයුතු ඉස්ලාමීය බවට පත් කළහ.

  උමර් (රළි) තුමාගේ කාලයේ සටන් රැසක් සිදුවිය. ඒවා සතුරන් විසින් පටන් ගත් ඒවා ය. යුද ශක්තියෙන් පිරිපුන් සතුරන්ට මුස්ලිම්වරුන්ගේ ආධ්‍යාත්මික ශක්තිය ඉදිරියේ සිටිය නොහැකි විය. රෝම හා පර්සියානු පාලන තන්ත්‍රයේ පැවති දූෂණ, වංචා හා අසාධාරණකම් නිසා ජනයා ඉස්ලාමය වෙතට යොමු වූහ.

  මේ නිසා පිරිසක් ඉස්ලාමය පිළිගත් මවාලිවරු වූහ. අනෙක් පිරිසක් කිලාෆතය පිළිගත් දිම්මිවරු වූහ. උමර් (රළි) තුමා දිම්මිවරු කෙරෙහි වැඩි අවධානයක් යොමු කළහ. ඔවුන්ගේ අයිතිවාසිකම් නොඅඩුව ලබා දුන්හ. එනිසා කල්යත් ම ඔවුන් ද මුස්ලිම් සහෝදරයින් බවට පත් වූහ.

  රාජ්‍යය පුළුල් වූ විට උමර් (රළි) තුමා පාලන විමධ්‍යගත කළහ. නබි (සල්) තුමාගේ පූර්වාදර්ශය මත පලාත් පාලන ක්‍රමයක් බිහි කළහ. පරිපාලනය (වාලි), මුදල් (ආමිල්), අධිකරණය (කාදි) හමුදාව (අමීර්) ආදිය තනි තනි නිලධාරීන්ට පැවරුණි. එම නිලධාරීන් අධීක්ෂණය කිරීම සඳහා මුහම්මද් බින් මස්ලමා (රළි) තුමා ඔම්බුට්ස්මන්වරයා ලෙස පත් කළහ. රජයේ නිලධාරීන් විසින් අනුගමනය කළ යුතු විනය නීති පද්ධතියක් සකස් කළහ. තම පරිපාලනය යහමින් පවත්වාගෙන යෑම සඳහා උපදේශක සභාවක් ඇති කළහ. මුදල් පාලන ආයතනය ලෙස බයිතුල්මාලය සකස් කළහ. රජයේ කටයුතු නිසි පරිදි ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තු (දිවාන්) ඇති කළහ. නීතිය

සැමට පොදු බව දැක්වූහ. ජල සම්පාදන පහසුකම් ඇති කළහ. නිෂ්පාදනය වැඩි දියුණු කළහ. මුදල් අච්චු ගසා භාවිතයට සැපයූහ. මෙයින් යහපත් පාලනයක් මෙන් ම යහපත් සමාජයක් ද බිහි විය.

- උමර් (රළි) තුමාගේ යහපත් සාධාරණ පාලනය සතුරන් බිය ගැන්වූයේ ය. පර්සියානු අධිරාජ්‍යයේ බිඳවැටීම ගැන ඔවුන් කේන්තියෙන් පසු වූහ. අබූ ලූඋලු ආ යන පර්සියානු වහළා උමර් (රළි) තුමා ඝාතනය කළේය. ඉනික්බිති කලීෆා පදවියට පත් වූ උස්මාන් (රළි) තුමාගේ පාලනය මුල් කාලයේ ඉතා මැනැවින් සිදුවූව ද පසු කාලයේ විවිධ ගැටලු සහිත විය. අබ්දුල්ලාහ් ඉබ්නු සබා යන යුදෙව් ජාතිකයා හිජ්රි 30 වන වසරේ දී, කිලාෆත් ප්‍රදේශයට ඇතුළු වී, ඉස්ලාමීය දැනුම අඩු කූෆාව, බසරාව හා ඊජිප්තුව යන ප්‍රදේශවල කැරැලි කෝලාහල ඇති කළේය. විරුද්ධ අදහස් පැතිරවූයේය. උස්මාන් (රළි) තුමාට විරුද්ධව ප්‍රචාරය කළේය. මෙහි ප්‍රතිඵලය ලෙස උස්මාන් (රළි) තුමා කැරළිකරුවන් විසින් ඝාතනය කරනු ලැබූහ. ඝාතනය කරනු ලැබූ කලීෆා වෙනුවෙන් පළිගත හැකි අවස්ථා කැරළිකරුවන් විසින් වළක්වන ලදී. මේ නිසා ඊළඟ කළීෆාවරයා වූ අලි (රළි) තුමා සහ උස්මාන් (රළි) තුමාගේ ගෝත්‍රිකයන් වන උමයියාවරු අතර මතභේද හටගත්තේ ය. මෙයට මුආවියා (රළි) නායකත්වය දුන්නේය. ජමල්, ෂිෆ්ෆීන්, වැනි අභ්‍යන්තර ගැටුම් හටගැනුණි. කුමන්ත්‍රණ හා කපටි ක්‍රියා නිසා මුස්ලිම් සමාජය බෙදී ගියේය. අලි (රළි) තුමාගේ ආධාරකරුවන්, මුආවියා (රළි) තුමාගේ ආධාරකරුවන් හා කවාරිජ්වරු යන තෙපිරිසක් බිහි වී ගැටුනහ. අවසානයේ කවාරිජිවරයෙකු වූ අබ්දුර් රහ්මාන් ඉබ්නු මුල්ජිම් විසින් අලි (රළි) තුමා ඝාතනය කරනු ලැබූහ. මේ සමඟ කුලෆාඋර් රාෂිදූන්වරුන්ගේ පාලනය අවසන් විය. මුආවිය (රළි) තුමාගේ නායකත්වයෙන් උමයියා වංශයේ පාලනය ආරම්භ විය.

  මෙහි ප්‍රතිඵලය ලෙස දේශපාලන, සමාජ, සංස්කෘතික කටයුතු සියල්ලෙහිම වෙනස්කම් සිදුවිය. ඉස්ලාමීය ජීවනය පිරිහෙන්නට විය. වෙනත් සංස්කෘතික බලපෑම් සමාජයේ මෙන් ම රාජ්‍ය පාලනයේ දී ඇතුළු විය.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

පියවර I : ඉස්ලාමයේ බිහිවීම පිළිබඳ ව සිසුන් දන්නා දේ විමසා බුද්ධි කලම්බනයක් ඇති කරන්න.

පියවර II : සිසුන් කණ්ඩායම් 3කට බෙදා පහත මාතෘකා ලබා දී තොරතුරු රැස්කිරීමට යොමු කරන්න.

(අ) ආගමික සංවර්ධනය
(ආ) සමාජ සංවර්ධනය
(ඇ) දේශපාලන සංවර්ධනය

පියවර III: තම තමන් රැස්කළ තොරතුරු කණ්ඩායම් අතර සාකච්ඡා කර බෙදා ගැනීමට අවස්ථාව දෙන්න.

පියවර IV: ඒවායේ විස්තර කෙටියෙන් ලියාගැනීමට යොමු කරන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. සිරාජුදීන් සෙයියද් අබුබක්කර් - මාර්ටින් ලිංග්ස් (1989), මුහම්මද් (සල්) තුමා, දර්ගා නගරය.
2. සයිබුර් රහ්මාන් මුබාරක් බූරි (1425 හිජ්රි), අර්රහීක්, චෙන්නයි දාරුල් හුදා.
3. අබුබක්කර් එම්. එම්. (1982), ඉස්ලාමීය වරලාරු. (1 කොටස), සායින්ද මරුදු ඉස්ලාමීය පර්යේෂණ සභාව.
4. අමීන් එම්. අයි. එම්. (2002), මුහම්මද් රසූලුල්ලාහ්, හෙම්මාතගම අල්හසනාත් මුද්‍රණාලය
5. අමීන් එම්. අයි. එම්. (2004), අබූබක්කර් සිද්දීක්, හෙම්මාතගම අල්හසනාත් මුද්‍රණාලය.
6. අබ්දුල් හයි අබු සාලිම් (1988), අන්නල් නබියින් අලගිය වරලාරු, චෙන්නයි. ඉස්ලාමීය ආයතනය. ට්‍රස්ට් (IFI)
7. සිෆාර් මුස්තෆා (2010), නබි (සල්) අවර්කලින් වාල්වියල්, කොළඹ 9, මීල්පාර්වයි උඝඩහ මෙයම්.
8. රියාල් එම්. ජේ. එම්. (2001), මදීනාවෙ නෞක්කි. උක්කුවලයි උම්මත් පබ්ලිකේෂන්
9. නාලිර් එම්. එච්. එම්. (1983), ඉස්ලාමීය නාහරීහත්තින් තෝට්‍රමුම් වලර්වියුම්., කොළඹ 10, අල් සභා මුද්‍රණාලය.
10. අමීන් එම්. අයි. එම්. (1999), අර්බියර් වාල්වියල්, කොළඹ, ඉස්ලාමීය බුක් හවුස්.
11. මුහම්මද් ඒ. මුක්තාර් (1986), ඉස්ලාමීය නාහරීහම්, වැලිගම අල් අස්හර් ප්‍රකාශකයෝ.

**නිපුණතාව 7.0** : **ඉස්ලාමයේ සම්භවය හා වර්ධනය පිළිබඳව ද ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දීම පිළිබඳව ද වටහාගෙන ප්‍රකාශ කරයි.**

**නිපුණතා මට්ටම 7.2** : ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ ඓතිහාසික පසුබිම වටහාගෙන විචාරවත් ලෙස ලියා ඉදිරිපත් කරයි.

**කාලය** : කාල පරිච්ඡේද 20

**ඉගෙනුම් ඵල** :

- අරාබි වෙළෙඳුන් ශ්‍රී ලංකාවට පැමිණියේ රට ආක්‍රමණය කිරීමේ අරමුණින් නොව, වෙළෙඳ සම්බන්ධතා වර්ධනය කර ගැනීමේ අරමුණින් බව වටහා ගනී.
- ශ්‍රී ලංකාව හා අරාබීන් අතර සම්බන්ධතාවය ඓතිහාසික පසුබිමක් සහිත වූවක් බවත් නිවැරදි ව වටහා ගනී.
- මෙම සම්බන්ධතා හා බන්ධුතාවයන් නිසා කුමන ආකාරයේ ප්‍රතිඵල ඇතිවූවා දැයි දැන පවසයි.
- කෙබඳු කාල වකවානුවක ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙන ලද්දේ ද යන්න දැන පවසයි.
- ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ මුල්කාලීන ජනාවාස පිහිටි ස්ථාන ගැන විස්තරාත්මක ව දැන ගනියි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

### ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබීම

- ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ ආකාරය පිළිබඳ තොරතුරු හෝ ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ මුල් කාලීන ඉතිහාසය පිළිබඳ තොරතුරු හෝ මෑත කාලය තෙක් අපට ලැබුණේ නැත.
- මුල් කාලීන අරාබි දේශ සංචාරකයන් හා යාත්‍රිකයන් විසින් තබා ගිය සටහන්, අනෙක් සමාජයන් හි සාහිත්‍ය ග්‍රන්ථ. ඓතිහාසික ග්‍රන්ථ, යුරෝපීය පාලකයන් ඉතිරි කළ සටහන්, තොරතුරු ආදියෙහි ආධාරයෙන්, ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ ආකාරය ගැන කරුණු කියැවේ.
- ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය ඉන්දියන් සාගරයේ පැවති අරාබි ජනතාවගේ වෙළෙඳ කටයුතු සමඟ කිට්ටු සම්බන්ධතාවයක් සහිත වූවකි. ඉන්දීය සාගරයේ වෙළෙඳාම හා වෙළෙඳ මාර්ගය ශ්‍රී ලංකාව ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ ඉතිහාසය සමඟ කිට්ටුවෙන් සම්බන්ධ වන කරුණු ය.

  මේ නිසා ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබීමට පාදක වූ අරාබි වෙළෙඳුන් හා ශ්‍රී ලංකාව අතර පැවැති බන්ධුතාවයේ පෞරාණිකත්වය පිළිබඳ කරුණු දැනගැනීම වටී.
- පර්සියානු බොක්කෙන් ආරම්භ වී චීනයේ කැන්ටන් වරාය දක්වා දිවෙන පුළුල් ප්‍රදේශයක් මෙම අරාබි වෙළෙඳාමට අඩංගු විය. ඉන්දියන් සාගරයේ කේන්ද්‍රීය වැදගත්කමක් ඇති ස්ථානයක

පිහිටා ඇති ශ්‍රී ලංකාව, නැගෙනහිරට හා බටහිරට පැවැති වෙළෙඳ මාර්ගයේ මධ්‍යස්ථානයක් විය. ඉන්දියන් සාගරයේ සුළං හමන රටාවෙහි, මෙම වෙළෙඳාම රැඳී පැවතිනි. අන්තර් ජාතික වෙළෙඳ මාර්ගයේ ප්‍රධාන තැනක් ගැනීමටත්, අන්තර් ජාතික මට්ටමින් ප්‍රසිද්ධියට පත්වීමටත් මෙය හේතු විය.

- ශ්‍රී ලංකාවේ නැව් ආරක්ෂා සහිතව නවතා තැබිය හැකි වරායවල් පිහිටීම, ඇති තරම් කුළු බඩු ලබා ගැනීමට හැකි වීම, පිරිසිදු ජලය ලබා ගැනීමට පහසුකම් තිබීම, ආදී හේතු නිසා වෙළෙඳාමේ ප්‍රධාන තැනක් ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. ඉස්ලාම් බිහිවීමටත් පෙර සිටම ශ්‍රී ලංකාවේ අරාබිවරුන්ගේ ජනාවාස බිහිවීමට මෙය හේතු විය.

- ක්‍රි.පූ.437 - 367 කාලයේ අනුරාධපුරය රජකළ පණ්ඩුකාභය රජ අනුරාධපුරයේ විදේශීය වෙළෙඳුන් සඳහා වෙනම ජනපද පිහිටවූ බව ද එහි යවනයින් සඳහා වෙනම ජනපදයක් වෙන්කර තිබූ බව මහාවංශයේ දැක්වේ. මහාවංශයේ යවනයින් ලෙස දැක්වෙන්නේ අරාබිවරුන් පිළිබඳ ව බව මහාවංශය පිළිබඳ පර්යේෂණ පවත්වා පරිවර්තනය කළ ගයිගර් පවසයි.

- මෙම තොරතුරුවලට අමතරව වෙනත් තොරතුරු රැසක් ද ඉස්ලාමයට පෙර ම අරාබි වෙළෙඳුන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලෙස ජීවත් වූ බව ඔප්පු කිරීම සඳහා සාධක රැසක් ඇත. අනුරාධපුරයේ මුස්ලිම්වරුන්ගේ නිවෙස් අලංකාර අයුරින් සකසා තිබුණු බව පාහියන් පවසයි. විලියම් ගයිගර්ගේ අදහස අනුව, විජය හා ඔහුගේ පිරිස ශ්‍රී ලංකාවට පැමිණීමට පෙරම යෙමන් රාජ්‍යයේ අරාබි වෙළෙඳුන් ශ්‍රී ලංකාවේ පදිංචි වූහ. ආර්යයන් ශ්‍රී ලංකාවට පැමිණෙන විටත්, අරාබිවරුන් මෙහි සිටින්නට ඉඩ ඇති බව ද කියැවේ.

- අරාබි වෙළෙඳුන් මලබාර් වෙරළේ හා ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් ජීවත් වූ බව එහි වෙළෙඳ ආධිපත්‍ය ඔවුන් සතුව පැවති බවත් සඳහන් කරන ප්‍රසිද්ධ ලේඛකයා වූ පිලිනි ක්‍රිස්තු වර්ෂ ක්‍රමය ආරම්භ වීමට පෙර ම මෙම අරාබි ජනපද පැවති බවට සඳහන් වේ. මෙය හිටපු පුරා විද්‍යාඥ ආචාර්ය බාලේන්ද්‍ර මෙසේ සඳහන් කරයි.

  "පසුගිය වසර 2000 ට පෙර සිටම අරාබි ජනයා ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලෙස ජීවත් වූ නිසා වැද්දන් හා ආදිවාසීන් තරම් ම ඔවුන් ද පුරාණ අය ලෙස සලකනු ලබත්."

- අරාබිවරුන්ගේ මෙම ජනපද සම්ප්‍රදාය ඉස්ලාම් බිහිවීමෙන් පසුවත් ඒ අයුරින් ම පැවතුනි.

  එතෙක් අරාබි වෙළෙඳුන් යැයි හඳුන්වනු ලැබූ ඔවුන් ඉන් පසු "අරාබි මුස්ලිම් වෙළෙන්දන්" වශයෙන් විශේෂණ නාමයෙන් හඳුන්වනු ලැබූහ.

  මෙසේ මුස්ලිම්වරු ලෙස පදිංචි වූ අරාබි ජනයාගේ ඉස්ලාමීය සදාචාරාත්මක ගුණයන් ද වෙළෙඳ කටයුතුවල ඔවුන් දැක් වූ අවංකභාවය ද වෙනත් යහපත් ලක්ෂණ ද ඉස්ලාම් ආගම ශ්‍රී ලංකාවේ පැතිරීමට හේතු විය.

  ඒවා පහත අයුරින් දැක්විය හැකිය.

- අල්කියාබාකරි යන ග්‍රන්ථය සාධක වශයෙන් ඉදිරිපත් කරමින් සිද්දිලෙබ්බයි මුස්ලිම් නේෂන් යන පුවත්පතේ මෙසේ ලියයි.

  ක්‍රි.ව. 628 දී වහාබ් ඉබ්නු අබී හබ්සා යන සහාබිවරයා නබි (සල්) තුමා ශ්‍රී ලංකාවේ රජු වෙත එවා තැබූහ. නබි (සල්) තුමාගේ ලිපිය බාරදුන් සහාබිවරයාට රජතුමා සහාබිවරයාගේ කාර්යය කිරීමට අවසර දුන් අතර මස්ජිදයක් ඉදිකිරීමට ද අවසර දුන්නේ ය. කැමති අයට එම ආගම

වැළඳ ගැනීමට ද හේ අවසර දුන්නේ ය. එම සහාබිවරයා මෙහි වාසය කළ අරාබිවරුන්ට හා අන් අයට ඉස්ලාමය දේශනා කළ අතර, සමහරුන් තම ආගමට හරවා ගත් පසු ක්‍රි.ව. 632 දී අරාබියට ආපසු ගියේය.

- අරාබියේ අළුත් ආගමක් බිහි වූ බව දැනගත් ශ්‍රී ලංකාවේ මහරජ දෙවන අග්‍රබෝධි මහරජතුමා (ක්‍රි.ව.623-633) ඒ පිළිබඳ ව දැනගැනීම සඳහා දූත පිරිසක් යවා තැබීය. මෙම පිරිස අරාබියට ළඟා වූ අවස්ථාවේදී නබි (සල්) තුමා වෆාත් වූ බවත්, පළමු කලීෆා අබුබක්කර (රළි) ගෙන් පසුව දෙවන කලිෆා වන උමර් (රළි) පාලනය කරන බවත් දැන ගත්තේය. උමර් (රළි) තුමා හමු වූ දූත පිරිස එතුමාගෙන් ඉස්ලාම් පිළිබඳ දැනගෙන ශ්‍රී ලංකාවට පෙරළා පැමිණෙන අතරමඟ මක්රාන් හි (වර්තමාන කරාච්චියේ දී) දූතයෙක් අභාවයට පත් වූ අතර අනෙක් දූතවරයා ශ්‍රී ලංකාවට පැමිණ තමා දැනගත් තොරතුරු දැන්වීය. මෙම තොරතුරු ඉතිහාසඥයා වූ ඉබ්නු ෂහ්රියාර් තම “අජාබුල් හින්ද්”යන ග්‍රන්ථයේ දී සඳහන් කරයි.

- “පුදුහල් ඵුල්තාන්” යන ග්‍රන්ථයේ කර්තෘ බලදුරි පවසන පහත සිද්ධිය ද ශ්‍රී ලංකාවේ ඉස්ලාම් පැතිරීමට හේතු වූ තවත් කරුණකි. මැණික් දූපතේ රජතුමා එහි ජීවත් වූ මුස්ලිම් දෙමාපියන්ගේ අනාථ වූ දරුවන් හා වැන්දඹුවන් ඉරාකයේ එවකට ආණ්ඩුකාරයා වූ හජ්ජාජ් වෙතට යවා තැබීය. ඔහු කරාච්චිය අසල ඇති “තේපල් යන ස්ථානය අසල මුහුදු කොල්ලකරුවන් විසින් අත් අඩංගුවට ගනු ලැබූහ. මෙය දැන ගත් හජ්ජාජ් ඉන්දු රටේ රජු රාජා ඩාහිර් වෙත ලිපි යවා එම කාන්තාවන් වහා නිදහස් කරන ලෙස ඉල්ලා සිටිය ද එය ප්‍රතික්ෂේප කළ සින්දු රටට විරුද්ධව මුස්ලිම් ආක්‍රමණය සිදු විය. ඉන්දියාව මුස්ලිම්වරුන්ගේ පාලනයට යටත් වීමට හේතුව මෙම සිද්ධියයි.

- ක්‍රි.ව. 8 වන ශත වර්ෂයේ දී හජ්ජාජ්ගේ තාඩණ පීඩණවලට බිය වූ සමහර “හාසිම්වරු” තමිල්නාඩුවේ මලක්කාවේ සහ ශ්‍රී ලංකාවේ පදිංචි වූහ. මොවුන් ශ්‍රී ලංකාවේ ඊසාන දිග හා වයඹ දිග ප්‍රදේශවල පිහිටා තිබූ ත්‍රිකුණාමලය, පුත්තලම, යාපනය, මාන්තොට, මන්නාරම, කුතිරමලෙයි, කොළඹ, බාබරින් (බේරුවල) ආදී ප්‍රදේශවල ජීවත් වූ බව අලක්සන්ඩර් ජෙන්ස්ටන් යන ලේඛකයා පවසයි.

- ශ්‍රී ලංකාවෙන් සොයාගන්නා ලද සොහොන් ගල් ද අරාබි කාසි ද ශ්‍රී ලංකාවේ ඉස්ලාම් ආගමේ ව්‍යාප්තිය පෙන්වන සාධක වන්නේ ය.

- ශ්‍රී ලංකාවේ ජීවත් වූ මුස්ලිම්වරු තමන්ට ආගමික නීතිරීති ගැන ඉගෙන ගැනීම සඳහා උපදේශක වරයෙකු යවා තබන ලෙස බග්දාදය පාලනය කළ අබ්බාසිය කලීෆා හාරුන් අල් රෂීද් වෙත ඉල්ලා සිටි අවස්ථාවේ දී කලිෆා කාලිද් ඉබ්නු අල් බකායා යන අය හිජ්රි 300 වලදී ශ්‍රී ලංකාවට එවන ලදී.

- තම වගකීම නිසි පරිදි ඉටු කළ එතුමා හිජ්රි 317 දී අභාවප්‍රාප්ත වී කොළඹ දී භූමිදානය කරන ලදී. එතුමා මතක් කිරීම ලෙස එතුමා භූමිදානය කළ ස්ථානයේ ස්ථාපිත කිරීම සඳහා කලිෆා හාරුන් තුමා බග්දාදයේ සිට සොහොන් ගලක් (Tomb stone) එවා තැබුවේ ය. එය අද කොළඹ කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ.

- කොළඹ නගරයෙන් ඈත පුලියන් තීවු, ත්‍රිකුණාමලය, මඩුල්බෝව වැනි ස්ථානවලින් සොයාගෙන ඇති සොහොන් ගල් ද මෙරටේ ඉස්ලාම් ආගමේ පැතිරීම පෙන්වන සාධක වන්නේ ය.

- මුතුරාජවෙල, මීගමුව, වත්තල, ගම්පොල, ගලගෙදර වැනි ස්ථානවලින් හමු වූ අරාබි කාසි ද, ශ්‍රී ලංකාවේ ඉස්ලාම් ආගමේ පැතිරීම පෙන්නුම් කරන සාධක වන්නේ ය.

**ශ්‍රී ලංකාවේ ඉස්ලාම් ආගම වර්ධනය වීම**

- ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබීමට හා පැතිරීමට හේතු වූ අරාබි වෙළෙඳුන් ද මෙරට ඉස්ලාමය පැතිරීමට හේතු වූහ. නැගෙනහිර හා බටහිර අතර පැවැති වෙළෙඳාමේ ප්‍රධාන ස්ථානය ගත් වරාය ආශ්‍රිත නගර එකල ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථාන විය. සුළං පහර ආධාර කරගෙන මුහුදු ගමන් ගිය අරාබි වෙළෙඳුන්, දකුණු ඉන්දියාවේ වෙරළබඩ වරාය ආශ්‍රිත නගර හෝ ශ්‍රී ලංකාවේ වරායවල ලැගුම් ගෙන ගියහ.

- ශ්‍රී ලංකාවේ වරාය ආශ්‍රිත නගරවල ලැගුම් ගෙන යෑමට හේතු වූ කරුණු මෙසේ ය :
    - * තම වෙළෙඳාමට අවශ්‍ය වෙළෙඳ භාණ්ඩ මෙහි බහුලව ලබා ගැනීමට හැකි වීම.
    - * පිරිසිදු ජලය හා කෑම ලැබීම.
    - * මෙම වරායවල් ස්වභාවයෙන් ම ආරක්ෂා සහිත ඒවා වීම.
    - * නැව් අලුත්වැඩියාවට අවශ්‍ය පහසුකම් තිබීම.
    - * මෙසේ වෙරළබඩ නගරවල නැවතී යෑම ද පසුකාලීන ව එම ප්‍රදේශවල අරාබි ජනාවාස බිහිවීමට හේතු විය. ක්‍රිස්තුවට පෙර සිටම ශ්‍රී ලංකාවේ වෙරළබඩ නගරවල හා අනුරාධපුරය වැනි අභ්‍යන්තර නගරවල අරාබි වෙළෙඳුන් වාසය කළ බව ඉතිහාසඥයින් පවසති.

- ලොව ඉස්ලාමය පැතිරී ගිය හයවන ශත වර්ෂයේ හා ඉන් පසුව මෙම අරාබි වෙළෙඳාම දිගටම පැවතුණි. ඉස්ලාම් බිහිවන තෙක් අරාබි වෙළෙඳුන් යැයි හඳුන්වනු ලැබූ ඔවුන් ඉස්ලාම් බිහිවීමෙන් පසු අරාබි මුස්ලිම් වෙළෙඳුන් යැයි හඳුන්වනු ලැබූ අතර, වෙළෙඳ කටයුතුවල යෙදුණාහ.

- වෙළඳාම් කිරීමේ අරමුණින් වෙරළබඩ නගරවල රැඳුණු ඔවුන්ගේ ඉස්ලාමීය පිළිවෙත් ස්වදේශීය ජනයාගේ පිළිගැනීමට ලක් විය.

- මුස්ලිම්වරුන්ගේ ජනාවාස ප්‍රථමයෙන් ස්ථාපිත වූ ස්ථානය කුමක් දැයි නිවැරදි ව තීරණය කිරීමට නොහැකි ව ඇතත්, උමයියාවරුන්ගේ තාඩන පීඩනවලට බියෙන් හාෂිම්වරු ශ්‍රී ලංකාවට පැමිණ පදිංචි වීමත් සමඟ ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනාවාස බිහි වූ බව අලක්සන්ඩර් ජොන්ස්ටන් පෙන්වා දෙයි.

    අල්කියා බාකරි යන ග්‍රන්ථය මුල් කරගෙන සිද්දිලෙබ්බයි මහතා මුස්ලිම් නේෂන් හි සඳහන් කරන වාහිබ් ඉබ්නු අබී හබ්සා හා සම්බන්ධ සිද්ධිය ද, ඓතිහාසික ලේඛක ඉබ්නු ෂහ්රයාරි තම අජාඉබුල් හින්ද් යන ග්‍රන්ථයේ සඳහන් කරන කරුණුත්, ශ්‍රී ලංකාවේ මුල් කාලීන මුස්ලිම්වරුන් පදිංචි වීමට අදාළ තොරතුරු ලබාදෙන අතර, ඉස්ලාමීය වර්ධනයට ව්‍යාප්තියටත් හේතු වේ යන සත්‍යය ද ගෙන හැර දක්වන්නක් වී ඇත.

- ක්‍රි.ව. 9 වන ශතවර්ෂයේ දී වාණිජමය වශයෙන් සුප්‍රසිද්ධව පැවති ප්‍රධාන වරායවල් තුන අතුරින් මාන්දයි වරාය ද එකකි. මෙහි පැවැත් වූ පුරාවිද්‍යා පර්යේෂණවල දී එහි සැලකිය යුතු සංඛ්‍යාවක් අරාබි වෙළෙඳුන් සිටි බව දැනගත හැකි ය.

- මෙම කාල වකවානුවේ දී කොල්ලම් වරායේ සිට චීනය දක්වා පැවති වෙළෙඳ මාර්ගය භාවිත කිරීම සඳහා ශ්‍රී ලංකාවේ දකුණු දිග ප්‍රදේශයේ වෙරළබඩව අරාබි වෙළෙන්දන් තම ජනාවාස පිහිටුවා ගන්නා ලදී. කොළඹ, බේරුවල, කළුතර, ගාල්ල, වැලිගම, මාතර, ත්‍රිකුණාමලය, මන්නාරම සහ පුත්තලම වැනි නගර ඒවායින් සමහරකි. මෙසේ වෙළෙඳ අරමුණින් පිහිටවූ මෙම ජනාවාස මගින් ඉස්ලාමයේ දියුණුවට ඉමහත් දායකත්වයක් ලබා දෙන ලදී.

- ශ්‍රී ලංකාවේ ඉස්ලාම් දියුණුවීමට දායක වූ තවත් අංගයක් ලෙස දකුණු ඉන්දීය මුස්ලිම්වරුන් සමඟ ලාංකීය මුස්ලිම්වරු ඇති කර ගත් සම්බන්ධතාව දැක්විය හැකිය. අරාබි වෙළෙඳුන් මෙන් ඉන්දියානු වෙළෙන්ඳුන් ද ශ්‍රී ලංකාවේ වෙරළබඩ නගරවල පදිංචි වී තම ජනාවාස පිහිටුවා ගත්හ. මේ පිළිබඳ ව ජනාබ් සිද්දි ලෙබ්බයි මෙසේ පවසයි.

  ". . . දකුණු ඉන්දියාවේ තිබෙන නාගූර්, කාරයිකාල්, තොණ්ඩි, කායල් පට්ටනම් වැනි ප්‍රදේශවලින් මුස්ලිම්වරුන් වෙළෙඳාම් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවට පැමිණ පදිංචි වූහ.

- ශ්‍රී ලංකාවේ දකුණු දිග වෙරළබඩ නගරවල ඉස්ලාම්හි ව්‍යාප්තිය පහත කරුණු මගින් ගෙන හැර දැක්වේ.

  ක්‍රි.ව. 12 දී මුස්ලිම් වෙළෙඳුන් විශාල සංඛ්‍යාවක් වැලිගමෙහි ධනවතුන් ලෙස ජීවත් වූහ. වැලිගමෙහි ජීවත් වූ ආර්ථික තත්ත්වයෙන් දියුණු මුස්ලිම්වරු පෘතුගීසීන් විසින් කොල්ලකනු ලැබූහ.

  14 වන ශතවර්ෂයේ ගාල්ලේ මුස්ලිම් සමාජයක් ජීවත් විය. මෙය ඉබ්නු බතූතාගේ සංචාරක සටහනෙහි දැක්වේ. ඔහු බේරුවලට ගිය අවස්ථාවේ දී නාහුර් ඉබ්රාහිම් යන නාවික නායකයා තමාට සංග්‍රහ පවත්වා ගෞරව පැවැත් වූ බව සඳහන් කරයි.

  ක්‍රි.වර්ෂ 10 වන ශතවර්ෂයේ පටන් බේරුවල ප්‍රදේශයේ ඉස්ලාම් වර්ධනය වී පැවතිණි. ක්‍රි.ව.930 ට අයත් මෙහි සොයාගත් සොහොන් ගල ද ක්‍රි.ව.1010 ට අයත් පෙරිය තම්බි මරික්කාර් ට ශ්‍රී ලංකා රජු විසින් ප්‍රදානය කළ තඹ සන්නස ද සාධක දෙකකි.

- ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය වර්ධනයට අරාබියෙන් පැමිණි ආගමික ප්‍රචාරකයන්ගේ දායකත්වය සැළකිය යුත්තකි.

  ශ්‍රී ලාංකීය මුස්ලිම්වරු අතර ආගමික භක්තිය අඩු ව පැවති වකවානුවල දී ඔවුන්ට ආගම පිළිබඳ දේශණා පවත්වා, යහමඟට හැරවීම සඳහා බග්දාදයේ කලීෆාවරයා විසින් කාලිද් ඉබ්නු බකායා යන දේශකවරයෙක් එවා තබන ලදී. එතුමාගේ සොහොනේ සොහොන් ගල කොළඹ දී සොයාගනු ලැබීමෙන් එතුමා කොළඹ පදිංචි වී සිටිමින් තම දේශණා කටයුතුවල යෙදුණු බව ද කොළඹ මුස්ලිම් ජනාවාසවල මධ්‍යස්ථානයක් වූයේ ය යන්න ද පැහැදිළි වන්නේ ය.

- මෙම යුගයේ දී ඉස්ලාම් ස්ථාවර වීමට අවශ්‍ය සියලුම අධ්‍යාපනික පහසුකම් ලබා දෙන ලදී. සර් අලෙක්සන්ඩර් ජොන්සන්ගේ පහත සඳහන් අදහස් මෙම ප්‍රකාශය තහවුරු කරයි.

  පර්සියානු බොක්ක, බසරාව ආදිය හරහා බග්දාදය සමඟ ද, අනෙකුත් කිලාෆත් රටවල් සමඟ ද, අරාබි මුහුද හා ඊජිප්තුව හරහා මධ්‍යධරණී මුහුදු ප්‍රදේශයේ මුස්ලිම් රාජ්‍යය සමඟ ද, ස්පාඤ්ඤයේ මුස්ලිම් රජ සමඟ ද, පවත්වාගෙන ගිය සම්බන්ධතා මගින් ඔවුන්, මෙම රටවලින් පැවති ඉස්ලාමීය නීති රීති පිළිබඳ ව විවිධ අරාබි මූලග්‍රන්ථ ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්හ.

- මෙම සාධක පමණක් නොව පහත කරුණු ද ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය සංවර්ධනය විවිධ මානයක් ලබා වර්ධනය වී පැවැති බවට තහවුරු කරන්නක් වී ඇත..

  * එම අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ පැවති සියලුම ආගම් මෙන් ඉස්ලාම් ආගම ද සම ව සලකන ලදී. රජුගේ උපදේශකවරු වශයෙන් ඇමතිවරු හතරදෙනෙක් පත් කරනු ලැබ සිටි බව පෙන්වා දෙන අල් ඉදිරිස්ගේ ප්‍රකාශය මෙම කාලවකවානුවේ දී ශ්‍රී ලංකාව කුමන ආකාරයේ වර්ධනයක් ලැබ තිබුණේ ද යන්න වටහා ගැනීමට උදව් වන්නේ ය.

* මුල් කාලයේ දී වෙරළබඩ නගරවල පමණක් වර්ධනය වී පැවති ඉස්ලාමය පසුව ක්‍රම ක්‍රමයෙන් රටේ අභ්‍යන්තර ප්‍රදේශවල ද වර්ධනය වීමට පටන් ගත්තේ ය.

* අල් ඉදිරිස්ගේ ප්‍රකාශයට අනුව මෙම කාලයේ අගනුවර ව පැවති යාපහුව, කුරුණෑගල, දඹදෙනිය වැනි ප්‍රදේශවල හිජ්රි 4 වන ශතවර්ෂයේ දී ඉස්ලාම් පැතිර පැවති බව දැන ගත හැකිය.

* පසුකාලයේ පැමිණි මොරක්කෝ රටේ දේශ සංචාරකයෙකු වන ඉබ්නු බදුදාගේ සටහන් අනුව පුත්තලම හා කුරුණෑගල ගැන විශේෂයෙන් සඳහන් වේ.

  කුරුණෑගල නගරය සිය අගනුවර කරගෙන රජකළ දෙවන බුවනෙකබාහු රජ අස්වැද්දුම යන ගමේ මුස්ලිම් කාන්තාවක වූ මැදගෙඩිය කුමාරි හාමිනේ යන කාන්තාවක් විවාහ කර ගත්තේය. මෙම දෙදෙනාටම දාව උපන් වස්තු හාමි මුස්ලිමෙකු ලෙස හැදී වැඩී අවසානයේ රජකමට පත්වීම ගැන නොරිසි වූ සමහරු විසින් ඔහු මරා දමනු ලැබුවේය.

  ගලේ බණ්ඩාර ඖලියා යන නමින් ඔහු ඝාතනය කරනු ලැබූ ස්ථානයේ සොහොන අදත් පවතින අතර. මෙම ප්‍රදේශයේ පාලනය පවා අද වනතෙක් මුස්ලිම්වරු සතුව පැවතීම වැදගත් ය.

* කුරුණෑගලට තමා ගිය බව ද සේක් සිරාසි යන අය එහි මස්ජිදයක වාසය කරමින් සමනළ කන්දට වන්දනාවේ යන බැතිමතුන්ට මාර්ගය පෙන්වා දෙමින් සිටි බව ද ඉබ්නු බදුදා තම සටහනේ දක්වයි. එමගින් මෙම ප්‍රදේශයේ ඉස්ලාම් ආගම පැතිර පැවති බවට සාධක සපයයි.

* ඉබ්නු බදුදා තම ගමන් සටහනේ "කුනාගර්" යැයි සඳහන් කරන්නේ ගම්පොල නගරය ගැන බව පර්යේෂකවරු පවසති. මෙම ප්‍රදේශයෙන් මෙම වකවානුවට අයත් කාසියක් සොයාගනු ලැබීමත් ගම්පොලට සමීපව ඇති හෙම්මාතගම ප්‍රදේශයෙන් සොහොන් ගල් ද සොයාගෙන ඇත.

  මෙම සාධක සියල්ල ක්‍රි.ව. 14 වන ශතවර්ශයේ දී, මෙම ප්‍රදේශවල ඉස්ලාම් වර්ධනය වී තිබූ ආකාරය පෙන්වයි.

* වෙරළබඩ ප්‍රදේශ අතුරින් වැදගත් ස්ථානයක් හිමිවූයේ කොළඹ නගරයට ය. එම කාලයේ දී ප්‍රධාන වරායක් වූ කොළඹ වරාය පලස්තීයන මුස්ලිම්වරයෙකුගේ පාලනය යටතේ පැවතියේ ය. මෙම කාලයේ දී බේරුවල, ගාල්ල වැනි නගරවල මුස්ලිම් ජනාවාසවල පැවති ධනවත් බව හා ශක්තිමත් බව ගැන යාත්‍රිකයන්ගේ සටහන් හා කාව්‍යවලින් දැනගත හැකි ය.

- මෙසේ ස්ථාපිත කළ ජනාවාසවල වෙළෙඳාම හෝ මුහුදු ගමන් සම්බන්ධ පවරන නඩු හබවල මුස්ලිම්වරයෙකු සම්බන්ධ වූයේ නම්, නඩු විභාගයේ දී සැලකිය යුතු සංඛ්‍යාවක මුස්ලිම් උගතුන්, වෙළෙඳුන් හෝ නාවිකයන් සම්බන්ධ කර ගැනීමටත්, ආසියාතික ප්‍රාන්තවල මුස්ලිම්වරු අතර පැවති නීති රීති ක්‍රම අනුව යුක්තිය පසිඳලිය යුතු යැයි සිංහල රජවරු විසින් අණ කර තිබුණි.

- ඉස්ලාම් පෘතුගීසීන් පැමිණීමට පෙර ම ශ්‍රී ලංකාවේ මුල්බැස තිබුණු බවට සාධක පවතී. තවද ඉස්ලාමීය හැඟීම් හා දැනුමක් ඇති සමාජයක් ලෙස ශ්‍රී ලාංකීය මුස්ලිම් සමාජය පැවැතුණු බවට සාධක ඇත.

- ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ වෙළෙඳාම ය. එහෙත් ඔවුන්ගේ ජීවිතය ඉස්ලාමීය පදනමින් සකස් වූයේය. ඉස්ලාමය කෙරෙහි ඔවුන් තුළ පැවති දැඩි විශ්වාසය හා අධිෂ්ඨානශීලීත්වය ගැන ලන්දේසි ආගමික නායකයකු වන ශුද්ධ වූ ජේම්ස් සෙල්සාර්ක් යන අය මෙසේ දක්වා සිටී.

  "යෝනකයන් අතර ආගමික හැඟීම කාවැද්දීම ඉතා අමාරු කරුණකි. ක්‍රිස්තියානි ආගමට සම්බන්ධ කිසිම දෙයක් ඔවුනතර බෙදීම ඔවුන් කේන්ති ගන්වන කරුණක් වන අතර, ඔවුන් ඒවා ප්‍රතික්ෂේප කරති."

  ක්‍රිස්තු ධර්මයට හරවනු ලැබූ ජනයා අතර එක මුස්ලිම්වරයෙකුගේ නමක් හෝ නැත යැයි පවසන ගෝව් ගේ අදහස් සැළකිල්ලට ගැනීම වැදගත් ය.

- මෙසේ වෙරළබඩ නගරවල ද රටේ අභ්‍යන්තර ප්‍රදේශවල ද වර්ධනය වෙමින් ශක්තිමත් වූ ඉස්ලාම්, පෘතුගීසීන්ගේ පැමිණීමත් සමඟ පිරිහෙන්නට පටන් ගත්තේ ය. ඔවුන් ශ්‍රී ලාංකීය මුස්ලිම්වරු සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්ති අනෙකුත් රටවල මුස්ලිම්වරු සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්තිවල කොටසක් විය. ස්පාඤ්ඤයින් මුස්ලිම්වරුන්ට විරුද්ධව අනුගමනය කළ සියලු ක්‍රියා පෘතුගීසීන් විසින් ද ලාංකීය මුස්ලිම්වරුනට එරෙහිව සිදු කෙරුණි.

- පෘතුගීසීන්ගේ අරමුණ වූ වෙළෙඳාම හා ක්‍රිස්තු ධර්මය පැතිරවීම යන කරුණුවලට මුස්ලිම්වරු විරුද්ධ වූ නිසා මුස්ලිම්වරුනට එරෙහිව ඔවුන් ගෙන ගිය හිංසාකාරී ක්‍රියා දැඩි වීමට හේතු විය. මෙම තත්ත්වයන් ඉස්ලාමීය දියුණුව කෙරෙහි ද බලපෑම් ඇති කරන්නට විය.

- වෙරළබඩ නගරවලින් මුස්ලිම්වරුන් පන්නා දමනු ලැබූ අතර, මහනුවර වැනි රටේ අභ්‍යන්තර ප්‍රදේශවල ඔවුන් පදිංචි වූහ. මහනුවර රජුගේ ආරක්ෂාව යටතේ ජීවත් වූ මුස්ලිම්වරුනට රජවරු විසින් උසස් පදවි හා තානාන්තර පිරිනැමූහ. මෙම කාලයේ දී ලන්දේසීන්ට විරුද්ධව සටන් කළ මුස්ලිම්වරු තම ආගම රැකීම ද ඒ සඳහා අරමුණු කොට ගත්හ. එනිසා මහනුවර රාජධානියේ ඉස්ලාම් බාධාවකින් තොරව වර්ධනය විය.

- ලන්දේසින් මුල්කාලයේ මුස්ලිම්වරුනට හිංසා පීඩා කළ ද අවසාන කාලවල දී විවිධ සහන මුස්ලිම්වරුනට සැලැස්වූහ. ගාල්ල, වැලිගම, මාතර වැනි ප්‍රදේශවල ලන්දේසින් විසින් මුස්ලිම් ගම්පතින් . කරනු ලැබූහ. ඉන්දුනීසියානු මුස්ලිම් නීති රීති හඳුන්වා දුන් ඔවුහු මැලේ ජාතිකයන් ශ්‍රී ලංකාවේ පදිංචි කරවූහ.

  මොවුන්ගේ මෙම ක්‍රියා නිසා පෘතුගීසීන්ගේ පාලන සමයේ ඉස්ලාමයට සිදුවූ පරිහානිය තරමක් දුරට හෝ මඟහැරුණා යැයි සැලකිය හැකිය.

- බ්‍රිතාන්‍යයන් ආගම පිළිබඳ දැරූ ලිබරල්වාදී ප්‍රතිපත්තිය නිසා කලින් ශ්‍රී ලංකාව යටත් කරගෙන සිටි පාලකයන්ගේ යුගයේ අත්විඳි දුෂ්කරතා මඟහැරුණේය.

  එහෙත් ඔවුන් අනුගමනය කළ සැලසුම්ගත ජාතීන් අතර භේදය ඇති කිරීමේ ක්‍රියාවන් නිසාත්, ආගම වෙනස් කිරීම පදනම් කොටගත් අනිවාර්ය ඉංග්‍රීසි අධ්‍යාපන සැලසුම නිසාත් මෙම යුගයේ මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන වර්ධනයට බාධා ඇති විය. පැවති පරිසරය සලකා ඉංග්‍රීසි ඉගෙන නොගත යුතුය යන තීරණය මෙයට මූලික හේතුව විය.

මේ බාධකය නිසා ඉංග්‍රීසි අධ්‍යාපනය ප්‍රතික්ෂේප කළ මුස්ලිම් ජනතාව, අධ්‍යාපනය මද්රසා අධ්‍යාපනයට සීමා කර ගත්හ. මෙසේ මුස්ලිම්වරු ඉංග්‍රීසි අධ්‍යාපනය ප්‍රතික්ෂේප කිරීම නිසා මුස්ලිම්වරුන්ගේ සමාජ, දේශපාලන තලයේ බලවත් පසුබෑස්මක් ඇති කළේය. 19 වන ශතවර්ෂයේ අග භාගය තෙක් මුස්ලිම්වරුන් දේශපාලනමය වශයෙන් දායකත්වය ඉතා අඩු වීමට බලපෑ ප්‍රධාන හේතුව මෙය වන්නේය.

- මෙවැනි භයානක පසුබෑස්මෙන් සමාජය ගලවා ගැනීම සඳහා ප්‍රතිසංස්කරණවාදීන් ක්‍රියා කළහ.

  තම සමාජයේ ප්‍රගතිය රැඳී ඇත්තේ ආගම පදනම් වූ අධ්‍යාපනයේ බව වටහා ගත් සිද්දි ලෙබ්බයි, සමාජය තුළ පැවති නොදැනුවත්කම ඉවත් කර අධ්‍යාපනය කෙරේ යොමු කිරීම සඳහා මුස්ලිම් නේෂන් යන පුවත්පත ආරම්භ කළේය. මේ නිසා ශ්‍රී ලාංකීය මුස්ලිම් ජනයා සංස්කෘතික ශූන්‍යභාවයෙන් මිදී පුළුල් ඉස්ලාමීය උම්මතයේ අංගයක් ය යන හැඟීම ලදහ.

- මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන ඉදිරි ගමන සඳහා 1884 දී සිද්දි ලෙබ්බයි, ඔරාබි බාෂා, වාපිච්චි මරික්කාර් යන අය විසින් අල් මද්රසතුල් කෙරියා යන පාසල ස්ථාපිත කළහ. මෙම පසුබිම කේන්ද්‍ර කොටගෙන ක්‍රියා කළ තවත් එක් ප්‍රතිසංස්කරණවාදියා , අස්සවාබ් හා මුස්ලිම් ආරක්ෂකයා යන පුවත්පත පළ කළ අයි. එල්. එම්. අබ්දුල් අසීස් තුමා ය.

- ඉස්ලාමය පටහැනි කරුණු පහදා දීමත්, සමකාලීන මුස්ලිම් ලෝකයේ සිදුවීම් ගෙන හැර දක්වමින් අප ද මුස්ලිම් ලෝකයේ කොටසක් ය යන හැඟීම ඇති කිරීමත් මෙම පුවත් පතේ අරමුණ විය.

  ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා සටනක් ලෙස 1905 දී සිදු වූ තුර්කි තොප්පි සිද්ධිය සැලකේ.

- ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය වර්ධනය කෙරෙහි සූෆි විද්වතුන් හා තරීක්කාවල දායකත්වය සඳහන් කළ යුත්තකි. පෞද්ගලිකව ද, තරීකා වශයෙන් ද, සංවිධාන වීම ඔවුන් විසින් ඉටු කළ කාර්ය භාරය නිසා රටේ අහුමුළුවල පවා අධ්‍යාත්මයේ ආලෝකය පැතිරිණි. රටේ අද දක්වා පවතින තරීකා මෙයට සාධක වන්නේ ය. මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික අනන්‍යතාවය සුරැකීමෙහිලා මේවා මගින් අති මහත් දායකත්වයක් දැක් වේ.

  19 වන ශතවර්ෂයේ ගෝලීය මට්ටමින් හටගත් ඉස්ලාමීය රැල්ල අප රටට ද බලපෑවේය. ලෝකයේ ඉස්ලාමීය විද්වතුන්ගේ සිතුවිලිවල බලපෑම ලංකාවට ද බලපෑවේය.

  මෙම විද්වතුන්ගේ නිර්මාණ දමිළ බසින් පරිවර්තනය කර පොත්පත් වශයෙන් ද සඟරාවල නිර්මාණ ලෙසින් ද පළ විණි. මෙය ශ්‍රී ලංකාවේ ද පිරිසිදු ඉස්ලාම් දහමක් හඳුන්වා දීමට සමත් විය.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

පියවර 1 : ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ පසුබිම රසවත් ව ඉදිරිපත් කරන්න.

පියවර 2 : සිසුන් කණ්ඩායම් තුනකට වෙන් කරන්න. පහත මාතෘකා යටතේ තොරතුරු රැස්කිරීමට අවස්ථාව ලබා දී යොමු කරන්න.

i. යුරෝපීයයන්ගේ පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ ඉස්ලාම්

ii. යුරෝපීයයන්ගේ කාලයේ ශ්‍රී ලංකාවේ ඉස්ලාම්

iii. නිදහසෙන් පසු ශ්‍රී ලංකාවේ ඉස්ලාම්

පියවර 3 : එක් එක් කණ්ඩායම් රැස්කළ තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට මග සලස්වන්න.

පියවර 4 : සාකච්ඡාවක් පවත්වා ඔවුන් රැස්කළ තොරතුරු අන් අයට ද ලබා ගැනීමට අවස්ථාව සළස්වන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. අමීන් එම්. අයි. එම්. (2000) - මුස්ලිම්වරු සංවර්ධනය කළ විද්‍යාත්මක හා සෞන්දර්යමය කලාව
2. ඉස්ලාම් 11 ශ්‍රේණිය , ජාතික අධ්‍යාපන ආයතනය, 2000
3. අමීන් එම්. අයි. එම්. (2000)- ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා සංස්කෘතිය , අල්හසනාත් ප්‍රකාශනය
4. අසීස් ඒ. එම්. ඒ. (2007) ශ්‍රී ලංකාවේ ඉස්ලාම්, කුමරන් ප්‍රකාශණය
5. රහීම් අබ්දුල් - ඉස්ලාමීය විශ්වකෝෂය, 2,3 වන කොටස, යුනිවර්සල් ප්‍රකාශකයෝ, චෙන්නයි, 600017

**නිපුණතාව 7.0 : ඉස්ලාමයේ සම්භවය හා වර්ධනය පිළිබඳව ද ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දීම පිළිබඳව ද වටහාගෙන ප්‍රකාශ කරයි.**

**නිපුණතා මට්ටම 7.3 :** ශ්‍රී ලාංකිකයින් ලෙස මුස්ලිම්වරු මෙරට වෙනුවෙන් සිදු කළ දායකත්වයන් වටහාගෙන රටට සේවය කරයි.

**කාලය :** කාල පරිච්ඡේද 25

**ඉගෙනුම් ඵල :**

- සිංහල රජවරුන්ගේ කාලයේ දී හා පසුව යුරෝපීයයන්ගේ කාලයේ දී ද නිදහසෙන් පසුව ද අප රටේ මුස්ලිම්වරු මේ රටේ ප්‍රගතියට හා සංවර්ධනයට ඉටුකළ දායකත්වය දැන අගය කරමින් තමා ද ඒ අයුරින් ක්‍රියා කිරීමට උනන්දුවක් ලබයි.
- ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ දේශපාලන හා ආර්ථික, සංස්කෘතික, ජාතික මට්ටමේ දායකත්වය වටහා ගෙන, තමා ද එවැනි දායකත්වය ලබාදීමට දක්ෂතාවය හා පරිචය ලබා ගනී.

## විෂය කරුණු පැහැදිළි කිරීමට අත්වැලක්

**ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ජාතික මට්ටමේ දායකත්වය**

- වෙළෙඳාම් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවට පැමිණි අරාබිවරුන්ගේ අවධානය යොමු වූයේ තම ආර්ථික කරුණු පමණි. ඔවුන් මෙරටේ ජාතික සංවර්ධනය කෙරෙහි කිසිදු සැලකිල්ලක් නැති බව පොදුවේ අදහස් දැක්වුව ද, එම පසුබිමෙහි අපගේ මුතුන් මිත්තන් දායකත්වය පිළිබඳ ව දැන ගැනීම ඉතා වැදගත් ය.

  ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය ගැන කතා කරන කිසිවෙකුත් මෙම කොටස බැහැර කරමින්, ඔවුන්ගේ ඉතිහාසය ගැන කතා කළ නොහැකි යැයි පවසන තරමට, මෙම ජාතික දායකත්වය වැදගත් වේ.

- මේ රටේ ජීවත්වූ මුල් කාලීන මුස්ලිම්වරු තම හැකියාවන්ට අදාළ පරිදි, විවිධ ක්ෂේත්‍ර තුළින් මෙරටේ ඉදිරි ගමනට හා සංවර්ධනයට දායක වූ බව පොදුවේ ශ්‍රී ලංකාවේ ඉතිහාසය දැනගැනීමට වෑයම් කරන ඕනෑම කෙනෙකුට එහි ඉතිහාසය පුරාම හඳුනා ගන්නවා ඇත.
- මේ අනුව මුස්ලිම්වරු විදේශීය වෙළෙඳාම සුරැකීමටත්, එමගින් රටේ අභ්‍යන්තර දේශීය කෘෂිකර්මාන්තය වැනි විවිධ ක්ෂේත්‍රවල වර්ධනයටත් දායක වූහ. සිංහල රජවරුන්ගේ කාලයේත් ඉන්පසුව දේශීය දේශපාලන ක්ෂේත්‍රයේත් වැදගත් විවිධ කාර්යභාරයන් ඉටු කර ඇති බව ප්‍රතික්ෂේප කිරීමට හෝ වසන් කිරීමට හෝ නොහැකි සත්‍යයන් ය.
- මුල් කාලයේ මුස්ලිම්වරු ශ්‍රී ලංකාවේ විදේශීය වෙළෙඳාමෙහි ඉතා වැදගත් දායකත්වයක් දැක්වූහ. අනුරාධපුර යුගයේ දී දියුණුව පැවති කෘෂි ආර්ථිකයත්, එයට සම්බන්ධ ජල සම්පාදන ව්‍යුහයත්, මුස්ලිම්වරුන් සතුව පැවති විදේශීය වෙළෙඳාමින් ලැබුණු අමතර අවස්ථා යොදාගෙන දියුණු කළ ඒවාය. මෙම අදහස මහාචාර්ය ගුණවර්ධන මහතාගේ පහත සඳහන් ප්‍රකාශයෙන් තහවුරු වන්නේ ය.

"ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම වර්ධනය වී පැවති වකවානුවේ විශාල ජල සම්පාදන වැඩ කටයුතු මෙහෙයවා ඇත. විදේශීය වෙළෙඳාම මෙම ජල සම්පාදන කටයුතුවලට අවශ්‍ය ආදායම ලබා දුන් බවත් මෙයින් තහවුරු වන්නේ ය."

- අනුරාධපුර පාලන කාලයේ අවසාන කාලයේ දී ශ්‍රී ලංකාවේ කෘෂි ආර්ථිකය බිඳවැටුණු අවස්ථාවේදී, වෙනත් ආර්ථික කටයුතුවලට යොමුවීමේ අවශ්‍යතාවය උදා විය. මෙම තත්ත්වය යටතේ කෘෂි ක්ෂේත්‍රයේ ඇති වූ පසුබෑස්ම නිසා ඇති වූ ආර්ථික පාඩුව, දකුණු ආසියානු රටවල් හරහා මුස්ලිම්වරු සිදුකළ වෙළෙඳ කටයුතු මගින් ලැබුණු ආදායම මගින් පිරිමසා ගන්නා ලදී.

- මුස්ලිම්වරු හඳුන්වා දුන් තවලම් ගමනාගමන ක්‍රමය ඔවුන් මෙරටට කළ තවත් එක් වැදගත් දායකත්වයකි.

  අරාබියේ දී ඔටුවන්, බූරුවන්, අශ්වයින් යොදාගෙන බඩු රැගෙන ගිය අරාබි වෙළෙන්දන් මේ රටේ වෙරළබඩ හා කඳුකර ප්‍රදේශ අතර බඩු ප්‍රවාහණය සඳහා ගවයින් යොදා ගත්හ. මෙය තවලම් නම් වේ.

- කඳුකර පෙදෙස්වල වෙළෙඳ භාණ්ඩ වූ පුවක්, ඇත් දළ වැනි ඒවා වෙරළබඩ වරායවල් වන කොට්ටියාරම, කල්පිටිය, පුත්තලම වැනි ස්ථානවලට රැගෙන ගොස්, ඔවුන් එහි සිට ලුනු, කරවල, රෙදිපිළි ආදිය වෙරළබඩ නගරවලින් කඳුරටට ගෙන ගියහ.

- මහනුවර මහරජු රාජසිංහ 1762 දී හමුවීමට ගිය සුදු ජාතික දූතයා වූ ජෝන් පයිබස් ගවයින් 20-30 අතර සංඛ්‍යාවකින් යුත් ගවයින් මත වෙළෙඳ භාණ්ඩ පොදි බැඳගෙන වරායවල් වෙතට ගමන් කළ මුස්ලිම් වෙළෙඳුන් පිරිසක් දුටු බව දක්වන අදහස මෙහි සැලකිල්ලට ගත යුත්තකි.

  ශ්‍රී ලංකාවට පේෂ කර්මාන්තය හඳුන්වා දෙන ලද්දේ ද අප මුතුන් මිත්තන් විසිනි. බේරුවල (බාබරින්) නගරයේ විසූ ව්‍යාපාරිකයෙකු විසින් 12 වන සියවසේ අග භාගයේ නැත්නම් 13 වන සියවසේ මුල් භාගයේ දී මෙම කර්මාන්තය හඳුන්වා දෙනු ලැබූ බව සර් ඇලෙක්සන්ඩර් ජොන්ස්ටන් ආසියානු සංගමයට ලියූ සිය ලිපියක සඳහන් කරයි.

- කුරුඳු පොතු වගා කිරීම සම්බන්ධව මෙන් ම ඒවා පදම් කිරීම සම්බන්ධයෙන් ද අපගේ මුතුන් මිත්තන් සැලකිල්ලක් දැක්වූහ. එයට සාධක ලෙස ඇලෙක්සන්ඩර් ජොන්ස්ටන්ගේ ඉහත ලිපිය සාධක සපයයි. එහි ඔහු මෙසේ කරුණු දක්වයි.

  ශ්‍රී ලංකාවේ, නිරිත දිග වෙරළබඩ පළාත්වල හා රට අභ්‍යන්තරයේ කුරුඳු සාමාන්‍යයෙන් වගා කෙරේ. වෙරළබඩ ප්‍රදේශවල කුරුඳු වගා කිරීම ද ඒවා පදම් කිරීම ද කරනු ලබන්නේ එක්තරා ජාතිකයන් (මුස්ලිම්වරු) ය. ඔවුන්ගේ සංඛ්‍යාව 24 000 ටත් 25 000 ටත් අතර වේ.

- මෙරට වෛද්‍ය ක්ෂේත්‍රයට මුස්ලිම්වරුන්ගෙන් ඉටු වූ සේවාව අති මහත් ය. යුනානි වෛද්‍ය ක්‍රමය මුස්ලිම්වරුන්ගේ වෛද්‍ය ක්‍රමය ලෙස සැලකේ. 9 වන 10 වන ශතවර්ෂවල වෙරළබඩ වරාය ආශ්‍රිත නගරවල ජීවත් වූ අරාබි ජනයා මගින් මෙම යුනානි වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාවේ හඳුන්වා දෙනු ලබන්නට ඇතැයි පර්යේෂකයින් සලකයි. මුලදී වෙරළබඩ ප්‍රදේශවල පමණක් භාවිතාව පැවති මෙම වෛද්‍ය ක්‍රමය ක්‍රම ක්‍රමයෙන් රටේ අභ්‍යන්තර පෙදෙස්වලට ද ව්‍යාප්ත විය.

- 10 වන ශත වර්ෂයේ දී බේරුවල පදිංචි ව සිටි තුර්කියේ පාලකයාගේ පුත්‍ර ජමාලුද්දීන් සහ ඔහුගේ පුත්‍රයා යුනානි වෛද්‍ය සම්ප්‍රදාය අනුගමනය කළ බවට ජන වහරක් පවතී.

මේ පිළිබඳ ව ඇලක්සන්ඩර්ගේ පහත ප්‍රකාශය වැදගත් ය.

මෙම පවුලේ ප්‍රධානියා ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස මා විසින් 1806 දී පත් කරන ලදී. මෙම දූපතේ වාසය කළ ස්වදේශීය වෛද්‍යවරුන් අතුරෙන්, ඉතාමත් බුද්ධිමතෙක් ලෙස ඔහු සලකන අතර, ස්වදේශීය වෛද්‍ය ග්‍රන්ථවලින් ඉතා හොඳ ග්‍රන්ථ ඔහු සතුව පැවතිණි. එයින් බොහෝමයක් ඔවුන් පවුලේ අය විසින් වසර 700 ක් 800 ක් පමණ කාලයක් තිස්සේ, පරිහරණය කරන ඒවා ය. මෙම කාල වකවානුව තුළ ඔහුගේ පවුලේ එක් අයෙකු හෝ වෛද්‍ය වෘත්තියේ යෙදී ඇත. ශ්‍රී ලංකාවේ ස්වදේශීය මුස්ලිම් වෛද්‍යවරු විසින් ඉතා පුරාණ කාලයේ සිට භාවිත කළ මෙම රටේ සියලු ඖෂධ පැළෑටි පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් ඔහු මට සැපයුවේ ය.

- භූ විද්‍යාඥ වූ අල් ඉද්රීසි, යාකූත් අල් හමවි, අල් කස්වීනි වැනි අය ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ අතර ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ඖෂධ පැළෑටි ද ඇතුළත් වූ බව පවසයි. සෙනරත් රජුගේ පුත් දෙවන රාජසිංහ රජතුමා ගාල්ලේ යුනානි වෛද්‍යවරයා ලෙස කටයුතු කළ සුල්තාන් නැමැති අයට ඉඩම් කැබැලි දෙකක් තෑගි වශයෙන් ලබා දුන්නේ ය. මහනුවර වාසය කිරීමට ද අවසර දුන්නේ ය. සුල්තාන් මහනුවර රජ වාසලේ සේවය කළේය.

මුස්ලිම් වෛද්‍යවරු සිංහල රජවරුන්ගේ විශ්වාසය ලබාගත් නිසා, ඔවුනට බෙහෙත් ගේ මුහන්දිරම් (රජයේ වෛද්‍ය අංශයේ ප්‍රධානී) යන තානාන්තරය ලබා දුන්නේ ය. එපමණක් නොව, දුම්බර, මාතලේ, යටිනුවර වැනි ප්‍රදේශවල ඉඩම් ලබා දී, වෛද්‍ය තිලක රාජකරුණා ගෝපාල මුදලි යන කීර්ති නාමය ද ලබා දී ගෞරව කළේය.

කීර්ති ශ්‍රී රාජසිංහගේ කාලයේ දී ඔහුගේ පාලනය පෙරළා දැමීම හා ඝාතනය කිරීම සඳහා සැළසුම් කළ කුමන්ත්‍රණය පිළිබඳ ව මෙවැනි ගෝපාල මුදලි වරයෙක් මගින් විස්තර දැනගත් රජතුමා එම ගෝපාල මුදලිට තඹ සන්නසක් ලබා දුන්නේ ය. ඒ අතර ඉඩකඩම් ද ලබා දුන්නේ ය.

- මුස්ලිම්වරුන්ගේ දායකත්වයන් අතර ජාතික දේශපාලන ක්ෂේත්‍රය කෙරෙහි ඔවුන්ගේ සේවාවන් වැදගත් කොට සැලකිය යුතු ඒවා ය.

සමහර අවස්ථාවල සිංහල රජවරුන්ගේ දූතයන් ලෙස ක්‍රියාකර මහත් සේවාවක් ඉටු කළහ. ඊජිප්තුව සමඟ වෙළෙඳ සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට බලාපොරොත්තු වූ පළවන බුවනෙකබාහු මහරජු අල්හාජ් අබු උස්මාන් යන දූතයා ඊජිප්තුවට යවා තැබීය.

ජෝන් පයිබස් මහනුවර රජු හමුවීමට ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේ දී මහනුවර මහරජුගේ දූතයා ලෙස ත්‍රිකුණාමලයට ගොස් එතුමා මහනුවරට කැඳවාගෙන පැමිණියේ, උදුමාන් ලෙව්වයි යන මුස්ලිම් පුද්ගලයා ය. බුවනෙකබාහු පෘතුගීසීන් සමඟ එක් ව මායාදුන්නට විරුද්ධ වූ විට කල්ලිකොට්ටයි හි රජුගේ සාමොර්ගේ උදව්ව මායාදුන්නට අවශ්‍ය වූ විට, ඒ සඳහා කල්ලන්කෝට්ටයි වෙත යවා තැබුවේ ද මුස්ලිම්වරු ය.

සිංහල රජතුමාගේ රජවාසලේ මුස්ලිම් අමාත්‍යවරු හතර දෙනෙක් සේවය කළ බව භූගෝල විද්‍යාඥ ඉද්රීස් පවසයි. ඔවුන් සතර දෙනා අමාත්‍යවරුන් වූවා පමණක් නොව විදේශීය ජාතිකයන් අතර ඇතිවන මතභේද සමථයකට පත් කරන අය ලෙස ද විදේශ වෙළෙඳාමේ රජයෙට උපදේශකයන් ලෙස ද ක්‍රියාකළ බව පී. ජේ. පෙරේරා පවසයි.

- මහනුවර රජු වෙනුවෙන් මුස්ලිම්වරු ලන්දේසීන්ගේ සහාය පැතූ නිසා පෘතුගීසීන් විසින් 1642 දී මාතර විසූ 200 - 300 දක්වා වූ පිරිමින් සමූල ඝාතනය කළහ. දරුවන් හා කාන්තාවන් සිර අඩස්සියේ තැබූහ. පෘතුගීසීන් පළවා හැරීමේ කාර්යයට සහාය දැක්වීමට ස්තුති කිරීම ලෙස ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අකුරණයෙහි ඉඩම් සපයා දී මුස්ලිම්වරු එහි පදිංචි කරවීය.

  1815 දී එංගලන්තයේ පැවති ලිබරල්වාදී ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවට ද බලපෑවේය. එහි ප්‍රතිඵලයක් ලෙස 1833 හඳුන්වා දෙන ලද ව්‍යවස්ථා දායක සභාවට සහභාගී වීමට මුස්ලිම්වරුනට ද අවස්ථාව ලැබුණි.

  1865 දී මහ නගර සභා සහ පළාත් පාලන සභාවල ද සහභාගී වීමට අවස්ථාවක් මුස්ලිම්වරුනට හිමි විය. මහනුවර මහනගර සභාවේ මුස්ලිම්වරු 8 දෙනෙක් මුස්ලිම්වරු නියෝජනය කළහ.

  1833 දී ව්‍යවස්ථාදායක සභාව පිහිටුවන ලද නමුත් 1889 තෙක් එයට සහභාගී වීමට මුස්ලිම්වරුනට අවස්ථාවක් නොලැබුණි. පරංගීන් හා වතු පාලකයින් මුස්ලිම්වරුනට වඩා අඩු සංඛ්‍යාවකින් යුක්ත වුව ද ඔවුන්ට නියෝජනය කිරීමට අවස්ථාව ලබා දී තිබුණි. මේ නිසා සිද්දි ලෙබ්බයි හා ඔහුගේ හිතවතුන් දේශපාලන අයිතිවාසිකම් ඉල්ලා හඬ නැගූහ. මෙහි ප්‍රතිඵලයක් ලෙස 1899 දී එම්. සී. අබ්දුර් රහ්මාන් ව්‍යවස්ථාදායක සභාවට තෝරා පත් කරගන්නා ලදී.

  නිදහස් අරගලවලදී ද අනෙකුත් ජාතීන් හා එක් ව මුස්ලිම්වරු ද හඬනැගූහ. නිදහස දිනාගැනීම සඳහා 1919 දී ස්ථාපිත කරන ලද ජාතික කොංග්‍රසයේ උප සභාපතිවරයකු ලෙස ටී.බී. ජායා තෝරාගන්නා ලදී. පසුව මුස්ලිම්වරුන් කිහිප දෙනෙකු එහි බැඳුනහ.

- රාජ්‍ය සභාවේ දී ටී. බී. ජායා මහතා සිය දේශනයක දී "ජාතියක් ලෙස ඉල්ලීම් හා ලාභ ප්‍රයෝජන ලබනවාට වඩා නිදහස ලබා ගැනීමට වැඩ කිරීම මුස්ලිම්වරුන්ට වැදගත් බව" පැවසීය. මෙය ජායාගේ ජාතික හැඟීමට හොඳ උදාහරණයකි.

  1939 දී පවත්වන ලද සමස්ත ලංකා දේශපාලන මහ සභාවේ දී, රාජ්‍ය සභාවේ සාමාජික සර් මාකන් මාකර්, මෙරටේ මහ ජාතිය සුළු ජාතියක් බවට පත්වීම අනුමත කළ නොහැකි යැයි පැවසීය.

  මෙම මහ සභාවේදී ම ආචාර්ය බද්යුද්දීන් මහ්මුද් මහතා තම කතාවේ දී, ශ්‍රී ලංකාවට නිදහස ඉල්ලීම සඳහා සිංහල රජය සමඟ තමා ද එක්වන බව පැවසීය.

  අප සතුව තිබූ දේශපාලන දැනුම හා නීතිය ස්ථාපිත කළ යුතු ය යන හැඟීමත්, මෙරටට ඩොමිනියන් තත්ත්වය ඉල්ලන විට, සිංහල ජනතාව සමඟ උරෙන් උර ගැටී සටන් කිරීමට අප පෙළඹවීය යැයි සර් රාසික් ෆරීද් මහතා 1945 දී ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන් රාජ්‍ය සභාවේ කතා පැවැත් වූ අවස්ථාවේ දී පැවැසීය.

- මුස්ලිම්වරු සිංහල රජුගේ යුගයේ දී ඔවුන්ගේ හමුදාවට බැඳී සේවය කළහ. පෘතුගීසි හමුදාවට එරෙහිව රජුගේ හමුදා සමඟ එකතුව සටන් කළ ආකාරය ඉතිහාසගත සටහන්වලින් දැක්වේ.

- දෙවන රාජසිංහ රජුගේ කාලයේ දී "වැල්ලවාය" නම් සටනේ දී මුස්ලිම්වරුන්ගේ ඔටු හමුදාවට ප්‍රධාන තැනක් හිමි විය. මෙම ජයග්‍රහණයට ප්‍රශංසා කිරීමක් ලෙස හඟුරන්කෙත දේවාලයට ප්‍රදානය කළ තිර රෙද්දෙහි ඔටුවන්ගේ හමුදාව ඇඳ තිබීම දැකිය හැකිය.

**ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික දායකත්වය**

- ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු සංස්කෘතික රටකි. එහෙයින් මෙහි ජීවත්වන සියලු ජන කොටස් සතුව සංස්කෘතික දායාදයන් පවතී. එසේම මෙරට වාසී මුස්ලිම්වරු ද අනන්‍ය වූ සංස්කෘතික පාරම්පරිකත්වයක් සහිත වෙති.

- ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික පාරම්පරිකත්වය අන් ජන කොටස්වල සංස්කෘතික අංශවලින් වෙනස් වූවකි. මෙයට හේතුව මුස්ලිම්වරුන් ජීවනකටයුතු සෑම එකකම ඉස්ලාම් ප්‍රධාන තැනක් ගැනීම ය. එනම් මුස්ලිම්වරුන්ගේ ජීවන කටයුතු ඔවුන්ගේ ආගමින් වෙන් කළ නොහැක්කකි.

- අරාබි වෙළෙඳාම පදනම් කරගෙන බිහි වූ ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස පිහිටා තිබුණේ වෙරළබඩ ප්‍රදේශවල ය. මෙසේ පිහිටා තිබූ ජනාවාසවල මස්ජිද ද, ඒ හා සම්බන්ධ වූ කුත්තාබ් යන කුර්ආන් පාසල් ද විය.

- අද මෙසේ මුල් කාලයේ ඉදිකළ මස්ජිද කිසිවක් දක්නට නැත. අද ඇති මස්ජිද සියල්ල පෘතුගීසීන්ගෙන් පසුව ඉදිකළ ඒවා ය.

- ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ගොඩනැගිලි කලාව ආරම්භ වන්නේ මස්ජිද් ඉදිකිරීමේ කලාවෙනි. මිහ්රාබ් මිනරා කුබ්බා ආදිය මස්ජිද් ගොඩනැගිලි කලාවේ ප්‍රධාන අංගයන් ය. මෙහි දී විවිධ රටවල කුබ්බාව විවිධ ආකාරයේ හැඩය ලැබුව ද මෙරට ඉදිකළ මස්ජිද්වල කුබ්බාවලට එතරම් වැදගත්කම් නොදෙන ලදී. එහෙත් මෑත කාලයේ ඉදිකළ කුබ්බාවල මැදපෙරදිග රටවල ආභාෂය දක්නට ඇත. මිනාරා ද කුබ්බා මෙන් වැදගත්කමක් ලැබුවේ මෑත කාලයේ දී ය.

  ශ්‍රී ලාංකීය මස්ජිද් ගොඩනැගිලි කලාවේ වැදගත් ස්ථානයක් හිමිවන අන් කරුණු දෙක නම් මිම්බර් හා මිහ්රාබ් ය. සාමාන්‍යයෙන් අප රටේ මස්ජිද, පිටත කොටස හා ඇතුළත කොටස යැයි කොටස් දෙකකින් සමන්විතය. අභ්‍යන්තර කොටසෙහි සලාත් ඉටු කෙරෙන අතර, බාහිර කොටසෙහි රැස්වීම් හා අන් අංග (මව්ලිද්, හිස්බු, රාතිබු ආදිය) ඉටු කෙරේ. මෙම අංග වර්තමානයේ හිඟවන බවක් දක්නට ඇත. මස්ජිද් ගොඩනැගිලි කලා සම්ප්‍රදායයෙන් අරාබි අක්ෂර කලා මෝස්තර සහිත හව්ල් වැදගත් තැනක් ගත්ත ද ශ්‍රී ලංකාවේ මස්ජිද්වල ඇති හව්ල් හි මෙවැනි මෝස්තර නොමැත. සම්මන් කොටුව මස්ජිදයේ ඇති හව්ල් පමණක් මැලේසියාවේ සහ ඉන්දීය කලා සම්ප්‍රදායයේ බලපෑමට ලක් වූවක් ලෙස දක්නට ඇත.

  ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික සදාචාර පර්සියානු බලපෑමට වඩා අරාබිය බලපෑම අධිකය. එහෙත් සමකාලීන තත්ත්වය යටතේ මෙම සුවිශේෂ ලක්ෂණයෙහි පසුබැස්මක් ඇතිවන බව පෙනෙන්නට ඇත. අප රටේ මුස්ලිම්වරුන්ගේ බහුතරයක් ෂාෆි මද්හබයට අයත් වූවන් වෙති. ඔවුහු අහ්ලුස් සුන්නා පිළිපදින්නන් ද වෙති. වෙළෙඳ අරමුණින් දකුණු හා ගිනිකොණ රටවලට පැමිණි අරාබිවරු වැඩි වශයෙන් ෂාෆි මද්හබයට අයත් වූවන් වීම මෙයට හේතුව විය.

  19 වන ශතවර්ෂයේ මුල් කාලවල දී මුස්ලිම් ගොඩනැගිලි කලා සම්ප්‍රදායයෙහි, මස්ජිදවලට අමතරව සාවියා, තක්කියා, දර්ගා යන අංග ද ඇතුළත් විය. මෙම කාලවකවානුවේ ඇති වූ සූෆි තරීකාවල බලපෑම මෙම බිහිවීමට හේතු වූ බව සිතිය හැකිය. සාදුලියා තරීකාවේ මධ්‍යස්ථානය සාවියා ලෙස ද කාදිරියා තරීකාවේ මධ්‍යස්ථානය තක්කයා ලෙස ද හැඳින් වේ.

  ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික හා සදාචාරාත්මක පාරම්පරිකත්වයේ, තරීකා විසින් ප්‍රබල බලපෑම් ඇති කෙරුණි. ෂාදුලිය්යා, කාදිරිය්යා, රිෆා ඉයියා නක්සබන්දිය්යා වැනි තරීකාවන් අප රටට පිවිසියේ ය.

මාපිල්ලයි ලෙබ්බයි ආලිම්, කීලක්කරයේ අබ්දුල් කාදර් තයික්කා සාහිබ් වැනි අය, කාදිරිය්යා තරීකාව ශ්‍රී ලංකාවේ ස්ථාපිත කළහ. ෆික්හ්, තසව්වුෆ්, අකීදා සම්බන්ධව මොවුන් ලියා පළකළ ග්‍රන්ථ ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ අධ්‍යාත්මික සිතුවිලි කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. අන් තරීකා හඳුන්වා දෙනු ලැබුවේ ද එසේ ය.

19 වන ශතවර්ෂයේ පමණ ශ්‍රී ලංකාවට පැමිණි සූෆි විද්වතුන් මෙරට මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික සම්ප්‍රදාය කෙරෙහි ප්‍රබල දායකත්වයක් කර ඇති බව කිසිවෙකු ප්‍රතික්ෂේප කළ නොහැකි සත්‍යයකි. මෙම කාලවල දී යෙමන් රාජ්‍යය සහ ශ්‍රී ලංකාව අතර කිට්ටු සංස්කෘතික සම්බන්ධතා පැවැතිණි. අබ්දුල්ලා ඉබ්නු පාතිබ් අල් යමනි යන යෙමන් රාජ්‍යයේ සූෆි උත්තමයාණන්ගේ සොහොන ද මෙහි තිබීම අවධානයට යොමු විය යුත්තකි.

පෘතුගීසීන්ගේ පැමිණීමත් සමඟ මෙරට මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික පාරම්පරිකත්වයට තදබල බලපෑම් ඇති වුව ද, එම තර්ජනවලින් මෙරට මුස්ලිම්වරු බේරා ගැනීමට සමත් වූයේ දකුණු ඉන්දියාව සමඟ පැවති වෙළඳ හා සංස්කෘතික සම්බන්ධතාවයයි.

පෘතුගීසීන් එතෙක් අරාබිය සමග පැවති දීර්ඝ කාලීන සම්බන්ධතාවය බිඳ දැමූවිට, මුස්ලිම්වරුනට කළ හැකි වූයේ දකුණු ඉන්දියාව සමඟ පැවැති තම සම්බන්ධතාවය දැඩි කිරීමයි.

දකුණු ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ මව්බස දෙමළ වීම මෙම සම්බන්ධතාවය තහවුරු කරන්නක් නිසා මෙහි ප්‍රතිඵලයක් ලෙස අරාබි දෙමළ බස බිහි විය. කල්යත් ම මෙම බස එම දෙපිරිසගේ ම සංස්කෘතික භාෂාවක් බවට පරිනත විය.

දකුණු ඉන්දීය මුස්ලිම්වරු අරාබි - දෙමළෙන් ලියා පළකළ ග්‍රන්ථ ලාංකීය මුස්ලිම්වරු අතර ප්‍රචලිත විය. ශ්‍රී ලංකාවේ ආගමික මෙහෙය ඉටුකළ ද, ඉන්දියානු ආගමික විද්වතාණන් වූ මාප්පිල්ලයි ලෙබ්බෙ ආලිම් තුමා මහානි, ෆත්හුද් දයියාන් වැනි ග්‍රන්ථ ශ්‍රී ලාංකීය මුස්ලිම්වරු අතර ඉස්ලාමීය වගකීම් පිළිබඳ කරුණු දැනගැනීමටත්, ඒවා ක්‍රියාත්මක කිරීමටත්, සහාය වුනි. එතුමා අරාබි දෙමළෙන් පරිවර්තනය කර පළකළ කුත්බා යන ග්‍රන්ථය සිකුරාදා දිනවල කුත්බා දේශන සඳහා බෙහෙවින් භාවිත විය.

අරාබි දෙමළ බසේ දියුණුවට දායක වූ විද්වතුන් අතර, සෙයිහු මුස්තෆා කසාවත්තයි ආලිම් අප්පා කවියා වැනි අය සැලකිය යුතු අය වෙති. එතුමාගේ නිර්මාණ අතර කසීදා, මර්සියා, නම් පද්‍ය හා ගද්‍ය ග්‍රන්ථ සුවිශේෂ වූ ඒවා ය.

ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික ජීවිතයේ තරීකා වැදගත් දායකත්වයක් දැක් වූ නිසා ඔවුන්ගේ අධ්‍යාත්මික ජීවිතය බෙහෙවින් තක්කියා හා සාවියා කේන්ද්‍ර කොටගත් ඒවා විය. රාතිබු, විරුදු, (නිදසුන් : රාතිබුල් හද්දාද්, හිස්බුල් බහ්ර් ආදිය තරීකාවල අධ්‍යාත්මික වත් පිළිවෙත් සමහරක් ය. මේවා පදනම් කරගෙන ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ ආගමික කටයුතු සංස්කෘතික ගුණ ලක්ෂණය සිතුවිලි රටා ද ගොඩනැඟුණි. මෙම මූලික ලක්ෂණ ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ හිත් තුළ පැලපදියම් කිරීම සම්බන්ධයෙන් සූෆි විද්වතුන්ගේ ග්‍රන්ථ ද දායකත්වයක් ඉටු කළේය.

ඉමාම් ගස්සාලිගේ ෆිතායතුල් හිදා යන ග්‍රන්ථය තීලක්කරයි සෙයියදු මුහම්මදු ආලිම් තුමා විසින් අරාබි දෙමළට පරිවර්තනය කෙරුණි. රාතිබුල් හද්දාද් නූහ් ලෙබ්බයි ආලිම් විසින් පරිවර්තනය කෙරුණි. අද තත්ත්වය අනුව සම කාලීන මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික හා සදාචාරාත්මක වර්ධනය කෙරේ නවීන යුගයේ ඉස්ලාමීය සංවිධාන හා සමිති සමාගම් සැලකිය යුතු අන්දමේ දායකත්වයක් සපයයි.

මේවාට අමතරව, මුස්ලිම් ලෝකයේ ඉස්ලාමීය සංවිධාන හා ඒවා පළකරන ග්‍රන්ථ සඟරා, සංයුක්ත තැටි ආදිය ලාංකීය මුස්ලිම්වරු අතර සංස්කෘතික ව්‍යුහය කෙරෙහි බලපෑම් කරන ආකාරය ද දැකිය හැකිය.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

පියවර 1 : මුස්ලිම්වරු ශ්‍රී ලංකාවට ඉටුකළ දායකත්වයන්ගෙන් වැදගත් වන කිහිපයක් ඉදිරිපත් කර පහදන්න.

පියවර 2 : සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා "නිදහසට පෙර මුස්ලිම්වරුන්ගේ ජාතික සහභාගීත්වය, නිදහසින් පසුව දායකත්වයට වඩා අඩු ය" යන මාතෘකාවට පක්ෂව හා විරුද්ධව විවාදයක් පැවැත්වීමට කරුණු ගොනු කිරීමට යොමු කරන්න.

පියවර 3 : ශිෂ්‍ය සංගමයේ දී ඔවුන් අතර විවාදයක් පවත්වන්න.

පියවර 4 : අඩුපාඩුකම් සපුරා සිසුන්ගේ හැකියාවන් අගය කරන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. ෂුක්රි එම්. ඒ. එම්. - ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ පෞරාණික ඓතිහාසික මග, ඒ. ජේ. ප්‍රකාශකයෝ, කොළඹ.
2. අමීන්, එම්. අයි. එම්. (2010) - ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ ප්‍රතිසංස්කරණවලට මුල් වූවෝ අල්හසනාත් මුද්‍රණාලය, හෙම්මාතගම.
3. අමීන්, එම්. අයි. එම්. (2000) - ශ්‍රීලාංකීය මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා සංස්කෘතිය, අල් හසනාත් මුද්‍රණාලය, හෙම්මාතගම.
4. අසීස්. ඒ. එම් ඒ. (2007)- ශ්‍රී ලංකාවේ ඉස්ලාම්, කුමරන් මුද්‍රණාලය, කොළඹ.
5. අබ්දුර් රහීම් - ඉස්ලාමීය විශ්වකෝෂය I, II , යුනිවර්සල් ප්‍රකාශකයෝ, චෙන්නයි.
6. අසීස් අයි. එල්. එම්. ඒ. - ශ්‍රී ලාංකීය යෝනකයන්ගේ ඉතිහාසය, කොළඹ යෝනක සංස්කෘතික මධ්‍යස්ථානය
7. කමල්දීන් එස්. එම්. (1990) - ආචාර්ය බුර්හානුදීන් ජායා, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

**නිපුණතාව 8.0 : පෞද්ගලික හා පවුල් ජීවිතය සම්බන්ධ ඉස්ලාමීය නීති රීති හා ඉගැන්වීම් උගෙන සිය ජීවිතය සකස් කර ගනියි.**

**නිපුණතා මට්ටම 8.1** : පෞද්ගලික හා පවුල් ජීවිතයේ ඉස්ලාමීය ප්‍රවේශය යොදා ගනිමින් තම පවුල් ජීවිතය යහපත් ලෙස සකස් කර ගනියි.

**කාලය** : කාල පරිච්ඡේද 30

**ඉගෙනුම් ඵල** :

- පෞද්ගලික හා පවුල් ජීවිතයේ වැදගත්කම ඉස්ලාමීය දෘෂ්ටිය අනුව සාධක සහිත ව ඉදිරිපත් කරයි.
- විවාහය, දික්කසාදය, ඉද්දා පිළිබඳ නීති රීති ෂරීආ පදනමින් පහදා ලියයි.
- සැමියා - බිරිඳ, දෙමාපියන් - දරුවන්, වගකීම් හා අයිතිවාසිකම්, පිළිබඳ ව කුර්ආන් හා සුන්නාවෙන් සාධක දක්වා හඳුනා ගනියි.
- නෑයින්, අසල්වැසියන්ගේ වගකීම් හා අයිතිවාසිකම් දැන ක්‍රියාත්මක වෙයි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

- පිරිමියෙක් හෝ කාන්තාවක් තනි පුද්ගලයා යන අර්ථකථනයට ඇතුළත් ය. තනි පුද්ගලයා ගොඩනැගිල්ලක ඇති ගඩොලකට සමාන ය.
- තනි පුද්ගලයින් එක් වී පවුල යන ඒකකයත්, පවුල් එක් වී සමාජයත් ඇති වන්නේ ය.
- හොඳ පවුල් සැකැස්මක් ඇති කිරීම අදහස් කරගත් ආගමක් වශයෙන් ඉස්ලාම් තනි පුද්ගලයාට වැඩි වැදගත්කම් ලබා දෙන්නේ ය.
- ඊමාන්, ඉබාදා, අක්ලාක් වැනි මූලික අංගයන්ගෙන් ඉස්ලාම් තනි පුද්ගලයින් බිහිකිරීම සඳහා පුහුණුව ලබා දෙන්නේ ය. මෙම පුහුණුව ලැබීම පුද්ගලයාගේ වගකීමයි. එය ෆර්ල් අයින් වේ.
- කියාමාවේ දී මිනිසුන් අල්ලාහ් විසින් ප්‍රශ්න කරනු ලබන්නේ තනි පුද්ගලයන් ලෙස සලකා ය.
- කිසිදු පුද්ගලයෙකුට තවත් අයෙකුගේ වගකීම් දැරිය නොහැකි ය.
- කවුරුන් අංශු මාත්‍රයකින් හෝ යම් ක්‍රියාවක් කරයි ද ඔහු එහි ප්‍රතිඵල ලබයි. කවුරුන් අංශු මාත්‍රයක හෝ අකුසලක් කරයි ද ඔහුට එහි ආනිසංසය හිමි වන්නේ ය. (99:7-8)
- ඔබ සැම දෙනාම වගකීම් දරන්නන් ය. ඔබගේ වගකීම් පිළිබඳ ව ඔබ සැමදෙනා ම (තනි තනිව) ප්‍රශ්න කරනු ලබන්නේ ය. (බුහාරි)
- මිනිසා දුර්වලතාවයන්ගෙන් සපිරුණු අයෙකි. ඒ නිසා තනි පුද්ගලයෙකු ලෙස පවතිමින් තම වගකීම් නිසි පරිදි ඉටුකර ජයලැබීම අසීරු කරුණක් වන නිසා, තනි පුද්ගලයකු ලෙස ජීවත් වීම ගැන අවධාරණය කර, සමූහ ජීවිතයක් කෙරෙහි පොළඹවයි.
- රංචුවෙන් තනි වූ එළුවෙකු පහසුවෙන් වෘකයෙකුට ගොදුරු වන්නාක් මෙන් සමූහයෙන් වෙන් ව යන මිනිසා ෂයිතාන්ගේ ග්‍රහණයට අසුවන්නේ ය.

  අල්ලාහ්ගේ උදව්ව පවතින්නේ එකමුතුව ජීවත් වන්නන් සමඟ ය.

**පවුල**

- පිරිමියෙකු කාන්තාවක හා නීත්‍යානුකූලව විවාහ වීමෙන් පවුලක් බිහිවන්නේ ය. පරම්පරාවෙන් හෝ මව්කිරි බීම නිසා හෝ දරුවන් හා වෙනත් නෑදෑයින් එක් වූ විට පවුල විස්තීරණ වේ.

- විවාහක බන්ධුතාවය, ලේ නෑකම, කිරි බීමේ නෑකම හැර වෙනත් ආකාරයකින් පවුල බිහිවීම ඉස්ලාම් අනුමත කරන්නේ නැත. (හදා ගැනීම සඳහා බාර ගැනීම, වැරදි ලිංගික සම්බන්ධතාවය නිසා දරුවන් ලැබීම වැනි)

- පවුල් බිහිවීම සඳහා අල්ලාහ් විසින් අනුමත ස්වභාවික පිළිවෙළ පුරුෂයා හා කාන්තාව යන විරුද්ධ ලිංගික පුද්ගලයින් දෙදෙනෙක් නීත්‍යානුකූල සහකරුවන් ලෙස, ක්‍රියා කිරීමයි. මෙම පිළිවෙළට වෙනස් ආකාරයෙන් ක්‍රියා කිරීම මිනිස් සමාජයට විනා කිරීමකි.

- නවීන යුගයේ පවුල යන පදනම බිඳ දමන සිතුවිලි බිහිවීම නිසා, විධිමත් පවුල් ව්‍යුහය රැක ගැනීමේ අවශ්‍යතාවය වැඩියෙන් වටහා ගෙන ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය 1994 වන වසර අන්තර් ජාතික යහපත් පවුල් වසර වශයෙන් ප්‍රකාශ කළ අතර, සෑම වසරකම මැයි 15 වන දිනය, අන්තර් ජාතික පවුල් දිනය ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

- ඉස්ලාම් ස්වභාවික ආගමකි. එය මිනිස් වර්ගයේ බෝවීම ස්වාභාවික සීමාවන් නො ඉක්මවා ක්‍රියාකරන, ආයතනයක් වන පවුල් සංවිධානයට අති විශේෂ වැදගත්කමක් ලබා දී ඇත. මේ නිසා ඉස්ලාම් පවුල් බද්ධ (Family Oriented) ආගමක් ලෙස හඳුන්වනු ලබයි.

- පවුල් වශයෙන් එක්වන ලෙස ඉස්ලාම් තනි පුද්ගලයින් පොළඹවයි. මෙයට හේතුව පවුල තුළ තනි පුද්ගලයාට ආරක්ෂාවක් තිබීම ය.

- ඉස්ලාමීය සමාජ ව්‍යුහයේ පවුලක් බිහිවීම සඳහා පවුල් රැසක් උදව් වේ. තනි පවුලකට ඇතිවන බලපෑම සමාජයට ද බලපායි. එසේම තනි පවුලක ජයග්‍රහණය එම සමාජයෙහි ජයග්‍රහණය ද විය හැකි ය.

**පවුල් ජීවිතයේ වැදගත්කම**

- සැමියා, බිරිඳ, දෙමාපියන්, දරුවන්, නෑදෑයින්, ආදී විවිධ මට්ටමේ අය, ඔවුනොවුන් අතර ගනුදෙනු කරමින්, සතුටින් ජීවත් වීම පවුල් ජීවිතය වන්නේ ය.

- ගිහි (පවුල්) ජීවිතයට විරුද්ධ ජීවිතය පැවිදි ජීවිතය වේ. ඉස්ලාමයේ පැවිදි ජීවිතයට ඉඩක් නැත. එය නබි (සල්) තුමාගේ ක්‍රමයට පටහැනි ක්‍රමයකි. ස්වභාවධර්මයට ද පටහැනි වූවකි.

- මිනිසා විසින් මවන ලද අස්වාභාවික ක්‍රමයක් ලෙස ඉස්ලාම් පැවිදි ජීවිතය හඳුන්වා දෙයි.

- (මෙලොවෙන් සියලු සතුට අතහැර දමන) පැවිදි බව අප ඔවුන්ට වගකීමක් කළේ නැත. “අල්ලාහ්ගේ සතුටු හිමිකර ගැනීම සඳහා ඔවුන් නිර්මාණය කළ පැවිදි ජීවිතය අපි ඔවුන්ට කිසිවිටෙකත් අනිවාර්ය කළේ නැත.” (57:27)

- උස්මාන් බින් මල්ඌන් (රහ්) යන සහාබිවරයා නබි (සල්) තුමා වෙත පැමිණ ගිහි ජීවිතයේ නොයෙදී පැවිදි ජීවිතයක් ගත කිරීමට අවසර ඉල්ලූ අවස්ථාවේ දී, නබි (සල්) තුමා එය ප්‍රතික්ෂේප කළහ. නබි (සල්) තුමා අවසර දී තිබුණේ නම් අපි පුං හරණය කරන්නට තිබුණා යැයි සෑදු බින් අබි වක්කාස් (රළි) දන්වන නබි වාක්‍යය බුහාරි, මුස්ලිම් ආදී ග්‍රන්ථවල සටහන් වී ඇත.

අල්ලාහ් සිතට සැනසීමත්, සිරුරට සෞඛ්‍යයත්, තම නීත්‍යානුකූල හවුල්කරු සමඟ ජීවත් වීමෙහි අඩංගු කර ඇත. එහෙයින් මිනිසා තනිව ජීවත්වන විට මානසික අසහනයකට පත්වන අතර, ශාරීරිකව ද විවිධ බලපෑම්වලට ලක්වන්නේ ය.

- (ඔබ සැනසීමක් ලැබීමට ඇති) සහායිකාව ඔබගෙන් ඔබ වෙනුවෙන් ම ඔබට ඔහු මවා තිබීමත්, ඔබලා අතර සෙනෙහසක් දයාවක් ඇත්කර තිබීමත් ඔහුගේ සාක්ෂිවලින් එකකි. (30:21)

  පිරිමියා ගැහැණිය යුවල වශයෙන් මවනු ලැබ ඇත. එහෙයින් එම යුවළ පවුල් ලෙස එක් නොවන තැන ඒ දෙදෙනා පිරිපුන් නොවෙති.

- ජනයිනි, ඔබගේ මැවුම්කරු ගැන බියවන්න. ඔබ සැම කෙනෙක්ම එක් ආත්මයකින් මැව්වේ ඔහු ය. එම ආත්මයෙන් තම හවුල්කාරිය මැවීය. (4:1)

- පවුල් ජීවිතය මගින් මිනිසා තමාට පමණක් යන ආත්මාර්ථයෙන් මිදී තම සහකාරියවන බිරිඳ හා දරුවන් වෙනුවෙන් සිතා ක්‍රියා කිරීමට පෙළෙඹෙන්නේ ය. මෙයට අල්ලාහ්ගේ දායාදයන් හිමි වන්නේ ය.

  ඔබ අල්ලාහ්ගේ මාර්ගයේ වියදම් කරන එක් දිනාරයක්,වහලෙක් නිදහස් කිරීම සඳහා වියදම් කරන දිනාරයක්, දුප්පතකු වෙනුවෙන් වියදම් කරන දිනාරයක් හා ඔබගේ පවුල වෙනුවෙන් වියදම් කරන දිනාරයක්, යන ඒවායින් වැඩි ප්‍රයෝජනයක් ලබා දෙන්නේ පවුලට ලබාදෙන දිනාරය වන්නේ ය. (මුස්ලිම්)

- මෙම යහපත ලැබෙනුයේ පවුල් ජීවිතය ගෙවන්නාට ය.

  එසේම පවුලක ජයග්‍රහණය සමාජයේ ජයග්‍රහණය වන්නේ ය.

- පවුල් ජීවිතය මගින් පිරිමියා හෝ කාන්තාව වගකීම් දරන පුද්ගලයෙකු බවට පත් වන්නේ ය. ඒ නිසා ඔහුගේ ජීවිතය පිළිවෙළක් වන්නේ ය.

- විවාහ ජීවිතය මගින් සිත පාලනය කිරීම, පරම්පරාවක් බිහිවීම, පාරිශුද්ධභාවය, ආරක්ෂාව, ගෞරවය, සෞඛ්‍යය වැනි විවිධ ප්‍රයෝජන අත්වන්නේ ය යන්න හදීස් මගින් ගෙන හැර දැක්වේ.

- හලාල් වූ ක්‍රමයට තම හැඟීම් සංසිඳවා ගන්නා විට එයට ද අල්ලාහ් ගෙන් යහඵල හිමි වන්නේ ය.

- නබි සහාබිවරු අල්ලාහ්ගේ දූතයාණන්ගේ මෙසේ විමසූහ. අයෙක් තම බිරිඳ සමඟ සංවාසයේ යෙදීමටත්, පින් හිමිවේ දැයි ඇසූහ. එයට නබි තුමා තම ආශාවන් වැරදි ආකාරයට සංසිඳවා ගත් විට පව් හිමි වෙනවා නොවේ ද ? එසේ නම් නිසි ක්‍රමයට සංසිඳවා ගැනීම සඳහා යහඵල හිමි වන්නේ ය. (මුස්ලිම්)

- මිනිසෙක් ශාරීරික සැපත ලැබීමටත්, ආදරය හුවමාරු කර ගැනීමටත්, දරුවන් නිසා සතුටක් ලැබීමටත්, වයෝවෘද්ධ අවධියේ දී ආරක්ෂාව ලැබීමටත්, පවුල් ජීවිතය තුළින් සම්පූර්ණ සහතිකයක් ලැබේ.

- පවුල් ජීවිතය තුළින් පුරුෂයා හා කාන්තාව සුරක්ෂිතභාවය ලබති.

**විවාහය**

- අරාබියෙන් නිකාහ් යන්නෙන් අදහස් කෙරෙන්නේ විවාහයයි. නිකාහ් යන්නෙහි වචනාර්ථය, විවාහ ගිවිස ගැනීම, බිරිඳ සමඟ ශාරීරික ව එක්වීම යනාදියයි.

- පවුලක් ලෙස එක් ව ජීවත් වීමට ෂරීආ පනවා ඇති කොන්දේසි අනුගමනය කරමින්, පිරිමියෙකු හා කාන්තාවක් අතර ඇති කරගන්නා ගිවිසුම විවාහය නම් වේ.

- විවාහය පවුල් ජීවිතයට ප්‍රවේශය වන්නේය.

- ඉස්ලාමීය දෘෂ්ටිය අනුව විවාහය නැමදුමකි. එහි සියලු ක්‍රියාවන්ටම යහඵල අත්වන්නේ ය. අල්කුර්ආනය හා සුන්නාහ්ව මෙම යහක්‍රියාව කෙරෙහි අප පොළඹවන්නේ ය.

- ඔබ අතුරෙන් සහායකයකු නැති අයට විවාහය සිදු කරවන්න. (24 :32)

- තරුණයිනි, ඔබ අතුරෙන් ශක්තිය ඇති අය විවාහ වන්න. එය ඔබගේ බැල්ම පාලනය කිරීමටත්, පතිවත රැක ගැනීමටත් හොඳම ක්‍රමය වන්නේය. දුර්වලයින් සවිමය ඉටු කරන්න. එය ඔහුට ආරක්ෂාව සපයයි. (බුහාරි)

- ඉස්ලාමීය ෂරීආවේ, පොදු අරමුණු 3ක් වන ලරූරියියාත්, හාජියියාත්, කහ්සීනියියාත් යන ඒවායින් ෂරීආවේ පදනම වන ලරූරියියාත් හි අන්තර්ගත වන කරුණු 5 න් පරම්පරාව පවත්වා ගැනීම ද එකකි. මේ අනුව විවාහය ෂරීආවේ වැදගත් තැනක් අත්කර ගනී.

- විවාහය මගේ ක්‍රමයකි යැයි නබි (සල්) තුමා පවසා තිබීමෙන් එහි පදනම සුන්නා බව වැටහේ. එහෙත් පිරිමියාගේ හා කාන්තාවගේ ශාරීරික, මානසික, ආර්ථික, සමාජ තත්ත්වයන් අනුව වාජිබ්, මක්රූහ්, හරාම්, මුබාහ් යැයි නීතියේ අගය වෙනස් වන්නේ ය.

- විවාහ ජීවිතය ස්ථාවර ව පැවැතිය යුතු නිසා ඉස්ලාම් නිවැරදි මඟ පෙන්වීම් සහ විවාහ ගිවිසුමට අදාළ කොන්දේසි ද පහදා ඇත. මෙමගින් අන් විවාහ ක්‍රමවලින් ඉස්ලාමීය විවාහ ක්‍රමය උසස් බව වැටහේ.

- විවාහය හා සම්බන්ධ ඉස්ලාමීය විධික්‍රම අනුගමනය කළ යුතු අනුපිළිවෙළට පියවර තුනකට වර්ග කර දැක්විය හැකි ය.

  1. සූදානම් වීම.
  2. ගිවිසුම (අඃදා - විවාහය ඉටු වීමට කොන්දේසි)
  3. ප්‍රසිද්ධ කිරීම.

    1. සූදානම් වීම පළමු පියවර වේ. මෙහි,
        * සැමියා - බිරිඳව තෝරා ගැනීම
        * මනාලිය බැලීමට යෑම
        * ගැලපීම නිරීක්ෂණය කිරීම (අල්කුබ්ඨ)
        * මනාලයා මනාලියගේ කැමැත්ත ලබා ගැනීම.
        * විවාහ කතාබහ (අල් කිත්බා)

ආදී කරුණු ඇතුළත් ය.

- ප්‍රථම අදියර ක්‍රියාවල දී අනිවාර්යයෙන් අවධානය යොමුවිය යුතු කරුණ වනුයේ, තමාගේ ජීවිතයට සහායකයා වන සැමියා හෝ පුරුෂයා හෝ කාන්තාව තමා විවාහ කර ගැනීමට සුදුසු අජ්නබි ද යන්න තහවුරු කර ගැනීම ය.

- විවාහ කර ගැනීමට අනුමත අජ්නබිවරු ගැන ද, අනුමත නොකළ මහ්රම්වරු ගැන ද, අල්කුර්ආනය ඉතා පැහැදිළි ව පහදා දී ඇත. බලන්න. (2.221), (24:3), (4:21-24)

- කරුණු හතරක් පදනම් කරගෙන කාන්තාව විවාහ කරගනු ලබන්නීය. ඒවා ධනය, ලස්සන, පවුල, ආගමික හැඟීම ආදිය වේ. ආගමික හැඟීම ඇති කාන්තාවම තෝරා ගන්න. එසේ නො වූවා නම් ඔබ දුගී බවෙන් පෙළෙත්වා. (බුහාරි, මුස්ලිම්)

- මුගීරා ඉබ්නු ෂුඃභා (රලි) කාන්තාවක් විවාහ කර ගැනීමට තෝරා ගත්තා ය. එවිට, නබි (සල්) තුමා ඔබ ඇය දුටුවා දැයි ඇසූහ. නැත යැයි ඔහු පිළිතුරු දුන් විට, ඔබ ඇයව බලන්න. එවිට ඔබගේ සම්බන්ධය දැඩි කෙරේ යැයි පැවසූහ. (නසායී)

- අවිවාහක තරුණියක් නබි (සල්) තුමා වෙතට පැමිණ තම පියා ඔහුගේ සහෝදරයාගේ පුතාව තමාගේ කැමැත්තක් නොමැතිව තමාට විවාහ කර දුන් බව පැමිණිලි කළාය. නබි (සල්) තුමා ඇයට තම කැමැත්ත අනුව ක්‍රියා කිරීමට ඉඩ හැරියහ. එවිට එම තරුණිය, මම මගේ පියාගේ ක්‍රියාව අනුමත කරමි. එහෙත් පියවරුනට මේ සම්බන්ධව කිසිදු අයිතියක් නැති බව හැඟවීම මගේ අරමුණ යැයි පැහැදිළි කළාය. (ඉබ්නු මාජා)

- අවිවාහක තරුණියගෙන් එකඟතාව ලබාගත යුතු ය. ඇගේ නිශ්ශබ්දතාව ඇගේ එකඟතාවය වන්නේය.

- විවාහය සඳහා වූ කැමැත්ත ගෙන හැර දැක්වීම හෝ එය ඔබගේ සිත් තුළ ඔබ සඟවා තැබීම හෝ ඔබට වරදක් නොවේ. (2:235)

- එක් මුඃමින්වරයෙක් තවත් මුඃමින්වරයෙකුගේ සහෝදරයා ය. මුඃමින්වරයෙක් තම සොහොයුරාගේ වෙළෙඳාමට විරුද්ධව වෙළෙඳාම් නොකළ යුතුයි. තම සොහොයුරාගේ විවාහ යෝජනාවට විරුද්ධව විවාහ යෝජනා කිරීමත් නොකළ යුතුයි. (මුස්ලිම්)

2. ගිවිසුම

විවාහය ඉටු කිරීමට අවශ්‍ය කොන්දේසි :

* ඉස්ලාම් කොන්දේසි කඩනොකර ගිවිසුම් ඉටු කරන ලෙස පවසයි.

* විශ්වාසවන්තයින් ගිවිසුම් ඉටු කරන්න. (5:1)

* මුස්ලිම්වරු ඔවුන්ගේ ෂර්ත් ඉටු කිරීමේ වගකීම් දරන්නෝ ය. (අබූ දාවුද්)

* විවාහය ශුද්ධ වූ ගිවිසුමක් වන නිසා එහි ෂර්ත් හෙවත් කොන්දේසි ඉටු කළ යුතු ය. විවාහය ඉටු කිරීමට අවශ්‍ය අය හා ක්‍රියාකාරකම් :

  1. මනාලයා හා මනාලිය
  2. වලී
  3. ෂාහිද්වරු
  4. ඊජාබ්, කබූල්

* මනාලයා මනාලිය සම්බන්ධව විවාහ වීමට අවසරය ලත් අය (අජ්නබිවරු) විවාහ වීමට අවසර නැති අය (මහ්රම්වරු) පිළිබඳ කරුණු වැදගත් ය. විවාහ වීමට අවසරයක් නැති අය දැන ගැනීමෙන් අවසරය ඇති අය හඳුනා ගතහැකි ය.

* මහ්රම් ආකාරය
  1. ස්ථිර මහ්රම්වරු
  2. තාවකාලික මහ්රම්වරු

* සමහර කාන්තාවන්ට, සමහර පිරිමින්ට විවාහ කර ගැනීමේ ඉස්ලාමය ස්ථිරව ම තහනම් කර ඇත. මොවුන් වර්ග තුනකි.

  ලේ නෑකම, විවාහ නෑකම, කිරිබීමේ නෑකම යන ආකාරවලට මොවුන් බෙදනු ලබති.

* ලේ නෑකම නිසා විවාහ කර ගැනීමට තහනම් අය :
  1. උපත නිසා - මව, මවගේ මව, මේ අයුරින් ඉහළට යන නෑදෑයින්.
  2. වැදූ දරුවන් - දරුවන්ගේ දරුවන් ලෙසින් පහළට යන නෑකම්
  3. තම දෙමාපියන් හෝ ඔවුන්ගෙන් කෙනෙකුගේ දරුවන් ඔවුන්ගේ දරුවන්ගේ දරුවන් යන ලෙසත්, පහළට යන නෑදෑයින්. එනම් තම සහෝදරියන් හා ඔවුන්ගේ දරුවන් මෙහි දැක්වේ.

* සිය සීයාගේ හා ආච්චිගේ දරුවන් මෙය ප්‍රථම පියවර සමඟ නවතින්නේ ය. එනම් මවගේ හෝ පියාගේ සොහොයුරියන් විවාහ කර ගැනීම තහනම් ය. නමුත් ඔවුන්ගේ දරුවන් විවාහ කර ගත හැකි ය.

* විවාහ සම්බන්ධය නිසා විවාහ කර ගැනීමට අවසර නැති අය :
  1. බිරිඳගේ දෙමාපියන්, බිරිඳගේ මවගේ මව ආදී ලෙස ඉහළට යන නෑකම්
  2. සංවාසයේ යෙදුණු බිරිඳගේ දරුවන්, බිරිඳගේ දරුවන්ගේ දරුවන් යන අයුරින් පහළට යන නෑකම්
  3. පුතාගේ බිරිඳ, පුතාගේ පුතාගේ බිරිඳ, දුවගේ පුතාගේ බිරිඳ, මේ ආකාරයට දිගට යන බන්ධූන්
  4. පියාගේ බිරිඳ

* කිරි මවගේ සම්බන්ධය නිසා විවාහ කර ගැනීමට අවසර නොමැති අය

  ලේ නෑකම නිසා විවාහ කර ගැනීමට අවසර නොලැබූ අය, කිරිමවගේ සම්බන්ධය නිසා විවාහ කර ගත නොහැකි ය. (බුහාරි, මුස්ලිම්)
  1. කිරිමව
  2. කිරිමවගේ මව
  3. කිරිමවගේ සොහොයුරිය
  4. කිරිමවගේ සැමියාගේ සොහොයුරිය
  5. කිරිමවගේ සැමියාගේ මව
  6. කිරිමවගේ දරුවන් හා දරුවන්ගේ දරුවන්
  7. කිරිබීම නිසා නෑදෑවන සොහොයුරිය

* තාවකාලික ව විවාහ කර ගැනීමට අවසර නොලැබූ අය :

  1. එකවර සොහොයුරියන් දෙදෙනෙක් භාර්යාවන් කර ගැනීම.
  2. කාන්තාවක් සහ ඇගේ පියාගේ සොහොයුරිය, එකවර භාර්යාව කරගැනීම
  3. කාන්තාවක් හා කාන්තාවගේ මවගේ සහෝදරිය එකවර භාර්යාව කර ගැනීම
  4. අන් කෙනෙකුගේ භාර්යාව
  5. තෙවරක් තලාක් පැවසූ කාන්තාව. කලින් සැමියාට තාවකාලික ව විවාහ කර ගැනීමට අවසර නොලද අයෙකි.
  6. මුෂ්රික් වූ කාන්තාවක්
  7. ගණිකාවන්. ගණිකාවන් පව් සමාව අයැද මෙම අකුසලයෙන් මුළුමනින් ම මිදී පිරිසිදු ජීවිතයක් ගත කළානම් ඔවුන් විවාහ කර ගත හැකි ය. (තාවකාලික මහ්රම්වරුන් විවාහය හැර අනිකුත් සියලු දේවල අජ්නබිවරුන්ට අදාළ නීතිරීතිවලට යටත් වේ.)

  ඉහත අයුරින් මහ්රම්වරු නොවන අය එනම්, අජ් නබිවරුන් විවාහ කරගන්නා විට මනාළයා සහ මනාලිය සතුව පහත ලක්ෂණ තිබීම වැදගත් කොට සලකන බව හදීස්වල දැක්වේ.

  * මනාලිය - දරුඵල සහිත, මනාව උගත්, බුද්ධිමත්, ආගමට ලැදි, ගෞරවනීය පවුලකට අයත්, රූමත්, අවිවාහක ළඳක් වීම.

  * මනාලයා - ආගමට ලැදි, මනාව උගත්, ධනවත්, වැදගත් යුවලකට අයත්, මනා පෞරුෂයක් ඇති, වඳභාවයක් නැති, කරුණාවන්ත රූමත් තරුණයකු වීම.

  ඔවුන් පහත කොන්දේසිවලට යටත් වූ අය විය යුතුයි.

  * මනාලයා - මුස්ලිම් අයෙකු වීම, එකවර භාර්යාවන් හතර දෙනෙකු විවාහ කරගත් අයෙකු නොවීම, මනාලියට අජ්නබි වීම, හජ් වගකීම සඳහා ඉහ්රාම් බැඳගත් අයෙකු නොවීම.

  * මනාලිය - මුස්ලිම් හෝ පිරිසිඳු අහ්ලුල් කිතාබ් වීම, අන් කෙනෙකුගේ භාර්යාවක් නොවීම, ඉද්දා අනුගමනය කරන අයෙකු නොවීම, හජ් වගකීම සඳහා ඉහ්රාම් බැඳගත් අයෙකු නොවීම.

* වලී - මනාලියගේ භාරකරු

කාන්තාවක් විවාහ වීමට, විවාහ ගිවිසුම සිදුකිරීමට භාරකරුවෙකු සිටීම අවශ්‍ය ය. මෙම ෂර්තය නැතිවිට විවාහය වළංගු නොවේ. බොහෝ ආගමික විශාරදයින්ගේ මතය මෙය වන්නේ ය.

මේ සඳහා ඔවුන් ඉදිරිපත් කර ඇති සාධක :

- විශ්වාසවන්තයින් වනතෙක් ඔබගේ ගැහැණු දරුවන් අල්ලාහ් සම කරන්නන්ට විවාහ කර නොදෙන්න (2:221)

- භාරකරුවන් නොමැති ව විවාහය නොමැත. (අහ්මද්)

  කාන්තාවකගේ විවාහය ඉටුවන්ගේ ඇයගේ කිට්ටු නෑයෙකු වන භාරකරුවාගේ වචන මගිනි. එවැන්නෙකු නැතිවිට, දුර නෑයෙකු වන භාරකරුවෙකුගේ වචන මගින් ඉටු වේ. එවැන්නෙකුත් නැතිවිට විනිශ්චයකරුවකුගේ වචන මගින් ඉටු වේ. ඉමාම් ෂාෆි (රහ්) මතය අනුව භාරකරුවකු පහත අනුපිළිවෙළට සැකසෙති.

  1. පියා
  2. පියාගේ පියා
  3. දෙමාපියන් මගින් ලැබූ සහෝදරයින්
  4. පියා මගින් ලැබූ සහෝදරයින්
  5. දෙමාපියන් මගින් ලැබූ සහෝදරයාගේ පුතා
  6. සහෝදරියගේ පුතා
  7. පියාගේ සහෝදරයා
  8. පියාගේ සහෝදරයාගේ පුතා
  9 විනිශ්චයකාරතුමා

- භාරකරුවා නිදහස්, හොඳ සිහියක් ඇති, වැඩිවියට පත් පුරුෂයෙකු විය යුතුයි. භාරකරුවා නිරපරාධී විය යුතුය යන කොන්දේසියක් නැත.

**ෂාහිද්/සාක්ෂිකරුවන්**

- විවාහය ඉටු වූ බවට සාධකය සාක්ෂිකරුවන් වන්නාහ. සාක්ෂි නොමැති විවාහය වළංගු නොවේ. බොහෝ ඉමාම්වරුන්ගේ මතය මෙයයි. එයට සාධක පහත දැක්වේ.
  - ගණිකාවක් කිසිදු සාක්ෂියක් නොමැතිව තම විවාහ ගිවිසුම තමා ම ඉටුකර ගනිති. (තිර්මිදි)
  - භාරකරුවන් හා අවංක සාක්ෂි දෙකක් නොමැතිව විවාහය යන්න නැත. (දාරකුත්නි)
  - සාක්ෂිකරුවන් හොඳ සිහියක් ඇති, වැඩිවියට පත්, ගිවිසුමට සම්බන්ධ දෙපාර්ශවයේම කතාව වටහාගත හැකි අය ද, විය යුතුයි. සාක්ෂි අවංක, චරිතවත් අය විය යුතුයි. සාක්ෂි මුස්ලිමෙකු හා නිදහස් පුද්ගලයෙකු විය යුතුය. ඔවුන් පුරුෂයින් දෙදෙනෙක් විය යුතුය.

**ඊජාබ්, කබූල්**

- විවාහ ගිවිසුමේ මූලික අංගය, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයේම අන්‍යෝන්‍ය තෘප්තිය වන්නේ ය. තෘප්තිය යනු සිත හා බැඳුනු කාර්යය වන්නේ ය. සිතේ තත්ත්වය අල්ලාහ් හැර අන් අයෙකුට දැන ගත නොහැකිය. එහෙයින් සිතේ ඇති තෘප්තිය දැක්වීමට ඇති මාර්ගය කටවචන වන්නේ ය. විවාහ ගිවිසුමට සම්බන්ධ දෙපාර්ශ්වයම, තම තෘප්තිය වචන මගින් දක්වති.

  ගිවිසුමට සම්බන්ධ දෙපාර්ශ්වයෙන් ප්‍රථමයෙන් කතා කරන්නාගේ වචන ඊජාබ් ලෙස ද, දෙවනුව අදහස් දක්වන්නාගේ වචන කබූල් ලෙස ද සඳහන් වේ.

- ඊජාබ් හා කබූල් සඳහා වන ෂර්තයන් :
    1. ගිවිසුමේ යෙදෙන්නා, ගිවිසුම ඉටු කිරීම සඳහා මුළුමනින් ම සුදුසු අයෙකු විය යුතුය.
    2. ඊජාබ් හා කබූල් එකම ඉඳුමක දී ඉටුවිය යුතු ය.
    3. ගිවිසුමට සම්බන්ධ දෙපාර්ශ්වයම විවාහ ගිවිසුම සිදුවීමට අදාළ වචනවලට කන්දීම.
    4. ඊජාබ් වාක්‍යවලට විරුද්ධ ව කබූල් හි වචන නොතිබිය යුතු ය.

- ඊජාබ්, කබූල් සඳහා වෙනම වචන භාවිතයක් නොමැත. විවාහය යන අදහස ගෙන දෙන ඕනෑම වචනයක් කුමන භාෂාවකින් යෙදුව ද එමගින් විවාහය ඉටු වන්නේ ය. ඊජාබය සම්බන්ධයෙන් නම් විවාහය යන අදහස ඍජුව ලබා දෙන සවාජ් යන වචන මගින් විවාහය ඉටු වන්නේ ය. කබූල් සම්බන්ධයෙන්, පිළිගැනීම යන වචනය ගෙන දෙන ඕනෑම වචනයක් මගින් එය ඉටු වන්නේ ය. ඊජාබ් හා කබූල් සඳහා වන වචන එය වඩාත් හොඳ වචන යෙදුම ලෙස දෙපාර්ශ්වය විසින් ම යෙදිය යුතුය. විවාහ ගිවිසුමට අදාළ වචන යෙදුම, කිසියම් ෂර්තය ඉටු කිරීමට අදාළ කිසිදු සීමා සහිත නොවිය යුතු ය.

**මහර් නැතහොත් සදාක්**

- විවාහයක දී මනාලයා මනාලියට අනිවාර්යයෙන් ම දිය යුතු දීමනාව මහර් යන්නෙන් අදහස් වේ. මෙය මුදල්වලින් හෝ ද්‍රව්‍ය ලෙසින් හෝ දිය හැකිය. ඒ ගැන අල් කුර්ආනය මෙසේ සඳහන් කරයි. ඔබ විවාහ කරගත් කාන්තාවට ඇගේ මහරය (හෙවත් සදාක්) සතුටු සිතින් දෙන්න. එයින් කිසිවක් ඔබට ඇය සතුටින් දුන් විට එය සතුටින් භුක්ති විඳින්න. (4:4)

- මහ්රයේ ප්‍රමාණය තීරණය කිරීමට, මනාලයා තම ආර්ථික පහසුකම, මනාලියගේ ඉල්ලීම හෙවත් දෙදෙනාගේ අන්‍යෝන්‍ය ගිවිසුම ආදිය පදනම් කර ගත හැකිය. ලිංගික සම්බන්ධතාවය ඇති වීමට පෙරම මහර් ගෙවීම වැදගත් ය. මහරය නොගෙවා අතහැරීම ද දුන් මහරය ආපසු ගැනීම ද පාපී ක්‍රියාවන් ය. බිරිඳ සිය කැමැත්තෙන් එය සැමියාට වියදම් කළේ නම් එහි වරදක් නැත.

### 3. ප්‍රසිද්ධ කිරීම

* සැමියා හා භාර්යාව එක්වීම ප්‍රසිද්ධ කරන සිද්ධිය වලීමාව වන්නේය. වලීමාව යනු විවාහයෙන් පසුව මනාලයා දෙන සංග්‍රහය වන්නේය. මෙම සංග්‍රහයට නෑදෑයින්, මිත්‍රවරුන්, අසල්වැසියන්, දුප්පත් පොහොසත් යන සියල්ලන්ටම ආරාධනා කිරීම සුදුසු ය.

* "විවාහය ප්‍රසිද්ධ කර දන්වන්න" යැයි නබි (සල්) තුමා පැවසූහ.

* ඔබෙන් කෙනෙකු විවාහ සංග්‍රහය සඳහා ආරාධනා ලැබූ විට ඔහු එයට සහභාගී වෙත්වා. (බුහාරි)

* විවාහ බන්ධනයට ඇතුළත් වූ නව යුවතිපතිට සුබපතා සතුටු කිරීම සුන්නතයකි.

**දික්කසාදය**

- විවාහයට මෙන් ම දික්කසාදයට ද විධික්‍රම හා නීති ඉස්ලාමය පනවා ඇත. විවාහක යුවළ පරස්පර අවබෝධයෙන් සතුටින් ජීවත් විය යුතුයැයි ඉස්ලාමය බලාපොරොත්තු වේ. එහෙත් සමහර අවස්ථාවල විවාහ ජීවිතය සතුටින් ඉටු වීමට බාධා පැමිණෙන්නේ ය. එවන් අවස්ථාවල විවාහ බන්ධනයෙන් නිදහස් වීමට ඉස්ලාම් අවසර ලබා දෙයි. එහෙත් සමහර අවස්ථාවල පවුල් ජීවිතය ගෙවීමට බාධා ඇති වේ. නැත්නම් දෙදෙනා අතර අදහස්වල එකඟතාවයක් නොපවතින විට නැතහොත් භෞතික තත්ත්ව බාධාවක් ව පවතින විට, රෝගී තත්ත්ව හෝ වෙනත් බාධකයෝ ඇති විට විවාහ ගිවිසුමෙන් ඉවත් වීමට දී ඇති අවසරය තලාක් වන්නේ ය. එහෙත් ප්‍රශ්නවල දී ඒවා සමථයට පත් කර ගෙන ජීවත් වීම වැදගත් ය.

- සාමාන්‍යයෙන් විවාහයේ අරමුණ සැපවත් හා සතුටින් පිරි පවුල් දිවිය හා එමගින් හොඳ දරු පරම්පරාවක් බිහි කිරීමයි. මෙවැනි අරමුණු කරා ළඟාවීමට බාධාවක් ව පවතින, විවාහ බන්ධන පවත්වාගෙන යාම අර්ථ රහිත වන අතර, එමගින් ගැටුම්, සංකීර්ණතා සහ අහිතකර තත්ත්ව පමණක් බිහි වන්නේ ය. පිළිකුල හා අසහනය නිසා ඔවුන් වැරදි මාර්ග අනුගමනය කිරීමට ද පුළුවන. මෙවැනි තත්ත්වයක දී විවාහයේ අරමුණු ඉටු නොවන විටෙක විවාහ බන්ධනයෙන් ඉවත් වී වෙනත් විවාහයක් කර ගැනීමේ මගක් ලෙස තලාක් පවතී.

- ක්‍රිස්තියානි ආගම අනුව තලාක් තහනම් වූවකි. කාන්තාවක් සැමියාට ද්‍රෝහි වූ අවස්ථාවක වුවද, ඇය සමඟම ජීවත් විය යුතු බව ක්‍රිස්තු දහම පවසයි. එහෙත් මෙයට වෙනස් ව සාධාරණ හේතුවලට විවාහ බන්ධනයෙන් ඉවත් වීමට අවසර ලබා දෙයි.

- යහුදිවරුන් හේතුවක් රහිතව ද කාන්තාවක් දික්කසාද කළ හැකි ය. ලස්සන කාන්තාවක් විවාහ කර ගැනීම සඳහා තම බිරිඳ දික්කසාද කළ හැකිය. එහි කිසිදු වරදක් නොමැත. මෙසේම ජාහිලියා යුගයේ එකම කාන්තාව කිහිපවාරයක් අවශ්‍ය නම් තලාක් කර නැවත නැවත විවාහ විය හැකිය. මෙවැනි තත්ත්වය ඉස්ලාම් අනුමත කරන්නේ නැත. ඒ වෙනුවට තලාක් යන තීරණයට පැමිණීමට කලින් හා පසුව අනුගමනය කළ යුතු දැඩි නීති ඉස්ලාම් පනවා ඇත.

- ඉස්ලාම් තලාක් අනුමත කර තිබුණ ද කැමැත්තෙන් එය කළේ නැත. මක් නිසාද තලාක් යන්න මූලික වශයෙන් හරාම් ය. අවශ්‍යතාවය අනුව පමණක් එය අනුමත කෙරේ. අනවශ්‍ය ලෙස තලාක් පැවසීම හරාම් වූ සිද්ධීන් අතුරෙන් අල්ලාහ්ට ඉතාම පිළිකුල් කරුණ වන්නේ ය.

- කාන්තාවන් සැප විඳීම සඳහා ඇති ආශාවෙන් තලාක් කියන්නාට අල්ලාහ් ශාප කරයි. පිරිමින්ගෙන් දික්කසාදය ලබා ගන්නා කාන්තාව මුනාෆික් වන බව නබි (සල්) තුමා පවසා ඇත. එනිසා ඉස්ලාම් අනුව තලාක් යන්න අල්ලාහ්ට ඉතාම අකැමැති කරුණකි. අසාමාන්‍ය පරිසර තත්ත්ව යටතේ විවාහ ජීවිතය ක්‍රමවත් ව පවත්වාගෙන යෑමට බාධා ඇතිවන විට පමණක් මෙය ඉස්ලාම් අනුමත කරයි.

- දික්කසාදයක් සිදුවීම වැළැක්වීම සඳහා විවාහයට පෙර සිටම ඉස්ලාම් යම් පිළිවෙළවල් අනුගමනය කරයි. විවාහ කතාබහ, විවාහ ගැලපීම යනාදිය මෙයින් වැදගත් ඒවා ය. විවාහ ජීවිතයට ඇතුළු වූ පසු ඔබ පිළිකුල් කරන කිසියම් චර්යාවක් ඔබගේ බිරිඳ සතු වූයේ නම් ඔබ කැමති ඇගේ චර්යාවන් ගැන සිතා තෘප්තිමත් වන ලෙස නබි (සල්) තුමා පවසා ඇත.

- මෙම නබි වැකියෙන් ද (දික්කසාදයට පෙළඹීමට පෙර) පවුල් ජීවිතයේ මතභේද හටගන්නා විට, ක්‍රියා කළයුත්තේ කෙසේ ද යන්න පෙන්වා දී ඇත.

● ගැටලුවක හා පවතින තත්ත්වයන් ගැන පහදා දී කාරුණික උපදේශයන් මගින් ඇය යහමඟ යැවීම සුදුසු ය.

එම කාන්තාවන් ඔබට පටහැනිව ක්‍රියා කරන බව ප්‍රිය වූවා නම් ඔවුන්ට හිතෝපදේශ පවත්වන්න. (4:34)

● අනෙක නිදි ඇඳෙන් ඇය ඈත් කර තැබීමෙන් යහමඟට ගෙන ඒම සඳහා වෑයම් කිරීම, පළමු ක්‍රමය ඵල රහිත වන අවස්ථාවල දී මෙම දෙවන ක්‍රමය අනුගමනය කළ හැකිය. මේ ගැන අල් කුර්ආනය ඔවුන් නිදි ඇඳෙන් ඈත් කර තබන්න යැයි පවසයි. (4:34)

● ඉහත ක්‍රම දෙකම සාර්ථක නොවන විටෙක දී, ඇය යහමඟ යැවීමේ අදහසින් සෙමින් ගසන්න යැයි අල් කුර්ආනය පවසයි. (4:34) කාන්තාවන්ගේ මුහුණට පහර දීම සහ තුවාල ඇතිවන අයුරින් පහර දීම අල් කුර්ආනය අනුමත නොකරයි.

දෙපාර්ශ්වයෙන් ම වගකිව යුතු දෙදෙනෙකු ඉදිරිපත් වී "වෙන්වීමක් ඇති වේ" යැයි ඔබ බිය වුනි නම් සැමියාගේ පවුලේ කෙනෙකු ද බිරිඳගේ පවුලේ කෙනෙකු ද සමථ කරුවන් ලෙස පත් කරන්න. ඒ දෙදෙනා සාමය පැතුවා නම් අල්ලාහ් ඒ දෙදෙනා අතර සාමය ඇති කරන්නේ ය. (4:34) මේ ක්‍රියා පිළිවෙළවල් සතර ප්‍රයෝජනවත් නොවන අවස්ථාවේ දී පමණක් දික්කසාදය යන තීරණයට එළැඹිය යුතු ය.

● පිරිමින්ට දී ඇති තලාක් අයිතිය මෙන් කාන්තාවන්ට අයිතියක් දී නැත. කාන්තාවන්ගේ ස්වභාවය, ලක්ෂණ, ඔවුන් මුහුණ දෙන ජීවිත ගැටලු ආදිය සැලකිල්ලට ගෙන, කාන්තාවන්ට ප්‍රමාණවත් අයිතිවාසිකම් ලබා දී ඇත. තවද පුරුෂයා තලාක් පවසන විට එයට හේතු අධිකරණයේ දී ප්‍රකාශ කිරීම අවශ්‍ය නොවේ. මේ නිසා කාන්තාවගේ පෞද්ගලිකත්වය ආරක්ෂා වේ. එසේ පෞද්ගලිකත්වය එළි කෙරෙන්නේ නම් එය ඇය නැවත විවාහ වීමේ දී ගැටලු ඇති කරයි. එහෙත් කාන්තාවක් තම සැමියාගෙන් දික්කසාදය ඉල්ලා සිටිනා විට ඒ සඳහා හේතු දැක්වීම අනිවාර්යයෙන් ම කළ යුතුය. කාන්තාවන් මෝස්තරවලටත්, හදිසි තීරණවලටත්. හැඟීම්වලටත් ලක්වන නිසා දුරදිග නොබලා ක්ෂණික තීරණවලට එළැඹෙන හෙයින්, තලාක් (දික්කසාදය) සඳහා අයිතිවාසිකම් අඩු වශයෙන් දී ඇත.

**දික්කසාද ක්‍රම**

**තලාක්**

● තලාක් යනු විවාහ ගිවිසුම කැඩීම යන්න ය. සැමියා විසින් බිරිඳව විවාහ ජීවිතයෙන් ඉවත් කිරීම මෙයින් අදහස් කෙරේ. තලාක් කීම සඳහා හේතු හෙළි කිරීම අවශ්‍ය නොවේ. සැමියා වචන කීපයක් පවසා බිරිඳව විවාහ ගිවිසුමෙන් මුදාහැරීම මෙයින් අදහස් කෙරේ. මෙය වර්ග දෙකකි. තලාක් සුන්නි හා තලාක් බිදඉ ඒවා වන්නේය.

● තලාක් සුන්නි තලාක් කීම සඳහා ඉස්ලාම් පනවා ඇති සීමාවන් අනුගමනය කරමින්. තලාක් පවසන විට එය තලාක් සුන්නි නම් වේ. සංවාසයේ නොයෙදුනු කාන්තාවක් මාස් ශුද්ධියෙන් පිරිසිදුව සිටින කාලය තුල වරක් පමණක් තලාක් කීම තලාක් සුන්නි නම් වේ.

● තලාක් බිදඉ - ඉස්ලාමීය නීති සීමාවන් ගැන නොසළකා එයට පටහැනිව පිහිටන තලාකය මෙයින් අදහස් වේ. එනම් එක්වරම තුන්වරක් තලාක් කීම. එකම ස්ථානයේ තලාක් තුන එකක් පසුව එකක් කීම. මාස් ශුද්ධිය, කාලයේ හෝ ප්‍රසූතයෙන් පසු නිෆාස්වලින් පිරිසිදු නොවූ අවස්ථාවක තලාක් කීම, මාස් ශුද්ධිය අවසන් වූ පසු සංසර්ගයෙන් අනතුරුව තලාක් කීම ආදිය මෙම වර්ගයට අයත් ය.

- තලාකය, තලාක් බාඉන්, තලාක් රජඉ යැයි තවදුරටත් වර්ග දෙකකට බෙදයි. තලාක් කියන ලද කාන්තාව නැවත භාර්යාව කරගත නොහැකි තලාකය තලාක් බාඉන් නම්. එනම් තලාක් තුනම සම්පූර්ණ කළ අවස්ථාව මෙයින් අදහස් වේ.

  තලාක් රජඉ මගින් තලාක් පැවසූ කාන්තාව නැවත භාර්යාව කරගත හැකි තලාකය අදහස් කෙරේ.

- තලාක් සහනය භාවිතා කිරීම සඳහා තලාක් එකක් හෝ දෙකක් පමණක් පවසා ඉද්දා කාලය තුළ දෙදෙනාම නැවත එක්වීමට ඇති හැකියාව මෙමගින් දැක්වේ.

කුල්උ

- ඉවත් කිරීම, ගැලවීම, ඉදිරීම යන අදහස මෙහි අඩංගු ය. කාන්තාවන්ට සැමියා සමඟ ජීවත් විය නොහැකි තත්ත්වයක් උදා වී මුදලක් සැමියාට ගෙවීමෙන් කාන්තාව තමා නිදහස් කර ගැනීම මෙයින් අදහස් කෙරේ. සැමියාගෙන් ඇය ලැබූ සියල්ලට අමතර ව ඔහු ඉල්ලන දෙයක් ඇය ගෙවිය යුතුයි. කුල් උ සඳහා කාන්තාව පිරිසිදු/ අපිරිසිදු වීම වැදගත් නොවේ. තවද කුල්උ කළ කාන්තාව තුන්වරක් මාස් ශුද්ධිය සිදුවන තෙක් සිටිය යුතු ය.

- ෆස්කු බින්දේය යන අදහස මෙයින් ලැබේ. ගිවිසුමේ ඇති වූ අඩුපාඩු නිසා හෝ වෙනත් හදිසි කරුණක් නිසා හෝ ෆස්කු සිදුවිය හැකිය. උදා : විවාහයෙන් පසු දෙදෙනාම එකම කිරිමවගෙන් කිරි බිව් බව දැන ගැනීමය. විවාහ යුවළගෙන් කෙනෙක් ආගම වෙනස් කරගත් අවස්ථාවේ දී ෆස්කු සිදුවේ.

  එසේම රෝගී තත්ත්වය හෝ දුගී බව වැනි කරුණු ගැන කාතිවරයාට දන්වා විවාහ බන්ධනය බිඳ දැමීම වේ. ෆස්කු යනු ඉස්ලාමීය විනිශ්චයකරුවාට දන්වා විවාහ බන්ධන බිඳ දැමීම වන්නේය.

- ලිආන්

  ලිආන් යන්නෙන් ශාප කිරීම යන්න අදහස් කෙරේ. සැමියා සහ බිරිඳ අතර අයෙකු දුරාචාරය පිළිබඳ චෝදනා පැන නැඟී, ඔප්පු කරගත නොහැකි අවස්ථාවේ දී, අල්ලාහ් කෙරේ දිවුරා ශාප වේවා යැයි පවසා දෙදෙනා වෙන් ව යෑම ලිආන් නම් වේ. එනම් අයෙක් දුරාචාරය ඔප්පු කිරීමට සාක්ෂි හතරක් අවශ්‍ය ය. එහෙත් සාක්ෂි ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවේ දී, අයෙක් තම චෝදනාව ඔප්පු කිරීම සඳහා හතර වතාවක් දිවුරා පස්වන වතාවේ දී තම කීම බොරු නම් අල්ලාහ්ගේ ශාපය මට ඇති වේවා යැයි කියති. භාර්යාව නිදොස් නම් ඇය ද මෙසේ කරයි. තම චෝදනාව ඔප්පු කිරීම සඳහා හතර වතාවක් දිවුරා පස්වන වතාවේ දී තම කීම බොරු නම් අල්ලාහ්ගේ ශාපය මට ඇතිවේවා යැයි කියයි. මෙසේ කියා වෙන් වීම ලිආන් නම් වේ. ලිආන් ක්‍රමයට වෙන් වූ යුවළට නැවත එක් ව ජීවත් වීමට ඉඩ නොදෙයි.

- ලිහාර්

  මෙය ජාහිලියියා යුගයේ දික්කසාද ක්‍රමය වන්නේය. පුද්ගලයෙක් තම බිරිඳව මවට සමාන කර කතා කිරීමෙන් ලිහාර් ඇති වන්නේ ය. ලිහාර් මගින් වෙන් වූ අයෙක් නැවත එක් ව ජීවත් වීමට නම් වහලෙකු නිදහස් කළ යුතුය. නැතහොත් මිස්කින්වරු 60 දෙනෙකට ආහාර දිය යුතු ය.

- ඊලාඋ

  දිවුරා වැළකී සිටීම යන්න මෙහි අදහසයි. තම බිරිඳ සමඟ එක්වන්නේ නැත යනුවෙන් දිවුරීම ඊලාඋ යැයි සඳහන් වේ. මෙසේ දිවුරා මාස හතරක් තුළ එක් නොවූවා නම් දෙදෙනාම වෙන් වෙති. මෙසේ වෙන් වුවහොත් සාමාන්‍ය තලාක් මෙන් ඉද්දා අනුගමනය කළ යුතුයි.

- තමාගේ බිරිඳ සමඟ එක්වන්නේ නැතිය යැයි දිවුරූ පුද්ගලයාට මාස හතරක අවකාශයක් ඇත. එහෙයින් ඒ අතරතුර ඔවුන් නැවත එක් වූවා නම්,සැබැවින් ම අල්ලාහ් සමාවන්නා හා කරුණාවන්තයා ය. එහෙත් ඔවුන් එම කාල අවකාශය තුළ නැවත එක් නොවී, දික්කසාද වීම තහවුරු කර ගන්නේ නම්, සැබැවින් ම අල්ලාහ් මොවුන්ගේ සත්‍යයට කන් දෙන්නාය. එහෙත් එම කාල අවකාශයෙන් පසුව තලාක් සිදුවන්නේ ය.

## ඉද්දා

ඉද්දා යනු ගණනය කිරීම යන වචනාර්ථය දෙන්නේ ය. සැමියාගේ වියෝව හෙවත් වෙන්වීම වෙනුවෙන් බිරිඳ කිසියම් කාලයක් විවාහ නොවී වැළකී සිටීම මෙමගින් දැක්වේ. ඉද්දා ගත කිරීමේ සිරිත ජාහිලියියා යුගයේ ද පැවතිණි. ඉද්දා විවිධාකාර ය.

1. සැමියාගේ අභාවය වෙනුවෙන් අනුගමනය කරන ඉද්දා

   සැමියාගේ අභාවය වෙනුවෙන් කාන්තාවක් මාස 4 කුත් දින 10 කුත් ඉද්දා අනුගමනය කළ යුතුයි. ඔබ අතුරින් තම සැමියා වියෝ වූ කාන්තාවන් මාස 4කුත් දවස් 10 ක් බලා සිටිත්වා යැයි අල්කුර්ආනය පවසයි.

2. සැමියා වියෝ වූ කාන්තාව හෛල් ඇතිවීම නැවතුණු ඉතා වයෝවෘද්ධ කාන්තාවක් වූවා නම් ඇය මාස 3 ක් පමණක් ඉද්දා ගෙවීම සෑහෙන්නේය. ඔබේ කාන්තාවන් අතුරෙන්, කිසිවෙකු ඉතා වයස්ගත වී මාස් ශුද්ධිය වීමේ බලාපොරොත්තුව නැති වී, ඉද්දා ගණන් කිරීමට කුමක් කළ යුතුදැයි ඔබට සැකයක් මතු වූ විට, එම කාන්තාවන්ගෙන් තවත් කවරෙකුට මෙතෙක් මාස් ශුද්ධිය ඇති නුවූවා ද ඔවුන්ට ද ඉද්දා හි කාල අවකාශය මාස 3 කි. (බලන්න. 65:4)

3. සැමියා අහිමි වූ කාන්තාව ගැබිණියක් නම්, ඇය දරුවා ලබන තෙක්, ඉද්දා ගත කළ යුතුයි. ගැබිණි කාන්තාවගේ ඉද්දා කාලය ඇය දරුවා ප්‍රසූත කරන තෙක් වන්නේ ය. (බලන්න. 65:6)

4. තලාක් පවසනු ලැබූ කාන්තාවක කුර්උ 3 ක් ඉද්දා ගත කළ යුතුයි. පළමු හෝ දෙවන තලාක් කියනු ලැබූ කාන්තාව ඉද්දා කාලය තුළ බේරා ගැනීමට සැමියා කැමැත්තේ නම්,එසේ කළ හැකිය. විවාහ වී සංවාසය කිරීමට පෙර කාන්තාවක් තලාක් කියනු ලැබූවා නම්, එම කාන්තාව ඉද්දා ගෙවිය යුතු නැත. (බලන්න. 33: 48)

- දැනට මුස්ලිම් සමාජය තුළ පවතින ඉද්දාවලට අදාළ සිරිත් විරිත් නිසා ඉස්ලාමයේ සතුරන්, ඉද්දා සමාජ අසාධාරණයක් හෝ හිංසාවක් බව ප්‍රචාරය කිරීමට පොළඹවනු ලැබූවා යැයි පැවසිය හැකි ය.

**ඉද්දා අනුගමනය කරන අතරතුර අනුගමනය කළ යුතු දෑ**

- සැමියාගේ වියෝව වෙනුවෙන් ඉද්දා අනුගමනය කරන කාන්තාව, මාස 4 ක් හා දින 10 ක් සැමියාගේ වියෝව අනුස්මරණය කිරීමට ඉස්ලාම් අවසර දී ඇත. මෙය සමාජ හිංසාවක් නොවේ. සැමියා වියෝ වූ වහාම කිසිවකු ඒ දුක් වේදනාව අමතක කිරීමට කලින් නැවත විවාහ ජීවිතයට ඇතුළු වීමට කැමති වන්නේ නැත. කාන්තාව මෘදු මොලොක් සිතක් ඇති අයෙක් නිසා, සැමියා අහිමි වූ කාන්තාව ඒ හා සමඟම නැවත විවාහ දිවියට ඇතුළු වීමට අකැමැති වනු ඇත.

- සැමියා අහිමි වූ කාන්තාව ඉද්දා කාලය තුළ තම දුක පිළිබිඹුවන සේ අලංකාර මෝස්තරවලින් වැළකීමෙන් ද, තමා හැඩවැඩ කර ගැනීමෙන් වැළකී සිටීම යන තත්ත්වයක් රැකගත යුතුයි. ඉද්දා කාලය තුළ විවාහ වීම හා විවාහ කතාබහේ යෙදීම ආදියෙන් වැළකී සිටිය යුතුය. ඉද්දා අනුගමනය කිරීම සමාජ හිංසාවක් ලෙස නොසැලකිය යුතුය. මක් නිසා ද යත් එය ඉතා පහසුවෙන් ඉටුකළ හැකි යහ ක්‍රියාවකි.

- මුස්ලිම් කාන්තාවක් සාමාන්‍ය කාලවල දී කෙසේ ෆර්දාව ඇඳගෙන තම අව්රතය වසාගෙන තම රූපශ්‍රීය අන් අයට නොපෙනෙන සේ සිටිය යුතු ද ඒ පිළිවෙතම ඉද්දා කාලයේ දී ද අනුගමනය කළ යුතු ය. ඉද්දා කාලයේ දී කාන්තාවන් තම ජීවනෝපාය සඳහා දහවල් කාලයේ දී ගෙයින් පිටව ගොස් රැකියාවේ යෙදී රාත්‍රියේ දී නිවසේ රැඳිය හැකිය.

  * නබි (සල්) තුමාගේ කාලයේ දී ඉද්දා අනුගමනය කරන කාන්තාවක් දර කැපීම සඳහා කැලෑවට ගියාය. අතරමඳ දී ඇය හමු වූ පුද්ගලයකු ඉද්දා කාලය ගත කරන කාන්තාවක් මෙසේ ගෙයින් පිටව යෑම සුදුසු නොවේ යැයි කීවේය. එම කාන්තාව නබි (සල්) තුමා වෙත පැමිණ ඉද්දා අනුගමනය කරන කාලය තුළ දර කැපීමට යෑම නොමනා ඇයි දැයි ඇසුවා ය. එවිට නබි (සල්) තුමාණෝ, එය ගැටලුවක් නොවේ. එය ඇයට වළංගු කටයුත්තකැයි පිළිතුරු දුන්හ. මෙම සිද්ධිය ඉද්දා අනුගමනය කරන කාලය තුළ කාන්තාවක්, අදාළ කොන්දේසි දෙක සුරකිමින් ක්‍රියා කිරීමට ඉඩ ඇත යන්න තහවුරු කරයි.

  * වරක් ඉද්දා අනුගමනය කළ කාන්තාවක්, නබි (සල්) තුමා වෙත පැමිණ තමාගේ ගෙදර සහෝදරවරු පමණක් සිටින නිසා තමා සැලසුමක් ලැබීමට කතා කර කර සිටීමට කිසිදු කාන්තාවක් තම නිවසේ නැති බවත්, තම අසල්වැසි නිවසට ගොස් එහි සිටින කාන්තාවන් සමඟ කතා කර කර සිටීමට අවසර ඉල්ලූහ. මෙම ඉල්ලීම නබි (සල්) තුමාණන් පිළිගත්හ.

  ඒ අනුව අවශ්‍ය විට දී ඉද්දා අනුගමනය කරන කාන්තාවක් ගෙයින් පිට යෑමට හැකි බව පැහැදිළි ය.

- මෙසේ ඉස්ලාමයේ ඉද්දා ක්‍රියාවලිය ඉතා පහසු සරල එකක් ව තිබිය දී අප සමාජයේ කාන්තාවන් ඉතා අසීරුවෙන් ඉද්දා අනුගමනය කරති.

  අද සමාජයේ සමහර මට්ටම්වල කාන්තාවකගේ සැමියා අභාවයට පත් වූවා නම් ඉද්දා අනුගමනය කිරීම සඳහා සුදු ඇඳුම් ඇඳීමට ඇය බල කරනු ලබයි. ඇය නිවසේ අඳුරු තැනක වාඩි කරවනු ලබයි. කිසිම පිරිමියෙකු ඇය නොදැකිය යුතු නිසා ඇය සිටින තැන ආවරණය කිරීමට දැඩි ක්‍රියාමාර්ග ගනු ලැබේ. ඇය එම කුඩා අඳුරු ස්ථානයේ ම ඉද්දා කාලය මුළුල්ලේ ම සිටිය යුතුයි. සමහර ස්ථානවල කුඩා ළමයි පවා ඇයව නොදැකිය යුතු බව දැඩි නීති පනවනු ලැබේ. ඇය පිරිමියෙකු දුටුවේ නම් එය ඇය කරන අකුසලයක් යන අදහස අප සමාජය තුළ පැතිර පවතී. සමහර ගම්වල මෙයින් ඔබ්බට ගොස් කාන්තාව ඉද්දා අනුගමනය කරන අතරතුර

පිරිමියෙකු ඇය දුටුවේ නම් ඇය නැවත මුල සිට ඉද්දා අනුගමනය කිරීම ආරම්භ කළ යුතු බව බලකරනු ලබන්නීය. ඉද්දා පිළිබඳ ව මෙවැනි දැඩි නීතිරීති සමාජයේ අනුගමනය කරන නිසා ඉද්දා පිළිබඳ විවිධ වැරදි අදහස් පැතිර ඇත. සැමියා වියෝ වූ කාන්තාව ඉද්දා අනුගමනය කිරීම මහත් බරක් කොට සලකයි. එහෙයින් සමහර ප්‍රදේශවල දින 40 ක් පමණක් ඉද්දා අනුගමනය කිරීමේ වැරදි පුරුද්දක් ද පවතී.

- රෝගී තත්ත්වය නිසා හෝ වෛද්‍යවරයා හමුවීම වැනි අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා හෝ ඉද්දා කටයුත්තේ යෙදී සිටින කාන්තාවක් ගෙයින් පිට යෑම වරදක් නොවේ.

- එහෙයින් අප ඉද්දා පිළිබඳ ඉස්ලාමීය විධිමත් පිළිවෙත නිසි පරිදි වටහාගෙන තිබීම අවශ්‍යය. අල්ලාහ් කොපමණ උසස් දැනුම හා ඥානයකින් යුක්තව ආගමික මගපෙන්වීම් ගොනු කර ඇත්දැයි යන්න අප වටහා ගන්නා අතර, එය පොදු ජනතාවට ද වටහා දිය යුතු ය.

- තලාක් පවසනු ලැබූ කාන්තාව ඉද්දා අනුගමනය කරන අවස්ථාවේ දී, ඇයව නැවතත් බිරිඳ කර ගැනීමට හැකියාවක් ඇත. මේ කාලය තුළ දෙදෙනාම නැවත එක්වීමට අවස්ථා සලසන අයුරින්ම, ඇය තම සැමියාගේ නිවසේම ඉද්දා අනුගමනය කළ යුතුය. මේ කාලය තුළ දෙදෙනා එක් කරන අයුරින් ඇයට සැමියාගේ හිත ගන්නා අයුරින් ඇඳ පැළඳගත හැකි ය. එය ඉස්ලාමය වළක්වා නැත. එහෙත් තලාක් බාඉන් අවස්ථාවේ දී කාන්තාවක් මෙසේ සැමියාගේ හිත් ගන්නා අයුරින් ඇඳ පැළඳ ගැනීම අවශ්‍ය නොවේ.

- නිකාහ් අවස්ථාවේදී බිරිඳට සැමියා දෙන තෑග්ග මහර් නම් වේ. දෙදෙනා පවුල් දිවිය ගෙවන විට, බිරිඳට සැමියා දෙන ජීවන වියදම් නෆකා නම් වේ. විවාහ ජීවිතයෙන් සැමියා බිරිඳගෙන් වෙන් වූ විට, ඇයට දෙන තෑග්ග මතාඋ වේ. බිරිඳට තලාක් කියා දික්කසාද කරන විට,මතාඋ ගෙවීම පිළිබඳ ව 2:2, 2:236 වචන මගින් පැහැදිළි කෙරේ. මෙය ඉද්දා කාලය තුළ සැමියා බිරිඳට ඉටු කළ යුතු එක් අංගයකි.

**ඉද්දා හි ප්‍රයෝජන**

1. අල්ලාහ්ගේ අණ පනත් පිළිගෙන ඉටු කිරීම මගින් අල්ලාහ්ගේ දායාදයන් ලබා ගැනීම.
2. මානසික පීඩනයන්ගෙන් මිදීමට ඇති මාර්ගය
3. පළමු සැමියා මගින් ගැබ් ගෙන ඇත්දැයි නිරීක්ෂණය සඳහා වන කාලය
4. සැමියා වියෝ වූ කාන්තාව ඔහුගේ වියෝව අනුස්මරණය කිරීම සඳහා ඉස්ලාමීය කාල සීමාව
5. ප්‍රථම සැමියාගේ ක්‍රියාමාර්ග නැවත මතක් කිරීමටත් ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීමටත් ඇති අවස්ථාව
6. නැවත විවාහ වීම සම්බන්ධව තීරණයකට එළැඹීමට ඇති කාල අවකාශය
7. තලාක් රජ්ඊ වූවා නම් නැවත එක් ව ජීවත් වීමට අවස්ථාවකි.

**දරුවන් දෙමාපියන්ටත්, දෙමාපියන් දරුවන්ටත් ඉටුකළ යුතු යුතුකම් හා වගකීම්**

**දරුවන් දෙමාපියන්ට**

- මිනිසුන්ගේ දෑස්වලට දරුවන් සිසිලක් වන්නේය. ඔවුන් නිසා මිනිස් ජීවිතයට සතුටක් ලැබෙන්නේය. ඔවුන් මත පහළවන අල්ලාහ්ගේ දායාදය දෙමාපියන්ට ද ලැබෙන්නේ ය. දරුවන් නිසා අල්ලාහ් දෙමාපියන්ට ආහාරයෙහි බරකත් ලබා දෙන්නේ ය.

- දරුවන් සම්බන්ධයෙන් දෙමාපියන්ට ඇති වගකීම ඉස්ලාම් පැහැදිළි ව වටහා දී ඇත.

1. ඉස්ලාම් යහ චිත්ත පාරිශුද්ධත්වය : තමාට දායාදයක් ලෙස ලැබෙන්නා වූ සාලිහ් වූ දරුවෙකු ලෙස හදාවඩා ගනිමි යන අදහස
2. තම දරුවාට සදාචාරාත්මක මවක් තෝරාගැනීම.
3. සදාචාරාත්මක දරුවෙකු පතා අල්ලාහ්ගෙන් දුආ ප්‍රාර්ථනා කිරීම.
4. මව්කුස තුළ සිටිය ද දරුවා සුරැකීම.
5. දකුණු කනෙහි අදාන් ද වම් කනෙහි ඉකාමත් ද පවසා පිඹීම හා පැනිරස කැවීම.

   "කවරෙකුට දරුවෙකු ලැබුණද ඔහු එහි දකුණු කනෙහි අදාන් ද, වම් කනෙහි ඉකාමත් ද කියා පිඹින්නේ නම්, එම දරුවාට කිසිදු අනතුරක් නොවන්නේ ය." (මන්හන් අබියඃලා අල් මව්සිලි)

6. අකීකා දීම : "පිරිමි දරුවාට එළුවන් දෙදෙනෙකු ද, ගැහැණු දරුවා වෙනුවෙන් එක් එළුවෙකුද අකීකා දීම" (තිර්මිදි)
7. ලස්සන නම් තැබීම : අබූ මූසා අල් අෂ්අරි (රලි) පවසයි. "මට පිරිමි දරුවකු ලැබී මම ඒ දරුවා නබි (සල්) තුමා වෙත රැගෙන ගියෙමි. එතුමා දරුවාට ඉබ්රාහිම් යැයි නම් තැබුවේ ය. රටඉඳි ගෙජිය සපා එය දරුවාගේ කටේ තැබුවේය. දරුවාට දායාදයක් ලබාදෙන ලෙස දුආ ප්‍රාර්ථනා කළහ. පසුව මට දරුවා දුන්හ." (බුහාරි)
8. හත්වන දින එහි හිස මුඩුකොට එහි බරට සමාන රිදීවල වටිනාකම් පිනට දීම.
9. දරුවාට චර්මඡේදනය කිරීම.
10. පළමු දෙවසර තුළ කිරි පෙවීම. "දරුවාට උපන් දා සිට දෙවසරක කාලයකට කිරි පෙවීම කරත්වා." (2:233)
11. හලාල් වූ ජීවායින් දරුවාට ආහාර සැපයීම.
12. ආගමික පදනම් ඉගැන්වීම. කුර්ආනය හා සුන්නාහ් ඉගැන්වීම.
13. සලාතය පිහිටවීමට පුහුණු කිරීම.
14. දරුවන් ක්‍රීඩා කිරීම සඳහා පහසුකම් සැලැස්වීම.
15. සාලිහ් වූ හොඳ මිතුරන් හඳුන්වා දීම.
16. "නිවසේ දී අවසර ඉල්ලීමේ පුරුද්ද දරුවන්ට ඉගැන්වීම." (24:58)
17. දරුවන් අතර අපක්ෂපාතීව ක්‍රියා කිරීම. "ඔබගේ දරුවන් අතර සාධාරණව කටයුතු කරන්න." (මුස්ලිම්)
18. දරුවන් කෙරේ ආදරය දැක්වීම.

19. යහපත් හැසිරීම හා චාරිත්‍ර වාරිත්‍ර කියාදීම. "ඔබ ඔබගේ දරුවාට යහපත් හැසිරීම් හා චාරිත්‍ර වාරිත්‍ර ඉගැන්වීම ඔබ සැමදාම දුප්පතුන්ට දන්පින් කිරීමටත් වඩා හොඳය. (තබරානි)

20. ගැහැණු දරුවන්ට හිජාබ් ඇඳීමට පුරුදු කිරීම.

21. වැඩිවියට අදාළ පිළිවෙත් ඉගැන්වීම.

22. දරුවා නිසි වයසට පත් වූ විට සාලිහ් වූ සහායකයකු සොයා දීම.

දරුවන්ගේ යුතුකම් ඉටු කිරීමේ දී දෙමාපියන් අනුගමනය කළ යුතු විනයයන්

1. ආදර්ශමත් විනයයක්
2. විවෘතව සාකච්ඡා කිරීම
3. ආදරය දැක්වීම
4. විශ්වාසවන්තව ක්‍රියා කිරීම
5. උනන්දු කිරීම හා පොළඹවීම
6. සාධාරණබව, සමානාත්මතාව
7. ලයාන්විතබව හා පාලනය

දෙමාපියන් සඳහා ඉදිරිපත් කරන ඉස්ලාමීය උපදෙස් හා ආදර්ශයන් සමහරක්

- ඊමාන්ධාරී ඔබ, ඔබව හා ඔබගේ පවුල නිරයේ ගින්නෙන් ආරක්ෂා කරගන්න. (66:6)

- ඔබ සැම දෙනාම වගකිව යුත්තන් ය. ඔබ සැමදෙනාම ඔබගේ වගකීම ගැන විමසනු ලබනු ඇත. (බුහාරි, මුස්ලිම්)

- නබි (සල්) තුමාණෝ අබ්බාස් (රළි)තුමාගේ පුතුන් තිදෙනා වන අබ්දුල්ලාහ්, උබයිදුල්ලාහ්, හා රුසයියිර් (රළි) යන තිදෙනා පෙළගස්වා කවුරුන් ප්‍රථමයෙන් මා ළඟට පැමිණෙන්නේ ද ඔහුට මේ මේ දේවල් ලැබේ යැයි කියන්නාහ. දරුවන් දුවවිත් නබි (සල්) තුමාගේ උකුළට වැටෙති. එවිට නබිතුමා ඒ දරුවන් සිප ගනිති. (මුස්නද් අහ්මද්)

- නබි (සල්) තුමා, හසන් (රළි) ගේ හෝ හුසයින් (රලි) ගේ අත අල්ලා ඔවුන්ගේ දෙපා තම දෙපා මත තබා උඩට නගින ලෙස කියන්නාහ. (තබරානි) නබි (සල්) තුමා ළමුන් දුටු විට ඔවුන්ට සෙනෙහස පෙන්වා සලාම් කියන්නාහ. (බුහාරි)

- කෙනෙකු නබි (සල්) තුමා වෙත පැමිණ ඔබ ඔබගේ දරුවන් සිපගන්නේ ද ? අප එසේ කරන්නේ නැතැයි කීවේය. එවිට නබි(සල්) තුමා අල්ලාහ් ඔබගේ හදවතෙන් සෙනෙහස ඉවත්කර තිබීමට මම වගකිව යුතුද කියා පැවසූහ. (බුහාරි)

- තමා ආහාර දිය යුත්තන් අපතේ යැවීම මිනිසෙකුට සෑහෙන අකුසලයක් වන්නේ ය. (මුස්ලිම්)

- කවරෙකුට දියණියන් තිදෙනෙක් සිටින විට ඔහු ඔවුන් වෙනුවෙන් දුක් මහන්සි වී, තමාගේ හලාල් වූ ඉපැයීමෙන් ඔවුන්ට කවා පොවා, ඇඳුම් පැළඳුම් ලබා දෙන්නේ ද, ඔහුට එම දැරියන් කියාමාවේ දී නිරයේ ගින්නෙන් ආරක්ෂා කරන තිරයක් වෙති. (මුස්නද්, අහ්මද්)

**දෙමාපියන් වෙනුවෙන් දරුවන්**

- ඉස්ලාමීය දෘෂ්ටිය අනුව අල්ලාහ්ට හා රසුල්වරයාගෙන් පසුව ඊළඟ තත්ත්වය දෙමාපියන්ට හිමිය.

- දෙමාපියන්ගේ අගයයන් පැහැදිළි කර, දෙමාපියන් සම්බන්ධයෙන් මුස්ලිමෙකු ක්‍රියා කළ යුතු ආකාරය අල්කුර්ආනය පහදයි. ඔවුන්ගෙන් අයෙකු හෝ දෙදෙනාම හෝ ජීවත්ව සිටින විට, වෘද්ධ ව දුබලතාවයට ලක් වී, සිටියේ නම්, ඉස්ලාම් ඔවුනට ඉමහත් ගෞරවයක් ලබා දෙන්නේය. (බලන්න. 17:23-24, 4:36, 28:8, 31:14)

- දෙමාපියන් මුස්ලිම් නොවූව ද, ඔවුන්ට උපකාරවන අයුරින් ද, ස්තුති පූර්වකව ද, හැසිරිය යුතු බව ඉස්ලාම් උගන්වයි.

- අස්මා (රළි) තුමිය මෙසේ පැවසුවාය. අල්ලාහ්ට සම කරමින් ජීවත් වූ මගේ මව වරක් මා බැලීමට පැමිණියා ය. මේ පිළිබඳ ව නබි (සල්) තුමා වෙත ගොස් විමසුවෙමි. මගේ මව ඉතා ආශාවෙන් මා වෙතට පැමිණ ඇත. මම ඇයට උපස්ථාන කළ හැකි දැයි ඇසුවෙමි. ඔව් ඔබ ඔබගේ මවට උපස්ථාන කරන්න යැයි පැවසුවා ය. (බුහාරි, මුස්ලිම්)

- ඉස්ලාමය අනුව දෙමාපියන් අතුරින් සැලකිලි දැක්වීමට ප්‍රමුඛතාවය හිමිවිය යුත්තේ මවට ය. අයෙක් නබි (සල්) තුමා වෙත පැමිණ අල්ලාහ්ගේ දූතයාණෙනි, මම මට හොඳින් සැලකීමට වඩාත් සුදුස්සා කවුරුන් දැයි ඇසුවේ ය. නබි (සල්) තුමා ඔබගේ මව යැයි කීහ. ඉන්පසු කවුදැයි ඇසුවේ ය. ඔබගේ මවයැයි පිළිතුරු දුන්හ. ඉන්පසු කවුදැයි ඇසුවේ ය. ඔබගේ මවයැයි පිළිතුරු දුන්හ. නැවත ද එම ප්‍රශ්නයම ඇසුවේ ය. ඔබගේ පියා යැයි නබි තුමා පිළිතුරු දුන්හ.

- වයස අවුරුදු 40 ක් වන මිනිසෙකු තම බිරිඳ දරුවන් යැයි පවුලේ බර දරන්නේ ය. එම අවස්ථාවේ දී යහපත් මුස්ලිමෙකු තම දෙමාපියන් ජීවත් ව සිටියේ නම් ඔවුන් සමඟ කෙසේ හැසිරිය යුතු ද යන්න අල්කුර්ආනය පැහැදිළි කරයි. (බලන්න. 46:15)

- දරුවන් දෙමාපියන්ට ඉටුකළ යුතු වගකීම් දෙආකාර ය.
  1. දෙමාපියන් ජීවත් ව සිටින විට කළ යුතු ඒවා
  2. දෙමාපියන් වියෝ වූ පසු කළයුතු ඒවා

- දෙමාපියන් ජීවත් ව සිටියේ නම් ඔවුන්ගේ කැඳවුමට වහාම පිළිතුරු දීම.
  * නබි(සල්) තුමා මෙසේ පැවසූහ. ජුරයිජ් ආගම දන්නා අයෙකු නම් සලාතය දිගුවේලාවක් ඉටු කරනවාට වඩා මවට පිළිතුරු දීම අවශ්‍ය බව වටහාගනු ඇත. (බුහාරි)
  * ජුරයිජ්ගේ සිද්ධිය මුළුමනින් ම පවසන්න.

- ඔවුන් සමඟ කරුණාවෙන් හා දයාවෙන් ක්‍රියා කරන්න.
  * සෑද් ඉබ්නු අබි වක්කාස් (රළි) ගේ මව සෑද් ඉස්ලාමය අත දැරීමට බල කිරීමක් ලෙස ආහාරපාන ගැනීමෙන් වැළකී සිටියා ය.
  * එවිට සෑද් තම මව වෙත ගොස් ඔබට ප්‍රාණයන් කිහිපයක් තිබී, ඒවා එකිනෙක නැතිවන තෙක් වෑයම් කළ ද මම මගේ ආගමෙන් ඉවත් වන්නේ නැතැයි තදින් ම කීවේය.

  පසුව සෑද්ගේ මෙම දැඩි පිළිතුර අල්ලාහ්ගේ අප්‍රසාදයට ලක්විය. (31:15)

- ඔවුන් තුළ කැපවීම වෙනුවෙන් කෘතඥ පූර්වක ව ක්‍රියා කරන ලෙසද, ඔබගේ දෙවියාට, මව්පියන්ට කෘතඥ වන ලෙස ද අණකර ඇත. (17: 23)
- ඔවුන්ගේ අයෙකු හෝ දෙදෙනාම හෝ වයස්ගත වූ විට, ඔබ වෙතින් ඔවුන් එළවන්නට එපා.
- ඔවුන්ගේ සිත් රිද්දවන වචන කීම හෝ කාර්යයන් හෝ නොකළ යුතුය.
- ඔවුන් සමඟ ඉතා කීකරුව සහ යටහත් පහත් ව හැසිරීම.
- ඔවුන් වෙනුවෙන් දුආ ප්‍රාර්ථනා කිරීම
- අනෙක් අය අපගේ දෙමාපියන්ට දොස් පවරණ අයුරින් ක්‍රියා නොකිරීම.
- ඔවුන්ගේ කැමැත්ත අකැමැත්ත දැන ක්‍රියා කිරීම.

දෙමාපියන් අන්තරා වූ විට, ඔවුන් වෙනුවෙන් කළ යුතු දෑ :

1. ඔවුන්ගේ ජනාසා සලාතයට සම්බන්ධ වීම.
2. ඔවුන් වෙනුවෙන් අල්ලාහ්ගේ පව් සමාව සඳහා ප්‍රාර්ථනා කිරීම.
3. ඔවුන් සම්බන්ධ වූ ගිවිසුම් ඉටු කිරීම.
4. ඔවුන්ගේ නෑයින්ට උදව් කිරීම.
5. ඔවුන්ගේ මිතුරන්ට ගරු කිරීම.

**සැමියා බිරිඳට හා බිරිඳ සැමියාට කළයුතු වගකීම් හා අයිතිවාසිකම්**

ශාරීරික වශයෙන් පිරිමියා කාන්තාවගෙන් වෙනස් වුව ද ඔවුන්ගෙන් කෙනෙක් අනෙක් කෙනා වෙතින් සැනසිල්ලක් ලබාගත හැකි අයුරින් අල්ලාහ් මවා ඇත.

- ඔබ (එක් ජීවත් වීම සඳහා ඔබගේ) භාර්යාවත්, ඔබ ඔවුන්ගෙන් සැනසිල්ල ලැබීම සඳහා ඔබගෙන් ඔවුන් මවා, ඔබ අතර ආදරය හා සෙනෙහස ඇති කර තිබීම ඔහුගේ සාක්ෂිවලින් එකකි. (30:20)
- සතුට හා මිහිරිබව මෙම අන්තර් සම්බන්ධතාවය අල්ලාහ් ඇතිකිරීමේ අරමුණ, අති මහත් වගකීමක් සතුටින් ඉටුකළ යුතු නිසා ය.
- සැමියා හා බිරිඳ අතර අන්තර් සම්බන්ධතාවය යහමින් පැවැත්වීම සඳහා දෙදෙනාගේම වගකීම් හා අයිතිවාසිකම් නිසි පරිදි සැලකීම අවශ්‍ය ය.
- කාන්තාවක් හා පුරුෂයාගෙන් විවාහය මගින් පවුල් ජීවිතය ආරම්භ කරන අවස්ථාවේදී, ක්‍රීඩාවක් ලෙස හෝ අසභ්‍ය ලෙස හෝ නොව, අල්ලාහ් මවා ඇති ස්වාභාවික නීතිය (සුන්නාව) ක්‍රියාත්මක කිරීම සඳහා එක්වන බව වටහාගත යුතුය.
- නබි (සල්) තුමා මෙසේ වදාළහ. "විවාහය මගේ ක්‍රමයයි. (සුන්නා) කවුරුන් එය පිළිකුල් කරයි ද ඔහු අපගෙන් අයෙක් නොවේ."

- අල්ලාහ් පහත කරුණු සැමියාගේ සහ බිරිඳගේ වගකීම බවට පත් කරයි.
    - යහපත් දරු පරම්පරාවක් ඇති කිරීම
    - පවුලට අවශ්‍ය මූලික අවශ්‍යතා සපුරාලීම
    - පවුලේ නෑ සම්බන්ධතා රැකීම
    - සූරතුන් නිසා හි පළමු වාක්‍යය බලන්න.

  සැමියාට හා බිරිඳට හිමි මෙම පොදු වගකීම, ඉටුකළ හැක්කේ, ඔවුන් අතර පවත්වන විධිමත් අන්තර් සම්බන්ධතාවය මගිනි. ඒ සඳහා ඔවුන් දෙදෙනාගේම වගකීම් හා අයිතිවාසිකම් අර්ථකථනය කළ යුතු ය.

- සැමියාගේ හා බිරිඳගේ වගකීම් හා අයිතිවාසිකම් අල්ලාහ් තආලා විසින් ම පහදා දී තිබීම ඉස්ලාමීය පවුල් සංවිධාන ව්‍යූහයේ වැදගත්කම වන්නේ ය.

- සැමියා හා බිරිඳ අතර පවතින ස්වාභාවික හැකියාව හා දුර්වලතාවය ගැන සලකා මෙම සීමා පනවා දී ඇත. මෙහිදී දම්පතීන් අතර අයෙකු ඉටුකළ යුතු වගකීම අනෙක් කෙනාගේ අයිතිවාසිකම වන්නේය.

- මේ දෙදෙනාගේ ම අයිතිවාසිකම් හා වගකීම්, ප්‍රධාන මාතෘකා තුනක් යටතේ ඇතුළත් කළ හැකි ය.
    1. පවුල පරිපාලනය කිරීම
    2. පවුලේ සමාජ හා ආර්ථික සංවර්ධනය ගැන සොයා බැලීම
    3. පවුලේ හැඟීම්බර ආධ්‍යාත්මික සංවර්ධනය සුරැකීම

  මෙම කරුණු 3 කෙරෙහි දෙදෙනාම සම සමව දායකත්වය දැක්විය යුතුය. ඒවා සමබරය. එහෙත් වෙනස් ය.

  1. පවුල පරිපාලනය කිරීම

     පවුල පරිපාලනයේ දී ඉස්ලාම් පුරුෂයාට නායකත්වය ලබා දී ඇත. මෙයට හේතුව අල්කුර්ආනයේ පැහැදිළි කෙරේ.

     * පිරිමින් කාන්තාවන් පරිපාලනය කරන්නන් ය. (4:34)
     * මෙයට හේතුව අල්ලාහ් ඔවුන්ගෙන් සමහරුන්ට අන් අයට වඩා උසස් තත්ත්වයක් ලබා දී තිබීමත්, පිරිමින් තම ධනයෙන් වියදම් කරන්නන් වීමත් ය.
     * ඉස්ලාමීය නායකත්වයේ ප්‍රධාන වගකීම සාකච්ඡා කිරීමයි. මෙය අල්කුර්ආනයේ ඔවුන්ගේ ක්‍රියාකාරකම්, සාකච්ඡාව පදනමින් පවත්වන්නේ ය. (3:159)

     පවුල් පරිපාලනයේ, නායකයා ලෙසින් පුරුෂයාට වැදගත් වගකීම් තුනක් පවතී.
     1. බිරියට කරුණාවෙන් හා ගෞරවයෙන් සැලකීම.
     2. බිරියගේ ජීවන අවශ්‍යතා ඉටු කිරීම.
     3. බිරිය හා පවුල රකිමින් ඔවුන්ට නිවැරදි මග පෙන්වීම

* සැමියා තම වගකීම අයථා ලෙස භාවිතා නොකළ යුතු ය.

* අල්ලාහ් අයෙකුට බලය ලබා දී, එය මිනිසුන්ගේ යහපතට එය යොදා නොගන්නා කිසිවෙකු ස්වර්ගයේ සුවඳ නොවිඳින්නේ ය. (බුහාරි)

* මෙම මගපෙන්වීම යටතේ වගකීම් හා අයිතිවාසිකම් සැමියා බිරිඳ අතර බෙදී ගොස් දෙපාර්ශ්වය එය අවබෝධයෙන් පිළිගන්නා විට පවුල් පරිපාලනය යහපත් වන බවට කිසිදු සැකයකුත් නැත.

2. පවුලේ ආර්ථික, සමාජ සංවර්ධනය ගැන සොයා බැලීම.

 * පවුලේ ආර්ථික සංවර්ධනය කරුණු දෙකක් මත රැඳී ඇත.

   1. ඉපැයීම (අය)
   2. වියදම් කිරීම (වැය)

 * මෙම කරුණු දෙක සම්බන්ධයෙන් ම සැමියා හා බිරිඳ ඉස්ලාම් පනවා ඇති විධික්‍රම සුරකිමින් සහන සලසා ඇති කරුණුවල දී සාකච්ඡා කර ක්‍රියාකළ යුතු ය.

 * ආදායම හා වියදම හලාල් විය යුතුයි යන්නත්, ආගමික වතාවන්ට ඒවා බාධාවක් නොවිය යුතුය යන්නත් ඉස්ලාමීය විධික්‍රමයයි.

 * පවුලට අවශ්‍ය වියදම ගෙවීම (නෆකා) සැමියාගේ වගකීමයි. දරුවන් නිසි පරිදි හදාවඩා ගැනීම බිරිඳගේ වගකීම වන්නේ ය.

 * බිරිඳට ඉපැයීමට අයිතියක් ඇත. එහෙත් එයට සැමියා අවසර දිය යුතුය. එය ඇයගේ වගකීම්වලට බාධාවක් ද නොවිය යුතුය. ආගමික සීමාවන් ඉක්මවා නොයා යුතුය.

 * වියදම් කිරීමේ දී, අපතේ වියදම් කිරීම හෝ ලෝභීවීම හෝ නුසුදුසු ය.

 * හින්ද් බින්ති උත්බා පැවසුවා ය. අල්ලාහ්ගේ දූතයාණෙනි (මගේ සැමියා) අබූ සුෆ්යාන් ලෝභීයෙකි. එහෙයින් ඔහුගේ ධනයෙන් ගෙන මගේ දරුවන්ට කෑම සැපයීම වැරදි දැයි ඇසුවාය. එයට අල්ලාහ්ගේ දූතයාණෝ මෙසේ පැවසූහ. ඔබගේ අවශ්‍යතාවයට සෑහෙන තරමින් සාධාරණව ගැනීමෙහි වරදක් නොවේ. (බුහාරි)

 * තවද ලෝභියෙකු ලෙස වියදම් නොකර ඔබගේ අත ඔබගේ බෙල්ලේ බැඳගන්නා තත්ත්වයක් ඇති කර නොකරන්න. එසේම ඔබ ළඟ ඇති දෑ වියදම් කිරීමේ දී දෑත් එක්වරම දික් කරගැනීමෙන් ද වළකින්න. මේ නිසා අපහාසයට පත් වී දුකට පත්වන්නේ ය. (17:29)

 * සැමියාගේ ආර්ථික, සමාජ තත්ත්වය ඉහළ නැංවීමට දායක විය යුතුයි. සැමියා නොමැති විටෙක ඔහුගේ ගෞරවය හා ධනය සුරැකිය යුතුය.

 * පවුලේ හැඟීම් බර අධ්‍යාත්ම සංවර්ධනය සුරැකිය යුතුයි.

   විශ්වාසවන්තයිනි, ඔබ ඔබව ද, ඔබගේ පවුල ද, මිනිසුන් ද, ගල් ද, දවන නිරයේ ගින්නෙන් ආරක්ෂා කරගන්න. (66:6)

 * සැමියා හා බිරිඳ තම ප්‍රබලතාවයන් හා දුබලතාවයන් හඳුනාගෙන තම ජීවිතය ක්‍රමවත් කර ගත යුතුයි.

* තම පාලනය යටතේ ඇති පවුලේ ආධ්‍යාත්මික වශයෙන් වර්ධනය කිරීමත්, බිරිඳට හා දරුවන්ට ඉස්ලාමීය දැනුම ලබා ගැනීමට මග සැලැස්වීමත් සැමියාගේ වගකීමයි.

* පවුලේ ප්‍රධානියා තම පවුලට මගපෙන්වන්නා ය. ඒ ගැන ඔහු කියාමාවේ දී වගකිව යුතුය. (බුහාරි)

* නබි තුමනි, ඔබගේ පවුලේ අය සලාතය කෙරේ යොමු කරන්න. ඔබ ද එහි යෙදෙන්න. (20:132)

* පිරිමියා හා කාන්තාව මැවූ අල්ලාහ් ඒ දෙදෙනාගේ අභ්‍යන්තර අවශ්‍යතාව ගැන දන්නේය. කාන්තාව පාලනය කිරීමේ වගකීම පුරුෂයාට ලබා දී තිබීමෙන් තම පුරුෂාර්ථය ප්‍රදර්ශනය කරන වැදගත් අවස්ථාවේදී පුරුෂයාට ප්‍රමුඛත්වය ලබා දී ඇත.

* ඔබගේ භාර්යාවන් ඔබට අයත් වගාබිම් ය. එහෙයින් ඔබගේ වගාබිම් සමඟ ඔබ කැමති පරිදි ජීවත් වන්න. ඔබ වෙනුවෙන් මූලිකත්වය ලබා දෙන්න. තවද අල්ලාහ්ට බියවන්න. සැබැවින්ම ඔබ ඔහුව හමුවන බව ස්ථිර වශයෙන් ම දැනගන්න. (නබිතුමනි) විශ්වාසවන්තයින්ට සුභපැතුම් පවසන්න. (2:223)

* සාමාන්‍යයෙන් සැමියා වැඩි කාලයක් නිවසින් පිටත ගත කරයි. භාර්යාව ගෙතුළ ගත කරන්නීය. සැමියා ගෙයින් පිටත සිටින විට බිරිඳ විශ්වාසවන්තව ගතකළ යුතුය. එහෙයින් සැමියා අකැමැති කිසිවෙකු නිවසට ඇතුළත් වීමට ඉඩ නොදිය යුතුය.

* පවුල සැමියාගේ මගපෙන්වීම යටතේ පාලනය කිරීමත් දේපළ විධිමත් ව ආරක්ෂා කර ගැනීමත් ඇගේ වගකීමයි.

* කාන්තාව තම සැමියාගේ නිවස සුරැකිය යුතුය. ඒ ගැන ඇය විමසනු ලබන්නී ය. (මුස්ලිම්)

* යහපත් පවුල් දිවියක් ගොඩනැංවීමට සැමියාට තම දේපළින් ලබා දී සතුටුවීම මනාය. ඔවුන් එයින් සුළු කොටස් හෝ දුන්නේ නම් එය ඔබ සතුටින් භුක්ති විඳින්න.

**නෑයින් හා අසල්වැසියන්**

* ඉස්ලාම් ලේ නෑකමට ගරුත්වයක්, නම්බුවක් ලබාදී ඔවුන් සමඟ සමගිව ජීවත් වීමේ අවශ්‍යතාවය අවධාරණය කර නෑදෑයින්ගෙන් වෙන් ව සිටීමට දැඩි විරෝධතාවය දක්වයි. නෑයින් අපගෙන් ඈත් ව ජීවත් වුවත් අප ඔවුන් සමඟ එකතුව හා එකමුතුව ජීවත් විය යුතු බව පනවයි.

* මුස්ලිමෙක්, තම දෙමාපියන්, බිරිඳ, දරුවන් යන අයට පමණක් සීමා නොවී, නෑයින් හා ලේ බන්ධූන් සමඟ ද සම්බන්ධතා පවත්වා ගත යුතුයි. ඔවුන් සමඟ අන්‍යෝන්‍යව ළඟින් ඇසුරු කරමින් උදව් උපකාර කරමින් ජීවත් විය යුතුයි. මෙවැන්නන් අර්හාම් නමින් හඳුන්වනු ලබති. මෙම පදය රහීම් යන මුල් පදයෙන් බිහි වූවකි. රහ්ම් යන්න ගර්භාෂය හඟවයි. ගර්භය සමගින් මවගෙන් ලැබෙන නෑකම මෙයින් දැක්වේ. රහ්ම් යන පදය කරුණාව, දයාව, ආදරය, සෙනෙහස ආදී අදහස ගෙන දෙයි. අල්ලාහ් තම සෙනෙහස එළි කිරීමට තමාම රහ්මාන්, රහීම් යැයි හඳුන්වා ගනියි. ඒ නම් සෙනෙහසින් ඇතිවන කිට්ටු ලේ බන්ධූතාවය මෙමගින් දැක්වේ.

* ලේ නෑයින් උලුල් අර්හම් යැයි හඳුන්වනු ලබති. මෙම සීමාවට විවාහ වීමට සුදුස්සන් හා නුසුදුස්සන් යන වෙනස්කමක් නොමැති ව, ලේ නෑකමින් බන්ධුන් වන සියල්ලන් ම එහි ඇතුළත් වෙතැයි කීම මෙයින් වඩාත් සුදුසු අදහස වේ.

* ඉමාම් කුර්තුබි උලුල් අර්හම් යන නෑකම සාමාන්‍ය නෑකම බවත්, සුවිශේෂ නෑකම බවත් දෙවර්ගයකට බෙදයි. සාමාන්‍ය නෑකමට ඉස්ලාම් යන සීමාවට ඇතුළත් සියල්ලන් ම ඇතුළත් ය. සුවිශේෂ නෑකමෙහි නෑයින් වන අය පමණක් ඇතුළත් ය.

* කාෆිර් වුව ද, ඔවුන් ද ලේ නෑකමට ඇතුළත් ය. එහෙයින් උලුල් අර්හම් - ලේ නෑකම යන්නට ඉස්ලාමීය දෘෂ්ටිය අනුව ඉතා පුළුල් පිරිසක් ඇතුළත් වෙති.

**ලේ නෑකම සුරැකීමේ වැදගත්කම**

* ලේ නෑකම සුරැකීමේ වැදගත්කම කුර්ආනය හා සුන්නාහ් මගින් අවධාරණය කෙරේ.

ඔබ ඔබ අතර අවශ්‍ය දෑ ඉල්ලා ලබා ගන්නේය. තවද අල්ලාහ්ට බියෙන් ලේ නෑකමින් යුත් බන්ධුතාවයට සලකන්න. (4:1)

* මෙහිදී අල්ලාහ් ලේ නෑකම සුරැකීමේ වැදගත්කම අල්ලාහ්ට ඇති බැති බිය සමඟ සම්බන්ධ කර ඇත.

* අල්කුර්ආනයේ 17:23 වන ආයතයේ දෙමව්පියන්ට කෘතඥවීම ගැන පහදා දී 17:26 හි මෙසේ සඳහන් කරයි.

බන්ධුන්ට හා මගීන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා දෙන්න. ඔබේ දේපළ ප්‍රමාණය ඉක්මවා අනිසි ලෙස අපතේ වියදම් නොකරන්න. (17:26)

* අල්ලාහ් නමදින්න. කිසිවක් ඔහුට සම නොකරන්න. දෙමාපියන්ට කෘතඥ වන්න. එසේම නෑදෑයින්ට ද, අනාථයින්ට ද, දුප්පතුන්ට ද, අසල්වැසි නෑදෑයින්ට ද, අසල්වැසියන් වන අන්‍යයන්ට ද සැමවිටම ඔබ සමඟ සිටින මිතුරන්ට ද, මගීන්ට ද, ඔබගේ පාලනයට නතුවූවන්ට ද, (සෙනෙහසින් ස්තුතිවන්ත වන්න.) කවරෙකු ගර්වයෙන් හා ආඩම්බරයෙන් හැසිරෙයි ද සැබවින්ම අල්ලාහ් ඔහුට අකැමැත්තේය. (4:36)

ෟ මෙම වාක්‍යයේ ද දෙමාපියන්ට උපකාර කිරීමෙන් අනතුරුව ලේ නෑයින්ට ප්‍රමුඛතාවය දීම ගැන පැවසේ.

තවද ඉතා කිට්ටු අයගෙන් ආරම්භ කොට ක්‍රම ක්‍රමයෙන් පිළිවෙළට යා යුතු බව අවධාරණය කෙරේ. තවද ඉස්ලාමීය සමාජ ව්‍යුහයේ දී සෑම පුද්ගලයෙකුම අනුපිළිවෙළට ඇතුළත් කරනු ලැබ ඇත. ප්‍රථමයෙන් පවුලේ අය ද, ඉන්පසු නෑයින් ද, පසුව සමාජයේ සිටින්නන් ද යැයි පෙළගස්වා ඇත.

* ලේ නෑකමේ වැදගත්කම සුන්නාව මගින් විවිධ අයුරින් අවධාරණය කරනු ලැබ ඇත. නබි (සල්) තුමා තම ප්‍රචාරක කටයුතු පටන් ගත් අවධියේ සිටම මෙය අවධාරණය කර ඇත. තම පැමිණීමේ අරමුණ ගැන පහදා දෙන විට, ජනයා තම නෑයින් සමඟ සම්බන්ධ කිරීමටත්, පිළිම වන්දනාව නැති කිරීමටත්, ඒකීයත්වය අවධාරණය කිරීමටත් අල්ලාහ් මා එවා ඇත. (මුස්ලිම්)

* හිර්කල් රජු වෙත පැමිණි දූත පිරිස ගෙන් හිර්කල් ඔබගේ නබිවරයා දේශනා කරන්නේ කුමක් ගැන දැයි ඇසූ විට, එම පිරිස අතර සිටි අබූ සුෆ්හාන් මෙසේ කීවේය. නැමදිය යුත්තේ අල්ලාහ් පමණි. අන් කිසිවක් ඔහුට සම නොකළ යුතුයි. අපගේ මුතුන් මිත්තන්ගේ මත අත්හැරිය යුතුයි. සලාතය, සත්‍යය, විනය හා නෑයින් සමග ජීවත් වීමේ උතුම් ගුණාංග වෙත ඔහු අප යොමු කරයි යැයි කීවේය.

* නෑයින්ට සැලකීම මෙම ආගමේ ලක්ෂණයකි. ඒකීයත්වය, සලාතය සමඟ නෑදෑයින්ට සැලකීම අවධාරණය කරනු ලැබ ඇත.

* අල්ලාහ් සහ ලේ නෑයින් සමඟ එකමුතුව කටයුතු කිරීම යන අංගය අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධය පහත හදීසය මගින් පෙන්වා දිය හැකිය. නෑදෑයින්ගේ බන්ධූතාවය අල්ලාහ්ගේ අර්ෂයේ එල්ලෙමින් මෙසේ පවසයි. "මා සමඟ එක්ව කටයුතු කරන්නා සමඟ අල්ලාහ් ද එක්ව කටයුතු කරයි. මාගෙන් ඉවත් ව කටයුතු කරන්නා සමඟ අල්ලාහ් ඉවත් වෙයි". (බුහාරි)

* ලේ නෑකම සුරැකීම නිසා ප්‍රයෝජන රැසක් අත්වේ.

  1. ස්වර්ගය ලැබේ.

     මිනිසෙක් නබි (සල්) තුමා වෙත පැමිණ අල්ලාහ්ගේ දූතයාණෙනි, මා ස්වර්ගයට පිවිසීමට සලස්වන ක්‍රියාවක් මට දන්වන්න යැයි පැවසීය. එවිට නබි (සල්) තුමා ඔබ අල්ලාහ් නමදින්න. ඔහුට කිසිවක් සම නොකරන්න. සලාතය ඉටුකර Zසකාතය දෙන්න. තවද ලේ නෑයින් සමඟ එකතුව සිටින්න යැයි පැවසුවේය. (බුහාරි)

  2. ජීවිතය දියුණුවේ ; දීර්ඝායුෂ ලැබේ.

     කවරෙකු තම ආයුෂ දිගු විය යුතුයි, ජීවිත පහසුකම් වැඩිවිය යුතු යැයි සලකයි ද ඔහු තම නෑයින් සමඟ එක් ව කටයුතු කරත්වා. (බුහාරි) එනම් ශරීර සුවයත්, සපිරුණු සිතත් ඇති යහපත් දිවිය යන්න දීර්ඝායුෂ යන්නෙන් අදහස් කෙරේ.

  3. ධනය වැඩි වේ.

  4. අන් අයගේ හිතවත්කම් ලැබේ.

  අල්ලාහ්ට බිය වී ලේ නෑයන් සමග එකමුතුව ජීවත්වන්නාගේ ආයුෂ දීර්ඝ කෙරේ. ධනය වැඩිදියුණු වේ. ඔහුට ඔහුගේ පවුලේ අය විසින් සෙනෙහස දක්වනු ඇත. (අදබුල් මුෆ්රද්)

* ලේ නෑකම නොසලකා හැර ජීවත්වීම නිසා විවිධ අහිතකර ඵලයන් ඇති කරන්නේ ය.

  1. නෑකම බිඳ දැමීම පාපී ක්‍රියාවකි. එය අල්ලාහ්ගේ අමනාපය, පිළිකුල ඇතිකර කියාමාවේ දී ස්වර්ග ජීවිතය ද වළක්වයි.

     * ස්වර්ගය අහිමි වේ.

     * ලේ නෑකම බිඳින්නා ස්වර්ගයට පිවිසෙන්නේ නැත. (බුහාරි)

  2. අල්ලාහ්ගේ දායාදයන් අහිමි වේ.
     පිරිසක් අතර සම්බන්ධතා කපාහැර ජීවත් වන්නෙකු සිටියේ නම්, එම පිරිසට අල්ලාහ්ගේ දායාදය ලැබෙන්නේ නැත. (බයිහකි)

3. අමල් නොපිළිගැනේ
   මිනිසුන්ගේ ක්‍රියාවන් බ්‍රහස්පතින්දා සහ සඳුදා රාත්‍රී කාලවලට අල්ලා වෙත ගෙන හැර දැක්වේ. එවිට නෑකම කපාහැරිය පුද්ගලයාගේ අමල් පිළිගනු නොලැබේ. (බුහාරි)

4. අල්ලාහ්ගේ දඬුවම හිමිවේ.
   පරලොවෙහි අල්ලාහ්ගේ දඬුවම් හිමිවන අතර, මෙලොවෙහි දී ද දඬුවම් ලැබීමට සුදුසු වරද නෑකම් බිඳදමා ජීවත් වීම සහ අක්‍රමිකතා කිරීමයි. (අබූදාවුද්)

5. අල්ලාහ්ගේ සම්බන්ධතා බිඳී යෑම
   කවුරුන් ලේ නෑයින් සමඟ එක් ව කටයුතු කරනවා ද, ඔහු සමඟ මම ද එක් ව කටයුතු කරන්නෙමි. කවුරුන් ලේ නෑකම බිඳ දමන්නේ ද මම ද එය බිඳ දමන්නෙමි. (අබූදාවුද්)

**නෑයින් සමඟ බැඳී සිටීම**

* නෑකම පවත්වන්නන් සමඟ පමණක් නොව නෑකම බිඳ දමා කටයුතු කරන්නන් සමඟ ද සම්බන්ධතා පවත්වන්නා (සැබැවින් ම) නෑකම සුරකින්නා ය. (බුහාරි)

* නෑයින් සමඟ බැඳී කටයුතු කිරීමෙන් ඔවුන්ට උපකාර කර නම්බු කිරීම වැදගත් ය. ප්‍රථමයෙන් මවට ද, ඉන්පසු පියාට ද, එයින් පසුව නෑදෑයින්ට ද පිළිවෙළින් සැළකිය යුතු ය.

* නෑදෑයින්ට උදව් කිරීමෙන් දෙගුණයක යහඵල හිමිවන්නේ ය. නෑයින් අවශ්‍යතා ඇති අය වී, ආර්ථික අමාරුකම්වලට භාජනය වූවා නම් වැඩිපුර උදව් කළ යුතුය. මේ නිසා අල්ලාහ්ගේ යහඵලය ද නෑයින්ගේ හිතවත්කම ද අත්වේ.

* නෑයින් සමඟ එක් ව කටයුතු කිරීම ගැන ඉබ්නු අබී ජම්රා මෙසේ පවසා ඇත. හැකි පමණ ඔවුන්ට යහපත සැලසීමත්, හැකි පමණ ඔවුන්ගේ දුක් දොම්නස් ඉවත් කිරීමට උදව් වීමත්, මෙයින් අදහස් කෙරේ.

* මුස්ලිම් නොවූව ද ලේ නෑකම සලකා කටයුතු කිරීමත්, ඔවුන්ට උදව් උපකාර කිරීමත් වැදගත් ය. මෙම පවුලට අයත් පුද්ගලයින් මගේ හිතවතුන් නොවේ. මගේ හිතවතුන් කවුරුන් ද යත්, අල්ලාහ් සහ යහපත් දේව විශ්වාසීන් ද වන්නාහ. එහෙත් එම පවුලේ අය සමඟ මට ලේ නෑකමක් ඇත. එය මම උදව් උපකාර කිරීමෙන් සාරවත් කරමි. යැයි නබි (සල්) තුමා පැවසූහ. (බුහාරි)

* නරක චර්යාවක් වුව ද නෑයින්ට උදව් කළ යුතුයි. උමර් (රළි) තුමා තමාට නබි (සල්) තුමා දුන් ඇඳුම තම මව් පාර්ශ්වයේ සහෝදරයෙකු වූ මුෂ්රික් කෙනෙකුට දුන්හ. අබුබක්කර් (රළි) තමන්ගේ නෑයෙකු වන මිස්තාහ් ඉබ්නු අතාදා යන දුප්පත් අයෙකුට උදව් උපකාර කළහ. එහෙත් ඔහු ආයිෂා (රළි) තුමියට අපවාද කරන්නෙකු විය. එහෙයින් අබුබක්කර් (රළි) උදව් කිරීම නතර කළවිට, එයට විරෝධය පාමින් අල්ලාහ්ගේ වහී පහළ විය. (24: 22) තම වරද වටහාගත් අබුබක්කර් (රළි) තම උදව් කිරීම නැවතත් ආරම්භ කළේය.

* සෑම අවස්ථාවකදී ම නෑකම සුරකිමින්, සමාජ ජීවිතයේ එකමුතුකම හා එක්සත්කම ඇතිවීම සඳහා මුස්ලිම් වෑයම් කළ යුතුයි.

**අසල්වැසියන්**

* පුද්ගලික, පවුල් ජීවිතයේ සුරැකිය යුතු වැදගත් අංගයක් ලෙස, අසල්වැසියන්ගේ බන්ධුතාවය වේ. ඉස්ලාම් අසල්වැසියන් සමඟ පවත්වාගත යුතු නෑ සම්බන්ධය ඉතා අධික ලෙස අවධාරණය කරයි.

* ඉස්ලාමීය සමාජ හා පවුල් ව්‍යුහය ගැන කතා කරන සූරා නිසාහි අසල්වාසියන් ගැන මෙසේ සඳහන් කෙරේ.

* අල්ලාහ්ට පමණක් නමදින්න. ඔහුට කිසිවක් සම කිරීමෙන් වළකින්න. දෙමාපියන්ට ස්තුතිවන්ත වන්න. (එසේම) නෑදෑයින්ටත්, අනාථයින්ටත්, දුප්පතුන්ටත්, අසල්වැසි නෑයින්ටත්, පිටස්තර අසල්වැසියන්ටත්, (සැමවිටම) ඔබ සමඟ සිටින මිතුරන්ටත්, ගමන් යන්නන්ටත්. ඔබ සතු වහලුන්ටත් (දයාවෙන්) කෘතඥතාවය දක්වන්න. කවරෙකු ගර්වයෙන් හා ආඩම්බරයෙන් හැසිරෙයි ද ඔහුට සැබැවින් ම අල්ලාහ්ගේ දයාව හිමි නොවේ. (4:36)

* මෙම වාක්‍යයේ දී උදව් උපකාර කරන ලෙස අණ කිරීමක ආකාරයෙන් දක්වා තිබීම එහි වැදගත්කම ගෙන හැර දක්වයි.

**අසල්වැසියා යන්නෙහි තේරුම**

* අලි (රළි) තුමාගේ අදහස අනුව අසල්වැසියා යනු අපගේ කටහඬ ඇසෙන දුරකින් සිටින්නන් ය. ආයිෂා (රළි) තුමියගේ අදහස අනුව සෑම දිශාවක ම ඇති ගෙවල් 40 අසල්වැසියන් ය.

* සාමාන්‍යයෙන් අසල්වැසියා යැයි පවසන විට, මුස්ලිම්, කාෆිර්, සත් පුරුෂයා, අසත්පුරුෂයා, මිතුරා, සතුරා, ගමේ අය, පිටස්තරයින්, යහපත සලස්වන්නා, අයහපත සලස්වන්නා, නෑදෑයා, නෑදෑයන් නොවන්නා, වැනි සියල්ලන් ම එහි ඇතුළත් ය.

* සයියද් සුලයිමාන් නද්වි තුමා අසල්වැසියා ගැන පහදා දෙන විට, මුහම්මද් නබි (සල්) තුමාගේ ආගම අප නිවසට අසල සිටින්නාට පමණක් අසල්වැසියා යැයි නොකියයි. ඒ වෙනුවට අල්ජාර් යනු අසල සිටින්නා ය. එනම් ගමනක දී, තම අසලින් වාඩි වී සිටින්නා, පන්තියේ එකට ඉගෙන ගන්නා ශිෂ්‍යයා, කර්මාන්ත ශාලාවේ හෝ කඬේ දී තමා සමඟ රැකියා කරන්නා, සලාතය ඉටු කිරීමේ දී තමා අසල සිට එය ඉටු කරන්නා, ඔබ සමඟ මහපාරේ ඇවිදින්නා, කඩයක දී ඔබ බඩු මිලදී ගන්නා විට බඩු ගන්නා පුද්ගලයා යන විවිධ අය දැක්වීමට යොදා ගනී.

අසල්වැසියන් විවිධ ය.

* නබි (සල්) තුමා අසල්වැසියන් තුන් ආකාරයකැයි පැවසූහ.

පළමු ආකාරය - මුෂ්රික්, (සමකරන්නා) මොහුට අසල්වැසියා යන පදනමින් පමණක් උදව් පැතීමේ අයිතියක් ඇත.

දෙවන ආකාරය - මුස්ලිම් - මොහුට අසල්වැසියා යන අයිතිය ද, මුස්ලිම් යන අයිතිය ද ඇත. මෙසේ දෙආකාරයක අයිතියක් ඇත.

තුන්වන ආකාරය - නෑදෑ මුස්ලිම්, මොහුට අසල්වැසියා, මුස්ලිම්, නෑදෑයා යනුවෙන් අයිතිවාසිකම් තුනකි. (මුස්නද්)

**අසල්වැසියන් සමඟ හැසිරිය යුතු ආකාරය :**

* ගරුසරු ව හැසිරීම

* කවුරුන් අල්ලාහ් හා කියාමාව පිළිගනී ද ඔහු තම අසල්වාසියාට ගරු කරත්වා (බුහාරි)

* ඔවුනට තෑගි බෝග දෙන්න.
නබි (සල්) තුමා පැවසූහ. මුස්ලිම් කාන්තාවනි, අසල්වැසියාට තෑගි දීම ගැන සුළුකොට නොසලකන්න. එය එළුවෙකුගේ කුරයක් වුව ද කමක් නැතැයි කීහ. (බුහාරි)

* අසල්වැසියන් සමඟ යහමින් හැසිරීම.
නබි (සල්) තුමා මෙසේ වදාළහ. අල්ලාහ්ගේ දෘෂ්ටියේ මිතුරුකම අතින් වඩාත් හොඳවන්නා තම මිතුරන් අතරත් වඩාත් හොඳ පුද්ගලයා ය. අල්ලාහ්ගේ දෘෂ්ටියේ වඩාත් හොඳ අසල්වැසියා තම අසල්වැසියන්ගේ යහපත්ම පුද්ගලයා වන්නේ ය. (තිර්මිදි)

* උපකාර කිරීම හා සැපදුක් කම්කටොළුවලට සම්බන්ධ වීම.

* නබි (සල්) තුමා වදළහ. අසල්වැසියාට අප ඉටුකළ යුතු යුතුකම් වනුයේ,

  - ඔහු රෝගී වූ විට ඔහු වෙත ගොස් සුවදුක් විමසීම
  - ඔහු වියෝ වූ විට ඔහුගේ ජනාසාවෙහි සහභාගී වීම.
  - ඔහු ණයක් ඉල්ලූ විට හැකි පමණින් උදව් කිරීම.
  - ඔහුගෙන් වන අතපසුවීම් වසන් කිරීම.
  - ඔහුට යහපතක් සිදු වූ විට සුබ පැතීම.
  - ඔහුට දුකක් ඇති වූ විට සැනසීම.
  - ඔහුගේ නිවසට සුළං නොවදින සේ ඔබගේ නිවසේ බිත්ති උස් නොකිරීම.
  - විශේෂ කෑමක් සකස් කල විට ඔහුට ද දීමට අමතක නොකරන්න. (තබරානි)

* ප්‍රමුඛත්වය දීම

  - අයෙක් තම දේපළ නිවස විකුණන්නේ නම්, එය මිලදී ගන්නට තැත්කරන අය අතරින් ප්‍රමුඛතාවය දිය යුත්තේ අසල්වැසියාට ය යැයි ෆික්හු ක්ෂේත්‍රයේ අෂ්ෂුෆ්ආ යන කොටස පහදා දෙන්නේ ය.

* අන් අයගේ අකටයුතුකම් වලින් ආරක්ෂා කිරීම.

  - අසල්වැසියන්ට අන් අයගෙන් දුකක් කරදරයක් පැමිණි විට, හැකි පමණ සහයෝගය දක්වා ඔහු ආරක්ෂා කිරීමට ඉදිරිපත් විය යුතුයි.

* අසල්වැසියාට හිංසාවක් ඇති නොවන සේ ක්‍රියා කිරීම.

  - කවරෙකුගේ හිංසාවලින් ඔහුගේ අසල්වැසියා ආරක්ෂාව නොලබන්නේ ද, අල්ලාහ් කෙරේ දිවුරා කියමි, ඔහු මුඃමින්වරයෙක් නොවේ යැයි තෙවරක් දිවුරමින් නබි (සල්) තුමා පැවසූහ. (බුහාරි)

* තම සිතුවිලි වචන, ක්‍රියා යන සියල්ලෙහිම අසල්වැසියා ආරක්ෂාව ලැබිය යුතුය. අසල්වැසියාගේ නම්බුව, ගෞරවය, ඔබ බාරයේ ඇති දෙයක් ලෙස සලකා සුරක්ෂිත කළ යුතුය.

  ඔහුගේ අඩුපාඩුකම් නොසෙවියයුතුය. ඒවා දැනගත්ත ද එළි නොකළ යුතුය. කෙනෙකු අසල්වැසියාගේ දේපළ සොරකම් කිරීම, වෙනත් සොරකම් දහයකට වඩා නරක ක්‍රියාවකි. (තබරානි) මෙහි අදහස අසල්වැසියාට කරන හිංසාව හා සලසන අයුක්තිය වැන්නකට දඬුවම එවැනි අපරාධ දහයකට දෙන දඬුවම වන්නේ ය.

* කෙනෙකු නබි (සල්) තුමා වෙත පැමිණ, “ස්ත්‍රියක් සලාත ඉටු කරයි. සව්මය රකියි. දන් දෙයි. එහෙත් ඇයගේ දිවෙන් අසල්වැසියන්ගේ සිත් රිදෙන ආකාරයට කතා කරයි. යැයි පැවසූ විට, නබි (සල්) තුමා, ඇය නිරයට පිවිසෙයි” යනුවෙන් පැවැසීය. “තවත් කාන්තාවක් නැමදුම් හා දන්පින් අඩුවෙන් සිදුකරයි. එහෙත් අසල්වැසියන් සතුටට පත් කරයි. හිරිහැර නොකරයි. යනුවෙන් පැවැසූ විට, නබි (සල්) තුමාණන් ඇය ස්වර්ගයට පිවිසෙයි” යනුවෙන් පැවැසීය. (බයිහකී)

* ඉමාම් ගස්සාලි තුමා තම ඉහ්යා උලුමුද්දීන් යන ග්‍රන්ථයේ අසල්වැසියාට ඉටුකළ යුතු යුතුකම් ගැන පහත සඳහන් අයුරින් දක්වා ඇත.

  1. අසල්වැසියාට සලාම් කීම.
  2. ඔහුට පිළිකුලක් නොවන සේ පමණට කතා කිරීම.
  3. නිතර නිතර සුවදුක් විමසීම
  4. රෝගී වූ විට සුවදුක් විමසීම.
  5. ඔහුගේ දුකෙහි පිහිට වීම.
  6. මරණය වැනි සිද්ධියක දී එයට සහභාගී වීම.
  7. සතුටුදායක අවස්ථාවල දී සුබපතා ඔහුගේ සතුටෙහි දායක වීම.
  8. ඔහුගේ වැරදි අඩුපාඩුකම්වලට සමාවීම.
  9. ඔහුගේ නිවසට එබී බැලීමෙන් වැළකී සිටීම.
  10. අප නිවසේ අපවිත්‍ර ජලය ඔහුගේ නිවස ඉදිරියෙන් හැරවීමෙන් වැළකීම.
  11. කුණු කසල ඔහුගේ නිවස ඉදිරිපිට නොදැමීම
  12. ඔහුගේ මාර්ගයට හරස් නොකිරීම
  13. ඔහු තම නිවසට ගෙන යන දේවල් ගැන සොයා බැලීමෙන් වැලකීම.
  14. ඔහුගේ දුබලතා වසන් කිරීම.
  15. අවශ්‍ය අවස්ථාවල උදව් පදව් කිරීම.
  16. ඔහු නැතිවිට නිවස ආරක්ෂා කිරීම
  17. ඔහුට විරුද්ධව කථා නොකිරීම, කේලාම් කීමෙන් වැලකීම
  18. ඔහුගේ ගෞරවය හා නම්බුව සුරැකීම.
  19. ඔහුගේ දරුවන්ට ස්නේහය දැක්වීම.

20. ඔහු ආගමික දැනුම, ලෞකික ව්‍යවහාර නොදත් කෙනෙකු නම් ඔහුට මඟ පෙන්වීම.

* නබි (සල්) තුමා පැවසුහ. "ඔබගේ උරුමක්කාරයෙකු ලෙස ප්‍රකාශ කරනු ඇතැයි" බියවන තරමට අසල්වැසියා ගැන ජිබ්රීල් (අලෛ) තුමා මට උපදේශයන් දුන්හ.

* මුස්ලිම්වරයෙක් තම පෞද්ගලික ජීවිතයේ දී ද, පවුල් ජීවිතයේ දී ද ඉස්ලාමීය උපදේශයන් පිළිපදින්නේ නම්, ඔහුට ඉතා යහපත් ජීවිතයක් ගෙවීමටත් හැකි වන්නේ යැයි යන්න සහතික ය.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

පියවර I : පෞද්ගලික ජීවිතය හා සමාජ ජීවිතය යන දෙක සසඳමින් ආකර්ශනීය හැඳින්වීමක් ඉදිරිපත් කරන්න.

පියවර II : සිසුන් කණ්ඩායම් හතරකට බෙදා එක් එක් කණ්ඩායමට පහත මාතෘකා ලබා දී, (පොත්පත් හා අන්තර්ජාලය ඔස්සේ) තොරතුරු රැස්කිරීමට මඟ පෙන්වන්න.

කණ්ඩායම 1 - පවුල් ජීවිතයේ වැදගත්කම, විවාහය

කණ්ඩායම 2 - සැමියා, බිරිඳ, දෙමාපියන්, දරුවන්, වගකීම් හා අයිතිවාසිකම්

කණ්ඩායම 3 - අසල්වැසියන් හා නෑදෑයින්

කණ්ඩායම 4 - දික්කසාදය හා ඉද්දා

පියවර III: රැස්කළ තොරතුරු අදාළ කර ගනිමින් සාකච්ඡා කිරීමට යොමු කරන්න.

පියවර IV: සාකච්ඡා කළ කරුණු ගොනුකර සටහන් කර ගැනීමට යොමු කරන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**

1. ෆික්හුල් ඉස්ලාම් - ඥාතීන් හා අයිතිවාසිකම් (2006) ඉස්ලාමීය ආයතනය, චෙන්නයි.
2. ඉමාම් ගස්සාලි - විවාහය (1958) යුනිවර්සල් පබ්ලිකේෂන්, චෙන්නයි.
3. මන්සූර් එම්. ඒ. එම්. (1993) - විවාහය , දාරුල් අර්කම් ප්‍රකාශනය, මල්වාන.
4. ෆයිරෝස් කාන් මුහම්මද් (2007), මණක්කුම් මණ් වාල්වු, මක්කල් සේවයි පදිප්පහම්, චෙන්නයි.
5. ජමාලුද්දීන් එම්. ඒ. එම්. (2001), ඉස්ලාත්තිල් කුඩුම්බවියල්, චෙන්නායි පුර්කාන් පබ්ලිකේෂන් ට්‍රස්ට්
6. අලි අල් හාෂිම් මුහම්මද් (2007) - ආදර්ශමත් මුස්ලිම්, දාරුල් හුදා, චෙන්නයි.
7. අමීන් එම්. අයි. එම්. - ඉස්ලාමීය පවුල් දිවිය, අල් හසනාත් මුද්‍රණාලය, හෙම්මාතගම.
8. රමීස් ඒ. සී. එම්. (2010), ඉස්ලාත්තිල් කුලන්දයි වලර්පු, කොළඹ, මීල්පාර්වෙ උඵඩහ මෙයියම්

**නිපුණතාව 8.0 : පෞද්ගලික හා පවුල් ජීවිතයට සම්බන්ධ ඉස්ලාමීය නීති රීති හා ඉගැන්වීම් උගෙන සිය ජීවිතය සකස් කර ගනියි.**

**නිපුණතා මට්ටම 8.2 :** මිනිස් ජීවිතයේ මූලික අවශ්‍යතා වන ආහාර, ඇඳුම් පැළඳුම් හා නිවසට අදාළ ඉස්ලාමීය නීතිරීති විධිවිධාන හා අගයයන් පිළිපදියි.

**කාලය :** කාල පරිච්ඡේද 30

**ඉගෙනුම් ඵල :**
- හලාල් අනුගමනය කර හරාමයෙන් වැළකී හැසිරීමේ වැදගත්කම පහදා දෙයි.
- හලාල්, හරාම් සීමාවන්, විධික්‍රම ගැන දැන ලියයි.
- ආහාර, ඇඳුම්, නිවෙස් පිළිබඳ ඉස්ලාමීය දේශනයන් වටහාගෙන ජීවිතයේ අනුගමනය කරයි.

## විෂය කරුණු පැහැදිළි කිරීමට අත්වැලක්

- හලාල් හරාම් හි වැදගත්කම, සීමාවන් හා විධික්‍රම

  ෂරීආවෙන් අවසර ලත් සියල්ල හලාල් යන පදයෙහි අන්තර්ගත ය. සමහර කරුණු ෂරීආව මගින් පැහැදිළිව ම තහනම් කරනු ලැබ ඇත. මෙම තහනම ඉක්මවා කටයුතු කරන්නන් කියාමාවේ දී දඬුවමට ලක් වෙති. සමහර විට මෙලොවෙහි ද ඔවුන් දඬුවමට ලක් කරනු ඇත. මෙවැනි කරුණු හරාම් යන පදයෙහි අන්තර්ගතය.

- ඉස්ලාමයේ පැමිණීමට පෙර හලාල් හරාම් සම්බන්ධයෙන් මිනිසා තම මනෝ ආශාවට අනුව ක්‍රියා කළහ. මෙහිදී අරාබි සමාජයේ තත්ත්වය ගැන සලකා බැලීම වටී. ඔවුන් මත්පැන් පානය කිරීමත්, පොලිය ආහාරයට ගැනීමත්, කාන්තාවන් හිංසා කිරීමත් හලාල් යැයි සැලකූහ. ඔවුන්ගෙන් සමහරු තම දරුවන් දුප්පත්කම නිසා හෝ ලැජ්ජාව නිසා මරා දැමීම පවා හලාල් යැයි සැලකූහ. ඒ අතර අල්ලාහ් අනුමත කළ බොහෝ පශු සම්පත් සහ ධන ධාන්‍ය හරාම් යැයි සැලකූහ. අල්කුර්ආනය ඔවුන්ගේ මෙම අසාධාරණ ක්‍රියාවලට විරුද්ධ විය. (බලන්න :6:138-140)

- හලාල් හරාම් නිර්ණය කිරීම සිතෙහි ආශාවන්ට ඉස්ලාම් පැවරුවේ නැත. ඒවාට අයත් සීමා සහ විධික්‍රම එය ඉදිරිපත් කළේය.

- හලාල් හරාම් සම්බන්ධයෙන් ඉස්ලාම් ඉදිරිපත් කළ මූලික විධි කිහිපයක් මෙහි දැක්වේ.

  1. මූලික වශයෙන් සියල්ල හලාල් ය.

     අල්ලාහ් මවා ඇති ද්‍රව්‍ය ප්‍රයෝජන සියල්ල මූලික වශයෙන් හලාල් වූ ඒවා ය. එයින් කිසිවක් නුසුදුසු බව පවසනනේ නම් ඒ සඳහා සාධක අල්කුර්ආනයේ හා සුන්නාවෙන් ඉදිරිපත් කළ යුතුය යන අදහස මෙම නීතියෙන් ඉදිරිපත් වේ.

     මෙම නීතිය ඉදිරිපත් කරන ඉස්ලාමීය විද්වතුන්, මෙයට සාධක ලෙස විවිධ අල්කුර්ආන් වාක්‍ය ඉදිරිපත් කරති. ඔහු කවරෙකු ද යත් ලොව ඇති සියල්ල ඔබ වෙනුවෙන් මැව්වේ ඔහුය. (2:29)

අහසේ ඇති දේ හා පොළොවේ ඇති සියල්ල තම දයාවෙන් ඔබට වසන් කර දුන්නේ ඔහුය. තවද පාර්බාහිර වූ ද, සැඟවුණු ඒවා වූ ද සියල්ල ඔහට ඔහු සම්පූර්ණ කර දී ඇත. යන්න ද මොවුන් දුටුවේ නැද්ද ? (31:20)

මේ වචනය අනුව අහසේ හා පොළොවේ ඇති සියල්ල මවා ඇත්තේ මිනිසාට ය. ඔහුට අවනත කොට දී ඇත. ඔහුට ඒවා දායාදයන් කොට ඇත. යන අදහස ඉදිරිපත් කෙරේ. එසේ නම් මිනිස් යහපත සඳහා මවනු ලැබූ සියල්ල නැතහොත් එයින් බොහොමයක් තහනම් කරනු ලැබූ ඒවා හරාම් වූ ඒවා වූවා නම්, ඒවා මිනිස් සමාජයට පහළ කළ දායාද ලෙස සලකන්නේ කෙසේ ද ?

එහෙයින් මෙම වචනවලින් හලාල් හි වටය ඉතා පුළුල් බව පැහැදිළිය. මිනිසාගේ යහපත සැලකිල්ලට ගෙන එයින් සමහරක් අල්ලාහ් හරාම් ලෙස දක්වා ඇත. හලාල් සමඟ සසඳන විට හරාම් යැයි සඳහන් කරනු ලැබිය හැකි ඒවායෙහි සංඛ්‍යාව කුඩා ය.

මූලික වශයෙන් සියල්ල හලාල් ය යන මේ වාක්‍යය, වත් පිළිවෙත් හැරෙන්න අනෙක් සියල්ලෙහිම යෙදුණි. මිනිස් ක්‍රියාකාරකම්වලට හා වැඩකටයුතුවලට ගැලපෙන සේ ඇත. මෙහි අප අමතක නොකළ යුතු කරුණු දෙකක් ඇත.

1. නැමදුමට සුදුස්සා අල්ලාහ් පමණි.

2. අල්ලාහ් පෙන්වා දී ඇති ක්‍රම ඔස්සේ පමණි ඔහු නැමදිය යුත්තේ.

එහෙයින් අලුතින් නැමදුමක් හෝ, සව්මය හෝ සලවාතය හෝ බිහි කිරීමට කිසි කෙනෙකුට අවසර ලබා දී නැත.

මිනිස් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්, ඒවා බිහිකරන්නේත් මිනිසා ය. එහෙයින් මූලික වශයෙන් ඒවා අවසර ලත් ඒවා ය. මෙයින් ෂරීආව මගින් තහනම් කළ ඒවා පමණක් හරාම ලෙස සඳහන් කළ හැකිය. කෙටියෙන් පවසන්නේ නම් ද්‍රව්‍යයක් හෝ ප්‍රයෝජනයක් හෝ මිනිස් ක්‍රියාකාරකමක් හෝ හරාම් යැයි කියන විට, එයට ස්ථිර වූ සාධක ඉදිරිපත් කළ යුතු ය. මක්නිසා ද යත්, මූලික වශයෙන් සියල්ලම හලාල් වන්නේය යන අදහස මෙම හදීසය ඉදිරිපත් කරයි.

2. හලාල් කිරීම හෝ හරාම් කිරීම අල්ලාහ්ගේ ඒකායන මාධ්‍යයකි.

ලොව මිනිසා කුමන තරාතිරමට පත්වූව ද ඔහුට කිසිවක් හලාල් කිරීමේ හෝ හරාම් කිරීමේ අයිතිය පවරා දී නැත. කවුරුන් අල්ලාහ්ගේ මෙම අයිතිවාසිකමෙහි අත තබන්නේ ද ඔහු තම සීමාව ඉක්මවූවෙකු ලෙස සැලකිය යුතුයි. එසේම ඔහු පිළිවෙත අනුගමනය කරන්නා, ඔහු නැමදූ අය ලෙස සලකනු ලබයි. ඔහුට සමවූවෙකු සැලකූ අයෙකු නොවන්නේය.

එසේ නොමැති අල්ලාහ් අවසර නොදුන් ඒවා ආගම කරගත හැකි සම කිරීම් ඔවුනට තිබේ ද? (42:21)

අති බින් හාකිම් (රලි) නබි තුමා වෙත ආහ. ඉස්ලාමය පිළිගැනීමට පෙර ඔහු ක්‍රිස්තු භක්තිකයකු වූයේය. අල්ලාහ් හැර තම පාදිලිවරු හා තම සන්නාසිවරු ද මර්යම්ගේ පුත්‍රයා වන මසහ් ද තම දෙවියන් කර ගනිති. එහෙත් එකම දෙවියා හැර අන් කිසිවෙකුට නැමදිය යුතු යැයි අණකරනු ලැබ සිටිති. ඔහු හැර අන් දෙවියකු නැත. ඔහු ඔවුන් සමකරන ඒවායින් බාහිරව පාරිශුද්ධයන් ය. (9:31) යන අල්කුර්ආන් වාක්‍යය උසුරනු අසා සිටියේය. අල්ලාහ්ගේ

දූතයාණෙනි, ඔවුන් පාදිලිවරුන්ට හා සන්නාසිවරුන් නමදින්නේ නැතැයි කීය. එවිට නබි (සල්) තුමා ඇත්තය. එහෙත් ඔවුන් හලාල් වූ දෑ එම පාදිලිවරු හරාම් කළහ. හරාමය හලාල් කළහ. ඔවුන් ද එය පිළිගත්හ. මෙයයි එම ජනයා ඔවුන්ට කළ නැමදුම බව කීහ. (තිර්මිදි)

මුෂ්රිකින්වරු අල්ලාහ්ගේ අවසරයෙන් තොරව හලාල් බවට පත් කරන හරාම් බවට පත් කරන ක්‍රියාව සිදුකරන ක්‍රියාවලිය අල්කුර්ආනය විරුද්ධ විය. (බලන්න : 10:59, 16:115)

මෙවැනි අල්කුර්ආන් වචනවලින් හා පැහැදිලි හදීස්වලින් හලාල් හරාම් කිරීමේ ක්‍රියාව අල්ලාහ් සතු ඒකායන ක්‍රියාව බව ඉමාම්වරු තීරණයට එළැඹුණාහ.

ඉමාම් අබූ යුසුෆ් තුමා අල්කුර්ආනයේ කිසිදු පහදාදීමක අවශ්‍යතාවය රහිතව, පැහැදිලිව දක්නට ලැබෙන අංග හැර අනෙක් ඒවායින් මෙය හලාල්, මෙය හරාම් යැයි තීන්දු දීම පිළිකුල් කරන තත්ත්වයක් අපගේ ගුරුවරුන් වන විද්වතුන් අප දුටුවෙමු යැයි පවසන බව ඉමාම් ෂාෆිඊ තම අල් උම්මු යන ග්‍රන්ථයේ සටහන් කර ඇත.

3. හලාල් වූ යමක් හරාම් කිරීමත්, හරාම් වූ යමක් හලාල් කිරීමත් අල්ලාහ්ට සම කිරීමකි.

හලාල්, හරාම් කරන හා හරාමය, හලාල් කරන ක්‍රියාවලිය ඉස්ලාමය විසින් පිළිකුල් කෙරේ. අල්ලාහ් පවසන බව නබි (සල්) තුමා මෙසේ පවසති. මම ගැත්තන් පිරිසිදු අය ලෙස මවා ඇත්තෙමි. ඔවුන් වෙත ෂයිතාන්වරු පැමිණියහ. ෂයිතාන්වරු ඔවුන් යහමඟින් ඉවතට ගෙන ගියහ. මම ඔවුන්ට හලාල් කළ ඒවා හරාම් කළහ. මම කිසිදු සාධකයක් සපයා නැති ඒවා සලකා අල්ලාහ්ට සම කරන ලෙස ඔවුන්ට අණ කළහ. (මුස්ලිම්)

ඉහත හදීස්හි ෂිර්කය හා හලාල් හරාම් කිරීම එකට සම්බන්ධ කර විරෝධතාවය ප්‍රකාශ කර ඇත.

මුෂ්රිකින්වරු අල්ලාහ් අවසර නුදුන් ඒවා හරාම් කර ගැනීම ගැන විවිධ ස්ථානවල දැඩි ලෙස විරුද්ධ වී ඇත. (බලන්න : 5:103-104, 6:143-144)

පහත වාක්‍යවල අල්කුර්ආන් හලාල් වූ ඒවා හරාම් කිරීම ගැන විරුද්ධ වෙයි. යමක් හරාම් කරන ලද්දේ කුමන පදනමින් ද යන්න අදහසක් ලෙස ඉදිරිපත් කරයි.

(නබි තුමනි) අල්ලාහ් තම ගැත්තන් සඳහා ලබා දී ඇති ඇඳුම්, ආයිත්තම් සහ පිරිසිදු (උසස්) ආහාරය නුසුදුසු ඒවා බවට තහනම් කරන්නෝ කවුරුන් ද ? යැයි විමසා, එය මෙලොව දිවිය කෙරෙහි බැඳුණු අයට සුදුසු, එහෙත් කියාමා දිනයේ දී ඔවුන්ට පැමිණ අයත් වන්නේ යැයි පවසන්න. (7:32)

නබිතුමනි, ඔබ පවසන්න සැබැවින්ම මගේ හිමියා (නොමනා යැයි) වළක්වා ඇත්තේ රහසිගතව හෝ එළිපිට කරනු ලබන අවනම්බුව ගෙන දෙන ක්‍රියාවන් හා වෙනත් පාපී ක්‍රියාවන් ය. අසාධාරණ ලෙස (කෙනෙක් අන් කෙනෙකු මත) හිංසා කිරීමත්, කිසිදු සාධකයන් නොමැති විට අල්ලාහ්ට යමක් සම කිරීමත් ය. ඔබ නොදන්නා දේ අල්ලාහ්ට එරෙහිව (බොරුවට) කීමත් ය. (7:33)

මක්කා කාල පරිච්ඡේදයේදී ම හලාල්, හරාම් කිරීමටත්, හරාම්, හලාල් කිරීමටත් විරුද්ධව අල්කුර්ආනය අදහස් දක්වා තිබීමෙන් එම ක්‍රියාවේ බරපතලකම මනාව වටහා දෙන්නේය.

මදීනාවේ දී සමහර මුස්ලිම්වරු දැඩි ජීවන ක්‍රමයක් අනුගමනය කිරීමට ඉදිරිපත් වූ විට, හලාල් වූ දේ තමනට හරාම් කර ගැනීමට ඉදිරිපත් වූ විට, අල්කුර්ආන් එයට විරුද්ධ විය. (බලන්න. 5:87-88)

මෙම නීතිය ලබාගෙන ඇත්තේ ඉහත වාක්‍ය වලින් ය.

4. හරාම් කර ඇත්තේ අයහපත් ඒවා ය.

සියල්ල මැවූ දෙවියන්ට තමා කැමැති දෙයක් හලාල් කිරීමට හෝ හරාම් කිරීමට අයිතියක් ඇත. එහෙත් ඔහු එසේ තම අයිතිවාසිකම යොදා නැත. යමක් හලාල් කරනවිට හෝ හරාම් කරන විට සලකා බලා ඇත්තේ මිනිසාගේ යහපතය.

ඌරු මස් හරාම් කළ විට එය පිළිකුල් සහගතය යන්න හැර අන් කිසිදු හේතුවක් එදා මුස්ලිම්වරුන් දැන සිටියේ නැත. නවීන විද්‍යාව එහි ඇති අනතුරුදායී තත්ත්වය ගැන අද අපව දැනුවත් කරයි. එසේම ශාපය ගෙන දෙන අංග තුනකින් වැළකී සිටින්නැයි පවසා ඇත.

1. ජලාශවල මලපහ කිරීම.
2. මහාමාර්ගය මැද මලපහ කිරීම
3. සෙවන දෙන ගස්යට මලපහ කිරීම

යැයි නබි (සල්) තුමා පැවසූ අවස්ථාවේ දී ඒවා මනුෂ්‍ය ස්වභාවය, සාමාන්‍යයෙන් පිළිකුල් කරන කරුණු බව පමණි එදා මුස්ලිම්වරු දැන සිටියේ. එහෙත් මෙම ක්‍රියා රෝග බෝවීම කෙරෙහි ප්‍රධාන සාධක වන බව අද සොයා දැනගෙන ඇත.

කෙටියෙන් පවසන්නේ නම්, යමක් හරාම් යැයි ඉස්ලාම් පවසා තිබුණේ නම්, එයට සාධාරණ වූ හේතුවක් තිබෙන්නේමය. එහි ද කිසියම් හානියක් තිබෙන බව අමතක කළ නොහැකිය.

5. හරාම් වූ ඒවා වෙනුවට ප්‍රයෝජනයට ගත හැකි ඒවා හලාල් හි ඇතුළත් ය.

ඉස්ලාම් මිනිස් යහපත සැලකිල්ලට ගන්නා ආගම වන්නේය. එය සැමවිටම වෑයම් කරනුයේ මිනිස් ජීවිතය පහසු කිරීමට ය. මිනිස් ජීවිත අපහසුවට පත් කරන අදහසක් එහි නැත. එහෙයින් යමක් හරාම් කරනවිට එය වෙනුවට යොදාගත හැකි යමක් ඉදිරිපත් කිරීමට ඉස්ලාම් පසුබට වූයේ නැත. උදාහරණ ලෙස කරුණු කීපයක් පහත දැක්වේ.

* පොලිය හරාම් ය. වෙළෙඳාම හලාල් ය.
* සූදු ක්‍රීඩාව හරාම් ය. යහපත් ක්‍රීඩා කටයුතු හලාල් ය.
* පරදාර සේවනය, සම ලිංගික හැසිරීම හරාම්, විවාහය හලාල් ය.
* මත්පැන් හරාම්, අනෙකුත් බීම වර්ග හලාල්

6. හරාමයට හේතුවන ඒවා හරාම් ය

ඉස්ලාමය යමක් තහනම් කරන විට එයට මගපාදන සියල්ල තහනම් කරන්නේය. උදාහරණ ලෙස පරදාර සේවනය තහනම් කළ ඉස්ලාම් එයට හේතුවන සියලු මාර්ග තහනම් කළේය. ඒ අනුව අන් පිරිමින් සමඟ තනිව සිටීම, සීමා රහිත ගැහැණු හා පිරිමි ඇසුරු කිරීම, සිරුරේ කොටස් ප්‍රදර්ශනය කිරීම, ලිංගික චිත්‍රපට හා ඡායාරූප, පහත් හැඟීම් අවුස්සන කතාන්දර, ගායනා ආදිය ද තහනම් කර ඇත.

හරාමයේ යෙදෙන්නන්ට හිමිවන අකුසලය එයට සහාය දක්වන සියල්ලන්ටම අත්වේය යන අදහස් එය ඔවුන් සහායවන ආකාරය අනුව, අත්වේය යන අදහස මෙම නීතිය බලවත් කරයි. උදාහරණ ලෙස පොලිය හරාම් කළ ඉස්ලාම්, එය ගෙවන්නා, එය ලබන්නා, එය සටහන් කරන්නා යන සියල්ලන්ට ශාප කර ඇත. එනම් හරාමයට සහායවන සියලු ක්‍රියාවන් හරාම් වන්නේය. හරාමයට උදව් උපකාර කරන සියලු දෙනාම එම පාපී ක්‍රියාවේ දායකයන්මය.

7. කපටි ලෙස හරාම්හි යෙදීම ද හරාම් ය.

හරාමයට මගපාදන සෘජු ක්‍රියා සියල්ල ඉස්ලාම් තහනම් කරයි. එසේම හරාමයක් කිරීම සඳහා වක්‍රව යෙදෙන්නා වූ සියලු ක්‍රියා එය තහනම් කරයි.

ඇත්තෙන්ම මගේ සමාජයේ එක් කොටසක් මත්පැන හලාල් ලෙස සලකති. එහි නම වෙනත් නමකින් එය හඳුන්වති. (අහමද්)

මිනිසුන්ට යුගයක් උදා වෙයි. එවිට වෙළෙඳාමේ නමින් ඔවුන් පොලිය හලාල් ලෙස සලකත්. (ඉකාසතුල්ලහ් ෆාන්)

අද ලෝකහේ ඉතා පහත් නැටුම කලාවක් යන නමින් උනන්දු කෙරේ. පොලිය භාවිතය යන නමින් යොදා ගනිති. හරාම් වූ යමක නම වෙනස් කිරීමෙන් එය හලාල් වන්නේ නැත.

8. හොඳ චේතනාව හරාම සාධාරණීකරණය නොකරයි.

මුස්ලිම්වරයෙක් ඉටුකරන ඕනෑම ක්‍රියාවක් ඔහුගේ යහපත් චේතනාව නිසා නැමදුමක් වන්නේය. එයට අදාළ අරමුණ කොතරම් උසස් වුවත්, පිරිසිදු වුවත්, මෙම කරුණු හරාම් වූවක් ලෙස සැලකේ. එහි අරමුණ හොඳ නිසා එය හලාල් වන්නේ නැත.

අරමුණ යහපත් වනවාසේම එයට ළඟාවන මාර්ගය ද යහපත් විය යුතුය යන අදහස ඉස්ලාම් ඉදිරිපත් කරයි. අයෙක් පොලිය හෝ අල්ලස් ලබා ගැනීමෙන් හෝ සූදු ක්‍රීඩාවෙන් හෝ හරාම් වූ වෙළෙඳාමකින් හෝ මුදල් උපයා එය යොදා මස්ජිදයක් ඉදිකළේ නම්, ඔහුගේ එම හොඳ අරමුණ ඔහුගේ කටයුත්ත හලාල් කරන්නේ නැත. මක්නිසා ද යත් ඉස්ලාමයේ තහනම් කළ ඒවා සම්බන්ධයෙන් යහපත් චේතනාව ඒවා හලාල් බවට පත් කරන්නේ නැත. මෙම අදහස සනාථ කරන හදීස් රැසක් ඇත.

කවරෙකු හරාමය මගින් මුදල් හම්බකර පසුව දන්පින් කරන්නේ ද, එයින් ඔහුට අත්වන යහපතක් නැත. ඔහුට ලැබෙන්නේ එහි පාපයයි. (ඉබ්නු කුසයිමා)

9. හරාමයට යොමු විය හැකිය යන බියෙන් සැක කටයුතු කරුණුවලින් වැළකී සිටීම.

ඉස්ලාමයේ හලාල් මෙන් ම හරාම් ද මනාව පැහැදිළිය. එසේම හරාම් ද යන්න සැක කටයුත්තක් වන ඒවා ද ඇත. පැහැදිළිව හරාම් වූ කරුණකින් ආරක්ෂා වීම සඳහා සැක

කටයුතු කරුණුවලින් ඈත් ව සිටීම, ආරක්ෂිත වීම නම්. එයට සාධක ලෙස පහත හදීසය පිහිටයි. හලාල් ද පැහැදිළිය. හරාම් ද පැහැදිළිය. එහෙත් මේ දෙක අතර ඇති සැක කටයුතු පව්වලින් වැලකී සිටින්නා, විවෘත පාපී ක්‍රියාවලින් ද වැළකී සිටින්නේම ය. සැක කටයුතු පාපී ක්‍රියාවල යෙදෙන්නා විවෘත පව්වල යෙදීමට බෙහෙවින් ම අවස්ථාවක් ඇත. පව් යනු අල්ලාහ් විසින් තහනම් කළ කොටසක් ය. තහනම් නොකරන ලද ප්‍රදේශ අසල උලා කන ගවයා තහනම් කළ ප්‍රදේශයට ඇතුලුවීමට බෙහෙවින් ම අවකාශ ඇත. (බුහාරි)

10. හරාම් සියල්ලන්ට ම හරාම් ය.

ඉස්ලාම් යමක් හරාම් යැයි පවසන විට, සියල්ලන්ටම එය හරාම් වන්නේය. අරාබීන්ට හලාල් වූ ද, අජමියට හරාම් වූ කිසිවක් නැත. නැතහොත් සුදු ජාතිකයාට හලාල් වූද, කලු ජාතිකයාට හරාම් වූ ද කිසිවක් ඉස්ලාමයේ නැත. පාලකයා ද, පාලනය කරනු ලබන්නන් ද, උගතුන් ද, නූගතුන් ද, මහ ජනයා ද, සියල්ලන් ම ඉස්ලාමීය ෂරීආව ඉදිරියේ සමාන ය. හලාල් සියල්ලන්ට ම හලාල් වන අතර හරාම් සියල්ලන්ටම හරාම් වන්නේ ය.

උදා : කළ අය කවුරුන් වුව ද, කාගෙන් සොරකම් කරන ලද්දක් වුව ද, හොරකම හරාම් ය. සොරකම් කළ තැනැත්තා කවුරු වුව ද ඔහු දඬුවම් ලැබිය යුත්තේමය.

නබි (සල්) තුමාගේ පහත ප්‍රකාශනයෙන් මෙය තහවුරු වන්නේය. අල්ලාහ් මත දිවුරා කියමි. මුහම්මද්ගේ දුව ෆාත්තිමා සොරකම් කළ ද ඇයගේ දෑත් මම සිඳලමි. (බුහාරි)

11. බලකිරීම තහනම් කළ යමක් වලංගු කරන්නේ ය.

හරාම් සම්බන්ධයෙන් ඉතාම දැඩි ව ක්‍රියාකරන ඉස්ලාම් මිනිසාගේ යහපත නොසලකා හැරියේ නැත. මිනිසා තමාව විනාශ වේ යන බයෙන් ආරක්ෂා කර ගැනීමට බලකරනු ලබන අවස්ථාවේ දී තහනම් කළ දෙයක් කිරීමට එය අවසර දී ඇත.

අල්කුර්ආනය මළ දේවල්, ලේ, ඌරු මස්, අල්ලාහ් නොවන යමකුගේ නම කියා දව්හ් කරන ලද දේවල් හරාම් යැයි කී පසු ද කිසියම් පුද්ගලයෙකුට මෙවැනි යමක් ආහාර වශයෙන් ගැනිමේ බලපෑමට ලක් වූවා නම්, පවු කිරීමේ අදහස නොමැතිව ද, සීමාව නොඉක්මවා එය අහරට ගැනීම වරදක් නොවේ. සැබැවින්ම අල්ලාහ් සමාවන්නා ද, කරුණාවන්තයා ද වන්නේ ය. (2:173) අල්කුර්ආනයේ ස්ථාන හතරක හරාම් වූ ආහාර ගැන සඳහන් කිරීමෙන් පසුව මෙම අදහස ඉදිරිපත් කෙරේ.

මෙම වචන අනුව බලපෑමට ලක් වූ පුද්ගලයෙකුට තහනම් කළ ආහාරය අනුභව කළ හැකිය. ඒ සඳහා ඔහු පිළිපැදිය යුතු කොන්දේසි දෙකකි.

1. තහනම් කළ දෑ අනුභව කිරීම තුලින් සතුටක් බලාපොරොත්තුවන්නෙක් හෝ එය අරමුණක් කර ගන්නෙක් නොවිය යුතුය.
2. අවශ්‍ය ප්‍රමාණයට වඩා ආහාරයට නොගත යුතුයි.

හලාල්, හරාම් යන කරුණ ඉස්ලාම් කෙසේ සකස් කළේ ද, එම කරුණ කෙරෙහි කොතරම් උනන්දුවක් දක්වන්නේ ද යන්න අප මෙතෙක් සලකා බැලූ විධි ක්‍රම අනුව වටහා ගත හැකිය.

- හලාල් හරාම් කරුණ අතින් ඉස්ලාමයේ මෙම මගපෙන්වීම අප සුරකින විට, විවිධ ප්‍රයෝජන ලබාගත හැකි ය. නැතහොත් බරපතල විපාක ඇති වේ. එයින් සමහරක් පහත කොටසින් සලකා බලමු.

1. ප්‍රාර්ථනා අනුමත නොවීම.

   අල්ලාහ් පාරිශුද්ධයා ය. ඔහු පිළිගන්නේ පිරිසිදු ඒවා ය. ඔහු තම දූතවරුන්ට අණ කරන ඒවාම තම ගැත්තන්ට ද අණ කරන්නේය. තවද අල්ලාහ් පවසයි. "දූතවරුණි, පිරිසිදු ආහාර අනුභව කොට යහක්‍රියාවල යෙදෙන්න." (23:53)

   තවද අල්ලාහ් පැවසුවේය. "විශ්වාසවන්තයිනි, අප ඔබට ලබාදුන් පිරිසිදු හලාල් වූ ආහාරයම අනුභව කරන්න." (7:10) යැයි පැවසූ නබි (සල්) තුමා මිනිසෙකු ගැන සඳහන් කළහ. ඔහු දීර්ඝ ගමනක යෙදී දූවිලි ගෑවුණු ඇඳුම් සහිතව කඃබාවට පිවිස දෑත් ඔසවා මගේ රක්ෂිතයාණෙනි, මගේ රක්ෂිතයාණෙනි යැයි ප්‍රාර්ථනා කරයි. එහෙත් ඔහුගේ ආහාර පානාදිය ද, ඇඳුම් පැළඳුම් ද හරාම් වූ ඒවා ය. ඔහු පෝෂණය වනුයේ මුළුමනින් ම හරාම් වලින් ය. මෙවැනි කෙනෙකුගේ ප්‍රාර්ථනාව පිළිගනු ලබන්නේ කෙසේ ද ? (මුස්ලිම්)

2. යහ ක්‍රියා පිළිගනු නොලැබීම

   කවරෙකු හරාම් වූ අයුරින් ධනය රැස්කොට පසුව පින්දහම් කරන්නේ ද, එනිසා ඔහුට සිදුවන කිසිදු යහපතක් නැත. ඔහුට ලැබෙන්නේ එහි පවය. (ඉබිනු කුසයිමා)

3. යහපත හා අයහපත බෙදා දැකීමේ හැකියාව නොලැබීම

   විශ්වාසවන්තයිනි, ඔබ අල්ලාහ්ට සත්‍ය වන්නේ නම් ඔබට ඔහු සත්‍යය හා අසත්‍යය බෙදා දැකීමේ දැනුම ලබා දෙන්නේ ය. (8:29)

4. ස්වර්ගයට පිවිසීමේ භාග්‍යය නොලැබීම

   ගැත්තෙක් හරාම් වූ ක්‍රමයෙන් ධනය හම්බ කර එයින් පින් දහම් කළේ නම්, එය පිළිගනු නොලබන්නේ ය. තමා වෙනුවෙන් හා තම නිවැසියන් වෙනුවෙන් එයින් වියදම් කළේ නම් එයින් බරකත් ඇති නොවන්නේය. එය ඉතිරිකර ඔහු මළේ නම් ඔහුගේ නිරයේ ගමනට පක්ෂව එය පවතී. අල්ලාහ් අකුසලයක් අක්සලයක් මගින් විනාශ කරයි. එක් අපිරිසිදු දෙයක් තවත් අපිරිසිදු දෙයකින් නැති වන්නේ නැත. (මිෂ්කාත්)

   හරාම්, හලාල් කරුණු පරලොව දිනයේ ජය පරාජය තීරණය කරන බරපතල කරුණකි. මෙය වැටහී එයට අදාළ වටිනාකම හිමි කිරීම අවශ්‍ය ය.

**ආහාර හා සම්බන්ධ ඉස්ලාමීය හැසිරීම් රටා**

- මනුෂ්‍යයන්ගේ සෞඛ්‍යයට වැදගත් මූලාධාරයක් ලෙස ආහාර පවතී. මිනිසා ආහාරයට ගන්නා අහර ගැලපෙන අහරක් වූවා නම් ජීවිත කටයුතු ඉටු කිරීමට එය පහසුවක් වනු ඇත. මෙයට වෙනස් ආකාරයට මිනිසෙක් බුද්ධියට හෝ සිරුරට හෝ ජීවිතයට හෝ හානි සිදුකරන ආහාර වර්ග මිනිසා අනුභව කරන විට, ජීවිත කාර්යය ඉටු කිරීමට එය බාධාවක් වන්නේය.

  මෙම පදනමින් සලකා බලන විට, මිනිසා අනුභව කරන ආහාරය, ඔහුගේ ලෞකික කාර්යයන්ට උදව්වක් වන බව පැහැදිළිය. මිනිසා අනුභව කරන ආහාරයටත්. ඔහුගේ ලෞකික,ආධ්‍යාත්මික ජීවිතයටත්, දැනුමටත්, අතර දැඩි බන්ධුතාවයක් තිබෙන නිසා ඉස්ලාම් මේ සම්බන්ධයෙන් වැදගත්කමක් ලබා දෙන්නේය. කුර්ආන් හදීසය උපදේශයන් මෙය තහවුරු කරන්නේ ය.

"විශ්වාසවන්තයින් අප ඔබට ලබාදුන් ඒවායෙන් හා පිරිසිදු ඒවායින් අනුභව කරන්න." (2:172) සැබැවින්ම අල්ලාහ් පාරිශුද්ධයාය. ඔහු පිළිගන්නේ පාරිශුද්ධ ඒවාය. රසූල්වරුන්ට අණ කළ ඒවාය. ඔහු විශ්වාසවන්තයන්ටත්, පනවන්නේ. එනම් දූතයාණෙනි, පිරිසිදු ආහාරවලින් ම ඔබ අනුභව කරන්න. යහ ක්‍රියාවල යෙදෙන්න. (23:51)

- හලාල් වූ ආහාර සොයාබලා ලබාගැනීම සෑම මුස්ලිම්වරයෙකුගේ ම යුතුකම වන්නේය. (තබරානි)

  හරාම් වූ ආහාරයෙන් පෝෂණය ලැබූ කිසිදු සිරුරක් ස්වර්ගයට පිවිසෙන්නේ නැත. එයට සුදුසු ස්ථානය නිරය වන්නේ ය. (තබරානි.)

- විශ්වාසවන්තයෙනි, මත්පැනත්, සූදුවත්, පිළිම වන්දනාවත්, හෙල්ලය විද කරන සාත්තර ඇසීමත්, ෂයිතාන්ගේ පිළිකුල් සහගත ක්‍රියාවන්ම වන්නේය. මෙයින් මුළුමනින් ම ඉවත් ව කටයුතු කරන්න. (5:90)

- ආහාරය මුස්ලිමෙකුගේ ලෞකික, ආධ්‍යාත්මික, දැනුම සම්බන්ධ කටයුතු සමඟ කෙසේ බැඳී පවතී ද යන්නත්, එය කොතරම් දුරට බලපෑම් ඇති කරන්නේ ද යන්නත් ඉහත සඳහන් අල්කුර්ආන් සුන්නා දේශනයන් මගින් වටහා දෙන්නේය.

**ආහාර අනුභව කිරීමේ දී ඉස්ලාම් දක්වා ඇති පිළිවෙත් පිළිපැදීම**

- ආහාර වර්ග අතර හරාම් කරන ලද ඒවා පහත සඳහන් මාතෘකා යටතේ වර්ග කළ හැකිය.

  1. මස් මාංශ අතර හරාම් කරන ලද ඒවා මළ සතුන්, ලේ, ඌරන්ගේ මාංශ, විධිමත් ව දබහ් නොකරන ලද සතුන්, බෙල්ල හිරවී මල සතුන්, පහර කා මල සතුන්, උස තැනක සිට බිමට වැටී මැරෙන ඒවා, අන් සතුන්ගේ අංවලින් ඇන මරනු ලබන සතුන්, බිලි දෙන ස්ථානවල කපනු ලබන සතුන්, තහනම් කළ පක්ෂීන්ගේ මාංශ මේ පිළිබඳ ව කුර්ආනය මෙසේ පවසයි.

     ඉබේම මල සතුන්, ලේ, ඌරු මස් සහ අල්ලාහ් නොවන අයගේ නම කියා දබහ් කරන ලද සතුන්, බෙල්ල මිරිකීමෙන් හා පහර කෑමෙන් මලවුන්, උසක සිට බිම වැටී මලවුන්, අංවලින් ඇණ පහර දී මරන ලද්දාවූ සතුන්, ඔබට තහනම් කරන ලද ඒවාය. එහෙත් (අවසර ලත් ඒවායින්) කුමක් ඔබ (පණපිටින් දැක විධිමත් ව) කපන ලද්දේ ද එය හැර, එය ඔබට අනුභව කළ හැකිය. යැයි අල්කුර්ආන් පවසයි. (5:3)

     නබි (සල්) තුමා නපුරු කැලෑ සතුන් අතර, උල් දත් සහිත සතුන්ගේ මාංශ ද, පක්ෂීන් අතර උල් නිය සහිත පක්ෂීන්ගේ මස් ද නොකන ලෙස වළක්වා ඇත. (බුහාරි) උදා: සිංහයා, කොටියා, වෘකයා, උකුස්සා, බස්සා, රාජාලියා

     ජල්ලාලා හි මස් කෑම ද, ඒවායේ නැග ගමන් යෑම ද නබි (සල්) තුමා තහනම් කළහ. ජල්ලාලා යනු පොදුවේ ආහාර සඳහා අවසර දෙනු ලැබූ හා සිරුරේ දුර්ගඳ ගසන තෙක් නිතර කසල කා ජීවත්වන, ඔටුවා, එළුවා, හරක්, කුකුල්, තාරාවා වැනි සතුන් හා පක්ෂීන් සඳහන් කෙරේ.

  2. ශාක අතරින් හරාම් වූ ඒවා, මිනිසාගේ බුද්ධියටත්, සිරුරටත්, හානිකර ශාකවර්ග, උදාහරණ ලෙස දුම්කොළ, ගංජා, නියඟලා අල වැනි ඒවා.

3. තහනම් කළ ඉපැයීමේ ක්‍රමවලින් ලද ඒවා.

උදා : මිනුම් කිරුම් වංචා මගින්, මිශ්‍ර කිරීම, සඟවා තැබීම, පොළිය, සූදුව, අල්ලස, සොරකම, මත්ද්‍රව්‍ය වෙළෙඳාම, හරාම් වූ රැකියාවලින් ඉපැයූ මුදල්, තහනම් කළ කෘෂිකර්ම හෝ ඉපැයීම වැනි ඒවා දැක්විය හැකිය.

අල්ලාහ් වෙළෙඳාමට අවසර දී පොලිය තහනම් කළේය.

හරාම් වූ ආහාර අනුභව කිරීම නිසා අත්වන හානි සහ හලාල් වූ ආහාර අනුභව කිරීම නිසා ලැබෙන ප්‍රයෝජන :

| හලාල් | හරාම් |
|---|---|
| 1. ආධ්‍යාත්මික ජීවිතය දැඩි වේ. | 1. ආධ්‍යාත්මික ජීවිතයට හානි පැමිණේ. |
| 2. නැමදුමක් වී යහපත සිදුවේ. | 2. පාපයක් වී දඬුවම ලැබේ. |
| 3. සිත ප්‍රභාමත් වේ. | 3. සිත අඳුරු වේ. |
| 4. නැමදුම් භාරගනී. | 4. නැමදුම් හා ප්‍රාර්ථනා අනුමත නොවේ. |
| 5. ස්වර්ගයට පිවිසීමේ වාසනාව හිමිවේ. | 5. නිරයට පිවිසෙයි. |
| 6. සැපවත් ජීවිතයක් හිමි වේ. | 6. සැපවත් ජීවිතයක් අහිමි වේ. |
| 7. ජීවිතය සැනසිලිදායක හා තෘප්තිමත් එකක් වේ. | 7. ජීවිතයේ කැළඹුනු ස්වභාවයත්, අතෘප්තිකර තත්ත්වයත් පහළ වේ. |
| 8. පින් වැඩිවේ. | 8. පව් වැඩි වේ. |
| 9. සමාජ ජීවිතය සැනසිලිදායක වේ. | 9. සමාජ ජීවිතයේ ගැටලු ඇති වේ. |
| 10. දැනුම වර්ධනය වීමත්, ලෝකය ගැන බැඳීමක් නැතිකමක් ඇති වේ. | 10. මොඩකමත්, ලෞකික ආශාවත් වැඩි වේ. |

**ඇඳුම්වලට අදාළ ඉස්ලාමීය විධික්‍රම**

- මුස්ලිම්වරයෙකුගේ පෙනුමත්, ඇඳුමත් ලස්සන වූත්, ක්‍රමවත් වූත්, ගෞරවනීය වූත්, එකක් විය යුතුය යැයි ඉස්ලාම් කැමැත්තේය. අල්කුර්ආනයේ දෘෂ්ටිය අනුව ඇඳුම් ඇඳීමේ අරමුණු දෙකකි. සිරුර හා නිරුවත වැසීම, පෙනුම අලංකාර කිරීම ආදියයි. පහත වාක්‍ය මගින් එය සනාථ කෙරේ.

  ආදම්ගේ පුතනුවනි, සැබැවින්ම ඔබගේ විලිය වසාගත හැකි ඇඳුම් ආයිත්තම් ඔබට ලබා දී ඇත්තෙමු. (7:26)

- ඇඳුමේ මෙම අරමුණු නොසලකා නොහැරිය යුතු ය යන අදහස සහතික කිරීම සඳහා අල්කුර්ආනයේ එම පරිච්ඡේදයේම පිහිටා ඇති පහත වාක්‍ය පිහිටන්නේය.

  ආදම්ගේ දරුවනි, කෙසේ ෂයිතාන් ඔබගේ දෙමාපියන් ස්වර්ගයෙන් පිටමං කළේ ද, තවද ඔවුන්ගේ විලිය නිරාවරණය කළ යුතුයැයි ඔවුන්ගේ ඇඳුම් ඉවත් කළේද, එසේ නැවතත් ඔහු ඔබව ව්‍යාකූලත්වයට ලක් නොකරත්වා. (7:27)

  ආදම්ගේ දරුවනි, නැමදුමෙහි යෙදෙන සෑම ස්ථානයකම ඔබව ඇඳුම්වලින් සරසා ගන්න. (7:31)

- අලංකාරයට හා යහපත් බාහිර පෙනුම කෙරෙහි අවධානය යොමු කරන ඉස්ලාම්, එයට පදනම් වන පිරිසිදුකම කෙරෙහි ද අවධානය යොමු කරයි. එය පහත හදීස් මගින් තහවුරු කෙරේ.

  නබි (සල්) තුමා, අපිරිසිදු ඇඳුම් ඇඳ සිටි පුද්ගලයෙක් දුටුහ. තම ඇඳුම් සෝදා ගැනීමට කිසිවක් ඔහුට නොලැබුණා දැයි එතුමා විමසුහ. (අබූ දාවුද්)

  මිනිසා යහපත් පෙනුමෙන් හා පිරිසිදු වූ ද තම ගෞරවයට සුදුසු වූ ද ඇඳුමෙන් සැරසී පෙනී සිටීම ඉස්ලාම් කැමැත්තේය. මෙම අදහස තහවුරු කරන හදීස් ද ඇත.

  අයෙක් සාමාන්‍ය ඇඳුමෙන් සැරසී නබි (සල්) තුමා බැහැදැකීමට පැමිණියේය. ඔබ සතු ධනයක් වේදැයි එතුමා පුද්ගලයාගෙන් විමසුහ. පුද්ගලයා ඔව් යැයි කීය. කුමන වර්ගයේ දේපල ඔබ සතුවේද? එතුමා නැවත ප්‍රශ්න කළහ. සියලුම ආකාරයේ සම්පත් අල්ලාහ් මට ලබා දී ඇතැයි එම පුද්ගලයා පැවසීය. එයට නබි (සල්) තුමා අල්ලාහ් ඔබට සම්පත් ලබා දී ඔබට ගෞරව කර ඇත්තේය. එහි ලක්ෂණ ඔබ තුලින් මතු වීමට කැමැත්තේය යි පැවසූහ. (බුහාරි)

- ජුම්ආව සඳහා පැළඳ යාමට අමතර ඇඳුම් දෙකක් තබා ගැනීමෙන් කිසිදු වරදක් නැත.

- ඇඳුම් සම්බන්ධයෙන් පිරිමින්ට හා කාන්තාවන්ට යම් යම් සීමා පනවා ඇත. පිරිමි සම්බන්ධයෙන් නම්, දෙ ආකාරයක ඇඳුම් ආයිත්තම් ඉස්ලාම් ඔවුනට තහනම් කර ඇත.

  1. රත්රන් ආභරණ පැළඳීම
  2. පිරිසිදු සේදවලින් යුත් ඇඳුම් ඇඳීම

- අලි (රළි) තුමා මෙසේ පැවසූහ. නබි (සල්) තුමා පට රෙදි තම දකුණතට ගත්හ. රත්තරන් තම වමතට ගන්න. පසුව මේ දෙක මගේ සමාජයේ පිරිමින්ට තහනම් ඒවා යැයි පැවසූහ. (අහ්මද්)

- උමර් (රළි) තුමා මෙසේ පවසයි. පට රෙදි නොඅඳින්න. කවරෙකු පට රෙදි අඳින්නේ ද ඔහු මතු දිවියේ දී මෙය අඳින්නේ නැත යැයි නබි (සල්) තුමා කියනු මම අසා ඇත්තෙමි. (බුහාරි)

- වරක් නබි (සල්) තුමා පුද්ගලයෙක් තම ඇඟිලිවල රන් මුද්දක් ඇඳ තිබෙනු දුටුහ. එය එතුමා ගලවා විසි කළහ. ඔබගෙන් අයෙක් ගිනි වෙත ගොස් එය තම අතෙහි පැළඳ ගන්නවා ද ? යැයි ඇසූහ. නබි (සල්) තුමා එතැනින් බැහැරට ගිය පසු ඔබගේ මුද්ද ගන්න. එයින් ප්‍රයෝජනයක් ලබා ගන්න යැයි ඔහුට පවසන ලදී. එවිට එම පුද්ගලයා අල්ලාහ් වෙත දිවුරමි. අල්ලාහ්ගේ දූතයාම විසි කර පසු මම එය නැවත නොගනිමි යි පැවසීය. (මුස්ලිම්)

  රත්රන් මුද්ද මෙන්ම රත්රන් පෑන් හෝ රත්රන් ඔරලෝසු භාවිතා කිරීමත් පිරිමින්ට තහනම්ය.

- එහෙත් පිරිමින්ට රිදී මුද්දක් පැළඳීමට අවසර ඇත. නබි (සල්) තුමා රිදියෙන් තැනූ මුද්දක් ගත්හ. එය ද එතුමාගේ අතෙහි විය. පසුව අබුබක්කර් (රලි) තුමාගේ අතෙහි විය. එයින් පසු එය උමර් (රලි) තුමාගේ අතෙහි දක්නට ලැබුණි. ඉන්පසු අරීස් යන ළිඳෙහි වැටෙන තෙක්, උස්මාන් (රලි) තුමාගේ අතෙහි දක්නට ලැබුණි. (බුහාරි)

- පොදුවේ කාන්තාවන් සුන්දර දේවලට කැමති අයයි. ඒ නිසා ඔවුන්ට රන් හා පට තහනම් වූයේ නැත. එහෙත් රන් හා රිදී උපකරණ භාජන භාවිතා කිරීමට පිරිමින්ට මෙන් ම කාන්තාවන්ට ද අවසර දී නැත.

- කාන්තාවන්ගේ ඇඳුම සම්බන්ධයෙන් ගත්විට එය කෙසේ විය යුතුදැයි ඉස්ලාම් සීමා පනවා ඇත.

1. පිටත දැකිය හැකි කොටස් ලෙස දක්වා ඇති සිරුරේ කොටස් හැර අනෙක් කොටස් වසාගත හැකි ආකාරයෙන් ඇඳුම පැවැතිය යුතුය.

   නබිතුමනි, විශ්වාසවන්ත කාන්තාවන්ට පවසන්න. ඔවුන් තම බැල්ම පහත් කර ගන්නටත්, තම පතිවත රැක ගැනීමටත්, තම රූ ශ්‍රියෙන් පිටත පෙනීමට අවසර ඇති කොටස් හැර ඉතිරි කොටස් පිටත නොපෙනිය යුතු යැයි පවසයි. (24:31) පිටත පෙනෙන යනු වැළැක්විය නොහැකි අනිවාර්යයෙන් පිටත පෙනෙන ශරීර කොටස් වන්නේ ය යන්න මස්ඌද් (රළි) තුමාගේ පහදාදීම වන්නේය. මෙම පහදාදීම අනුව කාන්තාව මුළුමනින් ම සිය සිරුර වැසිය යුතුය. ඇයගේ මුළු සිරුරම අව්රතය වන්නේය. එහෙයින් ඇගේ සිරුරේ කිසිදු කොටසක් පිටත නොපෙනිය යුතුය. පිටත පෙනිය හැකි යනු මුහුණ හා දෑත වන්නේය යැයි ඉබ්නු උමර් (රලි) පහදා දෙති. බොහෝ ඉස්ලාමීය විද්වතුන් ද අදහස් කරන්නේ මෙයයි. මේ අනුව කාන්තාවගේ මුහුණ හා දෑත් හැර සිරුරේ ඉතිරි කොටස් සියල්ල වසාගත යුතු ය.

2. අවුරතය පිටත නොපෙනෙන අයුරින් ඇඳුම නොපැවතිය යුතුය.

   දෙපිරිසක් නිරයේ හිමිකරුවන් ය. ඔවුනට මම සාක්ෂියක් නොවෙමි. ඔවුන්ගෙන් පිරිසක් හරක් වලිගය මෙන් වූ කස අතැතිව සිටිති. ඔවුන් එයින් මිනිසුන් පෙළති. අනෙක් පිරිස ඇඳුම් ඇන්ද ද නිරුවතින් සිටින කාන්තාවන්ය. ඔවුන් වැරදි මාර්ගයේ යන අතර අන් අය ද වැරදි මාර්ගයේ යොමු කරති. ඔවුන්ගේ හිස් ඔටුවන්ගේ සෙලෙවන මොල්ලි මෙන් වෙයි. මෙවැනි අය ස්වර්ගයට පිවිසෙන්නේ නැත. එහි සුවඳවත් ඔවුනට ළඟාවන්නේ නැත. (මුස්ලිම්)

   ඇඳුම් ඇන්ද ද නිරුවතින් සිටින්නන් යන්නෙන් අදහස් වන්නේ, ඔවුන්ගේ ඇඳුම සිරුර ආවරණය කරන ක්‍රියාව නිසි පරිදි ඉටු නොකරයි යන්නය. ඒවා ඉතා දුහුළු රෙදි නිසා සිරුරේ අලංකාරය පිටතට පෙනෙන්නේ ය යන්න ය.

   වරක් මනාලියක් ආයිෂා (රළි) තුමිය වෙත කැඳවාගෙන එනු ලැබුවාය. ඇය දුහුළු සළුවක් පොරවාගෙන සිටියාය. එය දුටු ආයිෂා (රළි) තුමිය එම කාන්තාව නූර් නම් පරිච්ඡේදය විශ්වාස නොකරන බව කීවාය. (තෆ්සීර්, කුර්තුබි)

   ශරීර කොටස්වල ප්‍රමාණය අලංකාරය, රූපශ්‍රීය පෙන්වන අයුරින් ඇඳුම් නොසැකසිය යුතුය. එනම්, ඇඳුම තද ඇඳුමක් නොවිය යුතුය. දුහුලු ඇඳුම් මෙන් ම තද ඇඳුම් ද හැඟීම් අවුස්සන සුළුය. එහෙයින් මෙසේ අඳින කාන්තාවන් ද ඇඳුම් ඇඳගෙන නිරුවතින් සිටින කාන්තාවන් හා සමාන ය.

3. එය පිරිමින් සඳහා වෙන් වූ ඇඳුමක් නොවිය යුතුය. මක්නිසා ද යත් කාන්තාවන්ගේ ඇඳුම් අඳින පිරිමින් ද, පිරිමින්ගේ ඇඳුම් අඳින කාන්තාවන් ද නබිතුමා ශාප කර ඇත්තාහ.

4. ඇඳුම සුගන්ධ ගැල්වූවක් නොවිය යුතුය. කාන්තාවකට නිවසේ සිටින විට එනම් මහ්රම්වරුන් ඉදිරියේ සිටින විට සුගන්ධ ගල්වාගෙන සිටීමට අවසර ඇත. එහෙත් නිවසින් බැහැරවන විට සුගන්ධ ගල්වාගෙන යෑමට ඇයට අවසර නැත.

   කාන්තාවක් සුගන්ධ ගල්වාගෙන තමාව ඔවුන් බැලිය යුතුය යන අදහසින් පිරිසක් ඉදිරියෙන් යන්නේ නම් ඇය ගණිකාවක් වන්නීය. ඇය කෙරෙහි රාගී හැඟීමෙන් බලන සෑම අයෙක්ම ඇය දූෂණය කරන්නේය යැයි නබි (සල්) තුමා වදාළහ. (නසාඊ)

5. ආඩම්බරකම හා තම ප්‍රසිද්ධිය එළිකරන්නක් ලෙස ඇඳුම නොවිය යුතුය. ඇඳුම හා ආහාර යන දෙකටම ඉස්ලාම් පනවන පොදු කොන්දේසි දෙකකි. අපතේ යැවීම වැලැක්වීම, ආඩම්බරකම වැළැක්වීම යන්න ඒවා ය. සමාජයේ වඩා ප්‍රචලිත ඇඳුම ඇඳීමෙන් වැලකී සිටීම මෙයට උදව් වන්නේය. නබි (සල්) තුමා, කවරෙකු ප්‍රචලිත ඇඳුම් අඳින්නේ ද, අල්ලාහ් ඔහුව මතු ජීවිතයේ දී ඉතා පහත් ඇඳුම් අන්දවන්නේ ය යැයි පැවසූහ. (අහ්මද්)

   ඇඳුම මත ජනයා මිනිසුන්ගේ තරාතිරම අගය කරති. එහෙයින් අප ගැන අන් අය වැරදි වැටහීම් ගැනීමට අප අවස්ථාව නොදිය යුතුය. අයෙකු ඉබ්නු (රළි) තුමා වෙත පැමිණ මම තෝරාගත යුත්තේ කුමන ඇඳුම් දැයි වුමසූහ. එවිට මෝඩයන් ඔබ දෙස බලා සිනා නොසෙන බුද්ධිමතුන් ඔබව හෙලා නොදකින ඇඳුම ඔබ ඇඳිය යුතු යැයි කීහ. (තබරානි)

- පිරිමියාගේ ඇඳුම්වලට ද කොන්දේසි ඇත. ඒවා මෙසේ ය :

1. අව්රතය ආවරණය කරන අයුරින් වීම. පිරිමියාගේ දණහිස සිට පෙකණිය දක්වා වූ කොටස් අව්රතය ලෙස සැලකේ.

2. කාන්තාවන්ගේම ඇඳුමක් නොවීම.

3. ආඩම්බරකම දක්වන ඇඳුමක් නොවීම.

4. තුනී ඇඳුමක් නොවීම.

**නිවෙස් ජීවිතය හා සම්බන්ධ ඉස්ලාමීය පිළිවෙත්**

- මිනිස් සමාජ සැකැස්මෙහි නිවසේ දායකත්වය සුවිශේෂ ය යන අදහස ඉස්ලාම් දරන්නේය. එහෙයින් එය නිවසට සුවිශේෂ තත්ත්වයක් හා තරාතිරමක් ලබා දී ඇත. අල්ලාහ් නිවෙස්, ඔබට සැනසිල්ල ගෙන දෙන ස්ථාන බවට පත් කර ඇත. (16:80)

  නිවස සැනසුම, ආරක්ෂාව, සාමය, ආදරය ආදියේ බැම්මක් ද, යහ ක්‍රියාවල හා උත්තම ගුණාංගවල වාසස්ථානය ලෙස, සමාජයට අවශ්‍ය උගතුන් හා පරිත්‍යාගශීලීන් බිහිකරන ආයතනයක් ලෙස පිහිටිය යුතුයැයි ඉස්ලාම් බලාපොරොත්තු වන්නේය.

  නිවස මෙවැනි කාර්යයන් ඉටු කළ යුතු නම්, එහි භෞතික සැකැස්ම, භෞතික පරිසරය, අධ්‍යාත්මික පරිසරය හා එහි සාමාජිකයන්ගේ වගකීම ආදියෙහි අදාළ අවධානය යොමු කිරීම අවශ්‍ය දෙයකි.

- නිවසේ භෞතික පිහිටීම හා එහි පරිසරය

1. නිවස අවශ්‍යතාවයට සරිලන පරිදි විශාල එකක් වීම, කරුණු හතරක් වාසනාව ගෙන දෙන ඒවා ය. ඒවා : හොඳ භාර්යාවක්, විශාල නිවස, යහපත් අසල්වැසියන් හා හොඳ වාහනය යනාදියයි. (නසාඊ)

2. නිවස පිරිසිදුව තබා ගැනීම : එක් හදීසයක නබි (සල්) තුමා, ඔබගේ නිවසේ මිදුල පිරිසිදුව තබා ගන්න යැයි පවසා ඇත. (තිර්මිදි)

3. නිවසේ අලංකාරය හා පිළිවෙලෙහි සැලකිලිමත් වීම. නබිතුමනි, ඔබ විමසන්න. අල්ලාහ් තම ගැත්තන්ට එළිකර දී ඇති අලංකාරය හා ආහාර වර්ගවල පිරිසිදුකම වළක්වන්නෝ කවුරුන් ද ? (7:32)

4. නිවසේ පරිසරය බාහිර පරිසරය පිරිසිදුව තබා ගැනීම.

මුස්ලිම්වරයෙක් වගා කරන්නේ ය. නැතහොත් ගස් සිටුවන්නේය. එයින් පක්ෂීන්, සතුන් හෝ මිනිසුන් යමක් අහරට ගන්නේ නම් එය එම මිනිසාගේ දානමානයක් වන්නේ ය. (මුස්ලිම්)

භාවිත කරන ලීබඩු උපකරණ, භාජන, අන් බඩු බාහිරාදිය, ඉස්ලාමීය සීමාවන්ට ඇතුළත් වීම, රන් රිදී භාජනවල ආහාරපාන ගැනීම, ආමාශයේ නිරයේ ගින්න රැස් කරන්නේය. (මුස්ලිම්)

- භෞතික පිහිටීම හා පරිසරය පමණක් හොඳ පවුලක නිවසක් බිහිවීමට හේතුවන්නේ නැත. එහෙයින් හොඳ නිවසක් ඇති කිරීම සඳහා ඉස්ලාම් තවත් කරුණු රැසක් ගෙන හැර දක්වන්නේය.

1. විවාහය සඳහා සහකාරයා/සහකාරිය තේරීමේ දී, යහපත් ගුණාංගවලට හා ඊමානය මූලිකත්වය දී ඇත. ආගමට ලැදි කාන්තාවන් හිමිකර ගන්න. නැතහොත් සිදුවන්නේ මහ විනාශයයි. (බුහාරි)

2. සැමියා සහ බිරිඳ ඔවුනොවුන් වෙත ඇති වගකීම් ඉටු කිරීම.

3. දෙමාපියන්, දරුවන් කෙරෙහි ඇති තම වගකීම නිසි පරිදි ඉටු කිරීම.

4. දරුවන්, දෙමාපියන් කෙරෙහි ඇති තම යුතුකම ඉටු කිරීම.

5. පවුලේ නෑයින් අතර සුහද සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.

6. අසල්වැසියන්ගේ අයිතිවාසිකම් ගැන සලකා කටයුතු කිරීම. ජිබ්රිල් (අලෛ) තුමා අසල්වැසියන් සමඟ සුහදත්වය රැක ගන්නා ලෙස දිගින් දිගටම බලකරමින් සිටියහ. එය කොතරම් වී ද යත් අසල්වැසියා පසු උරුමක්කාරයකු කරනු ලබන්නේදෝ්‍ය මම සිතන්නට වීමි. (බුහාරි)

7. අමුත්තන්ගේ අයිතිවාසිකම් සුරැකීම.

අල්ලාහ් කෙරෙහි සහ පරලොව දිවිය කෙරෙහි විශ්වාසය තබා ඇති අය තම අමුත්තන්ට හොඳින් සලකත්වා. (මුස්ලිම්)

8. නිවසේ සියලු කටයුතුවලදී ම ඉස්ලාමීය ක්‍රමය අනුගමනය කිරීම. ඊමාන්ධාරීනි, ඔබගේ දකුණත අයිතිකරගත් අය ද, ඔබ අතර සිටින නිසි වයසට පත් නොවූ දරුවන් ද, අවස්ථා තුනක දී ඔබගෙන් අවසරය ලබාගත යුතු ය. (24:58)

- නිවස ඉස්ලාමීය චාරිත්‍ර වාරිත්‍ර අනුව පවත්වාගෙන යෑමට එහි, අධ්‍යාත්මික පරිසරය බෙහෙවින් උපකාරී වන්නේය. එහෙයින් එම අධ්‍යාත්මික පරිසරය රැක ගත හැකි අයුරින් පියවරවල් අනිවාර්යයෙන්ම ගත යුතුය. එයට පහත පියවර ගත හැකිය.

1. පස්වේල් සලාතය ජමාඅත් ලෙස ඉටු කිරීමට අවධානය යොමු කිරීම.

අයෙකු මස්ජිදය හා කිට්ටු සම්බන්ධතාවයක් පවත්වන්නේ නම් ඔහුට ඊමාන් ඇතැයි යන්නට ඔබ සාක්ෂියක් වන්න. (හිල්යා)

2. නිවසේ සුන්නත් සලාත ඉටු කිරීම.

ඔබගේ සුන්නත් සලාත්වලින් කිහිපයක් හෝ නිවසේ දී ඉටු කරන්න. ඒවා ඔබගේ මිනීවල බවට පත් නොකරන්න. (මුස්ලිම්)

අයෙකුට අල්ලාහ් දායාද හිමි කරත්වා. ඔහු රාත්‍රියේ නින්දෙන් අවදිව සලාතය ඉටු කරන්නේ ය. තම බිරිය ද නැඟිටුවන්නේය. ඇය නැඟිටීමට ප්‍රතික්ෂේප කරන විට ඇගේ මුහුණේ වතුර ඉසින්නේය. කාන්තාවට ද අල්ලාහ් දායාද හිමි කරත්වා. ඇය රාත්‍රියේ නින්දෙන් නැගිට සලාතය ඉටු කරන්නීය. පසුව තම සැමියා ද නැගිට වන්නීය. ඔහු නැගිටීම ප්‍රතික්ෂේප කරන විට, ඔහුගේ මුහුණෙහි වතුර ඉසින්නී ය. (අබූ දාවුද්)

3. නිවසේ අල්කුර්ආනය පුරුද්දක් ලෙස උසුරීම. ඔබගේ නිවෙස් මිනී වලවල් නොකරන්න. සූරා අල් බකරා උසුරන නිවසින් ෂයිතාන් පලා යන්නේය. (මුස්ලිම්)

4. අල්ලාහ් ගැන සිහි කරවන සිද්ධීන් (දික්ර්, බයාන්, තජ්වීද පන්ති) ආදිය ලැහැස්ති කිරීම.

   අල්ලාහ් මතක් කරන නිවසට උදාහරණය පණ ඇති පුද්ගලයා ය. අල්ලාහ් මතක් නොකරන නිවසට උදාහරණය මළ පුද්ගලයෙකුය. (මුස්ලිම්)

- ඉහත සඳහන් සෑම කරුණක් කෙරෙහිම අවධානය යොමු කරන විටය නිවසක් මුස්ලිම් නිවසක් වන්නේ.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

පියවර 1 : මිනිස් ජීවිතයේ මූලික අවශ්‍යතා පිළිබඳ ඉස්ලාමීය දේශන සැකෙවින් විස්තර කරන්න.

පියවර 2 : සිසුන් කණ්ඩායම් 3කට බෙදන්න.

1. හලාල් , හරාම් විධි ක්‍රම
2. ආහාර, ඇඳුම් පිළිබඳ සීමා
3. ඉස්ලාමීය නිවෙස් පිළිබඳ දේශනා

ආදී මාතෘකා යටතේ තොරතුරු රැස්කිරීමට යොමු කරන්න.

පියවර 3 : එක් එක් කණ්ඩාම රැස්කළ තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 4 : ඔවුන් රැස්කළ තොරතුරු පොතෙහි සටහන් කර ගැනීමට යොමු කරන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**

1. මව්ලානා ජමීල් අහ්ලන් නද්වි , නබිතුමාගේ ජීවිතය, ඉස්ලාමීය ට්‍රස්ට් ආයතනය, චෙන්නයි.
2. අගාර් මුහම්මද් ඒ.සී. (1996) , සත් ධර්ම නීති පහදා දීම. අල් කලම් මුද්‍රණාලය
3. මන්සූර් එස්. එම්. (2000) ඉස්ලාමීය කාන්තා ඇඳුම, නොලේජ් මුද්‍රණාලය, මාදම්පේ
4. මුතහ්හිර් මුර්තලා (1996), ඉස්ලාමීය හිජාබ්, ඉස්ලාමීය සේවා සංවිධානය, කොළඹ.

**නිපුණතාව 9.0 : සමාජීය ජීවිතය හා සම්බන්ධ ඉස්ලාමීය නීතිරීති හා උපදේශ දැන ඒ අනුව සිය ජීවිතය සකස් කර ගනී.**

**නිපුණතා මට්ටම 9.1** : ඉස්ලාමයේ සමාජ ජීවිතයට ලබා දී ඇති වැදගත්කම වටහා ගෙන සමාජයීය යුතුකම් ඉටු කරයි.

**කාලය** : කාල පරිච්ඡේද 30

**ඉගෙනුම් ඵල** :

- ඉස්ලාමය සමාජීය ජීවිතය සඳහා වූ මගපෙන්වීමක් යන්න තේරුම් ගෙන අන් අයට ගෙනහැර දක්වයි.
- ඉස්ලාමීය සමාජ සැකැස්මෙහි සුවිශේෂීත්වය අනෙකුත් සමාජවල සැකැස්ම හා සසඳා පැහැදිළි කරයි.
- මුස්ලිම්වරයෙකු අල්ලාහ්ගේ නියෝජිතයා ලෙස ද, සමාජයේ නියෝජිතයා ලෙස ද සිට කෙසේ සේවය කළ හැකි ද යන්න හඳුනාගෙන දේශන පවත්වයි.

## විෂය කරුණු පැහැදිළි කිරීමට අත්වැලක්

### සමාජීය ජීවිතයේ වැදගත්කම

- පොදුවේ ජන සමූහයක් සමාජයක් ලෙස හඳුන්වති. එහෙත් සමාජයක් යන්න එයට වඩා ගැඹුරු වූ ද, පුළුල් වූ ද තේරුමක් ඇත්තකි. සමාජය යන්න සියලුම ආකාරයන් හි සම්බන්ධතා අඩංගු වූවකි. එය තනි පුද්ගලයින් අතර ඇතිවන්නා වූ සම්බන්ධතා, හැඟීම්, හැදියාවන් හා සමාජීය බන්ධන යන්න හඳුන්වන බව සමාජ විද්‍යාඥයින් සඳහන් කරති. මෙම සම්බන්ධතා ආගම, භාෂාව, ප්‍රදේශය, ජාතිය සමග සම්බන්ධවිය හැකිය. එසේත් නොමැතිනම් රැකියා සම්බන්ධව ද විය හැකිය.
- තවත් ආකාරයකට පවසන්නේ නම්, සමාජය යන්න විශාල කණ්ඩායමක් ලෙස සඳහන් කළ හැකිය. එහි තනි පුද්ගලයෙකුගේ ජීවිතයට අවශ්‍ය පුහුණුව, පළපුරුද්ද ඔහු ලබාගන්නේ ය. එය ඕනෑම නෑකමක් හෝ එසේත් නැතිනම් පොදු අභිවෘද්ධියක් උදෙසා එක්වීමක් වේ. ඔවුන් අතර එකිනෙක ගැලපෙන සමාන අදහස් ද දක්නට ලැබේ.
- සමාජය තනි පුද්ගලයින්ගේ එක්වීමක් ලෙස සැලකුවහොත්, තනි පුද්ගලයින් සමාජය නිර්මාණය කරයි. එසේත් නැතිනම් සමාජය තනි පුද්ගලයින්ව නිර්මාණය කරයි. එනම් තනි පුද්ගලයා සමාජයේ ද, සමාජය තනි පුද්ගලයාගෙන් ද බලපෑමට ලක් කෙරෙයි. පිරිමියෙකු ගැහැණියක විවාහ කර ගනියි. ඔවුන් දෙදෙනාගෙන් පවුලක් ඇතිවෙයි. පවුල් බොහෝමයක් ජාතියෙන් හෝ භාෂාවෙන් හෝ ආගමෙන් හෝ මූලධර්මයන්ගෙන් හෝ රැකියාවෙන් හෝ එක් වී සම්බන්ධ වන විට සමාජයක් ඇති වේ. උදාහරණයක් ලෙස යුදෙව් සමාජය, දෙමළ සමාජය, ක්‍රිස්තියානි සමාජය, යන්න නිර්මාණය වේ. සමාජවාදී සමාජය, කෘෂිකාර්මික සමාජය ලෙස හැඳින්වීම සඳහන් කළ හැක. කෙසේ වෙතත්, යම් සමාජයකින් තනි පුද්ගලයින් නිර්මාණය වෙති. එම තනි පුද්ගලයින් පෙනුමෙන් පමණක් නොව චින්තනයෙන්, ජීවන ක්‍රමයෙන් හා සංස්කෘතිය යන්නෙන් එක් වෙති. යම් සමාජයක් එහි සංස්කෘතිය, එහි බිහි වූ තනි පුද්ගලයින් හරහා අනෙක් පරම්පරාවට ලබා දෙති. එසේත් නොමැති නම් සෑම තනි පුද්ගලයෙක් ම තමන් ජීවත් වන්නා වූ සමාජයේ නියෝජිතයෙක් ලෙස ක්‍රියා කරයි. එබැවින් තනි පුද්ගල සමාජ සබඳතාවයන් ශරීරයේ අවයවවලටත්, ගොඩනැගිල්ලක ගල්වලටත් නබි (සල්) තුමාණන් උපමා කර සඳහන් කළහ.

- මිනිසා සමාජයක් ලෙස ජීවත් වීම සලකා, සමාජ විද්‍යාඥයින් ඔහුව සමාජ සත්ත්වයා යැයි ඉදිරිපත් කරති. ඉස්ලාමය මිනිසාව සත්ත්වයකු ලෙස පිළිනොගනී. ඔහුව අල්ලාහ්ගේ නියෝජිතයා යැයි උසස් කර සඳහන් කරයි. මිනිසා ස්වභාවයෙන් ම එක් වී ජීවත් වෙයි. එය ප්‍රතික්ෂේප කළ නොහැක. " අල්ලාහ් මිනිසාට කථා කිරීමට ඉගැන්වීය." (55:2) යැයි අල්කුර්ආනය සඳහන් කරයි. මිනිසාට කතා කිරීමේ හැකියාව ලබාදීම මගින් ඔහුව එක් ව ජීවත් වීමට ඉඩහැරී ය. කථාව ප්‍රධානම සන්නිවේදන මාධ්‍යය වෙයි.

- සෑම ජීවියෙකුට මෙන් ම මිනිසාට ද අවශ්‍යතා ඇත්තේ ය. ප්‍රඥාව ඇත්තෙකු වීම අනුව ද අල්ලාහ්ගේ නියෝජිතයා වීම අනුව ද මිනිසාගේ අවශ්‍යතාවයන් සීමා රහිත ය. ඒ සියලුම අවශ්‍යතා මිනිසාට තනිව සිට ලබාගත නොහැක. එයට අන් අයගේ උදව් අවශ්‍ය ය. කුසගින්න, පිපාසය හා ලිංගික ආශා වැනි ශාරීරික අවශ්‍යතා තිබිය හැකිය. ආදරය, ආරක්ෂාව, ගරු කිරීම වැනි මනෝ විද්‍යාත්මක අවශ්‍යතාවයන් විය හැකිය. කුමක් වුවත් මිනිසා එක් ව ජීවත් වී අන් අය හා සහයෝගයෙන් ජීවන සැලැස්මක් නිර්මාණය කිරීම හරහා සමාජීය සංස්කෘතියක් එළිදක්වයි. මිනිසා එක් ව ජීවත් වීම මගින් ලොවෙහි සංස්කෘතීන් හා ශිෂ්ටාචාරයන් වැනි දෑ බිහිවෙයි.

- නබි (සල්) තුමාගේ සීරාවෙන් අප මෙය ඉගෙන ගන්නෙමු. එතුමන් එතුමාගේ මක්කා ජීවිත කාලය තුළ දී තනි පුද්ගලයින් ව නිර්මාණය කළේය. මදීනා ජීවිත කාලය තුළ දී එම තනි පුද්ගලයින් යොදාගෙන සමාජයක් නිර්මාණය කළේය. තනි පුද්ගලයින් එක් කිරීම මගින් පමණක් සමාජයක් නිර්මාණය නොවෙයි. ඔවුන් වෙත පොදු (සමාන) ලක්ෂණ දක්නට ලැබිය යුතුයි. ඔවුන්ට එකිනෙක සම්බන්ධ කරන්නා වූ නායකත්වයක් තිබිය යුතු වේ. ඔවුන්ට ස්වාධීනව ක්‍රියා කළ හැකි ප්‍රදේශයක් තිබිය යුතුයි. මදීනාවෙහි මේ හතරම ලැබුණු හෙයින් සමාජයක් නිර්මාණය කිරීමට හැකිවිය.

- නබි (සල්) තුමාණෝ එම සමාජය සැලසුම් සහිතව ගොඩනැගූහ. මදීනා ජනයා හමු වූ අවස්ථාවේ පළමු අකබා ප්‍රතිඥාවෙන් "අප අල්ලාහ්ට කිසිත් සම නොකරන්නෙමු, සොරකම් නොකරන්නෙමු, අශීලාචාර ක්‍රියාවල නිරත නොවෙමු, පරම්පරාවේ පුද්ගලයින් මරා නොදමමු, එතුමා හරි යැයි ප්‍රකාශ කළ දේ පිළිපැදීමෙන් නොවැළකෙමු " යැයි දිව්රූහ. මෙය වැරදි ක්‍රියාවලින් තොර වූ සමාජයක් නිර්මාණයේ අඩිතාලම ලෙස පැවතිණ. ඉන් පසුව මුස්අබ් ඉබ්නු උමෛර් (රළි) තුමාව මදීනාවට යවා ඉස්ලාමය ප්‍රචාරය කළ විට ප්‍රදේශයේ වාතාවරණය ද නිරීක්ෂණය කරවූහ. මෙය එම ප්‍රදේශයේ විශ්ලේෂණයක් ලෙස පැවතිණි. දෙවන අකබා ප්‍රතිඥාවෙහි දී නබි (සල්) තුමාණන්ව ආරක්ෂා කිරීමේ සහතිකය ලබා ගත්තේ ය. මෙය නායකත්වය ආරක්ෂා කිරීමක් ලෙස පවතියි. හිජ්රත් ගිය පසු මස්ජිද් නබවිය නිර්මාණය කර සමාජය එක් කිරීමක් ලෙස ද, යුදෙව්වන් සමග ගිවිසුමක් ඇති කිරීම, ස්වාධීන ප්‍රදේශයක් ලබා ගැනීමේ උත්සාහයක් ලෙස පැවතුණු බව ද කිව හැකිය.

- නබි (සල්) තුමා සැලසුම් සහගත ව සමාජයක් නිර්මාණය කිරීම නිරීක්ෂණය කළ විට සමාජ ජීවනයේ වැදගත්කම තවදුරටත් පැහැදිළි වේ. තනි පුද්ගලයෙකුගේ චින්තනයෙන් ඇති වූ අදහස්, ඔහු තුළම රැඳී තිබුණහොත් දෙවැනි පුද්ගලයෙකුට දැනගත නොහැකි නම්, එම අදහස ඔහුත් සමඟම වියැකී යයි. ඉස්ලාමය ලෝක අවසන් දිනය දක්වා පැවතිය යුතු නම් පුද්ගලයකු මත රැඳී නොපැවත, සමාජයේ ඇලී පැවතිය යුතුය යන්න නබි තුමාණන් දැන සිටියහ. ලෝක අවසානය දක්වා පැවතිය යුතු ජීවන සැලැස්මක් සමාජයක් තුළින් ම ඉදිරිපත් කළ යුතු බැවින් සමාජයක් බිහි කිරීමේ උත්සාහයෙහි ආසන්න වශයෙන් වසර දහයක් පමණ වැය කළහ. මෙය සමාජයේ වැදගත්කම ගෙන හැර දක්වයි.

- එක් මුස්ලිම්වරයෙකු තවත් මුස්ලිම්වරයෙකුට කැඩපතක් ය යන හදීසයට අනුව ඉස්ලාමීය ජීවන ක්‍රමයෙහි ඇතිවන්නා වූ පසුබෑම්, දුර්වලවීම් හා අඩුපාඩු නිවැරදි කිරීම සඳහා අවස්ථාව දසමාජ ජීවිතය හරහා ම ලැබෙයි. නබි (සල්) තුමාගේ අපවත් වීමෙන් පසුව සමාජයේ ඇති වූ අර්බුද සඳහා විසඳුම් ද, රෝගී තත්ත්ව සඳහා නිවාරණය ද හා ඇබෑර්තු පිරවීම් ද නොයෙකුත් පුද්ගලයින් තනිවම ද, එක්ව ද ඉටුකළ ඉජ්තිහාද් ඉතිහාසය මෙය තවදුරටත් ස්ථිර කරයි.

**ඉස්ලාමීය සමාජ ව්‍යුහයේ විශේෂාංගයන්**

- ඉස්ලාමීය සමාජ ව්‍යුහය ක්ෂණිකව ඇති වූවක් හෝ කාලයත් සමඟම බිහි වී වර්ධනය වූවක් හෝ නොවේ. එය අල්ලාහ්ගේ හා ඔහුගේ දූතයා විසින් සැලසුම් සහගත ව ගොඩනගන ලද්දක් වේ. එබැවින් අනෙකුත් සමාජ ව්‍යුහයන්ගෙන් වෙනස් වෙයි. ඉස්ලාමය සමාජ ව්‍යුහය වෙනුවෙන් ම පදනම් කිහිපයක් නිර්මාණය කර ඇත. එහි මූලික පදනම තව්හීද් වේ.

- සමහරුන් සමාජ ව්‍යුහයේ විශේෂ ලක්ෂණවලට ඊමාන්, නිදහස, සමානාත්මතාවය, සහෝදරත්වය, යුක්තිය, සාමූහික වගකීම හා නායකත්වය යන්න සඳහන් කරති. තවත් සමහරුන් සහෝදරත්වය, සමානාත්මතාවය, සමාජ සාධාරණත්වය, සාමූහික වගකීම හා නායකත්වය යන්න සඳහන් කරති. මේවා තනි තනිව වෙන්කර දැක්වුව ද එකක් අනෙකක් සමඟ එකට එක ගෙතී පවතී. සියලු දෙනාම සහෝදරවරුන් ලෙස සලකා ක්‍රියා කරන විට, ඔවුන් සියලු දෙනාවම සමානව සලකනු ලබති. එහි උස්පහත් බවක් ඇති නොවේ. සමානාත්මතාවයක් පවතින විට නීතිය ද නියමාකාරයෙන් ක්‍රියාත්මක වේ. සමාජයේ එක් කොටසකට සමාව ද, තවත් කොටසකට දඬුවම් ද ලබා දෙන විනිශ්චයයන් හි වෙනස්කම් එහි නොපවතිනු ඇත. ඔවුන් සෑම දෙනාම සාමූහික වගකීමකින් යුතුව ක්‍රියාත්මක වෙති. මෙවැනි සමාජ තත්ත්වයක් විනය ගරුක නායකත්වයක් ඇති සමාජයක පමණක් දක්නට හැකි ය.

- සමාජ සැකසුමෙහි විශේෂාංග ලෙස තවත් කිහිපයක් ගෙනහැර දැක්විය හැකිය. ඉස්ලාමය අල්ලාහ් හා මිනිසා අතර වූ සම්බන්ධතාවය බලවත් කිරීමේ ආධ්‍යාත්මික ධර්මයක් පමණක් නොව මිනිසුන් අතර වූ සම්බන්ධතාවයන් ස්ථිර කරන්නා වූ ද ජීවන ක්‍රමයක් ද වෙයි. මෙබැවින් එය ඉබාදතයන්හි දී හා අනෙකුත් කටයුතුවල දී සමාජය කේන්ද්‍රකොට ක්‍රියාත්මක වෙමින් පවතී.

- ඉස්ලාමයෙහි ඉගැන්වීම් තනි පුද්ගලයින්ව සැලකීමෙන් තොරව සමාජය සලකාම ඉදිරිපත් කරයි. අල්කුර්ආනය, ජනයිනි, “විශ්වාසවන්තයිනි” යැයි ආමන්ත්‍රණය කිරීම මගින් ගුණධර්මයන් හා ක්‍රමවේදයන් ඉදිරිපත් කරයි. ඉස්ලාමීය ඉබාදතයන්ගෙන් වැදගත් ඒවා සාමූහිකව ඉටුකළ යුතු බව විධානය කරයි. වන්දනය, උපවාසය, සකාත්, හජ්, යන හතරම සමූහ ක්‍රියා ලෙස ඉටු වේ. වන්දනය සඳහා වූ පූර්ව සූදානම හා ක්‍රමවේදයන් මෙයට සුදුසු වූ උදාහරණ ලෙස සැලකිය හැකිය. එය ජනයාව මස්ජිදය වෙත කැඳවයි. අසාන් කීම සඳහා මුඅස්සින්, දේශනා කිරීම සඳහා කතීබ්, සලාතය ඉටුකිරීම සඳහා ඉමාම් ඉගැන්වීමට මුඅල්ලිම් යන බොහෝ දෙනෙකුගේ සහයෝගය එයට අවශ්‍ය වේ. මොවුන්ව බිහිකිරීම සමාජයේ මෙහෙයයි. ඔවුන්ට භූමියෙහි පාලනය ලබාදුනහොත් වන්දනය ක්‍රියාවට නංවනු ඇතැයි (22:94) අල්කුර්ආනය ගෙන හැර දැක්වීම සැලකිය යුතු ය.

- මුස්ලිම් සමාජය අකීදාව පදනම් කොට ඇත. ඉබාදතයන් මගින් එය පිවිතුරු බවට පත් කරයි. පැහැදිළි වූ ඉස්ලාමීය චින්තනය එයට මග පෙන්වයි. ඉස්ලාමීය චින්තනය එය ක්‍රියාත්මක කරවයි. ෂරීආව හා ඉස්ලාමීය අගයන් එහි බලපැවැත්වෙයි. ශූරා යන සාකච්ඡාව එහි සුවිශේෂී ස්ථානයක් දරයි. තනි පුද්ගල ජීවිතය සම්බන්ධ විෂයයන් හෝ, පවුල් හා සමාජ විෂයයන් හෝ සම්බන්ධ කරුණු ද, දේශපාලන විෂයයන් හෝ එම සමාජයේ ශූරා මගින් තීරණය කරනු ලැබේ.

- එය සහෝදරත්ව සමාජයක්, සමාජයේ එක් එක් සාමාජිකයෙකුම අනෙක් සාමාජිකයෙකුට ආදරය දක්වමින් හැසිරෙයි. අන්‍යෝන්‍ය උපකාරයන් කර ගනිති. තම අවශ්‍යතාවයට වඩා අන් අයගේ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දෙයි. කුසල් ඇත්තා වූ කරුණුවලදී ද, තක්වාහි ද උපකාර කර ගනිති. අන්‍යෝන්‍ය කරුණාව දක්වති. ආදරය දක්වති. සාමූහික වගකීමෙන් ක්‍රියාත්මක වෙති. අන්‍යෝන්‍ය ත්‍යාගයන් ලබාදීම මගින් සමාජය වර්ධනය කර ගනිති.

- මුස්ලිම් සමූහයටම සුවිශේෂී වූ ලක්ෂණ දක්නට ලැබේ. මෙබැවින් එය නොයෙකුත් සුවිශේෂී න්‍යායන්ගෙන් ආමන්ත්‍රණය කරනු ලැබේ. එය දඃවා සමාජයක්, යහපත පැනවීමත්, අයහපත වැළැක්වීමත් ජනයාව අල්ලාහ් වෙත කැඳවීමත් එහි ප්‍රධාන කාර්යයන් වේ.

- එය මධ්‍යස්ථ (යුක්ති සහගත) සමාජයක් වේ. ඕනෑම ක්‍රියාවක දීම එය අති අන්තවාදී ස්ථාවරයක් නොගනී. ආසාවන් මැඩ පවත්වා තපස් ජීවිතයකට යොමු කළේ ද නැත. තම ආශාවන්ට අවනත වී සීමාව ඉක්මවා ක්‍රියා කිරීමට ද නොකියයි. මිනිස් ස්වභාවයන් පිළිගෙන ඒවා විඳීමට අවස්ථාව ලබා දෙයි.

- එය අරමුණක් ඇත්තා වූ සමාජයකි. අල්ලාහ්ගේ තෘප්තිය ලබා ස්වර්ගය ලබා ගැනීම එහි අරමුණයි. එබැවින් ස්වර්ගය ළඟා කර ගැනීමේ මාර්ගයන් දේශනා කරයි. නිරයට යන මාර්ගයන් වසා දමයි.

- එය කුර්ආනීය සමාජයකි. අල්කුර්ආනය එම සමාජයට මග පෙන්වයි. එය දේවත්ව සමාජයකි. වහී එයට මග පෙන්වයි. එය මනුෂ්‍යත්වයේ සමාජයකි. මිනිසාව ඔහුගේ ජීවිතය කේන්ද්‍ර කොටගෙන ක්‍රියා කරයි. එය විනීත සමාජයකි. විනීත බව වැපිරීම හා පෝෂණය එහි ලක්ෂණයක් වේ. මා යහගුණයන් සම්පූර්ණ කිරීම සඳහා එවන ලද්දේ යැයි නබි (සල්) තුමාණන් පවසා ඇත. එය අන්තර්ජාතික සමාජයකි. එයට රටක්, ජාතියක්, භාෂාවක් හා පැහැයක් වැනි වෙනස්කම් දක්නට නැත. එහි ඉගැන්වීම් පොදු ය.

- මෙලෙස මුස්ලිම් සමාජයට ආවේණික වූ සම්ප්‍රදායන් ඇත. ඒවා සහභාවරුන්ගේ කාලයේ පටන් පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන යමින් පවතී. එම සමාජය ඉෂාවට පෙර නින්දට නොයයි. සුබහ්වලට පසුව නිදානොගනියි. කලට වේලාවට නින්දට යයි. උදෑසනම අවදි වෙයි. එහි පුරුෂ, ස්ත්‍රී මිශ්‍රවීම් දක්නට නැත. මහ්රම්වරු පමණක් මිශ්‍රව සිටිති. අජ්නබී වූවන් යම් සීමාවන් සහිතව පමණක් ක්‍රියා කරති. ගමන් යෑමේ දී හා ගෙදර නැවතී සිටීමේ දී ද මේවාට අවනත වෙති. අනාචාරයේ හැසිරීමට ලංනොවන්න යන අල්කුර්ආනීය මාර්ගය ක්‍රියාත්මක කෙරෙයි. ආහාර ගැනීම, වස්ත්‍ර පැළඳීම, නිවාස තැනීම, උත්සව පැවැත්වීම හා ගති පැවතුම් ප්‍රමුඛ ක්‍රියාවල එම සම්ප්‍රදායයන් අනුගමනය කෙරෙමින් පවතී.

- සරල බව, හරාම් හලාල් රැකීම, ඥාතීන්ට සැලකීම, සලාමය පැතිරවීම, අසල්වාසීන්ට උදව් කිරීම, ත්‍යාගශීලී ව කටයුතු කිරීම, සමාජය දුබල ජනයාව මුදවා ගැනීම යන ලෙස එම සමාජය පෝෂණය කරනු ලැබේ. ශරීරයේ අවයවවලට උපමා කිරීම ක්‍රියාවට නංවනු ලැබේ.

**සහෝදරත්වය**

- ඉස්ලාමීය සහෝදරත්වය ප්‍රතිපත්ති හා සම්බන්ධ වූවකි. අප සැවොම ආදම්ගේ පරම්පරාවේ දරුවන් ය යන විශ්වාසනීය ප්‍රතිපත්තිය එක් මුස්ලිම්වරයෙකු තවත් මුස්ලිම්වරයෙකුගේ සහෝදරයෙකුය යන අල්කුර්ආනයේ හා සුන්නාහ්වේ නිශ්චයන් මෙය සනාථ කරයි.

- එක් මුස්ලිම්වරයෙකු තවත් මුස්ලිම්වරයෙකුගේ සහෝදරයා වෙයි. ඔහු අනෙකාට අපරාධයක් නොකරයි. (අපරාධකාරයින්ට) ඔහුට භාර නොකරයි. කවුරුන් තම සහෝදරයාගේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගන්නේ ද ඔහුගේ අවශ්‍යතාවයන් අල්ලාහ් සැලකිල්ලට ගනී. කවුරුන් මුස්ලිම්වරයෙකුගේ කරදරයක් ඉවත් කරයිද, ඔහුගේ කරදරවලින් එකක් අල්ලාහ් (මරණින් මතු දිවියෙදි දී) විසඳයි. කවුරුන් මුස්ලිම්වරයෙකුගේ අඩුපාඩුවක් වසං කරයිද, අල්ලාහ් මරණින් මතු දිවියෙහි දී ඔහුගේ අඩුපාඩුවක් වසං කරනු ඇත. (බුහාරි)

- තවත් හදීසයක, ඔහු තවත් මුස්ලිම්වරයෙකුට වංචා නොරකරනු ඇත. බොරු නොකියනු ඇත. උදව් නොකර අත්නොහරිනු ඇත. මුස්ලිම්වරයෙකුට තවත් මුස්ලිම්වරයෙකුගේ ගරුත්වය, වස්තුව හා රුධිරය තහනම් කර ඇත. මිනිසෙකු තම මුස්ලිම් සහෝදරයාව පහත්කොට සැලකීමම ඔහු නරක පුද්ගලයෙකු යැයි කීමට සෑහේ. (තිර්මිදි) තමන් කැමති දේම තම සහෝදරයාට ද කැමති නොවනතාක් කල් ඔබගෙන් කවරෙකු හෝ ඊමාන්ධාරියකු නොවනු ඇත (බුහාරි)

- එබැවින්, එම සහෝදරත්වය, වර්ධනය කිරීම සඳහා එක් මුස්ලිම්වරයකු තවත් මුස්ලිම්වරයකුට ඉටුකළ යුතු වගකීම් හයක් පිළිබඳ ව නබි තුමාණන් අවධාරණය කර ඇත්තාහ. හමු වූ විට සලාම් කියනු මැනවි. භෝජන සංග්‍රහයකට ආරාධනා කළහොත් එහි සහභාගී වනු මැනවි. උපදෙස් බලාපොරොත්තු වුවහොත් උපදේශයන් ලබා දෙනු මැනවි. කිවිසුම් හැර අල්හම්දුල්ලාහ් යැයි කීවිට (යර්හමු කල්ලාහ් යැයි) පිළිතුරු දෙනු මැනවි. අසනීප වුවහොත් සුවදුක් විමසනු මැනවි. මරණයට පත්වුවහොත් ජනාසාව පිටුපසින් යනු මැනවි යැයි ඉතා සරල ලෙස, එහෙත් සහෝදරත්වය බලවත් කිරීමට හැකි ක්‍රමවේදයන් පෙන්වා දුන්නෝය. සකාත්, සදකා හා හිෆත් යන්න ද සහෝදරත්වය වර්ධනය කිරීම සඳහා වූ මාර්ගයන් ලෙස දක්නට ලැබේ.

  එහෙත් ඉස්ලාමය රුධිර සම්බන්ධතා මත වූ සහෝදරත්වය ප්‍රතික්ෂේප නොකරයි. රුධිර සම්බන්ධතා ගරුකළ යුතුබව එය බලකරනවා පමණක් නොව එය බිඳ දැමීම පිළිබඳ ව අනතුරු අඟවයි.

**සමානාත්මතාවය**

- ආචාර්ය හමුදා ඉබ්දුල් අතී මහතා සමානාත්මතාවය යන වචනයට තේරුම් ලබාදෙන විට, එම වචනය එකක් තව එකක් මෙන් එකම ආකාරය ගනී යන අදහස හැර, අල්ලාහ් ඉදිරියේ සියලු දෙනාම සමානයි යන අදහස ගතයුතු යැයි පවසයි. මිනිසුන් බාහිර පෙනුමෙන් එකම ආකාරයකට සිටිය ද හැකියාවන්, සුදුසුකම්, කැමැත්ත හා අකැමැත්ත වැන්නෙහි වෙනස් වීම ස්වභාවික වේ. මේවායින් කිසිවක් කෙනෙකුගෙන් තව කෙනෙක්ව උසස් නොකරනු ඇතැයි පවසන ඔහු, මිනිස් සමූහයේ මෙම වෙනස්කම් කෙනෙක්ව තව කෙනෙකුගෙන් උසස් නොකරනු ඇතැයි පවසයි.

  ආචාර්ය හමුදාගේ අදහස පහත ආකාරයට විස්තර කරනු ලැබේ. මිනිසා එක් රටක එක් මවකගේ කුසෙහි උපන්නෙකු නොවේ. එකම ආකාරයේ පරිසරයක ජීවත් වන්නෙකු ද නොවේ. ඔහු නොයෙකුත් රටවල්වල නොයෙක් උෂ්ණත්ව මට්ටම් ඇති ප්‍රදේශවල නොයෙක් ආකාරයේ රැකියා කර තම ජීවනෝපාය ගත කරති. එබැවින්, ඔවුන් අතර ජාති, වර්ණ, භාෂා හා වර්ග

වෙනස්කම් පැවතීම ස්වාභාවික ය. ඒ සමඟම ස්වාභාවිකව ම පවතින්නා වූ ශාරීරික ස්වභාවයන්, බුද්ධිය හා හැකියාවන් වැන්නෙන් උස් පහත් යන වෙනස්කම් ඇති කිරීම ප්‍රතික්ෂේප කළ නොහැකිය. මේවායින් කිසිවක් මිනිසා සිතූ ආකාරයට නොපිහිටයි. සත්‍යය මෙසේ තිබිය දී ඒවායෙහි පදනමින් මිනිසාව වෙන්කර බැලීම සමාව දිය නොහැකි වැරැද්දකි.

- ඉස්ලාමය ලබා දෙන්නා වූ සමානාත්මතාවය පහත දක්වන්නා වූ පදනම් අඩංගු වූ ඒවා බව නිරීක්ෂණය කළ හැකිය.
  1. මිනිසුන් සියලු දෙනාවම අති උත්තම අල්ලාහ් ම මැව්වේය.
  2. මිනිසුන් සියල්ලෝම ආදම් - හව්වා දෙදෙනාගේ දරුවන් ය.
  3. අල්ලාහ් සියලු මැවීමකට ම සාධාරණව හා යුක්ති සහගතව සලකයි. ඔහු කිසිම ජාතියකට හිස නමන්නකු නොවෙයි. සියල්ල ඔහුගේ මැවීම්. ඔහුගේ ආධිපත්‍යය යටතේ ඇත්තන් ඔහුට අයත් වූවන් ය.
  4. ඕනෑම මිනිසෙකු ඉපදෙන විට හෝ මරණයට පත්වන විට හෝ කිසි දෙයක් රැගෙන එන්නන් හෝ රැගෙන යන්නන් හෝ නොවෙති. එම ආකාරයට සමානාත්මතාවයක් ඇත්තවුන් ය.
  5. අල්ලාහ් මිනිසුන්ව ඔවුනගේ ක්‍රියාකාරකම් අනුව නිශ්චය කරයි.
  6. අල්ලාහ් මිනිසාට මිනිසෙකු ලෙස උසස් ගෞරවයක් ලබා දී ඇත. ඔහු අනෙකුත් මැවීම්වලට වඩා උසස් වූවෙක්, අලංකාර වූවෙක්, උස් පහත්කම් නැත්තෙක්

- අල්කුර්ආනය හා සුන්නාහ්ව ඉස්ලාමයේ සමානාත්මතා පදනම ඉතා පැහැදිලිව ම ඉදිරිපත් කරයි. "ජනයනි, නිශ්චය වශයෙන් ම අප ඔබලාව එක් පිරිමියෙකුගෙන් හා එක් ස්ත්‍රියකගෙන් මැව්වෙමු." (49:13) යැයි ප්‍රකාශ කර සමානාත්මතාවයේ පදනම අල්කුර්ආනය ගෙන හැර දක්වයි. මෙය නබි (සල්) තුමාගේ හජ්ජතුල් විදා දේශනාව තවදුරටත් ගෙනහැර දක්වයි. " ජනයිනි, ඔබගේ දෙවියන් ඒකයෙකි. ඔබගේ ආදි පියා ආදම් ය. ඔබ සියල්ලෝම ආදම්ගේ පරම්පරාව වේ. ආදම් පස්වලින් මවන ලද්දේ ය. දැනගන්න. අරාබි ජාතිකයකු අරාබි නොවන්නෙකු මත හෝ අරාබි නොවන්නෙකු අරාබි ජාතිකයකු මත හෝ, සුදු ජාතිකයකු කළු ජාතිකයකු මත හෝ කළු ජාතිකයකු සුදු ජාතිකයකු මත හෝ වෙනත් ඕනෑම ආකාරයක ගරුත්වයක් හෝ විශේෂත්වයක් හෝ නොමැත. නිශ්චය වශයෙන් ම ඔබගෙන් උසස් වන්නා අල්ලාහ් මත අධික බය (තක්වා) ඇත්තෙකි" යැයි සඳහන් කළෝය.

- අබුදර් (රළි) තුමා, බිලාල් (රළි) තුමා දෙස බලා කළු ජාතික පුතු ලෙස ආමන්ත්‍රණය කළ විට, තවමත්, ජාහිලිය්යතය ඉවත් වූයේ නැතැයි නබි (සල්) තමා තරයේ කියා සිටියහ. මෙය ශ්‍රවණය කළ අබුදර් (රළි) තුමාණන්, බිලාල්තුමණි, මට සමාවුව මැනවි, ඔබගේ පාදයෙන් මාගේ මුහුණ පාගා දමනු මැනවි යැයි කඳුළු සලමින් ඉල්ලා සිටියහ. මෙය, වර්ණ භේද පෙන්විය යුතු නොවන බව ගෙනහැර දක්වයි.

- එබැවින් ජාති, භාෂා, වර්ණ හා ප්‍රාදේශීය යන භේදයන් සැලකිල්ලට නොගෙන සියලු දෙනාවම සාමානාත්මතාවයෙන් සැලකිය යුතු බව ඉස්ලාමය ඉල්ලා සිටියි. සමානාත්මතාවය ඊමානයේ කොටසකි. සෑම මුස්ලිම්වරයෙක්ම අන් අය තමන්ව සමානාත්මතාවයෙන් සැලකිය යුතු බව බලාපොරොත්තු වේ. තමන් ද අන් අයව එසේ ම සලකයි.

## සමාජ සාධාරණත්වය

- ඉස්ලාමයට පෙර වූ සමාජවල සමාජ සාධාරණත්වය නොමැති බව පැහැදිළි ව දක්නට ලැබිණි. මිනිසා මිනිසාට යටත් වී ජීවත් වීමේ පරිසරයක් සම්පූර්ණයෙන් ම දක්නට ලැබිණි. ඉස්ලාමයෙහි මිනිසාගේ දුර්වලතා දන්නා අල්ලාහ්ම උසස්ම මැවීම වන මිනිසාට සමෘද්ධිමත් හා විශිෂ්ඨ ලෙස ජීවත් වීමේ මාර්ගය පෙන්වා දී ඇත. විශ්වාසවන්තයිනි, ඔබලා සාධාරණත්වයෙහි ස්ථිරවම චිල්බ සිටින්න. (ඔබලා සාක්ෂි දුන්නේ නම්, එය) ඔබට හෝ, එසේත් නොමැති නම්, ඔබගේ දෙමාපියන්ට හෝ, එසේත් නොමැති නම් (ඔබලාගේ) ළඟ නෑයින්ට හෝ විරුද්ධව පැවතිය ද අල්ලාහ් වෙනුවෙන් (සත්‍යය පමණක්) සාක්ෂි දෙනු මැනවි. . . . . (4 :135)
- සාධාරණව ක්‍රියා කරන්නන් අල්ලාහ්ගේ ආලෝකමත් වූ මිම්බර් හි සිටිනු ඇත. ඔවුන් තමන්ගේ පාලනයෙහි, පවුලෙහි හා තමන්ගේ වගකීම යටතේ සිටියවුන් මධ්‍යයෙහි සාධාරණව කටයුතු කර ඇත්තාහ. (මුස්ලිම්)
- කුර්ආනය හා සුන්නාව පැහැදිළි කර ඇති දේව නීතීන් සමෝටම පොදු වූ ඒවා ය. ඔබට පෙර සිටියවුන් විනාශව ගියේමන්ද, ඔවුන් පහත් මට්ටමේ ජනයා මත නීතිය ක්‍රියාත්මක කළහ. ඉහළ පැලැන්තිය අත්හැර දැමූහ. කාගේ අත්හි මුහම්මද්ගේ ප්‍රාණය ඇත්තේ ද ඔහු මත ශපථව මුහම්මද්ගේ දුව ෆාතිමා සොරකම් කළේ ද මම ඇයගේ අත ද කපා දමමි. (බුහාරි)
- රසූල්වරුන් සාධාරණත්වය ක්‍රියාත්මක කිරීම සඳහා ම පහළ කරන ලද්දේ ය.
- අල්කුර්ආනය සඳහන් කරයි. "නිශ්චය වශයෙන් ම අප අපගේ දූතයින්ව පැහැදිළි සාධක සමඟ යවා ඇත්තෙමු. ඔවුන් සමඟ ආගම් ද, නීතියෙහි (සාධාරණත්වයෙහි) මිනුම් තරාදිය ද මිනිසුන් සාධාරණව ජීවත්වීම උදෙසා පහළ කළෙමු" (57:25)
- අල්ලාහ් මිනිසුන්ට අබමල් රේණුවක පවා හානියක් නොකරයි. නිශ්චය වශයෙන් ම අල්ලාහ් මිනිසුන්ට අබමල් රේණුවක පවා හානියක් නොකරයි. එහෙත් මිනිසුන් (හානි සිදු කරමින්) තමන් තමන්ටම හානි පමුණුවා ගනිති. (10:44)
- මාගේ අනුගාමිකයිනි, මම අසාධාරණය කිරීම මට හරාම් කර ඇත්තෙමි. ඔබලා ද කෙනෙකු තව කෙනෙකුට අසාධාරණ නොකරන්න. (මුස්ලිම්)
- නිශ්චය වශයෙන් ම අල්ලාහ්, කිසිවෙකුට ඔවුනගේ පාපයන්ට අධික දඬුවම් ලබා දී අබමල් රේණුවක හෝ අපරාධ නොකරයි. එහෙත් (අබමල් රේණුවක පමණ හෝ) කුසල් ඇත්නම් (පවා) එය දෙගුණ කර තම කරුණාව නිසා (පසුව එයට) ඉතා අධික ආනිසංස ලබා දෙයි. (4:40)
- මේ සියල්ලම අල්ලාහ් ද ඔහුගේ දූතයා ද තමන් යුක්ති ගරුකව ක්‍රියාකර, මිනිස් සමාජය ද යුක්ති ගරුකව ක්‍රියාත්මක විය යුතු යැයි දන්වා සිටියි.

## ඉස්ලාමය අවධාරණය කරන්නා වූ සමාජ සාධාරණත්වය

- සම්පත් බෙදා දීම
- සමාජයේ සියලුම සාමාජිකයින්ට සමාන වූ අවස්ථා ලබාදීම
- බලතල ඇත්තන් සේවකයින්ට ඔවුන්ගේ සේවයට අදාළ වේතනය සුදුසු වේලාවෙහි දී ලබාදිය යුතුය. ඔවුන් සූරා නොකෑ යුතුය.

- දුප්පත්කමින් පීඩිත වූවන්ගේ තත්ත්වය දියුණු කිරීම සඳහා ධනවතුන් හා සේවා යෝජකයින් සාධාරණව කටයුතු කිරීම.

- මෙම විෂයයෙහි ඉස්ලාමය මක්කා කාලසීමාවේ සිට අවධානය යොමුකර තිබීම හා එයට විශේෂ ස්ථානයක් ලබා දී තිබීම ද සඳහන් කළ හැකිය.

  දුප්පතුන්ට ආහාර ලබා නොදෙන්නා නිරයේ සිටිනු ඇතැයි අවවාද කිරීම. "එයට ඔවුන්, අප වන්දනාමාන කරන්නන් අතර නොවෙමු. අප දුප්පතුන්ට ආහාර ලබා නොදුන්නෙමු." (84:3-4)

  (නබි තුමණි, අවසන් දිනයේ) විනිශ්චය බොරු කරන්නන්ව ඔබ (සැලකිල්ලෙන්) බැලුවෙහි ද? (යනඑන මං නැති) අනාථයින් එළවන්නා ඔහුය. ඔහු දුප්පතුනට (ආහාර ලබා නොදෙන අතර) ආහාර ලබාදෙන ලෙස (අන් අය) උනන්දු කරවන්නේ ද නැත. (107:1-3)

**විරුද්ධවාදීන් හා සාධාරණත්වය**

- අල්කුර්ආනය යුක්තිය ඉටුකිරීමේ දී තම විරුද්ධවාදීන් සමඟ ද යුක්තිගරුකව ක්‍රියා කරන ලෙස නියෝග කරයි. විශ්වාසවන්තයිනි, නීතිය ස්ථාපනය කිරීමේ දී අල්ලාහ් වෙනුවෙන් ඔබලා ස්ථිර වූ සාක්ෂීන් ලෙස සිටින්න. මිනිසුන්ගෙන් එක් කොටසක් මත (ඔබලා තුළ) ඇති ද්වේශය, (ඔවුනට) අයුක්තියක් හෝ කිරීමට ඔබව නො පොළඹත්වා (කොපමණ ක්‍රෝධයක් තිබුණ ද) ඔබ නීතිය ක්‍රියාත්මක කරන්න. එය වනාහි පිවිතුරු භාවයට ඉතාමත් ආසන්න වූවකි. (ඕනෑම අවස්ථාවක දී) ඔබ අල්ලාහ්ටම බිය වන්න. නිශ්චය වශයෙන් ම අල්ලාහ් ඔබ කරන්නා වූ දෑ හොඳින් දන්නා වේ. (5:8) එනම් ඕනෑම සමාජයක් මත ඔබට ඇත්තාවූ අකමැත්ත හෝ විරුද්ධත්වය හෝ ඔවුන් හා යුක්තිගරුකව ක්‍රියා කිරීමෙන් ඔබව වැලැක්විය යුතු නොවන බව ඉස්ලාමය බලාපොරොත්තු වෙයි.

**පවුලේ සාමාජිකයින් සමඟ යුක්තිගරුකව කටයුතු කිරීම**

- ඉස්ලාම් මිනිසුන් අතර ඇති සම්බන්ධතා ඒවායෙහි තරාතිරම ද සම්පූර්ණයෙන්ම සැලකිල්ලට ගනී. එයට අනුකූලව ඔවුනොවුන්ගේ අයිතිවාසිකම් ද, ඔවුන් සමඟ යුක්තිගරුකව කටයුතු කළ යුතු ය යන්න ද නිර්ණය කරයි. ලේ ඥාතීන්, කවුරුන්දෝ ඔවුන් හා පමණක් යුක්තිගරුකව කටයුතු නොකර, කිසිදු සබඳකමක් නැති ජනයා සමඟ ද ඔහු යුක්තිගරුකව කටයුතු කළ යුතු යැයි බලාපොරොත්තු වෙයි.

- මව හා පියා යන දෙදෙනා සැලකූ විට මොවුන්ගේ විෂයයෙහි ඉතාමත් ම යුක්තිගරුකව කටයුතු කරන ලෙස ඉල්ලා ඇත. "මව්පියන් සමඟ හොඳ ආකාරයට කරුණාවෙන් කටයුතු කරන්න." (4:36)

- මිනිසාට ඉතා අධික ලෙස විශාල උපකාරයන් කර ඇත්තේ අල්ලාහ් ය. ඊට පසුව දෙමාපියන්ගේ උපකාරයන් පවතී. මිනිසෙකුගේ සෑම කාර්යයක දී ම දෙමාපියන්ගේ දායකත්වය ඉතා අධික වේ. ඔවුන්ගේ දායකත්වය නැති විට ඔහුට උසස් දියුණුවක් ලබාගත නොහැක. ඔවුනගේ ත්‍යාගශීලීත්වයට සම කළ හැකි දෙයක් මිනිස් සමාජයෙහි දක්නට නැත. ඔවුන් කරන්නා වූ විශාල උපකාරයන් හි අල්ලාහ්ගේ අතිවිශාල උපකාරයන්ගේ පිළිබිඹුව දක්නට ලැබේ. අල්ලාහ් නැමද පිළිපැදීම ඔහුට කරන්නා වූ ස්තූතියකි. දෙමාපියන් සැලකීමේ දී ඔවුන් හා යුක්තිගරුකව ආදර භක්තියෙන් කටයුතු කිරීම ඔවුනට කරන්නා වූ මහත් උපකාරයකි. අල්කුර්ආනයේ මටත් ස්තුති කරනු මැනවි, ඔබගේ දෙමාපියන්ට ද ස්තුති කරනු මැනවි. මා වෙතම නැවත පැමිණිය යුතුව ඇත. (31 :14)

- එබැවින් දෙමාපියන්ගේ විෂයයෙහි දී සමාජ යුක්තිගරුක භාවය යන පදනමෙහි ඉතා සැලකිලිමත් විය යුතුය. මේ සමඟම නෑදෑයින් සමඟ, යුක්තිගරුකව කටයුතු කිරීම දැඩි ව අවධාරණය කර සඳහන් කර තිබීම සැලකිල්ලට ගත යුතුව ඇත.

**ස්වාමිපුරුෂයා හා බිරිඳ අතර යුක්තිගරුක භාවය**

- ස්වාමිපුරුෂයා හා බිරිඳ යන දෙදෙනා අන්‍යොන්‍ය ලෙස කෙනෙකු අනෙකාට යුක්ති ගරුකව කටයුතු කළ යුතු ය යන දැඩි නියෝග කුර්ආනය හා හදීසය ලබා දී ඇත. (අල්බකරා : 228)

- රසූල් (සල්) තුමාණන් අවසන් හජ්හි දී පිරිමින් ස්ත්‍රීන්ට ඉටුකළ යුතු යුතුකම් ද, ස්ත්‍රීන් පිරිමින්ට ඉටුකළ යුතු යුතුකම් ද තිබේ යැයි සඳහන් කිරීම දැකගත හැකි ය. විශ්වාසවන්තව කටයුතු කිරීම, ආදරය හා මනා හැසිරීමක් ඇති ව කටයුතු කිරීම වැනි දෑ පිළිබඳ ව මෙහි අවධාරණයෙන් සටහන් කර ඇත.

- තවද භාර්යාව විෂයයෙහි ස්වාමිපුරුෂයා හා සම්බන්ධ යුක්ති සහගත භාවය ලෙස ඇය හා හොඳින් කටයුතු කිරීම, ඇයට ආහාර, ඇඳුම් පැළඳුම් හා වාසස්ථාන වැනි දෑ ලබාදීම ද, ඇයගේ ක්‍රියාකලාපයෙහි අතෘප්තිමත් වන්නේ නම් කුර්ආනයේ හා සුන්නාහ්වේ අණට අනුව කටයුතු කිරීම ද වේ. රසූල් (සල්) තුමාණන් ප්‍රකාශ කළ බවට මුආවියා (රළි තුමාණන් සඳහන් කළහ. මම නබි (සල්) තුමාගෙන් භාර්යාවකට තම ස්වාමියා වෙත කුමන අයිතිවාසිකම් ඇත්තේ දැයි විචාලෙමි. නබි (සල්) තුමාණන් මෙසේ පැවසූහ. "ඔබ ආහාර අනුභව කරන විට ඇයට ද අනුභව කිරීමට සලස්වන්න. වස්ත්‍ර මිලයට ගන්නා විට ඇයට ද වස්ත්‍ර මිලයට ගෙන දෙන්න. ඇයගේ මුහුණට නොගසන්න. ඇයට ශාප නොකරන්න. ඇය හා ඇති සම්බන්ධය නතර කර දැමීමට අවශ්‍ය වුවහොත් ගෙදරදී පමණක් එම සම්බන්ධය නතර කරගන්න. මේවා ඔබගේ භාර්යාවට ඇති වගකීම් ය." (අබූ දාවුද්)

- මෙහි භාර්යාව සම්බන්ධ යුක්ති ගරුක භාවයන් සඳහන් කරන සේ ම භාර්යාව පුරුෂයා විෂයයෙහි ද යුක්ති ගරුක ව කටයුතු කළ යුතුය. අල්ලාහ්ට විරුද්ධ නොවන්නා වූ ක්‍රියාවල දී ඔහුට අවනත වීම, ඔහුගේ ගෞරවය ආරක්ෂා කර ඒ සඳහා ක්‍රියාත්මක වීම, ඔහුගේ දරුවන්, වස්තු හා ගෙය ආරක්ෂා කිරීම, ඔහුගේ අනුමැතිය නොමැතිව ගෙයින් පිටවී නොයාම, බැල්ම පහත් කර ගැනීම, ශබ්දය පහත් කර ගැනීම, කට පරිස්සම් කර ගැනීම, ඔහුගේ නෑයින් සමඟ යුක්ති ගරුකව ආශ්‍රය කිරීම වැනි දේ මෙහි අඩංගු වේ. රසූල් (සල්) තුමා පැවසූහ. "යම් ස්ත්‍රියක් පස්වේල් සලාතය ඉටුකර, රමලාන් මාසයේ උපවාසය ඉටු කරන්නීය. තවද තම පතිවත ආරක්ෂා කර ස්වාමි පුරුෂයාට අවනතව හැසිරෙයි. මෙලෙස කටයුතු කරන්නේ නම්, ඇය ස්වර්ගයෙහි දොරටුවලින් කුමන දොරටුවට කැමැත්තදක්වන්නී ද ඒ මාර්ගයෙන් ස්වර්ගයට පිවිසෙන්නීය." (මිෂ්කාත්)

- මෙලෙස අල්කුර්ආනය හා හදීසය ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර යුක්ති සහගත භාවයෙන් කටයුතු කිරීම පිළිබඳව අවධාරණය කර ඇත. ඒ සමඟම දරුවන්ගේ විෂයයන් ද සඳහන් කර ඇති බව සැලකිල්ලට ගත යුතු ය.

**බෙලහීනවූවන් සමඟ යුක්තිගරුක බව**

- ජාහිලීයිය සමාජයේ බෙලහීනයන් යටපත් කර කොන් කරනු ලැබූහ. ඒ සමගම අල්කුර්ආනය යුක්ති සහගතව කටයුතු කරන්නන්ට අතිමහත් ආනිශංස ඇතැයි සඳහන් කරයි. කුසගින්නෙන් පසුවන්නන් සෑමකෙනාටම ආහාර ලබාදෙන්න. රෝගීන් සියළු දෙනාටම නිවාරණය ලබා දෙන්න. ඇඳුම් නොමැති සෑම දෙනාටම ඇඳුම් ලබා දෙන්න. අවශ්‍යතා ඇත්තන්ට අවශ්‍ය ප්‍රමාණයට පහසුකම් සලසා දෙන්නැයි එය අණ කරයි. ආහාර, ඇඳුම්, නිවාස හා ඔවුනට අවශ්‍ය වන දේ අපතේ නොයවා අවශ්‍ය පුද්ගලයින්ට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට සකසා දිය යුතු යැයි සඳහන් කර ඇත. (ඉමාම් නවවිගේ අල් මජ්මූඃ හි)

**ආර්ථිකමය යුක්තිගරුකභාවය**

- සමාජයෙහි ආර්ථික දුෂ්කරතාවලින් පීඩිතවූවන්ට ද්‍රව්‍යමය උපකාරයන් ඉතාමත් ම අවශ්‍ය වන්නේ ය. කරුණාවන්ත, සහයෝගී, ස්නේහී වදන්වලින් එම අවස්ථාවේ දී අවශ්‍ය නම් යම් සිත් සැනසුමක් හා ශාන්තියක් ලැබෙනවා හැරෙන්න එම වදන්වලින් ඔවුනගේ ගැටලු සමථයකට පත් නොවේ.

- පොදුවේ අල්කුර්ආන් සකාතය සමඟ වන්දනය හා දේව මාර්ගයෙහි වියදම් කිරීම සම්බන්ධ කර ප්‍රකාශ කර තිබීම ආර්ථිකමය යුක්තිගරුක බව පවත්වා ගත යුතුය යන්නට සාක්ෂියක් වේ. අල්ලාහ්ව මෙනෙහි කරන්නා වූ ඕනෑම පුද්ගලයකු මෙම කරුණෙහි දී නොසැලකිලිමත් ව සිටිය යුතු නොවේ ය යන්න මෙය පෙන්වා දෙයි. අල්කුර්ආනයේ ඔවුනගේ වස්තුවෙහි යාචකයින්ට ද, දුප්පතුන්ට ද උරුමයක් තිබුණේය. (51 : 19)

- ඔවුන්ගේ වස්තුවෙහි නිර්ණය කරන ලද උරුමයන් ඇත්තේ ය. (70 : 24-25)

- වස්තුව බෙදීමේ යුක්තිසහගත භාවය ක්‍රියාත්මක කිරීමට ඉස්ලාම් නොයෙකුත් ක්‍රමවේදයන් තබා ඇත්තේ ය.
  1. උරුමක්කරුවන්ගේ වස්තුව බෙදීම
  2. සකාත්, සදකා, හිබත්
  3. පොදු සුබසිද්ධියෙහි පැවැත්ම සඳහා වස්තු මත රජය බදු පැනවීම

- ධනය මිනිසුන් අතර යුක්ති සහගතව බෙදාහැරීම සඳහා ඉස්ලාමය ඉදිරිපත් කරන්නා වූ මෙම ක්‍රමයන් අනිවාර්ය වන්නා වූ ඒවා වේ.

- ධනය එක් ස්ථානයක රැස් ව වර්ධනය වීම කෙරෙහි ඉස්ලාමය කැමැත්තක් නොදක්වයි. සමාජයේ ද, ජනයාගේ ද, සුබසිද්ධිය සැලකිල්ලට ගෙන ධනයෙන් එක් කොටසක් කිරීමට පාලකයාට බලය ලබා දෙයි. දුප්පතුන්ගේ හා දුගීන්ගේ තත්ත්වය ඉහළ නංවයි. ධනය ධනවතුන් හා දුප්පතුන් අතර දෝලනය වීමට හරි. එය ධනවතුන්හි අතෙහි පමණක් රැඳී පැවැත්මට ඉඩ නොහැරී ඔබගෙන් ධනවතුන් අතර පමණක් නොගැවසීමට (මෙලෙස අණ කරයි) (59:7)

**සාමූහික වගකීම**

- රසූල් (සල්) තුමාණන් සඳහන් කළහ. "මිනිස් කුලය, සම්පූර්ණයෙන් ම අල්ලාහ්ගේ පවුල වෙයි. මිනිස් කුලයට වැඩි යහපත සිදු කරන්නා අල්ලාහ්ගේ අධික ආදරයට පාත්‍ර වූ පුද්ගලයා වන්නේය." (මිෂ්කාත්)

- සෑම, තනි පුද්ගලයෙකුටම දුක හා කම්කටොලු ඇති විට කිසිවෙකුගේ උදව් නොමැතිව තනිවම හිඳ ශෝකවීමට ඉඩ නොහැරිය යුතුය. ඔහුගේ දුක් කම්කටොලු හැකිතාක් දුරට අන් අය විසින් දැන හැකිතාක් දුරට ඒවා ඉවත් කිරීමට උත්සාහ කළ යුතු යැයි බලාපොරොත්තු වේ.

- රසූල් (සල්) තුමාණන් සඳහන් කළහ. "කවුරුන් මිනිසුන් වෙත කරුණාව නොදක්වන්නේ ද එවැන්නෙකුට අල්ලාහ් කරුණාව නොදක්වයි." (බුහාරි)

- ඉස්ලාමය තනි පුද්ගලයින්ගේ වැදගත්කම අඩු කළේ ද නැත. පවුල නොසලකා හැරියේ ද නැත. ඒ සමඟම ඔහු කුමන සමාජයක අංගයක් ද, එහි උරුමය වෙනුවෙන් උත්සාහ දැරීම ද ඔහුගේ යුතුකම වේ. ඉස්ලාමය ඔහු තුළ මෙම හැඟීම ඇති කරයි. එම සමාජය නිර්මාණාත්මක වර්ධනය කිරීමට උත්සුක වීමත් එම සමාජයට කරන්නා වූ සේවාවකි.

- ඉස්ලාමය පිළිගත් සියලු දෙනාම උම්මතයක් යන අරමුණක් ඇති කණ්ඩායමකි. ඔවුන් අතර දේවධර්මය පදනම් වූ සහෝදරත්වය දක්නට ලැබේ. රුධිර බන්ධන නොතිබුණ ද ඔවුන් කෙනෙකු තව කෙනෙකුට සහෝදරයෙකි. ඔවුනගේ උරුමයන් ඔවුන්ගෙන් උදුරාගත නොහැකිය. යහපත බලාපොරොත්තුව, ආදරය, දයාව, හදිසි අවස්ථාවක සේවාවන්, විපතක දී උදව් කිරීම, අනුකම්පාව ඇතිව කටයුතු කිරීම යන සියල්ලම මෙහි අන්තර්ගත ය.

- නබි වදනක මෙහි ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව විස්තර කෙරෙයි. නබි (සල්) තුමාණන් දන්වා සිටියහ. දේව විශ්වාසිකයෙකුට ලොවෙහි ඇතිවන්නා වූ දුකින් ඕනෑම දුකක් කවුරුන් ඉවත් කරන්නේ ද අල්ලාහ් අවසන් දිනයෙහි දී ඔහුට ඇතිවන්නා වූ කරදරවලින් එකක් ඉවත් කරන්නේ ය. දුකෙහි වෙළී ශෝක වන්නා වූ පුද්ගලයෙක් එයින් මුදවා ගැනීමට කවුරුන් උපකාර කරන්නේ ද මෙලොව හා පරලොව ඔහුට ඇතිවන්නා වූ කරදරවලින් ඔහුව මුදවා ගැනීමට අල්ලාහ් කටයුතු කරයි. මුස්ලිම්වරයෙකුගේ වැරදි හා අඩුපාඩු යමෙකු වසන් කරන්නේ නම්, ඔහුගේ වැරදි සහ අඩුපාඩු මෙලොවෙහි ද, පරලොවෙහි ද අල්ලාහ් වසන් කරයි. ඇත්තෙකු තම සහෝදරයෙකුට උදව් කිරීමෙහි යෙදී සිටින තාක් අල්ලාහ් ද ඔහුට උදව් කරමින් සිටින්නේ ය. (මුස්ලිම්)

- මෙම හදීස් එක් මුස්ලිමෙකුගේ කටයුතුවල දී සාමූහිකව ක්‍රියා කිරීමේ වැදගත්කම විස්තර කරයි. දේව විශ්වාසය ඇත්තවුන් එකිනෙකා සම්බන්ධව එක් ශරීරයක් ලෙස පැවතිය යුතුයි. එම ශරීරයෙහි එක් අවයවයක් දුකට පත්වන්නේ ද, මුළු ශරීරයම එය දැන එය ඉවත් කිරීමට උත්සාහ ගනී. එවැනි තත්ත්වයක් ඇතිව මෙම සමාජය ක්‍රියාකළ යුතු බව ඉස්ලාමයේ කැමැත්ත වේ. තවද ඉස්ලාමය අන්‍යොන්‍ය සහයෝගය මත ද සාමූහික වගකීම මත ද සමාජය ගොඩනගයි.

- සාමාන්‍ය පුද්ගලයෙකුව සැලකිල්ලට ගත් කළ ඔහු තම පවුලේ සාමාජිකයින් වන දෙමාපියන්, අඹු දරුවන්, සහෝදරයින් හා නෑදෑයින්ගේ විෂයයෙහි සාමූහික වගකීම් ඉටු කිරීමෙහි වගකීම් දරන්නේ ය. මොවුන් මත වූ වගකීම් ලෙස ඔවුන්ට යහපත යොමුකර අයහපත වළක්වා, යහමාර්ගය පෙන්වා දිය යුතු වගකීම දරන්නේය. තම දරුවන් විෂයයෙහි ඔවුන් හොඳ හැදියාවන් හා සාරධර්ම ඇත්තන් ලෙස හදාවඩා ගත යුතු වගකීම ද දරන්නේ ය.

**සාමූහික වගකීම ඉටුකිරීම සඳහා වූ ක්‍රමවේදයන්**

- පවුලට හා නෑදෑයින්ට වියදම් කිරීම.

  පහසුකම් ඇත්තන් තම පවුලට ද පහසුකම් නොමැති නෑදෑයින්ට ද ඔවුන්ගේ ලේ නෑයින් නිසා ද, තම වගකීම නිසා ද මෙය ඉටු කළ යුතුය. අල්කුර්ආනය මේ පිළිබඳ ව පවසා ඇත්ත නම්, නෑදෑයින්ටත්, දුප්පතුන්ටත්, මඟීන්ටත්, ඔවුනොවුන්ගේ කොටස ලබා දෙනු මැනව. (17 : 26) සාමූහික වගකීම් පර්වු කිංගාෂාව, සමාජ කටයුතු ආදිය ඉටු කිරීම.

**සකාත් වගකීම**

- සකාත්, සදකා, ත්‍යාගයන්, වක්ෆ්, වසියියත්, උල්හියියා හා අකීකා වැනි දේ නිසි ලෙස සම්පූර්ණ කිරීම මගින් ද සමාජය වෙනුවෙන් සාමූහික වගකීම ඉටුකළ හැකි ය.

- මිනිසුන් මධ්‍යයෙහි සාමය ඇති කිරීම

  මිනිසුන් මධ්‍යයෙහි අන්‍යොන්‍යව ඇතිවන්නා වූ විරෝධතා හි දී සාමය ඇති කිරීම සාමූහික වගකීමකි. දෙදෙනෙකු අතර වන විරුද්ධත්වය විරුද්ධවාදීන් කිහිප දෙනෙකු අතර වෛරයක් වී එය ක්‍රෝධය හා තරගකාරීත්වයක් ඇති කර ලේ සලමින් යුද්ධ කිරීමේ තත්ත්වයකට යා හැකි හෙයින් අල්කුර්ආනය මෙය අවධාරනය කර ඇත. විශ්වාසවන්තයින් (සියලු දෙනා) නිශ්චය වශයෙන් ම සහෝදරවරුන් ය. එබැවින් ඔබගේ සහෝදරවරුන් අතර (විනය හා සාමය ස්ථාපනය කර) සමූහයක් ලෙස සිටින්න. (මෙහි) අල්ලාහ්ට බියව ජීවත්වන්න. (මෙමගින්) ඔහුගේ කරුණාව ලබාගත හැක.

- කෙනෙකු තව කෙනෙකුට අන්‍යොන්‍යව උදව් කිරීම, නම්‍යශීලී වීම, සුබ පැතීම, අධ්‍යාපනය ලබාදීම, ණයට දීම, ව්‍යාපාරයෙහි කොටස්කරුවෙක් කර ගැනීම, කෘෂිකර්මයෙහි කොටස්කරුවකු වීම හා උපදෙස් ලබා දීම, හොඳ දේ වෙත යොමු කිරීම, වැරදි දේ වැලැක්වීම වැනි දෑ මෙහි අඩංගු වේ.

**නායකත්වය**

- අරාබි භාෂාවෙන් අක්කියාදා යන පද ව්‍යවහාරය, නායකත්වය යන අර්ථයන් යෙදෙනුදක්නට ලැබේ. ව්‍යවහාරයේ අල්-කියදත් යන්න මිනිස් ලක්ෂණ/ස්වභාවය සමඟ එක්ව යන, මිනිස් හැසිරීමෙහි බලපෑම් ඇති කරන්නා වූ, නිශ්චිත වූ ඉලක්කය වෙත මඟ පෙන්වන්නා වූ, කලාවක් විස්තර කෙරේ.

- තවද නායකත්වය යන්න බලපෑම්වලින් තොර ක්‍රම හරහා ජනයා කටයුතු කිරීමට පෙළෙඹවීම මගින් ඔවුන්ව නියමිත දිශාවකට යොමු කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස ද සඳහන් කළ හැක.

**නායකත්වයේ අවශ්‍යතාව**

- විශ්වාසවන්තයිනි, ඔබලා අල්ලාහ්ට අවනතවන්න. එලෙසම අල්ලාහ්ගේ දූතයාට ද, ඔබගේ නායකයාට ද අවනත වන්න.

- විශ්වාසවන්තයිනි, ඔබ අතර ඕනෑම කරුණක් සම්බන්ධව අසම්මුතියක් ඇති වුවහොත් එය අල්ලාහ් වෙත හා ඔහුගේ දූතයා වෙතට බාර කරන්න. සත්‍ය වශයෙන් ම ඔබ අල්ලාහ් හා අවසන් දිනය විශ්වාස කරන්නන් වන්නේ නම් ඔවුන්ගේ තීන්දුව ඔබලා තෘප්තිමත් ව බාරගනු ඇත. මෙය යහපත් වූ ද ඉතාමත් අලංකාර වූ ද තීරණය වනු ඇත. (4:59)

- තනිව කටයුතු කිරීමත්, වෙන් ව ජීවත් වීමත්, හෙළා දකින ඉස්ලාමය සමූහයක් ලෙස ජීවත් වීමට නායකත්වයක් අවශ්‍ය බව අවධාරණය කරයි.

- පැහැදිළි සාක්ෂි ඉදිරිපත් වීමෙන් පසුව ද, මතභේද ඇති වී වෙන් ව සිටියවුන් ලෙස නොඉඳින්න. ඔවුනට සමහර මුහුණු අඳුරු වී ද, සමහර මුහුණු සුදුමැළි වී ද, යන දිනයෙහි දැඩි වූ වේදනාවන් දක්නට ලැබෙනු ඇත. (3:105-106)

- ඔබලාගෙන් තිදෙනෙකු ගමනක් ගිය ද ඉන් කෙනෙක්ව නායකයකු ලෙස පත්කරගන්න. (බුහාරි)

- උමර් (රළි) තුමාණන් පැවසූහ :" නායකත්වයක් නොමැතිව සාමූහිකත්වයක් නැත. යටහත් වීමක් නොමැතිව නායකත්වයක් නොමැත." (තාරමී)

- නබි (සල්) තුමාණන් පැවසූහ : අත් පා ඉවත් කරනු ලැබූ වහලෙක් ව ඔබට නායකයකු ලෙස පත් කර, ඔහු අල්කුර්ආනය මගින් ඔබව පාලනය කරන්නේ නම් ඔබ ඔහුට අවනත වන්න.

- හොඳ නායකත්වයකට ජනයා නියමිත දිශාවෙහි යොමු කිරීමේ හැකියාව සතු වනු ඇත. එම දිශාව වනාහි ඉස්ලාමය ජාත්‍යන්තරව ප්‍රචාරය කිරීම වැනි පොදු ලක්ෂණයන් අඩංගු වන සේ විය හැකිය. එසේත් නොමැති නම්, සැලකිය යුතු යම් කරුණක් සම්බන්ධව සම්මේලනයක් පවත්වන ආකාරයේ විශේෂ ලක්ෂණයක් ඇත්තක් සේ විය හැකිය. කෙසේ වෙතත් ක්‍රියාවට නංවන්නා වූ ක්‍රමවේදයන්, ලබා ගැනීමට බලාපොරොත්තු වන්නා වූ ප්‍රතිඵලයනුත්, සම්බන්ධ වන්නා වූ ජනයාගේ සුබසිද්ධියට දීර්ඝ කාලීන ආධාරකයක් සේ පැවතිය යුතුයි.

- ඉහත සඳහන් කළ අල්කුර්ආන් වාක්‍යයන් හා හදීසයන් මුස්ලිම්වරුන් තමන්ගේ ක්‍රියා කලාපයන් නියමාකාරව සිදුවීම සඳහා තමන් ගෙන් නායකත්වයක් ඇතිකර ගන්නා ලෙසත්, එළෙස නායකත්වයක් පහළ වන විට එයට අවනත වන ලෙසත්, නායකත්වයට අවනතවීම වනාහී අල්ලාහ් හා රසූල්ට අවනත ව කටයුතු කිරීමට දෙවැනි ව ඇති මට්ටමෙහි පවතින බව ද සඳහන් කරයි.

**නායකත්වයෙහි විශේෂත්වය**

- මිනිසා සමාජය සමඟ එක් ව ජීවත්වන ස්වභාවයෙන් මවා ඇත්තේ ය. සමාජයක් නොමැතිව තනිව ජීවත් වීම ඔහුට දුෂ්කර වෙයි. එබැවින් මිනිසාට ලබාදෙන්නා වූ ඉතාමත් ම කෲර වූ හිංසනය ඔහුට හුදකලාව සිරගත කිරීම යැයි බුද්ධිමතුන් පවසා ඇත්තාහ. මේ ආකාරයට ශරීරයෙහි ඇති එක් අවයවයක් තවත් අවයවයක අවශ්‍යතාවය බලාපොරොත්තුව ඇති සේ මිනිසා තවත් මිනිසෙකුගෙන් අවශ්‍යතා ඇත්තෙකු ලෙස සිටින්නේ ය. මෙලෙස මිනිසුන් අතර වූ සම්බන්ධතා අධික වන විට නායකත්වයක් අවශ්‍යය. එසේ නොවන්නේ නම් හොඳ විනයානුකූල සමාජයක් ලෙස, සමාජ සංස්ථාවක් ලෙස එය නොපවතිනු ඇත.

- සමාජයෙහි නායකත්වය යන්න සිරුරෙහි සිරස වැනි ය. සමාජයේ ඉලක්කයන් එහි ක්‍රියාකාරීත්වයන් යන්න නායකත්වයම තීරණය කරනු ඇත. එය බලවත්ව හා සෝදිසියෙන් සිටින විට සමාජයම බලවත් වේ. එය බෙලහීන වන විට සමාජය ද බෙලහීන වී බිඳවැටීමට ලක් වේ.

- ඉස්ලාමයේ දෘෂ්ටිකෝණයෙහි නායකත්වය යන්න ලෙහෙසි පහසු කාර්යයක් නොවෙයි. එහි ක්‍රියාකාරකම් පැතිරෙන්නා වූ සියලු අවස්ථාවලදී ම එහි වගකීම් ද වර්ධනය වේ. මන්ද යත්, ඔබලා සියලු දෙනාම පාලකයන් ය, ඔබලාගෙන් හැම දෙනෙකුම ඔහුගේ පාලනය පිළිබඳ ව විචාරනු ලබන්නේ ය. ඉමාම් පාලකයෙකි. ඔහු තමන්ගේ පාලනය පිළිබඳ ව විචාරනු ලබන්නේ ය (බුහාරි) යන හදීස් මෙම වගකීමෙහි බරපතල බව අවධාරණය කරයි. තවද මෙය අති මහත් වූ පීඩාකාරී අමානතයක් යන්න තවත් නබි (සල්) වදනක් මගින් අපට වටහා ගත හැකිය. අබූදර් අල්කිෆාරි (රලි) තුමාණන්, නබි (සල්) තුමාගෙන් නායකත්ව පදවියක් ඉල්ලූ විට නබි(සල්) තුමාණන් දුන් පිළිතුර මෙය අවධාරණය කරයි. අබූදර් තුමනි, ඔබ බෙලහීනයකි. නිශ්චය වශයෙන් ම එය අමානතයක් ය. එය කෙනෙකු සුදුසුකම් නොමැති විට භාරගෙන එහි වගකීම් නිසිලෙස ඉටු කිරීමට අපොහොසත් වුවහොත් එය අවසාන දිනයේ දී නිගාව හා කරදර ඇති කරයි. (මුස්ලිම්)
- මෙලෙස නායකයා තේරීම ද අමානතයක් වෙයි. මක්නිසා ද යත් සුදුසු පුද්ගලයා සුදුසු ස්ථානය නොතැබුවේ නම්, අමානතය සම්පූර්ණ වූයේ නැතැයි යන්න අර්ථය වේ. විශ්වාසවන්තයිනි, ඔබලා වෙත ලබා දෙන ලද අමානතයන් ඒවායෙහි අයිතිකරුවන්ට නැවත ලබාදිය යුතු බව නිශ්චය වශයෙන් ම අල්ලාහ් ඔබට අණකර ඇත. (4 :59) යන අල්කුර්ආන් වදන මෙය තේරුම් කර දෙන්නේය.
- කවුරුන් සුදුස්සෙකු තෝරා පත්කර ගැනීමේ ක්‍රියාවලියෙහි දී නිශ්ශබ්දව හිඳ තම අදහස ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින්නේ ද ඔහු සාක්ෂීන් වසං කළ පුද්ගලයෙකු යන ලැයිස්තුවට එක්වන්නේය. මේ පිළිබඳ අල්ලාහ් අනතුරු අඟවා පහත ලෙස හන් කරන්නේය. ඔබ සාක්ෂීන් වසන් නොකරනු, කවරෙකු හෝ එරය වසං කරන්නේ ද, ඔහුගේ හදවත නිශ්චය වශයෙන් ම පාපයට ලක්වන්නේය. ඔබ කරන්නා වූ සියල්ලම අල්ලාහ් හොඳින් දනී. (2:283)

**නායකත්වයට අවනත වීම**

- නායකත්වය නියමාකාරයට සිදුවිය යුතු නම්, එම නායකත්වයට අදාළ අයිතිවාසිකම් අනුගමනය කළ යුතු වෙයි. එනම්, නායකත්වයට එයට යටත් වන්නන් අවනතව කටයුතු කළයුතු වන්නේය. මෙයට ආධාරකයක් ලෙස අල්කුර්ආන් වාක්‍යයන් හා නබි (සල්) තුමාණන්ගේ හදීසයන් පවතින බව දක්නට හැකිය.

  විශ්වාසවන්තයිනි, අල්ලාහ්ට අනුගමනය කර අවනත වී කටයුතු කරන්න. එසේම ඔබගේ දූතයාණන්ට ද නායකයින්ට ද අවනත වන්න. (4:59) යන අල්කුර්ආන් වැකිය ද ඔබලා අතර හබෂි රටෙහි වහලා නායකයාව සිටිය ද ඔහුට අවනත වී අනුගමනය කර කටයුතු කරන්න. යන හදීසය ද නායකත්වයට අවනතව කටයුතු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි.

- නායකත්වයට අවනත වීම ගැන අවධාරණය කළ ඉස්ලාම් එහි තෝන් ලණුව සීමාවන් සැලසුම් කර පවත්වාගෙන යයි. මන්ද යත්, ඉස්ලාම් ඒකාධිපතිවාදී නායකත්ව ප්‍රවණතාව සපුරා පිළිකුල් කර තිබේ. එබැවින් නායකත්වයට යම් යම් කොන්දේසි පැනවීම තුළින් ඒ සඳහා අවනතභාවය අවධාරණය කරයි. මෙහිලා පහත සඳහන් සීමාවන් පනවා තිබේ.
  1. නායකයා හෙවත් පාලකයා ඉස්ලාමීය ෂරීආහ්ව ක්‍රියාවට නඟන්නකු විය යුතුය.
  2. මහජනතාවට සාධාරණ ලෙස තීන්දු දෙන්නකු විය යුතුය.
  3. මහජනතාව පව් කෙරෙහි යොමු නො කරන්නකු විය යුතුය.

ඉහත සඳහන් කොන්දේසිවලට පටහැනිව නායකත්වය ක්‍රියා කරන විට යටහත්ව ක්‍රියාකිරීම යුතුකමක් නොවේ. පහත සඳහන් නබි (සල්) වදනින් මේ බව පැහැදිළි කරයි. "නියත වශයෙන් ම අවනතභාවය තිබිය යුත්තේ යහපත් කරුණුවල දී ය." (බුහාරි)

**නායකත්ව ගති ලක්ෂණ**

- නායකත්වය මැනවින් සාර්ථක වීමට නම්, ඒ සඳහා යෝග්‍යතාවන් ලබා සිටිය යුතු අතර යම් යම් ගුණ දහම් ද පිළිපැදිය යුතු වේ. නායකයන්ගේ සාර්ථකත්වය රඳා පවතිනුයේ එහි ඇති ගති ලක්ෂණ මත ය.

  අල්ලාහ් සහ අවසන් දිනය ගැන දැඩි සේ විශ්වාස කරන අය සඳහා වන ආදර්ශය, නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයා වෙත ම පවතී. (අල් අහ්සාබ් :31) යන අල්කුර්ආන් පාඨයෙන් හඟවන්නේ මෙයයි. එතුමා, දේශපාලකයකු, ගෘහමූලිකයකු, පරිපාලකයකු සහ නැමදුම්කරුවක් වශයෙන් ක්‍රියා කළ ආකාරයෙන්ම සෑම අතින් ම මාර්ගෝපදේශක නායකයකු ද වෙමින් එහි ගති ලක්ෂණ ගැන පෙන්වා දුන්නේය.

- නබි (සල්) තුමා ලබා තිබූ නායකත්ව ගති ලක්ෂණ පහත සඳහන් ලෙස සම්පිණ්ඩනය කොට සඳහන් කළ හැකි වේ. පරිපූර්ණ ගුණ දහම්, ප්‍රඥාවන්ත භාවය හා යහපාලනය, විනීතභාවය, ඉවසිලිවන්තභාවය, ඉවසා දරා ගැනීම, පොරොන්දු කඩ නොකිරීම, විරෝධාරභාවය, කායික ශක්තිය, සුහදතාව, ආදරය, මානසික තැන්පත් භාවය, දුරදක්නා නුවණ, පෞරුෂය හා ශ්‍රේෂ්ඨ ආදර්ශය යනාදිය ද ඇතුළු තවත් බොහෝ ගතිලක්ෂණ එතුමා තුළ දක්නට තිබිණි.

**නායකත්ව වගකීම්**

- ඉස්ලාමීය නීතිවේදීන් විසින් රටේ නායකත්වය කෙරෙහි වගකීම් රාශියක් පවරනු ලැබේ. අල්ලාමා අබුල් හසන් අලි අල් මාවර්දි විසින් සඳහන් කරනු ලබන ආගමික, ආර්ථික, දේශපාලනික හා සමාජයීය වගකීම් දහය ඉතා පැහැදිළිව පවතී. ඒවා සැකෙවින් මෙසේ ය :

  1. රටේ ස්වෛරීත්වය ආරක්ෂා කිරීම
  2. විශ්වාසිකයන් සහ උපදේශකයන්ගේ අදහස් අනුව ක්‍රියා කිරීම.
  3. දීන් (මාර්ගය) ආරක්ෂා කිරීම
  4. දඬුවම් ක්‍රියාවට නැංවීම
  5. එදිරිවාදිකම් මැඩලීම
  6. ඉස්ලාමයට එරෙහිවන අය සමඟ (බලකිරීම් යටතේ) ජිහාද් කිරීම
  7. zසකාත් සහ බදු යනාදිය රැස්කිරීම
  8. බයිතුල්මාලයෙන් පිරිනමනු ලබන දීමනාවන් තීරණය කිරීම.
  9. අවශ්‍ය වන කල්හී නීතිය ක්‍රියාත්මක කිරීම
  10. දේශයේ කටයුතුවල දී නිරන්තරයෙන් ම සුපරීක්ෂාකාරීව පසුවීම

  ඉස්ලාමීය නායකත්වය පාලනය කරන මූලික කරුණු තුනකි. ඒවා ෂූරා, නීතිය හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යනාදියයි.

**සමාජය හසුරුවීමේ ආයතනය වශයෙන් මස්ජිදය**

- නබි (සල්) තුමා මදීනාවට හිජ්රත් කළ අවස්ථාවේ, මදීනා සීමාවේ (කුබා) මුල්ම මස්ජිදය ඉදි කළහ. ඉන්පසු මදීනාවේ මස්ජිදයක් ඉදි කළහ. එහෙත් කුබා මස්ජිදයට වඩා මදීනා මස්ජිදය (මස්ජිදුන් නබවි) නබි (සල්) තුමාගේ චරිතයේ සහ මුස්ලිම් සමාජ නිර්මාණයෙහිලා වැදගත් දායකත්වයක් උසුලන අතර, එය ආදර්ශ මස්ජිදය ද වෙයි. මස්ජිදයන් විසින් සමාජය හසුරුවිය යුතු බවට පූර්වාදර්ශය වශයෙන් පවතී.

- මස්ජිදය, ජමාඅත් නැමදුම් සඳහා අරඹන ලද වුවද, එය මුස්ලිම් සමාජය කෙසේ එක්සත් කරනවා ද, කෙසේ ආරක්ෂා කරනවා ද යනාදියට පුහුණු මධ්‍යස්ථානයක් ද විය. නැමදුම සඳහා කැඳවීම හා ව්‍යවහාරයන් යනාදිය මේ බව ක්‍රියාවෙන් පෙන්නුම් කළේය.

- මස්ජිදයේ අධ්‍යාත්මික ක්‍රියාකාරකම් සහ ලෞකික ක්‍රියාකාරකම්, සමාජ ජීවිතයට ද ඉවහල් වන බැවින් මස්ජිදය හා වන සබැඳියාව ප්‍රශංසාවට ලක්වෙයි.

- පුද්ගලයකු මස්ජිදයට යාම සිරිතක් කැරගෙන සිටින බව දුටු කළ, හෙතෙම ඊමානය අත්කැර ගෙන සිටින බවට ඔබ සාක්ෂිදරන්න. (තිර්මිදි)

- මහපොළොව මත අල්ලාහ් අතිශයින් ප්‍රියකරන ස්ථානය මස්ජිදයයි. ඔහු බෙහෙවින් පිළිකුල් කරන ස්ථානය කඩවීදියයි. (මුස්ලිම්)

- මහ්ෂරයේ කිසිදු සෙවනක් නොමැති ඒ දවසේ, අල්ලාහ්ගේ අර්ෂ් යට සෙවණ ලබන වාසනාව කණ්ඩායම් සතකට ලැබේ. ඔවුනතට, මස්ජිදය හා දැඩි සබැඳියාවක් පවත්වා ගත් අය ද, එක් කණ්ඩායමකි. (බුහාරි)

- සිය නිවසේ සිට වුළූ ගෙන, සිය ආගමික යුතුකම ඉටු කරනු පිණිස අල්ලාහ්ගේ කිසියම් මස්ජිදයක් කරා ගමන් කරන්නේ ද, ඔහු තබන සෑම පියවරකට ම ආනිශංස ලියාගනු ලැබේ. පව අහෝසි කෙරේ. තත්ත්වය උසස් කෙරේ. (මුස්ලිම්) යනාදී හදීස, අධ්‍යාත්මික ප්‍රගතිය සඳහා වන ක්‍රමයක් වශයෙන් පමණක් සඳහන් වෙතත්, එය සමාජ ප්‍රගමනය සඳහා වන ක්‍රමයක් වශයෙන් ද සැලකිය හැකිය. මන්ද යත්, මිනිසාට අධ්‍යාත්මික තැන්පත් භාවය අත්කැර දෙන අතරතුර ම, ඔහුට සමාජ යහපතෙහි කැක්කුමක් ඇති කරවීමට ද එය ඉවහල් වේ. ඉබ්නු අබ්බාස් (රලි) තුමා ඉඃතිකාෆ් සිටි කාල පරාසය තුළ එක්තරා සහෝදරයෙකුගේ අවශ්‍යතාවක් ඉටුකරනු පිණිස පිටතට යාම හා ඊම පිළිබඳ එතුමා කළ විස්තරය මේ බව සනාථ කරයි.

- නබි (සල්) තුමා මුස්ලිම් සමාජය ගොඩනැඟුවේ මස්ජිදය කේන්ද්‍ර කර ගනිමිනි. මේ නිසා එහි කාර්යභාරය පුළුල් විය. අල්ලාහ් සහ ඒක පුද්ගලයා සම්බන්ධ කරවන පිටිය වශයෙන් පමණක් නොව පුද්ගලයන් අතර සහසම්බන්ධතා ඇති කරන්නා වූ පිටියක් වශයෙන් ද එය පත් කළේය.

- ඕනෑම විටෙක ජනතාවට තම නායකයා හමුවිය හැකි හා එය පහසු කරවන තැනක් බවට ද මස්ජිදය පැවැතියේය. නබි (සල්) තුමා සිය වාසස්ථානය සලසා ගත්තේ මස්ජිදයේ එක් පසෙකය. නැමදුම් සඳහා එහි එන ජනතාවට එතුමන් මුණගැසීම ද මේ නිසා පහසු විය. මදීනාවේ වාසය කරන්නන් පමණක් නොව, පිටින් පැමිණෙන මුස්ලිම්වරුන් ද, මුස්ලිම් නොවන්නන් ද, පෞද්ගලිකව හා සාමූහිකව එතුමන් මුණගැසිය හැකි තැනක් වශයෙන් ද මස්ජිදය පත් විය.

- එහිදී නිතර නිතර සමාජ කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වන ලදී. නැඟී එන නව සමාජය වශයෙන් තනි පුද්ගලයෝ ද, සමාජය ද බොහෝ ප්‍රශ්නවලට මුහුණ දුන්හ. එම අවස්ථාවේ අල්ලාහ්ගෙන් ලැබෙන වහී, නබි (සල්) තුමාගේ මඟපෙන්වීම හා සමාජය සමඟ පවත්වා ගත් අකීදාව ඔවුන්ට මහෝපකාරී විය. ඒවා බෙහෙවින් සිදුවූයේ මස්ජිදයේ ය.

- නබි (සල්) තුමාගේ අවධියේ මස්ජිදය අධ්‍යාපන ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක විය. අල්ලාහ් වෙතින් පහළ වන අල්කුර්ආන් ආයත, එහි දී පාරායනය කොට දක්වන ලදී, නබි (සල්) තුමා කුත්බා හා සාකච්ඡාවන් මගින් දේශනාවන් කළහ. මස්ජිදයේ ස්ථිර ලෙස රැඳී සිටි (අස්හාබුස්සුෆ්ෆා නමැති) සහාබා කණ්ඩායම් නබි (සල්) තුමාගෙන් ඉගෙන ගත් අතර මොවුහු සෙසු සහාබාවරුන්ට ද ඉගැන්වූහ.

- එය සමාජයේ ආර්ථික අවශ්‍යතා සපුරාලන ස්ථානය වශයෙන් ද ක්‍රියාත්මක විය. Zසකාත්, සදකා හා ගනීමා යනාදිය ලැබෙන විට ඒවා බෙදාහරිනු ලැබූයේ මස්ජිදයේ සිටිය.

- සමාජ ප්‍රශ්න ගැන සාකච්ඡා කොට විසඳුම් සපයන සේවාවට අමතරව, සමාජයේ සිදුවන අඩුපාඩුවලට ඉස්ලාම් යටතේ තීන්දු දෙන උසාවිය වශයෙන් ද එය ක්‍රියාත්මක විය. නබි (සල්) තුමා විනිශ්චයකාරයා වශයෙන් පෙනී සිට තීන්දු දුන්නේය.

- ඇතැම් අවස්ථාවල හමුදා පුහුණු කඳවුරු වශයෙන් ද, වෛද්‍ය සායනය වශයෙන් ද මස්ජිදය ක්‍රියාත්මක විය. එහි කූඩාරම් තනා ප්‍රතිකාර ලබාදුන් බව ද ඉතිහාසයේ කියැවේ.

- නබි (සල්) තුමාට පසුව බිහිවූ කුලෆාඋර් රාෂිදූන්වරුන්ගේ කාලයේ දී ද මස්ජිදවල සිටම කටයුතු ඉටු කෙරිණි. ප්‍රාන්ත අගනුවරවල ආණ්ඩුකාරවරු ද මස්ජිද ඉදිකොට එලෙසින් ම ක්‍රියා කළහ. සහාබාවරු මස්ජිදවල දී සිප්සතර ඉගැන්වූහ. ඔවුන්ගේ අනුගාමිකයන් වූ තාබියීන්වරු සහ තබඋත්තාබියීන්වරු පවා මෙම ක්‍රියාකලාපය අනුගමනය කළහ. ඉමාම් මාලික් සහ සඊද් බින් මුසයියබ් යනාදිහු, මස්ජිදුන් නබවියේ පංති පැවැත්වූහ. හිජ්රි වර්ෂ 36 දී ඊජිප්තුවේ අම්ර් ඉබ්නුල් ආස් මස්ජිදයේ අධ්‍යාපන කව හතළිහකට වඩා දක්නට විය. ඉමාම් ෂාෆිඊ සහ ජරීමුත්තබරී යනාදීහු ද ඉගැන්වූහ. හිජ්රි 361 දී ඉදිකරන ලද ජාමිඋල් අස්හර් මස්ජිදය වත්මනෙහි අස්හර් සරසවිය වශයෙන් පත් වී ඇත. ට්‍යුනීසියාවේ ජාමිආ සයිතූනියා ද එවැන්නකි. බැග්ඩෑඩයේ මස්ජිදයේ කතීබ් ජාමිආ තුමා වූ අල් බග්දාදී ඉගැන්වීම් කටයුතු කළේය. ඩැමස්කස් උමර් හි ද සිප්සතර උගන්වන ලදී. මේ සියල්ලෙහි ම ආගමික ශිල්පය පමණක් නොව, සාහිත්‍යය, කාව්‍ය, දර්ශනය, ගණිතය සහ වෛද්‍ය විද්‍යාව යනාදී විෂයයන් ද උගන්වා තිබේ.

  මස්ජිදය, ඉබාදත් සඳහා පමණක් වන ස්ථානයක් පමණක් නොව, මුස්ලිම්වරුන්ට ආගමික අධ්‍යාපනය හා ලෞකික අධ්‍යාපනය ද ලබා දෙන කලායතනයක් වීයැයි ආචාර්ය මුස්තාෆා ෂිෆාඊ සඳහන් කරනුයේ ඒ නිසාවෙනි.

- මස්ජිද් පුස්තකාල බිහිවීමට ද, අස්හාබුස් සුෆ්ෆාවරුන්ගේ සේවය පූර්වාදර්ශයක් විය. ඉස්ලාමය දියුණුවට පත් වකවානුවේ ඉදි වූ මස්ජිදවල පුස්තකාල ද විය. මදීනාහ්ව, ඊජිප්තුව, ඩැමස්කස්, කයිරවාන් හා ට්‍යුනිසියා යනාදී ස්ථානවල දක්නට තිබෙන මස්ජිද පුස්තකාල මීට නිදසුන් වේ.

- එහෙත් කාලයාගේ ඇවෑමෙන් බටහිර බලවේගවල කුමන්ත්‍රණ හේතුවෙන් මස්ජිද, ඒවායේ පුළුල් සේවාවන් හකුළා ගත්තේය. අධ්‍යාත්මික ක්‍රියාකාරකම්වලට පමණක් සීමා වූ ස්ථාන වශයෙන් ක්‍රියාත්මක වීමට පටන් ගත්තේය. ලෞකික කටයුතු පිළිබඳ (දේශපාලනික, සමාජයීය, ආර්ථික, අධ්‍යාපනික, සංස්කෘතික හා ජාත්‍යන්තර) ක්‍රියාකාරකම් වෙනත් තැන්වලට මාරු කරන ලද අතර, ඒවායේ ආධ්‍යාත්මික ජීවය ද තුරන් විය. අන්‍ය සංස්කෘතික බලපෑම්වලට ලක් ව අශෝභන විය. මේ නිසා මුස්ලිම් ප්‍රජාවේ පරිහානිය ආරම්භ විය.

- මෙය යථාවත් කිරීමෙහි ලා තත්කාලයේ විසූ සංශෝධකයන් බොහෝ දෙනෙකු විසින් දරන ලද ප්‍රයත්න හේතුවෙන් මස්ජිදයන් නැවත යථෝක්ත සේවාවන්වල යෙදවීමට බොහෝ මාර්ග විවෘත කොට තිබේ. ජගත් මුස්ලිම් සංසදය (රාබිදා) විසින් ඒ සඳහා වෙන ම ශාඛාවක් ස්ථාපිත කොට තිබේ. අප රට සම්බන්ධයෙන් සලකන කල්හි සමාජ පුනර්නිර්මාණ කේන්ද්‍ර වශයෙන් මස්ජිදයන් පත් කැරවීමේ අවශ්‍යතාව පැන නැඟ තිබේ. එහිලා,

1. මස්ජිදවලට සුදුසු පරිපාලකයන් පත් කිරීම.
2. මස්ජිද සංවිධානයෙහි සංශෝධන ඇති කිරීම.
3. අධ්‍යාපන කව ඇති කිරීම.
4. කෙමෙන් කෙමෙන් පුස්තකාල ගොඩනැගීම.
5. Zසකාත් යනාදිය එක්රැස් කිරීම හා බෙදා හැරීමට විධිවිධාන සැලසීම.
6. සමාජ ප්‍රශ්න නිරාකරණය කරනු පිණිස සමථ මණ්ඩල ඇති කිරීම.
7. පොදු කටයුතුවල නිරතව නායකත්වය දැරීම. (දේශපාලන, සමාජ, අධ්‍යාපන හා ආර්ථිකය සම්බන්ධයෙන්)
8. මස්ජිද සම්මන්ත්‍රණ පවත්වා, සමාජ එක්සත්භාවයට මඟ පෑදීම.
9. සමාජ පරිසරය වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම්වල යෙදීම. (ශිෂ්‍ය, කාන්තා, තරුණ තරුණියන්, විරැකියාවෙන් පසුවන්නන් සම්බන්ධයෙන්)
10. අන්‍ය ආගමිකයන් සමඟ සබැඳියාව ක්‍රමවත් කිරීම

යනාදිය මස්ජිදවල සිදු කිරීමට වෑයම් කළ යුතු ය.

**අන්‍ය සමාජ සමඟ සබැඳියාව**

- මුස්ලිම්වරුන් පමණක් වෙසෙන ජනපද බහුතර මුස්ලිම්වරුන් වෙසෙන ජනපද හා සුළුතර මුස්ලිම්වරුන් වෙසෙන ජනපද වශයෙන් මුස්ලිම් ජනපද කොටස් තුනකට බෙදන්නට පුළුවන. ග්‍රාමීය මට්ටමෙන් වුව ද, ජාතික මට්ටමෙන් වුව ද මෙම තත්ත්වය දක්නට තිබේ. මෙහිලා මුල්ම තත්ත්වයන් හැර සෙසු තත්ත්ව දෙක යටතේ ම, මුස්ලිම්වරු මුස්ලිම් නොවන්නන් හා සම්බන්ධ වී වාසය කරති. සංකීර්ණ වූ මෙබඳු තත්ත්වයක් තුළ අප කෙසේ කටයුතු කළ යුතුදැයි ඉස්ලාම් පැහැදිලි කර දෙයි.

- නබි (සල්) තුමාගේ පශ්චාත් නුබුව්වත් අවධියේ මක්කාවේ මුස්ලිම්වරු සුළුතර ජනතාවක් වශයෙන් විසූහ. මදීනාහ්වේ මුස්ලිම්වරු බහුතර ජනතාවක් වශයෙන් විසූහ. එහෙත් ඔවුහු, මුස්ලිම් කොටස් සමඟ සුහද සම්බන්ධතා පවත්වා ගත්හ. සුළුතරයක් වශයෙන් වාසය කළ කාලයේ සතුරන් ගෙන් වෙසෙසින් කුරයිෂිවරුන්ගෙන් එල්ල වූ හිරිහාර හා අයිතිවාසිකම් කඩකිරීම් සියල්ලම ඉවසා දරා ගත්හ. බහුතරයක් වශයෙන් වාසය කරන කළ, සුළුතර ජනතාවගේ අයිතිවාසිකම්වලට ගරු කළහ. සහාබා සහ තාබිඊන් සමාජවල දී මේ ක්‍රමය ම පිළිපදින ලදී.

- බහු වාර්ගික සමාජයක වාසය කරන මුස්ලිම්වරුන්ට සෙසු ප්‍රජාවත් සමඟ එකමුතුව ජීවත්විය හැකි බව අල්කුර්ආනය සහ සුන්නාහ්ව ද ගෙන හැර දක්වයි. මිනිසුන් අතරින් (නපුරුකම් කරන ඇතැමුන්, තවත් ඇතැමකු ලවා අල්ලාහ් නොවැළැක්වී නම්, ක්‍රිස්තියානි ජනතායේ දේවස්ථාන, ජුදෙව් ජනයාගේ ආරාම හා අල්ලාහ්ගේ නාමය බහුල වශයෙන් සිහිපත් කරන මස්ජිද ද විනාශ කොට තිබෙන්නට පුළුවන. (22:40) යනුවෙන් අල්කුර්ආනය බහු ආගමික සමාජයක් තුළ වාසය කිරීම අළලා සඳහන් කරයි. බහුවාර්ගික සමාජයේ මුස්ලිම්වරුන් වාසය කළ බවට හා ඔවුනට වාසය කළ හැකි බවට මෙමගින් ගෙනහැර දැක්වේ.

- ඔබේ පරම හිමියා (අල්ලාහ්) සිතුවේ නම් මිහිපිට ජීවත් වෙන සියලු දෙනාම එකසේ විශ්වාසය තබා තිබෙන්නට පුළුවන. (එම නිසා) මිනිසුන් (සියලු දෙනාම විශ්වාසියන් (මුස්ලිම්වරුන්) බවට පත්විය යුතු යැයි බලපෑම් කරන්නට ඔබට හැකි වේ ද ? (10:99) යනුවෙන් නබි (සල්) තුමා අමතා ප්‍රශ්න නැගීමෙන් සියලුම මිනිසුන් මුස්ලිම්වරු නොවෙති; මුස්ලිම් නොවන්නෝ ද ජීවත් වෙති යන්න ගෙන හැර දක්වති.

- මුස්ලිම් නොවන්නෝ ද මිනිස්සු යනු අල්ලාහ්ගේ නිර්මාණය යන උදාර සිතුවිල්ල සහිත ව මුස්ලිම්වරුන් ජීවත් විය යුතුයැයි ඉස්ලාම් ප්‍රකාශ කරයි. කොතරම් දුරට ද යත්, ඔවුන් වඳින පුදන දෙවිවරුන් ගැන පවා පහත් කොට කතා නොකළ යුතු බවට අවවාද කරයි. විශ්වාසිකයිනි, අල්ලාහ් නොවන දේවලට ඔවුන් (දෙවියන් වහන්සේ) කුඹුවත් ද, ඒවාට ඔබ පරිභව නොකරන්න. ඒ හේතුවෙන් ඔවුන්, නොදැනුවත්කම් කරණ කොට ගෙන සීමාව ඉද්මවා අල්ලාහ්ට පරිභව කරනු ඇත. (6:108)

- (ඉස්ලාම්) ආගමෙහි බලපෑමක් නැත. (මන්ද යත්) මංමුළාවෙන් (බැහැරව) යහ මාර්ගට (යොමුවන්නේ කෙසේ දැයි) පැහැදිළි විය. (2:256) එම නිසා මුස්ලිම් නොවන්නන්ට බල කොට ඉස්ලාමය වෙතට එන්නැයි මුස්ලිම් කිසිවෙක් මුස්ලිම් නොවන්න්ට බල නොකරති. එහෙත් ඉස්ලාමයේ ශ්‍රේෂ්ඨත්වය සොයන්නට ගෙනහැර දක්වන්නට පුළුවන. ඇතැම් විට තර්ක විතර්ක කළ යුතු තත්ත්වයට පත් කරනු ලැබුවා නම්, කෙසේ ක්‍රියා කළ යුතුදැයි අල්කුර්ආනයේ මුස්ලිම්වරු දැනුවත් කරනු ලබති.

- (විශ්වාසිකයිනි) ඔබ ආගම් සහිත උදවිය සමඟ තර්ක කිරීමට ඔබට සිදු වෙතොත්, විනීත ලෙස විනා (ඔවුන් සමඟ) තර්ක නොකරන්න. එනමුත්, ඔවුන්ගෙන් කිසිවකු සීමාව ඉක්මවා ගිය විටෙක, (ඊට) අදාළ ලෙස පිළිතුරු දීම වරදක් නොවේ. ඔවුන් හා තර්ක කරන විට අපට පහළ කරන දෙය සහ ඔබට පහළ කරන ලද (ආගම) දෙස ද අපි විශ්වාස කරමු. අපේ දෙවියා ද, ඔබගේ දෙවියා ද එකම කෙනා ය. අප ඉඳුරා අවන වෙමින් ජීවත් වන්නේ ඔහුට ය කියා පවසන්න. (29:46)

- මුස්ලිම් නොවන්නන් ගැන නබි (සල්) තුමා පවසා ඇති දෙය ගැන සලකා බලන්න. මුස්ලිම් නොවන සුළුතර පුද්ගලයන්ට හිංසා කරන්නේ කවුරුන් ද, මම ඔහුට සතුරු වෙමි. මා කාගේ සතුරෙකුව සිටින්නෙම් ද, පරලොවෙහි දී ඔහුට එරෙහිව වාද කරන්නෙක් ව පසුවෙමි. (තාරික් බග්දාද්) උදක් ම, අසාධාරණයට ලක් වූවන්ගේ ප්‍රාර්ථනය ගැන බියපත් වන්න. ඔහු කාෆිර් (මුස්ලිම් නොවන්නකු) වුව ද එසේම ය. එය සහ අල්ලාහ් අතර කිසිදු තිරයක් නැත. (මුස්නද් අහමද්) යන්වෙන් ද, නබි (සල්) තුමා අවවාද කොට ඇත. මෙය, මදීනා ජීවිත කාලයෙහි පවසන ලද්දක් බැවිනි, මුස්ලිම් නොවන සුළුතරය යනුවෙන් යෙදී තිබෙනුයේ.

- නබි (සල්) තුමා මුස්ලිම් නොවන්නන් සමඟ කෙසේ ක්‍රියා කළේදැයි බලන්න. නබි (සල්) තුමා සහ සහාබාවරු යුදෙව්, ක්‍රිස්තියානි හා කුරෙයිෂි කාෆිර්වරන් සමඟ ජීවත් වූහ. ඔවුන් සමඟ සුහද ගිවිසුම් ඇති කර ගත්හ. ගිවිසුමට එළැඹි එකී ජනතාව සමඟ මැනවින් කටයුතු කළහ. එලෙස හොඳින් ක්‍රියා කරන මෙන් අනුන්ගෙන් ද ඉල්ලා සිටියහ.

- නබි (සල්) තුමන් හමුවීමට ඇබිසීනියානු ක්‍රිස්තියානිවරුන්ගේ පිරිසක් මදීනාවට පැමිණියහ. නබිතුමා ඔවුන් ගරුසරුව පිළිගෙන සංග්‍රහ කළ දසුන දුටු සහාබාවරු විමතියට පත්වූහ. පසු විටෙක ඊට හේතුව ද විමසූහ. එහිදී එතුමා මොවුන් මගේ හිතවතුන්ව ඉතා ගෞරවනීය ලෙස සැලකුවා. මොවුන් මගේ හිතවතුන්ට කළ ගෞරවයට වඩා මා ඒ අයට ගෞරව කරන්නට කැමැති යි කීය. (නුබුව්වත් 5,7 වසරවල දී මුස්ලිම්වරුන් ඇබිසීනියාවට හිජ්රත් කළ සිද්ධිය)

- නජ්රාන් ප්‍රදේශයේ ක්‍රිස්තියානි ජනයා, මදීනාවට පැමිණි අවස්ථාවේ දී ද නබි (සල්) තුමා මෙලෙසින් ම ක්‍රියා කළේය. ඔවුන් මස්ජිදුන් නබවියෙහි රඳවා ගත් අතර, ඔවුන්ගේ නැමදුම් අවස්ථාව එළැඹි කල්හි මස්ජිදයේ එක් පසෙක ජප කිරීමට ඉඩකඩ සලසා දුන්නේ ය. ඔවුන් තම ආගම ගැන තර්ක කළ අවස්ථාවේ නබි (සල්) තුමා ඊට ඇහුම්කන් දුන්නේය. ගෞරවනීය ලෙස ඔවුනට පිළිතුරු ද සැපයීය. ඊජිප්තුවේ ක්‍රිස්තියානි පාලකයා මුකව්කස් එවා තිබූ තෑගිබෝග ඉතසිතින් පිළිගත්තේය. එම තෑගි අතර වූ මාරියතුල් කිබ්තියා නමැති ළඳ සිය සුර්රිය්යත් වශයෙන් තබා ගත්තේය.

- එතුමා නජ්රාත්ප්‍රදේශයේ කිතුණුවන් සමඟ කරගත් සම්මුතිය, මුස්ලිම් නොවන ජනයාට සැලකිය යුතු ආකාරයට පැහැදිළිව පෙන්නුම් කරන්නකි. නජ්රාත් වැසියෝ ද, ඔවුන් වැන්නෝ ද අල්ලාහ්ගේ රැකවරණයේ ඔහුගේ නබි හා රසුල් වන මුහම්මද් (සල්) ගේ භාරයේ ද පසුවන්නෝ ය. ඔවුන්ගේ ජීවිතය, ආගම, භූමිය, දේපළ ඇතුළු මෙහි සිටින හා නොසිටින සියලු දෙනාගේම ආගමික සිද්ධස්ථාන වත්පිළිවෙත් සියල්ලම හා ඔවුන්ට මෙම ආරක්ෂාව ද හා වගකීම ද ඇත. කිසිම පූජකයකු හෝ තාපසයකු හෝ ඔහුගේ තත්ත්වයේ සිට ඉවත් නොකෙරේ. එසේම ආගමික වගකීම් ඉටුකරන්නෝ එම වගකීමෙන් ඉවත් නොකෙරෙති. නීත්‍යානුකූලව ඔවුන් වෙත තිබෙන ලොකු, කුඩා සෑම දෙයක්ම ඔවුන්ට අවශ්‍ය වේ. යම් කෙනෙකු මොවුන්ගෙන් අයිතිවාසිකම් ඉල්ලා සිටිතොත්, දෙපාර්ශ්වයටම කිසිම අවාසියක් නොවන අයුරින් සාධාරණ ලෙස විසඳනු ලැබේ. කෙනෙකුගේ වරදකට තවත් කෙනෙකුට දඬුවම් නොපැමිණ වේ. මෙම සම්මුතිය අනුව ක්‍රියා කිරීමට අල්ලාහ් සහ ඔහුගේ ධර්ම දූතයා බැඳී සිටිති. (තබකාත් ඉබ්නු සෑද)

- මෙනයින් සම්මුතියට එළැඹුනු නබි (සල්)තුමා යම් කෙනෙකු (මුස්ලිම් නොවන) සම්මුතියට එළැඹුණු කෙනෙකුට අසාධාරණයක් කරයි ද, නැත්නම් අයිතිවාසිකම් අඩු කරයි ද නැත්නම් දරාගත නොහෙන පරිදි වගකීම් පවරයි ද නැත්නම් ඔහුගේ කැමැත්තකින් තොරව ඔහුගෙන් කිසියම් දෙයක් ලබා ගත්තේ ද ඔහුට එරෙහිව මම අවසාන දිනයේ වාද කරන්නෙමි. (අබූ දාවුද්) යන්නෙන් අනතුරු හැඟවීය.

- කලීෆා උමර් තුමාගේ (රළි) අවධියේ බයිතුල් මක්දස් කිලාඵතයේ පාලනයට නතු විය. කලීෆාතුමාම පැමිණ එය භාරගන්නා මෙන් ඉල්ලා සිටිනු ලැබීය. එතුමා එහි යනවිට අසර් නැමදුම සඳහා කාලය එළැඹියේ ය. එහිදී ම නැමදුම ඉටු කර ගන්නා ලෙස දේවස්ථානයේ ප්‍රධාන පූජකතුමා කලීෆාවරයාගෙන් ඉල්ලා සිටියේ ය. එය ප්‍රතික්ෂේප කළ කලීෆාවරයා මා මෙහි නැමදුම් ඉටු කළා නම්, පසු කාලයක දී කලීෆා නැමදුම් කළ තැනය කියාගෙන මුස්ලිම්වරුන් අයිතිවාසිකම් කියන්නට පුළුවනැයි කියමින් වෙනත් තැනකට ගොස් නැමදුම ඉටු කළේය.

- ඒ අවස්ථාවේ කුද්ස් වැසියන් සමඟ ගිවිසුමක් ඇති කර ගත්තේය. ඔවුන්ගේ දේවස්ථානවල කිසිවකු පදිංචි නොවිය යුතුය. ඒවා විනාශ නොකළ යුතුය. එහි කිසිම කොටසක් නොකැඩිය යුතුය යනුවෙන් ආණ්ඩුකාරවරයාට චක්‍රලේඛයක් යැවීය. කලීෆා උමර් තුමා(රළි) සිය අවසන් කාලයේ මෙසේ පවසා ඇත. තිම්මිවරුන් වන අන්‍යාගමිකයන් සමඟ මනා අන්දමින් ක්‍රියාකළ යුතු බව, ඔවුන්ගේ ගිවිසුම් ක්‍රියාවට නංවන ලෙස, ඔවුන් වෙනුවෙන් සටන් වදින ලෙස හා ඔවුන්ගේ ශක්ති ප්‍රමාණයට වඩා වගකීම් නොපවරන ලෙස, මගෙන් පසු එන කලීෆාවරයාට මම උපදෙස් දෙමි. (කිතාබුල් කරාජ්) ඔවුහු අපේ භාරකාරීත්වය යටතේ සිටිති. ඔවුන්ගේ ප්‍රාණය අපේ ප්‍රාණය මෙනි. ඔවුන්ගේ දේපළ අපේ දේපළ වෙති. (ඒවා ආරක්ෂා කළ යුතු වේ.) යනුවෙන් කලීෆා අලි තුමා (රලි) පවසා තිබේ.

- ඊජිප්තුවේ මුස්ලිම්වරුන්ගේ සංඛ්‍යාව වැඩි වූ කාලයේ, ආණ්ඩුකාරවරයා වශයෙන් කටයුතු කළ අම්ර් ඉබ්නු ආස්තුමා (රළි) එක්තරා කාන්තාවකගේ නිවස කඩා, මස්ජිදය විස්තීරණය කළේය. මේ සඳහා ආණ්ඩුකාරයා සිය අනුමැතිය නොලද බව එම කාන්තාව කලීෆාවරයා වෙත පැමිණි කළාය. කලීෆාවරයා ආණ්ඩුකාරයාගෙන් විමසා සිටි විට, එම කාන්තාව පමණට වඩා වන්දි මුදලක් බලාපොරොත්තු වූ බව ද, ඇය වෙනුවෙන් වන්දි මුදල බයිතුල්මාලයේ තැන්පත් කර ඇති බව ද ආණ්ඩුකාරයා කියා සිටියේ. මස්ජිදය කඩා දමා, මුලින් තිබුණාක් මෙන් නිවස ඉදිකර දෙන ලෙස කලීෆාවරයා නියෝග කළේය.

- මුස්ලිම් පාලනයට නතුව සිටි මුස්ලිම් නොවන වැසියන්ගේ (තිම්මිවරු) අයිතිවාසිකම් නිසි ලෙස ලබා දීමෙහිලා නබි (සල්) තුමා සහ කලීෆාවරුන් දැඩි ලෙස ක්‍රියා කළ බව ඉහත සඳහන් කරුණුවලින් සනාථ වේ. පාලකයන් පමණක් නොව, සාමාන්‍ය පොදු ජනයා ද මුස්ලිම් නොවන්නන් සමඟ අවංගව හා සාධාරණව කටයුතු කළයුතු බවට ඉස්ලාම් දැඩි ලෙස අවධාරණය කරයි. නිදසුනක් වශයෙන් අසල්වැසියන් වෙනුවෙන් ඉටුකළ යුතු වගකීම් ගැන විස්තර කරන විට මුස්ලිම්, මුස්ලිම් නොවන්නන් යන භේදයක් නොදැක්විය යුතුය. (4:36) යනුවෙන් කර තිබෙන නියමයන් දක්වන්නට පුළුවන. දෙමව්පියන් මුස්ලිම් නොවන්නන් වුව ද, ඔවුන්ගේ අයිතිවාසිකම් මුස්ලිම් වන දරුවන් විසින් ලබාදිය යුතු වේ. (31:15) යන්න ද තවත් නිදසුනකි.

- අපේ රට සම්බන්ධයෙන් අප විසින් පිළිපැදිය යුතු කරුණු කිහිපයකි.

  * අප රටේ වෙසෙන විවිධ වාර්ගික භාෂාවන් හා ආගමික සියලුම ජනයා ආදම්තුමාගේ (අලයි) පරපුරට අයත් වූවන් වශයෙන් සැලකීම.

  * අසල්වැසියන් සමඟ සුහද සම්බන්ධතාව වැඩිදියුණු කර ගැනීම. ඔවුන්ගේ දුක සැපෙහි දී සහභාගී වීම, ඔවුන්ගේ සාධාරණ අයිතිවාසිකම් ලබා දීම.

  * වැරදි කමා කොට උදාර ලෙස හැසිරීම

  * ආපදා විපත්වල දී මානව දයාවෙන් උදව් උපකාර කිරීම, සහනාධාර පිරිනැමීමෙහිලා දායක වීම.

  * ප්‍රසිද්ධ උත්සව සහ මංගල්‍යයන්හි දී අන්‍යොන්‍ය වශයෙන් උදව් උපකාර කිරීම හා සහභාගී වීම.

  * ප්‍රාදේශීය හා දේශීය සුබසෙත වෙනුවෙන් උත්සුකව සහයෝගය දැක්වීම.

  * වාර්ගික සමගිය ඇති කරන්නා වූ රැස්වීම්, අදහස් හුවමාරු කරගැනීම් සහ සමිති, සංගම් සංවිධානය කිරීම.

  * අකීදා, ඉබාදා, හලාල් හා හරාම් යනාදිය රැක ගනිමින් වාසය කිරීම.

## සත්ත්ව කරුණාව

- සමාජ ජීවිතයෙහිලා මුස්ලිම්වරයෙකු සෙසු ජනයා විසින් ඉටුකළ යුතු වගකීම් සහ අයිතිවාසිකම් ගැන ඉස්ලාමයෙන් පැහැදිළි කොට තිබේ. ඒ අයුරින් ම තමන් හා වාසය කරන දේව මැවීම් සමඟ ආදරයෙන් හා කරුණාවෙන් කටයුතු කරන මෙන් ද පනවා තිබේ.

- ජීවීන් සමඟ කරුණාවෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් 1824 දී එංගලන්තයේ සත්ව කරුණා පදනම පිහිටුවන ලදී. මෙය මානව දයාව යටතේ ක්‍රියාත්මක වන්නකි. ජීවීන් සමඟ ආදරයෙන් ක්‍රියා කිරීම මගින් හෝ ඒවායේ අයිතිවාසිකම් කර කරමින් කටයුතු කිරීම මගින් ඇතිවන විපාක, ආනිසංශ ගැන මෙම පදනම විසින් කිසිත් සඳහන් කොට නැත. එහෙත් ඉස්ලාම්, දේව නිර්මාණයන් සමඟ මැනවින් කටයුතු කිරීම එක්තරා ආගමික මෙහෙවරක් වශයෙන් සලකයි. ඒවායේ අයිතිවාසිකම් කඩකරමින් කටයුතු කිරීම දේව දණ්ඩනයට අදාළ වරදක් වශයෙන් සලකයි.

- දේව මැවීම් සමඟ ආදරයෙන් කටයුතු කිරීම ඊමානය දැඩි කරවන ගතිලක්ෂණයක් බව ඉස්ලාම් සලකයි. අල්ලාහ් බෙහෙවින් ආදර සිතක් ඇත්තා ය. සියලුම කටයුතුවල දී ඔහු අපේක්ෂා කරනුයේ එයයි.

- ඉස්ලාම්සම්ප්‍රාප්තියට පෙර, එකල අරාබි ජනයා අතර දක්නට තිබුණු සත්ව ඝාතනය, හාම්පුතා මියගිය කළ ඔහුගේ සොහොන් වල මත, ඔහුට අයත් සතුන් මැරෙන තුරා බැඳ දැමීම හා පණපිටින් සිටින සතාගේ මාංශ කපාගෙන අනුභව කිරීම යන සියලුම වැරදි ක්‍රියා මුස්ලිම් තහනම් කළේ එබැවිනි.

- වරෙක ඉබ්නු උමර් (රළි) තුමා පාරෝ ගමන් කරන විට, ඇතැමෙක් කුකුළකු බැඳ තබා ඉලක්කය බලමින් සිටියහ. ඉබ්නු උමර් (රළි) තුමන් එනු දුටු ඔවුහු එතැනින් දුවන්නට පටන් ගත්හ. මෙසේ කළේ කවුරුන් ද, මෙවැනි දේවල් කරන්නෝ ශාප ලද්දෝ යැයි (බුහාරි) නබි (සල්) තුමා පවසා තිබේ යැයි සඳහන් කළේය.

- පණපිටින් සිටින සතුන්ගේ මස් අනුභව කිරීම, මළකුණු අනුභව කිරීමට සමාන යැයි නබි (සල්) තුමා පවසා තිබේ. (තිර්මිදි)

- යම් කිසිවෙකු යම් පක්ෂියෙකු නිෂ්ඵල ලෙස මරා දමන විට, එම පක්ෂියා පරම හිමියනි, මොහු මා නිෂ්ඵල ලෙස මරා දැමී යැයි කියමින් වාද කරන්නේ ය. (නසාඊ) යනුවෙන් නබි (සල්) තුමා පවසා තිබේ.

- ජීවීන්ට හිංසා කිරීම සාමාන්‍ය කරුණක් නොවේ. අල්ලාහ්ගේ ශාපය අත්කර දෙන හා පරලොවෙහි දී අල්ලාහ් වෙත වරදකරුවකු වශයෙන් පෙනී සිටීමට සලස්වන වරදක් වශයෙන් ඉස්ලාමයෙන් අනතුරු අඟවමින් උගන්වයි.

- සතුන් සමඟ කරුණාවෙන් ක්‍රියා කිරීම අල්ලාහ්ගේ ආශිර්වාදය හා ස්වර්ගය ලබා දෙයි.

- ඔටුවා, එය ඇතිකරන්නාට ජලය සපයයි. එළුවා වෙත අල්ලාහ්ගේ ආශිර්වාදය (බරගත්) තිබේ. (බුහාරි) කුකුළා හඬලන විට ශාප නොකරන්න. ඌ ඔබට නැමදුම සඳහා අවදි කරයි. (නසාඊ)

- පිපාසයෙන් පසුවූ සුනඛයෙකුට ජලය සැපයූ කෙනෙකුගේ සියලු පවු කමා කරනු ලැබීය. (බුහාරි)

- සෑම ජීවියෙකුටම කරුණාව දැක්වීම කුසල් අත්කර ගැනීමට හේතු වේ. (බුහාරි)

- ජීවීන් සමඟ කටයුතු කිරීමට අදාළ නීති රීති රැසක් තිබේ.

1. ආදරය දැක්වීම

   ජීවීන් සමඟ කරුණාවෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන් හදීස රැසක් මගින් අවධාරණය කෙරේ. නිදසුන් : සුනඛයාට ජලය පෙවීමෙන් පවු කමා කරනු ලැබීය, මඟ වැරදුණු සතුන් සිය තටාකයෙන් ජලය පානය කිරීමට සැලසූ ක්‍රියාවට දේව ආනිසංස ඇත.

   හාම්පුතකු නැති නිදැල්ලේ යන සුනඛයන්ගේ ආහාර අවශ්‍යතාව උදෙසා වක්ෆ් අරමුදලින් වක්ෆුල් කිලාබ් යනුවෙන් කොටසක් වෙන්කොට තිබුණු බවට ඉස්ලාමීය ඉතිහාසය දෙස් දෙයි.

2. හිරිහැර නොකිරීම

   සතුන්ට හිරිහැර කිරීමේ ක්‍රියාව ඉස්ලාම් තරයේ ම හෙළා දකී. සතුනට හිරිහැර කිරීම හරාම් යනුවෙන් නීතිවේදීහු සඳහන් කරති. නිදසුන් : බළලාට හිරිහැර කළ කාන්තාවක් අපාගත වූ බව බුහාරියෙහි සඳහන් හදීසයක දැක්වේ.

3. නිශ්චිත සතා මවනු ලැබුවේ කුමකට ද, එම වැඩ කොටස පමණක් උගෙන් ලබා ගැනීම.

   නබි (සල්) තුමා මෙසේ සඳහන් කළේය. එක්තරා මිනිසෙක් ගවයාගේ පිට උඩ ගමන් කරමින් සිටියේ ය. ගවයා මුහුණ හරවා මා මවනු ලැබුණේ මේ සඳහා නොවේ. ගොවිතැන් වැඩට පමණක් මවනු ලැබුවෙමි යි කීය. (බුහාරි)

   ජීවීන්ගේ පිට, උඩ නගින වේදනාවක් ලෙස භාවිතය නොකරන්න යනුවෙන් ද නබි (සල්) තුමා පැවසීය.

   උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමා (රහ්) සිය පාලන සමයේ ගවයකුට හෝ ඔටුවකුට හෝ ඉසිලිහ හැකි බර ප්‍රමාණයන් නිර්ණය කළේය. ඊට වඩා බට පටවන්නාට දඬුවම් කළේය.

4. විවේකය ලබාදීම

   ඔබ තණකොළ සහිත ස්ථාන හරහා ගමන් කරන විට එයින් ඔටුවා ප්‍රයෝජනයක් ලබන්නට ඉඩකඩ සලසන්න. දැඩි නියං සහිත කාලවල ගමන් කරන විට සතා අසීරුවට පත් නොවන පරිද්දෙන් කටයුතු කරන්න. (මුස්ලිම්)

5. පොරවලට ලක් නොකළ යුතුය. මුහුණට පහර නොදිය යුතුය.

   සතුන්ගේ මුහුණට පහර දීම හා හංවඩු ගැසීමේ ක්‍රියාවට නබි (සල්) තුමා ශාප කළේය. (අබූ දාවුද්) සතුන් අතර පොර ඇති කිරීම ද වැළැක්වීය. (අබූදාවුද්)

6. හානිකර සතුන්

   මිනිසුනට හානිකරන සතුන් මරා දැමීමට ඉස්ලාමයෙන් අනුමැතිය ලැබී තිබුණ ද නියත වශයෙන් ම අල්ලාහ් සෑම ක්‍රියාවකදී ම යහපත් ලෙස කටයුතු කරන මෙන් නියම කරයි.

7. ඝාතනය කරන සතුන්

දබ්හි දී පිළිපැදිය යුතු ක්‍රියා පටිපාටිය ගැන ඉස්ලාම් පැහැදිළි ලෙස ඉදිරිපත් කරයි.

එබැවින් මිනිසා සිය පරිසරයේ ජීවත්වන ජීවීන් හා එක් ව වාසය කළ යුතු වේ. අල්කුර්ආනය ද මෙම ජීවීන් ගැන අධික සැලකිල්ලක් දක්වන්නේ ඒ නිසාවෙනි. අල්කුර්ආනයේ බකරා (එළදෙන) අන්ආම් (ගොවිපල් සතුන්), අන්නහ්ල් (මීමැස්සා), අන්නම්ලු (කුහුඹුවා), අල්අන්කබූත් (මකුළුවා) සහ අල්ෆීල් (ඇතා) යන මාතෘකා යටතේ පරිච්ඡේද පහළ කරනු ලැබීමෙන් මේ බව පැහැදිළි වේ.

- ජීවීන් සම්බන්ධයෙන් අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

මිනිසුනි, ගොවිපල් සතුන් ද, මැවුවේ ඔහු (අල්ලාහ්) ය. ඒවායේ ඔබ වෙනුවෙන් (ශීතල වලක්වන) දුම් ද, බොහෝ ප්‍රයෝජන ද තිබේ. ඒවායින් සමහරක් ඔබ අනුභව කරන්නෙහු ය. ඔබ උන් දක්කා (තණ කවා) සවස් භාගයේ දක්කා ගෙන එන විට ද (තණ කැවීමට) උදේ වරුවේ දක්කාගෙන යන විට ද ඒවා ඔබට කදිම වේ. ඉතා අපහසුවෙන් විනා ඔබට හා නොහැකි ප්‍රදේශවලට උන් (ඔබ) ඔබේ බර සහිත බඩු භාණ්ඩ ද උසුළාගෙන යයි. නියත වශයෙන් ම ඔබේ අල්ලාහ් (ඔබට) ඉතා කාරුණිකයාණන්ට හා පිහිටවන්නා ව සිටී. අසුන් හා කොටළුවන් යනාදිය පිට උඩ යාම වශයෙන් (ඔබට) අලංකාරයක් වශයෙන් ද (ඔහු නිර්මාණය කළේය) තවද ඔබ නොදන්නා දේවල් ද ඔහු මවා ඇත.

- මෙම පාඨය මගින් වටහා ගත හැකි කරුණු පහත සඳහන් ලැයිස්තු ගත කළහැකි වේ.

  * ගොවිපල් සතුන් මිනිසුන් සමඟ සමීපව ජීවත්වන ප්‍රාණීන් ය. එබැවින් එබඳු සතුන්ට අදාළ ආරක්ෂාව හා වැදගත්කම ලබා දීම අවශ්‍ය වේ.

  * සතුන්ට ද තරහාව හා ආශාවන් යනාදී හැඟීම් තිබේ.

  * මිනිසුන් විසින් උන්ගෙන් තම ආර්ථික අවශ්‍යතා ඉටුකර ගැනීම පමණක් නොව, ආදරය, කරුණාව හා ළෙන්ගතුකම යනාදිය ඇති කරවන ගුණාංග ද එම සතුන් වෙත පවතී. ඒවා සෞන්දර්යාත්මක හැඟීම් ද ජනිත කරවයි.

- ශාකවලට ආදරය කිරීම

  * මිනිසාගේ පරිසරයෙහි දක්නට ලැබෙන ශාක, පැළෑටි, සම්බන්ධයෙන්ද ඉස්ලාමයෙන් පැහැදිළි චින්තනයක් ඉදිරිපත් කෙරේ. ඒවා අල්ලාහ්ගේ මැවීම් ය. අල්ලාහ්ට අවනතව ක්‍රියාකරයි. අල්ලාහ් ගුණ ගයයි.

  * ශාක ද ජීවය සහිත දේව නිර්මාණ වේ. ඒවාට වේදනාව දැනෙන බව නූතන විද්‍යාවෙන් කියැවේ. නිර්මාණයන් ඉල්ලාහ්ගේ පවුල වේ. ඔහුට බෙහෙවින් ප්‍රිය වනුයේ සිය පවුලට ප්‍රයෝජනවත් වන අයයි. (බුහාරි) ඒ අනුව මුස්ලිම්වරයෙකු අල්ලාහ්ගේ සෑම නිර්මාණයකටම ළෙංගතු වීම අවශ්‍ය වේ.

  * වළාකුළුවලින් අපි ඉතා භාග්‍යවන්ත වර්ෂාව ගෙන්වා, එමගින් බොහෝ උයන් ද (ගොවියන්) අස්වනු නෙළන ධාන්‍ය වර්ග ද, පැලවන්නට සලස්වමු. තට්ටු වශයෙන් (පළතුරු) පිරුණු, වලු සහිත දිගට වැඩෙන ඉඳි ගස් ද, පැල වන්නට සලස්වා එය ගැත්තන්ට බොජුන් බවට පත් කොට, එමගින් මළ භූමිය ජීවමාන කරමු. (50:9-11)

* ජලය ද, එමගින් පණ ගසා ඉස්මතු වන පැළෑටි ද අල්ලාහ්ගේ ආශිර්වාදයක් වශයෙන් සඳහන් කරනු ලැබේ. එනිසා එකී අගනා ආශිර්වාදයන් අපතේ නොයැවිය යුතුය. ඒවා ආරක්ෂා කළ යුතුය. ඒ වනාහි මහ පොළොව සාරවත් කරන්නා වූ සේවයකි.

* ඔබ අතරින් කෙනෙකු අත ඉඳි පැළයක් තිබෙන තත්ත්වය තුළ පරමාන්ත දවස එළැඹෙතැයි තිබුණ ද එය රෝපණය කරන්න. (තිර්මිදි) යනුවෙන් නබි (සල්) තුමා කළ ප්‍රකාශය පැල සිටුවීමේ වැදගත්කම කියා පාන ප්‍රමාණවත් සාක්ෂියකි. මුස්ලිම්වරයකු විසින් රෝපණය කරන ලද ගසකින් හෝ වගාවකින් හෝ පක්ෂීන් හෝ සතුන් හෝ අනුභව කළා නම්, රෝපණය කළ අයට එය සදකා වේ. (බුහාරි)

* පැළෑටි විනාශ කිරීමෙන් පොළොවේ සමතුලනයට හානි සිදුවේ. එයින් මිනිස් ජීවිතයට බලපෑම් සිදුවේ. අලංකාරය තුරන් වේ. පොළොවේ උණුසුම වැඩිවීමට එය හේතු වේ. අවශ්‍යතාවට විනා ගස් කැපීම ඉස්ලාමයෙන් තහනම් වේ. අබූබක්කර් තුමා (රළි) සිය සේනාවට කළ දීර්ඝ උපදේශයෙහි, ගස් නොකපන්න. ඒවා ගිනි නොතබන්න. පළ දරන කිසිම ගසක් නොකපන්නැයි සඳහන් කර තිබේ.

* ඉමාම් බින් හුසයිමා බින් සාබිත් තුමා (රළි) මෙසේ පවසයි. උමර් තුමා (රළි) මගේ පියාණන් අමතා පහත සඳහන් ලෙස විමසනු මට ඇසිණි. ඔබ ඔබේ ඉඩකඩම් වගා නොකිරීමට හේතුව කුමක් ද? එහි දී මගේ පියා, මම මහළු මිනිසෙක්. හෙටම මැරෙන්නට පුළුවන් යනුවෙන් පිළිතුරු දුන්නේය. ඉන්පසු උමර් තුමා (රළි) මගේ පියා සමග එක් ව වගා කරනු දිටිමි. (ජාමිඋල් කබීර්)

* ඉඩම සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගත යුතුය. එහි පැළෑටි සිටුවිය යුතුය. පුරන් ව නොහැරිය යුතුය යන විෂයයෙහි ඉස්ලාම් සැලකිලිමත් වෙයි. තවද, සමාජ ජීවිතය තුළ, මිනිසා පැළෑටිවලට ආදරය කරමින් ඒවා වගා කර ගැනීම ඉබාදතයකැයි ඉස්ලාම් අවධාරණය කරයි.

**මිනිස් අයිතිවාසිකම්**

- මිනිසා මිනිසකු වශයෙන් ජීවත් වීම අවශ්‍ය වේ. ඔහු අල්ලාහ්ගේ නියෝජිතයා වශයෙන් ක්‍රියාත්මක විය යුතුය. මේ සඳහා හෙතෙම ස්වාධීන විය යුතු වේ. ඔහු ස්වාධීන ව ජීවත් වනු පිණිස, ඔහුට හිමි අයිතිවාසිකම් ලබා දීම අවශ්‍ය වේ. උපදින විට මිනිසා ස්වාධීන ලෙස උපදී. හෙතෙම අයිතිවාසිකම් භුක්ති විඳීමේ අවශ්‍යතාවෙන් හා යෝග්‍යතාවෙන් උපත ලබන බව සැබෑවකි.

- ජගත් ඉතිහාසයේ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ සිතුවිල්ල පහළ වූයේ ක්‍රි.ව. 13 වන ශතවර්ෂයේ ආරම්භයේදී යැයි ද ක්‍රි.ව.1215 මහා ප්‍රඥප්තිය මුල්ම නිදහස් ප්‍රඥප්තිය යැයි ද කියනු ලැබේ. එහි වර්ධනයක් ලෙස 1948 හි එක්සත් ජාතීන්ගේ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය බිහිවිය. එහෙත් ඊට ශතවර්ෂ හයකට පෙරාතුව ම ඉස්ලාම්, මිනිස් අයිතිවාසිකම් ගැන සම්පූර්ණයෙන් ම කථා කොට හමාර කළ වග ඉතිහාසය විසින් වසන් කරනු ලබයි.

- මිනිසා කොතැන, කෙසේ පසු වෙතත් මිනිසකු වශයෙන් ඔහුට ලබා දී තිබෙන අයිතිවාසිකම් භුක්ති විඳිය හැකි බව ඉස්ලාමයේ අදහස වේ. ඉස්ලාමය විසින් ලබා දී ඇති අයිතිවාසිකම් මිනිසා සිටින තත්ත්වයට මිස අන් කිසිදු සුදුසුකමකට ලබා දුන්නක් නොවේ. ඉස්ලාමයේ මිනිස් අයිතිවාසිකම අල්ලාහ් විසින් පිරිනමන ලද්දකි. එය කිසිවකු විසින් පැහැර ගැනීමට හෝ අඩු කිරීමට හෝ නුපුළුවන. එය මිනිසකු විසින් දෙනු ලබන්නට හෝ ආපසු ගනු ලබන්නට නුපුළුවන.

එමගින් සැම දෙනාම පාලනය වේ. ස්ථායී වේ. නොවෙනස්වන සුළුය. වෙනස් නොවෙයි. අඛණ්ඩව ක්‍රියාවට නංවනු ලබයි. මේවා ගැන සැලකීමේ දී ඉස්ලාම් විසින් ලබා දී ඇති මිනිස් අයිතිවාසිකම් දිව්‍යමය ස්වභාවයෙන් සැදුම් ලද්දක් බව ද, මනුෂ්‍ය බලපෑම්වලට ලක් නොවන්නක් බව ද පැහැදිළි වේ. මන්ද යත්, රාජ්‍යයන් හෝ පොදු ආයතන හෝ විසින් අයිතිවාසිකම් ලබා දීමෙහි දී, මිනිසාගේ රුචි අරුචිකම් බලපෑම් ඇති කරයි. ඇතැම් විටෙක නැත්නම් ඇතැම් අයවලුන්ට ලබා දෙන අයිතිවාසිකම් ඇතැම් විටෙක හෝ ඇතැම් අයවලුන්ට නිෂේධ වනුයේ ඒ නිසාවෙනි. මෙම තත්ත්වය ඉස්ලාමයෙහි ඇති නොවේ. පාලකයන් සහ පාලිතයන්, අතීතයේ ජීවත් වූවන් හා අනාගතයේ ජීවත් වන්නවුන් යන මේ සියලු දෙනාම එක සමාන අයිතිවාසිකම් භුක්ති විඳිති.

- ඉස්ලාම් විසින් ලබා දී ඇති අයිතිවාසිකම් පහත සඳහන් ලෙස ලැයිස්තුගත කළ හැකි වේ.

  * **ජීවත් වීමේ අයිතිවාසිකම**

  - දරිද්‍රතාව හේතුවෙන් ඔබේ දරුවන් ඝාතනය නොකරන්න. (ඝාතනය නොකරන මෙන් අල්ලාහ් විසින් තහනම් කරන ලද කිසිවකු සාධාරණ හේතු විරහිතව ඝාතනය නොකරන්න. 6:151)
  - ෂිර්කයට අනතුරුව මහා පාපය වශයෙන් මෙය ගැනේ.

  * **ජීවිතය රැක ගැනීමේ අයිතිවාසිකම**

  - යම්කිසි කෙනෙකු වෙනත් කෙනෙකු අසාධාරණ ලෙස ඝාතනය කරන්නේ ද, හේ සියලුම මිනිසුන් ඝාතනය කළාට සමාන වේ. යම්කිසි කෙනෙකු කිසියම් ජීවිතයක් - ආත්මයක් - ජීවත් කරවන්නේ ද හෙතෙම සියලුම මිනිසුන් ජීවත් කළාට සමාන වේ. (5:32)
  - මෙහි දී ඝාතනයෙන් රැකගැනීම යනු, අසාධාරණ ලෙස කෙනෙකු ඝාතනය කිරීම පමණකැයි නොගැනේ. ලෙඩරෝග, තුවාළ, කුසගින්න හා ජලයේ ගිලීම යනාදී මරණයට හේතුවන කරුණුවලින් රැක ගැනීම ද අදහස් වේ.

  * **පතිවත රැක ගැනීමේ අයිතිවාසිකම**

  - (විශ්වාසිකයිනි) ඔබ ගණිකා වෘත්තියට සමීප ද නොවන්න. මන්ද යත් එය අවමන් සහගත මෙන් ම නරක ක්‍රමයක් ද වේ. (17:52)
  - නබි (සල්) තුමා සෑම දෙනාම සෙස්සන්ගේ ජීවිතය, දේපළ හා පතිවත යනාදී කරුණු තුන ආරක්ෂා කරගත යුතු වෙතැයි හජ්ජතුල් විදා දේශනයේ දී අවධාරණය කළේය.

  * **මූලික ජීවන තත්ත්වය අත්කර ගැනීමේ අයිතිවාසිකම**

  - ඔවුන්ගේ ධනයෙන් සිඟමන් යදින්නන්ට හා නොයදින්නන්ට කොටසක් තිබේ. (සියල්ලන්ට ම දන් දෙති.) (51:19) මිනිසාගේ මූලික අවශ්‍යතාවන් වන ආහාර, ඇඳුම්, නිවහන, වෛද්‍ය ප්‍රතිකාර හා අධ්‍යාපනය යනාදිය කෙනෙකු වෙතින් හෝ කිහිප දෙනෙකු වෙතින් ඉල්ලා ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ. උදව් උපකාර කිරීමට කිසිවකු නොමැති විට රැකබලා ගැනීමේ වගකීම රජයට පැවරේ.

* **පෞද්ගලික අයිතිවාසිකම්**

- මෙහිලා පළමුවැනි මිනිසා, පහළකු නොවී නිදහස් ව ජීවත් වීමේ අයිතිවාසිකම වේ. මිනිසුන් තුන් දෙනෙකුට එරෙහිව මම පරලොව ද වාද කරමි. ඔවුන්ගෙන් පළමුවැන්නා, මිනිසුන් වහල්කොට, විකුණා, එම මුදලින් යැපෙන්නා (බුහාරි) යනුවෙන් නබි (සල්) තුමා පැවසීය. ඉස්ලාමය හඳුන්වා දෙනු ලැබූ කාලයේ දී ඊට පෙරාතුව හා පසුව ද, වහල් ක්‍රමය පැවතියේ ය. මෙබඳු වහල් ක්‍රමය ඉස්ලාම් තරයේ හෙළා දකියි. ඔවුන් නිදහස් කරන මෙන් ද, ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා දෙන මෙන් ද අණ කරයි.

* **ඊළඟට, අධිකරණ විභාගයකින් තොරව අත්අඩංගුවේ නොතබා නිදහසේ පසුවන්නන්ට සලස්වන, නිදහස ලබා ගැනීමේ අයිතිවාසිකම**

- නබි (සල්) තුමා දේශනයක් පවත්වමින් සිටිය දී, සභාවේ සිටි කෙනෙක් "තම අසල්වැසියා කිනම් හේතුවක් සඳහා අත්අඩංගුවට පත් ව සිටීදැ"යි ප්‍රශ්න කළේය. ඊට පිළිතුරු නොදී නබි (සල්) තුමා දිගටම කතා කරමින් සිටියහ. ඔහු දෙවන වරටත් නැගිට එම ප්‍රශ්නය නැඟීය. නබි (සල්) තුමා ද කතාව නොනවත්වා ම පවත්වමින් සිටියහ. ඉන්පසු නබි (සල්) තුමා, ප්‍රශ්න නැඟූ පුද්ගලයාගේ අසල්වැසියා නිදහස් කරන මෙන් අදාළ අයට නියෝග කළේය.

* **යම්කිසිවෙකු විසින් කරන ලද වරදකට වෙනත් කෙනෙකු අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවෙන් ආරක්ෂා වීමේ අයිතිවාසිකම**

- පුතා සිදුකළ වරදට පියා, මිතුරා කළ වරදට මිතුරා යනාදී වශයෙන් අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාව ඉස්ලාම් නොඉවසයි. වරදක් නොකළ තැනැත්තෙකු දඬුවම් ලැබීමක් මෙහි දී සිදුවේ. මේ නිසා පෞද්ගලික අයිතිවාසිකමට හානියක් සිදුවේ. කෙනෙකුගේ බර වෙනත් කෙනෙක් නොඋසුලයි. (6:164) යනුවෙන් මෙය අල්කුර්ආනයේ දක්වනු ලැබේ.

* **යුක්තිය ඉල්ලා සිටීමේ අයිතිවාසිකම**

- විශ්වාසිකයනි, යුක්තිය ස්ථාපිත කිරීමේහිලා, අල්ලාහ් වෙනුවෙන් ඔබ දැඩි සාක්ෂිකරුවන් වන්න. මිනිසුන්ගෙන් එක් පිරිසක් කෙරෙහි ඇති ද්වේශය (ඔවුනට) කෲරකම් කරන්නට පොළඹවන්නක් නොවිය යුතුය. (කොතරම් ද්වේශයක් තිබුණද) ඔබ යුක්තියම ඉටු කරන්න

* **සමානාත්මතා අයිතිවාසිකම**

- මිනිසුනි නියතවශයෙන් ම අපි ඔබලා පිරිමියකු හා ගැහැණියකගෙන් නිර්මාණය කළෙමු. ඉන්පසු කෙනෙකු, අනෙකා හඳුනා ගනු පිණිස ඔබ සැම ශාඛා හා ගෝත්‍රිකයන් කළෙමු. (49:13).

- කිසිදු අරාබිවරයෙක් අජම්වරයෙකුට වඩා උසස් නොවේ. කිසිදු අජම්වරයෙක් අරාබිවරයෙකුට වඩා උසස් ද නොවේ. සියලු දෙනා ම ආදම්ගේ දරුවන් ය. ආදම් මවනු ලැබුණේ පස්වලිනි. (බයිහකී)

* **සහාය දැක්වීමේ සහ නොදැක්වීමේ අයිතිවාසිකම**

  - හරක් ද කුසලට හා (අල්ලාහ්ට) බිය බැතියෙන් ඔබලා එකිනෙකාට සහායව සිටින්න. අකුසලයට හා අනිටුකම්වලට ඔබලා එකිනෙකාට සහාය නොදක්වන්න. අල්ලාහ්ට පමණක් බියවන්න. මන්ද යත්, නියත වශයෙන් ම දඬුවම් කිරීමෙහිලා අල්ලාහ් දැඩි ය. (5:2)

- ජීවිතයට හා දේපළ ධනයට ආරක්ෂාව ලැබීමේ අයිතිවාසිකම

යම්කිසිවකු කිසියම් විශ්වාසිකයකු (ඔහු විශ්වාසිකයකු බව හොඳින් දැන සිටිය දී) සිතාමතා ම ඝාතනය කළේ නම්, ඔහුට අදාළ දඬුවම අපායයි. ඔහු එහි සදහටම රැඳෙන්නේ ය. අල්ලාහ් ඔහු කෙරෙහි කුපිතව ඔහුට ශාප ද කරන්නේ ය. හැරත් ඉමහත් වේදනාව ද ඔහු වෙනුවෙන් වෙන් කොට තිබේ. (4:93) මළවුන් නැගිටුවනු ලබන දිනයේ ඔබේ පරම හිමියා, හමුවන තාක් ඔබේ ජීවිතහා සන්තක දේවල් එකිනෙකා පැහැර ගැනීම තහනම් කොට ඇතැයි නබි (සල්) තුමා සිය හජ්ජතුල් විදා දේශනයේ දී සඳහන් කළේය.

- මානව ගරුත්වය ආරක්ෂා කිරීමේ අයිතිවාසිකම

විශ්වාසිකයිනි, කිසිදු පිරිමියෙකු අන්කිසිදු පිරිමියෙකුට සරදම් නොකරන්න. ඔවුන් (සරදම් කරන) මොවුන්ට වඩා උසස් වන්නට පුළුවන. (එමෙන් ම) කිසිදු ගැහැණියක අන් කිසිදු ගැහැණියකට සරදම් නොකරන්න, ඔවුන් (සරදම් කරන) මොවුන්ට වඩා උසස් වන්නට පුළුවන. ඔබ අතරින් කෙනෙකු අනෙක් පුද්ගලයා ගැනපහත්කොට කතා නොකරන්න. ඔබ අතරින් කෙනෙකු (නරක) නම් පට නොබඳින්න. විශ්වාසය තැබීමෙන් පසු නරක පටබැඳි නම්, මහත් පාපයකි. (මේවායින්) නොවැළකුණෝ කවුරුන්ද, දුෂ්ඨයෝ ඔවුහුම ය. (49:11)

- පෞද්ගලික ජීවිතයේ ගරුත්වය ආරක්ෂා කිරීමේ අයිතිවාසිකම

විශ්වාසිකයනි, සැක සාංකාවලින් බොහෝවිට ඔබ වළකින්න. මන්ද යත්, ඇතැම් කරුණුවල දී සැක කිරීම අකුසලයකි. (කිසිදු කෙනෙකුගේ වංහුං ගැන) ඔබ හාරා විමසීමෙන් බැහැර වන්න. (49:12)

විශ්වාසකයනි, ඔබේ නොවන ගෙවලට ඔබට (පිවිසෙන්නට සිදුවේ නම්) එහි සිටින අයට සලාම් කියා (ඔවුන්ගේ අවසරය ලැබෙන තාක්) නොපිවිසෙන්න. මෙසේ හැසිරීම ඔබටම ඉතා යහපත් වේ. (මෙය අමතක නොකොට) ඔබ සැලකිලිමත් වන්න. (24:27)

කෙනෙකු ඔහුගේම නිවසට වුව ද හදිසියෙන් ම හෝ රහසින් නොපිවිසිය යුතු බව නබි (සල්) තුමා පවසා තිබේ. පිට අයගේ නිවෙස් තියුණු ලෙස බැලීම ද තහනම් කොට තිබේ.

- දුෂ්ට පාලනයට එරෙහිව සටන් වැදීමේ අයිතිවාසිකම

අසාධාරණයට ලක්වූවන් හැර අන් කිසිවෙකු කිසිදු කෙනෙකුට ප්‍රසිද්ධියේ නරක වචනවලින් කෑමොර දීමේ ක්‍රියාව අල්ලාහ් ප්‍රිය කරන්නේ නම නැත. (4:148)

- අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම

විශ්වාසය තැබූ පිරිමි හා විශ්වාසය තැබූ ගැහැණු (එකිනෙකා) ආරක්ෂා කර ගනිති. ඔවුහු (කෙනෙකු අනෙකාට යහපත අණවමින්) අයහපත වළක්වමින් (පසුවෙති) (9:71)

මොවුන්ට අප විසින් පාලන බලය ලබාදුන් කල්හි යහපතට අණවති. අයහපත් දේවලින් වළක්වති. (22:41)

ඔබ අතරින් යම් කිසිවකු නපුර දුටුකළ එය සිය දොහොත්වලින් වැළැක්විය යුතුය. නොහැකි නම් දිවෙන් (වචනවලින්) වැළැක්විය යුතුය. එසේත් නොහැකි කළ සිතෙන් හෙළා දැකිය යුතුය. මෙය ඊමානයේ දුබල මට්ටමයි. (මුස්ලිම්)

- රැස්වීම් පැවැත්වීමේ අයිතිවාසිකම

(විශ්වාසිකයිනි) ඔබ අතරින් පිරිසක් ඉදිරිපත් වී ඔවුන් (මිනිසුන්ට) යහපත කරා කැඳවමින් අයහපතින් වළක්වමින් සිටින්න. ජයග්‍රාහක වනුයේ මෙබඳු අයයි. (3:104)

- වත් පිළිවෙත් ඉටුකිරීමේ අයිතිවාසිකම

(ඉස්ලාම්) ආගමෙහි බල කිරීමක් නැත. මංමුළාවෙන් නිසි මාර්ගය පැහැදිළි විය. (2:256)

ආගම් ලද අයවලුන් සමඟ ශිෂ්ට සම්පන්න ප්‍රයමනාප විලාශයෙන් විනා වාද නොකරන්න. (26:46)

අල්ලාහ් නොවන යම් දෙයක් ඔවුන් කැඳවත් ද ඒවාට ඔබ පරිභව නොකරන්න. (6:104)

- දේශපාලන කටයුතුවලට සහභාගී වීමේ අයිතිවාසිකම

ඔවුන්ගේ සෑම කටයුත්තක්ම තමන් තුළ සාකච්ඡා කර ගනිති. ඔබ අතරින් කිසිවකු සැබෑ වශයෙන්ම විශ්වාසය තබා සත්ක්‍රියා කළේ නම්, පූර්වගාමීන් (මහපොළොවට) අධිපතීන් බවට පත් කළා සේ ම මොවුන් ද, මහ පොළොවට අධිපතීන් බවට පත් කරන බව ද ඔහුට රිසි ආගමෙහි ද මොවුන් ස්ථාපිත කැර තබන බව ද, මොවුන් බිය, සංහිඳියාව හා සුරක්ෂිතභාවයට පත් කරන බව ද නියත වශයෙන් ම අල්ලාහ් පොරොන්දු වී තිබේ. (24:55)

ඉහත සඳහන් කළ සියලුම අයිතිවාසිකම් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයටම පොදු වූවකි. ඉස්ලාමය හඳුන්වා දෙනු ලැබූ අවධියේ පුරුෂ පක්ෂය අයිතිවාසිකම් සහිතව ජීවත් වූහ. එහෙත් සමහර කොටස්වලට අයිතිවාසිකම් අහිමි වී තිබුණි. බලවතා දුබලයන් පාගාගෙන අයිතිවාසිකම් නොදී සිටි තත්ත්වයක් පැවතිණි. කාන්තාවන් සම්බන්ධයෙන් සලකන කල, ඔවුහු බොහෝවිට අයිතිවාසිකම් අහිමි කරන ලද්දෝ වූහ. යම් යම් උදවිය පමණක් අයිතිවාසිකම් ලබා සිටියහ. කාන්තාවන්ට ජීවත් වීමේ අයිතිය නොවීය. එනම් පුරුෂ පක්ෂයට නොහොත් සමාජ සම්ප්‍රදායයට අනුව තම ජීවන රටාව පවත්වාගත යුතු තත්ත්වයක් දක්නට තිබිණි. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, අධ්‍යාපනය ලැබීමේ නිදහස හා විවාහ වීමේ නිදහස යනාදිය අහිමි වී දක්නට විය. මෙසේ ලබා දුන් සියලුම අයිතිවාසිකම් ඉස්ලාමය විසින් ලබා දෙන ලදී. පිරිමියාට හා කාන්තාවන්ට සමානාත්මතාව යනු සෙසු ප්‍රජාවන්වල දක්නට ලැබෙනවාට වඩා ඉස්ලාමයෙහි වෙනස් වේ. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයම ස්වභාවය හා ක්‍රියාකාරකම් අනුව, ඇතැම් කරුණුවල දී පිරිමින්ට ද, තවත් යම් යම් කරුණුවල දී කාන්තාවන්ට ද ප්‍රමුඛතාව සලසා දී තිබේ. නායකත්ව වගකීම සම්බන්ධයෙන් පිරිමියාට ද, දරුවන් හදාවඩා ගැනීම සම්බන්ධයෙන් ගැහැණියට ද ප්‍රමුඛතාව සලසා තිබීම නිදසුනක් කොට දක්වන්නට පුළුවන.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

පියවර 1 : ඉස්ලාමීය සමාජ ජීවිතයේ වැදගත්කම, සමාජ ව්‍යූහයේ, විශේෂාංග, සමාජයේ කේන්ද්‍රස්ථානය වශයෙන් මස්ජිදය ආදිය පිළිබඳව සිසුන්ට විස්තර කරන්න.

පියවර 2 : සිසුන් කණ්ඩායම් හතරකට බෙදා එක් එක් කණ්ඩායමට පහත සඳහන් මාතෘකා ලබා දෙමින් ඒ ගැන තොරතුරු සෙවීමට මග පෙන්වන්න.

* ඉස්ලාමීය සමාජ ජීවිතයේ වැදගත්කම, සමාජ සාධාරණත්වය, සාමූහික වගකීම් සහ නායකත්වය පිළිබඳව ඉස්ලාමීය දැක්ම
* වත්මන් මස්ජිදවල තත්ත්වය හා ඒවා පුනර්නිර්මාණය කිරීමට උපදෙස්
* ජාතීන් අතර යහපත් සම්බන්ධතාවන් ගොඩනැගීමට ඉස්ලාමයෙන් ලැබෙන උපදෙස්

පියවර 3 : කණ්ඩායම් එකිනෙක රැස්කර ගත් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.

පියවර 4 : අදහස් හුවමාරුවේ සාරාංශය ලියාගන්නට දැනුවත් කරන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. ගස්සාලි මුහම්මද්, (2004) ඉස්ලාමීය ඔලුක්ක මාන්බුහල්, ඉලක්කිය සේලයි ප්‍රකාශකයෝ, චෙන්නයි.
2. හමුදා අල්අත්ති, 61985) ඉස්ලාම් උංගල් පාර්වයිකු I.I.F.S.O. කුවයිට්
3. මුස්තෆා සිෆාඊ (1999), ඉස්ලාමීය නාහරීම් , ඉලක්කිය සෝලයි, චෙන්නයි.
4. නිලිර් එම්. එච්. එම්. , ඉස්ලාමීය නාහරිහත්තීන් කොට්රමුම් වලර්චියුම් (1985), අෂ්ෂබාබ් මුද්‍රණාලය, කොළඹ.
5. අමීන් සී.එම්.ඒ. (1988), සමූහ පුනරමයිල් මස්ජිද් හලින් පංගු , රේන්ටා මුද්‍රණාලය, තිහාරිය,
6. මව්දූදි මව්ලානා, (2001) ඉස්ලාත්තිල් මනිද උරිමයිහල්
7. අලවි ආසිම්, (2005) තලයිමත්තුවම් ඕර් ඉස්ලාමීය අනුහල් (2005), ඉස්ලාමික් පබ්ලිකේෂන් සෙන්ටර්, කොළඹ.
8. මුහම්මද් කුතුබ් (1978) , අය්යමුම් තෙලිවුම් ,ඉස්ලමික් පබ්ලිකේෂන් සෙන්ටර්, කොළඹ.
9. මුස්තෆා මනවයි (1996), ඉස්ලාවුම් සමය නල්ලිහක්කමුම් , සව්දා පබ්ලිකේෂන්, චෙන්නායි
10. අක්රම්, මුහම්මද් (2003), නබයිමුරයිකේට්ර ඉස්ලාම් , මුසල්මාන් මුද්‍රණාලය, පස්යාල
11. ෂුක්රි එම්. ඒ. එම්. (1995), ඉස්ලාත්තිල් මනිද උරිමයිහල් , බේරුවල ඉස්ලාමීය වෙලියීට්ටුප් පර්යහම්

**නිපුණතාව 9.0 : සමාජ ජීවිතය හා සම්බන්ධ ඉස්ලාමීය නීතිරීති හා උපදේශ දැන ඒ අනුව සිය ජීවිතය සකස් කර ගනියි.**

**නිපුණතා මට්ටම 9.2 :** වෘත්තීය හා ව්‍යාපාරික කටයුතුවල දී ඉස්ලාමීය විධිවිධාන වටහාගෙන පිළිපදියි.

**කාලය :** කාල පරිච්ඡේද 40

**ඉගෙනුම් ඵල :**

- ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ විශේෂාංග දැන පවසයි.
- ඉපැයීමට ඉස්ලාම් ලබා දී ඇති වැදගත්කම හා පිළිවෙත් විස්තර කරයි.
- වෘත්තීය හා ව්‍යාපාරික කටයුතුවල දී වෙළෙඳාම, කෘෂිකර්මය, හස්ත කර්මාන්තය, සේවා සම්බන්ධ නීති රීති හා පිළිවෙළ සාක්ෂි සමඟ ඉදිරිපත් කරයි.
- සමාජ ජීවිතය හා සම්බන්ධ ගනුදෙනු පිළිබඳව වටහාගෙන සෙස්සන් සමඟ අදහස් හුවමාරු කර ගනියි.
- ඉස්ලාම් වළක්වා ඇති ආර්ථික ක්‍රියාකාරකම්වලින් වැළකී සිටියි.
- ඉස්ලාම් පසු උරුමය පිළිබඳ නීතියේ වැදගත්කම් හා පිළිවෙත් වටහාගෙන පවසයි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

### ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ විශේෂාංග

- මිනිසාගේ අවශ්‍යතාවයන් හා ඒවා ඉටු කිරීමට උපයෝගී වන ස්වභාවයේ ආශිර්වාදය අතර පවතින මිනිස් ක්‍රියාකාරකම් ගැන අධ්‍යයනය කරන විෂයයෙහි මිනිසාගේ මූලික අවශ්‍යතා ලෙස සැලකෙන්නේ ආහාර, ඇඳුම්, වාසස්ථාන, ආදායම යනාදියයි. මේවා ඉටු කිරීම සඳහා ධනවාදය, සමාජවාදය වැනි ආර්ථික ක්‍රම බිහි විය. අඩුපාඩුකම්වලින් යුත් මෙම ආර්ථික ක්‍රම දිනෙන් දින ආර්ථිකය ආශ්‍රිත ගැටලු බිහිකරමින් සිටී. ජීවිතයේ අනෙක් අංග පසෙකලා ආර්ථික සමෘද්ධිය පමණක් ඉලක්ක කරගෙන මේවා ක්‍රියාත්මක වන නිසා මිනිස් ජීවිතයේ අනෙකුත් අංග බලපෑම්වලට ලක් වෙමින් තිබීම දැකිය හැකිය.
- ඉස්ලාම් ආධ්‍යාත්මික වර්ධනයක් සහිත ආර්ථික වර්ධනය සැලසුම් කර ඇත. එනමුත් මෙම දෙවිදියේ සංවර්ධනයෙන් ලෝකය මුළුමනින් ජයග්‍රහණය ලැබිය යුතු නම්, ඉස්ලාමයේ විවිධ අංග සමකාලීනව සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක විය යුතුය. ඊට පටහැනිව එහි එක් කොටසක් පමණක් ක්‍රියාත්මක කර අනෙක් කොටස් අතහැරීම මගින් බලාපොරොත්තු වන පූර්ණ සංවර්ධනය දැක ගත නොහැකි වේ.

  ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ විශේෂ ගුණාංග

  1. අල්ලාගෙන් ලබා ගන්නා ලද දේව ගුණයෙන් සමන්විත ය.

     භාවිතයේ තිබෙන ආර්ථික ක්‍රම මිනිස් සිතුවිලිවලින් බිහි වූ ඒවා ය. එමනිසා එහි මිනිස් දුර්වලතා වැඩියෙන් දක්නට තිබේ. නමුත් ඉස්ලාමීය ආර්ථික සිද්ධාන්ත වහී හි මග පෙන්වීමෙන්

ගොඩනංවා ඇති නිසා එහි දේව ගුණය දක්නට ලැබේ. මේ නිසා මෙය පරිපූර්ණ හා ඉතා සුදුසු ආර්ථික ක්‍රමයක් වේ.

2. සමකාලීනව නම්‍යශීලී නොවන ගුණයෙන් හා නම්‍යශීලී වන ගුණයෙන් ක්‍රියාත්මක වන ආර්ථික ක්‍රමය

මෙහි දේවත්ව ගුණය සහිත කොටස නම්‍යශීලී නොවන ලෙසත් ඉජ්තිහාදයට නොහොත් පර්යේෂණයට අයත් කොටස නම්‍යශීලී ගුණය සහිතවත් තිබේ. එමනිසා මෙම ආර්ථික ක්‍රමය සියලු කාලවලට සරිලන ආකාරයට පවතී.

අනම්‍යශීලී ආර්ථික විධිවිධාන

- මෙම විශ්වයේ පවතින සියලු සම්පත් අල්ලාහ්ට අයත් ය. අල්ලාහ් අණ පනත්වලට අනුවම මිනිසා ඒවා උපයෝගී කළ හැක. තවද අහස්වල හා පොළොවේ ඇති සියල්ල අල්ලාහ්ට අයත් ය. (53:31)

- මිනිසාගේ මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමට මෙම සම්පත් උපයෝගී කර ගැනීම සහතික කර ඇත. එක් එක් පුද්ගලයෙකුගේ මූලික ආර්ථික අවශ්‍යතාවයන් ඉටුකර දීමේ වගකීම මෙම ආර්ථික ක්‍රමය භාරගෙන ඇත. ඔවුන්ගේ ධනයෙන් ඉල්ලන්නන්ටත්, ඉල්ලන්නේ නැති අයටත් කිසියම් අයිතියක් ඇත. (70:24-25) නබි (සල්) තුමා. පහසුකම් නැති අයගේ වගකීම භාරගැනීම මගේ යුතුකම ය. එවැන්නන් මා වෙතට පැමිණෙත්වා (හාකිම්) යනුවෙන් පැවසූහ.

- ධනය චක්‍රීකරණය සඳහා ඉස්ලාමීය ආර්ථික ක්‍රමය මග පාදයි. එමනිසා පිරිසක් වෙත ධනය රැස්වී අසමතුලිත තත්ත්වයක් බිහිවීම මෙමගින් වළක්වාලයි. ධනය ඔබ අතර සිටින ධනවතුන් අතර පමණක් චක්‍රීයගත නොවී තිබීම සඳහා . . . (59:7) යන අල්කුර්ආන් වැකිය මෙම විධිවිධානය ස්ථිර කරයි.

- වස්තූන් පිළිබඳ පුද්ගලික අයිතිය ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ සහතික කරනු ලැබ ඇත. එනම් වස්තුව තබා ගැනීමේ අයිතිය හා වියදම් කිරීමේ අයිතිය ඔහුට ලබා දී ඇත. පිරිමින් ඉපැයූ දේවල් පිරිමින්ට අයත් ය. කාන්තාවන් ඉපැයූ දේවල් ඔවුන්ටත්. (4:32) යන අල්කුර්ආන් වාක්‍යය මෙම විධිවිධානය ස්ථිර කරයි.

- ඉස්ලාමීය ආර්ථික සිද්ධාන්තයේ ආර්ථික නිදහස සීමා කර තිබේ. ජීවිත අවශ්‍යතා සොයන විට කුර්ආන් හා සුන්නා පැනවූ නීතිරීති කඩකළ නොහැක. එය අනුමත කරන ලද ඉපැයීම් ක්‍රමය, වළක්වන ලද ඉපැයීම් ක්‍රමය යනාදී ලෙස වර්ග දෙකට බෙදී ඇත. ඔබලාගේ ධනය ඔබ අතරේ අසාධාරණ ලෙස නොගිලින්න. (2:188) යනුවෙන් කුර්ආනය අණ කරයි.

- වියදම් ක්‍රමවත් කර නාස්තිය වළක්වයි. බොරු ආටෝපය වළක්වා ගත යුතුය. සීමාව ඉක්මවා නාස්ති නොකරන්න. නියත වශයෙන් ම නාස්ති කරන්නන් ෂෛතාන්ගේ සහෝදරයන් වන්නෝ ය. (17:26) යන කුර්ආන් වැකිය මෙම රීතිය ගෙන දෙයි.

- ඉහත සඳහන් විධිවිධානයන් සියල්ල කාලය අනුව හෝ ප්‍රදේශය අනුව වෙනස් වන්නේ නැත. කොතැනකදීත්, කුමන කාලයේදීත්, මේවා ස්ථිරවම පවතියි. මේවා වෙනත් මතවලට ඉඩක් නොතබන දේව ගුණයක් සහිත විධිවිධානයන් ය.

නම්‍යශීලීතාවයක් සහිත හෝ පර්යේෂණයට ලක්කළ හැකි විධිවිධාන

- ආර්ථික කටයුතුවල දී රජයේ මැදිහත්වීමේ ප්‍රමාණය තීරණය කරන ක්‍රියාමාර්ග
- සමාජ නීතිය පිහිටුවාලීම සඳහා වන ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම
- කාලීන ආර්ථික තත්ත්වයන්ට අනුව ආර්ථික සැලසුම් ඇති කර ක්‍රියාවට නැංවීම.
- ආර්ථික අංශ, පොදු අයිතිය තනි අයිතිය ලෙස වෙනස් කිරීම් සම්බන්ධ සීමාවන් ගෙන ඒම.
- වේතන සම්බන්ධ තීරණයන් ගැනීම.
- පොළිය හා සම්බන්ධ ක්‍රියාකාරකම් පැහැදිළි කිරීම.
- වෙනස් නොවන නීති, වෙනස් වන නීති ආශ්‍රිත ව ඉස්ලාමීය ආර්ථිකය චක්‍රීයනය වන නිසා එය යහපත් ආර්ථික ක්‍රමයක් ලෙස ස්ථාවර වී ඇත.

3. ස්වභාව ධර්මයට හා මිනිස් ස්වභාවයට උචිත ආර්ථික ක්‍රමය

   ස්වභාව ධර්මයාගේ නීති කඩකිරීමට හෝ මිනිස් ස්වභාවයන් සමඟ මිශ්‍ර වී ජීවිත සිද්ධාන්ත විනාශ කිරීමට හෝ ඉස්ලාමීය ආර්ථික ක්‍රමය ඉඩ දෙන්නේ නැත. උදාහරණයක් වශයෙන් දුරාචාරය ආදායම් ඉපැයීමේ මාර්ගයක් ලෙස ගැනීම ඉස්ලාම් තහනම් කර ඇත. එය ස්වභාව ධර්මයේ නීතිය කඩ කිරීමකි. මත්පැන් නිෂ්පාදනය, බෙදාහැරීම, භාවිතය යනාදිය ඉස්ලාම් වළක්වාලයි. ඒවා මිනිස් ස්වභාවය වෙනස් කරන නිසා ය. ඔබ දුරාචාරය වෙත ළංවෙන්න එපා. නියත වශයෙන් ම එය ලැජ්ජා රහිත දෙයකි. තවද (වෙනත් විනාශයක් කරා රැගෙන යන) වැරදි මාර්ගයක් ද වන්නේ ය. (17:32) (5:90-91 බලන්න) මත් කරවන සියල්ල මත්ද්‍රව්‍ය වේ. සියලු මත්ද්‍රව්‍ය හරාම් වේ. (මුස්ලිම්)

4. ඉස්ලාමීය ආර්ථික ක්‍රමය සදාචාරයටත්, සංස්කෘතියටත් මූලිකත්වය දෙන ආර්ථික ක්‍රමයකි. කුමන වර්ගයට අයත් නිෂ්පාදනයක් වුව ද බෙදාහැරීමක් වුව ද පරිභෝජනය වුව ද එය සදාචාරය හා සංස්කෘතිය නැති කරයි නම් ඉස්ලාම් එය අනුමත කරන්නේ නැත. උදාහරණයක් වශයෙන් ඇඳුම් නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය, චිත්‍රපටි නිෂ්පාදනය, ප්‍රකාශනය, බැලීමට ඉස්ලාමීය සදාචාරය, සංස්කෘතියට පටහැනි වෙතොත් ඉස්ලාම් එය අනුමත කරන්නේ නැත.

5. සමාජ යහපත හා පුද්ගලික යහපත අතර හඳුනා ගැනෙන ආර්ථික ක්‍රමය භාවිතයේ පවතින ආර්ථික ක්‍රමවලින් ධනවාදය පුද්ගලික යහපත පමණක් අරමුණු කරගෙන ක්‍රියාත්මක වේ. සමාජවාදී ආර්ථික ක්‍රමය සමාජ යහපත පමණක් සැලකිල්ලට ගනියි. නමුත් ඉස්ලාමීය ආර්ථික ක්‍රමයෙහි මිනිසාගේ විශේෂත්වය ක්‍රමානුකූල ව වර්ධනය කර ගැනීමටත් සමාජ යහපත සුරැකීමටත්, උපදේශයන් ඉදිරිපත් කර ඇත. එකක් වෙනුවෙන් තවෙකක් නැති කරගැනීම ඉස්ලාම් අනුමත කරන්නේ නැත. එකක් අනෙක මත රැඳෙමින් අවශ්‍යතාවය ඉටු කිරීමේ ක්‍රමයෙන් එය ක්‍රියාත්මක වේ.

6. ඉස්ලාමීය ආර්ථික ක්‍රමය අධ්‍යාත්මික අවශ්‍යතාවය, ලෞකික අවශ්‍යතාවය යනාදිය සැලකිල්ලට ගෙන ආර්ථික ක්‍රියාවලින් ක්‍රියාත්මක කරයි. මිනිසා ශරීරය, ආත්මය හා දැනුම යනාදියෙන් සමන්විත වන නිසා හුදෙක් ම ලාභය පමණක් සැලකිල්ලට ගෙන හෝ ශාරීරික අවශ්‍යතා

පමණක් සැලකිල්ලට ගෙන හෝ ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කරවන්නේ නැත. අධ්‍යාත්මික අවශ්‍යතා හා ලෞකික අවශ්‍යතා සැලකිල්ලට ගෙන ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කරයි. මෙනිසා මිනිස් හරයයන් ආරක්ෂා කෙරේ.

7. මෙම ක්‍රමය දිව්‍යමය ස්වභාවය දරන්නක් බැවින් එය ආශිර්වාදාත්ම, සංවර්ධනාත්මක වූවකි. අතීතයේ මැනවින් ක්‍රියාවට නංවන ලද කාල වකවානුවල එහි සශ්‍රීකත්වය දකින්නට පුළුවන් විය. මෙම අර්ථ ක්‍රමය අත්හැර දමන ලද නිසා, වත්මන් අර්ථ ක්‍රමය කරණකොට ගෙන ජීවිතයෙහි ගැටලු පැන නැගී තිබෙන බව දකින්නට පුළුවන.

8. ඉස්ලාමීය ආර්ථික ක්‍රියාකාරකම ඉබාදත් වශයෙන් සලකනු ලබයි. එය අල්ලාහ්ගේ නියමයනට අනුරූපී ව ක්‍රියාත්මක කරනු ලබන බැවින් ය, එය ඉබාදතයක් වනුයේ.

**ධනය ඉපැයීම සඳහා ඉස්ලාමයෙන් ලැබී තිබෙන වැදගත්කම**

ධනය ඉපැයීමට හෝ උපයා ජීවත්වීමට ඉස්ලාම් දී ඇති වැදගත්කම

- මිනිසා අල්ලාහ්ගේ නියෝජිතයන් වන බැවින් ඔහුගේ යැපීමට අවශ්‍ය පහසුකම් අල්ලාහ් විසින් මෙම විශ්වය තුළ සලසා දී තිබේ. ජීවත්වීම සඳහා පහසුවෙන් ලබාගත හැකි පරිද්දෙන් අත්‍යාවශ්‍ය දේවල් සකසා දී තිබේ. වෙනත් ඇතැම් පහසුකම් සොයා ලබාගත හැකි පරිද්දෙන් සකසා දී තිබේ. මෙනයින් මිනිසා තමාට අදාළ ජීවන අවශ්‍යතාවන් සොයා ලබා ගන්නා පරිශ්‍රමය ධනය සෙවීම හෙවත් ඉපැයීම වශයෙන් ඉස්ලාමයෙහි හඳුන්වනු ලැබේ.

- ඔබට මෙම මහපොළොව ඇතිරිල්ලක් කෙළේ ඔහුය. එබැවින් එහි සෑම දිග්භාගයකටම ගොස් ඔබට ලබා දී තිබෙන දේවල් අනුභව කරන්න. (67:15)

- පරලොවෙහි දී කිසිදු බිය සැකයකින් තොරව අල්ලාහ් මුණගැසෙන්නට පුළුවන. ශ්‍රමිකයන්ගේ වේතන, සාධාරණ ලෙස ගෙවීම අවශ්‍ය වේ.

වෘත්තීය ක්‍රියාකාරකම් අතරින් වෙළහෙළඳාම

- ඉස්ලාමය විසින් අනුමත කරන ලද ගනුදෙනු අතර (අල්ෆයිඋ) වෙළෙඳාම ද වේ. වෙළෙඳාම යනු අලෙවිකරු සහ ගැනුම්කරු, වෙළෙන්දා සහ පාරිභෝගිකයා අනුමත ක්‍රමයට වූ කැමැත්ත පරිදි, ප්‍රතිලාභ ලබාගෙන, තනිව අයිති වස්තුවක්, කෙනෙකු අනෙකාට දීම වෙයි.

- අල්ලාහ් වෙළෙඳාම හලාල් කොට පොළිය තහනම් කළේය. (අල්කුර්ආනය 2:275)

- ශ්‍රමයෙහි උසස් වන්නේ කුමක්දැයි නබි (සල්) තුමාගෙන් විමසන ලද විට ඇඟපත මහන්සියෙන් කරන රැකියාව සහ අවංක වෙළෙඳාම බව එතුමා පිළිතුරු දුන්නේ ය. (අහ්මද්)

- ඉස්ලාම්, වෙළෙඳාම අනුමත කොට තිබෙන බව ඉහත සඳහන් කුර්ආන් සහ හදීස ඉගැන්වීම්වලින් සහතික වේ.

- වෙළහෙළඳාම් පිණිස වන සියලුම මංපෙත් අල්ලාහ් විසින් සකසා දී තිබේ. මිහිපිට සෑම දිග්භාගයකම විවිධ වර්ගයේ භාණ්ඩ අල්ලාහ් ඉස්මතු කරයි. ඒවා ගොඩබිම් මාර්ගවලත්, සමුදුරු වාර්ගයේ හා ගුවනින් ප්‍රවාහනය කිරීමේ පහසුකම මිනිසාට ලැබී තිබේ. ඒවා හුවමාරු කර ගැනීමේ පහසුකම් සලසා දී තිබේ. මේ සියල්ල සාධාරණ ලෙස භාවිතය කරමින් වෙළෙහෙළඳාම්වල යෙදෙන්නාට ගෞරවය හා දියුණුව හිමි වේ.

- විශ්වාසවන්ත සත්‍යවාදී වෙළෙන්දා, පරලොවෙහි දී නබිවරුන්, සිද්දීකීන් (සත්‍යවාදීන්) සහ සුහදාවරුන් සමග සිටී. (ඉබ්නු මාජා)

- ඉස්ලාමයෙහි, වෙළෙහෙළෙඳාම ඉබාදත් වශයෙන් සලකනු ලබන බැවින් ඒ සඳහා නීතිරීති සකසා ඇත.

- වෙළෙහෙළෙඳාම් පිළිබඳ නීතිරීතීන් අතර එය ඉටුවීම පිණිස වන කොන්දේසි වැදගත් වේ.

  * මුස්ලිම්වරුනි, ගිවිසුම් ඉටු කරන්න. (5:1)

  * මුස්ලිම්වරු තමන්ගේ ෂර්ත ඉටුකිරීමට බැඳී සිටිති (අහ්මද්)

- වෙළෙහෙළෙඳාම් පිළිබඳ කොන්දේසි පිළිපැදීම මුස්ලිම් වෙළෙඳුන්ගේ වගකීම වේ.

  1. ගැනුම්කරුවන් හා අලෙවිකරුවන් හොඳ සිහියක් නැති, බීමත් ව පසුවන, මන්දබුද්ධික හෝ හයහතර නොතේරෙන දරුවන් හෝ නොවිය යුතු වේ.

  2. වෙළෙඳ භාණ්ඩය

     වෙළෙඳ භාණ්ඩ. පිරිසිදු හා ප්‍රයෝජනවත් ඒවා විය යුතුය. එසේ නොව, නජීස් තහනම් කරන ලද හෝ නිෂ්ඵලදායක දෙයක් හෝ නොවිය යුතුය. නිදසුනක් වශයෙන් සත්ත්ව මළකුණු, සූකර මාංශ, නිසි ලෙස නොකපන ලද සත්ත්ව මාංශ, ප්‍රතිමාවන්, වාද්‍ය භාණ්ඩ, පහත් හැඟීම් කුළුගන්වන ගී තැටි, පින්තූර, වීඩියෝ කැසට් පට හෝ මත්ද්‍රව්‍ය යනාදිය අලෙවි කිරීම ඉස්ලාමය විසින් තහනම් කැරෙන බව සඳහන් කළ හැකි වේ. මේවා අධ්‍යාත්මික, සාමාජික, ආර්ථික, සෞඛ්‍යමය හා සදාචාරාත්මක දුර්විපාක අත්කැර දෙන ඒවා ය.

     ඉබේම මියගිය (සතුන්), රුධිරය,, සූකර මාංශ සහ අල්ලාහ් නොවන දේවල නම් කියන ලද ඒවාය ඔබට හරාම් කර තිබෙනුයේ. (2:173)

     නියත වශයෙන් ම අල්ලාහ් සහ ඔහුගේ දූතයා, මත්පැන්, මියගිය සතුන්, ඌරන්, පිළිම ආදියෙහි වෙළෙහෙළෙඳාම තහනම් කළහ. (බුහාරි)

- වෙළෙඳ භාන්ඩය, විකුණන්නාට අයිතිවූවක් වියයුතු අතර, ගැනුම්කරුට ලබාගත හැකි දෙයක් හා තත් කාලයේ සතුව තිබෙන්නක් විය යුතුය. තව කෙනෙකුට හෝ රජයට හෝ අයත් දෙයක් විකුණන්නට නුපුළුවන. එමෙන් ම මුහුදේ ඇති මසුන්, අහසේ පියාසර කරන පක්ෂීන් සහ නොඉදුණු පලතුරු යනාදිය ද නිදසුන් කොට දැක්විය හැකි වේ.

- අයිති නැති දේවල වෙළෙඳාමක් නැත. (හදීස්)

- අල්ලාහ් පලතුර තහනම් කළා නම්, ඔබ අතරින් කිසියම් කෙනෙකු සිය සහෝදරයාගේ වස්තුව ගත යුත්තේ'මන් ද ? (බුහාරි)

- භාණ්ඩය ද, මිලද නිශ්චිත වශයෙන් දැනුවත් නොවූ දේවල් ද අලෙවි කිරීම තහනම් කැර තිබේ. එහෙත් ඇසට නොපෙනෙන අදපෙන ගුණය ගැන දැනුවත් ව සිටින්නේ නම් අලෙවි කළ හැකි වේ. නිදසුන් : ටින්කළ මසුන්, සිලින්ඩර් ගත ගෑස්

ඊජාබ් කබූල්

වෙළෙන්දෙකු තමා සන්තකයේ පැවැති භාණ්ඩයක් අලෙවි කළ බව පැවසීම ඊජාබ් නම් වේ. නිශ්චිත භාණ්ඩය තමා මිලට ගත් බවට කරන ප්‍රකාශය කබූල් නම් වේ. ඊජාබ් සහ කබූල් පැහැදිළි ලෙස ප්‍රකාශ කිරීම හා මේ දෙක අතර ප්‍රමාදයක් නොසිදුවීම අනිවාර්ය වේ. ඉමාම් නවවිතුමාගේ (රළි) අදහස අනුව ව්‍යවහාරයේ දී සමාජය විසින් ඊජාබ් සහ කබූල් යනුවෙන් සිතන ප්‍රකාශ, කුඩා පරිමාණ වෙළෙඳ ව්‍යාපාරවල දී පිළිගනු ලැබේ. එහෙත් මහා පරිමාණ වෙළෙඳ ව්‍යාපාරවල දී ඊජාබ් හා කබූල් රහිත ව එය වලංගු නොවන බව ඉමාම් ගස්සාලි තුමාගේ (රළි) අදහස වේ.

- වෙළෙඳ ගනුදෙනුවල දී තහනම් වූ කරුණු

1. බොරු දිවුරුම් දීම

   වෙළෙඳාමේ දී බොරු දිවුරුම් දීම තුළින් යම් දෙයක් සහතික කරනු ලබන විට එහි හරාම් තත්ත්වය තවත් දැඩි වේ. සාමාන්‍යයෙන් නොදිවුරන ලෙස ද, විශේෂයෙන් බොරු දිවුරුම් නොදෙන ලෙස ද සබි (සල්) තුමා විසින් වළක්වා තිබෙනුයේ එබැවිනි.

   දිවුරීම, අලෙවිය වැඩි කරයි. එහෙත් ආශිර්වාදය නැති කරයි. (බුහාරි)

   වෙළෙඳ ගනුදෙනුවල දී නිතර නිතර දිවුරීමේ ක්‍රියාවට නබි (සල්)තුමා ගරහා ඇත. මන්ද, මෙය මිනිසුන් මුළා කරන්නට කරනු ලබන්නකි. අල්ලාහ්ගේ නාමයට අදාළ ගරුත්වය සිතෙන් තුරන් කරයි.

2. කිරුම් මිනුම්වල වංචා කිරීම

   කිරා නැත්නම් මැන, භාණ්ඩ ගන්නා විට ප්‍රමාණය වැඩිකොට ගැනීම ද, කිරා මැන දෙන විට ප්‍රමාණය අඩුකොට දීම ද, කිරුම් මිනුම් වංචාව, කත්ෆීෆ් යනුවෙන් හැඳින්වේ. මෙය අල්කුර්ආනයේ සහ සුන්නාහ්වේ දැඩි ගර්හාවට ලක් වේ.

   ප්‍රමාණය (නිසි මිනුම් දණ්ඩෙන්) සම්පූර්ණයෙන් මනින්න. බර සාධාරණ ලෙස කිරන්න. කිසිදා ජීවියෙකු (මිනිසෙකු) එහි ශක්තියට වඩා අපි බල නොකරමු. (6:152)

   ඔබ ද මනින විට සම්පූර්ණව මනින්න. (කිරන විට) නිසි බරට කිරන්න. මෙය (ඔබට) ඉතා යහපත් වන්නේ ය. විශිෂ්ට ප්‍රතිඵල ද දෙන්නේ ය. (17:35)

   මේ ගැන නබි (සල්) තුමා මෙසේ පැවසුහ. "විකුණන විට ද, මිලදී ගන්නා විට ද, සිය උරුමකම පවසන විට ද ත්‍යාගශීලී ව ක්‍රියා කරන පුද්ගලයාට අල්ලාහ් ආශිර්වාද කරත්වා" යනුවෙන් නබි නායක තුමා (සල්) මේ ගැන ප්‍රකාශ කර තිබේ. (බුහාරි, තිර්මිදි)

   කිරුම් මිනුම්වල දී ඉතා සාධාරණ ලෙස ක්‍රියා කිරීම, බුද්ධියට අගෝචර වූවක් වුව ද, මුස්ලිම්වරයෙකු මෙහිලා තමාට හැකි උපරිමයෙන් සාධාරණ ව ක්‍රියා කළ යුතුය.

   කිසිදා ජීවියෙකුට එහි ශක්තියට වඩා බලකොට නැතැයි අල්කුර්ආනය සඳහන් කෙරෙන්නේ ඒ බවය. මුස්ලිම්වරයෙකු තමාට එක්තරා මිනුම් දණ්ඩක් ද, තමා කැමැති අය වෙනුවෙන් වෙනත් මිනුම් දණ්ඩක් ද සෙස්සන්ට තවත් මිනුම් දණ්ඩක් ද තබා ගැනීම සාධාරණ නොවේ. සෑම මිනිසෙකුගේ ම දේපල ධනය සම්බන්ධයෙන් සාධාරණය හා නීතිගරුක ලෙස ක්‍රියා කළ යුතු වේ. අනුන්ගේ ධනය අසාධාරණ ලෙස ගන්නා උදවිය බෙහෙවින් භයානක වෙති.

4. භාණ්ඩ සැඟවීම - අල් ඉහ්තිහාර්

භාණ්ඩ වෙළෙඳපොළට නොලැබෙන පරිද්දෙන් වළකා නැත්නම් සඟවා එමගින් ඉල්ලුමක් ඇතිකොට මිළ වැඩිවීමකට මඟ සලසන ප්‍රෝඩාකාරී උපක්‍රමයකි. ඉස්ලාම් පෞද්ගලික තරගයට හා වෙළඳපොළේ ස්වාභාවික තරගයට නිදහස සලසා දී තිබේ. එහෙත් තෘෂ්ණාවෙන් කුළුගැන්වී සෙස්සන් දුකටත් කරදරයටත් පත්කොට ධනය උපයන්න යාම ඉස්ලාම් තරයේ අවවාද කරයි. භාණ්ඩ සැඟවීම වළකමින් නබිතුමා (සල්) පහත සඳහන් දේශනාවන් කළේ එබැවිනි.

මිල වැඩිවීමක් අපේක්ෂා කරමින් දින හතළිහකට වඩා සඟවා තබනවුන් අල්ලාහ් බැහැර කරයි. (අහ්මද්)

මිල වැඩිවන තාක් භාණ්ඩ සඟවා තබන්නා පාපියෙකි. (මුස්ලිම්) විකුණන්නා ලාභ ලබයි. සඟවන්නා ශාපයට ලක්වෙයි. (ඉබ්නු මාජා)

ඉහත සඳහන් හදීසය පාදක කැර ගනිමින් ඉස්ලාමීය නීති විශාරදයෝ භාණ්ඩ සැඟවීමේ තත්ත්ව දෙකක් තහනම් වී ඇති බව සඳහන් කරති.

(අ) භාණ්ඩ සැඟවීම රටවැසියනට කරන හානියක් වන තත්ත්වය

ආ) වෙළෙන්දා සිය ලාභය වැඩිකර ගැනීමේ අරමුණින් කෘත්‍රිම ලෙස මිල වැඩිකොට අලෙවි කරන තත්ත්වය

5. බාල කිරීම හා මුළා රැවටීම

අලෙවියෙහි හා මිලට ගැනීමෙහිලා ජනතාව සමඟ සබැඳියාව තිබෙන සියලුම කටයුතුවල වංචා කිරීම හා මුළා කිරීමේ ක්‍රියාව ඉස්ලාම් තහනම් කැර තිබේ. මුස්ලිම්වරයෙකු සෑම අවස්ථාවකදී ම අවංකව හා සත්‍යවාදී ව කටයුතු කළ යුතුය. හුදෙක් ලාභ ලැබීම තකා ඒවා අහිමි නොකර ගත යුතු වේ. මේ ගැන නබි(සල්) තුමා පහත සඳහන් ලෙස පැවසීය.

කිසියම් භාණ්ඩයක සියලුම විස්තර පැහැදිලි ව නොකියා විකිණීම හලාල් නැත. (එම භාණ්ඩයේ අඩුපාඩු ගැන දන්නා කෙනෙකු නොකියා සිටීම ද හලාල් නොවේ.) (හාකිම්, බයිහකි)

වරෙක නබි (සල්) තුමා වෙළෙඳ පොළට ගොස් වෙළෙන්දෙකුගේ ධාන්‍ය ගොඩ තුළට අත පොවා බැලූ විට එය තෙත් ව තිබෙනු දිටීය. ඒ මන්දැයි වෙළෙන්දාගෙන් විමසූ අවස්ථාවේ එය වැස්සට තෙමුණු බව හේ කීය. මිනිසුන්ට පෙනෙන පරිද්දෙන් එය පිටතින් පෙනෙන්නට තබන්නට බැරිදැයි ඔහුව පැවැසූ නබි (සල්) තුමා අප මුළා කරන උදවිය අපගේ පාර්ශ්වයේ අය නොවෙති යි කීය. (මුස්ලිම්)

6. සොර බඩු හෝ කොල්ලකෑ බඩු මිලට ගැනීම

අපරාධ තුරන් කිරීම මුස්ලිම්වරුන්ගේ වගකීම වේ. වැරදිකරුවන් අකර්මණ්‍ය කරනු පිණිස, සොරකම් කරන ලද, කොල්ල කන ලද හෝ අසාධාරණ ලෙස ලබාගත් භාණ්ඩ යැයි දැනගත් කිසිම දෙයක් මිලට ගැනීමට ඉස්ලාම් අවසර දී නැත. එලෙස මිලට ගැනීම අසාධාරණයට අතහිත දීමකි.

7. සොරකම් කරන ලද්දක් බව දැන දැන, සොර බඩුවක් මිලට ගන්නා අකුසලය හා සොරකම් කිරීමෙන් අත්වන අපකීර්තිය ද බෙදා ගනී. (බයිහකී)

සොරකම් කරන ලද හෝ නීති විරෝධී ලෙස පැහැර ගත් වස්තුවක් නීත්‍යානුකූල නොවේ. (ඊට අයිතිකරුට තිබෙන අයිතිවාසිකම නැතිවී යන්නේ ද නැත.) කල් පසුවුව ද හරාමය, හලාල් නොවෙයි.

8. මස්ජිදයේ වෙළෙහෙළෙඳාම්වල නිරත වීම.

මස්ජිදය තුළ වෙළෙහෙළෙඳාම් කිරීමේ ක්‍රියාව ඇතැම් වියතුන් අනුමත කළ ද, එය හිතකර ක්‍රියාවක් නොවන බව බහුතර වියතුන්ගේ අදහස වේ.

ඔබ, මස්ජිදය තුළ අලෙවිකරුවෙකු හෝ ගැනුම්කරුවෙකු දුටුවා නම් අල්ලාහ් ඔබේ වෙළෙඳාම ලාභ සහගත නොකෙරේවා යි ඔහුට කියන්න යැයි නබි (සල්) තුමා පවසා ඇත. (තිර්මිදි)

ජුම්ආවට කුහුටුම් කළාට පසු, වෙළෙඳාම් කිරීම පවා හරාම් ය යන අදහස ඉමාම් අහ්මද් (රහ්) වන්නන් සඳහන් කරති.

8. මිලපාලනය - අත්තස්ඊර්

ගැනුම්කරු හා අලෙවිකරු යන දෙපාර්ශ්වයේ යහපත ගැන සලකා භාණ්ඩවලට නිශ්චිත මිලක් නිර්ණය කිරීම (ව්‍යවහාරයේ) මිල පාලනය යනුවෙන් හඳුන්වනු ලැබේ.

එක්තරා අවස්ථාවක ඇතැමෙක්, “අල්ලාහ්ගේ දූතයාණෙනි, භාණ්ඩවල මිල වැඩි වී තිබේ. ඒ නිසා මිල පාලනය කරන්නැ”යි නබි (සල්) තුමාගෙන් ඉල්ලා සිටියහ. ඊට එතුමා “මිල පාලනය කරන්නා ජීවන පහසුකම් හකුළන්නා - වැඩි වැඩියෙන් ලබා දෙන්නා හා ජීවිතයට අත්‍යවශ්‍ය දේවල් ලබා දෙන්නා අල්ලාහ් ය. භාණ්ඩවල හෝ ජීවිතවල අසාධාරණකම් කොට ඒ හේතුවෙන් කිසිවෙකු මා වරදකරුවකු නොකළ තත්ත්වයන් අල්ලාහ් මුණගැසීමට කැමැත්තෙමි” යි පිළිතුරු දුන්නේ ය. (අහ්මද්)

රජය විසින් මිල පාලනයක් කිරීම නුසුදුසු බව මෙම හදීසයෙන් අවධාරණය වෙතැයි ඉස්ලාමීය වියත්හු පවසති. එය අසාධාරණයක් හා ආර්ථික නිදහස පාලනය කරන්නක් වශයෙන් පවතී. පාරිභෝගිකයාගේ යහපත ගැන සලකනවා වගේ ම වෙළෙන්දාගේ යහපත ගැන ද සැලකිය යුතු වේ. මිල පාලනය තුළින් පාරිභෝගිකයා වෙළෙන්දාගේ අකටයුතුකම්වලට ලක්වන්නට ඉඩ තිබේ.

මිල පාලනයකු සඳහා ඉස්ලාමයෙහි ඉඩකඩ නැති වුව ද සමස්ත වෙළෙඳපොළටම බලපෑ හැකි පරිද්දෙන්, වෙළෙන්දන් අසාධාරණ ලෙස අධික මිලක් නියම කිරීමට පෙළෙඹෙතොත් රජයේ මැදිහත් වීමත් අවශ්‍ය වේ. ඒ අනුව භාණ්ඩ සැඟවීම වැළැක්වීමටත්, අසාධාරණය තුරන් කිරීමටත් මිල පාලනය කළයුතු බවට ඉමාම් මාලික් වැනි වියත්හු අදහස් දක්වති.

**පොළිය - අර්රිබා**

- වෙළෙඳාමෙහිලා වැළැකී සිටිය යුතු ඊළඟ ප්‍රධාන කරුණ වනුයේ පොළියයි. පොළිය සුළු වුව ද, විශාල වුව ද එය හරාම් වේ. පොළිය සම්බන්ධයෙන් අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

- විශ්වාසිකයනි, ඔබ (සැබෑ) විශ්වාසිකයා නම් අල්ලාහ්ට බියෙන් පොලියේ (මේ තාක් ලැබූ දෙය හැර) ඉතිරිය (නොගෙන) අතහරින්න. ඔබ මෙසේ ක්‍රියා නොකළා නම්,අල්ලාහ් සහ ඔහුගේ දූතයා සමඟ යුද වදින්නට සූදානම් වන්න. එහෙත් ඔබ (පොළිය ගැනීමේ හේතුවෙන් පසුතැවිලි වී) වැළකුණා නම්, ඔබගේ වස්තුවෙහි මුල් තොගය ඔබට අයත් ය. ඔබ අසාධාරණකම් නොකරන්න. (එක් ව) ඔබ අසාධාරණයට ලක් නොවිය යුතුය. (2:278-279)

- කිසියම් ප්‍රදේශයක පොලිය හා ගණිකා වෘත්තිය පැතිර ගිය විටෙක එම ප්‍රදේශවාසීන් තමන් විසින් ම අලල්ලාහ්ගේ දඬුවම පතිත කැර ගත්තෝ වෙති යි නබි (සල්) තුමා පවසා ඇත. (අල් හාකිම්)

- පොලිය අනුභව නොකරන්න. එය අනුභව කරවන්නා, ඊට සාක්ෂිවන්නා හා එය ලියන්නා යන සියල්ලන්ටම අල්ලාහ් ශාප කොට ඇතැයි නබි(සල්) තුමා සඳහන් කර ඇත. (අබූ දාවූද්, තිර්මිදි)

- ඉස්ලාමයේ පමණක් නොව, පූර්ව ආගම් වන යුදෙව්, ක්‍රිස්තියානි ආගම් ද පොලිය තහනම් කර තිබේ.

- දැන් පොලියේ වර්ග ගැන සලකා බලමු.

  පොළි වර්ග දෙකකි. ඒවා නම්,

  1. රිබා අන්නසිආ

  2. රිබා අල්ෆළ්ල්

  රිබා අන්නසීආ යනු, ණය හිමියා, ණයකරුගෙන් ප්‍රමාද වූ කාලය වෙනුවට ලබාගන්නා වූ නියමිත අතිරේක මුදල් ප්‍රමාණයයි.

  රිබා අල්ෆළ්ල් යනු, අඩු මුදල වැඩි මුදලකට ද, අඩු ආහාරය වැඩි ආහාර ප්‍රමාණයකට ද හුවමාරු කර ගැනීමයි.

  පළමු වර්ගය මෙන් ම දෙවැනි වර්ගය සැබෑ පොලියට මඟ පෙන්වන්නක් බැවින් හරාම් වේ.

- මේ ගැන නබි(සල්) තුමා මෙසේ ප්‍රකාශ කළේය. රන් කාසියක් රන් කාසි දෙකකට ද, රිදී කාසියක්, රිදී කාසි දෙකකට ද අලෙවි නොකරන්න. මන්ද මම පොලිය සම්බන්ධයෙන් බිය වෙමි. (මුමන්තා, මාලික්)

- භාණ්ඩ හයකින් මෙවැනි පොළිය ගැනීම වළක්වා ඇති බව හදීස්වලින් දැනගන්නට තිබේ. ඒවා නම්, රත්තරන්, රිදී, තිරිඟු, බාර්ලි, රටඉඳි, දියලුනු ය.

- රත්රන්වලට රත්රන් ද, රිදීවලට රිදී ද, දියලුනුවලට දියලුනු ද වශයෙන් සමාන ප්‍රමාණයෙන් ඒ ඒ අවස්ථාවේ ම හුවමාරු කර ගත යුතු ය. ඒ විනා, ප්‍රමාණය වැඩිකළහොත් නැත්නම් වැඩි කරන මෙන් ඉල්ලා සිටියහොත් දෙන්නා හා ලබන්නා යන දෙදෙනා ම පොලී ගනුදෙනුවල නිරත වූවෝ වෙති. (බුහාරි)

- හදීසවල විශේෂයෙන් මෙකී භාණ්ඩ හය පමණක් හේතුව, මේවා මිනිස් ජීවිතයේ මූලික අවශ්‍යතා වීමයි. රන් හා රිදී ගනුදෙනු මාධ්‍යයක් හා මිලවලට මිනුම් දණ්ඩක් වෙයි. සෙසු හතර ප්‍රධාන ආහාර ද්‍රව්‍ය වේ. මේවායේ පොලිය සම්බන්ධ වෙතොත් එය මහජනතාවට බෙහෙවින් බලපායි. මේ අනුව මහජන යහපත තකාම විශේෂයෙන් මේවායින් වැඩිපුර ලැබීම තහනම් කොට ඇත. රත්රන්, රිදී හා මිල නිර්ණය කරන මාධ්‍ය මෙහි අඩංගු වේ. (නිදසුන් : මුදල්)

  තවද නිශ්චිත තත්ත්වයේ පවතින නිශ්චය නොවූ භාණ්ඩ ද අඩංගු වේ. (නිදසුන් : සහල්)

  එම නිසා රන් රිදී වැනි දේවල් හෝ ඊට සමාන භාණ්ඩ හුවමාරු කර ගන්නා විට (නිදසුන් : රන්වලට රන්, තිරිඟුවලට තිරිඟු) කොන්දේසි දෙකක් තිබේ.

  1. දෙකම සමාන ප්‍රමාණයෙන් වීම. මෙහි දී වර්ගය හෝ තත්ත්වය හෝ ගැන නොසැලකිය යුතු ය. නිදසුනක් වශයෙන් සම්බා කිලෝවක් රතු සහල් කිලෝ 11/2 කට හුවමාරු නොනල යුතුය. එය පොලිය වේ. මෙම ක්‍රියාව ම හලාල් බවට පත්කර ගැනීමට නම්, මුලින් ම, රතු සහල් අයිතිකරු එය සම්බා සහල් අයිතිකරුට මුදලට අලෙවි කළ යුතු වේ. මෙහි දී මිලයෙහි වෙනසක් සිදුවීම ගැටලුවක් නොවේ.

  2. භාණ්ඩ හුවමාරුවේ දී එකක් දී, අනෙක ප්‍රමාද නොකළ යුතුය. ඒ ඒ අවස්ථාවේම හුවමාරු කර ගත යුතු ය.

     භාණ්ඩ දෙකම වර්ගයෙන් වෙනස් ව අරමුණින් සමාන ව (නිදසුන් : රන් හා රිදී) ප්‍රමාණයේ වෙනස හරාම් නොවේ. එහෙත්, මෙහිදී ප්‍රමාදය නුසුදුසු ය. නිදසුන් වශයෙන් රන්වලට රිදී හුවමාරු කර ගන්නා විට ප්‍රමාද නොකොට ඒ ඒ අවස්ථාවේ ම කර ගැනීම කොන්දේසිය වේ. එහෙත් ප්‍රමාණයන් වෙනස් ව තිබීම වරදක් නොවේ. මෙහි දී අඩු රත්තරන් ප්‍රමාණයකට වැඩි රිදී ප්‍රමාණයක් ගත හැකි ය. මෙනයින් ම තිරිඟු හා බාර්ලි හුවමාරුව ද කරගත හැකි ය.

     හුවමාරු කෙරෙන භාණ්ඩ දෙකම වර්ගය හා අරමුණ යන දෙකරුණෙහි ම වෙනස් නම් නියමිත කොන්දේසි දෙකම අනවශ්‍ය වේ.

     තවද, රන්, රිදී හා ප්‍රධාන ආහාර යනාදිය හැර අනෙක් ඒවායේ ප්‍රමාණය වෙනස සහ ප්‍රමාදය වැරදි නොවේ. (නිදසුන් : එළුවෙකු, එළුවන් දෙදෙනෙකුට හුවමාරු කර ගත හැකි වේ.)

  ආර්ථික වශයෙන් ද පොළිය අනිටු ඵල විපාක ඇති කරන්නක් බව පැහැදිළි කරුණකි. ව්‍යවහාර ලෝකයේ දක්නට තිබෙන ආර්ථික හා සමාජයීය ප්‍රශ්න හා පිරිහීම් මීට හොඳ උදාහරණයකි.

**වෘත්තීය ක්‍රියාකාරකම්වල දී ගොවිතැන**

- ඉස්ලාමීය දැක්ම අනුව, මිනිසා අල්ලාහ්ගේ නියෝජිතයා ය. නියෝනය ස්ථාපිත කරනු පිණිස දේව පණිවිඩවලින් මඟ පෙන්වා ඇත. එනයින් ම, නියෝජිතයකු වශයෙන් ජීවත් වීමට හැකි පරිද්දෙන් අල්ලාහ් මහ පොළොවේ ඇතිරිල්ලක් විලස මවා තිබේ. එහි, මිනිසාට අවශ්‍ය ගහකොළ මවා ඇත. ජීවිතයට අවශ්‍ය දේවල් ඒවායින් එළි දක්වයි. මේවා මගින් මිනිසා සිය ආහාර අවශ්‍යතාව සපුරා ගනී. මේ අතින් මිනිසා සිය ආර්ථික අවශ්‍යතාවල ප්‍රධාන තැන ගන්නා ආහාර අවශ්‍යතාව සපුරා ගනු පිණිස කරනු ලබන ධනය ඉපැයීම් අතරින් ගොවිතැන ද එකකි.

- ආදි මිනිසා වූ ආදම් තුමා (අලයි) ලොවට එවනු ලැබූ දා පටන් ආහාර අවශ්‍යතාව සඳහා ගොවිතැන් බත් කරන ලද බව දැනගන්නට පුළුවන. මෙම ක්‍රියාව මානව සංහතිය විසින් නොකඩවා පවත්වා ගෙන එන ලදී. අල්ලාහ් විසින් එවනලද බොහෝ නබිවරු ගොවිතැන්බත්

කරමින් ජීවත් වූ බවට නිදසුන් අල්කුර්ආනයේ සහ සුන්නාහ්වේ දකින්නට තිබේ. මේ කටයුත්තට සරිලන පරිද්දෙන් අල්ලාහ් මහ පොළොව මවා ඇති බව ද පවසයි.

තවද අල්ලාහ් ඔබ වෙනුවෙන් මහ පොළොව ඇතිරිල්ලක් කෙළේය. ඒ මත ඔබගේ ගමන් බිමන් සඳහා විශාල මංමාවත් ද මැවීය. (71:19,20)

- අහසේ සිට වර්ෂාව පහළ කළේ ඔහු ය. එමගින් සෑම වර්ගයකම ගහකොළයක් ම අපි හෙළි කෙළෙමු. එසේම හරිත (නිල්ල) හෙළි කෙළෙමු. එතුළින් බීජ වර්ග සුහුඹුල් කරල් හෙළි කළෙමු. (6:99)

- අප (වැහි වළා) උසුලන සුළං එවමු. ඉන්පසු අහසින් ජලය පහළ කරමු. එය ඔබට බොන්නට සලස්වමු. ඔබ ඒවා රැස්කර තබන්නේ ද නැත. (15:22)

- ඉහත සඳහන් අල්කුර්ආනීය පාඨ අනුව, ගොවිතැනට සුදුසු පරිද්දෙන් අල්ලාහ් භූමිය සකස් කොට දී ඇති බව විස්තර වේ. වර්ෂාව, සුළඟ, පොළොව, ගහකොළ යනාදී සියල්ල ගැන මෙහි විස්තර වේ. ගොවිතැන් කරමින් ආහාර අවශ්‍යතාව පහසු කරගනු පිණිස අල්ලාහ් මෙසේ සකස් කොට තිබේ.

- නබි (සල්) තුමා දේශනවන් ද ගොවිතැන පොළඹවන්නක්ව ඇත. මුස්ලිම්වරුන් ගොවිතැනෙහි යෙදී සිටි බව ඉතිහාසය පුරා දකින්නට තිබෙනුයේ එබැවිනි.

- අයෙකුට ඉඩකඩම් ඇත්නම් ඔහු එහි ගොවිතැන් කළ යුතුය. නැත්නම් එය සිය සහෝදරයාට දන් දිය යුතුය. එය නුපුළුවන් නම් තමාට ම තබාගන්නට පුළුවන. (බුහාරි, මුස්ලිම්)

- ඉඩකඩම් ඇත්නම්, එය පුරන් ව නොහැරිය යුතු බව මෙම හදීසයෙන් දැක්වේ. තමාට බැරි නම් අනෙක් අයට හෝ දන් දෙන මෙන් පැවසේ. ධනය ඉපැයීමෙහිලා ගොවිතැනට ඇති වැදගත්කම ගැන මෙම හදීසයෙන් හෙළිදරව් කැරෙයි. " අයිතිවාසිකම් නොකියන ඉඩමක් යම් කෙනෙකු සරුසාරවත් කළා නම් ඊට සුදුස්සා ඔහුම ය". (බුහාරි)

- අයිතිවාසිකම් නොකියන ඉඩමක ගොවිතැන් කරන්නාට එම ඉඩම අයත් වෙතැයි සඳහන් කිරීම ද කෘෂිකර්මයෙහි වැදගත්කම ගෙන හැර පාන්නකි. මදීනා වැසියන් බොහෝ විට ගොවීහු වූහ. මදීනාවට හිජ්රත් කළ අවධියේ එහි විසූ වැසියෝ රටඉඳි ගස්වල පරපරාගනය සිදුකරන ක්‍රමවේද යොදමින් සිටියහ. සහීහ් මුස්ලිම් හි සටහන් වී ඇති හදීසයක මෙය සඳහන් වේ. සහාබිවරුන් කොතරම් දුරට කෘෂිකර්මයෙහි දියුණු වී සිටියේ දැයි මෙයින් පැහැදිලි වේ.

- මුස්ලිම්වරයෙකු, පැළැටියක් සිටුවා නැත්නම් වගාවක් කළ පසු කිසියම් මිනිසෙකු, සතකු හෝ පක්ෂියෙකු එය අනුභව කළ ද, එය ඔහුට දානයක් බවට පත් වේ. (මුස්ලිම්)

- ඉස්ලාමීය දැක්ම අනුව, ගොවියකු මෙලොව පමණක් නොව පරලොව දී ද විශිෂ්ට ආනිසංස ලබාන බව මෙම හදීසයෙන් පැහැදිලි කෙරේ. මෙය මුස්ලිම්වරුන් ගොවිතැන නියැලීම දිරිගන්වයි.

- පුරන් බිම්වල වගා කිරීම, කෘෂිකර්මය සහ අඳයට දීම යනාදී මාතෘකා යටතේ හදීස සංස්කාරකවරුන්, හදීස සංස්කරණය කර තිබෙන්නේ ද නීතිවේදීන් මෙම මාතෘකා යටතේ තීන්දු දී තිබීම ද මුස්ලිම්වරුන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි යෙදවීම සඳහා වූ මඟ පෙන්වීම ය.

- කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි කොටස් දෙකකි. එහි ද වැදගත් කොටස් දෙකකි.
  1. පැළෑටි හා ධාන්‍ය සමඟ සම්බන්ධ දේවල්
  2. සත්ත්ව පාලනය හා පක්ෂී පාලනය

- පොදුවේ ඉස්ලාමීය ආර්ථික මූලධර්මයෙහි අල්ලාහ් විසින් තහනම් කරන ලද කිසිදු නිෂ්පාදනයක්, බෙදා හැරීමක් හෝ පරිහරණය කිරීම තහනම් වී තිබේ. මේවා බොහෝ විට මිනිස් ජීවිතය, ශරීරය හා දැනුමට බලපාන දේවල් ය. කෘෂි නිෂ්පාදන ද අල්ලාහ් නීතියෙන් බැහැර වූවක් නොවේ. පැළෑටි වර්ග අතර නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම හා පරිභෝජනය කිරීම තහනම් කරන ලද ඒවා ද ඇත. නිදසුනක් වශයෙන් හෂීස්, දුම්කොළ හා කංසා යනාදිය දක්වන්නට පුළුවන. එම නිසා ගොවියෙකු ඒවා වගා කිරීම තහනම් වූවකි.

- සත්ත්ව පාලනයෙහි ද තහනම් කරන ලද ඒවා තිබේ. මේ අතරින් මුස්ලිම්වරුනට පරිභෝජනය තහනම් වූ සතුන් මුස්ලිම් නොවන්නන් වෙනුවෙන් වුව ද නිෂ්පාදනය කළ නොහේ. නිදසුනක් වශයෙන් ඌරන් ඇති කිරීම දැක්විය හැකිය. එහෙත් ඉස්ලාමයෙන් අනුමත වූ සත්ත්ව පාලනයෙහි නිරත වීමට පුළුවන. බොහෝවිට නබිවරු ද එහි නිරත වූහ.

**වෘත්තීය ක්‍රියාකාරකම්වල කර්මාන්ත**

- ආර්ථික විද්‍යාවේ මූලික අවශ්‍යතාවක් වන ආහාර අවශ්‍යතාව සපුරා ගනු පිණිස කෘෂිකර්මය කොතරම් දුරට ඉවහල් වේ ද, ඒ තරමට ම කර්මාන්ත ක්ෂේත්‍රය ද ජීවිතයේ බොහෝ අවශ්‍යතාවන් සපුරා ගැනීමට ඉවහල් වන බව පෙනේ.

- අල්කුර්ආනය සහ සුන්නාහ්වෙන් මෙයට වැදගත්කමක් දෙනු ලබනුයේ එබැවිනි. නබිතුමාගේ (සල්) වෘත්තීන් අතර ශ්‍රේෂ්ඨ වෘත්තිය කුමක් දැයි අසනු ලැබූ විට කර්මාන්ත සහ බොරුව මිශ්‍ර නොවූ වෙළෙඳාම (අහ්මද්) යනුවෙන් එතුමා පිළිතුරු දුන්නේය. මෙය, නබි (සල්) තුමා විසින් ප්‍රශංසාත්මක මුඛයෙන් පවසන ලද ඉපැයුම් ක්‍රමයකි. අල්කුර්ආනය ද, කර්මාන්ත ක්ෂේත්‍රය පිණිස වන මඟපෙන්වීම් සහ එහි අවශ්‍යතාව ගැන විස්තර කරනු ලැබේ. නබිවරුන් කර්මාන්තවල නිරත වූ ආකාරය ගැන ද අල්කුර්ආනයේ සඳහන් ය. මීට මූලික හේතුව වනුයේ ජීවිතය පහසු කර ගැන්මට මිනිසාට මෙම ක්ෂේත්‍රය අවශ්‍ය බවයි. කර්මාන්තය සෙස්සනට ඉගැන්වීම සුන්නත් වූ ඉබාදතයකැයි ඉස්ලාමීය නීතිවේදීන් සඳහන් කරනුයේ ඒ නිසා ය.

- ව්‍යවහාරික ලෝකයේ යකඩ ලෝහය කේන්ද්‍ර කරගෙන මහා පරිමාණ කර්මාන්ත රැසක් සිදු කෙරෙයි. ජීවිතය සුව පහසු කර ගැනීමට එය නන් අයුරින් ඉවහල් වන බව පෙනේ. අල්කුර්ආනයේ ද බොහෝ තැන්වල යකඩ ලෝහය ගැන සඳහන් වේ. එක්තරා සූරාහ්වක අල් හදීද් වේ. යකඩ හා සම්බන්ධ කර්මාන්ත ක්‍රමය ද අල්කුර්ආන් විස්තර කරයි.

- අපි යකඩ පහළ කළෙමු. එහි විශාල ශක්තියක් ද, මිනිසුන්ට අපමණ ප්‍රයෝජන ද ඇත. (57:25) මෙම පාඨය ගැන විස්තර ඉදිරිපත් කළ කුර්ආනීය වියත්හු විශාල ශක්තිය යනු, යුදඅවිවලට මූලද්‍රව්‍ය වශයෙන් යකඩය භාවිත කෙරෙන බව හා අපමණ ප්‍රයෝජන යනු එදිනෙදා ජීවිතයට අවශ්‍ය කෙරෙන භාණ්ඩ හා කර්මාන්තවලට අවශ්‍ය උපකරණ නිෂ්පාදනය ද හඟවනබව සඳහන් කරති.

  තවද අපි ඔහුට යකඩ මොලොක් කළෙමු. (34:10-11)

තවද ඔබලාගේ සටන්වල දී ඔබලා ආරක්ෂා කරනු පිණිස, සන්නාහ සෑදීමට ඔහුට ඉගැන්වූවෙමු. එබැවින් මේවාට ඔබලා ස්තුතිවන්ත වන්නෙහු ද ? (21:80)

දාවුද් නබිතුමන් (අලයි) හා සබැඳි ඉහත සඳහන් කුර්ආන් පාඨවලින් යකඩ හා සම්බන්ධ කර්මාන්ත ක්ෂේත්‍රයන්හි එතුමා නියැලුණු බව සනාථ වේ.

- නූහ් නබිතුමා (අලයි) නැව් සෑදීමේ කර්මාන්තයෙහි යොදවනු ලැබීය. අල්ලාහ්ගේ දඬුවමින් රැකවරණය ලැබීම සඳහා මෙසේ විය. වත්මනෙහි නැව් ගමනාගමනය තුළින් රටවල් අතර ආනයන අපනයන සිදුවේ. නැව් ඉදිකිරීමේ කර්මාන්තය දියුණුවට පත් වී ඇත. මේ බව අල්කුර්ආනයේ පහත සඳහන් ලෙස විස්තර කෙරේ.

  "තවද කඳු මෙන් මුහුදේ යාත්‍රා කරන දේවල් ද ඔහුගේ සාක්ෂිවලට අයත් ය." (42:32)

- සෑම නබිවරයෙකුම කිසියම් වෘත්තියක නිරත වුනු බව ඉතිහාසයේ පෙනේ. දාවුද් නබිතුමා (අලයි) යකඩ අවි ආයුධ නිපැදවීමෙහි ද, සකරියා නබිතුමා වඩු කර්මාන්තයේ ද යෙදුනාහ. සහාබාවරුන් අතරින් කාන්තාවන් පවා කර්මාන්තවල යෙදී ඇත. උම්මු හාතුල් මුඃමිනීන්වරුන් අතරින් සයිනබ් ජහ්ෂ් (රලි) තුමිය දැල් විියා ජීවත් වූවාය.

- දෙලෝ ජීවිතය ම සරුසාරවත් කරන කර්මාන්ත ක්ෂේත්‍රයෙහි යෙදෙන මෙන් ඉස්ලාම් අවධාරණය කරයි. එසේ නොව, අකීදාව, සමාජ ජීවිතය, ශික්ෂණය හා සාරධර්ම වනසන කිසිදු කර්මාන්තයක් ඉස්ලාමයේ අනුමත නොවේ. නිදසුනක් වශයෙන්, මත්ද්‍රව්‍ය නිෂ්පාදනය හා පහත් හැඟීම් අවුස්සන ඡායාරූප නිෂ්පාදනය, මිනිසාට අහිටු විපාක ඇති කරන නිෂ්පාදන යනාදිය තහනම් කොට තිබෙන බව සඳහන් කළ හැකි ය. ඒ අනුව, කර්මාන්ත ක්ෂේත්‍රයෙහි නිරතව ධනය ඉපැයීම ද ඉබාදතයක් වන බව සෑම මුස්ලිම්වරයෙකුම දැන සිටීම අවශ්‍ය වේ.

**වෘත්තීය ක්‍රියාකාරකම්වල සේවා වෘත්තිය**

- සේවා වෘත්තිය ද ධනය උපයන ක්‍රියාකාරකමකි. මිනිසකු ඉටුකරන සේවය තුළින් සිය ජීවනෝපාය සලසා ගනී. විවිධ වෘත්තීන් ඇත. රාජ්‍ය සේවය, පෞද්ගලික සේවය, පාලක සේවා, ගුරු වෘත්තිය, වෛද්‍ය වෘත්තිය, හෙද සේවය, ලිපිකරු සේවය,ආරක්ෂක සේවය, සන්නිවේදන සේවා, ගමනාගමන සේවය හා සෞඛ්‍ය සේවා වශයෙන් විවිධ වේ. මේ එකිනෙක සේවා පැවරීමට ද නිලධාරීහු පත් කරනු ලබති.

- වගකීම භාර ගැනීමේ දී තනතුරු දැරීමේ දී ඔවුනට යම් යම් බලතල පැවරේ. වගකීම් හා තනතුරු දරන්නන් වෙත බොහෝ දෙනෙකුගේ යහජීවිතය පිණිස වූ සැලසුම් භාර කරනු ලැබේ. මේ වගකීම් ඉටුකළ ක්‍රමය ගැන මොවුහු කියාමාවෙහි දී විමසනු ලබන්නේ ය. තමන්ගේ තනතුරු හා වගකීම් ගැන මොවුහු අල්ලාහ් හමුවේ වගකිව යුතු වේ. එබැවින් වගකීම් හා තනතුරු දරන්නන්, ඒවා තමන් වෙත විශ්වාසයට තබන ලද අමානත් බව වටහා ගත යුතු වෙති. අමානත් යනු අල්ලාහ් අණ පරිදි, මිනිසා මෙලොවෙහි දී සිය යුතුකම් හා සේවාවන් ඉටු කිරීම වේ.

- නියත වශයෙන් ම අහස් හා මහ පොළොව ද, කඳු ද, (අපේ අණ) අමානතය දරා ගන්නා ලෙස දැක්වීමු. නමුත් ඒවා දරා ගැනීමට ප්‍රතික්ෂේප කරන ලදී. ඒ ගැන බිය විය. එහෙත් මිනිසා එය දරා ගත්තේය. නියත වශයෙන් ම මිනිසා තුමූ තමාට අපරාධ සිදුකර ගන්නකු මෙන් ම මෝඩයකු ද වේ. (33:72)

- අමානතය නැති පුද්ගලයා වෙත ඊමාන් ද නැත. අල්ලාහ් සමග වන ගිවිසුම් ද නැත. (අහ්මද්)

- ඔබ සියලු දෙනාම වගකීම් දරන්නන් ය. ඔබගෙන් සෑම දෙනාගේම වගකීම් ගැන විමසනු ලබන්නෙුය. (බුහාරි)

- ඉහත සඳහන් කුර්ආන් හා හදීස මගින් වගකීම් සහ තනතුරුවල අමානත් තත්ත්වය ගැන පැහැදිළි කරනු ලැබේ. තම වගකීම් හා තනතුරු සම්බන්ධයෙන් සෑම දෙනා ම වගකීමට බැඳී සිටින බව ද ගෙන හැර දැක්වේ. ඒ අනුව සේවා වෘත්තීන් හි යෙදෙන සෑම දෙනාම නායකයා සමඟ එකඟතාවට එළෙඹෙති. මෙම නායකයෝ පාලකයන්ට ද පාලකයෝ අල්ලාහ්ට ද වගකීමට බැඳී සිටිති. පොදුවේ සියලු දෙනා ම වගකිව යුත්තෝ වෙති.

**පාලකයෝ**

- වත්මනෙහි රාජ්‍ය පරිපාලකයන් සියලු දෙනාම ඒ සඳහා වැටුප් ලබති. ජනපති ඇතුළු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු දක්වා සියලු දෙනාම ජාතික සේවකයෝ ය. මෙකී නායකත්ව තනතුරුවලට පත් කරනු ලබන්නෝ අතිශය සැලකිල්ලෙන් යුතුව ක්‍රියා කළ යුතු වෙති. මහජනතාවගේ විශ්වාසය මත මෙම වගකීම් පවරා ඇත. මොවුහු අල්ලාහ්ට සහ මහජනතාවට වගකිව යුත්තෝ වෙති. මෙය සුවිශාල අමානතයකි. අල්ලාහ් ඒ ගැන සියුම් ලෙස විමසන්නේය.

  වරෙක අබුදර් අල් කිෆාරිතුමා (රළි) නබි (සල්) තුමන් වෙත අවුත් ඔබතුමා මාව කිසියම් ප්‍රදේශයකට ආණ්ඩුකාරයා ලෙස පත් කරන්නේ නැද්දැ යි විමසීය. ඊට නබි(සල්) තුමා ඔහුගේ උරහිසට තට්ටු කරමින් මෙසේ කීය. "අබුදර්, ඔබ දුර්වලයි. මෙම තනතුර එක්තරා අමානතයක්. (විශ්වාසය මත තබන්නක්) පරමාන්ත දවසේ නම්බුවත්, ගරුත්වයත් නැති කර ගන්නා තත්ත්වයට පත් කරන්නක්. නමුත් මෙම වගකීම එහි සෑම බරක් සමඟම පිළිගෙන පිළිගත් දේවල් ඉටුකරන අය බේරා ගනු ලබන්නෝ ය." (මුස්ලිම්)

- සුදුසු අයට තනතුරු පිරිනැමීය යුතු බව ඉහත සඳහන් හදීසයෙන් අවධාරණය කරනු ලැබේ. උසස් අධ්‍යාපන මට්ටම, මහඟු පළපුරුද්ද හා ගුණ යහපත්කම් පමණක් නිසා ම සෑම දෙනාම සෑම තනතුරකට ම සුදුසු වන්නේ නැත. වගකීම්, තනතුරු සහ බලතල ක්‍රමානුකූලව හා ගෞරවාන්විත ව ඉටුකළ හැකි පුද්ගලයන්ට එය පැවරිය යුතුය.

- කිසියම් පිරිසක් අතර, අල්ලාහ්ගේ අතිශය කැමැත්තට අදාළ කෙනෙකු සිටිය දී ඔහු කොන් කොට, වෙනත් කෙනෙකු එම පිරිසට බලධාරියා වශයෙන් පත් කරන්නේ කවරෙක් ද, ඔහු අල්ලාහ්ටත් ඔහුගේ නබිවරයාටත් විශ්වාසිකයන්ටත් වංචා කළේ වෙයි. (අල් හාකිම්)

- යුප්රටීස් ගඟෙන් දිය බොන්නට යන ඔටු පැටවෙක් වුව ද කරදරයකට පත් වුනා නම් ඊට මේ උමර්, පරලොවෙහි දී අල්ලාහ්ට වගකිව යුතු යැයි උමර් තුමා (රළි) තමාට ම පවසා ගත්තේ ය. පාලකයන් තම වගකීම තක්සේරු කිරීමට මෙය ප්‍රමාණවත් වේ.

- කිසිදු සෙවණක් නොලැබෙන පරමාන්ත දවසේ, අල්ලාහ් පුද්ගලයන් සත් දෙනෙකුට සිය අර්ෂය යට සෙවන දෙන බවට පවසා ඇත. සාධාරණ පාලකයා නොහොත් නායකයා . . (බුහාරි, මුස්ලිම්) පාලන වගකීම මැනවින් ඉටු කිරීමේ ශ්‍රේෂ්ඨත්වය හා අවශ්‍යතාව මෙහිලා අගයනු ලැබේ. මේ අනුව, පාලකයෝ හා පරිපාලකයෝ තම වගකීම් ඉටු කිරීමේ දී සාධාරණ ලෙස කටයුතු කළ යුතු වෙති.

  මෙබඳු ජාතික සේවකයන්, රටටත් රටවැසියන්ටත්, ද්‍රෝහි නොවී ජනතාවගේ යහපතට හානියක් නොකොට, රටේ සම්පත් සූරා නොකමින් ක්‍රියා කළ යුතුය.

රාජ්‍ය සේවයේ නියැලෙන්නන්

- විදුහල්පතිවරු, ගුරුවරු, කථිකාචාර්යවරු, අධ්‍යාන සංවර්ධනය උදෙසා ඉමහත් දායකත්වයක් දරති. දේශයක ශිෂ්‍ය පරපුර මොවුන් වෙත පවරනු ලැබේ. මොවුන්ගේ අමානතය සුරකින ස්වභාවය, සේවා සුදුසුකම්, වගකීමෙන් ක්‍රියා කිරීම, වෘත්තීය සුදුසුකම් හා රාජකාරි හැඟීම යන සියල්ලම මොවුන්ගේ සේවයෙහි බලපෑම් ඇති කරයි.

- ඉගෙනීම සහ ඉගැන්වීම ඉතා උතුම් වූවකි. මන්ද, අල්ලාහ් නැණ නුවන අතින් සෙසු සියලු සත්ත්වයනට වඩා මිනිසා උසස් කොට තිබේ. ආගමික වියතකු බිහි කිරීම හා වෙනත් ක්ෂේත්‍ර සම්බන්ධ වියතුන් බිහි කිරීම ෆර්ල් කිෆායා වශයෙන් ඉස්ලාමීය නීතිවේදීන් දකින්නේ ඒ නිසාවෙනි. එසේ නම්, යහපත් පුරවැසියන් සහ උගතුන් බිහිකරන සේවය දරන්නා වූ මොවුහු අමානත් යුතුකම දරන්නෝ වෙති.

- ඔබ ලොවෙහි (ඉටු කළ යුතු) ඔබේ සේවය (නසීබය) අමතක නොකරන්න. අල්ලාහ් ඔබට යහපත සලසා තිබෙනවා වගේ ම ඔබ ද යහපත කරන්න. (28:77)

  “අමානතය නැති පුද්ගලයා වෙත ආගම නැත” (අහ්මද්)

- විදුහල්පති හා උපගුරු වැනි තනතුරු නුසුදුස්සන් වෙත පවරනු ලැබුණේ නම්.රටේ යහපත් පුරවැසියන් බිහි වීම සාක්ෂාත් නොවේ. වරෙක නබිතුමන් (සල්) වෙත පැමිණි ග්‍රාමීය අරාබිවරයෙක් පරමාන්ත එළෙඹෙන්නේ කවදා දැ යි විමසීය. “අමානතය තුරන් වූ විට පරමාන්ත දවස බලාපොරොත්තු වන්නැ”යි එතුමා පිළිතුරු දුන්නේ ය. “අමානතය තුරන් වන්නේ කෙසේ දැ”යි ඔහු නැවතත් විමසීය. “වගකීමක් ඊට නුසුදුසු පුද්ගලයෙකුට භාර කළවිට පරමාන්ත දවස බලාපොරොත්තු වන්නැ”යි නබි (සල්) තුමා විස්තර කළේය. (මුස්ලිම්)

- විදුහල්පතිවරුන්, ගුරු භවතුන් හා කථිකාචාර්යවරුන් සඳහා වගකීම් කවරේදැයි දක්වා තිබේ. අධ්‍යාපනය, ශික්ෂණය හා විනය යනාදී කරුණුවල දී සංවර්ධනයක් දැකගත හැකි වනුයේ එකී වගකීම් මැනවින් ඉටු කිරීම තුළිනි.

  “මුඃමින්වරයෙකු තමා කරන සෑම ක්‍රියාවක් ම නිසි ලෙස පිළිවෙලට කරනු දැකීම අල්ලාහ්ගේ කැමැත්තයි.” (බුහාරි)

- අධ්‍යාපන සේවයෙහි නිරතව සිටින්නන්ට අධ්‍යාපන වෘත්තීය සුදුසුකම් අවශ්‍ය වේ. නැත්නම් එය නිසි ලෙස ඉටු කිරීම අසීරු වේ. වෘත්තීය සුදුසුකම තුළ, උක්ත තනතුරට අවශ්‍ය කෙරෙන දැනුම, කුසලතා, ආකල්ප, ක්‍රියා ශක්තිය, අධිෂ්ඨානය , උනන්දුව හා ප්‍රවේශ ක්‍රමය පිහිටිය යුතුය.

- අධ්‍යාපන සේවයෙහි නියැලෙන්නන් තම සේවයෙහිලා වගකීමෙන්යුතුව ක්‍රියා කළ යුතුය. පහත සඳහන් දෙකරුණෙහිලා ඔවුහු වැදගත් සැලකිල්ලක් දැක්විය යුත්තේ ය.

  1. නිසි කල පැමිණීම, තමාට පැවරී තිබෙන වගකීම නිසි ලෙස ඉටුකිරීම හා රාජකාරි වේලාවන් අනිසි ලෙස භාවිත නොකිරීම.

  2. වැටුප් සඳහා තමන් කරන රාජකරිය, තමාට හැකි උපරිම කැපවීමෙන් ඉටු කිරීම. මෙය සේවකයාගේ පක්ෂපාතීත්වයට සාක්ෂියකි.

- එම නිසා අධ්‍යාපන සේවයෙහි නිරත වන්නන්, තම අමානත් වගකීම වටහා ගෙන ඉස්ලාමයෙන් අපේක්ෂා කෙරෙන යහපත් පුරවැසියන් බිහි කිරීමේ කර්තව්‍යයෙහි වගකීමෙන් යුතු ව ක්‍රියා කළ යුතුය.

සෞඛ්‍යය (වෛද්‍ය, හෙද, ලිපිකරු) සේවාවන්

- සෞඛ්‍ය සේවයෙහි නිරතවන වෛද්‍යවරුන් හෙදියන් සහ ලිපිකරුවන් යනාදීහු සෙසු ජනයාගේ යහපත හා සබැඳි සේවාවන් ඉටු කරති. මොවුන්ගේ ක්‍රියාකාරකම්, රටවැසියන්ගේ සුවසෙතෙහි බලපෑම් ඇති කරවන සුළුය. එමනිසා, මෙවැනි සේවාවන් හි දී ද අමානතය වගකීම් පිළිබඳ හැඟීම, සේවා සුදුසුකම් හා රාජකාරී හැඟීම වැදගත් තැනක් උසුලයි.

- පොදුවේ කිනම් සේවා වෘත්තියක යෙදෙන්නන් වුව ද, තම තනතුර සඳහා වූ ගිවිසුමට අනුව සේවය කරන සේවකයෝ වෙති. ඔහුට වැටුප් ගෙවන බැවින් ඔහුගේ රාජකාරී වේලාව, ඔහුට අදාළ සේවා කාලය වේ. එකල, ඔහුගේ සිත, කය, සිතුවිලි පිළිබඳ සියලුම හැකියාවන් හා කුසලතාවන් ඔහුගේ තනතුරෙහි සේවය සඳහා යෙදවීම අවශ්‍ය වේ. ඒ ඔහුගේ රාජකාරී වේලාව තුළ ඉටුකළ යුතු සෑම ක්‍රියාවකටම හෙතෙම වගකිව යුතු වේ.

- නිලධාරියකුගේ රාජකාරිය වනුයේ නියමිත වේලාවක තමන් මුණගැසීමට එන්නන්ගේ ඕනෑ එපාකම් ඉටු කිරීම හා සබැඳි බැවින් රාජකාරී කලට වේලාවට ඒ ජනතාවට අයත් කාලවේලාවෙයි. ඔවුන්ගේ අයිතිවාසිකම් එම නිලධාරියා විසින් නිසි පරිදි ලබාදිය යුතු වේ. මීට නිදසුන් වශයෙන් රෝහලක සේවය කරන වෛද්‍යවරයෙකුගේ සේවා කාලවේලාව ගැන සඳහන් කළ හැකිය. රෝගීන්, වෛද්‍යවරුන් මුණගැසීමට කල්මරමින් සිටිය ද නියමිත කාල වේලාවේ වෛද්‍යවරයා පෞද්ගලික රෝහලක කල්ගත කරන්නේ නම් එය බලාපොරොත්තුවෙන් කල් ගෙවන රෝගීන්ට කරන අසාධාරණයක් වශයෙන් සලකනු ලබයි. මන්ද යත්, සෑම දෙනාගේම ජීවිතයෙහිලා කාලය ඉතා වටිනා දෙයකි. වෛද්‍යවරයා සුළු කාලයකැයි සිතන කාලය රෝගියාගේ පැත්තෙන් වටිනා දෙයක් වන්නට පුළුවන. මෙනයින් ම ගුරුවරයකු, කථිකාචාර්යවරයකු, ලිපිකරුවක් හෝ හෙදියක සමන්ගේ සේවා කාලවේලාව තුළ ගන්නා අනුන්ගේ කාලය ඔවුන්ගේ ජීවිතයෙහි වටිනා දෙයක් වන්නට පුළුවන. එක් පුද්ගලයෙකුගේ නොහොබිනා ක්‍රියාවෙන් සෙස්සන්ගේ ජීවිතයට හෝ අධ්‍යාපනයට අහිටු විපාක ඇති කරන්නක් නොවිය යුතු ය.

- සෙස්සන්ගේ කාලය සොරා ගන්නා සේවා වෘත්තිකයන් දිව්‍යමය වගකීම යන හැඟීම අහිමි කරගත් සේවකයෝ වෙති. මීට මූලික හේතුව වනුයේ, අල්ලාහ් විසින් තමන් වෙත පවරා තිබෙන්නා වූ අනුන් සඳහා ඉටු කළ යුතු වගකීම් පිළිබඳ හැඟීමක් නැති වීමය . වගකීම සම්බන්ධයෙන් මොවුන් දරන උදාසීන ගතිය නිසා අනුන්ගේ යහපත නොසලකා හැර, ඔවුන්ගේ වටිනා කාල වේලාවන්, සූරා කන්නන් අමතක නොකළ යුතු කරුණක් ඇත. ඉහළ වැටුප් ලබන උසස් නිලධාරිහු ද, සාමාන්‍ය වැටුප් ලබන කම්කරුවෝ ද, මහජනතාවගේ බදු මුදලින් වැටුප් ලබන්නෝ වෙති. එබැවින්, සේවා වෘත්තීන් හි යෙදෙන උදවිය සාධාරණ ලෙස හා නීති ගරුකව තම සේවාවන් ඉටු කිරීම ඔවුන්ගේ වගකීම වේ.

**සමාජ ජීවිතය හා සබැඳි ගනුදෙනු හෙවත් ඉස්ලාමීය වානිජ ආයතන**

- මානව ඉතිහාසයේ මුල් අවධියේ පැවැති වාණිජ ක්‍රියාකාරකම් සරල ය. වර්තමානයේ සමාජ, අර්ථික, සංස්කෘතික හා තාක්ෂණික වශයෙන් ලොව වෙනස්කම්වලට බඳුන් වෙමින් පවතී. මුලදී දක්නට නොවූ ගනුදෙනු ක්‍රම හා වෙළෙඳ ගිවිසුම් දැන් සිදුවේ. මේවායින් සමහරක් ඉස්ලාම් ෂරීඅතය විසින් අනුමත කරන ලද ඒවාය. තවත් සමහරක් ඉස්ලාමීය ෂරීඅතයෙන් ප්‍රතික්ෂේප වී තිබේ. මේ නිසා නූතන වාණිජ ආයතන ගැන දැනුවත් වීම අවශ්‍ය කෙරේ.

**අනුමත වෙළෙඳ ක්‍රම**

- **මුලාරබා**

නූතන ඉස්ලාමීය විද්වතෙකු වූ අල් හබීබ් නමැත්තා මුලාරබා වට පහත සඳහන් අදහස සපයයි. එක් පාර්ශවයක ප්‍රාග්ධනය හා අනෙක් පාර්ශවයක ශ්‍රමය ද පාදක කරගෙන සිදු කරනු ලබන වාණිජ ව්‍යවසායයෙන් ලැබෙන ප්‍රතිලාභයෙන් දෙපාර්ශ්වයම දායක වන පරිද්දෙන් වන එක්තරා සාමූහික කොටස් සම්මුතිය මුලාරබා වේ.

ඉස්ලාම් මෙය අනුමත කොට තිබේ. කුර්ආනයේ හා සුන්නාහ්වෙන් මෙය අනුමත වී ඇත. ඉස්ලාමීය විද්වත්හු ද, මෙය නිවැරදි යැයි ඒකමතික ව අදහස් දක්වති.

අල්ලාහ්ගේ ආශිර්වාදය සොයා මිහිපිට සෑම දිග්භාගයක ම යන්නට සිදුවේ. (2:198) (62:60), (73:20) යනාදී පාඨ මුලාරබාව නීත්‍යානුකූලව සහතික කරතැයි මුබස්සිර්වරු පවසති.

නබි (සල්) තුමා නුබුව්වතයට පෙරාතුව කදීජා තුමිය (රළි) වෙතින් වෙළෙඳ භාණ්ඩ ෂාම් දේශයට රැගෙන ගියේ මුලාරබා ක්‍රමය යටතේ ය. ජාහිලිය්යා අවධියේ පහළව පැවති මෙම වාණිජ ක්‍රමය, ඉස්ලාමයේ සම්ප්‍රාප්තියට පසුව නබි (සල්) තුමා අනුමත කළේය.

මුලාරබා වලංගු වීම සඳහා ඉස්ලාමීය විද්වතුන් ඉදිරිපත් කර තිබෙන කොන්දේසි :

1. මුලාරබා ගිවිසුම පිණිස වන වචන භාවිතය
2. මුලාරබා ගිවිසුමට පිවිසෙන්නන් (ප්‍රාග්ධන හිමිකරු, ව්‍යවසායකයා)
3. ප්‍රාග්ධනය : එය යොදන පුද්ගලයට අයත් ව හෝ එය පරිහරණය කිරීමේ බලය ඔහු ලබා සිටීම. භාණ්ඩයේ ගුණය, ස්වභාවය, ප්‍රමාණය යනාදිය වෙසෙසින් දැන සිටින්නක් විය යුතුය.
4. ශ්‍රමය නොහොත් ව්‍යවසාය : පාඩුව ප්‍රාග්ධනය යොදන්නා භාරගත යුතුය. ව්‍යවසායකයා හේතුකාරක වී නම් ඔහු එය භාරගත යුතු ය.
5. ලාභ බෙදීම : දෙපාර්ශ්වයටම අදාළ අනුපාතය තීරණය වී තිබීම.
6. ගිවිසුම සීමා සහිත නොවිය යුතුය. නිශ්චිත ප්‍රදේශයක, නිශ්චිත භාණ්ඩයෙහි පැවතිය යුතු යැයි සීමාවන් නොපැනවිය යුතු ය.

පහත සඳහන් තත්ත්වයන් යටතේ මුලාරබා ගිවිසුම අහෝසි වේ.

1. ඉහත සඳහන් කොන්දේසියක් නොමැති වීම.
2. ව්‍යවසායකයා භාණ්ඩ සුරැකීමෙහිලා නොසැලකිලිමත් වීම හෝ ගිවිසුමේ අරමුණට පටහැනි යමක් කිරීම.
3. ව්‍යවසායකයා හෝ ප්‍රාග්ධන හිමිකරුගෙන් හෝ මරණය

   තවද ව්‍යවසායකයා, මුලාරබා මගින් ලද මුදල යොදා වෙනත් මුලාරබා ගිවිසුමක් ඇති කරගත නොහැකි ය. එලෙස කිරීම සීමාව ඉක්මවා යාමක් ලෙස ගැනේ.

**මුෂාරකා**

- ලොවෙහි දක්නට තිබෙන නිෂ්පාදන ව්‍යවසායන් හා වාණිජ ක්‍රියාකාරකම් කුඩා පරිමාණයෙන් හා මහා පරිමාණයෙන් සිදුවන බව දක්නට ඇත. මහා පරිමාණ නිෂ්පාදනය හා වාණිජ කටයුතුවල දී තනි පුද්ගලයෙක්ට පමණක් යෙදිය නොහැකි වාතාවරණයක් ඇති වන්නට පුළුවන. බොහෝ දෙනෙකු එක් වී මුදල් යොදා මෙවැනි ව්‍යවසායන් හි යෙදුණේ එබැවිනි. මුෂාරකා ක්‍රමය ද එවැන්නකි.

- බොහෝ දෙනෙකු එක් වී තම තමන්ගේ මූල ධනය එක්කොට නිෂ්පාදනය හෝ වෘත්තීය ව්‍යවසායයෙක යෙදෙන ක්‍රමය මුෂාරකා ක්‍රමයයි.

- මුෂාරකා ක්‍රියාකාරකම් සඳහා වන කොන්දේසි :
  1. ප්‍රාග්ධන ප්‍රමාණය වෙසෙසින් දැන සිටීම
  2. ප්‍රාග්ධනය අත්පිට ඇති මුදලක් වීම
  3. ලාභ අනුපාතය තීරණය කරගෙන සිටීම.

**මුරාබහා**

- මුරාබහා යන පදය රබ්හ ක්‍රියා පදයෙන් හටගත්තෙකි. ලාභ ලැබුවේය යනු එහි අරුතයි. ඉස්ලාමීය විද්වත්හු, මෙය විවිධ ක්‍රම යටතේ අර්ථ නිරූපණය කරති. ඉමාම් ඉබ්නු රුෂ්ද් මෙය පහත සඳහන් ලෙස අර්ථ නිරූපණය කරයි.

  මුරාබහා යනු ව්‍යාපාරිකයකු සිය අලෙවි භාණ්ඩයේ ගැනුම් මිල, එය මිලට ගන්නට එන තැනැත්තාට පැහැදිළි කොට, තමා එම භාණ්ඩය විකුණන විට බලාපොරොත්තු වන නිශ්චිත ලාභය ද එක්කොට අලුතින් මිල නිර්ණය කිරීම වේ.

- සාමාන්‍ය භාණ්ඩ අලෙවි ක්‍රමයෙන් මෙය වෙනස් වේ. සාමාන්‍ය අලෙවියේ දී වෙළෙන්දා අලෙවි භාණ්ඩයේ ගැනුම් මිල සඳහන් නොකොට ගැනුම් මිල සමඟ ලාභය ද එකතු කොට මුළු තොගයම එම භාණ්ඩය අලෙවි කරයි. මුරාබකාවේ දී ගැනුම් මිල හා ලාභය ගැනුම්කරු දැන ගනී.

- මුරාබකා වෙළෙඳ ක්‍රමය ෂරීආහ්වෙන් අනුමත වී තිබේ. චතුර් මද්හබ් ඉමාම්වරු ද බොහෝ ඉස්ලාමීය විද්වත්හු ද මෙය අවධාරණය කරති. මෙය කිසිදු ලෙසකින් පොලිය හා සම්බන්ධ නැත. සාමාන්‍ය වෙළෙඳ අලෙවියේ දී පිළිපදිනු ලබන ෂරීආහ් විධිවිධාන මෙහි දී පිළිගනු ලැබේ. සෞදි අරාබියේ පිහිටා ඇති ඉස්ලාමීය නීති පර්යේෂණ ආයතනය විසින් ද මෙය අනුමත කර තිබේ. සෑම ව්‍යාපාරික ගනුදෙනුවක දී ම මෙය යොදාගත හැකි වේ.

- මුරාබකා ගිවිසුම අනුව අලෙවිකරු සිය අලෙවි භාණ්ඩයට අදාළ මිල අත්පිට මුදලට හෝ වාරික ක්‍රමයට ගෙවන්නට පුළුවන. මෙලෙස, වාරික ක්‍රමයට ගෙවීමේ දී සිදුවන දුෂ්කරතා දුරැලීම සඳහා ගැනුම්කරුගෙන් කිසියම් ඇපයක් ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටින්නට පුළුවන.

- ෂරිආහ්වේ කොන්දේසි :
  1. අලෙවිකරු සහ ගැනුම්කරු (මුරාබහා වෙළෙඳ ගිවිසුමට එළැඹෙන්නන්)
  2. වෙළෙඳ ගිවිසුම සඳහා වන වචන භාවිතය
  3. ඊජාබ් සහ කබූල්

- මුරාබහා පිණිස වන නියමයන් :

  භාණ්ඩය සම්බන්ධ කොන්දේසි
  1. භාණ්ඩය පිරිසිදු හා හලාල් වූවක් වීම.
  2. අලෙවිකරු හා ගැනුම්කරු උක්ත වෙළෙඳාමෙන් ප්‍රතිලාභ අත්කර ගැනීම.
  3. අලෙවි භාණ්ඩය හා මිල වශයෙන් ගෙවන භාණ්ඩය (මුදල්) ඔවුනොවුන්ට අයත් වූවක් වීම.
  4. භාණ්ඩය අදාළ අයිතිකරුට භාරකළ හැකි වීම.
  5. නිශ්චිත භාණ්ඩයේ ප්‍රමිතිය, ප්‍රමාණය, බර, ලක්ෂණ සහ මිල යනාදී දෙපාර්ශ්වයම දැන සිටීම.
  6. මිලට ගත් භාණ්ඩය භාර ගැනීමෙන් පසු අනෙකාට අලෙවි කිරීම.

  මුරාබකා භාණ්ඩයේ මිල නීර්ණය කිරීමේ දී පහත සඳහන් කරුණු පැහැදිළි කර ගත යුතු වේ.
  1. ගැනුම් මිල ගැනුම්කරු වීමට යන පුද්ගලයාට ගෙනහැර දැක්වීම
  2. ලාභ මුදල ගැනුම්කරු දැන සිටීම
  3. අලෙවි භාණ්ඩය වෙනුවට දෙනු ලබන මිල භාණ්ඩය (අලෙවි භාණ්ඩයේ) එම වාර්ගයම නොවීම.
  4. මුල දී පාරිභෝගිකයා කළ වෙළෙඳ ක්‍රියාකාරකම ෂරීආහ්වෙන් අනුමත කොට තිබීම.
  5. සාක්ෂි : සාක්ෂිකරුවන් සූදානම් කර ගැනීම යෙහෙකි. මේ මගින් අවුල් හා මතභේද හටගැනීම වළක්වා ගත හැකි වේ.

**සලම්** (අත්තිකාරම් ගෙවීමේ වෙළෙඳාම)

- පසුවට භාණ්ඩය භාරදීමේ ක්‍රමය යටතේ මිලට ගැනීම සලම් නම් වේ. මෙහිදී භාණ්ඩයේ මිල ගැනුම්කරු ගෙවයි. අලෙවිකරු නිශ්චිත දිනයෙක භාණ්ඩය භාරදෙයි.

- මෙම වෙළෙඳාම් ක්‍රමය කුර්ආන්, සුන්නාහ් සහ ඉජ්මාඋ යටතේ අනුමැතිය ලැබූවකි. මිනිසුන්ට සිදුවන එක්තරා පොදු අවශ්‍යතාවයක් සපුරාලනු පිණිස මෙම ක්‍රමය අනුමත වී තිබේ. මුදල් තිබෙන පුද්ගලයා භාණ්ඩය ලබා ගැනීමේ අවශ්‍යතාවෙන් පසුවෙයි. භාණ්ඩයේ අයිතිකරු එය නිෂ්පාදනය කිරීමට පෙරාතුව එසේ නැත්නම් අස්වනු නෙලීමට පෙරාතුව මුදල් අවශ්‍යතාවෙන් පෙළෙනු ඇත. නිදසුනක් වශයෙන් ගොවියෙකුට අස්වනු නෙළීමට පෙර ඇතිවන අවශ්‍යතාවන් ගැන සඳහන් කළ හැකි ය.

- නබි (සල්) තුමා මදීනාවට පැමිණි අවස්ථාවේ එහි මෙම ගනුදෙනු ක්‍රමය පැවැතියේ ය. මෙය ෂරීආහ්වට ගැලපෙන ලෙස සකස් කරනු පිණිස නබි (සල්) තුමා කොන්දේසි දැමීය. කිසියම් දෙයකට අත්තිකාරම් ගෙවන අය නිශ්චිත ප්‍රමාණය හා බර යන දෙකටම එසේ ගෙවිය යුතු ය. තවද කාලය නීර්ණය කර ගත යුතුවේ.

1. මිල වශයෙන් ගෙවන මුදල් වර්ගය හා ප්‍රමාණය පැහැදිළි ලෙස දැන ගැනීම.
2. මිලට නියමිත ප්‍රමාණය ගිවිසුමට එළෙඹෙන අවස්ථාවේ ගෙවිය යුතුය.
3. අලෙවිකරුගේ භාරයේ භාණ්ඩය පැවතිය යුතුය.
4. භාණ්ඩයේ ප්‍රමිතිය හා ප්‍රමාණය විස්තරාත්මකව සඳහන් කොට තිබිය යුතුය.
5. භාණ්ඩය භාරකරන කාලය සහ දිනය සඳහන් විය යුතුය.

**අල් ඉජාරා**

- සියලු දෙනා ම තමන්ට අවශ්‍ය සෑම භාණ්ඩයක් ම සෑම විටෙක ම අයිතිකොට ගන්නේ නැත. මෙවැනි අවස්ථාවල අතමාරුවට ගැනීම මගින් හෝ කුලියට ගැනීම මගින් තම අවශ්‍යතාවය සපුරා ගැනීමට සිදුවේ.

"පුද්ගලයෙකුගෙන් නැත්නම් භාණ්ඩයකින් ප්‍රයෝජන ලැබීමට නිශ්චිත මුදල් ප්‍රමාණයක් ගෙවීම ඉජාරා වේ."

ඉජාරාවට අදාළ කොන්දේසි :

1. දෙපාර්ශ්වයම හොඳ සිහියෙන් පසුවන්නන් වීම.
2. වැඩිවියට පත්ව සිටීම
3. ගිවිසුම සම්බන්ධයෙන් එකඟතාවක් පැවතීම
4. කුලියට දෙන භාණ්ඩය ගැන පැහැදිළි වශයෙන් දැන සිටීම.
5. කුලියට දෙන භාණ්ඩය, එහි ඵලදායී තත්ත්වයෙන් භාරකළ හැකි වීම.
6. කුලියට දෙන භාණ්ඩය ෂරීආහ්වෙන් තහනම් කරන ලද්දක් හෝ දීම තහනම් කරන ලද්දක් හෝ නොවී හලාල් වූවක් වීම.
7. කුලී මුදල වටිනාකමක් සහිත වූවක් ද ප්‍රමාණය දැන සිටියක් ද වීම

**අල් මුසාරආ**

- මුස්ලිම්වරයෙකුට තමාට අයත් ගොවි බිමෙන් නන් අයුරින් ප්‍රයෝජන ගන්නට පුළුවන. ඔහු කැමැති නම් තමාටම එහි වගා කරන්නට පුළුවන. තමාට වගා කිරීමට නොහැකි යැයි සිතෙන අවස්ථාවල තවත් කෙනෙකුට, කිසිදු ලාභයක් නොපතමින් එම බිම තාවකාලිකව දෙන්නට ද පුළුවන.
- "ඔබෙන් අයෙකුට ඉඩමක් අයත් ව තිබුණේ නම් ඔහු එහි වගා කරත්වා. නැත්නම් එය තම සොයුරාට දෙත්වා."

කෙනෙකු සිය ඉඩම, වගා කිරීම සඳහා වෙන කෙනෙකුට දී ගිවිසුම අනුව මුළු අස්වැන්නෙන් නිශ්චිත අනුපාතයක් ලබන්නට පුළුවන. ඉඩමේ අයිතිකරු, ගොවියාට බීජ හා උපකරණ යනාදිය දෙමින් උදවු වන්නට පුළුවන.මෙසේ වගා කටයුතුවල යෙදීම හවුලේ කෘෂිකර්මයේ යෙදීම නම්. නබි (සල්) තුමා කයිබර් හි දී අත්පත් කරගත් ඉඩම්, මෙම ක්‍රමය යටතේ එහි විසූ ජනයාට ම දුන්නේ ය. එනම් ඔවුන් එහි වගාකොට, අස්වැන්නෙන් අඩක් නබි (සල්) තුමාට දීම යන කොන්දේසිය යටතේ එම ඉඩම් ඔවුනට ම දෙන ලදී. (මුස්ලිම්) පසු කාලීන කලීෆාවරුන් ද මෙම ක්‍රමය නොකඩවා පිළිපැදූ බවට වියත්හු අදහස් දක්වති.

- ජාහිලිය්යා අවධියේ ඉඩමේ එක් කොටසක අස්වැන්න ඉඩම් අයිතිකරු ද, ඉතිරි කොටසේ අස්වැන්න ගොවියා ද ලබන කොන්දේසිය යටතේ නැත්නම් අස්වැන්නෙන් නිශ්චිත ප්‍රමාණයක් ඉඩම් අයිතිකරු ලබන කොන්දේසිය යටතේ වගාව සඳහා ඉඩම ලබාදීමේ ක්‍රමයක් පැවතුණි. මේ නිසා ගොවියාට පාඩු සිදුවේ. ලැබෙන අස්වැන්නට අනුව දෙදෙනාම බෙදා ගන්නේ නම් ගැටලුවක් නැත. එය සාධාරණ ය. ජාහිලිය්යා අවධියේ ක්‍රමය ඉස්ලාමයෙන් තහනම් කරන ලදී.

- ගොවිතැනෙහි යෙදෙන විට ඉඩම් අයිතිකරු හා ගොවියා උදාරශීලී ව ක්‍රියා කළ යුතුය. ගොවියා, වගා කටයුත්තෙහි ඉතා සැලකිලිමත් ව ඉදිරිපත් විය යුතුය. ඉඩම් අයිතිකරු ඉතා අධික කොටසක් නොඉල්ලිය යුතු ය. දෙපාර්ශ්වය අතර හොඳ හිත පැවැතිය යුතුය.

- කෙනෙකුට සිය ඉඩම කුලියට දෙන්නට ද පුළුවන. මෙය නිවැරැදි බවට බොහෝ වියත්හු සඳහන් කරති. ඉඩම කුලියට නොදිය යුතුය යන අදහස දෙන හදීස මත පිහිටා කුලියට නොදිය යුතු යැයි පවසන වියත්හු ද සිටිති.

**ෆයිඋල් මුඅජ්ජිල් හෙවත් ෆයි උත්තක්සීද්**

- කල් දමන ලද ගෙවීමේ වෙළෙඳාම හෙවත් වාරික ක්‍රමය යටතේ ගනුදෙනු කරන වෙළෙඳාමයි. මෙම වෙළෙඳ ගිවිසුමේ දී භාණ්ඩය මුලින් ද, ඊට අදාළ වටිනාකම පසුව ද ගෙවනු ලබන බැවින්, මෙය කල්දමන ලද ගෙවීමේ වෙළෙඳාම යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම වෙළෙඳාමෙහිලා පුද්ගලයන් තිදෙනෙක් සම්බන්ධ වෙති. අලෙවිකරු, ගැනුම්කරු සහ තැරැව්කරු ය. තැරැව්කරු, අලෙවිකරු සහ ගැනුම්කරු සම්බන්ධීකරණය කරන්නා ය. ගැනුම්කරු වෙනුවෙන් තැරැව්කරු භාණ්ඩයේ වටිනාකම අලෙවිකරුට ගෙවයි. පසුව එකී මිලට වඩා වැඩි ප්‍රමාණයකින් ද එකතු කොට තැරැව්කරු ගැනුම්කරුගෙන් වාරික ක්‍රමයට ලබාගනී. මෙම වෙළෙඳ ගිවිසුමේ භාණ්ඩය සඳහා වන මිල, ව්‍යවහාරික මිලට වඩා වැඩි ය.

- චතුර්මද්හබ්වලට අයත් වියතුන් බහුතරයකගේ අදහස අනුව මෙය ෂරීආහ්ව ප්‍රකාර අනුමත වන්නකි. මෙහි දී ලබන වැඩිපුර ප්‍රමාණය හලාල් වෙතියි පවසති. නූතන වියතුන් සමඟ නෛතික ආයතන ද මෙම අදහස දරති. මෙය ඉස්ලාමයේ අනුමත වූවක් බවට නීතිවියතුන් ඒකමතිකව තීරණය කර ඇතැයි ඇතැම්හු පවසති.

  1. අල්ලාහ් වෙළෙඳාම හලාල් කොට පොලිය තහනම් කළේය. මෙම පාඨය සියලුම වර්ගයේ වෙළෙඳාම්වලට යෙදේ.

  2. විශ්වාසය තැබූ අයවලුනි, ඔබ ද එකිනෙකා නියමිත කාලයක් දක්වා ණය ගනුදෙනු කරගත්තේ නම් එය ලියාගන්න. (2:282) කල්දමන ලද ගෙවීම් වෙළෙඳාමෙහි දී ගිවිසුම සිදුවන අවස්ථාවේ භාණ්ඩය හැර භාණ්ඩයේ වටිනාකම ලබා ගැනීමක් නොසිදුවේ. භාණ්ඩය පමණක් හුවමාරු වන බැවින් මෙහි දී එක්තරා ණය ගනුදෙනුවක් සිදුවේ. එම නිසා ඉහත සඳහන් පාඨයෙන් ණය ක්‍රමය යටතේ වන වෙළෙඳාම අනුමත වේ.

  3. පහත සඳහන් හදීසයන් ද මෙය සහතික වේ. කිසියම් කෙනෙකු ණයට රටඉඳි දුන්නේ නම්, එය ඔහු දන්නා මිනුම් ක්‍රමයක් හෝ කිරීමේ ක්‍රමයක් නිශ්චිත කරගත් කාලසීමාවට ණයට දෙන්න. (මුස්ලිම්)

     මෙහි දී නබි (සල්) තුමා රටඉඳි, වෙළෙඳ භාණ්ඩයක් වශයෙන් සඳහන් කොට ඇත. එම නිසා මීට අදාළව මැනිය හැකි සියලුම භාණ්ඩ රටඉඳිවලට සාපේක්ෂව කළ හැකි ය.

පහත සඳහන් කොන්දේසි කල්දමන ලද වෙළෙඳාමෙහි දකින්නට ඇත්නම් එවැනි වෙළෙඳාම හා ඉන් ලැබෙන ලාභය ද ෂරීආහ්වට අනුව අනුමත වේ.

1. රැවටිල්ල, වංචාව හා ප්‍රෝඩාවෙන් වියුක්ත වූ වෙළෙඳාම් ක්‍රමයක් වීම.
2. වෙළෙඳ භාණ්ඩය ෂරීආහ්වෙන් අනුමත වූවක් වීම.
3. මුදල් ගෙවිය යුතු කාලසීමාව අර්ථ දක්වා තිබීම.
4. පාරිභෝගිකයාට දීමට පෙර අලෙවිකරු භාණ්ඩය භාරගෙන තිබීම.

මේ සමඟ ගනුදෙනුවල දී දෙපාර්ශ්වය විසින් ම පිළිපැදිය යුතු බවට පොදුවේ ෂරීආහ්වෙන් නියම වූ කොන්දේසි ද අඩංගු ය.

**අස්සම්සරා**

- තැරැව්කරු වශයෙන් කටයුතු කිරීමට ඉස්ලාමයෙන් තහනමක් නැත. මෙය අලෙවිකරු හා ගැනුම්කරු අතර කිසියම් සම්බන්ධතාවක් ඇති කරවන්නක් වන අතර. ලාභදායක ගනුදෙනුවකටද මඟ පාදයි.

- ඉමාම්වරුන් වූ ඉබ්නු සීරීන්, අතාඋ, ඉබ්රාහිම් අල් හසන් යනාදීහු, තැරැව්කරු වශයෙන් කටයුතු කිරීම හා ඒ සඳහා යම් මුදලක් ලැබීමෙහිලා කිසිදු වරදක් දැක නැතැයි ඉමාම් බුහාරි (රහ්) තුමා සඳහන් කරයි.

- ඉබ්නු අබ්බාස් (රළි) තුමා "මෙම ඇඳුම අලෙවි කළයුතු අසවල් මිලට වඩා වැඩි මිළකට අලෙවි කළා නම් වැඩිපුර මුදල ඔබට අයත් යැයි කෙනෙකු තව කෙනෙකුට පැවසීමේ වරදක් නැතැ"යි සඳහන් කරයි. ඒ අනුව, තැරැව්කරු තම සේවය වෙනුවෙන් ගාස්තුවක් අයකර ගත හැකි ය යන්න ප්‍රබල අදහසක් ලෙස ගැනේ.

**අත්තඃමීන් (රක්ෂණ ක්‍රමය)**

- ඉස්ලාමීය රජයක් මගින් ඒ යටතේ ජීවත් වන සෑම දෙනෙකුගේ ම ආරක්ෂාව සහතික කෙරෙයි. එකී සහතිකය සමාජ සාමූහික වගකීම යටතේ හෝ බයිතුල් මාල් නමැති භාණ්ඩාගාරය මගින් හෝ සිදු කෙරෙයි. සැබැවින් ම ඉස්ලාමීය රක්ෂණ සමාගම වශයෙන් ක්‍රියාත්මක විය යුතු වන්නේ බයිතුල්මාල් ආයතනයයි.

- ඉස්ලාමීය රටෙක වෙසෙන පුද්ගලයන්ට ඇති වන පෞද්ගලික ආපදා විපත්වල දී ඔවුන්ට පිහිටවීම රජයේ වගකීම වෙයි.

- ණයතුරුස් ව සිටින්නන්ට ද zසකාත් මුදලින් විශේෂ තොගයක් ගෙවනු ලැබේ. zසකාත් මුදල් ලැබීමට සුදුසුකම් ලදවුන් අතර ණයතුරුස් වූවන් ද එක්තරා කොටසක් බව ඔබ දන්නවා ඇත. මේ හැර, වෙනත් බොහෝ ආයතන මගින් ද ඉස්ලාම් ජනතාවගේ ආරක්ෂාව සහතික කරයි.

- මෙනයින්, ඉස්ලාමීය ගනුදෙනු නීතිරීතිවලට පටහැණි නොවන ආකාරයෙන් රක්ෂණ ආයතන ක්‍රියාත්මක කැරවීමෙහිලා වරදක් නැත. ඉස්ලාමයේ රක්ෂණ ක්‍රමය වූ කලී බොහෝ විට සහයෝගීතාව හා සාමූහික වගකීම යටතේ ආධාර ලබා ක්‍රියාත්මක වන්නා වූ සුබසාධන ආයතනයකි. එනමුදු දැනට ක්‍රියාත්මක වන නූතන රක්ෂණ සමාගම් හා ඒවායේ කාර්ය පටිපාටිය ඉස්ලාමයට හා එහි මූලික හරයනට පටහැනි වූවකි.

- මේ හේතුවෙන් ම වත්මනෙහි අපට දක්නට ලැබෙන ජීවිත රක්ෂණය ඇතුළුව සියලුම රක්ෂණ ක්‍රමවේදයන් හරාම් - තහනම් වූවක් බවට වියත්හු දකිති. මජ්මඋල් ෆික්හිල් ඉස්ලාමී නමැති ඉස්ලාමීය අධිකරණය විසින් ද මෙම තීන්දුව දී තිබේ. සූදුවට අදාළ ලක්ෂණ, පොලිය සහ කිසිම ගෙවීමකින් තොරව අනුන්ගේ ධනය ලබා ගන්නා ස්වභාවය යනාදිය නූතන රක්ෂණය හා බැඳී පවතී.

- තවද, ගනුදෙනුවල දී නොපැවතිය යුතු වූ අවිනිශ්චිත, අපැහැදිළි ගුණාංග රක්ෂණ ගිවිසුම් හා බැඳී පැවතීම නිසා ද මෙබඳු ක්‍රමවේදයන් බැහැර කළ යුතු වෙතැයි අදහස් කෙරේ.

- ජීවිත රක්ෂණ ක්‍රමය, නාම මාත්‍රයෙන් ඉස්ලාමීය නීතියට පටහැණිය. සෙසු රක්ෂණ ක්‍රමවේදයන් සම්බන්ධයෙන් (නිදසුනක් වශයෙන් විපත් රක්ෂණ) ඒවායේ යම් යම් සංශෝධනයන් කිරීම තුළින් ඉස්ලාමීය ක්‍රමයට පත්කළ හැකි වෙයි.

- නිදසුනක් වශයෙන්, නූතන ඉස්ලාමීය නීති විශාරදයෙකු වන ආචාර්ය යූසුෆ් අල් කර්ළාවි ගේ අදහස අනුව, විපත් සඳහා වන රක්ෂණය වන්දි සඳහා කොන්දේසි සමාන වූ ආධාරය වශයෙන් ගෙන ඉස්ලාමීය ක්‍රමය අනුව පිළිපැදිය හැකි වෙයි. එනම් තමාට යම්කිසි (වාස්තවික) විපතක් සිදුවන විට, තමාට සිදුවන පාඩුවේ බර අවම කරගන්නා කිසියම් මුදල් ප්‍රමාණයක් වන්දි වශයෙන් ගෙවිය යුතුය යන කොන්දේසිය මත තමාගේ ගෙවීම, සමාගමට ආධාර වශයෙන් ගෙවයි. එකී සමාගම, පොලී ගනුදෙනු බැහැර කරන්නක් නම්, මෙම ක්‍රමය ඉස්ලාමීය ෂරීඅතයට එකඟ වෙයි.

**අර්රහ්න්** (උකස් තැබීම)

- ණයකරු, තමා ලද ණයට ඇපයක් වශයෙන් ණය හිමියා වෙත, මූල්‍යමය වටිනාකමක් ඇති

  වස්තුවක් තැබීම උකසට තැබීම වෙයි. ඔබ මෙය විස්තරාත්මක ව දැනගනු පිණිස නිදසුනක් දක්වමු.

- කෙනෙක්, වෙනත් කෙනෙකුගෙන් එක්තරා මුදල් ප්‍රමාණයක් ණය වශයෙන් ලබයි. තමා ලද ණය මුදල පියවන තාක් හෙතෙම ඉඩම් කැබැල්ලක් හෝ සතකු හෝ ණය හිමියා වෙත තබයි. මෙය උකස් තැබීම නම් වෙයි.

- ඉස්ලාමීය නීතිය අනුව උකස් තැබීම අනුමත වෙයි. මීට පහත සඳහන් අල්කුර්ආනික පාඨය ඉවහල් වෙයි. ඔබ ගමන්බිමන්වල යෙදී සිට (ගනුදෙනු කිරීමට) ලියන්නකු නොලද විට (යම් වස්තුවක්) ඇපයට ලබා ගන්න. (2:283)

- නබිනායකතුමා (සල්) මෙම ක්‍රමය අනුමත කර ඇති අතර, එතුමා එක්තරා අවස්ථාවක, තමාගේ පළිහ යුදෙව්වෙකු වෙත ඇපයට තබා ඔහුගෙන් ආහාර ද්‍රව්‍ය ලබාගෙන ඇත. (බුහාරි)

- මෙම ක්‍රමය නීත්‍යානුකූල බවට, ඉස්ලාමීය වියත්හු මුල් අවධියේ සිටම ඒකමතික ව පිළිගත්හ.

- මෙම උකස් තැබීමේ ක්‍රමය වලංගු වීම සඳහා පහත සඳහන් කොන්දේසි ඉටුවිය යුතු වෙයි. ඒවා නම්,

  1. හොඳ සිහියෙන් පසුවීම
  2. තරුණ වියට පත්ව සිටීම
  3. උකස් තබන භාණ්ඩය හෝ ලිපිලේඛනාදිය, ගිවිසුමට එළෙඹෙන අවස්ථාවේ එහි තිබීම
  4. උකස ලබන්නා හෝ ඔහුගේ නියෝජිතයා හෝ එම වස්තුව භාර ගැනීම

- උකස් තැබීමේ ක්‍රියාවලියේ දී ගිවිසුමකට එළැඹීමේ අරමුණ වනුයේ ණය ආපසු ලබා ගැනීමේ සහතිකය ලබා ගැනීමකි. ඒ විනා එමඟින් ලාභ ඉපැයීම නොවේ. එම නිසා උකස ලබන්නා, තමා වෙත උකසට තබා ඇති භාණ්ඩය පරිහරණය නොකළ යුතු වේ. එනයින් එම භාණ්ඩයෙන් ප්‍රයෝජනයක් ගැනීම වනාහි දුන් නයෙහි පොළිය ඉපැයීමක් බවට පත් වෙයි.

- එහෙත්, උකසට තබා ඇති භාණ්ඩය ගමන් බිමන් යාහැකි හෝ කිරි දෙවිය හැකි සතකු වූවා නම්, ඒ සඳහා වන වියහියදම්වලට සමාන ලෙස ඒවායින් ප්‍රයෝජනයක් ලැබිය හැකිය. මේ අනුව, අශ්වයන් හා ගවයන් යනාදිය වේ නම්, ඒවායේ පිට නැඟී ගමන් බිමන් යාමට ද බර ඇදීමට ද පුළුවන. එළෙදෙනුන් හා එළුදෙනුන් යනාදිය නම් උන්ගෙන් කිරි දෙවීමට ද පුළුවන.

- මූලික වශයෙන් උකසට තැබූ භාණ්ඩයෙන් ලැබෙන ප්‍රයෝජන සියල්ලම උකස් තුබූ අයට ලැබිය යුතු වෙයි. ඒ අනුව එහි වර්ධනයේ ප්‍රතිඵල සියල්ල ම ඔහුට හිමි වූවකි.

- තවද, උකසට තබන ලද භාණ්ඩය එය තබාගත් පුද්ගලයා වෙත විශ්වාසය මත තබන ලද වස්තුවකි. එයට සිදුවන විනාශය හෝ අලාභ හානිය හෝ ඔහුගේ වරදකින් හෝ නොසැලකිල්ලකින් සිදුවන්නක් නොවේ නම් ඊට ඔහු වගකිය යුතු නැත.

- ණය ලබාගත් පුද්ගලයා විසින් ණය පියවන්නට නොහැකි වූයේ නම් උකස් තබන ලද භාණ්ඩය උකස් තබා ගත් පුද්ගලයාට අයත් නොවේ. මෙහිදී, එම භාණ්ඩය විකුණා දමා ණය මුදල ණය හිමියාට දෙනු ලැබේ. ඉතිරියක් ඇත්නම් එය භාණ්ඩයේ හිමිකරුට අයත් වෙයි.

- ණය පියවීමේ කාලසීමාවක් සඳහන් කොට, නියමිත දවසේ ණය නොපියවී නම්, උකස් භාණ්ඩය විකිණීමට අවසර තිබේ. මෙහිදී ද ඉතිරියක් ඇත්නම් එය භාණ්ඩ හිමියාට අයත් වන්නේ ය.

**අල් වකාලා** (ඒජන්සි ක්‍රමය)

- අල් වකාලා නම් අරාබි පදයේ අරුත, වගකීම පැවරීම හා භාරදීම යනාදියයි. කෙනෙකු තමාගේ කටයුතු කිරීමට වෙනත් කෙනෙකු පත් කිරීම මෙහි දී වකාලා නම් පදයෙන් අදහස් වෙයි.

- මෙය, ඉස්ලාමයෙන් අනුමත වූ ක්‍රමයකි. සෑම වගකීමක් ම, සෑම කාර්යයක් ම තමා විසින් ම කර ගැනීමට සෑම කෙනෙකුටම නුපුළුවන. බොහෝ අවස්ථාවල දී තමාගේ ඇතැම් කටයුතු ඉටු කිරීමට වෙනත් කෙනෙකුගේ උදව් පතන්නට සිදුවෙයි. එවැනි අවස්ථාවල වගකීම් භාරගත් අය, ඒජන්ත හෝ නියෝජිතයන් වශයෙන් පෙනී සිට එම වගකීම් ඉටු කරති. මෙම ක්‍රමය අනුමත කළාවූ බොහෝ නීතිමය පාඨ දක්නට ඇත. වරෙක නබිනායක තුමාගේ (සල්) අබූ රාෆි නම් නබි හිතවතා සහ අන්සාරිවරයෙක් (වකීල්) භාරකරු වශයෙන් පත්කොට මයිමූනාතුමිය (රලි) සරණ පාවා ගත්හ. තවද නබි (සල්) තුමා තමන් වෙනුවෙන් ණය පියවීම සහ දඬුවම් පමුණුවීම යනාදී වගකීම් ඉටුකරනු පිණිස බොහෝ දෙනෙකු පත්කොට ඇත.

- මෙම ක්‍රමයට ඉජ්මාඋ නම් ඒකමතික අනුමැතිය ලැබී තිබෙන අතර, එක්තරා සහයෝගීතාවක් වන බැවින්, මෙම ක්‍රමය ඉස්ලාමයේ පිළිගත හැකි ක්‍රමයක් වශයෙන් ද සලකනු ලැබේ. වකාලා ක්‍රමය, ගිවිසුමක් වන බැවින්, සෙසු ගිවිසුම්වලට අවශ්‍ය වන ඊජාබ් සහ කබූල් යනාදිය මෙයට ද අවශ්‍ය වේ.

- මෙම ගිවිසුමට එළැඹුණු දෙපාර්ශ්වයටම, තමන් කැමැති අවස්ථාවක එය ඉල්ලා අස්කර ගැනීමට ද, කඩ කිරීමට ද අයිතිය තිබේ.

- දැන් අපි වකාලා ක්‍රමයේ ගිවිසුමක් ක්‍රියාවට නැංවීමේ කොන්දේසි ගැන සලකා බලමු. එකී ගිවිසුම්වල සමහරක්, වගකීම් ලබන්නා හා සබැඳි ය. සෙසු සමහරක් වගකීම පවරන්නා හා සබැඳි ය.

  * වගකීම් පවරන්නා එය කරන්නේ කුමකින් ද, එය පිළිපැදීමට සම්පූර්ණ අයිතිය ඇත්තා විය යුතු ය. නිදසුනක් වශයෙන් සිහි මඳ පුද්ගලයකුට කිසිම කරුණක දී තමන් වෙනුවෙන් කිසිවකු පත් කිරීමට අයිතිය නැත.

  * වගකීම භාරගත් අය විචාර බුද්ධියකින් පසුවන්නකු විය යුතුය. මන්ද බුද්ධික හෝ උන්මත්තකයකු හෝ නොවිය යුතුය.

  * විශේෂයෙන් වගකීම් භාරගන්නා පුද්ගලයා තමාට පවරනු ලැබූ වගකීම් ගැන දැන සිටිය යුතුය. එහෙත් හෙතෙම පොදුවේ ප්‍රකාශ කරනු ලැබී නම් ගටලුවක් නැත. නිදසුනක් වශයෙන් කෙනෙකු වෙනත් කෙනෙකුට මා වෙනුවෙන් ඔබට කැමැති දෙයක් ගත හැකි යැයි ඉල්ලා සිටීම සඳහන් කළ හැකි ය.

- වකාලා ක්‍රමය, මිලට ගැනීම, විකිණීම, කුළියට දීම, ණය දීම, එය ආපසු ලබා ගැනීම, ආරාවුල් හා සාම ගිවිසුම් ක්‍රියාදාමයන් ඇතුළු සෑම ආකාරයක ම ගිවිසුම්වලට අදාළ වේ. වලංගු වේ. භාරගත් අය පිරිමියෙකු හෝ ගැහැණියක විය හැකිය.

- කෙනෙකු තමා විසින්ම කළ හැකි සෑම ක්‍රියාවක් ම, වකාලා ක්‍රමය යටතේ සෙස්සනට භාරකළ හැකි වෙයි. මෙය වකාලා සඳහා වන පොදු නීතියකි.

- නියෝජනය කළ නොහැකි කරුණුවල දී වකාලා වලංගු නොවේ. නිදසුනක් වශයෙන් නැමදුම් හා දිවුරුම් දීම වැනි දේ අනුන් ලවා කැරවිය නොහේ.

- පහත සඳහන් තත්ත්වයන් යටතේ වකාලා ගිවිසුම් අහෝසි වේ.
  1. දෙපාර්ශ්වය අතරින් එක් පාර්ශ්වයක් අභාවයට පත්වීම හෝ උමතු වීම.
  2. වකාලා යටතේ වූ අදාළ ක්‍රියාව අවසන් වීම.
  3. වගකීම පැවරූ අය, වගකීම පවරනු ලැබූ අයගෙන් එම වගකීම අවලංගු කිරීම.
  4. වගකීම භාරගත් අය එයින් ඉල්ලා අස්වීම.
  5. වගකීම් පවරන ලද දෙය, වගකීම් පැවරූ අයගේ අයිතියෙන් බැහැර වීම

**අල් කර්ළ්** (ණය)

- ණය දීම උසස් ක්‍රියාවකි. මුස්ලිම්වරයෙකු සෙසු මුස්ලිම්වරයෙකුට දෙවරක් ණය දීම, එක්වරක් දන්දීමට සමාන ය. (ඉබ්නු මාජා)

- සිඟාකෑම තහනම් කළ ද ඉස්ලාම් ණය ගැනීම තහනම් කළේ නැත. ඒ වෙනුවට ඊට අවසර දෙනු ලැබේ. ණය ලබන ක්‍රමය, ගනුදෙනු ක්‍රමයක් වශයෙන් සලකනු ලබන බැවින් එහි ද ඊජාබ් සහ කබූල් අවශ්‍ය වේ.

- මුදල් පමණක් නොව, ඇඳුම් සහ සතුන් යනාදිය ද වෙළෙඳ භාණ්ඩ ඇතුළුව කිරිම් මිනුම් සඳහා භාවිත වන භාණ්ඩ ද ණයට දිය හැකි ය.

- ණයට දීම එක්තරා උදව්වක්, සහයෝගයක් විනා, ඉපැයුම් මාර්ගයක් නොවේ. ස්වකීය ණය හිමියා තමා දුන් ප්‍රමාණය ම ණයකරුගෙන් ආපසු ගත යුතුවේ. දුන් ප්‍රමාණයට වඩා වැඩියෙන් ආපසු ඉල්ලා සිටීම හා අපේක්ෂා කිරීම හරාම් වේ.

- එහෙත්, කොන්දේසි නොදමන ලද තත්ත්වය තුළ ණයකරුට සිය කැමැත්තෙන් ම, ණය පියවීමේදී තමා ලද ප්‍රමාණයට වඩා වැඩිපුර දීමට අවසර තිබේ. එකී වැඩිපුර ප්‍රමාණය ණය හිමියා විසින් ලබාගැනීම වරදක් නොවෙයි නබි (සල්) තුමා. තමන් ලද ණය පියවීමේ දී ලැබූ ප්‍රමාණයට වඩා වැඩිපුර දීම සිරිතකි. ජාබිර් ඉබ්නු අබ්දුල්ලාහ් තුමා පහත සඳහන් පරිදි පවසයි.

  අල්ලාහ්ගේ දූතයා, මට දිය යුතු ණයක් තිබිණි. එතුමා එය ආපසු දුන් අතර ප්‍රමාණය වැඩිකර ද දුන්නේ ය. (බුහාරි, මුස්ලිම්)

- කෙනෙකු තමන් ලද ණය, හැකි ඉක්මණින් පියවීම උතුම් වේ. ණයක් දී ඇති තත්ත්වයෙන් මරුමුවට පත්වීම ගැන නබි (සල්) තුමා බොහෝ අවස්ථාවල දී දැඩි ලෙස අවවාද කර තිබේ.

- ණයකරුවන්ගේ ජනාසා සලාත පැවැත්වීමට එතුමා පසුබට වී ඇත.

- ණයකරු, එය ආපසු පියවිය නොහැකි අයුරින් අසීරු තත්ත්වයක පසු වෙතොත්, ණය හිමියා ඔහුට කාල අවකාශය ලබාදීම යහපත් ක්‍රියාවකි. ණය මුදල දානයක් වශයෙන් පත් කිරීම ඊට වඩා ශ්‍රේෂ්ඨ වේ.

- ඒ හැර ණයකරු අසීරු තත්ත්වයක පසුවෙතොත්, (ඔහුට) පහසුකම් ඇතිවන තාක් බලාපොරොත්තුවෙන් සිටින්න. තවද (මෙහි ඇති යහපත) ඔබ දනිතොත් එය ඔහුට ම දන් දීමෙන් ඔබට වඩාත් ආනිසංස අත් වේ. (2:280) යනුවෙන් අල්කුර්ආනයේ සඳහන් ය.

**පසු උරුමය**

- ආර්ථිකමය ක්‍රියාවල දී පසු උරුමය පිළිබඳ කරුණු ඉතා වැදගත් තැනක් උසුලයි. පසු උරුමය යනු කෙනෙකුගේ මරණයෙන් පසු ඔහුගේ වස්තුව අයිති විය යුතු වන්නේ කාට කාට දැයි හා කවර ප්‍රමාණයකින් දැයි විස්තර කරන්නකි.

- ලොව ඉපැදෙන සියලු දෙනා ම, තමාටත්, තම භාරයේ සිටින්නන්ටත් අවශ්‍ය භාණ්ඩ සොයා ගනිති. තමා සොයා ගත් කොටසක් හෝ විශාල කොටසක් හෝ බොහෝ විට තම දරුවන්ට ඉතිරි කර යනු ඇත. මෙම වස්තුව, තම පවුල හා ඥාතීන් සාධාරණ අන්දමින් බෙදාහදා ගෙන භුක්ති විඳිය යුතු බව ඔවුන්ගේ කැමැත්තයි. එහෙත් ප්‍රායෝගික ලෝකයේ මෙවැනි අත්හැර දමන දේපළ ධනය සාධාරණ ක්‍රමයකට නොබෙදා කීප දෙනෙකු පමණක් පැහැර ගන්නා තත්ත්වයක් උදා වී ඇත. මෙබඳු තත්ත්වයක් ඇති නොවන්නට ඔවුන් නීතියෙන් බැඳ දමා, ඒවා සාධාරණ ක්‍රමයකට බෙදා වෙන් කිරීමට මඟ සැලසීම අවශ්‍ය වේ.

- පුරාතනයේ සිට මේතාක් සෑම සමාජයක් විසින් ම මරණයෙන් පසු ඉතිරි කර යන දේපළ, කිසියම් ක්‍රමයකින් බෙදා ඇති බව පෙනේ. රෝමවරුන්, ග්‍රීකවරුන්, ජාහිලියියා යුගයේ ජීවත් වූවන්, ජාන්දුන් සහ මුස්ලිම්වරුන් යනාදීහු මේ සම්බන්ධයෙන් විවිධ නීතිරීති පිළිපැදූහ.

- යුදෙව්වන්ගේ පසු උරුමකම් නීතිය අනුව, මරණයට පත් කෙනෙකුට පිරිමි දරුවෙකු සිටී නම්, ගැහැණු දරුවන්ට හෝ බිරිඳට හෝ කිසිදු අයිතියක් නැතැයි සඳහන් වේ. එසේම, පවුලේ වැඩිමහල් පුතාට, ඔහුට බාල සොහොයුරාට මෙන් දෙගුණයක් දිය යුතු යැයි සඳහන් වේ. පිරිමි දරුවකු නැති විට දුවගේ පුතාට එම දේපළ පිරිනැමේ. පිරිමි දරුවන් නොමැති නම් ගැහැණු දරුවන්ට එය හිමි වේ.

- ජාහිලිය්‍යා යුගයේ දී පිරිමි දරුවන්ට පමණක් පසු උරුමකම් හිමි විය. එයින් ද, වීරෝදාර පුතාට ප්‍රමුඛතාව දෙන ලදී. හින්දූන්ගේ ප්‍රතිපත්තිය අනුව ගැහැණු දරුවන්ට පසු උරුමකම් නැත.

- මේ අන්දමට ඓතිහාසික වශයෙන් සලකන කල පසු උරුමකම් දීමේ දී ද වෙනස්කම් කර ඇති බව පෙනේ. පිරිමි, ගැහැණු, වැඩිමහල්, බාලයා, වීරයා සහ බියගුල්ලා වශයෙන් භේද ගැන සලකා බලා ඇති බව පෙනේ. මෙමගින් පෙන්වනු ලබන්නේ ක්‍රෝධය සහ භේදයයි. මේ හැර ධනය ගොඩගැසීමට ද, මෙමගින් අවකාශ සැලනේ. එම නිසා ඓතිහාසික වශයෙන් සැලකීමේ දී ඉස්ලාම් හැර, ඉතිරි පසු උරුමකම් පිළිබඳ පිළිවෙත්වලින් ඇති කර තිබෙන්නේ ප්‍රශ්න බව මෙමඟින් සනාථ වේ.

- ඉස්ලාමීය පසු උරුමකම් පිළිබඳ නීතිය, ඉහත සඳහන් නීති මෙන් පටු අරමුණු තේමා කරගත්තක් නොවේ. පහත සඳහන් කුරාන් පාඨය පහළ වූ තැන් සිට, ස්ත්‍රීන්, දරුවන් හා පවුලේ සිටින සියලු දෙනාම, තම තමන්ගේ තත්ත්වය අනුව, දේපළවල පසු උරුමකම් ලැබීමට අවස්ථාව සැලසෙයි. දෙමවුපියන් හෝ සමීප ඥාතීන් හෝ ඉතිරි කර ගිය වස්තුවෙන් ස්ත්‍රීනට ද කොටසක් හිමි වේ. (එයින් ධනය) අඩු වුව ද, වැඩි වුව ද එසේමයි. මෙය අල්ලාහ් විසින් නියම කරන ලද කොටසයි. (4:7)

- පසු උරුමකම් නීතිය පිළිබඳව පිරිමින්ටත්, ගැහැණුන්ටත් කොටසක් ඇතැයි ඉහත සඳහන් අල්කුර්ආන් පාඨයෙන් සඳහන් වේ. පිරිමි පක්ෂය, ගැහැණු පක්ෂයට වඩා වගකීම් දැරීමෙහිලා පියවරක් උසස් ය යන හේතුව මත, ගැහැණුන් ලබන කොටසට වඩා පිරිමින් ලබන කොටස වැඩි බව පහත සඳහන් කුරාන් පාඨයෙන් විස්තර වේ.

- ඔබගේ දරුවන්ගෙන් ගැහැණු දරුවන් දෙදෙනෙකුට ලැබෙන කොටස පිරිමි දරුවෙකුට ලැබෙන බව අල්ලාහ් ඔබට උපදෙස් දෙයි. ගැහැණු දරුවන් පමණක් සිට, ඔවුන්ගේ සංඛ්‍යාව දෙකක් නැත්නම් ඊට වැඩි නම්, ඔවුනට මියගිය අය ඉතිරි කළ දෙයින් 2/3 කොටසක් ලැබේ. එක් ගැහැණු දරුවෙකු නම්, ඔහුගේ වස්තුවෙන් 1/2 කි.

- පුරාතන හා නූතන යුගවල කෙනෙකුගේ හදාවඩා ගත් දරුවා, ඔහුගේම දරුවකු වශයෙන් සලකා, ධනයෙන් ද කොටසක් ලැබෙන තත්ත්වය පිළිපදිනු ලැබේ. හදාවඩා ගත් දරුවා, ඔහුගේම දරුවා නොවන බවට පහත සඳහන් පාඨය ගෙන හැර දක්වයි.

- (එසේම) අල්ලාහ්, හදාවඩා ගත් දරුවා ඔබගේ ම දරුවා බවට පත් කළේ නැත. හදාවඩා ගත් දරුවා තමන්ගේ ම දරුවකු යැයි පැවසීම, ඔබගේ වචනවලින් කියන දේවල් පමණි. අල්ලාහ් පවසා තිබෙන්නේ සැබෑවකි. තවද ඔහු, ඍජු මාර්ගය පෙන්වයි. (අල්කුර්ආන්)

- පසු උරුමකම් නීතිය සම්බන්ධයෙන් නබි නායකතුමා (සල්) බොහෝ අවස්ථාවල පවසා තිබේ. පහත සඳහන් වන්නේ එවැනි හදීසයකි.

- ඔබ පසු උරුමකම් පිළිබඳ නීතිය හදාරා, අනුන්ටත් උගන්වන්න. මන්ද, එය දැනුමේ අඩකි. තවද මෙම කලාව අමතක වන්නකි. මගේ ප්‍රජාවගෙන් ඉවත් කෙරෙන මුල්ම කරුණ මෙයයි. (ඉබ්නු මාජා)

**පසු උරුමකම් හා සම්බන්ධ නීතිරීති**

- කෙනෙකු සිය ඇවෑමෙන් හැර යන දේපළ, ධනය, පසු උරුමකම් පිළිබඳ වස්තු යනුවෙන් හැඳින්වේ. මෙම වස්තුව, පසු උරුමක්කාරයන් අතර බෙදා දීමට පෙර, එයින් ඉටුකළ යුතු ඇතැම් යුතුකම් තිබේ. පසු උරුමකම් නීති ගැන දැනගන්නට පෙරාතුව මෙම යුතුකම් ගැන දැනගැනීම අවශ්‍ය වේ.

    1. ජනාසාවට අදාළ යුතුකම් ඉටු කිරීම

    මුස්ලිම්වරයෙකුගේ ජනාසාව නෑවීම, කෆාත් කිරීම, නැමදුම් ඉටු කිරීම සහ මිහිදන් කිරීම යනාදී යුතුකම් හතරක් ඇත. මියගිය පුද්ගලයකුගේ වත්කම්වලින් ඉටු කළයුතු මුල්ම යුතුකම මෙයයි. මෙහිදී ජනාසාවට අදාළ යුතුකම්වල අඩුපාඩු නොසිදුවීමටත්, පසු උරුමක්කාරයන්ගේ උරුමකම්වලට හානියක් නොවීමටත් වගබලා ගත යුතු වෙයි.

    2. මියගිය පුද්ගලයාගේ ණය පියවීම

    මියගිය පුද්ගලයෙකුගේ දේපළවලින් ඉටුකළ යුතු දෙවැනි යුතුකම වනුයේ ඔහු විසින් පියවිය යුතු ව තිබුණු ණය පියවීමයි. මියගිය කෙනෙකුට දෙයාකාර ණය තිබෙන්නට පුළුවන.

    (අ) අල්ලාහ්ට ගෙවිය යුතු ණය (උදා : zසකාත්, නද්ර්, කෆ්ෆාරා, ෆිදියා)

    (ආ) මිනිසුනට ණය වී සිටියා නම් ඒවා පියවීම.

    3. වසිය්‍යතය (අන්තිම කැමැත්ත) ඉටුකිරීම

    වසිය්‍යත් යනු අන්තිම කැමැත්ත නොහොත් ඔප්පුව වේ. ජනාසාවට අයත් වියහියදම් හා ණය පියවීමෙන් පසු ඉතිරියෙන් , මියගිය තැනැත්තාගේ අන්තිම කැමැත්ත ඉටු කරනු ලැබේ. කෙනෙකු තමා මියගිය පසු, සිය ධනයෙන් වෙනත් කෙනෙකුට පිරිනැමිය යුතු යැයි ......... කළහැකි උපරිම සීමාව 1/3 කට වඩා වැඩි වූ විට එය වලංගු නොවේ. මේ ගැන මෙසේ සඳහන් වේ.

    පසු උරුමක්කාරයන්ට කොටස් ලැබීම, ණය සහ වසිය්‍යත් යනාදිය ගෙවීමෙන් පසුවයි. (අල්කුර්ආන්)

පසු උරුම සඳහා වන දේපල සඳහා කොන්දේසි :

දේපල යනු උරුමය ක්‍රියාවට නැංවීමට පහත සඳහන් කොන්දේසි හෙවත් ෂර්ත මනා අන්දමින් පිළිපැදිය යුතු වෙයි. මුස්ලිම්වරයෙකුට මෙහිලා පැහැදිළි දැනුමක් තිබිය යුතු වෙයි.

1. කිසියම් දේපළක් පසු උරුම සඳහා වන දේපළ වශයෙන් සැලකිල්ලට ගැනීම සඳහා, එහි අයිතිකරු මියගොස් සිටිය යුතුය. කෙනෙකු ආගිය අතක් නැතිව සිට දිගුකලක් පුරාවට නොපැමිණි කළ, නඩුකාරයාගේ තීන්දුව පරිදි ඔහුගේ දේපළ පසු උරුමය සඳහා වන දේපළ වශයෙන් අදහස් කෙරේ.

2. දේපළ අයිතිකරු මියගිය අවස්ථාවේ පසු උරුමක්කාරයා ජීවතුන් අතර සිටින බව සහතික කළ යුතුය. කෙනෙකු ආගිය අතක් නැතිව, ඔහුගේ ආපසු පැමිණීම සහතික නොකරනු ලැබුණා නම්, ඔහු වෙනුවෙන් කොටස් වෙන්කළ යුතු නොවේ. ආපසු පැමිණීමේ සම්භාවිතාව තිබේ නම් කොටස් පිළිගත යුතු වේ. මරණය සහතික කරනු ලැබුණා නම්, සෙසු පසු උරුමක්කාරයන් අතර වස්තුව බෙදාදිය යුතු වේ.

    ගැබෙහි සිටින දරුවාට ද පසු උරුම කොටස වෙන්කළ යුතු බව ඉමාම්වරුන්ගේ අදහසයි.

3. පසු උරුමය පිණිස වන දේපළවලින් කොටසක් ලැබීමට බාධක වන කිසිදු කරුණක් නොතිබිය යුතුය. පසු උරුමය ලැබීමට සුදුසුකම් ලබා සිටින කෙනෙකුට පහත සඳහන් කරුණු නිසා එය ලැබීමට බාධක ඇති වේ.

(අ) පසු උරුමක්කාරයන්, දේපළ හිමිකරු ඝාතනය කිරීම. ඝාතකයා පසු උරුමක්කාරයෙක් නොවෙයි. (අල් හදීස්)

(ආ) ආගම වෙනස් වීම - මුස්ලිම්වරයෙකු මුස්ලිම් නොවන්නෙකුගේ පසු උරුමක්කරුවෙක් නොවෙයි. මුස්ලිම් මුස්ලිම් නොවන්නෙකුගේ පසු උරුමක්කාරයෙක් නොවෙයි. (අල් හදීස්)

(ඇ) වහළකු වීම

පසු උරුමය පිණිස වන දේපළවලින් කොටස් ලැබීමේ හේතු :

1. ඥාති බන්ධු සම්බන්ධතාව - දේපල හැරයන අය හා පසු උරුමක්කාරයා අතර පවුල්, ලේ නෑකම්, (අල් බෘෘ, අල් උසූල්, අල් හවාෂි)
2. විවාහ සම්බන්ධතාව
3. වහල් - හාම්පුතු සම්බන්ධතාව

පසු උරුමක්කාරයාගේ විස්තර හා ඔවුන්ගේ වර්ග

මියගිය පුද්ගලයෙකුගේ දේපළවලට ඇති යුතුකම් ඉටු කරනු ලැබීමෙන් පසු, ඉතිරි දේපළ, එය ලැබීමට සුදුසු අය අතර බෙදා දෙනු ලැබේ. එසේ බෙදා දීමේ දී සියලුම උරුමක්කාරයන් සහ මියගිය අය සම්බන්ධ වෙති. පසු උරුමක්කාරයන් කොටස් තුනකට බෙදනු ලැබේ.

1. අස්හාබුල් ෆුරුල්

   නිශ්චිත කොටසකට අයිතිකරුවන් යැයි ෂරීආවේ සඳහන් උදවිය මොවුහ් වේ. එනම්, මේ වර්ගයට අයත් වූවෝ, ෆර්ල් යටතේ කොටස් ලබන්නන් යැයි සලකනු ලබති. මියගිය අයගේ සැමියා, බිරිඳ, පියා, මව, සීයා, ආච්චි, දුව, පුතාගේ දුව, එකුස් උපන් සොයුරිය, පියපස සොයුරිය, මවුපස සොයුරිය, සහ මව්පස සොයුරු යනාදීහු මෙහි අඩංගු වෙති. අල්කුරානය හෝ සුන්නාවේ හෝ මගින් නිශ්චය කරන ලද කොටස් මොවුන්ට අයත් වේ.

2. අසබාවරු

   පළමු වර්ගයේ උදවිය කොටස් ලබාගත් පසු ඉතිරිය ලැබීමට සුදුසුකම් ලද්දෝ මොවුහු වේ. අසබාවරුන් යැයි හඳුන්වනු ලබන මොවුන්ගේ වර්ග තුනකි.

   1. ඍජු අසබාවරු - පුතුන්, පුතාගේ පුතා, පියා, සීයා, සහෝදරවරු, සහෝදරයින්ගේ පිරිමි දරුවන්, මහජ්පා හා බාප්පාවරු, ඔවුන්ගේ පිරිමි දරුවන්

   2. අනුන් මගින් අසබාවරුන් වන්නෝ - පුතා සමඟ දුව, පුතාගේ පුතා සමඟ පුතාගේ දුව, දෙපාර්ශ්ව සහෝදරයන් සමඟ දෙපාර්ශ්ව සොයුරිය, පිය පාර්ශ්වයේ සහෝදරයන් සමඟ පිය පාර්ශ්වයේ සොයුරිය

   3. අනුන් සමග අයබාවරුන් වන්නෝ - මියගිය අයගේ දුව නැත්නම් මියගිය අයගේ පුතාගේ දරුවන් සමග මියගිය අයගේ සහෝදරියන් සිටින කල, ඒ සහෝදරියන් ඔවුන්ගේ අයබාවරුන් වී කොටස් ලබති.

3. දවිල් අර්හාම්/අල්අර්හම්

පොදුවේ දුර නෑයින් ය. බොහෝවිට මියගිය අය හා තමන් අතර ඇති සම්බන්ධතාව ස්ත්‍රියක මාර්ගයෙන් ලබන්නෝ මෙහි අඩංගු වෙති.

උදා : දුවගේ දරුවන්, සහෝදරියන්ගේ දරුවන්, දේපළ බෙදීමේ දී මුලින්ම අස්හාබුල් ෆුරුල් ද, ඉතිරියෙන් අයබාවරු ද, ඊට පසු දවිල් අර්හාම්වරු ද කොටස් ලබති.

කොටස්වල විස්තර

1. 1/4 කොටස් ලබන්නෝ (දෙදෙනෙක්) - සැමියා, බිරිඳ
2. 1/2 කොටස් ලබන්නෝ (5 දෙනෙක්) සැමියා, දුව, පුතාගේ දුව, එකුස් උපන් සහෝදරිය, පියාගේ සහෝදරිය
3. 1/8 කොටස් ලබන්නෝ - බිරිඳ
4. 1/3 කොටස් ලබන්නෝ (දෙදෙනෙකි) - මව, මව්බස සහෝදර සහෝදරියෝ
5. 1/6 කොටස් ලබන්නෝ (7 දෙනෙකි) - පියා, මව, සීයා, දුවගේ දුව, පියපස සහෝදරිය, ආච්චි, මව්පස සහෝදරයකු හෝ සහෝදරියක
6. 2/3 කොටස් ලබන්නෝ - දූවරු, පුතුන් ගේ දූවරු, දෙපාර්ශ්වයේ සහෝදරියන්

- **අල් හජ්බ්** - තහනම් කිරීම

පසු උරුමක්කාරයන් තමන්ට අදාළ කොටස අඩුවෙන් ලබන අවස්ථා ද, මුළුමනින් ම අහිමි කරගන්නා අවස්ථා ද ඇති වේ. එය හජ්බ් නම් වේ. එනම්, ඇතැමුන් පසු උරුමක්කාරයන් වනවිට තවත් සමහරුනට ධනයෙන් කොටස් නැතිවීම හෝ අඩුවීම හෝ සිදුවීමයි. මෙසේ කොටස් ලැබීමට තහනම් කරනු ලබන අය, අල්හාජිබ් හෝ මහ්ජුබ් යනුවෙන් හඳුන්වනු ලබති. මෙය එක් වර්ගයකි.

1. හජ්බන් නුක්සාන්

ඇතැමෙකු සිටින බැවින් තවත් ඇතැමෙකුට ලැබෙන්නට තිබුණු කොටස් සම්පූර්ණයෙන් ම නොලැබී යාමයි. උදා : සැමියා, බිරිඳ, මව

2. හජ්බුල් හිර්මාන්

ඇතැමෙකු සිටින බැවින් තවත් ඇතැමෙකුට ලැබෙන්නට තිබුණු කොටස් සපුරා නොලැබී යාමයි.

| **මහ්ජුල්** | **හාජිබ්** |
|---|---|
| 1. සීයා | පියා, සමීප සීයා |
| 2. මිත්තනිය | මව, සමීප මිත්තනිය |
| 3. පුතාගේ පුතා | පුතා, සමීප පුතාගේ පුතා |
| 4. එකුස් උපන් සහෝදරයා | පුතා, පුතාගේ පුතා, පියා, සීයා |
| 5. එකුස් උපන් සහෝදරිය | පියා, පුතා, පුතාගේ පුතා |

**වසියයත් - අන්තිම කැමැත්ත** (ඔප්පුව)

- කෙනෙකු හැර දමා යන වස්තුව හා සම්බන්ධ තවත් කරුණක් නම් වසියයත් වේ. වසියයත් යනු, කෙනෙකු තමාගේ මරණයෙන් පසු සිය වස්තුවෙන් තමා සඳහන් කරන අයවලුන්ට පිරිනමන ලෙස කරන අණ කිරීමයි. කෙනෙකු මෙලෙස වසියයත් කර තිබුණා නම්, ඔහුගේ මරණයෙන් පසු එය ඉටු කිරීම යුතුකමකි. පසු උරුමකම් බෙදා දීමට පෙරාතුව වසියයතය ඉටු කළ යුතු වේ. මේ ගැන අල් කුරානයේ මෙසේ සඳහන් වේ.

  (පසු උරුමක්කාරයින්ට කොටස් ලැබීම) ණය, වසියයත් යනාදිය දීමෙන් පසුව ය. (අල්කුර්ආන්)

- කෙනෙකු සිය වස්තුවෙන් වසියයත් කරන විට ද, නීතිරීති පිළිපැදිය යුතු වේ. සිය වස්තුවෙන් 1/3 කොටසකට වඩා වසියයත් කිරීමට අවසර නැත. මේ නිසා, මොහුගේ වස්තුවට හිමිකම් කියන්නන් ගැටලුවලට මුහුණ පාන්නට සිදුවනු ඇත. ඒ අතරම උරුමක්කාරයින්ට වසියයත් කිරීම ද කළ නොහේ. වසියයත් කරන්න. එය සාක්ෂිකරුවන් සහිත ව කිරීම යහපත් වේ. එය ලියවිලි මගින් තැබීම ද යහපත් ය.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

පියවර 1 : ඉස්ලාමීය අර්ථ ක්‍රමයේ සුවිශේෂ ලක්ෂණ හා ධනය ඉපැයීමට ඉස්ලාමයෙන් ලබා දී ඇති වැදගත්කම් විස්තර කරන්න.

පියවර 2 : සිසුන් කණ්ඩායම් හතරකට බෙදා පහත සඳහන් මාතෘකා අතරින් එකිනෙක එම කණ්ඩායම්වලට පවරමින් ඒ ගැන තොරතුරු සොයන ලෙස අවධාරණය කරන්න.

i. කර්මාන්ත හා සේවා වෘත්තියට ඉස්ලාමයෙන් ලබා දී තිබෙන වැදගත්කම් හා විධිවිධාන

ii. සමාජ ජීවිතය හා සම්බන්ධ ගනුදෙනුවල දී මුලාරබා, මුරාබහා. ඉජාජා සහ මුසාරආ පිළිබඳ විස්තර

iii. ඉස්ලාමයෙන් තහනම් වූ ඉපැයීම් ක්‍රම

iv. ඉස්ලාමීය පසු උරුමකම් නීතියේ වැදගත්කම හා නීති

පියවර 3 : සෑම කණ්ඩායමකින් ම එකිනෙකා කැඳවා, තම කණ්ඩායම විසින් එක්රැස් කරන ලද තොරතුරුවලින් සාරාංශය ඉදිරිපත් කරන ලෙස දැනුවත් කරන්න.

පියවර 4 : ඉදිරිපත් කරන ලද සමාලෝචන සම්පිණ්ඩනය ලියා ගන්නා ලෙස සියලුම සිසුන් දැනුවත් කරන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. යූසුෆ් අල් කර්ලාවි (1980) ඉස්ලාමයේ හලාල් සහ හරාම්, වහ්බා, කාහිරා ප්‍රකාශකයෝ
2. ගස්සාලි මුහම්මද් (2004) ඉස්ලාමීය ඔලුක්ක මාන්බුහල්, ඉලක්කියච් චෝලය් මුද්‍රණාලය, චෙන්නායි.
3. හයිරුල් බෂර් එම්. අයි. (2010), මානිඩ නම්බික්කසිහල් අක්රා මුද්‍රණාලය, කොළඹ 12.
4. සය්යිද් අබුල් අලා මව්දූදි (1983), ආර්ථික ප්‍රශ්නය, ලංකා ජමාඅත් ඉස්ලාම් ප්‍රකාශනය, කොළඹ 9.
5. අගාර් මුහම්මද් ඒ. සී. (1996), සන්මාර්ග සට්ට විලක්කංගල්, අල්කලම් මුද්‍රණාලය, බේරුවල.
6. මුහම්මද් මුජීබ් අබ්දුල් අලීම් (2000) මුදලීට්ට්‍ර අය්ප්පඩප්පිලානා ව්‍යාපාරම්, නලීමියා ඉස්ලාමීය ප්‍රකාශන ආයතනය
7. අය්යූබ් අලි සී. (2004) මුරාබහා නලීමිය්යා ඉස්ලාමීය ප්‍රකාශන ආයතනය
8. අගාර් මුහම්මද් ඒ.සී. (1992) ඉස්ලාත්තිල් වාරිපුරිමයි සට්ටම්, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

**නිපුණතාව 9.0 : සමාජ ජීවිතය හා සම්බන්ධ ඉස්ලාමීය නීතිරීති හා උපදේශ දැන ඒ අනුව සිය ජීවිතය සකස් කර ගනියි.**

**නිපුණතා මට්ටම 9.3 :** වරදවා වටහාගෙන ඇති සංකල්ප නිවැරදි ව වටහා ගෙන අන් අයට ද පහදා දෙයි.

**කාලය :** කාල පරිච්ඡේද 40

**ඉගෙනුම් ඵල :**

- බහු භාර්යා විවාහය, කාන්තාවන්ගේ තත්ත්වය, අපරාධ හා දඬුවම් සහ ජිහාද් සම්බන්ධ ආකල්ප වරදවා ඉදිරිපත් කිරීමේ හේතු හඳුනා ගනිති.
- ඉස්ලාමීය දෘෂ්ටියෙන් මේවා නිවැරදි බවට ඉතිහාසය හා ව්‍යවහාරික ජීවිතය සසඳා නිදසුන් සමඟ සනාථ කරති.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

### බහු භාර්යා විවාහය

- ඉස්ලාම්, මානුෂීය ස්වභාවයට ගැලපෙන ජීවන රටාවක් වන බැවින්, එහි දේශනාවන් ශ්‍රවණය කරන්නන්, කියවන්නන් සහ වටහා ගන්නන් ඊට ආකර්ෂණය වෙති. මෙය ඉතිහාසය පුරා දිගටම සිදු වෙමින් පවතියි. මෙය දැක ඊර්ෂ්‍යා කරන, නැත්නම් විමතියට පත්වන අය ඉස්ලාමයේ ප්‍රතිපත්ති හා ප්‍රායෝගික ක්‍රියාවන් වැරදි ලෙස ඉදිරිපත් කරමින් ද, විවේචනය කරමින් ද ප්‍රචාරයෙහි යෙදී සිටිනු පෙනේ.

- මෙසේ විවේචනයට ලක් වූ කරුණු අතර බහු භාර්යා විවාහය ද එකකි. පිරිමියෙකු, තත් කාලයේ එක් කෙනෙකුට වඩා ස්ත්‍රීන් සංඛ්‍යාවක් නීත්‍යානුකූල භාර්යාවන් වශයෙන් ගැනීම බහු භාර්යා විවාහයය වේ. ස්වභාවයෙන් ම හා නොවැළැක්විය හැකි හේතු නිසා ඇතිවන විවිධ වාතාවරණවල දී එය නොවැළැක්විය හැකි කරුණක් බවට පත් වේ.

- ස්ත්‍රීන් අතරින් ඔබට කැමති අයවලුන් දෙදෙනෙකු බැගින් හෝ තුන්දෙනෙකු බැගින් හෝ සිවු දෙනෙකු බැගින් හෝ ඔබ ආවාහ කර ගන්න. ඔවුන් අතර ඔබට සාධාරණ ලෙස හැසිරිය නොහැකි යැයි බියක් ඇති වේ නම්, එක් ස්ත්‍රියක ආවාහ කර ගන්න. (4:3) යන අල්කුර්ආනීය පාඨය බහු භාර්යා විවාහයට දෙන ලද අනුමැතිය වශයෙන් සලකනු ලැබේ.

- මෙවැනි විවාහ ක්‍රමයක් ඉදිරිපත් කර තිබෙන්නේ ඉස්ලාමයේ යැයි ද, එය කාන්තාවන්ට එරෙහි වූවකැයි ද, ලිංගික සමානාත්මතාවට පටහැණි වූවකැයි ද, විවේචනයට ලක් වේ. බහු භාර්යා විවාහ ක්‍රමය හඳුන්වා දුන්නේ ඉස්ලාම් යැයි දරන අදහස් සාවද්‍ය වේ.

- නබි (සල්) තුමාට (ක්‍රි.ව. 7 සියවස) පෙරාතුව පහළ වූ ශාස්තෘවරුන්ට (නබිවරුන්ට) එකකට වඩා භාර්යාවන් වූ බව අල්කුර්ආනීය අදහස්වලින් සනාථ වේ. මේ හැර, බොහෝ නරපතීන්, ප්‍රභූවරුන්, ධනවතුන් හා ප්‍රධානීන් තත් කාලයේ නිල වශයෙන් හා නොනිල වශයෙන් බොහෝ බිරින්දෑවරු තබා ගත් බව කතා, සාහිත්‍යය පමණක් නොව ඓතිහාසික තොරතුරුවලින් ද පෙනේ.

- ශිෂ්ට සමාජ, බහු භාර්යා විවාහ සමඟ ආරම්භ වී තිබිය යුතු ය. ඇත්තෙන් ම එම ක්‍රමය, සෑම තැනෙකම, සෑම කලෙකම පැවතියකි. එය බෙහෙවින් අඩු විකල්පයන් සහිත නීතියකැයි විවාහයේ පරිනාමය නමැති කෘතියේ එම්. ලෙඩ්ලි ඩානෝ මේ ගැන විස්තර කරයි.

- ඉස්ලාමය හඳුන්වා දෙනු ලැබූ ජායිලිය්යා අවධියේ, අරාබියේ පවා බහු භාර්යා විවාහය ව්‍යවහාරයෙහි පැවතියේ ය. මා ඉස්ලාමය පිළිගත් අවස්ථාවේ මට බිරින්දෑවරු අට දෙනෙක් වූහැ යි උමය්රා (රළි) තුමා ද, තමාට බිරින්දෑවරු දස දෙනෙකු සිටියහැ යි කයිලාන් (රළි) තුමා ද සඳහන් කරති. මේ අයුරින් වෙනත් බොහෝ සහාබාවරු සහ සහාබා නොවන්නන් ද බහු භාර්යාවන් තබා ගත්හ. නබි (සල්) තුමා ඉස්ලාමය හඳුන්වා දීමට පෙරාතුවම බහු භාර්යා විවාහය ව්‍යවහාරයෙහි පැවැති බව මේවායින් ඔප්පු වේ.

  ඉස්ලාම් බහු භාර්යා විවාහය දිරිගැන්වූයේ නැත. තහනම් කළේ ද නැත. මන්ද, සමාජ ජීවිතයේ දී එය ඇතැම් විට අවශ්‍ය වේ. ඇතැම් විට අනවශ්‍ය වේ. තනි පුද්ගලයන් සම්බන්ධයෙන්ද ඇතැමුනට අවශ්‍ය වේ. ඇතැමුන්ට අනවශ්‍ය වේ. ඉස්ලාම් එය නීතියක් නොකොට විකල්පයක් බවට පත් කළේ එබැවිනි.

- හිජ්රි 2 වසරේ සිදුවූ උහද් සටනේ දී සහාබාවරු 70 දෙනෙකු පමණ දෙනා ෂහීද් වූහ. ඉස්ලාම් විසින් සමාජ රටාවක් බිහිකොට, එය ළදරු අවධියේ පැවැති වකවානුවක, මෙවැනි මරණ ඉතා බරපතල විය. වැන්දඹුවෝ සහ අනාථයෝ බියට පත් වූහ. ඔවුන්ට ජීවිතය ලබා දෙන අටියෙන් ඉස්ලාම්, බහු භාර්යා විවාහයට අනුමැතිය දුන්නේ ය. ඔවුනට ජීවිතය ලබාදෙන මෙන් නබි (සල්) තුමා සහාබාවරුන් දිරි ගැන්වීය. එතුමා ද වැන්දඹුවන් ආවාහ කර ගත්තේ ය. මෙම සිද්ධියෙන් ඔප්පු වන්නේ බහු භාර්යා විවාහය අසාමාන්‍ය අවස්ථාවල සිදුවන්නක් බවයි.

- අසාමාන්‍ය අවස්ථාවල සංඛ්‍යාව හතරකට සීමා කරමින් ද, සමතාව රැකගත නොහෙන අවස්ථාවල එකක් දක්වා අඩු කරමින් ද ඉස්ලාමයේ ඉගැන්වෙන බහු භාර්යා විවාහය සමාජ අවශ්‍යතාව හා සමාජ සාධාරණත්වය පෙරදැරි කර ගත්තක් බව පෙන්නුම් කරයි.

- අනෙක් අතට බහු භාර්යා විවාහය හරහා පවුල් හා සමාජ අසාධාරණයක් ඇති නොවන්නට ඇතැම් සීමාවන් ද පනවා තිබේ.

- බහු භාර්යා විවාහය,
  1. අසාමාන්‍ය අවස්ථාවල අනුමැතිය දීම
  2. ඇතැම් කොන්දේසි යටතේ අනුමැතිය දීම
  3. භාර්යාවන් සංඛ්‍යාව හතරකට සීමා කිරීම
  4. භාර්යාවන් අතර සමතාව රැකීම යනාදී වශයෙන් කොන්දේසි පනවා තිබේ.

- මෙම සීමාවන් හතර ගැඹුරින් නිරීක්ෂණය කිරීමේ දී බහු භාර්යා විවාහය සම්බන්ධයෙන් ඉස්ලාමය දරන අරමුණ පැහැදිළි වේ. එම නිසා, අනුමැතිය දුන් වහාම, ඔවුනතර ඔබට සාධාරණ ලෙස ක්‍රියා කළ නොහැකි වෙතැයි සැකයක් ඇති වේ නම්, එක් භාර්යාවක් ආවාහ කර ගන්න. (4:3) යනුවෙන් ද, ඔබ මොන තරම් කැමැති වුණත් භාර්යාවන් අතර සමතාව සැලසීමට නුපුළුවන. එම නිසා, එක් පැත්තකට ඉඳුරා බර වී අනෙක් පැත්ත ගුවනේ පාවෙන්නන් බවට පත් නොකරන්න. (4:129) යනුවෙන් ද සඳහන් කරනුයේ.

- තරුණයෙනි, ඔබ අතරින් ශක්තිමත් අය විවාපත් වන්න. (බුහාරි) යන හදීසයෙහි සඳහන් ශක්තිය වනාහි, ශරීර ශක්තිය හා ආර්ථික ශක්තිය බව නීති විශාරදයින්ගේ මතය වේ. එක් බිරිඳක විවාපත් කර ගැනීමට මේවා අවශ්‍ය නම්, එකකට වඩා බිරින්දන් විවාපත් කර ගැනීමට වැඩිපුර ශක්තීන් අවශ්‍ය බව පැහැදිළි වේ. ඒ අතරින් ඉතා වැදගත් වනුයේ වෙනස්කම් නොකිරීමයි. මැනවින් තැන්පත් වූවන්ට හැර සෙස්සන්ට මෙය අසීරු ය. රුචි අරුචිකම්වලට ඉඩ නොදී,

බිරින්දෑවරුන්ගේ ඕනෑ එපාකම්, ආරක්ෂාව, කායික හා මානසික යහපත යනාදිය සම තත්ත්වයෙන් සැලසීම පහසු වූවක් නොවේ. බහු භාර්යා විවාහය, සමාජයේ පොදු නීතියක් නොවී ඇතැමුනට හා ඇතැම් කාල වකවානුවලට විශේෂ වූ නීතියක් වනුයේ ඒ නිසාවෙන් යැයි කිව හැකිය.

- මුලින් සඳහන් කළාක් මෙන් සටන්. විපත් වැනි අසාමාන්‍ය තත්ත්වයන් තුළ විකල්පයක් වශයෙන් අනුමත කරන ලද කරුණක් සාමාන්‍ය නීතියක් ලෙස දක්වමින් විවේචනය කිරීම සුදුසු නොවේ. ඉස්ලාමය කෙරෙහි ඊර්ෂ්‍යා සහගත හැඟීම් ඇතිකර ගත් උදවිය විසින් සාවද්‍ය ලෙස පතුරවන ලද අදහස් මෙය විශාල කොට දක්වන ලදී.

- මුස්ලිම්වරුන්ට ලිංගික හැඟීම් වැඩි යැයි ද, නිතර නිතර ඇඳුම් මාරු කරන්නාක් මෙන් ඔවුන් භාර්යාවරුන් මාරුකර ගන්නේ යැයි ද වැරදි අදහස් ඉදිරිපත් කෙරේ. මුස්ලිම්වරුන් ද මිනිසුන් ය. සෑම දෙනා තුළම නිපැදවෙන්නේ එකම වර්ගයේ හෝමෝන ය. මුස්ලිම්වරුන් සෙසු මිනිසුනට වඩා වෙනස් වනුයේ ප්‍රතිපත්තිවලින් පමණි. ශාරීරික තත්ත්වයෙහි කිසිදු වෙනසක් නැත. මිනිසාගේ ස්වාභාවික ලිංගික හැඟීම් පාලනයෙන් යුතුව සන්තර්පනය කර ගනු පිණිස විවාහය නිර්දේශ කර තිබේ. මෙම විනය ක්‍රම නොරකින සමාජයක් තුළ ලිංගික බලහත්කාරකම්, නීත්‍යානුකූල නොවන භාර්යාවන් තබා ගැනීම්, ලිංගික වෘත්තිකයන් යනාදී වශයෙන් වැරදි සහගත විකල්ප රාශියක් බිහි වී ඇත. මේ නිසා හටගන්නා පවුල් හා සමාජ ගැටලුවලින් ආරක්ෂ කරනු පිණිස, ඉස්ලාම් විවාහය සහ බහු භාර්යා විවාහය නිර්දේශ කරයි.

- ඉස්ලාම් විසින් බහු භාර්යා විවාහයට ඉඩකඩ සැලසූ අසාමාන්‍ය අවස්ථාවන් කොටස් දෙකකට බෙදේ.

1. සමාජයේ හෙවත් පොදු අවශ්‍යතාව

   සටන්, විපත් යනාදිය හේතුවෙන් පුරුෂ පක්ෂයට වඩා ස්ත්‍රී පක්ෂය වැඩිවීම, මෙහිලා වැදගත්ම කරුණ වනුයේ ජගත් සංග්‍රාම වකවානුවල මෙම ප්‍රශ්නය ඇති වීමය. ශ්‍රී ලංකාවේ දශක තුනක සටන, වැන්දඹුවන් හා අනාථයන්ගේ සංඛ්‍යාව වර්ධණය කොට තිබේ. මෙම තත්ත්වයන් තුළ අනාථයන් හා වැන්දඹුවන්ගේ ආර්ථික අවශ්‍යතා සපුරාලනු පිණිස තරමකින් හෝ සහන සැලසේ. එහෙත් මොවුන්ගේ කායික හා මානසික අවශ්‍යතා සපුරාලීමේ සහන නොසැලසේ. මේ නිසා පවුල් හා සමාජ දෝෂ වේගයෙන් පිවිසේ. සෑම කාන්තාවකම, තමාට ලෙන්ගතුකම් දක්වමින්, අනුකම්පා කරමින්, තමන්ව තේරුම්ගෙන ක්‍රියා කරන, දුක සැප බෙදාහදා ගන්නා හදවතක් ඇති පුද්ගලයන් සොයති. මෙය කළහැකි වනුයේ විවාහ බන්ධනය තුළින් පමණි. ඉස්ලාම්, වැන්දඹු විවාහයට හා බහු භාර්යා විවාහයට අනුමැතිය දෙන්නේ මීට විකල්පයක් වශයෙනි. මෙය කාන්තාවන් සඳහා වන ආරක්ෂාවකි.

2. තනි පුද්ගල නොහොත් සුවිශේෂ අවශ්‍යතාව

(අ) ස්වභාවයෙන් ම ඇතැම් පිරිමි, බෙහෙවින් ලිංගික හැඟීම් සහිත වූවෝ වෙති. ඔවුන් එක් බිරිඳකගෙන් සතුට නොලබන විට වෙනත් ස්ත්‍රීන් සොයති. මේ නිසා ලිංගික වෘත්තිය වර්ධනය වන අතර, එච්.අයි.වී. වැනි භයානක වසංගත රෝගවලට මඟ පෑදෙයි. මේ හේතුවෙන් පිරිමි හා ගැහැණු, පවුල් හා සමාජ දෝෂයට ලක් වෙති. මෙයින් ආරක්ෂා වීමට බහු භාර්යා විවාහය අවශ්‍ය වේ.

(ආ) ස්ත්‍රීන්ගේ මාසික ඔසප් හා දුෂ්කර ප්‍රසූත කාලයෙන් අඹුසැමි සබඳතාවට බාධාවක් වන බැවින් ද සමහරු ලිංගික වෘත්තිකයන් කරා යති. ඉස්ලාම් මෙය තහනම් කරන බැවින් විකල්පයක් වශයෙන් බහු භාර්යා විවාහයට අනුමැතිය දෙයි.

(ඇ) ඇතැම් බිරින්දෑවරුන් සදාකාලික රෝගීන් බවට පත්වන විට, ඔවුන් බලාකියා ගැනීමට ද, සැමියා වෙනුවෙන් කළ යුතු යුතුකම් ඉටු කිරීමට ද නොහැකි තත්ත්වයකට පත් වෙති. එවැනි අවස්ථාවල ස්ත්‍රීන් කුලියට යෙදවීමේ දී, වැරදි සිදුවන අවස්ථා විවෘත වේ. මේ නිසා පවුල් හා සමාජ දෝෂ හටගනී. මේවායින් ගැලවීමට බහුභාර්යා විවාහය විකල්පයක් බවට පත් වේ.

(ඈ) ඇතැම් අඹුසැමියෝ, දරු සම්පතක් නොමැතිව ළතැවෙති. බිරිඳ ගැබ් නොගන්නා බව දැනගන්නා විට, තමාට දරු සම්පතක් සොයාගනු පිණිස වෙනත් බිරිඳක පාවා ගැනීම වරදක් නොවේ. දරු සම්පතකට ඉඩ නැති ස්ත්‍රිය දික්කසාද කරනවා වෙනුවට, දරුවන් හදාගන්නවා වෙනුවට, දරු සෙනෙහස යටපත් කරගන්නවා වෙනුවට මෙය යහපත් වේ.

(ඉ) කෙනෙකු බොහෝ දේපළ සම්පත්වලට හිමිකරුවකු වන්නට පුළුවන. එම ධනය බොහෝ දෙනා අතර බෙදී යාමට මෙමගින් අවස්ථාව සැලසේ. පසු උරුමකම් ලැබීම හරහා භාර්යාවන්, දරුවන් හා සමීප ඥාතීන්ට මේ නිසා වැඩි යහපතක් සැලසේ. පවුල් හා සමාජ යහපත සඳහා ද මෙය උපකාරී වේ.

- බහු භාර්යා විවාහ ක්‍රමය, ඒක භාර්යා ක්‍රමයට වඩා වැදගත් වනුයේ මේ නිසා ය. එය ධර්මිෂ්ට භාවය අතින් උසස් වන බැවින්, ඒක භාර්යා ක්‍රමයේ තැන ගනියි යනුවෙන් හැව්ලොක් එලිස් (ලිංගික මනෝ විද්‍යාව - පිටුව 502) පවසන්නේ ඒ නිසාවෙනි.

- ස්ත්‍රිය හා පුරුෂයන් අතර ස්වාභාවික සම්බන්ධතාව ඇති කරන්නා වූ බහු භාර්යා විවාහ ක්‍රමයට පිවිසීම, ගණිකා වෘත්තිය, සමාජ රෝග, ගබ්සාවන්, නීතිවිරෝධීව උපදින දරුවන්ගේදුක් කම්කටොළු, ස්ත්‍රී පුරුෂ ජනගහන වෙනස හේතුවෙන් ඇතිවන අවිවාහක කාන්තාවන්ගේ අවාසනාව, කෲරත්ව සහ ඊර්ෂ්‍යාව යනාදී දෝෂයන්ගෙන් ආරක්ෂා වීමට යෝග්‍ය වන්නකි යනුවෙන් වෛද්‍ය ලේබොන් සඳහන් කරයි.

- ආචාර්ය ඇනී බෙසන්ට් තුමිය, බටහිට රටවල් කේන්ද්‍ර කරගෙන මෙසේ සඳහස් කරයි. බටහිර රටවල මතුපිට පෙනෙන සේ පවතින්නේ ඒක භාර්යා ක්‍රමයයි. ඇත්තෙන් ම එහි පවතින්නේ වගකීමෙන් බැහැර වූ බහු භාර්යා ක්‍රමයයි. පිරිමියාට එපාවන විට ඔහු තබාගෙන සිටි ගැහැණිය අත්හැර දමනු ලබයි. අන්තිමේ දී ඇයට මහමඟ ඇවිදින්නට සිදුවේ. ඇයගේ අනාගතය ගැන පළමුවන ආදරවන්තයාට කිසිම වගකීමක් නැත. බහු භාර්යා විවාහය ව්‍යවහාරයේ ඇති පවුලක, බිරිඳක වශයෙන් ද, මවක වශයෙන් ද පිළිගනු ලබන ස්ත්‍රියගේ තත්ත්වයට වඩා මැයගේ තත්ත්වය සිය ගුණයක් නරක ය.

- බටහිර රටවල, නගර වීථිවල රාත්‍රී කාලවල ඇවිදින දහස් සංඛ්‍යා අවාසනාවට පත් කාන්තාවන් දෙස බලන විට, බහු භාර්යා විවාහය සම්බන්ධයෙන් ඉස්ලාමයට ගරහන ඔවුන්ට දිවක් තිබෙන්නට නොපුළුවන. අතවරවලට ලක් ව නීති විරෝධී දරුවා සමඟ මහමඟට පත්කොට, පිහිටක් නැතිව යනෙන සෑම දෙනාටම බිලි වී, මාතෘත්වය අහිමි කැරගෙන, සියලු දෙනාගේ ම අපවාදයට ලක් ව ලැජ්ජා වනවාට වඩා, බහු භාර්යා විවාහයට පිවිස, එකම සැමියෙකු සමඟ ජීවත් වෙමින් නීත්‍යානුකූල දරුවන් අත දරාගෙන ගෞරවනීය ලෙස ජීවත් වීමට ලැබීම බොහෝ උතුම් වේ.

- ඉස්ලාම් බහු භාර්යා විවාහය අනිවාර්ය නොකරන බව ද, විකල්ප අවස්ථාවල පමණක් ඊට අනුමැතිය දෙන බව ද නිරීක්ෂණය කිරීමේ දී, දොස් නගන අයගේ ස්ථාවරය සාවද්‍ය බව ද දැන ගනිමු.

**ජිහාද්**

- පද අර්ථය : ජුහ්ද්, ජහද යන වචනයෙන් ජිහාද් යන පදය නිෂ්පන්න වී ඇත. මුළු මහත් ශක්තියම, බලයම යොදවා අදාළ ඉලක්කයට ළඟාවීම යන අදහසින් ද, කිසියම් ඉලක්කයකට ළඟාවීමට සිය ශක්තිය, හැකියාව යනාදී සියල්ලම ප්‍රයෝජනයට ගැනීම යන අදහසින් ද මෙම වචනය යෙදේ.

- ජිහාද් යන පදය හා හර්ග් යන පදය අතර ඇති වෙනස :

  සාමාන්‍යයෙන් අරාබි භාෂාවේහර්ග් හා කිදාල් යන වචනවලින් අරගල, යුද්ධය, සටන යනාදී තේරුම් දෙයි. ජිහාද් යන පදයේ සණ්ඩු කිරීම යන අරුත ඇතත්, යුද්ධය හෝ සණ්ඩුව හෝ ජිහාදයේ ක්‍රමවේදයක් විනා එය සම්පූර්ණ ක්‍රමවේදය නොවේ.

- අල්කුර්ආනයෙහි ජිහාද් යන පදය ෆී සබීලිල්ලාහ් යන්න හා සබැඳිව බොහෝ තැන්වල සඳහන් වේ. ඊට හේතුව, ආත්මාර්ථකාමී අරමුණු සියල්ලෙන් ම මිදී, හෘදයාංගමව, අල්ලාහ්ගේ සතුට පමණක් අරමුණු කරගෙන ජිහාද් සිදුවිය යුතු බවයි.

- ඊමාන් පිහිටුවා ඇත්තේ කවුරුන් ද, ඔවුහු දේව මාර්ගයෙහි සටන් වදිති. ප්‍රතික්ෂේපකයන් ව සිටින්නේ කවුරුන් ද ඔවුන් තාකූත්ගේ (ෂයිතාන්) මාර්ගයෙහි සටන් වදිති. (4:76)

  අල්ලාහ්ගේ මහේශාක්‍ය භාවය ශ්‍රේෂ්ටත්වයට පත් කරනු පිණිස සටන් වදින්නේ කවුරුන් ද, අල්ලාහ්ගේ මාර්ගයේ පවතින සටන ඔහුගේ ය. (බුහාරි)

- බලහත්කාරකම්වලින් මිනිසුන් රැකගෙන සමාජ නීතිය සහතික කරන අයුරින් කිසිම කෙනෙකුට අපරාධයක් නොකිරීමෙන් ද, යුද්ධ සම්ප්‍රදායයන් නොබිඳිමින් ද, අල්ලාහ්ගේ කලීමාව ගොඩනැංවීම සඳහා පිරිසිදු චේතනාවෙන්, අල්ලාහ් දැක් වූ මාර්ගයේ සිට, මුස්ලිම්වරයෙකු සිදුකරන සෑම ප්‍රයත්නයක් ම ජිහාද් වශයෙන් ඉස්ලාම් නිර්දේශ කරයි.

- ජිහාදය පිළිබඳ වැරදි ආකල්පය ඇති කිරීමට හේතුවක් වන පරිද්දෙන්, වැරදි අදහසින් විස්තර කර තිබේ. එහෙත්, ජිහාදයේ අරමුණ හා එය අත්කර ගැනීම සඳහා ඉස්ලාමයෙන් සකස් කර තිබෙන ක්‍රමවේදයන් කෙරෙහි සැලකිල්ල යොමු කරන අය, ජිහාදය හා සෙසු සටන් අතර වෙනස්කම් පවතින බව හා ඉස්ලාමීය මාර්ගයේ පවතින ජිහාද් යුක්තිය හා සාධාරණත්වයෙන් යුක්ත වූවක් බව ද දකිති.

- ඉහත සඳහන් ජිහාද් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන වැරදි අර්ථකථන, මෙය ත්‍රස්තවාදයක්, බලහත්කාරකමක්, කඩුවෙන් නොහොත් බලයෙන් ඉස්ලාමය ව්‍යාප්ත කරන්නක්, රටවල් අල්ලන්නක්, දේපළ ධනය කොල්ල කෑමක් නැත්නම්, පැහැර ගැනීමක්, පලි ගැනීමක් හා සීමාව ඉක්මවා යාමක් යනාදී වශයෙන් දෝෂාරෝපණ ගොතා ඇත.

- සාමය හා යුද්ධය නම් විෂයයෙහි මූලිකත්වය දරනුයේ සාමය බව ද, යුද්ධය විකල්පයක් යන්න ඉස්ලාමීය ස්ථාවරය වේ. ඉස්ලාම් වැඩිමනත් අරමුණු කර තිබෙන්නේ සාමයේ පැත්තට ය. ආචාර්ය මුස්තෆා අස්සිබාඊ කරන විස්තරය මීට ඉතා ගැලපෙන්නකි. ඉස්ලාම් යන පදය, සාමය හා සංහිඳියාව යන අරුත් දෙයි. එය සලාම් යන පදයෙන් නිෂ්පාන්න ඉස්ලාම් යනු මනස, පණ හා කය යනාදියෙන් සථ්‍යයට හා යහපත් දේවලට නතු වීමය. මෙලොව හා පරලොව වශයෙන් බලධාරී අල්ලාහ්ට අවනත වීමය. අස්සලාම් යනු අල්ලාහ්ගේ, අලංකාර ශ්‍රී නාමය කි. මුස්ලිම්වරුන්ගේ ආචාරය අස්සලාමු අලයිකුම් යන්නයි. සෑම මුස්ලිම්වරයෙක් ම නැමදුමේ දී, අත්තහියියාත් අවස්ථාවේ නබි(සල්) තුමාණන්, මුස්ලිම්වරුන් සහ උතුමන්ට සලාම් කියා, සාමය

වෙනුවෙන් ප්‍රාර්ථනා කරති. එසේම, සලාම් යන පදයෙන් ම නැමදුම සම්පූර්ණ වේ. නැමදුමෙන් පසු මඃසූර් වන ප්‍රාර්ථනයෙහි දී ද සලාම් යන පදය ප්‍රමුඛතාව ලබයි. මක්කාහ්වේ මස්ජිදුල් හරම් හි දොරටුවක් ද, මදීනාහ්වේ මස්ජිදුන් නබවියේ දොරටුවක් ද බාබුස්සලාම් (සාමයේ ද්වාරය) වශයෙන් නම් කර තිබේ. ලොවේ අල්ලාහ්ට අවනතව ජීවත් වූවන්ට පරලොවෙහි දී අත්වන නවාතැන දාරුස්සලාම් (සාමයේ නිවහන) යන්නයි. ස්වර්ගයේ ආචාරය සලාම් යන පදයයි.

- අල් කුර්ආනීය පාඨ විචාරාත්මක ව ගවේෂණය කරන විට, සිල්ම් (සාමය) පදය ද එයින් ව්‍යුත්පන්න පදයන් ද පාඨ 133 ක සඳහන් බව ද හර්ෆ් - යුද්ධය යන පදය හයපලක පමණක් සඳහන් බවද පෙනේ. සාමය පිළිබඳ ඉස්ලාමයේ ආකල්පය ඉතා බලවත් බව මෙයින් පැහැදිලි වේ. ඉස්ලාමයේ පිළිපැදීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵලය ශාන්තියේ මාර්ගය අත්කර ගැනීම බව අල්කුර්ආනයේ පැහැදිළිව සඳහන් වේ.

- නියත වශයෙන් ම, අල්ලාහ් වෙතින් ආලෝකය ද, පැහැදිළි ආගමක් ද පහළ වී ඇත. එයින් ඔහුගේ සොම්නස අනුගමනය කරන අයට අල්ලාහ්, සාමයට මඟ පෙන්වන්නේ ය. (5:15, 16)

- නබි (සල්) තුමා සහ සහාබාවරුන් මක්කාවේ අනේක විධ දුක් ගැහැටවලට ලක් කැරුණු අවස්ථාවේ, ඉවසිලිවන්ත වන මෙන් අල්කුර්ආනය ඔවුන්ගෙන් ඉල්ලා සිටීය. ඉස්ලාමයේ සතුරන් සමඟ සටන් වදිමු යැයි සහාබාවරුන් නබි (සල්) තුමාගෙන් අවසරය පැතූ අවස්ථාවල, තමා සටන් වැදීමට අවසර නොලද බව එතුමා පැවසීය. මදීනාහ්වේ දී, සටන් සඳහා අනුමැතිය ලැබීමට පෙරාතුව පහළ වූ හැත්තෑවක් (70) පමණ වූ කුර්ආන් පාඨ, සටන් ගැන නිහඬව සිටීම තුළින්, ඉස්ලාමයේ යුද්ධයට අනුමැතිය ලැබී තිබෙනුයේ විකල්පයක් වශයෙන් බව පැහැදිළි වේ.

- මනුෂ්‍ය ජීවිතය සදාකල් සැපදායක නැත. දුක, සැප, දිළිඳුකම සහ පහසුකම යනාදිය මාරුවෙන් මාරුවට එළෙඹෙයි. එමෙන් ම මිනිසුන්ගේ රුචි අරුචිකම් ද, වෙනස්වන සුළු ය. මේ හේතුවෙන් මත භේද හටගෙන, එකිනෙක කුළල් කා ගනිති. මේ සියලු එදිරිවාදිකම් සාමයෙන් අවසන් වෙතැයි අපේක්ෂා කළ නොහේ. ඇතැම් විටෙක මෙම ගැටලු නිරාකරණය කර ගනු පිණිස යුද්ධය නොවැළැක්විය හැකි සාධකයක් වෙයි. සාමය අවධාරණය කරන සෙසු ආගම්වල පවා, යුද්ධයට අනුමැතිය දී තිබෙනුයේ මේ නිසාවෙනි. යුද්ධයකින් නරක ප්‍රතිඵල පමණක් ලැබේ නම්,දේව දහම් කිසි විටෙක ඊට අනුමැතිය දෙන්නේ නැත. අනෙක් අතට, යුද්ධය මිනිසාගේ යහපතට මඟ සලසන නිසා ද, එය සමාජ විද්‍යාත්මක අවශ්‍යතාවක් වශයෙන් සලකනු ලබයි. අල්කුර්ආනීය අදහසින් මෙය සනාථ වෙයි.

  මිනිසුන් අතරින් ඇතැම් වැරදි කරන්නන්ට එරෙහිව, ඇතැමුන්ගේ මාර්ගයෙන් අල්ලාහ් (ඔවුන්) වළක්වා නොතිබුණේ නම් මේ මහ පොළොව විනාශ වී තිබෙන්නට පුළුවන. (2:251)

- මිනිසාගේ සමාජයීය ප්‍රගමනයට හා ඔවුන්ගේ සාරධර්ම ශිෂ්ටාචාර සංවර්ධනයට යුද්ධය නොවැලැක්විය හැකි එකක් වන බව මෙම පාඨයෙන් ගෙනහැර දැක්වෙයි. වරද ගැන විමසන්නට කණ්ඩායමක් සිටීමත්, එම කණ්ඩායම එම වැරදිකරුවන්ට වඩා බලවත් ව සිටීමත් අත්‍යාවශ්‍ය වේ.

- ඉස්ලාම්, ජිහාදය අනුමත කරනුයේ විවිධ හේතූන් මත ය.
  1. ඉස්ලාමීය දඃවාවට මඟ පාදා දීම.
  2. බලහත්කාරකම් යටත් කොට උදව් කිරීම.
  3. මුස්ලිම්වරුන්ගේ භූමි සහ පූජනීය ප්‍රදේශ රැකගැනීම.
  4. පහත් කරන ලද ජනතාව ගලවා ගැනීම.

- ඉස්ලාමීය ඉතිහාසය පුරා හටගත් සටන් ආත්මාරක්ෂක සටන් මිස ඉස්ලාමය බලයෙන්, කඩුවෙන් පැතිරවීමට දියත් කළ ක්‍රියාවක් නොවේ. ඉහත සඳහන් දේශනා සටන්වලට තුඩු දුන් හේතු සහ සටන් සිදුවුණු ආකාරය සනාථ කරන්නේ ය.

- ජිහාදයෙන් ජය ගත් පසු, බොහෝ අවස්ථාවල සමාව දෙන ලද බව දැනගන්නට පුළුවන. නබි (සල්) තුමා මක්කාහ්ව ජය ගැනීමෙන් පසු. සිය බාප්පාගේ කැවුත්ත සමා කෙළ ගැසූ නින්දාවට පවා සමාව දුන්නේ ය. යුද සිරකරුවෝ මානුෂික ලෙස සලකනු ලැබූහ. බද්ර් සටන් සිරකරුවන් සමඟ ක්‍රියා කළ ආකාරය මීට කදිම නිදසුනකි.

- දිම්මිවරු සෑම අයිතිවාසිකමක් ම ලබමින් වාසය කළහ. "දිම්මිවරයෙකුගේ රුධිරය, මුස්ලිම්වරයෙකුගේ රුධිරයට සමාන ය"ැයි නබි (සල්) තුමා කළ ප්‍රකාශය ඉස්ලාම් මොන තරම් දුරට මානව හිතවාදී ලෙස ක්‍රියා කරනවා ද යන්නට නිදසුනකි. ඉස්ලාමයෙන් ඉගැන්වෙන ජිහාදය, ත්‍රස්තවාදයක් ව, භූමිය ආක්‍රමණය කරන්නක් ව හා පළිගැනීමක් ව පැවතියා නම් ඉහත සඳහන් ගුණාංග දක්නට තිබෙන්නේ නැත.

- මුස්ලිම්වරු රටවල් ඇල්ලීම, කොල්ල කෑම හා ඉස්ලාමය කාවැද්දීම යනාදී අරමුණු සහිතව ජිහාද් කැර තිබුණේ නම්, යන යන සෑම තැනකම ඔවුන් ගරු සරු ලෙස පිළිගැනෙන්නේ නැත. හිජ්රි වර්ෂ 13 හා 100 අතර වූ සීමිත කාල පරාසයක් තුළ, ඉස්ලාමය බටහිරින් පිරනීස් කඳු දක්වා ද, නැගෙනහිරින් මධ්‍යම ආසියාව හා චීන මහා ප්‍රාචීරය දක්වා ද, ගිනිකොන දෙසින් සින්දු ප්‍රදේශය දක්වා ද ඉහළින් පිළිගැනෙන්නට ඉඩකඩ නොවීය. සෑම ප්‍රදේශයකම විසූ සියලුම උසස් ජනීජනයා මුස්ලිම්වරුන් පිළිගෙන, ගරු බුහුමණින් යුතුව සැලකූහ. මීට හේතුව වූයේ මුස්ලිම්වරුන් පිළිගෙන පිළිපදිමින් ජීවත් වූ ඉස්ලාමයේ සුවිශේෂත්වය හා මහිමයයි.

- ලොව පුරා විසිර ව්‍යාප්තව ගිය මුස්ලිම්වරු, මිනිසුන් දෙස මානව හිතවාදයෙන් බැලූහ. සෑම මිනිසෙකුම එකම ජීවයකින් මවනු ලැබූවන් බව සිත් දරාගෙන සිටියහ. මිනිසුන් අතර කිසිදු භේදයක් නොදැක්වූහ. සෑම අතින් ම සමාජ නීතිය ආරක්ෂා කළහ. එකල මුස්ලිම්වරු, ආයුධ බලයට වඩා අල්ලාහ් වෙත බලවත් සේ විශ්වාසය තැබූහ. බලය යොදවා කවර නම් කාර්යයක් කළ ද, එය පවතින්නේ නැත. පෙරදිග හා අපරදිග රටවල ඉස්ලාම් දැඩි ලෙස ස්ථාපිත වීමට තුඩු දුන් මූලික හේතුව වූයේ මොවුන් කෙරෙහි දක්නට වූ ඉස්ලාමීය සාරධර්ම ය. මිනිසුන්ට නම්බුව දෙමින් මානුෂික ගුණදහම් සහිතව ඔවුන් ඇසුරු කළහ. ශ්‍රී ලංකාව වැනි රටවල ඉස්ලාම් ප්‍රචලිත වූ ක්‍රමය ගවේෂණය කිරීම තුළින් මේ බව පහසුවෙන් වටහා ගත හැකි වන්නේය.

- මුස්ලිම්වරුන් ද, මුස්ලිම් නොවන්නන් ද, ජිහාදය ගැන සඳහන් කරන විට, ඔවුන්ගේ මනසට නැඟෙන්නේ ආයුධ සන්නද්ධ සටන් ය. මේ වනාහි, ජිහාදවර්ග අතරින් නොවැළැක්විය හැකි අවස්ථාවල යොදා ගන්නකි. ඉමාම් ඉබ්නුල් කය්යූම් තුමා සිය සාලිතුල් මආද් නමැති කෘතියෙහි ජිහාදය වර්ග 15 කට බෙදා දක්වයි. ඒවායින් වර්ග හතරක් (4) සිත හා සබැඳි ය. වර්ග දෙකක් (2) ෂයිතාන්ට එරෙහි වූ ඒවා ය. තුනක් (සමාජය) තුළ පැනනගින අපරාධවලට එරෙහි වූ ඒවා ය. ඉතිරි වර්ග හතර (4) ප්‍රතික්ෂේපකයන් සහ වංචනිකයන්ට එරෙහිව අත, දිව හා මුදල් යොදවා දියත් කරන ක්‍රියාවන් ය. මේ අනුව, ධාර්මික සටන යනු ජිහාදයේ විවිධ වර්ගවලින් එකක් බව සැලකුව මනාය.

**අපරාධ හා දඬුවම්**

- ව්‍යවහාරික ලෝකයේපවත්නා දණ්ඩන නීති වූකලී, නීති විශාරදයින්ගේ විධිවිධාන ලෙස සකසා ඇත. මේවා මානසික සාරධර්ම පුහුණුව හෝ සමාජ සංශෝධන අගයයන් හෝ ඇති කිරීමට අසමත් විය. අපරාධ ගැන ද, ඒවායේ ස්වභාවයන් හා නීති සම්පාදන ප්‍රයෝජනයන් ගැන ද සැලකිල්ලක් දැක්වූ තරමට අපරාධවලට අදාළ දඬුවම් හෝ අපරාධයන් නිසැක ලෙස ඔප්පු කිරීමට තැත් කිරීමෙහි හෝ වැඩි සැලකිල්ලක් යොමු කළ බවක් නොපෙනේ. ඇතැම් විට තාර්කික දක්ෂතාව හේතුවෙන් වරදකරු, නිවැරදිකරු වශයෙන් හඳුන්වා දිය හැකි තරමට බොළඳ විධිවිධාන ය. මේ නිසා සමාජ විනාශය හා පරිහානිය සහිත වේ.සමාජ විරෝධීන් රැක තරමට දුබලය. මේ නිසා, ලොවේ සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නන්ගේ බලය අධික වීමෙන් සමාජ අයිතිවාසිකම් පැහැර ගන්නා තත්ත්වයක් පවතී.

- සෑම තත්ත්වයක් තුළදී ම ඇතැම් මූලික හරයන් ආරක්ෂා කිරීමෙහි හා ඒවා වැඩිදියුණු කිරීමෙහිලා ඉස්ලාම් වැඩි සැලකිල්ලක් දක්වයි. ඒවා දීන් (මාර්ගය), දේපල, ධනය, ශරීරය, ජීවිතය, පරපුර, බුද්ධිය හා ගරුත්වය යනාදියයි. මේවා සුරක්ෂිත නොවන විටෙක, විනය විරෝධීභාවය, අසාධාරණය සහ අරාජිකත්වය ඇති වේ. මේවා ආරක්ෂා කිරීමට හා සංවර්ධනය කිරීමට ඉස්ලාම් අවධානය යොමු කරනුයේ එබැවිනි. ඉස්ලාමයේ අපරාධ හා දඬුවම් පිළිබඳ මූලධර්ම ද මෙම විධිවිධානවලට උචිතලෙස සකස් වී තිබේ.

- පොදුවේ අපරාධයක් යනු නිශ්චිත නෛතික සීමාවනට හෝ එකඟතාවලට බැඳී ක්‍රියාකරන බවට එකඟ වූ පුද්ගලයකු එය උල්ලංඝනය කිරීමකි. එලෙස උල්ලංඝනය කළ පුද්ගලයා පූර්ව තත්ත්වයට ගෙනෙන්නට පානු ලබන ව්‍යතිරේක ක්‍රියාව නැතහොත් එවැනි සීමාවන්ගෙන් සමාජය ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන ෂරිආවේ සඳහන් ප්‍රතිකාර ක්‍රියාව දඬුවම් වශයෙන් හැඳින්වේ. ඉස්ලාමීය දෘෂ්ටිකෝණය අනුව, වැඩිවියට පත්, යහපත් සිහියෙන් පසුවන කෙනෙකු, අල්ලාහ් සහ රසූල් නියම කළ කරුණක් අතහැර දැමීම සහ තහනම් කළ දෙයක් කිරීම වරදක් ලෙස දැක්වේ. මෙය සමාජයීය දැක්මෙන් සඳහන් කරතොත්, පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් වෙනත් පුද්ගලයෙකුගේ හෝ කණ්ඩායමක ශරීරයට හෝ දේපළවලට හෝ ආත්මගරුත්වයට හානියක් සිදුවන අයුරින් ක්‍රියා කිරීම හා ක්‍රියා කිරීමට දිරිගැන්වීම ඉන් දැක්වේ. මෙබඳු සමාජ විරෝධී ක්‍රියාවලින් ආගම, පුද්ගලයන් හා සමාජය ආරක්ෂා කර ගනු පිණිස ගන්නා වූ ෂරිආවේ සඳහන් ප්‍රතිකාරී ක්‍රියා දඬුවම් වශයෙන් හඳුන්වනු ලැබේ.

- ඉහත සඳහන් හරවත් කරුණු රැකගනු පිණිස, ඉස්ලාම් අපරාධයන් වර්ග කොට, ඒවාට ගැලපෙන දඬුවම් නිර්ණය කොට පුද්ගලයන්, සමාජය, ආගම සහ ඉස්ලාමීය රාජ්‍යය ආරක්ෂා කරයි.

- අපරාධ ජරාඉමුල් හුදූස්, දඬුවම් නිර්ණය කරන ලද අපරාධ, ජරාඉමුල් කියාස් වන්නිය. පලිගැසීම, වන්දි ලබාගැනීම නැමැති දඬුවම් ලබන අපරාධ, තසීර් අපරාධ හෙවත් සාමාන්‍ය අපරාධ යනාදී වශයෙන් වර්ග කොට තිබේ. සමාජයේ උන්නතියට අදාළ පදනම් සුරකින පරිද්දෙන් ඊට අදාළ දඬුවම් ඉස්ලාමයෙන් නිර්ණය වී තිබේ.

- දඬුවම් නියම කිරීමට පෙරාතුව ස්ලාම්, යම් යම් හරයන් සලකා එය සිදු කරයි.

  1. නියමිත දඬුවම අපරාධ සිදුවන්නට පෙර එය වළක්වා ගත හැකි පරිද්දෙන් විය යුතු ය.
  2. දඬුවම ඉතාම සුදුසු වන්නක් විය යුතුය.
  3. දඬුවම් දීමෙහි දී වරදකරු ගේ තත්ත්වය තරාතිරම ගැන සැලකිල්ලට නොගත යුතු ය.
  4. දඬුවම් සමාජ ආරක්ෂාව හා සමාජ ස්ථාවරත්වය ඉලක්ක කර ගත්තක් විය යුතු ය.
  5. දඬුවම් නීත්‍යානුකූල විය යුතුය.
  6. සාමාන්‍ය අපරාධවලදී දෙන දඬුවම්, වරදකරු සම්බන්ධයෙන් වෙනස් විය හැකිය.

  ඉස්ලාමීය දඬුවම්වල දක්නට ලැබෙන මෙකී මූලික හරයන් වරදවා අවබෝධ කරගෙන තිබේ. ඒවා සාධාරණ බව ද සනාථ කිරීමට ඉහත සඳහන් මූලික හරයන් ප්‍රමාණවත් වේ.

- ඉස්ලාමීය දඬුවම්වල අරමුණු හා ඉලක්ක, ඒ පිළිබඳ වැරදි අවබෝධය තුරන් කරයි.

  1. දැනුවත් කොට. යහමඟ පෙන්වා යහපත් මිනිසුන් බවට පත් කිරීම.
  2. වැරදි නැතිකොට සමාජ විනය හා නීතිය සුරැකීම
  3. සමාජ සංශෝධන හා විනය පාලනය
  4. පෞද්ගලික හා සමාජ අයිතිවාසිකම් සුරැකීම
  5. ජනතාව යහපත කරා මෙහෙයවමින් ආත්ම දමනය හා වගකීම් පිළිබඳ හැඟීම ඇති කරවීම.
  6. අපරාධකරුවන් යහමඟට යොමු කිරීම.
  7. මතුවට අපරාධ සිදු නොවන්නට වගබලා ගැනීම.
  8. කළ වරදට විපාකය ලබා දීම

- ඉස්ලාමීය දඬුවම් ම්ලේච්ඡ, අශිෂ්ට, මිනිස් අයිතිවාසිකම්වලට ඇඟිලි ගසන සහ කෲර ඒවා යැයි දෝෂදර්ශන විටින් විට අසන්නට ලැබේ. නිදසුනක් වශයෙන්, දුරාචාරයෙහි යෙදෙන්නාට කස පහර සියයක් හෝ විවාහක නම් ගල් ගසා මරා දැමීම, මත්පැන් පානය කරන්නාට කස පහර හතළිහක්, සොරකම් කරන්නාගේ අත සිඳලීම, අපවාද නගන්නාට කස පහර අසූවක් සහ ආගම වෙනස් කරන්නාට අවවාද කිරීමෙන් පසු මරණීය දණ්ඩනය නියම කිරීම යනාදිය වරදවා වටහාගෙන ඇති බව සඳහන් කළ හැකිය. මෙකී අපරාධවලින් සමායේ හර පද්ධතීන්ට සිදුවන හානිය හා ඒ නිසා ලොවේ කවර විපාක දැක්වේ ද යන්න සිතා බැලීමට මොවුහු අපොහොසත් වෙති. මෙකී දඬුවම් ක්‍රියාවට නොනැංවීම නිසා, සමාජයේ හටගෙන තිබෙන සමාජ, ආර්ථික, විනය හා සාරධර්ම පරිහානිය ගැන සිතන්නට අපොහොසත් වෙති.

  ඉස්ලාමීය දඬුවම්වලට අදාළ සාධාරණත්වය

  1. ඉස්ලාම් වනාහි අල්ලාහ් විසින් සකස් කරන ලද, මෙලොව හා පරලොව සම්බන්ධ කරගත් අංක සම්පූර්ණ ජීවන සැලැස්මකි. එහි නීති ව්‍යවස්ථා සියල්ලම, දෙලොවම සම්බන්ධ කර ගත්තක් බැවින්, එය විවේචනය කළ හැකි වනුයේ ඒ දෙකටම සම්බන්ධ කොට ගවේෂණය කරන්නන්ට පමණි. උදක්ම ලෝකායතය ඉලක්ක කැර ගෙන සිතන්නෙකුට මෙහි අරුත වටහා ගත නොහැකිය.

  2. ඉස්ලාම් කිනම් අරමුණු ඉලක්ක කරගෙන දඬුවම් නියම කරන්නේ ද, ඉන් එම අරමුණු අස්කර ගත හැකි බැවින්, එය සාධාරණ වේ. ඉස්ලාමීන් නීතිය ක්‍රියාවට නැංවූ නබි (සල්) තුමා ගේ අවධියේ ද කුලෆාඋර් රාෂිදුන්වරුන්ගේ අවධියේ ද, වත්මනෙහි ඉස්ලාමීය දඬුවම් ක්‍රියාත්මක කරන රටවල ද මෙය දැක ගන්නට පුළුවන.

3. වැරදි සිදුවීම වලක්වන වාතාවරණයක් බිහිකළාට පසුව ය, ඉස්ලාම් දඬුවම් නියම කරනුයේ. එහි විශ්වාස සංකල්ප, සමාජ, ආර්ථික, දේශපාලනික, අධ්‍යාත්මික හා විනය පිළිබඳ දේශන වැරදි සිදු නොවන වාතාවරණයක් බිහි කරයි. මීට නිදසුනක් වශයෙන් පහත සඳහන් කරුණු ඉදිරිපත් කළ හැකි ය. විවාහ හා බහු භාර්යා විවාහ යනාදිය අවිචාර, දුරාචාර සිදු වීම වළක්වයි. ඉස්ලාමීය ඇඳුම් පැළඳුම්, ස්ත්‍රී - පුරුෂයන් සම්බන්ධ විනය පිළිපදිනු ලබන විට වැරදි සබඳතා, හා වැරදි ක්‍රියා සිදුවන්නට අවස්ථාවක් නැත. Zසකාත්, පසු උරුමකම්, අන්තිම කැමැත්ත, සදකා, Zසකාතුල් ෆිත්ර් යනාදිය ක්‍රියාවට නැංවෙන තැනෙක සොරකම් සිදුවීමට ඉඩකඩ නැත. ඉස්ලාම් දඬුවම් පමුණුවාලීමට සැරසෙන්නේ මෙවැනි පසුබිමක් තුළ බැවින් එය සාධාරණ වේ. එය වරදවා තේරුම් ගෙන ඇති උදවිය මේ කරුණු විමර්ශනය කළ යුතු ය.

4. අපරාධ හා දඬුවම් සම්බන්ධයෙන් පූර්වාවබෝධයක් ඉස්ලාම් ලබා දී ඇත. ඉතා පැහැදිළි වශයෙන්, ජරාඉමුල් හුදූද් හා ජරාඉමුල් කිසාස් වත්තියා අළලා කුර්ආනයේ හා සුන්නාහ්වේ විස්තර කර තිබෙන බැවින්, ඉස්ලාමය පිළිගත් මුස්ලිම්වරයෙකු, මේවා පිළිගෙන ක්‍රියා කිරීම පහසුවක් වේ. මේවාට සහාබිවරුන් එකඟ වූ බවට සහාබිවරයකු වූ මාඉස්ගේ ඓතිහාසික සිද්ධියෙන් සනාථ වේ.

5. පරලොවහි දී පමුණුවනු ලබන දඬුවම් ගැන අවධාරණය කිරීම තුළින් ඉස්ලාම්, මානසික සංයමයක් සලසයි. මෙවැනි මානසික සංයමයක් සහිත පුද්ගලයන් අතර, අපරාධ සිදුකිරීමේ ප්‍රවණතාවක් නැත. නබි හිතවතුන් මානසික සංයමයකින් යුතු වූ බැවින් ඔවුනතර අපරාධ සිදුකිරීමේ අවස්ථා ඉතා විරල විය.

6. දඬුවම් පමුණුවාලීමට ඉස්ලාමයෙන් කොන්දේසි පනවා ඇත. අපරාධ සාක්ෂි සහිතව ඔප්පු කළ යුතුයි. නැතහොත් අපරාධකරු පිළිගත යුතුය. වරදට පොළඹවීමක් නොතිබිය යුතුයි. දැනුම හා නිදහස පවතින විට අපරාධය සිදුව තිබිය යුතුයි. වරද කිරීමේ මානසිකත්වයෙන් වරද කිරීම එසේ තීන්දු කරන දඬුවම, සාක්ෂි සහිත, තාර්කික සහ බුද්ධිමත් විචාරශීලීත්වයට ගැලපෙන්නක් වනවා විනා, එය කිසිම අපරාධ ප්‍රතිපත්තියකින් උපුරා ගත්තක් හෝ දේශයක තැන්නම් පුද්ගලයකුගේ රුචි අරුචිකම්වලින් බලපෑම්වලට ලක් වූවක් නොවන්නේ ය.

7. අපරාධය සිදුවූ පසුබිම ගැන සලකා ඉස්ලාමීය දඬුවම් පමුණුවනු ලබන බැවින්, එය සාධාරණ වේ. සොරකම් කළ අයගේ අත සිඳලිය යුතු බව ඉස්ලාමීය දණ්ඩණය වුව ද, සොරා සොරකමට පෙළඹවූයේ කුසගින්න විය හැකි යැයි සැකයක් ඇති වී නම්, ඔහුට එම දඬුවම පමුණුවන්නේ නැත. කුසගින්න හේතුවෙන් ජනයා සොරකම් කරනු ඇතැයි සිතූ උමර් (රළි) තුමා සාගතයක් පැවැති අවධියක සොරකම් සඳහා වන දඬුවම පැමිණවූයේ නැත. ඉස්ලාමීය දඬුවම් පමුණුවනු ලබන්නේ කිනම් අරමුණක් සඳහා ද යන්න දැක්වීමට මෙය කදිම නිදසුනකි.

8. ඉස්ලාම් හිතුමතයට දඬුවම් ක්‍රියාත්මක කිරීමට අවසර නොදෙයි. "සැකය පදනම් කරගෙන දඬුවම් පැමිණවීමෙන් වලකින්න." උමර් (රළි) තුමාගේ අවධියේ සිදුවූ සිද්ධියකින් මෙය පැහැදිළි ව දැක්වේ. හාතිබ් ඉබ්නු අලී බාලිතා වෙත සේවය කළ කොලුවන් කිහිප දෙනෙකු, මුස්නා ගෝත්‍රයට අයත් කෙනෙකුගේ ඔටු දෙනක සොරකම් කළබවට උමර් (රළි) තුමා වෙත පැමිණිලි කරන ලදී. උමර් (රළි) තුමා මෙය විභාග කළ විට එකී කොලුවෝ, තමා එය සොරකම් කළ බව පිළිගත්හ. මේ නිසා ඔවුන්ගේ අත් සිඳලන ලෙස උමර් තුමා තීන්දු කළේය. ඉන්පසු මොහොතක් කල්පනා කෙට, කොලුවන්ගේ හාම්පුතා අමතා අල්ලාහ්ගේ නාමයෙන්, ඔබ මේ කොලුවන් වැඩට යොදවා, ඔවුන් කුසගින්නෙහි තැබූ බවත්, ඒ හේතුවෙන්

තහනම් කරන ලද ආහාරය ගැනීමට ඔවුන් පෙළැඹවූ බවත්, මා නොදැන සිටියා නම්, මා ඒ කොලුවන්ගේ අත් සිඳලන්නට තිබුණා යනුවෙන් පැවසීය. තවද අල්ලාහ්ගේ නාමයෙන්, මා ඒ කොලුවන්ගේ අත් නොසිඳලූ නිසා, ඔබට පීඩාකාරී දඬුවමක් පමුණුවනවා යැයි පවසා, ඔටු දෙනගේ වටිනාකම මෙන්දෙගුණයක් ගෙවන ලෙස හාම්පුතාට නියෝග කළේය.

කෙනෙකු වරදක් සිදුකිරීමට පොළවන්නා වූ පසුබිමක් තිබේ නම්, ඔහුට දඬුවම් නොපමුණුවන බවට මෙම සිද්ධියෙන් සහතික වේ.

9. නිශ්චිත වැරදි ක්‍රියාවලට සමාව දීම හා දඬුවම් ලබන්නාගේ පවුල කෙරෙහි ඉස්ලාමයෙන් දැක්වෙන සැලකිල්ල, ඉස්ලාමීය දඬුවම් කෲර වූවක් නොවන බව සනාථ කරයි. දඬුවම ලබන්නන්ගේ පවුල්වලට පොදු අරමුදලෙන් ආධාර සපයනු ලැබේ.

10. පෞද්ගලික නිදහස සීමාවකට ලක්විය යුතුය යන පිළිවෙතට ඉස්ලාමීය දඬුවම් ඉවහල් වන නිසා එය සාධාරණ වේ. මන්ද, වැරදි සිදු කරන්නන්ගේ බලය වැඩි වී සමාජ හානියට හේතුවන පරිදි නිදැල්ලේ සිටීමට ඔවුනට ඉඩදීම ඊටහේතුව වීම ය.

11. නබි(සල්) තුමාගේ අවධියේ ද, කුලෆා උර්රාෂිදූන්වරුන්ගේ අවධියේ ද දඬුවම් පමුණුවනු ලැබුණේ ඉතා අඩු වශයෙනි. ඊට පාදක වූ හේතු රාශියක් ඇත. පළමුවැන්න, ඉස්ලාමීය දඬුවම් විසින් අපරාධ නොසිදුවන වටාපිටාවක් ඇති කිරීම ය. දෙවැන්න, ජනයා අපරාධවලින් වළක්වා ගත හැකි සමාජ පරිසරය බිහිවීමය. දැනට ව්‍යවහාරයෙහි ඇති දඬුවම් ක්‍රම, අපරාධ පොළඹවන්නක් වේ. ඒ අතර අපරාධ සිදුවීමට ඉවහල් වන සියලුම දොරටු විවෘත කර තිබේ.

12. ඉස්ලාමීය ඉතිහාසය පුරා, දඬුවම් ක්‍රියාවට නැංවූ ආකාරයෙන් දඬුවම් කෲරවූවක් නොවන බව ද, ඉස්ලාමයේ අරමුණ දඬුවම් දීම නොවන බව ද, සහතික වේ. දුරාචාරයේ යෙදුණු කාන්තාවක, නබි (සල්) තුමා වෙත අවුත්, තමාට දඬුවම් පමුණුවන මෙන් ඉල්ලා සිටියා ය. දරුවා වැදූ පසු එන්නැයි එතුමා ඇය ආපසු යැවීය. දරුවා ලැබුණු පසු ඇය නැවත පැමිණියා ය. එහිදී නබි (සල්) තුමා කිරි දීමෙන් පසු එන්නැයි ඇය හරවා යැවීය. දෙවසරකට පසු පැමිණි ඇයට දඬුවම් පමුණුවන ලදී.

ඉස්ලාමය සහ එහි දඬුවම් ක්‍රම ගැන වරදවා වටහාගත් උදවිය ඒ ගැන විවෘත මනසින් සාධාරණ ලෙස කල්පනා කිරීම තුළින් හිතකර නිගමනයකට එළඹෙන්නට පුළුවන් බව ඉහත සඳහන් හේතුවලින් සහතික වේ.

කාන්තාවන්ගේ තත්ත්වය

- කාන්තාවන්ගේ සංඛ්‍යාව සමාජයේ හරි අඩක් බව ගණනය කර තිබේ. එමනිසා සමාජය විසින් ඔවුන් කොන් කිරීමට හෝ අසාධාරණයට ලක් කිරීමට හෝ නුපුළුවන. සංඛ්‍යාවෙන් හරි අඩක් වුව ද, සමාජයේ යහපත හෝ අයහපත ඇති කිරීමෙහිලා අති විශාල දායකත්වයක් ඔවුන් දරන බව අවිවාදිත ය.

- මව, පාසලකි. ඇය නිසි ලෙස පරිපාලනය කිරීම තුළින් ශ්‍රේෂ්ඨ ගුණ දහම් සහිත පරපුරක්ම බිහි කරන්නී යැයි එක්තරා කවියෙක් කියයි.

- වත්මනෙහි පොදුවේ, වියතුන්, චින්තකයන්, සමාජ සංශෝධකයන්, දේශකයන් හා නායකයන් ඇතුළු සියලු දෙනා ම කාන්තාවන්ගේ ගරුත්වය, සමාජය තුළ ඔවුන්ගේ තත්ත්වය, ඔවුන්ට සිදුකරන කෲරකම් හා ලිංගික සමානාත්මතාව යනාදී නොයෙකුත් මාතෘකා ටයතේ කතා කරති. ලියති. අදහස් හුවමාරු කර ගනිති. පර්යේෂණ කරති.

- ක්‍රි.ව. 586 දී පවත්වන ලද සම්මේලනයක දී කාන්තාවන්ට, මිනිසුන් වශයෙන් සලකනවා ද නැත්නම් සතකු වශයෙන් පිළිගන්නවා දැයි වාද කොට, ඇය, පුරුෂ පක්ෂයට සේවය කිරීම සඳහා මවනු ලැබූවක් යන නිගමනයට එළැඹුනහ. 1995 දී බෙයිජිං හි පවත්වන ලද සම්මේලනයේ දී කාන්තාවන් පිළිබඳ ව අර්බුදකාරී අදහස් පමණක් හුවමාරු විය.

- ඉතිහාසය පුරා සෑම වකවානුවකදී ම, කාන්තාවන් කෙසේ සලකනු ලැබූවා ද යන්න තේරුම් ගැනීම තුළින්, ඉස්ලාමයෙන් ඔවුන්ට සලසන ලද උසස් තත්ත්වය ගැන පැහැදිලි ව වටහා ගත හැකිය.

ඉස්ලාමයේ ප්‍රවේශයට පෙර

- සුමේරියන්වරු, පිරිමියෙකු සොරකම් කළා නම් ඔහුට ලිහිල් දඬුවම් පැමිණවූහ. ගැහැණිය ඇගේ සැමියාගේ දෙයක් සොරකම් කළ ද, ඇයට දැඩි ලෙස දඬුවම් කළහ. ඇතැම් විට ඇගේ නාසය කපා දමන ලදී,

- ගබ්සාවකින් පසු ස්ත්‍රිය ජීවතුන් අතර සිටියත් නැතත් ඇය එල්ලා මරණු මිස, මිහිදන් කිරීමටවත්, මෙසපොටේමියන්වරු ඉදිරිපත් නොවූහ.

- ග්‍රීක වැසියන්, ස්ත්‍රීන්ට සැලකුවේ, බඩු මුට්ටු මිලට ගැනීම හා අලෙවි කරන්නක් වශයෙනි. සතුන් වෙනුවට හුවමාරු කර ගන්නා භාණ්ඩයක් වශයෙන් ස්ත්‍රීහු සලකනු ලැබූහ.

- රෝමන්වරු ස්ත්‍රීන්ට කිසිදු සැලකිල්ලක් නොදැක්වූහ. ස්ත්‍රීන්ට, යුක්තිය අයැද කිසිදු උසාවියකට යා නොහැකි විය. විවාහයෙන් පසු ඇගේ සියලුම දේපළ, සැමියාගේ ආධිපත්‍යයට යට විය. ඇයට නිදහසේ හරි හම්බ කිරීම, දේපළ ආරක්ෂා කිරීම, විකිණීම හෝ ගිවිසුම්වලට එළැඹීම හෝ කළ නොහැකි විය.

- ඉන්දියානුවන් ස්ත්‍රිය ගැන සිතුවේ, මරණය, වස, අපාය, වසංගතය හා නාරයන්ට වඩා දුෂ්ට වස්තුවක් වශයෙනි.

- සැමියාගේ මළකඳ චිතකයේ පිළිස්සෙන විට එම ගිනි මැලයට ඇය ද වීසි කරනු ලැබුවාය.

- පුරාතන ක්‍රිස්තියානිවරු කාන්තාවන් අපායේ දොරටුව, ෂයිතාන්ගේ මුල්ම ආකෘතිය, පාපයේ මව හා දෂ්ට කිරීමට සූදානම් ව සිටින ගෝනුස්සකු වශයෙන් සැලකූහ.

- අරාබිහු, කාන්තාවන් ලිංගික භාණ්ඩයක් හා වෙළෙඳ භාණ්ඩයක් වශයෙන් සැලකූහ. ඔවුහු ගැහැණු දරුවන් පණ පිටින් මිහිදන් කළහ. ඔවුනට කිසිදු අයිතිවාසිකමක් නුදුන්හ.

- නබි (සල්) තුමා ඉස්ලාමය රැගෙන ආවේ මෙබඳු පසුබිමෙක ය. එමගින් කාන්තාවෝ ගරු බුහුමනට පත් කරන ලදහ. ඔවුන් මිනිසුන් වශයෙන් පෙන්වාදෙන ලදී. පුරුෂයනට වගේම ස්ත්‍රීන්ට ද අයිතිවාසිකම් ලබා දුන්නේය. ඉස්ලාම්, කිසිම විටෙක කාන්තාවන්ට නිගරුකොට කතාකොට නැත. පිරිමින්ගේ පාරිභෝගික භාණ්ඩයක් වශයෙන් හෝ වහලියක් වශයෙන් හෝ සලකා නැත. පිරිමින්ට ලබා දුන් ගරුත්වයම ගැහැණුන්ට ද ලබා දී ඇත.

**1. එකම ආත්මයකින් බිහි වූ අය**

- ස්ත්‍රී පුරුෂ යන දෙපාර්ශ්වයම එකම මූලයකින් හටගත් අය වෙති. මිනිසකු වශයෙන් වගකීම් දරන්නන් සහ යහපත් ආනිශංස ලබන්නන් වශයෙන් ඔවුහු සමාන වෙති.

- මිනිසුනි, ඔබ ඔබේ දෙවියන්ට බියෙන් ක්‍රියා කරන්න. ඔහු ඔබ සියල්ලන් ම එකම ආත්මයකින් මැවීය. (මුලදී ඒ එකම කෙනා මවා) ඔහුගෙන් සිය බිරිඳ මැවීය. ඉන්පසු ඒ දෙපළගෙන් බොහෝ ස්ත්‍රී පුරුෂයන් (බිහිකොට) ව්‍යාප්ත කළේය. එමනිසා ඒ අල්ලාහ්ට ඔබ බියවන්න. (4:1)

- මිනිසුන් ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙනස් වුව ද ඒ දෙදෙනා ම එකම ජීවයකින් මැවීය. මේ අනුව, කෙනෙක් අනෙකාගෙන් පූරණය වෙති.

- එකම මිනිසාගෙන් ඔබව මැවුවේ ඔහු (අල්ලාහ්) ය. ඔහු (මිනිසා) සමඟ එක් ව ජීවත් වනු පිණිස ඔහුගේ භාර්යාව ඔහු වෙතින් ම මැව්වේය.(7:189) මිනිස් සංහතියේ ප්‍රභවය, එකම ස්ත්‍රී පුරුෂයන්ගෙන් සිදු විය. සියලු දෙනාම එකම රක්ෂකයාගේ වහලුන් ය යන සහෝදරත්ව හැඟීම සියලු දෙනා ම බැඳ තබයි. මේ නිසා, ඔබ සියලු දෙනාම එකමුතුව ජීවත් විය යුතු බවට අල්කුර්ආනය නියෝග කරයි. පිරිමියා, ගැහැණියගේ සහෝදරයා ය. ගැහැණිය පිරිමියාගේ සහෝදරයා ය. නියත වශයෙන් ම ස්ත්‍රීහු, පුරුෂයන්ගේ (කළණ) සහෝදරයෝ ය. (අහ්මද්)

**2. ආගම හා නැමදුම යනාදියෙහි සමානාත්මතාව**

- නියත වශයෙන් ම මුස්ලිම් වන ස්ත්‍රී පුරුෂයින්ට, විශ්වාසිකයන් වන ස්ත්‍රී පුරුෂයනට (අල්ලාහ්ට) නමදින ස්ත්‍රී පුරුෂයනට, ඇත්ත ම කතා කරන ස්ත්‍රී පුරුෂයනට, දානමාන කරන ස්ත්‍රී පුරුෂයනට, සවම් (නෝම්බි) සමාදන් වන ස්ත්‍රී පුරුෂයිනට, තම පතිවත රකින ස්ත්‍රී පුරුෂයනට, අල්ලාහ් සමාව ද මාහැඟි ආනිසංස ද, තබා ඇත. (33:35)

- පිරිමින්ට වඩා ගැහැණුන් පහත් නොවන බව සහ මෙම දෙපාර්ශ්වයම සමාන බව මෙම පාඨයෙන් හඟවනු ලබයි.

**3. සමාජ වගකීම්වල සමානාත්මතාව**

- විශ්වාසය තැබූ ස්ත්‍රී පුරුෂයෝ එකිනෙකාට කල්‍යාණ මිත්‍රයෝ වෙති. යහපත සිදුකරන මෙන් දිරි ගන්වමින් ද, පව් කිරීමෙන් වළක්වමින් ද, නැමදුම් ඉටු කරමින්, zසකාතය ද දෙමින් පසුවෙති. අල්ලාහ්ට සහ ඔහුගේ දූතයාට කීකරුව ක්‍රියා කරති. (9:71)

- ඇතැමුන් කාන්තාවන් පාපයේ බීජය, අකුසලයේ උල්පත සහ පිරිමින් නරක් වීමට හේතුව වෙතැයි සලකන්නාක් මෙන් ඉස්ලාම් නොසලකයි. ආදම් තුමා (අලයි) හව්වාතුමියගේ (අලයි) පෙළඹවීම නිසා තහනම් කළ දෙය අනුභව කළ බව කියති. එහෙත් දෙදෙනාම පවු කමාව අයැදියේ, දෙදෙනාම එක් කළ පාපයටයි. මේ බව අල්කුරානයේ අපේ ආරක්ෂකයාණෙනි, අපට අප විසින්ම වරද සිදුකර ගන්නා ලදී. ඔබ අප කමා කොට පිහිට නොවූයේ නම් නියත වශයෙන් ම අපි පාඩු විඳින්නන් බවට පත් වන්නෙමු. (7:25) යනුවෙන් කෙරෙන සඳහනින් පාපයේහිලා දෙදෙනාටම අයිතියක් තිබෙන බව දක්වයි.

**4. ආනිසංස අත්කර ගැනීමෙහි හා ස්වර්ගය අත්කර ගැනීමෙහි සමානාත්මතාව**

- ඔබ අතරින් පිරිමියෙකු හෝ ගැහැණියක හෝ කවුරුන් යහපත කළ ද එය මම නිෂ්ඵල බවට පත් නොකරමි. (3:95, 16:97, 4:124)

- ගිවිසුම් ඇති කර ගැනීමට ආයෝජනයන් කිරීමට හා හරිහම්බ කරන දෙය තමන් වෙනුවෙන් තබා ගැනීමට ඇයට අයිතිය තිබේ.

- ඉස්ලාම් විසින් ස්ත්‍රීන් උසස් තත්ත්වයෙහිලා සලකනු ලැබේ. නබි (සල්) තුමා "මුළු ලොවම ප්‍රීතිය ගෙන දෙන්නකි. ඒ අතරින් අති ශ්‍රේෂ්ට වනුයේ යහපත් ස්ත්‍රියයි." ද (මුස්ලිම්)

**මානව වර්ගයා බෝ කිරීම**

- පුරුෂයනට වගේම ස්ත්‍රීන්ට ද මෙහි දායකත්වයක් තිබෙන බැවින් ඇය ඉඳුරා පිරිමියාට සමාන වෙයි. බිරිඳගේ වගකීම් සැමියාගේ වගකීම්වලට නොදෙවෙනි ය.

**සිප්සතර හැදෑරීම**

- සිප්සතර හැදෑරීමෙහිලා පිරිමින් වගේ ම ගැහැණු ද සමාන වෙති. දැනුම සොයා ලබා ගැනීම සමස්ත මුස්ලිම්වරුන්ගේම වගකීම වේ. (බුහාරි) ඉතිහාසයේ ආයිෂා, බින්කි ෂිෆා, ෆාතිමා සිර්හින්ද් යනාදිහු අධ්‍යාපන ක්ෂේත්‍රයෙහිලා ආදර්ශවත් වූහ.

**සමාජ සේවාවල නිරත වීම**

- ඉස්ලාමීය හරයන් රැක ගනිමින් සමාජ සේවාවල යෙදීමට ඉස්ලාම් කාන්තාවන්ට අනුමැතිය දී ඇත. නබි (සල්) තුමාගේ අවධියේ කාන්තාවෝ සමාජ සේවාවේ විවිධ ක්ෂේත්‍රවල නිරත වෙමින් විශාල මෙහෙයක් ඉටු කළහ. ඉගැන්වීම, සටන් වැදීම සහ තුවාල ලැබූවන්ට වෛද්‍ය ආධාර කිරීම යනාදී වශයෙන් ආයිෂා (රළි) තුමිය හා අස්මා (රළි) තුමිය යෙදුණහ.

- මෙනයින්, මුස්ලිම් කාන්තාවන්ට ලැබී තිබෙන ගරුත්වය, නම්බුව, තත්ත්වය හා අයිතිවාසිකම් යනාදිය නිදහස් සටන් තුළින් හෝ ලැබූවක් නොවේ. ඇය ඉල්ලා සිටියත් නැතත් ඉස්ලාම් ඇයට මේවා ලබා දී තිබේ.

- ඉස්ලාම්, කාන්තාවන්ට ගරුකොට අයිතිවාසිකම් රැසක් ද, ගෞරවනීය තත්ත්වයක් ද ලබා දී තිබුණ ද, ඉස්ලාමය ගැන ඊර්ෂ්‍යා සහගත හැඟීමෙන් පසුවන ඇතැම්හු සැක සංකා හා ප්‍රශ්න ඉදිරිපත් කරති. ඒවායින් සමහරක් මෙසේ ය.
  - * සාක්ෂිකරුවන් වශයෙන් පිළිගැනීමෙහිලා සමානාත්මතාවක් නැත.
  - * පසු උරුමකම් බෙදීමේ දී වෙනස්කම් දැක්වීම
  - * නායකත්වයට අනුමැතිය නොදීම
  - * තලාක් (දික්කසාදය) කිරීමේ දී සමානාත්මතාව නැත

**සාක්ෂිකරුවන් වශයෙන් පිළිගැනීමෙහිලා සමානාත්මතාවයක් නැත.**

ණය ගනුදෙනු ලේඛනගත කිරීම සම්බන්ධයෙන් හා එහිලා අවංකව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් පහළ වී ඇති පාඨයෙහි , තවද ඔබ සාක්ෂිකරුවන් වශයෙන් පිළිගන්නා ඔබගේ පිරිමින්ගෙන් (සුදුසු වූ) දෙදෙනෙකු (ස්වර්ගයට) සාක්ෂිකරුවන් කරන්න. එසේ (සාක්ෂිකරුවන් විය යුතු දෙදෙනා පිරිමින්ගෙන් නොලැබුණහොත්, එක් පිරිමියෙකු හා ඔබ සාක්ෂිකරුවන් වශයෙන් පිළිගන්න. ස්ත්‍රීන් දෙදෙනෙකු උපකාරී විය යුතුය. මන්ද, ස්ත්‍රීහු බොහෝ විට ගනුදෙනු ගැන නොදන්නා නිසා ඒ දෙදෙනාගෙන් එකියකට වැරදුනහොත්, අනෙක් ස්ත්‍රිය ඇයට එය සිහිපත් කිරීමට (මෙසේ කිරීම) (2:282)

- ස්ත්‍රීන් දෙදෙනෙකුගේ සාක්ෂිය එක් පිරිමියෙකුගේ සාක්ෂියට ඉස්ලාම් සමාන කර තිබේ. ඇත්තෙන්ම මෙම වෙනස්කම ස්ත්‍රියට හෝ ඇයගේ ගරුත්වයට අඩුවක් නොවේ. අනෙක් අතට ඇය වෙළෙඳ ගනුදෙනු සහ සිවිල් ගැටලු සම්බන්ධයෙන් පරිචයක් ලැබූවක නොවෙයි. එක් ස්ත්‍රියකට වැරදුණත්, අනෙක් ස්ත්‍රිය ඇයව (එය) සිහිපත් කරවනු පිණිස යැයි අල්කුර්ආනයෙන් පැවසෙන්නේ ඒ නිසා ය. බොහෝ නීති විශාරදයින් අපරාධ හා පළිගැනීම් යනාදී ක්‍රියාවල දී කාන්තාවන්ගේ සාක්ෂිය පිළිනොගන්නේ ඒ නිසා ය. මන්ද, මෙවැනි අවස්ථාවන කාන්තාවන් කොතැන සිටියත්, කාන්තා ස්වභාවය නිසා ම, ඒවා දෙස නෙත් හෙළන්නට මැලි වෙති. ඔවුන්ගේ ස්වභාවය වනුයේ විලාප නගමින් දිවීමයි. මෙවැනි සියුම් අවස්ථාවන් ගැන තේරුම් ගැනීමට හෝ විස්තර කිරීමට හෝ ඔවුහු අපොහොසත් වෙති. ඒ අතරතුරම, ස්ත්‍රී ස්වභාවය හා සම්බන්ධ කරුණුවල දී ඇය, තනිව සිටින අවස්ථාවලදී ද ඇගේ සාක්ෂිය ඉස්ලාමයෙන් පිළිගනු ලැබේ. කන්‍යාභාවය, දරු ප්‍රසූතිය, කිරි දීම හා වෙනත් ඇතැම් අවස්ථාවල එක් පිරිමියෙකුගේ සහ එක් ස්ත්‍රියකගේ සාක්ෂිය සමානකොට සලකනු ලැබේ. මෙය "ලිආන්" අවස්ථාවට නිදසුනක් වශයෙන් දැක්විය හැකි ය.

**පසු උරුමකම් බෙදීමේ දී වෙනස්කම්**

- පසු උරුමකම් බෙදීමේ දී පවා ස්ත්‍රීන් හා පුරුෂයන් අතර සමානාත්මතාව නොමැති බවට දොස් නඟන්නෝ සිටිති.

ඇත්තෙන් ම ඉස්ලාම් විසින් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වය වෙත පවරා තිබෙන ආර්ථික බර සහ ඒ වෙනුවට ලබා දී තිබෙන පසු උරුමකම්වල සාධාරණත්වය ගැන දැනුවත් විය යුතු ය. කාන්තාවන්ගේ පවුල් වගකීම්වලට ප්‍රමුඛතාව දෙමින් හරිහම්බ කිරීමේ වගකීම ඇයට පවරා නැත. එම වගකීම පැවරී තිබෙනුයේ පිරිමියා වෙත ය. ස්ත්‍රිය,මව, බිරිඳ, සහෝදරිය හා දියණිය යනාදී වශයෙන් ද මියගිය අයගෙන් පසු උරුමකම් ලබයි. පිරිමි අය පසු උරුමකම වැඩියෙන් ලැබීමට සාධාරණ හේතු රැසක් තිබේ. ඔහු පවුලේ ප්‍රධානියා ය. සියලුම වියහියදම් දැරිය යුත්තේ ඔහු ය. පිරිමින්ට මෙන් ගැහැණුන්ට කිසිම ආර්ථික වගකීමක් නැත. ඕ, බිරිඳක ව සිටී නම්, සැමියා, මවක ලෙස සිටී නම්, ඇගේ පුතුන්, දියණියක ලෙස සිටී නම් පියා යනාදී වශයෙන් බොහෝ දෙනා ඇයට සලකති. ඇය කවදත් අනුන් මත රැඳී සිටින්නියකි. ඒ අතරම ඇය සැමියාගේ මහර් වශයෙන් දේපළ ලබන අවස්ථා ද ඇත. ඇය පසු උරුමයෙන් කොටස් අඩු වශයෙන් ලැබූව ද මේවායින් ඒවා හිලවු වේ. මෙනයින් ඇය ලබන ආර්ථික සමානාත්මතාව විවිධ කෝණවලින් විස්තර කළ හැකි වේ.

**නායකත්වයට අනුමැතිය නොදීම**

- පුරුෂයන් ස්ත්‍රීන් කෙරෙහි පරිපාලකයෝ ය. (4:34) ස්ත්‍රීන් සම්බන්ධයෙන් පුරුෂයන්ගේ නායකත්වය යන්නෙහි අරුත, පිරිමියා ගැහැණියට වඩා උසස් ය යන්න නොවේ. නායකත්වය යනු වගකීමකි. පවුල් මට්ටමේ නායකත්වය වඩාත් උචිත වනුයේ පිරිමියාගේ ප්‍රධානත්වයයි. සිය වස්තුවෙන් වියහියදම් කරන බැවින් ද, පුරුෂයාගෙන් ස්ත්‍රීන් කෙරෙහි පරිපාලකයෝ වෙති. (4:34) නායකත්වය උදෙසා පිහිටා තිබෙන සුවිශේෂ ගුණාංග හේතුවෙන් ස්ත්‍රීන්ට වඩා පුරුෂයන් උසස් යැයි සඳහන් කෙරේ. දරුවාට සාත්තු කිරීම ගැන සැලකීමේ දී එහිලා පුරුෂයාට වඩා ස්ත්‍රිය උසස් වේ.

- අල්ලාහ් පිරිමින්ට, ඔවුන්ගේ කාර්යය ඉටු කිරීමේ සුදුසුකම් හා ගුණාංගයන් පිරිනමා, එහිලා ගැහැණුන්ට වඩා පිරිමින් උසස් කොට තිබේ. ගැහැණුන්හට ඔවුන්ගේ කාර්යය ඉටු කිරීමට ඉවහල්වන සුවිශේෂ ගුණාංග පිරිනමා එහිලා ඔවුන් පිරිමින්ට වඩා උසස් කොට තිබේ.

- පුරුෂ නායකත්ව වගකීම යනුවෙන් මෙහිලා පවුල් පරිපාලනයට ප්‍රමුඛතාව සලස්වයි. ස්ත්‍රියක ඉස්ලාමීය හරයන් රැකගෙන, සමාජ ජීවිතයේ පාසල්වල, විශ්ව විද්‍යාලවල හා ආයතනවල ප්‍රධානත්වය දැරීම ඉස්ලාම් කිසිවිටෙක ප්‍රතික්ෂේප කොට නැත. ඇය, නඩුකාරියක, ඇමතිනියක හා නිරීක්ෂිකාවක වශයෙන් කටයුතු කළ හැකි බවට ඉස්ලාමීය සාක්ෂි දක්නට තිබේ. එනමුත්, ඇය සෑම තත්ත්වයකදී ම ඇයට නියමිත ෂරීඅත් සීමාවන් රැකගනිමින්, සිය පවුල වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් කොටස නිසි ලෙස ඉටු කරනු පිණිස, තනතුරු හා සේවාවන් බාධකයක් නොවන පරිදිදෙන් ප්‍රවේශම් විය යුතු වේ.

තලාක් (දික්කසාද) කිරීමෙහි සමානාත්මතාව නොමැතිවීම

- තලාක් කිරීම සම්බන්ධයෙන් ඉස්ලාම් පුරුෂ පක්ෂයට ප්‍රමුඛතාව සලසා ඇත. පවුලේ ප්‍රධානියා ඔහු ය. පවුල් ජීවිතයේ යථාර්ථවාදී අරමුණු ඉටු කර ගත නොහෙන කල, නොවැලැක්විය හැකි කරුණක් වශයෙනි, ඉස්ලාමය තලාකය අනුමත කරනුයේ. පිරිමියෙක් මහර් දී ආවාහ වෙයි. පවුල් ආයතනය හසුරුවයි. එවැන්නෙකු, තමා ගොඩනැගූ ආයතනය සුණු විසුණු කිරීමට ඉදිරිපත් වේ ද ? ඔහු නිගමනවලට එළැඹෙනුයේ ගැඹුරින් සිතා බැලීමෙන් පසුව ය. එහෙත් කාන්තාව, හැඟීම්වලට වහල් වී, සිතාමතා නොබලා ඉක්මන් නිගමනවලට එළැඹෙන්නියකි. මේ නිසා බොහෝ විට වැරදි තීරණවලට එළැඹීමේ අවස්ථා එමට ය.

- තලාක් විෂයයෙහිපුරුෂයාට වැඩි බලතල දීමට මෙය හේතුවක් වන්නට පුළුවන. ඒ අතරම, දික්කසාද විෂයයෙහි විවාහ බන්ධනයෙන් මිදී වෙන්වීමේ නිදහස ඉස්ලාම් ස්ත්‍රීන්ට ද දීමට පසුබට වී නැත.

- එම නිසා තලාක් අයිතිය සපුරා ස්ත්‍රියට පමණක් නොදී තිබුණා නම් පමණක් එය පක්ෂපාතීත්වයක්, වෙනස්කමකැයි කිව හැකි ය. එහෙත් එසේ නොව, ඇයට එහිලා අයිතිවාසිකම් ලබා දී, ඉස්ලාම් ඇයට ගරු කොට ඇත.

- ඉස්ලාම් සෑම අතින් ම කාන්තාවන්ට නම්බුකාර ලෙස සලකමින් අයිතිවාසිකම් ලබා දී, සමාජය තුළ ඔවුන් ගරුත්වයට පත්කොට ඇති බවය, සත්‍යය වන්නේ. එහෙත් ඉස්ලාම් ගැන ඊර්ෂ්‍යා කරන ඇතැමුන්, අන්ධයන් විලසින් කැර තිබෙන විවේචන කොතරම් ප්‍රචාරණයක් තිබුණ ද, ඒ සඳහා වන පිළිතුර මෙම දිව්‍යමය ආගමෙහි ඇති බව සැබෑවකි.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

පියවර 1 : බහු භාර්යා විවාහය, කාන්තාවන්ගේ තත්ත්වය ගැන සිසුන් සමඟ සාකච්ඡා කොට බුද්ධි කලම්බනයක් ඇති කරන්න.

පියවර 2 : සිසුන් කණ්ඩායම් හතරකට බෙදා, පහත සඳහන් මාතෘකාවලින් එකිනෙක එක් එක් කණ්ඩායමකට දෙමින් ඒ සම්බන්ධයෙන් ඇති වූ විවේචන සහ ඒවාට පිළිතුරු ද සොයන්නට මඟ පෙන්වන්න.

කණ්ඩායම 1 - බහු භාර්යා විවාහය

කණ්ඩායම 2 - කාන්තාවන්ගේ තත්ත්වය

කණ්ඩායම 3 - අපරාධ සහ දඬුවම්

කණ්ඩායම 4 - ජිහාද්

පියවර 3 : එක් එක් කණ්ඩායම් විසින් රැස්කරන ලද කරුණු ඔවුනොවුන් සාකච්ඡා කොට හුවමාරු කර ගැනීමට අවස්ථාව සලසන්න.

පියවර 4 : එක් එක් කණ්ඩායම් තමන් රැස්කළ කරුණු වචන 750 - 1000 කට සීමා වූ වාර්තාවක් වශයෙන් සකස් කර, සම්මන්ත්‍රණයක් සූදානම් කොට එහි දී ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


* අබ්දුල් අන්ති හමූදා, ඉස්ලාම් උංගල් පාර්වයිකු (1985), I.I.F.S.O., කුවයිට්.

* අබ්දුල් බාරි එම්. එස්. , ජිහාදින් යථාර්ථ කාලය, ඉස්ලාමීය සින්තනයි, (28:1,2,3) නලීමියියා ප්‍රකාශන ආයතනය, බේරුවල

* මසාහිර් එස්. එම්. එම්., ඉස්ලාමීය කන්නෝට්ටත්තිල් පොරුම් සමාදානවුම්, ඉස්ලාමීය සින්තනයි (15:4) නලීමියියා ප්‍රකාශන ආයතනය, බේරුවල.

* කර්ළාවි යූසුෆ්,(1985) ෆයිසල් මවුලවි, දෑවා පනියිල් පෙන්ගල් , දාරුල් අර්කම් ප්‍රකාශනය.

* මුහම්මද් කුතුබ් (1978), වෙයමුම් තෙලිවුම් , කොළඹ 9, ඉස්ලාමීය පබ්ලිකේෂන් සෙන්ටර්.

* සායික් (1973), ඉස්ලාම් ඕර් අරිමුහම් , කොළඹඉලංකයි ඉස්ලාමිය යෝදනා කලහම් ලිමිටඩ්,

* අක්රම් මුහම්මද් (2003), නඩයිමුරයික්කේට්ර ඉස්ලාම්, පස්යාල මුසල්මාන් ප්‍රකාශනය.

* කර්ලාවි යූසුෆ් 61997), කාලය මුස්ලිම් කාන්තාව, බේරුවල අල්කලම් මුද්‍රණාලය

* ජෛඅල් ආබ්දීන් (1993), ඉස්ලාම් කුට්රච්චාට්රුම් පතිල්කලුම්, චෙන්නයි ඉස්ලාමීය අධ්‍යාපන ප්‍රකාශන ආයතනය.

* ෆාතිමා ජහූෆා (2000), ඉස්ලාත්තිල් පෙන්නුර්මයි, චෙන්නයි මුනීජා ප්‍රකාශනය

* මන්සූර් එස්. එම්. (1999), උංගල් ඉතයන්තුඩන් ඉස්ලාම් පෙසුගිර්තු, මාදම්පෙ නොලේජ් ප්‍රකාශනය

**නිපුණතාව 10.0 : සදාචාරය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිය වටහාගෙන එහි වැදගත්කම හා එය සංවර්ධනය කරන ආකාරය දැන පිළිපදියි.**

**නිපුණතා මට්ටම 10.1 :** සදාචාරය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිය වටහාගෙන ක්‍රියාත්මක කරයි

**කාලය :** කාල පරිච්ඡේද 30

**ඉගෙනුම් ඵල :**
- ඉස්ලාම් සදාචාරයට දක්වන වැදගත්කම දැන තමා තුළ සදාචාරය ඇති කර ගන්නා ගතිපැවතුමත් ආදර්ශයත් ඇති කර ගනී.
- සදාචාරය පිළිපැද තමන් වෙත අධ්‍යාත්මීය ක්‍රියාකාරකම් වර්ධනය කර ගනී.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

**සදාචාරය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිය**

- ඉස්ලාමීය ෂරීඅත් මූලාශ්‍රවල හුලුක් හසන්, අහ්ලාක් හසන් යන පද යහපත් ගතිගුණ, සදාචාර, සාරධර්ම, යහපත් හැසිරීම් යනාදිය දැක්වීම සඳහා භාවිත කර ඇත. මේවා දැක්වීමට මකාරිමුල් අහ්ලාක් යන පදයත්, හදීසයේ භාවිත කර ඇත. ආදබ්, අදාබ් යන පද පොදුවේ ක්‍රියාවන්වල අනුපිළිවෙළ විස්තර කරයි.
- අල්ලාහ් සහ ඔහුගේ රසූල්වරයා මුස්ලිම්වරුන් වෙත දක්නට තිබිය යුතු ගුණාංග හා නොතිබිය යුතු ගුණාංග දක්වා ඇත. මිනිසාගේ මනෝ ඉච්ඡාව හා සමාජ පරිසරය පවසන සියලු දේවල් ඉස්ලාමීය සදාචාරයන් ලෙස සැලකිය නොහැක.
- සදාචාරත්වයෙන් ජීවත් වීම මෙලොවෙහි දී පමණක් නොව පරලොවේදී ද, ප්‍රයෝජනවත් වන දෙයකි. කියාමත් දිනයේ මුස්ලිම් කෙනෙකුගේ තරාදියේ යහපත් ගතිගුණට වඩා වැඩි බරැති වෙන කිසිම දෙයක් තිබෙන්නේ නැත. (තිර්මිදි, ඉබ්නු මාජා)
- අනෙක් සත්ක්‍රියා මෙන් ම යහගුණ හා සම්බන්ධ ක්‍රියාකාරකම් අල්ලාහ් වෙත පිළිගනු ලැබීමට ඉහ්ලාස් යන පිවිතුරු චේතනාව අවශ්‍ය වේ.
- ඉස්ලාම් මූලිකාවබෝධයෙන් අකායිද්, ඉබාදත්, මුආමලාත්, මුනාකආත්, ජිනායාත් යනාදී ප්‍රධාන කොටස්වලට වෙන්කර අධ්‍යයනය කරනවා සේ, අහ්ලාකියාත් සදාචාරය ද එහි අඩංගුය. එය එක් තනි කොටසක් ලෙස සැලකෙනවා සේ අනෙක් සියලු කොටස් සමඟ ද එය මිශ්‍ර වී තිබීම දැකිය හැකි ය.
- ඉස්ලාම් යහගුණයන් උසස් ඉබාදතයක් ලෙස සලකයි. කුසල් යන්නම යහ ගතිගුණයන් ය. (මුස්ලිම්)

ජීවිතයේ දී සදාචාරයේ වැදගත්කම.

- සදාචාරය යනු නබිවරුන්ගේ යහ ගැත්තන්ගේ විශේෂයෙන් මුහම්මද් (සල්) තුමාගේ ලක්ෂණයන් ය. එය පිළිගෙන ක්‍රියාත්මක කිරීම නබි (සල්) තුමා මුළුමනින් ම පිළිපැදීම වේ.

  නබිවරයාණෙනි, නියත වශයෙන් ම ඔබ උසස් ගතිගුණ ඇත්තෙකුව සිටින්නේ ය. (68:4)

- මුස්ලිම්වරුන්ගෙන් ශ්‍රේෂ්ට වන්නේ යහ ගතිගුණ ඇත්තා ය යනුවෙන් හදීස් අවධාරණය කර දන්වා සිටී.

  ඔබලාගෙන් ශ්‍රේෂ්ට වන්නේ ඔබලා අතුරෙන් ශ්‍රේෂ්ට යහ ගතිගුණ ඇත්තා ය. (බුහාරි)

- මූලික නැමදුම් පිළිවෙත් අනිවාර්ය කරන ලද ප්‍රධාන අරමුණුවලින් එකක් වන්නේ යහ ගතිගුණ ඇති කිරීමයි.

- සලාතය දුර්ගුණයන් නැති කර, යහ ගතිගුණයන් වර්ධනය කළ යුතුය.

  සලාතය පිහිටුවන්න. නියත වශයෙන් ම සලාතය නින්දිත සහ පිළිකුල් සහගත දේවල්වලින් ආරක්ෂා කරයි. (29:45)

  සදාචාර ගුණාංගයන්ගෙන් තොර සලාත් කරන්නාට නිරය තිබෙන බව සූරතුල් මාඌන් විස්තර කරයි.

- සකාත් මානසිකව, භෞතිකව, සමාජයීයව සදාචාර වර්ධනය අරමුණු කරගත් ඉබාදතයකි.

- ඔවුන්ගේ ධනයෙන් ඔබ සකාතය ගෙන, ඔවුන්ව පවිත්‍ර කර. පාරිශුද්ධ කරන්න. (9 : 103)

- සදකා (දන්දීම) යන විෂය නබි (සල්) තුමා යහපත් ගතිගුණවලටත් යොදා ගෙන ඇත.

  * ඔබේ සහෝදරයාගේ මුහුණ බලා සිනාසීම ඔබට සදකාවකි. (බුහාරි)

  * අතරමං වී අසරණ ව සිටින කෙනෙකුට මග පෙන්වීම ඔබට දානයකි. (බුහාරි)

  * මාර්ගයෙන් හානි කරන දේවල්, කටු, ඇටකටු, යනාදිය ඉවත් කිරීමත් ඔබට දානයකි. (බුහාරි) යනාදිය.

- සව්මය ආධ්‍යාත්මික හැකියාව හා යහපත් ගතිගුණ බිහි කරයි.

  විශ්වාසවන්තයිනි, ඔබලාට පෙර සිටි අයට අනිවාර්ය කළාක් මෙන් ඔබටත් සව්ම් රැකීම අනිවාර්ය කර ඇත. එමගින් ඔබලා පරිශුද්ධවන්තයින් විය හැක. (2: 183)

- බොරු දෙඩීමත්, ඒ අනුව ක්‍රියාකිරීමත් කවුරු අත්නොහරින්නේ ද ඔහු තම ආහාර හා පානයන්ගෙන් වැළකීමෙන් අල්ලාහ්ට කිසිදු අවශ්‍යතාවයක් නොමැත. (බුහාරි)

- හජ් යහගුණයන් වර්ධනය කරන ක්‍රියාකාරී ස්ථානයකි.

  හජ්හි දී සංසර්ගය, පරුෂ වචන භාවිතය, සණ්ඩු සරුවල් ඇති කර ගැනීම නොකළ යුතුය. (2 : 197)

- සදාචාර ගුණයන් ඊමානය හා බැඳුණු අංගයකි. සදාචාරයේ දුර්වලව සිටීම ඊමානයේ දුර්වලතාවය අවධාරණය කරයි.

  විශ්වාසවන්තයිනි, ඔබ අල්ලාහ්ට බියවන්න. සත්‍ය කතා කරන්නන් සමඟ එක්ව සිටින්න. (9:119)

- කවුරු අල්ලාහ් හා කියාමත් දිනය ඊමාන් කර තිබෙන්නේ ද ඔහු යහපත් දේවල්ම කතා කරත්වා. නැත්නම් නිහඬව සිටිත්වා (බුහාරි)

- යහපත් සදාචාරයේ වැඩිවීම ඊමානය වර්ධනය කරයි.

  නියත වශයෙන් ම මුඃමින්වරු අතුරෙන් පරිපූර්ණ ඊමානය ඇත්තා ඉතා යහපත් සදාචාරය ඇත්තාය. (තිර්මිදි)

- අයහපත් ගුණාංග ඊමානයට බලපෑම් එල්ල කරයි.

අල්ලාහ් මත දිවුරා පවසමි. ඔහු ඊමාන් කළ කෙනෙකු නොවේ. යනුවෙන් තුන් වතාවක් නබි (සල්) තුමා පැවසූ විට ඔහු කවුරුද රසූලුල්ලාහ් යනුවෙන් අසනු ලැබිණි. එයට එතුමා කාගේ හානියෙන් ඔහුගේ අසල්වැසියා රකිනු නොලැබුවේ ද, ඔහුය ඒ යනුවෙන් පැවසූහ. (බුහාරි)

- මුනාෆික්ගේ (වංචනිකයා ගේ) ලක්ෂණත්, අයහපත් සදාචාරයන් ය.

ලක්ෂණ තුනක් කවුරුන් වෙත දක්නට තිබෙන්නේ ද ඔහු මුනාෆික් ය. ඔහු සව්මි රැක, සලාතය කර, හජ් ඉටුකර, උම්රා ඉටුකර, තමාව මුස්ලිම් කෙනෙකු ලෙස පවසා ගත්තත්, එය එලෙසමය. ඔහු කතා කළොත් බොරු කියයි. පොරොන්දු වූ විට එයට පටහැනිව ක්‍රියා කරයි. විශ්වාස කළ විට ද්‍රෝහි වෙයි. (මුස්ලිම්)

- යහපත් ගුණාංග මගින් මුහම්මද් (සල්) තුමාගේ ආදරය ලැබීමටත්. පරලොවේ දී එතුමා සමඟ සමීපව සිටීමටත් මග පාදයි.

මට ඉතාමත් කැමති, පරලොවේ දී මට ඉතාම සමීපව සිටින්නා ගැන මම ඔබලාට දැනුම් දෙන්න ද ? යනුවෙන් (දෙවරක් හෝ තෙවරක්) නබි (සල්) තුමා ඇසූහ. එයට සහාබාවරු ඔව් අල්ලාහ්ගේ දූතයාණෙනි, යැයි පැවසූහ. එයට එතුමා ඔබලාගෙන් ඉතා උසස් ගතිගුණ ඇත්තා යැයි පැවසූහ. (අහ්මද්)

ආධ්‍යාත්මික වර්ධනය හා සදාචාරය

- මිනිසා කය, ඥානය, ආත්මය යන ප්‍රධාන අංග තුනෙන් සමන්විත කෙනෙකි. මේ තිනම එකවිට පෝෂණය කරන විටයි නිසි ඉස්ලාමීය ජීවිතය ඇතිවන්නේ.

- අධ්‍යාත්මික ජීවිතය හා සදාචාරය අතර ඉතා සමීප සම්බන්ධතාවයක් පවතී. මානසික සදාචාරය යනුවෙන් එක් තනි අංගයක්ම තිබේ. ඒ අනුව ඒවා කොටස් දෙකකට බෙදේ.

  1. අධ්‍යාත්මය පවිත්‍ර කරන, පුළුල් කරන සදාචාරයන්

     තක්වා, ඉහ්ලාස් (චිත්ත පාරිශුද්ධතාව), කුෂුඃ (බිය බැතිය), කුලූඃ (යටහත් බව), වරඃ (පරිස්සම), යහපත් සිතුම්, තැන්පත් බව, ආදරය, කරුණාව, සමාව දීමේ ගුණය, ඉවසීම යනාදිය ආධ්‍යාත්මික සදාචාරයන් ය

     * දේව බිය බැතිය (තක්වා)

       අල්ලාහ් පැනවූ දේවල් පිළිගෙන, ඔහු වැළැක්වූ දේවල්වලින් වැළකී ක්‍රියා කිරීම මගින් මෙලොවේ දී හා පරලොවේ දී අල්ලාහ්ගේ වේදනාවෙන් අප ආරක්ෂා කර ගැනීම තක්වා ලෙස හඳුන්වන්නෙමු.

     * අල්කුර්ආනය හා අල්හදීස් නොයෙක් තැන්වල දේව බිය බැතිය ගැන බලකර සිටී.

       විශ්වාසවන්තයිනි, අල්ලාහ්ව සත්‍ය ආකාරයෙන් ම බියවන්න. ඔබ මුස්ලිම්වරු ලෙස හැර නොමැරෙන්න. (3 : 102)

       අධික වශයෙන් ස්වර්ගයට පිවිසීමට සලස්වන්නේ කුමක් දැයි නබි (සල්) තුමාගෙන් විමසන ලදී. එයට එතුමා දේව බිය හා යහපත් ගුණාංග යැයි පිළිතුරු දුන්හ. (තිර්මිදි)

බොහෝ යහ ගුණාංගයන්ගේ මුදුන් මුලක් ලෙස තක්වාව අල්කුර්ආන් හඳුන්වා දෙයි.

ඔබ සාධාරණව ක්‍රියා කරන්න. එය දේව බියට ඉතා සමීප ය. (5:80)

ඔබ සමාව දීම තක්වාවට ඉතා සමීප ය (2 :237)

තක්වා මගින් ඇතිවන ඵල

i. අල්ලාහ්ගේ ආදරයට ලක් වූවන් බවට පත්වීම.

"දැනගන්න. නියත වශයෙන් ම අල්ලාහ්ගේ ආදරයට පාත්‍ර වූවන්ට කිසිදු බියක් නොමැත. ඔවුන් දුක්වන්නේ ද නැත. ඔවුන් කෙසේ අයද යත් ඊමාන් කර, දේව බිය ඇත්තවුන් ලෙසත් සිටිති." (10: 62, 63)

ii. පරලොවේ දී ලැබෙන අධික ආනිසංස හා සුඛෝපභෝගීත්වය

දේව බියෙන් ක්‍රියා කරන්නන්ට ඔවුන්ගේ රක්ෂිතයා වෙත ස්වර්ගයන් ඇත. ඒවාට යටින් ගංගාවක් ගලමින් පවතී. (3: 15)

iii. අල්ලාහ්ගේ වරප්‍රසාදය (රහ්මතය) ලබා ගැනීම.

මාගේ වරප්‍රසාද සියලු වස්තූන් තුළම අඩංගු වී තිබේ. එබැවින් එයට (මට) බිය වී, සකාතයන් දෙන්නෝ ද, ඔවුන්ටත් . . . (7 : 156)

iv. ගැටලුවලට විසඳුම් හා කරදරවලින් සැනසීම

කවුරු අල්ලාහ්ට බියෙන් ක්‍රියා කරන්නේ ද, ඔහුට පිටවන මග ඔහු ඇති කරයි. තවද ඔහු නොසිතන අයුරින් ඔහුට ජීවන පහසුකම් සලසා දෙයි. (65:2-3)

v. උදව් හා බලය

නියත වශයෙන් ම මෙම පොළොව අල්ලාහ්ට අයත් ය. එය ඔහුගේ ගැත්තන්ගෙන් තමා කැමති අයට උරුම කර දෙයි. (යහපත්) අවසානය තක්වා ඇත්තන්ට ය. (7: 128)

vi. සාමාන්‍යයෙන් තක්වා ඇත්තන්ගේ පුද්ගලික, පවුල්, සමාජමය ජීවිත නිසි අයුරින් හා සැනසීමෙන් පිරී පවතී.

2. සත්‍ය කතා කිරීම (සිද්ක්)

* සත්‍ය කතා කරන්නාක් මෙන් සමාජයේ ස්ථිරභාවයත්, ස්ථාවරභාවයත් ඇති කරන වෙනත් කිසිම ගුණාංගයක් නැත. එම නිසා තමා මෙම සත්‍ය කතා කිරීම යහ ගුණය සමාජයන් ගොඩනංවන මූලික යහගුණයන් ලෙස සලකනු ලබන්නේ.

* අල්කුර්ආනය හා අල් හදීස් විවිධ තැන්වල සත්‍ය කතා කිරීම පිළිබඳව පවසා සිටින අතර, බොරු දෙසීමත් වළක්වා ඇත.

විශ්වාසවන්තයිනි, අල්ලාහ්ට බියවන්න. යහපත් (සත්‍ය) කතාම කතා කරන්න. (33:70)

* ඔබ සත්‍යය පිළිපදින්න. නියත වශයෙන් ම සත්‍යය යහපත කරා රැගෙන යයි. යහපත ස්වර්ගය කරා රැගෙන යයි. මිනිසෙක් අඛණ්ඩව සත්‍යය කතා කර, එය ඔහු රක්ෂා කර

සිටියහොත් අල්ලාහ් වෙත ඔහු සත්‍යවන්තයෙක් ලෙස ලියනු ලබයි. මම ඔබලාට බොරුව ගැන අවවාද කරන්නෙමි. නියත වශයෙන් ම බොරුව පව කෙරෙහි රැගෙන යයි. පාපය නිරය කෙරෙහි රැගෙන යයි. මිනිසා අඛණ්ඩව බොරු නොදොඩා එහිම රැඳී සිටියා නම් අල්ලාහ් වෙත ඔහු බොරුකාරයෙක් ලෙස ලියනු ලබයි. (මුස්ලිම්)

* අමානතය ආරක්ෂා කිරීම, පොරොන්දු ඉටු කිරීම, සත්‍යයට ක්‍රියා රූපයක් ලබාදෙන ඒවා ය. සත්‍යයත් ආරක්ෂකයන්, ජනතාව විසින් ප්‍රිය කරනු ලබති. වස්තූන්වලට භාරකරුවන් ලෙස ක්‍රියා කරති. ඔවුනගේ සාක්ෂීන් පිළිගනු ලැබේ. ඔවුන්ගෙ අදහස්වලට ගරු කරනු ලැබේ. පරලොවේ දී ඔවුන්ට යහපත් ප්‍රයෝජන තිබේ. මීට විරුද්ධව බොරුකාරයන් ව ජනතාව ප්‍රිය කරන්නේ නැත. ඔවුන්ව විශ්වාස කරන්නේ ද නැත. ඔවුන්ගේ සාක්ෂීන් පිළිගැනෙන්නේ ද නැත. පරලොවේ දී දඬුවම් හා වේදනාවන් ඔවුන්ට තිබේ.

2. ඉවසීම (සබ්ර්)

* ඉවසීම ඉතා ශ්‍රේෂ්ට ගුණයකි. අල්කුර්ආන් ආසන්න වශයෙන් ස්ථාන 70 ක මේ පිළිබඳ ව පවසා ඇත.

  ඉවසිලිවන්තයන් තමන්ගේ කුලිය නොඅඩුව සම්පූර්ණයෙන් ලබාගනිති. (39: 10)

  ඔවුන් ඉවසීමෙන් සිටීමේ හේතුවෙන් ස්වර්ගය හා (ඇඳීමට) සේද ඇඳුම් ඔහු යහපත් කුලිය ලෙස ලබා දෙයි. (86:12, 32 : 23. 3: 186, 2:249, 16:126, 2:155-157)

  ඉවසීම පිළිවෙලක් කරගන්නාට අල්ලාහ් ඉවසීම ලබා දෙයි. තවද ඉවසීම ලද අයට වඩා ශ්‍රේෂ්ට සම්මානයක් ලද වෙන කවුරුන් හෝ නැත. (බුහාරි)

* ඉවසීම විවිධාකාරයෙන් පවතී.

  (අ) යටහත් වීමෙන් පෙන්නුම් කරන ඉවසීම

  මෙය අණ කර තිබෙන සලාතය වැනි මූලික වගකීම් ඉටු කිරීමේ දී පෙන්නුම් කරනා ඉවසීමයි. ඒවා මිනිසා ජීවිත කාලය පුරා අඛණ්ඩව ඉෂ්ට කිරීමට ඉවසීම අවශ්‍ය වේ.

  (ආ) පවුවලින් ආරක්ෂා කරගන්නා ඉවසීම. පවු නොකර තමාව ආරක්ෂා කර ගැනීමත්, පවුවලින් බේරී සිටීමත්, ඉවසීම වේ. පවු හා අපරාධ අලංකාරවත් ය. ඒවා පහසුවෙන් මිනිසා අගාධයකට ඇද දමයි.

  (ඉ) දුක් හා කරදර පීඩා ඇති කරන විට ඇතිවන ඉවසීම. ප්‍රාණය, වස්තූන්, පවුල, තත්ත්වය යනාදියෙහි ඇතිවන හානිවලදී මුස්ලිම් ඉවසීමෙන් ක්‍රියා කරයි. මෙම තත්ත්වය මූ:මින්වරයෙකුට විශාල යහපතක් ම සලසයි. යම් ප්‍රමාණයක බියකින් හා කුසගින්නෙන් වස්තූන්, ජීවිත වගාවන් යනාදියෙහි හානිවලින් අපි ඔබ පරීක්ෂා කරන්නෙමු. එනමුත් (නබිවරයාණෙනි) මෙම පරීක්ෂණවලින් ඇතිවන දුක දරාගන්නා අයට ඔබ ශුභාරංචි පවසන්න. (2 :155)

3. අමානතය (අමානත්)

* අමානතය රැකීම මුස්ලිම්වරයෙකුගේ ජීවිතයේ තිබිය යුතු එක් ප්‍රධාන ගුණාංගයකි. අමානත් යන පදය ඉතා පුළුල් අර්ථයකින් ඉස්ලාමීය ෂරීඅතය උපයෝගී කරයි.

  ඔබලාගෙන් එක් එක්කෙනා එක් භාරකරු ය. ඔබලා යටතේ සිටි අය පිළිබඳව ඔබ එක් එක්කෙනාගෙන් ප්‍රශ්න කරනු ලබයි. ඉමාම් (නායකයා) භාරකරුවෙකි. ඔහු ,ඔහු යටතේ සිටියවුන් පිළිබඳ ව විමසනු ලබයි. එක් එක් මිසිනා ඔහුගේ නිවසේ වාසය කරන්නන්ගේ භාරකරු ය. ඔහු ඔවුන් පිළිබඳ ව විමසනු ලබයි. බිරිඳක් තම සැමියාගේ නිවසේ භාරකාරියයි. ඇය ඒ පිළිබඳ ව විමසනු ලබයි. රැකියාවක් කරන්නා තම ස්වාමියාගේ වස්තූන්වල භාරකරු ය. ඔහු ඔහුගේ භාරකාරීත්වය පිළිබඳ ව ප්‍රශ්න කරනු ලබයි. (බුහාරි)

අමානතය රැකීම නොයෙක් ආකාරයෙන් සිදුවිය හැක.

(අ) තමා වෙත භාර කරන ලද වස්තූන්, ධනය වගකීමෙන් යුතුව ආරක්ෂා කිරීම

නබි (සල්) තුමා හිජ්රත් යාමට පෙර තමා වෙත භාරකරන ලද භාණ්ඩ නැවත භාරදීම සඳහා වන පිළියම් කිරීමෙන් අනතුරුව එතුමා හිජ්රත් ගියහ.

තමාව විශ්වාස කර භාරදුන් වස්තූන් ආරක්ෂා නොකරන කෙනා ඊමානය නැත්තෙකි. තමා දුන් පොරොන්දුව ආරක්ෂා නොකරන්නා ඉස්ලාමය ප්‍රතික්ෂේප කළ කෙනෙක් වන්නේ ය. (හදීස්)

(ආ) තමාට භාරකරන ලද තනතුර හා වගකීම නිසි ලෙස ඉටු කිරීම.

තනතුරු වගකීම ඉතා සුදුසු කෙනෙකු වෙත භාර කළ යුතුය. අබුදර් (රළි) තුමා තමාව කුමන හෝ ප්‍රදේශයකට ආණ්ඩුකාරවරයා ලෙස පත්කරන ලෙසට නබි (සල්) තුමාගෙන් ඉල්ලූ විට අබුදර්, ඔබ දුර්වල කෙනෙකි. අවසන් දිනයේ ගරුත්වය නැතිකර ගන්නා තත්ත්වයට හා ලැජ්ජා සහගත තත්ත්වයට මෙය රැගෙන යයි. එනමුත් මෙම වගකීම එහි සියලු බර සමගින් පිළිගෙන, පිළිගත් දේවල් නිම කරන්නන් බේරනු ලබති. යනුවෙන් නබි (සල්) තුමා පැවසූහ. (මුස්ලිම්)

වගකීම් නුසුදුසු අය වෙත භාරදෙන කාලයක් ඇති වූ විට අවසාන දිනය බලාපොරොත්තු වන්න. (බුහාරි)

(ඉ) ධනය හා දක්ෂතාවය නිසි අයුරින් යොදා ගැනීම

මිනිසාගේ භාරකාරීත්වය හා ආරක්ෂාව යටතේ භාරකරන ලද අමානත් වස්තූන් ලෙස ධනය හා දක්ෂතාවය දක්නට තිබේ. අල්ලාහ් මිනිසාට ඒවා ලබා දී ඇත. ඒවායේ භාවිතය පිළිබඳ ව අල්ලාහ් පරලොවෙහි දී විමසයි. ඒවා අල්ලාහ්ගේ තෘප්තිය අපේක්ෂා කර මුස්ලිම්වරයෙක් යොදා ගනියි.

(ඊ) රහස් ආරක්ෂා කිරීම

අන්‍යයන්ගේ රහස් ද, අපවෙත භාරකරන ලද එක් අමානතයකි. ඒවා හෙළි නොකර ආරක්ෂා කළ යුතු යැයි අපෙන් ඉල්ලා සිටියේ නම්, එය අප වෙත භාරකරන ලද අමානත් දෙයකි. (හදීස්)

සැමියා - බිරිඳගේ පෞද්ගලික ජීවිතයේ පාරිශුද්ධත්වය රැකීමේ අරමුණෙන් ලිංගික සම්බනධතාවයේ රහස් පිට අයට නොකියා ආරක්ෂා කිරීමත්, අමානතයක් ලෙස සැලකේ. අවසන් තීන්දු දෙන දිනයේ ඉතාමත් විශාල සූරාගෙන කන්නා ලෙස දෙවියන් ඉදිරියේ සිටින්නේ කවුරුන්දැයි ඔබ දන්නවා ද ? යැයි ඇසූ නබි (සල්) තුමා පහත සඳහන් අයුරින් පිළිතුරක් කීහ. කෙනෙක් තම බිරිඳට අධික වශයෙන් ආදරය කරයි. ඒ අයුරින්ම බිරියත් ඔහුට ආදරය කරයි. නමුත් ඔහු තම බිරිඳ පිළිබඳ රහස් අන් අයට කියයි. (මුස්ලිම්)

ඉහත සඳහන් කරන ලද ගුණාංගයන් මුස්ලිම්වරයෙක් වෙත දක්නට තිබිය යුතු වැදගත් ගුණාංගයන් ය. මෙවන් තවත් බොහෝ ගුණාංගයන් මුස්ලිම්වරයෙකුගේ ජීවිතයේ හොඳින් මිශ්‍ර වී ක්‍රියා කළ යුතු යැයි අල්කුර්ආනය හා හදීස් ඉල්ලා සිටී. මෙම ගුණාංග ක්‍රියාවේ නැංවෙන විට මුස්ලිම් සමාජයේ ජීවත්වන තනි පුද්ගලයා, පවුල්, පොදු ජනතාව නිසිමඟත්, ඉවසීමත්, පිළිවෙතත් ලබා ගනිති.

ආධ්‍යාත්මයට හා කරන අයහපත් සදාචාරයන්, ආරම්බරකම්, ඊර්ෂ්‍යාව, ගර්වය, අයහපත් චින්තන, නිෆාක්, රියාඃ, මනෝ ඉච්ඡාවට යටත් වීම, හදිසිය, කෝපය, කේන්තිය, ආත්මාර්තකාමීත්වය, වැන්න මුඃමින්වරයෙක් වළකා ගතයුතු අයහපත් ගුණාංගයන් ය.

* දර කැබැලි ගින්නෙන් දැවී යන්නා සේ යහපත් දේවල් ඊර්ෂ්‍යාව මගින් දැවී යයි. (අබූ දාවුද්)

* ආගම් ලද්දවුන් නබි (සල්) තුමාට විරුද්ධ වීමට හේතුව ඊර්ෂ්‍යාවයි. (2:119)

* ගැත්තන්ගේ සිතේ ඊමානය හා ඊර්ෂ්‍යාව එක්වන්නේ නැත. (හදීස්)

* ලැජ්ජාව හා ඊමානය එකිනෙක වෙන්කළ නොහැක්කකි. (හදීස්)

* විනාශ කරන දේවල් තුනකි. යටහත් වන මසුරුකම, පිළිපදින මනෝ ඉච්ඡාව, කෙනෙකු ස්ව ආඩම්බරකම. (තබරානි)

* නබි (සල්) තුමා සමඟ අවිනීතව ක්‍රියා කිරීම යහපත විනාශ කර දමයි. (49:2)

* හිත නොහොඳ දමින් සිටීම කුසල් විනාශ කරයි. (සඳුදා, බ්‍රහස්පතින්දා දිනවල අල්ලාහ්ගේ තීන්දුවකි මෙය)

මහා පාපයන්

උදාහරණ සමහරක් :

ෂිර්ක්, සාධාරණ හේතුවකින් තොරව සිදුකරන මිනීමැරුම්, හූනියම්, පොළිය, කැම, අනාථයන්ගේ වස්තූන් සූරාකෑම, මුඃමින්වන, අහිංසක පතිවත රකින කාන්තාවන්ට අවලාද නැගීම, යුධ පිටියේ දී පිටුපා දිවයෑම, දෙමාපියන්ට වදහිංසා කිරීම, නෑයන්ගේ සම්බන්ධතාවය නැතිකර ගැනීම, බොරු සාක්ෂි කීම, සලාතය සකාතය වැනි දේවල් අත්හැරීම, මත්පැන්, දුරාචාරය, සමලිංගික සේවනය, අල්ලස්, සියදිවි හානි කර ගැනීම් යනාදිය . . . (මුල් හත මුබිකාත් ලෙස හැඳින්වේ.)

බොරු කීම

(අ) වැරදි සිතුවිලි අත්හරින්න. මක්නිසා ද යත් වැරදි සිතුවිලි ඉතා විශාල බොරුකමට මග පාදයි. (බුහාරි)

සත්‍යය තෘප්තිය ගෙන දෙයි. බොරුව සැකයටත්, පවු කරවීමටත් මග පාදයි. (තිර්මිදි)

අල්ලාහ්ගේ දූතයාණන් බොරුව පිළිකුල් කළා සේ වෙන කිසිවක් පිළිකුල් කළේ නැත. මිනිසෙක් බොරු කීවේය යන පුවත එතුමාට ලැබුණොත් එම මිනිසා වරද තේරුම් ගෙන පවු සමාව අයැදියේය යව පුවත ලැබෙන තුරු එම මිනිසාගේ ගරුත්වය හා ගෞරවනීයත්වය සුළඟේ වීසිකර දමති නබි (සල්) තුමාණන්. (අහ්මද්)

මුඃමින්වරයෙකු වෙත සියලු අකුසල් තිබිය හැකිය. එහෙත් බොරුව නොතිබිය යුතු ය.

(ආ) මුස්ලිම්වරයෙකු සත්‍යය, අවංකබවට වැඩි වැදගත් කමක් දැක්විය යුතුය. බොරුව වැලැක්විය යුතුය. නබි (සල්) තුමා හා සහාබාවරුට බොරුව බෙහෙවින් පිළිකුල් කළහ. මෘමින්වරයෙකු වෙත නොතිබිය යුත්තකි බොරුව. දරුවන් හදාවඩා ගැනීමෙහි හා ගනුදෙනුවල දී සත්‍යවත් බව පිළිපැදිය යුතුය. බොරු කීමේ පුරුද්ද ........... ඇති කරයි. ඊමානය බෙලහීන කරයි.

ආඩම්බරකම

(අ) ආඩම්බරකම, ගරුත්වය යනාදිය මාගේ වස්තූන් ය. මේවායින් එකක් හෝ කෙනෙක් මගෙන් ලබා ගත්තේ ද ඔහු නිරයට යැවීමට සලස්වන්නෙමි. (මුස්ලිම්)

(ආ) මිනිසා තමාට ලැබෙන ධනයෙන්, තනතුරුවලින්, අධ්‍යාපනයෙන්, තනතුරුවලින් ලැබෙන තත්ත්වයෙන්, පාරම්පරික දේවල්වලින්, තම ක්‍රියාවන් මගින්, ලබා ඇති ශරීර අලංකාරයෙන් ආඩම්බර වන්නේ ය. මේවා සියල්ල මායාවන් ය. පරීක්ෂාව කුමක් දැයි මිනිස්සු වටහා නොගනී.

(ඉ) එමනිසා මිනිසා මෙහි දුප්පතෙක් - පොහොසතෙක්, බලවතෙක් - දුර්වලයෙක්, රෝගියෙක්- ආරෝග්‍යමතෙක්, බුද්ධිමතෙක්- මෝඩයෙක්, පාලනය කරන්නකු-යටහත් වන්නකු ලෙස සිටීම දෙවියන්ගෙන් ලැබෙන දේවල් ය. එම නිසා ඔහු තම උසස් තත්ත්වය සඳහා ආඩම්බර වීම හෝ අන් අය දෙස බලා විහිළු තහළු කිරීම හෝ නොකළ යුතු ය.

(ඊ) කාගේ සිතේ අල්ප මාත්‍රයක තරම් හෝ ආඩම්බරකම ඇත්තේ ද ඔහු ස්වර්ගයට යන්නේ නැත. (හදීස්)

(උ) අහස්වල දෙවියාත්, පොළොවේ දෙවියාත්, සියලු ලෝකවල දෙවියාත් වන අල්ලාහ්ටම සියලු ප්‍රශංසා හිමි වේ. අහස්වල හා පොළොවේ තිබෙන (සියලු) ආඩම්බරකම් ඔහුටම අයත් ය. ඔහුටයි (සියල්ලන්) අභියෝග හා ඥානය ඇත්තා වන්නේ ය. (45:36-37)

(ඌ) ආඩම්බරකම හා ප්‍රශංසාව දෙවියාට පමණක් අයත් දේවල් ය. ඒවා සරිලන්නේ ඔහුගේ ගුණාංගවලටයි. අල්ලාහ්ට අයත් මෙම ගුණාංග මිනිසා ලබා ගැනීමට තැත් කිරීම වැරදි ක්‍රියාවකි.

(එ) දෙවියන් ඉදිරියේ මිනිසා තමාව කොතරම් යටහත්භාවය ඇත්තෙකු ලෙස කරගත්තේ ද ඒ ප්‍රමාණයට මිනිසුන් අතරේ ඔහු උසස්කම හා ගරුත්වය ලබයි.

(ඒ) ආඩම්බරකම මිනිසාව පහත් කළ යුතු නැත. යටහත් භාවය උසස්කම හා ජයග්‍රහණය ලබාදිය හැක්කක් ය.

කේලාම් කීම

ඕපාදූප කතා කිරීම ගැන සඳහන් කරන තැනෙහිම කුර්ආන් කේලාම් කීම ගැනත් සඳහන් කර ඇත. මිනිසෙක් පැසු දෙයක් තවත් කෙනෙකුට එලෙසම කීම හෝ වෙනස් කර කීම. එමගින් හතුරුකම්, ක්‍රෝධකම් වර්ධනය වී සුහදකමට හානි කිරීමට තැත් කිරීම කේලාම් කීම වේ.

(නබිවරයාණෙනි, සෑමදෙයකටම) දිවුරන කිසිම නීචයෙකු ඔබ නොපිළිපදින්න. (ඔහු) සැමවිටම (ඕපදූප කතා කර) වැරදි කියා, කේළාම් කීමම වෘත්තියක් කර ගනිමින් සිටින්නාය. (68:10-11)

කේළාම් කියමින් සැරිසරන්නා ස්වර්ගයට ඇතුළුවන්නේ නැත. (බුහාරි)

නබි (සල්) තුමා කබ්රයක් පසුකරමින් ගමන් කරන විට මෙම කබ්රයේ සිටින්නා කේලාම් කීමේ හේතුවෙන් වේදනාවට ලක් වෙමින් සිටින්නේ ය යනුවෙන් පැවසූහ. (බුහාරි)

ඕපාදූප කතා කිරීම

(කවුරුන් හෝ වැරදි ගැන) ඔබ හාර හාර විපරම් කරමින් සිටින්න එපා. ඔබලාගෙන් කිසිවෙක් තවත් කෙනෙකු හා ඕපාදූප කතා නොකරන්න. (49:1)

ඕපාදූප කතා කිරීම යනු කුමක් දැයි ඔබ දන්නෙහි ද යනුවෙන් නබි (සල්) තුමා සහාබාවරුන්ගෙන් විමසූහ. එයට ඔවුන් අල්ලාහ් හා ඔහුගේ දූතයාම දනිති යැයි පිළිතුරු දුන්හ. ඔබේ සහෝදරයා පිළිකුල් කරන දෙයක් පිළිබඳව කතා කිරීම ඕපාදූප යි යනුවෙන් නබි (සල්) තුමා පැවසූහ. එසේ පවසන දෙය එම සහෝදරයා වෙත දක්නට තිබුණක් දැයි අසනු ලැබිණි. ඔබ ඔහු වෙත තිබෙන දෙයක් කීවොත් එය ඕපාදූපයයි. නැති දෙයක් කතා කළොත් වැරදි චෝදනා එල්ල කළේය යනුවෙන් නබි (සල්) තුමා පිළිතුරු දුන්හ. (මුස්ලිම්)

ඕපාදූප කතා කිරීම අන්‍යයන්ගේ ගරුත්වය, ලැජ්ජාව යනාදිය උදුරා ගනියි. ඕපාදූපයෙන් දිව ආරක්ෂා කරගත යුතුය. කතා කළහොත් යහපත් දේවල් කතා කළ යුතුය. නැත්නම් නිහඬව සිටිය යුතුය.

මිනිසෙක් අකැමැති ලෙසකට ඔහුගේ රූපය, ගුණාංග, පරම්පරාව ගැන කතා කිරීම ඕපදූප වේ. වරක් ආයිෂා (රළි) තුමිය සෆියියා (රළි) තුමියට කොට කෙනෙක් යැයි කතාකිරීම ඇසූ නබි (සල්) තුමා ආයිෂා තුමිය දෙස බලා ඔබ දැන් පැවසූ වචනය මුහුදු වතුරේ මිශ්‍ර කළහොත් එය පවා දූෂණය වී යැයි එය පවා නරක් වී යයි යනුවෙන් පැවසූහ. (අබූ දාවූද්)

ඔබලාගෙන් කවුරුන් හෝ තම සහෝදරයාගේ මාංශ අනුභව කිරීමට කැමැති වේ ද ? එය ඔබ පිළිකුල් කරන්නේ ය. (ඕපාදූප කතාකිරීමත් එසේමය) ඔබ අල්ලාහ්ට බියවන්න. (49:12)

අපවාද නැගීම

කවුරු පතිවත රකින ස්ත්‍රීන්ට අපවාද නගා (එයට අවශ්‍ය) සාක්ෂීන් හතරක් ගෙන නොආවේ නම්, ඔවුන්ට ඔබ කසපහර අසූවක් ගසන්න. පසුව එවැන්නවුන් කියන සාක්ෂීන් කිසිම කාලයක පිළිනොගන්න. නියත වශයෙන් ම ඔවුන් (සීමාව ඉක්මවූ) පවුකාරයන් ය.

අපවාද නැගීම මහා ශාපයකි. එයට කසපහර 80 ක් දෙන ලෙසට ඉස්ලාම් පවසයි. අපවාදය භයානක වරදක් නිසා ම එය දැඩි දඬුවම් පමුණුවා ඇත. අපවාද නැගූ කෙනාගේ සාක්ෂිය ඔහු මරණයට පත්වන තුරු පිළිගන්නේ නැත. ඔහු ෆාසික් (මහා පවුකළ නැතැන්තා) යැයි අල්කුර්ආනය පවසයි. කෙනෙක් දුරාචාරයේ යෙදෙනවා තවත් කෙනෙක් දුටු විට ඔහු ඒ පිළිබඳව තවත් අය සමඟ කතා කරමින් සිටීම නොකළ යුතුයි. නමුත් හතර දෙනෙක් එක්ව දැකීමට සිදුවූ විට ඍජුවම විනිශ්චයකාර තුමා වෙත ගොස් ඒ බව දන්වා දුරාචාර චෝදනාව ඔප්පු කළ හැකිය. අපවාදය සඳහා වන දඬුවම මෙතරම් දරුණු වීමට හේතුව ආත්ම ගරුත්වයට වඩා ලොවේ වෙනත් වටිනා දෙයක් නොමැති වීම නිසා ය.

- පොදුවේ සදාචාරාත්මකව ජීවත් වීමට ආධ්‍යාත්මය යහපත් කරයි. සත්‍යය කතා කර, අන් අය සමඟ ආදරයෙන් ඇසුරු කර, අනුන්ගේ යහපත ආරක්ෂා කරමින් ක්‍රියා කරන විට එය ආධ්‍යාත්මය වර්ධනය කිරීමට සලස්වයි.

- මූලික නැමදුම් වතාවත් ආධ්‍යාත්මික වර්ධනය මුල්කර ගත් ඒවා ය. ඉහ්ලාස් යන පිවිතුරු චේතනාවෙන් තොර කිසිම ඉබාදතයක් පිළිගැනෙන්නේ නැත. එම නිසා එය ප්‍රධාන ය.

- පොදුවේ අයහපත් ගුණාංග සමඟ ජීවත් වීම ආධ්‍යාත්මයට බලපෑම් කරයි. කේලාම් දොඩා, ඕපාදූප කතා කරමින් සිටින්නෙකුගේ ආධ්‍යාත්මය ඉතා දුර්වල එකක් වේ.

- ඉහත සඳහන් අදහස් නබි (සල්) තුමා ඉතා කෙටියෙන් පහත සඳහන් හදීසයන් සඳහන් කර ඇත.

  "කවුරු තම සිත පාරිශුද්ධ ඊමානයෙන්හා පවිත්‍රත්වයෙන් තම දිව සත්‍ය කතා කරන්නක් වශයෙන් ද, තම ආධ්‍යාත්මය සැනසීම ලද්දක් වශයෙන් ද, තම ගුණාංග නිසි අයුරින් සලසා ගත්තේ ද ජයග්‍රාහකයා ඔහු ය." (ඉබ්නු හිබ්බාන්)

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

පියවර I : සදාචාරය, අල් අක්ලාක් යන පදය ගැන සිසුන් වටහාගෙන ඇති කරුණු ගැන සාකච්ඡා කරන්න.

පියවර II : සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න. පහත මාතෘකා දී ඒ පිළිබඳ තොරතුරු රැස්කිරීමට සලස්වන්න.

* සදාචාරය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිය
* ඉස්ලාම් සදාචාරාත්මක ජීවිතයට දී ඇති වැදගත්කම
* මුස්ලිම් සතුවිය යුතු සදාචාරාත්මක ගුණ
* අධ්‍යාත්මික සංවර්ධනය සඳහා වන ඉස්ලාමීය මගපෙන්වීම්

පියවර III: එක් එක් කණ්ඩායම රැස්කළ කරුණු ඉදිරිපත් කරමින් අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර IV: අදහස් හුවමාරුවේ සාරාංශයක් ලියා ගැනීමට සැමදෙනාම පොළඹවන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


* මුහම්මද් අල් ගස්සාලි (2004), ඉස්ලාමීය ඔලුක්ක මාන්පුහල්, චෙන්නයි ඉලක්කියසෝලයි වෙලියීඩු
* අහාර් මුහම්මද් ඒ. සී. (1991), නබිවලි I, II බේරුවල අල්කලම් මුද්‍රණාලය
* ගස්සාලි ඉමාම් (1986), තනතුරු තන්හාව, චෙන්නයි යුනිවර්සල් පබ්ලිෂර්ස්
* අක්රම් මුහම්මද් (2004), ආත්මීහ වාල්වු ෆෝදනයි ගලුම් මුරයිමයි හලුම්, පස්යාල මුසල්මාන් මුද්‍රණාලය
* සුක්රි එම්. අයි. එම්. (1999), ඉස්ලාමීය වාල්වියල් කෝට්පාඩුගල්, බේරුවල නලීමියා ඉස්ලාමීය ප්‍රකාශන මධ්‍යස්ථානය
* ඉස්මායිල් එස්. එච්. එම්. (2000), ඉස්ලාමීය සදාචාරයන්, කුරුණෑගල අයි.අ.සු.මු.

**නිපුණතාව 10.0 : සදාචාරය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිය වටහාගෙන එහි වැදගත්කම හා එය සංවර්ධනය කරන ආකාරය දැන පිළිපදියි.**

**නිපුණතා මට්ටම 10.2 :** ඉස්ලාම් පවසන සදාචාරය පිළිබඳ උපදෙස් හා ක්‍රියාමාර්ග යොදා ගනිමින් ඉස්ලාමීය සදාචාරය අනුගමනය කරයි.

**කාලය :** කාල පරිච්ඡේද 30

**ඉගෙනුම් ඵල :**

- සදාචාරය වර්ධනය කර ගැනීමට අදාළ ඉගැන්වීම් අවබෝධ කරගෙන ජීවිතයේ ඒවා පිළිපදියි.
- පුද්ගලික ජීවිතයේ හා පවුල් ජීවිතයේ පිළිපැදිය හැකි සදාචාරය දැනගෙන ඒවා අනුගමනය කරන අතර අන් අයව ද එය පිළිපැදීමට පොළඹවයි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

**සදාචාරය වර්ධනය කිරීම සඳහා වන උපදෙස් හා ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාමාර්ග**

- ඉස්ලාම්, එහි සිද්ධාන්ත, නැමදුම් පිළිවෙත්, නීති රීති මගින් සදාචාරය වර්ධනය කිරීම සඳහා වන උපදෙස් ලබා දී ඇත.
- අල්ලාහ් ඒකයෙකි හා ඔහුගේ නීතිරීති ජීවිතයේ පිළිපැදිය යුතුයි යන සිද්ධාන්තය දැඩි අධිෂ්ඨානය සිත් ඒකාග්‍රතාවය, පිළිවෙල යනාදී සදාචාරයන් ඇති කරයි. නබිවරු හා ආගම් විශ්වාස කිරීම මගින් සමාජ එකමුතුබව, අන්‍යයන්ට ගරු කිරීමේ ගුණය, සාමයට ප්‍රිය බවක් යනාදිය බිහි වේ. එසේම කළා වල් කද්ර් වෙනත් බොහෝ යහ ගුණයන් ස්ථාපිත කරයි. මිනිසාගේ ආරම්භය පිළිබඳ ඉස්ලාමීය ස්ථාවරය සමානාත්මතාවය, සහෝදරත්වය නිදා යනාදියට මගපාදයි.
- ඉස්ලාම් අණකර තිබෙන නැමදුම්, වතාවත්, සදාචාර ගුණයන් බිහිකිරීමත් අරමුණු කරගත් ඒවාය.
- ගනුදෙනු, පවුල් ජීවිතය, අපරාධ සම්බන්ධ නීතිරීතීන් ආදිය සදාචාරය මුල් කරගත් ඒවාය. කිරුම් මිනුම්වල වංචා නොකළ යුතුයි. යන්නත් සැමටම සමාන නීතියක් තිබිය යුතුයි යන්නත්, රැවටීම්, ද්‍රෝහිකම් හා බොරුව සම්පූර්ණයෙන් වැළකිය යුතුයි යන්නත් ගනුදෙනුවල දී පවතින මූලික අංගයන් ය.
- පවුල් ජීවිතයේ විශ්වාසය, සහයෝගය, එකිනෙකා වෙනුවෙන් කැපකිරීම්, ආදයර, රැකවරණය, වගකීම් බෙදා ගැනීම යනාදිය යහපත් ගුණාංග ඇති කිරීම සඳහා දේශනාවන් ඉස්ලාම් සතුය.
- අපරාධ නීතිවල මූලික පරමාර්ථයම සදාචාරාත්මක ජීවිතය ආරක්ෂා කිරීමයි. මිනීමැරුම්, මත්පැන්, අපවාද, සොරකම යනාදිය ඉතා පැහැදිලි අයහපත් ගුණාංගයන් ය.
- ඉස්ලාම් පරලොවේ දී ලැබෙන අපරිමිත ආනිසංස විස්තර කර, සදාචාරාත්මක ජීවිතය දිරි ගන්වයි. පරලොවේ දී මුස්ලිම්වරයෙකු තරාදියේ ඉතා බරැති දෙය යහපත් ගුණාංග ලෙස තමාට ඉතා සමීපව සිටීමට සුදුස්සා යහපත් ගුණාංග ඇත්තා බවත්, නබි (සල්) තුමා පවසා තිබීම මෙයට කදිම සාක්ෂියකි.

- නබි (සල්) තුමා මිනිස් ජීවිතයට පූර්ව ආදර්ශයකි. ජීවිතයේ සෑම කොටසකටම එතුමා එක් ශ්‍රේෂ්ඨ මගපෙන්වන්නෙකි. එමනිසා සදාචාරයට සම්බන්ධ එතුමාගේ ජීවිතය පිළිපැදීමත් ශ්‍රේෂ්ඨ ඉබාදතයකි. සුන්නතයකි.

- ඉස්ලාම් බල කරන සදාචාර ගතිපැවතුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ද පෙන්වා දී ඇතත

- ඉස්ලාම් අකීදාව නිසි අයුරින් හා ස්ථිරව පවතින විට සදාචාර ගුණාංගයන් පූර්ණව පවතී. නබි(සල්) තුමාගේ සහාබාවරුන් වෙත ඉතා පූර්ණ යහ ගුණාංග ඇති වූයේ ඔවුන් පිළිගෙන සිට චින්තනයෙහි (වාදයෙහි) ස්ථිරව සිටීම නිසා ය. එමනිසා ඊමානීය හැඟීම් වැඩි කිරීමෙන් යහපත් ගුණාංග වැඩි කරගත හැක. ක්‍රියාත්මක කිරීමට එය සහාය වේ.

- ඉස්ලාම් අනිවාර්ය කර ඇති නැමදුම් වතාවත් හුදෙක් ම එක් චාරිත්‍රයක් ලෙස නොසලකා එහි යථාර්ථයන් අවබෝධ කරගෙන, ක්‍රියාත්මක කරවන විට සදාචාර ගුණාංග ක්‍රියාවට පැමිණීම පහසු වේ.

- ඉස්ලාම් පනවා ඇති නීතිරීති ඒ ආකාරයෙන් පිළිපැදීම මගිනුත් සදාචාරාත්මක ජීවිතය ක්‍රියාවට නැංවිය හැකිය.

- ජීවිතයේ සෑම අවස්ථාවක් ම දේව හැඟීමෙන් (තක්වා) පිවිතුරු චේතනාවෙන්(ඉක්ලාස්) ගත කරන විට අයහපත් ගුණාංග ඇතිවීමේ මං ඇහිරේ.

- හදීසුන් මුල්ලිස් මගින් ඉබාදතයන්ගේ වර්ධනයට අනුව යහපත් ගුණාංග හා සදාචාර ගුණාංග වැඩි විය යුතුය යන ඔවදන ලබාගන්නා නිසා අයහපත් සදාචාරයෙන් වැලකී යහපත් සදාචාරයන් ක්‍රියාවට නැංවීමට දිරි ගන්වනු ලබයි.

- දෙමාපියන්ගේ අවධානය හා නිවසේ පරිසරය, අධ්‍යාපනික ආයතන, මස්ජිද් වැනි පොදු ආයතන, ගමේ නායකත්වය යනාදිය මෙම කරුණු පිළිබඳ ව උනන්දුවක් හා අවධානයක් දැක්වීම මගින් පොදු සදාචාර ජීවිතය ක්‍රියාවට නැංවිය හැකිය.

- මුස්ලිම්වරු වෙත දක්නට තිබිය යුතු පුද්ගලික, පවුල්, සමාජ ජීවිතය හා සම්බන්ධ සදාචාර ගුණාංග

  * පුද්ගලික ගුණාංග

  මෙය වර්ග දෙකකට බෙදිය හැක.

  1. ආධ්‍යාත්මික ගුණාංග

     තක්වා ඉක්ලාස්, වරඋ, සුහ්ද්, කුපුඃ, මරාකබා, මුහාසබා, තවක්කුල්, රිළා, මහබ්බතුල්ලාහ් යනාදිය මෙවැනි ගුණාංගයන් ය.

  2. පොදු ගුණාංග

     සත්‍යය, විශ්වාසවන්තකම, ස්තුති කිරීමේ ගුණය, පිවිතුරු බව, කරුණාව, ලැජ්ජාව, ඉවසීම, අවයව ආරක්ෂා කර ගැනීම, වේලාවට ක්‍රියා කිරීම, පරිත්‍යාගය යනාදිය වැනි ගුණාංග වේ.

* පවුල් ජීවිතය හා සම්බන්ධ ගුණාංග

  ආදරය, නම්‍යශීලී වීම, වටහාගැනීම, වගකීම් බෙදාගැනීම, තැන්පත් බව, සහයෝගය, ආදර්ශව ජීවත්වීම යනාදිය පවුල් ජීවිතය හා සම්බන්ධ සදාචාර ගුණාංගයන් ය.

* සමාජ ජීවිතය හා සම්බන්ධ ගුණාංග

  යහපන පනවා අයහපත වැළැක්වීම, අන් මිනිසුන්ට හා සතුන් සිව්පාවුන්ට කරුණාව දැක්වීම, අන්‍යයන්ට ගරු කිරීම, සලාම් කීම, කිව්සුම් ගිය විට එයට පිළිතුරු දීම, ලෙඩදුක් විමසීම, ජනාසාව පසුපසින් යෑම, උදව් උපකාර කිරීම, නරකක් නොකර සිටීම, ණය දීම, නෑයින්ගේ හා අසල්වැසියන්ගේ යහපත රැකීම, නම්‍යශීලී වීම, සමාව දීම, දන්දීම, ආගන්තුක සත්කාරය, අන්‍යයන්ට සාධාරණය ඉටු කිරීම, සමානාත්මතාවය, සහෝදරත්වය, නායකත්වය, මධ්‍යස්ථ වීම, අන්‍යයන්ගේ යහපත රැකීම යනාදිය සමාජ ජීවිතයේ පිළිපැදිය යුතු ගුණාංගයන් ය.

- මුඃමින්වරයෙකු වෙත පුද්ගලික, පවුල්, සමාජය, ආශ්‍රිත ගුණාංග ජීවිතයේ පිළිපදිනු ලබන විට ඔහුගේ ඉස්ලාමීය ජීවිතය පරිපූර්ණ වේ.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

පියවර I : සදාචාර සංවර්ධනය සඳහා වූ දෙසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රමවේදයන් ගැන ද, මුස්ලිම්වරු අතර දකින්නට ඇති සදාචාරාත්මක ගුණ පිළිබඳව ද සිසුන් වටහාගෙන ඇති දේවල් ගැන සාකච්ඡා කරන්න.

පියවර II : සිසුන් කණ්ඩායම් හතරකට බෙදා එක් එක් කණ්ඩායමට පහත මාතෘකා ලබා දෙන්න.

* සදාචාරය දියුණු කර ක්‍රියාත්මක කිරීම සඳහා වන ඉස්ලාමීය දේශනා
* පුද්ගලික මට්ටමින් ද, පවුල් මට්ටමින් ද, සදාචාරාත්මක ගුණ දුබලවීමට හේතු හා ඒවා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
* සමාජ ජීවිතයේ සදාචාරය සංවර්ධනය කිරීම සඳහා බාධාවක් වන කරුණු හඳුනාගෙන ඒවා ඉවත් කිරීම සඳහා ක්‍රම විධි
* පාසල් ජීවිතයේ සදාචාරය ගොඩනැගීම සඳහා සැලැස්මක් සකස් කිරීම

පියවර III: එක් එක් කණ්ඩායම රැස්කළ අදහස් ඉදිරිපත් කර අදහස් හුවමාරුවට අවස්ථා සලස්වන්න.

පියවර IV: අදහස් හුවමාරු කළ කරුණු සාරාංශයක් ලෙස ලියා ගැනීමට සැමදෙනා ම යොමු කරන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


* මුහම්මද් අල් ගස්සාලි (2004), ඉස්ලාමීය ඔලුක්ක මාන්පුහල්, චෙන්නයි, ඉලක්කිය සෝලයි ප්‍රකාශනය
* අහාර් මුහම්මද් ඒ.සී. (1991), නබිවලි I,II, බේරුවල අල් කලම් ප්‍රකාශකයෝ,
* ගස්සාලි ඉමාම් (1986)ඵ පදචි මෝහම්, චෙන්නයි යුනිවර්සල් මුද්‍රණාලය
* අක්රම් මුහම්මද් (2004), ආන්මීහ වාල්වු පෝදනයි ගලුම් මුරයිමයි හලුම්, පස්යාල මුසල්මාන් මුද්‍රණාලය
* ෂුක්රි එම්. ඒ. එම්. (1999), ඉස්ලාමීය වාල්වියල් කෝට්පාඩුහල්, බේරුවල නලීමියා මුද්‍රණාලය
* ඉස්මායිල් එස්. එච්. එම්. (2000), ඉස්ලාමීය ඔලුක්කවියල්, කුරුණෑගල අයි.අ.සු.මු.

# පාසල පදනම් කරගත් තක්සේරුකරණය

## හැඳින්වීම

ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත් සෑම ගුරුවරයෙකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යොන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයෙකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයෙකු ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මඟහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත්, සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීමට සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩපිළිවෙල ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර, සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතිකව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණ සහිතව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්නුම් ක්‍රියාවලියත්, සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් - ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේ ය :

| | |
|---|---|
| 01. පැවරුම් | 02. ව්‍යාපෘති |
| 03. සමීක්ෂණ | 04. ගවේෂණ |
| 05. නිරීක්ෂණ | 06. ප්‍රදර්ශන/ඉදිරිපත් කිරීම් |
| 07. ක්ෂේත්‍ර චාරිකා | 08. කෙටි ලිඛිත පරීක්ෂණ |
| 09. ව්‍යුහගත රචනා | 10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. ශ්‍රවණ පරීක්ෂණ |
| 13. ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. කථනය |
| 15. ස්ව නිර්මාණ | 16. කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. සංකල්ප සිතියම | 18. ද්විත්ව සටහන් ජර්නලය |
| 19. බිත්ති පුවත්පත් | 20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් |
| 21. ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. විවාද |
| 23. සාකච්ඡා මණ්ඩල | 24. සම්මන්ත්‍රණ |
| 25. ක්ෂණික කථා | 26. භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම් - ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම සෑම එකක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගතයුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වගබලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණත්, මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# පළමු වාරය

**උපකරණ අංකය** : 01

**නිපුණතාවය** : 7.0

**නිපුණතා මට්ටම** : 7.2

**උපකරණයේ ස්වභාවය** : පැවරුම්

ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ පසුබිම ඓතිහාසික සටහන් සාධක ලෙස ගෙන පැවරුමක් සකස් කිරීමට සිසුන් යොමු කරන්න.

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. පැවරුමේ අරමුණ පහදා දීම, අරමුණුවලට හා මාතෘකා අතර සම්බන්ධහ පහදා දීම | 4 | 3 | 2 | 1 |
| 2. දත්ත, තොරතුරු රැස්කිරීම සඳහා අනුගමනය කළ ක්‍රමයේ අදාළ බව. | 4 | 3 | 2 | 1 |
| 3. දත්ත, තොරතුරු රැස්කිරීම හා ඒවා සටහන් කිරීම | 4 | 3 | 2 | 1 |
| 4. යොදාගත් ක්‍රමවේදයන්ගේ අදාළත්වය හා තර්කානුකූල ස්වභාවය | 4 | 3 | 2 | 1 |
| 5. තීරණයට එළඹීම, ඒවාෙ හේතු දැක්වීම හා නිර්මාණය ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ = $\frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# පළමු වාරය

**උපකරණ අංකය** : 02

**නිපුණතාවය** : 8.0

**නිපුණතා මට්ටම** : 8.1

**උපකරණයේ ස්වභාවය** : කණ්ඩායම් සාකච්ඡාවක්

දෙමාපියන් දරුවන්ටත්, දරුවන් දෙමාපියන්ටත් ඉටුකළ යුතු වගකීම් හා අයිතිවාසිකම් ගැන සිසුන් අතර කණ්ඩායම් සාකච්ඡා මෙහෙයවීමට මඟ පෙන්වන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. ඉගෙනුම් ක්‍රියාවලියට දක්වන අදාළ බව | 4 | 3 | 2 | 1 |
| 2. කණ්ඩායම් සාකච්ඡාව සංවිධානය කිරීම, සංස්කරණය, මාතෘකා වෙන් කර ගැනීම, උපදෙස් පිළිපැදීම | 4 | 3 | 2 | 1 |
| 3. සාකච්ඡාව ඉදිරියට ගෙන යා හැකි පරිදි, සංවර්ධනාත්මක ව අදහස් ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| 4. ඉදිරිපත් කරන අදහස්වල නිර්මාණාත්මක, ප්‍රමාණාත්මක, තර්කානුකූල භාවය | 4 | 3 | 2 | 1 |
| 5. සාරාංශ කිරීම, නිගමන, නිගමනවලට හේතු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ $= \frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# පළමු වාරය

**උපකරණ අංකය** : 03

**නිපුණතාවය** : 8.0

**නිපුණතා මට්ටම** : 8.1

**උපකරණයේ ස්වභාවය** : කණ්ඩායම් සාකච්ඡා

දික්කසාදය, ඒක පුද්ගලයෙකුගේ ද, සමාජයේ ද ඇති කර තිබෙන අයහපත් ප්‍රතිඵල පිළිබඳ ව කණ්ඩායම් සාකච්ඡාවක් පැවැත්වීමට සිසුන් යොමු කරන්න.

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. ඉගෙනුම් ක්‍රියාවලියට දක්වන වළංගුතාවය හා සම්බන්ධය | 4 | 3 | 2 | 1 |
| 2. කණ්ඩායම් සාකච්ඡාව සංවිධානය, සංස්කරණය, මාතෘකා වෙන් කිරීම, උපදෙස් පිළිපැදීම | 4 | 3 | 2 | 1 |
| 3. සාකච්ඡාව ඉදිරියට ගෙන යා හැකි අයුරින්, සංවර්ධනාත්මකව අදහස් ඉදිරිපත් කිරීම. | 4 | 3 | 2 | 1 |
| 4. ඉදිරිපත් කරන අදහස්වල නිර්මාණාත්මක, තර්කානුකූල, ප්‍රමාණාත්මක භාවය | 4 | 3 | 2 | 1 |
| 5. සාරාංශකරණය, තීරණය හා තීරණවලට හේතු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ = $\frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# දෙවන වාරය

**උපකරණ අංකය** : 01

**නිපුණතාවය** : 8.0

**නිපුණතා මට්ටම** : 8.2

**උපකරණයේ ස්වභාවය** : ක්ෂණික කථාවක් පැවැත්වීම

පහත සඳහන් මාතෘකා දෙක ඉදිරිපත් කර සිසුන් සූදානම් වීම සඳහා මිනිත්තු 20 ක කාලයක් ලබා දෙන්න. ඉන්පසු එක් එක්කෙනාට, මාතෘකාවක් ලබා දී, මිනිත්තු 7 ක කතාවක් පැවැත්වීමට යොමු කරන්න.

1. නිවස ඉස්ලාමීයකරණය කරන ක්‍රම විධි
2. ජීවිතයේ හලාල් හරාම් සැලකීමේ වැදගත්කම

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම | | නිපුණතා මට්ටම | |
| | ළඟාවී ඇත | | ළඟා වීනැත | |
| 1. යොමුවීම හා මාතෘකාව පැහැදිලි ව ඉදිරිපත් කිරීම, එහි අදාළත්වය | 4 | 3 | 2 | 1 |
| 2. සැකැස්ම, මාතෘකාවට අදාළ පරිදි කරුණු ඉදිරිපත් කිරීම, භාෂාවේ නිරවද්‍යතාවය | 4 | 3 | 2 | 1 |
| 3. මනා භාෂා යෙදීම්, උපමා යනාදිය යොදා ගැනීම නිර්මාණාත්මක බව | 4 | 3 | 2 | 1 |
| 4. පැහැදිලි බව, ශබ්දය පාලනය කර ගැනීම, මුහුණුවර, අංග චලනය, කාලය කළමනාකරණය, නිවැරදි උච්ඡාරණය | 4 | 3 | 2 | 1 |
| 5. සාරාංශ කිරීම, නිගමනවලට හේතු දැක්වීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ = $\frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# දෙවන වාරය

**උපකරණ අංකය** : 02

**නිපුණතාවය** : 9.0

**නිපුණතා මට්ටම** : 9.1

**උපකරණයේ ස්වභාවය** : කණ්ඩායම් සාකච්ඡාවක්

තමා ජීවත්වන සමාජයේ අන් ජාතිකයින් සමග අන්‍යොන්‍ය සම්බන්ධතාවය ගොඩනැගීම සඳහා ක්‍රම විධි පිළිබඳ ව කණ්ඩායම් සාකච්ඡාවක් පැවැත්වීමට සිසුන් යොමු කරන්න.

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. ඉගෙනුම් ක්‍රියාවලියට දක්වන වළංගුතාවය හා සම්බන්ධය | 4 | 3 | 2 | 1 |
| 2. කණ්ඩායම් සාකච්ඡාව සංවිධානය, සංස්කරණය, මාතෘකා වෙන් කිරීම, උපදෙස් පිළිපැදීම | 4 | 3 | 2 | 1 |
| 3. සාකච්ඡාව ඉදිරියට ගෙන යා හැකි අයුරින්, සංවර්ධනාත්මකව අදහස් ඉදිරිපත් කිරීම. | 4 | 3 | 2 | 1 |
| 4. ඉදිරිපත් කරන අදහස්වල නිර්මාණාත්මක, තර්කානුකූල, ප්‍රමාණාත්මක භාවය | 4 | 3 | 2 | 1 |
| 5. සාරාංශකරණය, තීරණය හා තීරණවලට හේතු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ = ලකුණු / 2 | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# දෙවන වාරය

**උපකරණ අංකය** : 03

**නිපුණතාවය** : 9.0

**නිපුණතා මට්ටම** : 9.1

**උපකරණයේ ස්වභාවය** : බිත්ති පුවත්පත

සතුන්ට ආදරය දැක්වීම සම්බන්ධයෙන් ඉස්ලාම් ලබාදී ඇති මානව අයිතිවාසිකම්, සමාජය මෙහෙයවන ආයතනය මස්ජිදය, ආදී අංග ඇතුළත් කර සිසුන්ගේ විවිධ නිර්මාණ අඩංගු බිත්ති පුවත්පතක් සකස් කිරීමට සිසුන් යොමු කරන්න.

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සමඟ දක්වන සම්බන්ධතාවය හා වලංගුතාවය | 4 | 3 | 2 | 1 |
| 2. සංවිධානය යනු එකක් වීම | 4 | 3 | 2 | 1 |
| 3. අලංකරණය සඳහා යොදා ගන්නා ලද ක්‍රමවේදයන් හා ඒවායේ වලංගුතාවය | 4 | 3 | 2 | 1 |
| 4. අන්තර්ගත නිර්මාණාත්මක ස්වභාවය හා තර්කානුකූල ස්වභාවය | 4 | 3 | 2 | 1. |
| 5. බිත්ති පුවත්පතක් ලෙස නිර්මාණයේ සාර්ථකත්වය | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ = $\frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# තෙවන වාරය

**උපකරණ අංකය** : 01

**නිපුණතාවය** : 9.0

**නිපුණතා මට්ටම** : 9.2

**උපකරණයේ ස්වභාවය** : පැවරුම්

ඉස්ලාම් අවසර දී ඇති ඉපැයීමේ ක්‍රම පිළිබඳ පැවරුමක් සකස් කිරීමට සිසුන් යොමු කරන්න.

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. පැවරුමේ අරමුණ පහදා දීම, අරමුණුවලට හා මාතෘකා අතර සම්බන්ධය පහදා දීම | 4 | 3 | 2 | 1 |
| 2. දත්ත, තොරතුරු රැස්කිරීම සඳහා අනුගමනය කළ ක්‍රමයේ අදාළ බව | 4 | 3 | 2 | 1 |
| 3. දත්ත, තොරතුරු රැස්කිරීම හා ඒවා සටහන් කිරීම | 4 | 3 | 2 | 1 |
| 4. යොදාගත් ක්‍රමවේදයන්ගේ අදාළත්වය හා තර්කානුකූල ස්වභාවය | 4 | 3 | 2 | 1 |
| 5. තීරණයට එළඹීම, ඒවාට හේතු දැක්වීම හා නිර්මාණය ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ = $\frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# තෙවන වාරය

**උපකරණ අංකය** : 02

**නිපුණතාවය** : 9.0

**නිපුණතා මට්ටම** : 9.3

**උපකරණයේ ස්වභාවය** : විවාදය

"කාන්තාවන්ට ගෞරවනීය තත්ත්වයක් ලබා දී ඇත්තේ ඉස්ලාම් පමණි" මෙම මාතෘකාවට පක්ෂව හා විපක්ෂව වාද කළ හැකි ආකාරයේ විවාදයක් සූදානම් කිරීමට සිසුන් යොමු කරන්න.

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. ඉදිරිපත් කරන ආකාරය, මාතෘකාව පැහැදිළිව හඳුන්වා දීම | 4 | 3 | 2 | 1 |
| 2. මාතෘකාවට ගැලපෙන සේ කරුණු සංවිධානය හා ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| 3. තර්කානුකූලව හා නිර්මාණාත්මකව තොරතුරු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| 4. සුදුසු පරිදි හැඟීම් හා අංග චලනය, කාල කළමනාකරණය | 4 | 3 | 2 | 1 |
| 5. සංක්ෂිප්ත කිරීම, තීරණ හා තීරණවලට හේතු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ $= \frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# තෙවන වාරය

**උපකරණ අංකය** : 03

**නිපුණතාවය** : 10.0

**නිපුණතා මට්ටම** : 10.1

**උපකරණයේ ස්වභාවය** : කණ්ඩායම් සාකච්ඡා

අද සිසුන් අතර පිරිහී යන සදාචාරාත්මක ගුණ සංවර්ධනය කිරීම සඳහා විධික්‍රම මොනවා ද යන්න ගැන කණ්ඩායම් සාකච්ඡාවකට සිසුන් යොමු කරන්න.

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. ඉගෙනුම් ක්‍රියාවලියට දක්වන වළංගුතාවය හා සම්බන්ධය | 4 | 3 | 2 | 1 |
| 2. කණ්ඩායම් සාකච්ඡාව සංවිධානය, සංස්කරණය, මාතෘකා වෙන් කිරීම, උපදෙස් පිළිපැදීම | 4 | 3 | 2 | 1 |
| 3. සාකච්ඡාව ඉදිරියට ගෙන යා හැකි අයුරින්, සංවර්ධනාත්මකව අදහස් ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| 4. ඉදිරිපත් කරන අදහස්වල නිර්මාණාත්මක, තර්කානුකූල, ප්‍රමාණාත්මක භාවය | 4 | 3 | 2 | 1 |
| 5. සාරාංශකරණය, තීරණය හා තීරණවලට හේතු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ = $\frac{ලකුණු}{2}$ | | | | 10 |